LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

කෘතිය: සමාජවාදී දෘෂ්ටිය සහ සංස්කෘතිය
කතෘ/පරිවර්තක: වී. අයි. ලෙනින්/දැදිගම. වී. රුද්රිගු
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2012-03-23
ඩිජිටල් සංස්කරණයන්: V1:2012-03-23, V2:2019-05-29
පිටු ගණන: 232
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

සියළු රටවල නිර්ධනයිනි, එක්වව්

වී.අයි.ලෙනින්

සමාජවාදී දෘෂ්ටිය සහ සංස්කෘතිය

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත
කෘතිය: සමාජවාදී දෘෂ්ටිය සහ සංස්කෘතිය
කතෘ/පරිවර්තක: වී. අයි. ලෙනින්/ඇදිගම. වී. රුද්රිගු
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2012-03-23
ඩිජිටල් සංස්කරණයන්: V1:2012-03-23, V2:2019-05-29
පිටු ගණන: 232
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

පටුන

මාක්ස්වාදයේ මූලාශ්‍රයන් තුන සහ එහි සංයුක්ත කොටස් තුන....................5
අපේ වැඩ පිළිවෙළ....................12
''කළ යුත්තේ කුමක්ද?'' යන පොතෙන්....................18
පක්ෂ සංවිධානය සහ පක්ෂ සාහිත්‍යය....................24
සමාජවාදී පක්ෂය සහ අපාක්ෂික විප්ලවවාදීත්වය....................31
සමාජවාදය සහ ආගම....................40
මාක්ස්වාදය සහ සංශෝධනවාදය....................46
''වේහි'' පිළිබඳව....................57
එල්. එන්. තොල්ස්තෝයි....................67
මාක්ස්වාදයේ ඓතිහාසික සංවර්ධනයේ ඇතැම් ලක්ෂණ....................73
ලෙව් තොල්ස්තෝයි සහ ඔහුගේ යුගය....................79
මහ රුසියානු ජාතිකාභිමානය ගැන....................84
අධිරාජ්‍යවාදය සහ සමාජවාදයේ භේද වීම....................90
නිර්ධන පංති සංස්කෘතික-අධ්‍යාපනික සංවිධානවල සාකච්ඡාවේ සභාපති මණ්ඩලයට යැවූ ලියුම....................108
1919 ජනවාරි 18 ද ජාත්‍යන්තරවාදී ගුරුවරුන්ගේ සමස්ත රුසියානු දෙවැනි සමුළුව අමතා කළ කතාව....................109
මහා ආරම්භයක්....................113
තරුණ සමිතිවල කාර්ය භාරයන්....................142
නිර්ධන පංතික සංස්කෘතිය ගැන....................161
ගුබේර්නියා සහ උයෙස්ද් මහජන අධ්‍යාපන අංශවල දේශපාලන අධ්‍යාපනික සේවකයින්ගේ සමස්ත රුසියානු සාකච්ඡාව අමතා 1920 නොවැම්බර් 3 ද කළ කතාව....................163
සටන්කාමී ද්‍රව්‍යවාදයේ අර්ථාන්විතය ගැන....................175
දින පොතකින් පිටු....................186
අපේ විප්ලවය....................192
සංස්කාරකගේ සටහන්....................197
නාමාවලිය....................213

මාක්ස්වාදයේ මූලාශ්‍රයන් තුන සහ එහි සංයුක්ත කොටස් තුන

ONBASE

මාක්ස්ගේ උගැන්වීම් ශිෂ්ටාචාර ලෝකය මුළුල්ලේම සියළු ධනපති (නිල සහ ලිබරල් යන දෙආකාරයේම) විද්‍යාවකම දැඩිතම විරෝධයට සහ වෛරයට පාත්‍ර වෙයි. එම විද්‍යාව, මාක්ස්වාදය කිසියම් ''අනර්ථකාරී නිකායක්'' ලෙසට සලකයි. පංති අරගලය මත පදනම් වූ සමාජයක් තුළ කිසිම ''අපක්ෂපාත'' සමාජ විද්‍යාවක් තිබිය නොහැකි නිසා, වෙනත් ආකල්පයක් බලාපොරොත්තු වීමටද නොපුළුවන. සියළුම නිල හා ලිබරල් විද්‍යාවන් එක් හෝ තවත් මාර්ගයකින් වේතන වහල් ක්‍රමය රකියි. ඒ අතර, මාක්ස්වාදය වේතන වහල් ක්‍රමයට විරුද්ධව නිර්දය ලෙස යුද්ධ ප්‍රකාශ කරයි. වේතන වහල් ක්‍රමයේ සමාජයක විද්‍යාව අපක්ෂපාත වෙතැයි අපේක්ෂා කිරීම යනු, ප්‍රාග්ධනයේ ලාභ අඩු කිරීම මගින්, කම්කරුවන්ගේ වේතන වැඩි කළ යුතුද, නැද්ද යන ප්‍රශ්නයේදී කර්මාන්ත කරුවාගෙන් අපක්ෂපාතිත්වය අපේක්ෂා කිරීම තරම්ම අඥාන බොළඳ කමකි.

එහෙත්, එපමණක්ද නොවේ. අළුත් කිසිම දෙයක් අගය කිරීමට විරුද්ධ හා ගල් ගැසුන යන අර්ථයෙන්ද, ලෝක ශිෂ්ටාචාරයේ සංවර්ධන මාර්ගයෙන් බැහැරව උද්ගත වූ යන අර්ථයෙන්ද මාක්ස්වාදය තුළ ''නිකායවාදයට'' සමාන කිසිම දෙයක් නොමැති බව දර්ශනයේ හා සමාජ විද්‍යාවේ ඉතිහාසය පැහැදිලි ලෙස පෙන්නුම් කරයි. ඊට ප්‍රතිකූල වශයෙන්, මාක්ස්ගේ විචක්ෂණභාවය ඉඳුරාම සමන්විත වන්නේ, මිනිස් වර්ගයාගේ ප්‍රමුඛතම සිත් විසින් දැනටමත් ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමෙන්ය. ඔහුගේ ධර්මය මතු වූයේ දර්ශනයේ, දේශපාලන අර්ථ ශාස්ත්‍රයේ හා සමාජවාදයේ ශ්‍රේෂ්ඨතම නියෝජිතයන්ගේ උගැන්වීම් එක එලලේ සහ අනන්තර ලෙස තවදුරටත් ඉදිරියට ගෙන යාමක් ලෙසටය.

https://liberationbase.wordpress.com

මාක්ස්වාදී ධර්මය සත්‍ය නිසා, එය සර්වබලධාරී ය. එය අංග සම්පූර්ණය; සංගත ය; එය, කිසිම ආකාරයක හෝ මිථ්‍යා විශ්වාසයක්, ප්‍රතිගාමිත්වයක් හෝ ධනපති පීඩන රැකීම සමග නොගැලපෙන,පිරිපුන් ලෝකාවබෝධයක් මිනිසුනට දෙන්නේය. ජර්මන් දර්ශනය, ඉංග්‍රීසි දේශපාලන අර්ථ ශාස්ත්‍රය හා ප්‍රංශ සමාජවාදය විසින් නියෝජනය කෙරෙන්නා වූ, දහනව වැනි ශත වර්ශයේ මිනිසාගේ විශිෂ්ඨතම නිමැවුමට සාධාරණ අනුප්‍රාප්තිකය වූයේ එයයි.

අප සැකෙවින් විස්තර කිරීමට බලාපොරොත්තු වන්නේ, මාක්ස්වාදයේ මෙම මූලාශ්‍රයන් තුන ගැනය. මාක්ස්වාදයේ සංයුක්ත කොටස්ද ඒවාය.

I

මාක්ස්වාදයේ දර්ශනය ද්‍රව්‍යවාදයයි. ස්වාභාවික විද්‍යාවේ සියලුම උගැන්වීම්වලට එකඟ වන, මිථ්‍යා විශ්වාසයන්ට, බොරු දේශනාවලට, යනාදියට රැහැණි වන එකම සසංගත දර්ශනය ද්‍රව්‍යවාදය බව, යුරෝපයේ මුළු නවීන ඉතිහාසයෙන්ම ඔප්පු වී තිබේ. සෑම වර්ගයකම මධ්‍යකාලීන කුණු කන්දල්වලටත්, ආයතන සහ අදහස් තුළ පැවති දස භාවයටත් විරුද්ධව අධිෂ්ඨාන සහගත අරගලයක් කරන ලද ප්‍රංශයේදී, දහ අටවැනි ශතවර්ෂය අගදී ඒ බව විශේෂයෙන්ම ඔප්පු වී ඇත. එනිසා, ප්‍රජාතන්ත්‍රවාදයේ සතුරන් ද්‍රව්‍යවාදය ''බිඳහෙළීමට'', දුර්වල කිරීමට හා එයට අපහාස කිරීමට, ඔවුනට හැකි සෑම ශක්තියක්ම නිතරම යොදවා ඇත. එමෙන්ම, ඔවුන්, එක් හෝ තවත් ආකාරයකින් ආගම ආරක්ෂා කිරීමක් හෝ එයට ආධාර දීමක් හෝ බවට පත්වන නේකාකාර විඥනවාදී දර්ශනයන් ඉදිරිපත් කර ඇත.

මාක්ස් හා එංගල්ස් නිරතුරුවම ඉතාමත් නොපසුබට ලෙස දර්ශනික ද්‍රව්‍යවාදය ආරක්ෂා කළහ. මෙම පදනමෙන් පිට පැනීමේ සෑම අවස්ථාවක්ම කොතරම් බරපතල ලෙස සාවද්‍ය වීද යන්න ඔවුහු නැවත පැහැදිලි කර දුන්හ. පංති විඥනය ඇති සෑම කම්කරුවෙකුටම, ''කොමියුනිස්ට් ප්‍රකාශනය'' මෙන්ම වැදගත් අත්පොත් වන ''ලුද්විග් ෆොයර්බාහ්'' සහ ''ඩූරිං විරෝධය''[1] යන එංගල්ස්ගේ කෘතිවල මෙම අදහස් ඉතාමත් පැහැදිලි ලෙස හා සම්පූර්ණ ලෙස විස්තර කර තිබේ.

එහෙත්, මාක්ස් දහ අටවැනි ශත වර්ෂයේ ද්‍රව්‍යවාදයෙන් නොනැවතුනේය. ඔහු වඩාත් උසස් මට්ටමක දර්ශනයක් ඉදිරිපත් කළේය. ඔහු මුල් ජර්මන් ද්‍රව්‍යවාදයේ, විශේෂයෙන්ම, ෆොයර්බාහ්ගේ ද්‍රව්‍යවාදයට මහ හෙළි කළ හෙගල්වාදී ක්‍රමයේ ජයග්‍රහණයන් එයට එකතු කර එය වඩාත් සාරවත් කළේය. ප්‍රධාන ජයග්‍රහණය වූයේ දයලෙක්තික

ක්‍රමය යි. එය, ඉතාමත් පූර්ණ පරිමාණ, ගැඹුරුතම හා සම්පූර්ණ ආකාරයේ සංවර්ධනය පිළිබඳ ධර්මයයි; සදාකාලික ලෙස සංවර්ධනය වන ද්‍රව්‍යයේ පරාවර්තනයක් අපට සපයන මිනිස් විඥනයේ සාපේක්ෂතාවය පිළිබඳ ධර්මයයි.පැරණි පිරිහෙන විඥනවාදය වෙත යන ''අළුත්'' ප්‍රතිවර්තනයන් ගැන දෙසන ධනපති දර්ශනිකයන්ගේ උගැන්වීම් තිබුණත්, ස්වාභාවික විද්‍යාවේ අලුත්ම සොයා ගැනීම් — රේඩියම්, ඉලෙක්ට්‍රෝන, මූලද්‍රව්‍ය තත්වාන්තරණය — මාක්ස්ගේ දයලෙක්තික ද්‍රව්‍යවාදය පුදුම එලවන ලෙසින් සනාථ කළේය.

මාක්ස් දර්ශනික ද්‍රව්‍යවාදය වඩාත් අරුත් සරු කර සම්පූර්ණයෙන්ම විකාශනය කළේය; ස්වභාව ධර්මය පිළිබඳ ප්‍රජානනයට මිනිස් සමාජය ගැන ප්‍රජානනයද ඇතුලත් වන සේ එය පුළුල් කළේය. ඔහුගේ ඓතිහාසික ද්‍රව්‍යවාදය විද්‍යාත්මක චින්තනයේ ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයක් විය. ඉතිහාසය සහ දේශපාලනය ගැන අදහස් තුළ කලින් රජ කළ ව්‍යාකූලත්වය හා අත්තනෝමතික භාවය වෙනුවට, නිෂ්පාදනීය බලවේගයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් එක් සමාජ ජීවන ක්‍රමයකින්, තවත් වඩාත් උසස් එකක් වැඩී එන සැටිත්, නිදර්ශනයක් වශයෙන්, වැඩවසම් ක්‍රමයෙන් ධනපති ක්‍රමය වැඩී එන සැටිත් පෙන්නුම් කරන, ඉතාමත් පරිපූර්ණ හා සසංගත විද්‍යාත්මක න්‍යායයක් ආදේශ කරන ලදී.

මිනිසාගේ ඥනය, ඔහුගෙන් ස්වාධීනව පවතින ස්වභාව ධර්මයේ (එනම්, සංවර්ධන වෙමින් පවතින ද්‍රව්‍යයේ) පරාවර්තනයක් වන්නා සේම, මිනිසාගේ සමාජ ඥනයද (එනම්, දර්ශනික, දේශපාලන, ආගමික යනාදී වූ, ඔහුගේ විවිධ අදහස් හා ධර්මයන්ද) සමාජයේ ආර්ථික ක්‍රමයේ පරාවර්තනයන් වන්නේය. දේශපාලනමය ආයතන ආර්ථික පදනම මස්තකයෙහි පිහිටා ඇති උඩු ව්‍යුහයකි. නිදර්ශනයක් වශයෙන්, නවීන යුරෝපීය රාජ්‍යයන්ගේ විවිධ දේශපාලන ආකෘති, පංති මස්තකයෙහි ධනපති පංතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමට උපස්තම්භක වන බව අපට පෙනේ.

මාක්ස්ගේ දර්ශනය වනාහි, මිනිස් වර්ගයාට, විශේෂයෙන්ම කම්කරු පංතියට, බලවත් ඥන උපකරණ සපයා දුන් පරිසමාප්ත දර්ශනික ද්‍රව්‍යවාදයකි.

II

දේශපාලන උඩු ව්‍යුහය ඉදි කිරීමට අඩිතාලම වශයෙන් ගෙන තිබෙන්නේ ආර්ථික ක්‍රමය බව ඒත්තු ගත් මාක්ස් මෙම ආර්ථික ක්‍රමය අධ්‍යයනය කිරීමට ඔහුගේ වැඩිම අවධානය කැප කළේය. මාක්ස්ගේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රධාන කෘතිය වන "ප්‍රාග්ධනය" නවීන, එනම්, ධනපති, සමාජයේ ආර්ථික ක්‍රමය අධ්‍යයනය සඳහා කැප කර ඇත.

මාක්ස්ට පෙර, මුල් දේශපාලන අර්ථ ශාස්ත්‍රය, ධනපති රටවල් අතුරෙන් ඉතාමත් දියුණු රට වූ එංගලන්තයෙහි පරිණාම වී මතුවිය. ඇඩැම් ස්මිත් හා ඩේවිඩ් රිකාර්ඩෝ, ඔවුන් ආර්ථික ක්‍රමය ගැන කළ විමර්ශන මගින් වටිනාකම පිළිබඳ ශ්‍රම න්‍යායයට අත්තිවාරම් දැමූහ. මාක්ස් ඔවුන්ගේ එම මෙහෙය ඉදිරියට ගෙන ගියේය. එම න්‍යායය ඔප්පු කිරීමට සාධක සැපයූ ඔහු, එය තවදුරටත් සසංගත ලෙස විකාශනය කළේය. සෑම වෙළෙඳ භාණ්ඩයකට වටිනාකම නිර්ණය වන්නේ, එය නිෂ්පාදනය සඳහා වැය කෙරෙන, සමාජමය වශයෙන් අවශ්‍ය ශ්‍රම කාලය අනුවය යි ඔහු පෙන්නුම් කළේය.

ධනපති අර්ථ ශාස්ත්‍රඥයන් ද්‍රව්‍යයන් අතර (එක වෙළෙඳ භාණ්ඩයක් තවත් එකක් සඳහා හුවමාරු කිරීම) සම්බන්ධයක් දුටු තැන, මාක්ස් මිනිසුන් අතර සම්බන්ධකමක් පවතින බව හෙළිදරව් කළේය. වෙළෙඳ භාණ්ඩ හුවමාරුවෙන් ප්‍රකාශ වන්නේ, තනි පුද්ගල නිෂ්පාදකයන් වෙළෙඳ පොළ මගින් පවත්වන සම්බන්ධයයි. මුදලෙන් සලකුණු වන්නේ එම සම්බන්ධය වඩ වඩාත් සමීප වන බව හා තනි පුද්ගල නිෂ්පාදකයන්ගේ සමස්ත ආර්ථික ජීවනයම, නො වෙන් කළ හැකි සේ එක සමස්තයකට එක්සත් කෙරෙන බවයි. ප්‍රාග්ධනය මේ හා සම්බන්ධයෙන් තවදුර සංවර්ධනයක් සලකුණු කරන්නේය: මිනිසාගේ ශ්‍රම ශක්තිය වෙළෙඳ භාණ්ඩයක් බවට පත් වෙයි. වේතන කම්කරුවා සිය ශ්‍රම ශක්තිය ඉඩම්, පැක්ටරි හා ශ්‍රම උපකරණ හිමියාට විකුණයි. කම්කරුවා තමන්ගේ හා තම පවුලේ නඩත්තු මිල (වේතන) උපයමින් දවසෙන් කොටසක් ගෙවයි. ඔහු දවසේ ඉතිරි කොටසට ගෙවීමක් නො ලබා වැඩ කරයි. එම කොටසේ කරන වැඩ තුළින් ධනපතියා සඳහා අතිරික්ත වටිනාකම උපදවයි. ලාභයේ උල්පත වන්නේත්, ධනපති පංතියේ වස්තුවෙහි උල්පත වන්නේත් එම අතිරික්ත වටිනාකමය.

මාක්ස්ගේ ආර්ථික න්‍යායයෙහි මුල් ගල්, අතිරික්ත වටිනාකම පිළිබඳ න්‍යාය ය.

කම්කරුවාගේ ශ්‍රමයෙන් උපදවන ලද ප්‍රාග්ධනය, කුඩා දේපළ හිමියන් විනාශ කරමින්ද, විරැකියා ගත වුවන් හමුදුවක් ඇති කරමින්ද, කම්කරුවා මිරිකා දමයි. කර්මාන්තයෙහිදී මහා පරිමාණ නිෂ්පාදනයේ ජයග්‍රහණය කල් නොයවාම පෙනී යන්නේය. නමුත් එම ප්‍රපංචයම කෘෂිකර්මාන්තයෙහිද දක්නට ලැබේ. එහි මහා පරිමාණ ධනපති ගොවිතැනෙහි උසස් කම ශක්තිමත් වෙයි, යන්ත්‍ර භාවිතය වැඩි වෙයි;

මූල්‍ය ප්‍රාග්ධනයේ උගුලට අසුවූ ගොවි ජන ආර්ථිකය, නොදියුණු ශිල්ප ක්‍රමවල බර යටතේ පිරිහී ඇද වැටෙයි. කෘෂිකර්මාන්තයේ කුඩා පරිමාණ නිෂ්පාදනයේ පිරිහීම විවිධාකාර ලෙස සිදු වේ. නමුත් එම පිරිහීම ප්‍රතික්ෂේප කළ නොහැකි සත්‍යයකි.

කුඩා පරිමාණ නිෂ්පාදනය විනාශ කිරීම මගින්, ප්‍රාග්ධනය ශ්‍රම ඵලදායකත්වය වැඩි කිරීමටත්, ලොකු ධනපතියන්ගේ සමාගම් සඳහා ඒකාධිකාරී තත්වයක් ඇති කිරීමටත් මාර්ගය පෙන්වයි. නිෂ්පාදනයද තව තවත් සමාජමය බවට පත් වේ — ලක්ෂ ගණන් හා කෝටි ගණන් කම්කරුවෝ ක්‍රමානුකූල ආර්ථික ජීවේන්ද්‍රියන් ලෙසට එකට බැඳෙති, — එහෙත් මෙම සාමූහික ශ්‍රමයේ නිෂ්පාදිතය ධනපතියන් අතළොස්සක් විසින් අත්පත් කරගනු ලැබේ. නිෂ්පාදනයේ අරාජිකත්වයත්, අර්බුදත්, වෙළෙඳ පොළවල් සොයා වියරු ලුහු බැඳීමත්, පොදු ජනතා සමූහයාගේ පැවැත්මේ අවදනම් සහිත භාවයත් උග්‍ර වන්නේය.

ප්‍රාග්ධනය කෙරෙහි කම්කරුවන්ගේ ගැති කම වැඩි කිරීමෙන් ධනපති ක්‍රමය එක්සත් ශ්‍රමකරු මහා බලවේගය ඇති කරයි.

මාක්ස් කලල ස්වභාවයේ වෙළෙඳ භාණ්ඩ ආර්ථිකයේ පටන්, සරල හුවමාරුවේ පටන්, එහි උසස්තම ආකෘති දක්වාද, මහා පරිමාණ නිෂ්පාදනය දක්වාද, ධනපති ක්‍රමයේ සංවර්ධන මාර්ගය සටහන් කර දැක්විය.

පැරණි හා අළුත් යන සියළුම ධනපති රටවල අත් දැකීමෙන්, මෙම මාක්ස්වාදී ධර්මයේ සත්‍යතාවය වසරක් වසරක් පාසා වැඩි වැඩියෙන් කම්කරු පිරිස්වලට, පැහැදිලි ලෙස ප්‍රදර්ශනය කෙරෙන්නේය.

ධනපති ක්‍රමය ලෝකය මුළුල්ලේම ජයග්‍රහණය ලබා ඇත. එහෙත් මෙම ජයග්‍රහණය, ප්‍රාග්ධනය පරදවා ශ්‍රමය ලබන විජයග්‍රහණයට ප්‍රස්ථාවනාව පමණකි.

III

වැඩවසම් ක්‍රමය පෙරළා දමා, "නිදහස්" ධනපති සමාජය ඇති වූ කල, මෙම නිදහසෙන් අදහස් කෙරුනේ, වැඩ කරන ජනතාව පීඩනයට පත්කිරීමේ හා සූරා කෑමේ නව ක්‍රමයක් බව එක්වරම පෙනී ගියේය. මෙම පීඩනයේ පරාවර්තනයක් හා එයට විරුද්ධත්වය පෑමක් වශයෙන්, අප්‍රමාදව විවිධ සමාජවාදී ධර්ම උද්ගත විය. එසේ වුවද, ප්‍රථමයෙන් ඇති වූ සමාජවාදය මනෝරාජික සමාජවාදය විය. එය ධනපති සමාජය විවේචනය කළේය; එය හෙළා දුටුවේය; එයට පරිභාස කළේය; එහි විනාශය ගැන සිහින මැව්වේය; වඩාත් හොඳ ක්‍රමයක් ගැන සිතුවිල්ලේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යෙදෙන අතර, සූරා කෑමේ දුශ්චරිතවත් බව ගැන පොහොසතුන්ට ඒත්තු ගැන්වීමට ප්‍රයත්න දරුවේය.

එහෙත්, නියම විසඳීමක් පෙන්නුම් කිරීමට මනෝරාජික සමාජවාදය සමත් නොවීය. ධනපති ක්‍රමය යටතේ වේතන වහල් ක්‍රමයේ නියම ස්වභාවය පැහැදිලි කිරීම එයට කළ නොහැකි විය. ධනපති සංවර්ධනයේ නියාමයන් අනාවරණය කිරීම එයට කළ නොහැකි විය. එමෙන්ම, නව සමාජයක නිර්මාණකයා වීමෙහි සමත් සමාජ බලවේගය කුමක්දැයි යන්න පෙන්නුම් කිරීම ද එයට නුපුළුවන් විය.

ඒ අතර තුර, යුරෝපයේ සෑම තන්හිම, විශේෂයෙන්ම ප්‍රංශයේ, වැඩවසම් ක්‍රමයේ බිඳවැටීම හා සමාගම්ව ඇති වූ වේගවත් විප්ලව විසින් වඩ වඩාත් පැහැදිලි ලෙස අනාවරණය වූයේ, සියළු සංවර්ධනයේ පදනම සහ ගාමක බලවේගය වශයෙන් විද්‍යාමාන වූ පංති අතර අරගලය යි.

රදළ පංතිය පරදවා දේශපාලන නිදහස ලබා ගැනීමේ ජයග්‍රහණ අතුරෙන් ඒකක් හෝ දරුණු ප්‍රතිරෝධයට මුහුණ නො දී අත්කර ගත හැකි නොවීය. ධනපති රටවල් අතුරෙන් එකක් හෝ, ධනපති සමාජයේ විවිධ පංති අතර ජීවිතයත් මරණයත් අතර කෙරෙන අරගලයකින් තොරව, එක්තරා දුරකට හෝ නිදහස් හා ප්‍රජාතන්ත්‍රවාදී වූ පදනමක් ඇතිව පරිණාම වූයේ නොවේ.

මාක්ස්ගේ ප්‍රඥාභාවය පිළිබිඹුවන්නේ, ලෝක ඉතිහාසය උගන්වන මෙම පාඩම නිගමනය කළ හා එය සසංගත ලෙස ව්‍යවහාරයට නැංවූ ප්‍රථමයා ඔහු වීමෙනි. ඔහු එයින් එළඹගත් නිගමනය පංති අරගලය පිළිබඳ ධර්මයයි.

දේශපාලනයේදී ජනතාව, සැමදමත් රැවටිල්ලට හා ආත්ම රැවටිල්ලට අඟුන ලෙස ගොදුරු වී ඇත. එමෙන්ම, සියළුම සදචාර, ආගමික, දේශපාලන හා සමාජ වදන්, ප්‍රකාශයන් හා පොරොන්දු පිටුපස තිබෙන කිසියම් එක් හෝ අනිත් පංතියක උවමනාවන් සොයා, තෝරා ගැනීමට ඔවුන් උගෙන ගන්නා තෙක්ම ඔවුන් එසේ තවදුරටත් රැවටෙනු ඇත. සෑම පැරණි ආයතනයක්ම, එය කොතරම් ම්ලේච්ඡ සහ කුණුවී තිබෙන සෙයක් පෙනුණත්, එය කිසියම් පාලක පංතිවල බලවේගයන් විසින් පවත්වා ගනු ලබන බව වටහා ගන්නා තෙක් ප්‍රතිසංස්කරණ සහ වැඩි දියුණු කිරීම් සඳහා සටන් කරන සටන් කරුවන් සියළු දෙනාම පැරණි ක්‍රමයේ ආරක්ෂකයන් විසින් රවටනු ලැබෙනු ඇත. එම පංතිවල ප්‍රතිරෝධය සුනු විසුනු කිරීමේ මාර්ග ඇත්තේ එකක් පමණකි. එය නම්, පැරණි ක්‍රමය අතුගා දමා, නව ක්‍රමය නිර්මාණය කිරීමේ බලවේගය වීමේ හැකියාව ඇති හා ස්වකීය සමාජ තත්වය නිසාම එසේ කළ යුතු,

බලවතා වීමෙහි සමත් බලවේගයන් අප වටා තිබෙන ඒ සමාජයෙන්ම සොයා ගැනීමත්, එම බලවේගයන්ට කරුණු පහදා දෙමින්, ඒවා අරගලය සඳහා සූදනම් කිරීමත් ය.

සියළුම පීඩිත පංති මේ දක්වා ලැග සිටි අධ්‍යාත්මික වහල් භාවයෙන් ගැලවී ඉන් ඉවතට යාමේ මාර්ගය නිර්ධන පංතියට පෙන්වා දුන්නේ මාක්ස්ගේ දර්ශනික ද්‍රව්‍යවාදය පමණකි. ධනපතිවාදයේ පොදු ක්‍රමය තුළ නිර්ධන පංතියට හිමිව තිබෙන සැබෑ තත්වය පැහැදිලි කළේ මාක්ස්ගේ ආර්ථික න්‍යායය පමණකි.

ඇමෙරිකාවේ පටන් ජපානය දක්වාද, ස්වීඩනයේ පටන් දකුණු අප්‍රිකාව දක්වාද," නිර්ධන පංතියේ ස්වාධීන සංවිධාන වැඩි වර්ධනය වෙමින් පවතී. නිර්ධන පංතිය එහි පංති අරගලයේ යෙදීමෙන් අවබෝධය ලබමින් සහ අධ්‍යාපනය ලබමින්ද, ධනපති සමාජයේ දුර්මතයන් ඉවත දමා ඒවායින් නිදහස් වෙමින්ද, තව තවත් සමීප ලෙස එහි පිරිස් ඒකරාශී කර ගනිමින්ද, තම සාර්ථකත්වයන්ගේ තරම මැනීමට උගෙන ගනිමින්ද සිටියි. එය එහි බලවේගයන් දෘඩි කරගනිමින්, නොවැලැක්විය හැකි ලෙසටම වැඩෙන්නේය.

''ප්‍රොස්විශේනිය'' අංක 3,
1913 මාර්තු

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති,
5 වැනි මුද්‍රණය,
වෙළුම 23, පිටු 40-48.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

අපේ වැඩ පිළිවෙළ

වත්මන් කාලයේ ජාත්‍යන්තර සමාජ ප්‍රජාතන්ත්‍රවාදය දෘෂ්ටිමය අස්ථිරතාවයකින් පෙළෙයි. මෙතෙක් මාක්ස්ගේ සහ එංගල්ස්ගේ උගැන්වීම් විප්ලවවාදී න්‍යායයේ ස්ථිර පදනම් ලෙස පිළිගත් නමුදු, මෙම උගැන්වීම් නොසෑහෙන බවත් ඒවා යල්පැන ඇති බවත් ප්‍රකාශ කිරීම් දැන් හැම තැනින්ම ඇසේ. ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට පමණක් සීමා නොවූ, ඔවුන්ගේ සැලකිල්ලට භාජන වූ ප්‍රශ්නයක් කෙරෙහි සිය ආකල්පය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් කියා ගන්නා හැම කෙනෙකු විසින්මත්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පුවත්පතක් පළ කිරීමට කල්පනා කරන හැම කෙනෙකු විසින්මත් සුපැහැදිලි ලෙස විග්‍රහ කළ යුතුය.

අපි සම්පූර්ණයෙන්ම මාක්ස්වාදී න්‍යායය මත පදනම් වමු. සමාජවාදය මනෝරාජිකත්වයේ සිට විද්‍යාවක් දක්වා, පළමුවෙන්ම පරිවර්තනය කොට, මෙම විද්‍යාවට ස්ථිර පදනමක් දැමුවේත්, එහි සියලු කොටස් තව දුරටත් වර්ධනය කිරීමේ සහ විස්තර කිරීමේදී අනුගමනය කළ යුතු මග පෙන්වූයේත් මාක්ස්වාදය විසිනි. කම්කරුවා කුලියට ගැනීම, කම්කරු ශ්‍රමය කුලියට ගැනීම, ධනපතීන් අතළොස්සක් විසින්, ඉඩම්, පැක්ටරි, ආකර ආදිය අයිතිකරුවන් විසින් දේපල රහිත කෝටි සංඛ්‍යාත මිනිසුන් වහල් භාවයට ගැනීම වසන් කරන සමකාලීන ධනපති ක්‍රමයේ ස්වභාවය පළමු වරට හෙළිකළේ මාක්ස්වාදය විසිනි. මහා පරිමාණ නිෂ්පාදන කුඩා නිෂ්පාදන ඉවත් කිරීමේ ප්‍රවණතාවයක් සමකාලීන ධනවාදී සංවර්ධනය පෙන්වන අතර සමාජවාදී ක්‍රමයක හැකියාව සහ අවශ්‍යතාවය බිහිකරන බව මාක්ස්වාදය විසින් පෙන්වා

දෙන ලදී. මුල් බැසහත් සිරිත් වලට යටින් දේශපාලන කුමන්ත්‍රණ, බුද්ධිමත් නීති, කපටි ලෙස වෙළුණු උගැන්වීම්, පංති සටන — දේපල හිමි පංතීන්ට විරුද්ධව දේපල රහිත පොදු ජනතාව නිර්ධන පංතියේ නායකත්වයෙන් ගෙනයන විවිධ පංති සටන් වටහා ගැනීමට මාක්ස්වාදය අපට ඉගැන්විය. විප්ලවකාරී සමාජවාදී පක්ෂයක සැබෑ කාර්ය භාරයන් මොනවාද යන්න එය පැහැදිලි කළේය: සමාජය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ පිළිවෙළවල් ඉදිරිපත් කිරීම නොව, කම්කරුවන්ගේ තත්ත්වය යහපත් කරන ලෙස ධනපතීන්ට හා ඔවුන් වලිගවාදීන්ට දේශනා කිරීම නොව, කුමන්ත්‍රණ සංවිධාන කිරීම නොව, එහෙත් නිර්ධන පංතියේ පංති සටන් සංවිධානය කිරීමත්, එම සටන්වලට නායකත්වය දීමත්ය; මෙහි අවසාන අරමුණ විය යුත්තේ නිර්ධන පංතිය විසින් දේශපාලන බලය අල්ලා ගැනීම සහ සමාජවාදී සමාජයක් සංවිධාන කිරීමය.

දැන් අපි මෙසේ ප්‍රශ්න කරමු: මේ දවස්වල ඉමහත් ලෙස කෑගසන, ජර්මන් සමාජවාදී බර්න්ෂ්ටයින් වටා රොක්වී සිටින, හැකර කටවල් ඇති මේ ''ප්‍රකෘතිවාදීන්'' මෙම න්‍යායයට අළුතින් යමක් එකතු කර තිබේද? කිසිවක්, කොහෙත්ම එකතුකර නැත. මාක්ස් හා එංගල්ස් විසින් අපට භාරකරන ලද විද්‍යාව දියුණු කිරීමට මොවුහු එකද පියවරක්වත් නොගත්හ. ඔවුහු නිර්ධන පංතියට එකද අළුත් සටන් ක්‍රමයක් හෝ උගන්වා නැත්තාහ. නොදියුණු න්‍යායයන් වලින් කොටස් ණයට ගෙන, නිර්ධන පංතියට සටන් කිරීමේ න්‍යායයන් දේශනා කිරීම වෙනුවට, නිර්ධන පංතියේ දුෂ්ටතම සතුරන් වන ධනපති ආණ්ඩු හා ධනපති පක්ෂවලට වාසිදීමේ න්‍යායයන් දේශනා කරති. මේ ආණ්ඩු හා ධනපති පක්ෂ සමාජවාදීන් බිලීබෑමේ නව මාධ්‍යයන් සෙවීමේදී වෙහෙස නොබලා ක්‍රියා කරති. බර්න්ෂ්ටයින් විසින් මෑතදී ලියන ලද ''විවේචනය'' රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ එක් මූලාරම්භකයකු හා නායකයකු වන ප්ලෙහානව් විසින් දැඩි විවේචනයට භාජනය කිරීම සම්පූර්ණයෙන්ම නිවැරදිය. බර්න්ෂ්ටයින්ගේ මත ජර්මන් කම්කරුවන්ගේ නියෝජිතයින් විසින්ද (හැනෝවර් සමුළුවේදී) [2] දැන් ප්‍රතික්ෂේප කර ඇත්තේය.

මේ වචන නිසා චෝදනා රාශියක් අප වෙත එල්ල වෙතියි අපි බලාපොරොත්තු වෙමු; සමාජවාදී පක්ෂය 'ආධාන ග්‍රාහීත්වයෙන්' පිට පනින ''පාෂාණ්ඩයින්ටද'', ස්වාධීන සෑම මතයකටමද දඬුවම් දෙන ''සැබෑ ලබ්ධිකයින්ගේ'' නිකායක් දක්වා වෙනස් කිරීමටද අප ක්‍රියා කරතියි ඔවුන් කෑගසනු ඇත. මෝස්තර සහ ඇනුම්පද සහිත මේ වාක්‍ය ඛණ්ඩ අපි හොඳින් දනිමු. මේවායේ සත්‍යය හෝ බුද්ධිය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හෝ බිඳකුදු නැත. සියලු සමාජවාදීන් එක්සත් කරන විප්ලවවාදී න්‍යායයකින් තොරව, ශක්තිමත් සමාජවාදී පක්ෂයක් තිබිය නොහැකිය. සියලු සමාජවාදීන් ශක්තිය ලබා ගන්නේ මෙම න්‍යායයෙනි. සිය සටන් ක්‍රම වලදීත් සහ ක්‍රියාකාරීත්වයේ මාධ්‍යයන් හිදී ඔවුහු මෙම න්‍යායය ව්‍යවහාරයට ගනිති. යමකුගේ දැනීම අනුව නිවැරදියැයි හඟින න්‍යායයක් පදනම් විරහිත චෝදනා වලින් සහ එය දූෂණය කිරීමට දරන ප්‍රයත්නවලින් ආරක්ෂා කිරීම සියලු විවේචන වල හතුරකු වීමක් අදහස් නොකරයි. මාක්ස්ගේ න්‍යායය යම්කිසි සම්පූර්ණ, අනුල්ලංඝනීය දෙයක් ලෙස අපි නොසළකමු. විලෝම වශයෙන්, සමාජවාදීන් ජීවිතය සමග එක්වී ඉදිරියට යාමට කල්පනා කරති නම්, ඔවුන් විසින් හැම අතින්ම වර්ධනය කළ යුතු, විද්‍යාවක මුල්ගලට පමණක් මාක්ස් විසින් පදනම් දැමූ බව අපේ වැටහීමය. රුසියානු සමාජවාදීන් සඳහා මාක්ස්ගේ න්‍යායය ස්වාධීන ලෙස විස්තර විභාගයකට භසුකිරීම අවශ්‍ය බව අපි කල්පනා කරමු. මන්දයත්,මෙම න්‍යායය සාමාන්‍ය මග පෙන්වීමේ මූලධර්ම පමණක් ඉදිරිපත් කරන බැවිනි. මෙය එංගලන්තයේ ප්‍රංශයට වඩා වෙනත් ආකාරයකටද, ප්‍රංශයේ ජර්මනියට වඩා වෙනත් ආකාරයකටද, ජර්මනියේ රුසියාවට වඩා වෙනත් ආකාරයකටද ක්‍රියාවේ යොදවන බැවිනි. ඒ නිසා න්‍යායික ප්‍රශ්න සම්බන්ධ ලිපිවලට අපි අපේ පුවත්පතේ ඉඩකඩ ඉතා ප්‍රීතියෙන් සපයමු. විවාදයට තුඩු දෙන ප්‍රශ්න විවෘත ලෙස සාකච්ඡා කිරීමටද අපි සියලු සහෝදරවරුන්ට ආරාධනා කරමු.

සියලු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට පොදු වැඩ පිළිවෙල රුසියාව විසින් භාවිතයට ගැනීමේදී පැන නගින ප්‍රධාන ප්‍රශ්න මොනවාද? මෙම වැඩ පිළිවෙලේ හරය, නිර්ධන පංතියේ පන්ති සටන් සංවිධාන කිරීමද, එහි අවසාන අරමුණ නිර්ධන පංතිය විසින් දේශපාලන බලය අල්ලා ගැනීම සහ සමාජවාදී සමාජයක් පිහිටුවාලීම බව අපි කලින් සටහන් කළෙමු. නිර්ධන පංතියේ පංති සටන ආර්ථික අරගලයෙන් (කම්කරුවන්ගේ තත්ත්වය යහපත් කරලීම සඳහා පෞද්ගලික ධනපතීන්ට හෝ පෞද්ගලික ධනපති කණ්ඩායම්වලට හෝ විරුද්ධව අරගලය) සහ දේශපාලන අරගලයෙන් (ජනතාවගේ අයිතිවාසිකම් පුළුල් කිරීම සඳහා, එනම් ප්‍රජාතන්ත්‍රවාදය සහ නිර්ධන පංතියේ දේශපාලන බලය පුළුල් කිරීම සඳහා ආණ්ඩුවට විරුද්ධව ගෙනයන අරගලයෙන්) යුක්තය. සමහර රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෝ (මොවුන් අතර ''රබෝචය මීස්ල්''[3] කණ්ඩායමද මෙයට අයත් යැයි කිව හැකිය) ආර්ථික අරගලය වඩාත් වැදගත් යැයි සළකති. ඔවුහු අඩු වැඩි වශයෙන් දේශපාලන අරගලය ඈත අනාගතයට දමති. මෙම ස්ථාවරය සම්පූර්ණයෙන්ම සාවද්‍යය. කම්කරු පංතියේ ආර්ථික අරගලය සංවිධානය කිරීම අවශ්‍ය බවත්, කම්හල් හිමියන්ට විරුද්ධව එදිනෙදා අරගලයේදී, පැගීමේ සෑම ආකාරයකටම සහ අවස්ථාවකටමත් විරුද්ධව කම්කරුවන්ගේ අවධානය යොමුකිරීම සඳහාත්, මේ අනුව කම්කරු සංවිධාන ඇති කැර ගැනීමේ අවශ්‍යතාවය ඔවුනට ඒත්තු ගැන්වීම සඳහාත්, වැඩකිරීමේ අවශ්‍යතාවය සියලු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීහු පිළිගනිති, එහෙත් ආර්ථික අරගලය නිසා දේශපාලන අරගලය අමතක කර දැමීම, ජාත්‍යන්තර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම වලින් ඈත් වීමකි, කම්කරු පංතික ව්‍යාපාරයේ මුළු මහත් ඉතිහාසය අමතක කර දැමීමකි. ධනපති පංතියේ විශ්වාසවත් අනුගාමිකයෝ සහ ධනපති ආණ්ඩුවට සේවය කරන්නෝ කම්කරුවන්ගේ හුදු ආර්ථික සංවිධාන ඇති කිරීමට සහ මේ අනුව ''සමාජවාදීමය'' දේශපාලනයෙන් ඔවුන් ඈත් කරවාලීමට නොයෙක් වර ප්‍රයත්න දැරූහ. රුසියානු ආණ්ඩුවටද මෙවැනිම කටයුත්තක් භාර ගැනීමට සෑම හැකියාවක්ම ඇත. මෙම ආණ්ඩුව ඉතා කුඩා දීමනා නැතිනම්, ව්‍යාජ දීමනා ජනතාවට දීමට ඉදිරිපත් වූයේ ඔවුන් පෑගී සිටිතියිද, ඔවුනට කිසිදු අයිතියත් නැතැයිද යන හැඟීමෙන් ජනතාව ඈත් කරවනු පිණිසය. ජර්මනියේ සහ අනිකුත් සියලු යුරෝපීය රටවල මෙන් (තුර්කිය සහ රුසියාව හැරුණු විට) කම්කරුවන්ට රැස්වීම් තැබීමේ සහ සංවිධානය වීමේ අයතිය නිදහස් ලෙස පාවිච්චි කිරීමට ඉඩ නොදෙන්නේ නම්, කිසිදු ආර්ථික අරගලයකට කම්කරුවන්ගේ තත්ත්වය ස්ථිර ලෙස උසස් කරවාලිය නොහැකිය, එය විශාල පරිමාණයක් මත ගෙනයාම පවා කළ නොහැකිය. එහෙත් මේ අයිතිවාසිකම් දිනාගැනීම සඳහා දේශපාලන අරගලයක් ගෙනයාම අවශ්‍ය වේ. රුසියාවේ කම්කරුවන්ට පමණක් නොව, සියලු රට වැසියනට දේශපාලන අයිතිය අහිමි කර ඇත. රුසියාව නිරපේක්ෂ සහ සීමා රහිත රාජාණ්ඩුවකි. සාර් තනිවම නීති පනවයි, නිලධාරීන් පත්කොට ඔවුන් පාලනය කරයි. මේ හේතුව නිසා රුසියාවේ සාර් සහ සාර් ආණ්ඩුව සියලු පංතීන්ගෙන් නිදහස් බවත්, සියලු දෙනාටම එකසමාන සංග්‍රහයක් කරන බවත් පෙනීයා හැකිය. එහෙත් යථාර්ථය නම් සියලු නිලධාරීන් තෝරාපත් කරන්නේ සුවිශේෂයෙන්ම ඉඩම්හිමි පංතියෙනි. මේ හැම කෙනෙක්ම විශාල ධනපතීන්ගේ බලපෑමට යටවී සිටිති. මේ විශාල ධනපතියෝ තමන්ගේ බෙර පදයට ඇමතියන් නටවා, තමනට අවශ්‍ය සියලු දේ ලබාගනිති. රුසියානු කම්කරු පංතිය විය ගස් දෙකකට යටවී සිටී. ධනපතීන් සහ ඉඩම් හිමියන් විසින් කම්කරු පංතියෙන් සොරා ගෙන ඔවුන් කොල්ල කෑමට හසු කර ඇත. කම්කරු පංතියේ සටන් වළක්වාලනු පිණිස පොලිසිය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එහි අත් පා බැඳ, කට වසා දමා ඇත. ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගන්නා සෑම ප්‍රයත්නයටම භයානක දඬුවම් පමුණුවති. ධනපතීන්ට විරුද්ධව ගෙනයන හැම වැඩ වර්ජනයකදීම, යුද්ධ හමුදව, සහ පොලිසිය කම්කරුවන්ට පහර දෙති. සෑම ආර්ථික අරගලයක්ම අවශ්‍යයෙන්ම, දේශපාලන අරගලයක් බවට පත්වේ. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය මේ සටන් දෙක නිර්ධන පංතියේ එකම පංති අරගලයක් ලෙස එකිනෙක අඛණ්ඩ ලෙස වෙළිය යුතුය. මෙවැනි අරගලයක ප්‍රථම හා ප්‍රධාන අරමුණ විය යුත්තේ, දේශපාලන අයිතිය දිනාගැනීමය, දේශපාලන නිදහස දිනාගැනීමය. පිටර්ස්බර්ගයේ කම්කරුවන්ට තනිවම සමාජවාදීන්ගේ සුළු ආධාරයද ඇතිව, වැඩකරන පැය ගණන අඩුකිරීමේ නීතියක් සම්මත කරවා ගැනීමට සමත්වීම නිසා ආණ්ඩුවෙන් වාසියක් ලබා ගැනීමට[4] හැකි වී නම්, එකම සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයක නායකත්වයක් යටතේ, ස්ථිර අරගලයන් මගින්, අසමාන ලෙස වඩාත් වැදගත් අයිතීන් දිනාගැනීමට රුසියානු කම්කරු පංතිය සමත් වනු ඇත.

වෙනත් පංතියක ආධාරය නොලැබුණද, රුසියානු කම්කරු පංතියට සිය ආර්ථික හා දේශපාලන සටන් තනිවම ගෙනයාමට පුළුවන. එහෙත් දේශපාලන අරගලයේදී කම්කරුවෝ තනිවී නැත්තාහ. නිදහසේ සිතීමට හා නිදහසේ කතාකිරීමට දඬුවම් පැමිණවීම නිසා එවැන්නක් සමග කොහෙත්ම සමාදන වීමට අකැමැති අවංක මිනිසුන්ගේ කෝපය පොදු ජනතාවට කිසිදු අයිතියක් නොමැතිවීම සහ "බෂී-බුසුක්" නිලධාරින්ගේ නීතිවිරෝධී කටයුතු විසින් කුප්පනු ලැබෙයි. මෙය අධික දඬුවම් වලට භාජනය වී සිටින පෝලන්ත, ෆින්ලන්ත, යුදෙව් ජාතිකයින්ගේ සහ රුසියානු ආගමික නිකායවල කෝපයටද හේතු වී ඇත. එය, නිලධාරින්ගේ හා පොලීසියේ අධික දඬුවම් වලින් ආරක්ෂාවක් ලබාගත නොහැකි, කුඩා වෙළෙන්දන්ගේ, නිෂ්පාදකයින්ගේ සහ ගොවීන්ගේ කෝපයටද හේතු වී ඇත්තේය. ජනගහණයේ මෙම කාණ්ඩවලට තනි තනිවම ස්ථිර දේශපාලන අරගලයක් ගෙනයා නොහැකිය. එහෙත් කම්කරු පංතිය මෙම අරගලයේ ධජය එසවූ විට, එයට හැම පැත්තකින්ම ආධාර ලැබෙනු ඇත. ජනතාවගේ අයිතිය සඳහා සටන් කරන සියලු දෙනාගේද, ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සටන් කරන සියලු දෙනාගේද නායකයා බවට රුසියන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය පත්වන අතර එවිට එය අනභිභවනීය වනු ඇත!

මේවා අපේ මූලික මතයන්ය. අපේ පුවත්පත මගින් අපි මේ මත ක්‍රමානුකූලව සෑම අංශයකින්ම වර්ධනය කරමු. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ ප්‍රකාශිත "ප්‍රකාශනය" මගින් සටහන් කර තිබෙන මග ඔස්සේ අපට ඉදිරියට යාමට හැකිබව අපි තරයේම විශ්වාස කරමු.

1899 ඔක්තෝබර් මාසයට පසුව ලියන ලදී.

පළමුවැනි වරට 1925 දී ලෙනින්ගේ තුන්වැනි කෘති සංග්‍රහයේ මුද්‍රණය කරන ලදී.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, වෙළුම 4, පිටු 182-186

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

‘‘කළ යුත්තේ කුමක්ද?’’ යන පොතෙන්

ආර්ථිකවාදයේ[5] ප්‍රථම ශාස්ත්‍රීය ප්‍රකාශනයේම ඉතාමත් අරුම සහගත ලක්ෂණයක් දක්නට ලැබේ. වර්තමාන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අතර පවතින අසමථයන්ගේ ස්වභාවය, එයින් නිරූපනය වන නිසා, එම අසමථයන් සියල්ලම ගැන වටහා ගැනීමට එය ඉවහල් වේ. එම ලක්ෂණය නම්, ‘‘පිරිසිදු හා පැහැදිලි කම්කරු ව්‍යාපාරයට’’ පක්ෂපාත වූ ද, නිර්ධන පංති අරගලය හා සමග සමීප ‘‘ඓන්ද්‍රිය’’ (‘‘රබෝචිය දියල’’[6] වචන) සම්බන්ධකම් පැවැත්වීම වන්දනීයත්වයට නංවන්නා වූ ද කම්කරු නොවන බුද්ධිමතුන්ට (සමාජවාදී බුද්ධිමතුන්ට පවා) විරුද්ධ වන්නා වූ ද අය ස්වකීය මත සනාථ කිරීම හා නිවැරදි බව පෙන්වීම සඳහා, ධනේශ්වර ‘‘පිරිසිදු වෘත්තීය සමිතිවාදීන්’’ ගේ තර්ක යොදා ගැනීම ය. මෙයින් පෙනෙන්නේ ආරම්භයේ පටන්ම ‘‘රබෝචිය මීස්ල්’’ පත්‍රය අවිඥාත ලෙස “Credo”[7] වැඩ පිළිවෙළ ක්‍රියාත්මක පටන් ගත් වග ය. මෙයින් පෙනෙන්නේ, කැමති වුනත් නැතත්, සාංසිද්ධිකතාවයට කෙරෙන සැම වන්දනමානයකින් ම, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ‘‘විඥාත ස්වභාවයෙන්’’ ඉටුවන කාර්ය කොටස ලඝු කොට දැක්වීමට කරන සැම කටයුත්තකින් ම, සිදු වන්නේ කම්කරුවන් කෙරෙහි පානු ලබන ධනේශ්වර දෘෂ්ටියේ බලය ශක්තිමත් වීම බවයි (මෙය ‘‘රබෝචිය දියල’’ට තේරුම් ගත නොහැක). ‘‘දෘෂ්ටියෙහි වැදගත්කම අභිවාදනය කිරීම’’* හා විඥාත ස්වභාවයෙන් ඉටු කෙරෙන කාර්ය කොටස අතිශයෝක්තියෙන් කීම*, යනාදිය ගැන දෙඩවන අය, සියළු දෙනාම කල්පනා කරන්නේ, කම්කරුවෝ ඔවුන්ගේ ඉරණම නායකයන් අතින් උදුරා ගනිත් නම්, ඒ පමණින් ම, පිරිසිදු හා පැහැදිලි කම්කරු පංති ව්‍යාපාරය, තමන්ගේ ම දෘෂ්ටියක් නිර්මාණය කර ගැනීමෙ හැකියාව ලබන බවයි — තමන්ගේ ම දෘෂ්ටියක් නිර්මාණය කර ගනු ඇතැයි යනුයි. නමුත්, මෙය බර පතල වැරදීමකි. ඉහත සඳහන් කරුණු වලට අමතරව, ඕස්ත්‍රියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ කෙටුම්පත් වැඩ පිළිවෙළ ගැන වූ කාල් කෞට්ස්කිගේ පහත සඳහන් කියමන ද, මෙහි ලා උපුටා දක්වන්නෙමු:

‘‘ආර්ථික සංවර්ධනය හා පංති අරගලය විසින්, සමාජවාදී නිෂ්පාදනය සඳහා අවශ්‍ය තත්වයන් පමණක් නොව, සමාජවාදය අවශ්‍ය දෙයකැයි යන විඥානය ද (අවධාරණය කෝ. කෝ. ගේ ය) සෘජු ලෙසම නිර්මාණය කරනු ලබන බව, මාක්ස් අවධාරණයෙන් ප්‍රකාශ කළේ යයි, අපගේ සංශෝධනවාදීහු බොහෝ දෙනෙක් විශ්වාස කරති. එමෙන් ම, ධනේශ්වර ක්‍රමයේ ඉතාමත් සංවර්ධිත රට වූ එංගලන්තය, අනිත් සැම රටකට ම වඩා විඥාත භාවය අතින් පසුබා සිටින බව ද, මෙම විවේචකයෝ සත්ත කර කියති. කෙටුම්පත අනුව බලන කල, මෙසේ කියා ප්‍රතික්ෂේප කරන, නැත හොත්, සාධර්මික-මාක්ස්වාදී අදහසක් වශයෙන් හැඳින්වෙන දෙය, ඕස්ත්‍රියානු වැඩ පිළිවෙළ කෙටුම්පත් කළ කාරක සභාව විසින් ද, පිළිගන්නා ලදැයි කෙනෙකුට සිතා ගැනීමට ඉඩ තිබේ. ‘‘ධනේශ්වර සංවර්ධනය නිසා නිර්ධන පංතිකයන් වැඩි වන තරමට, අනිවාර්ය ලෙසම ධනපති පංතියට විරුද්ධව සටන් කිරීමට නිර්ධන පංතියට සිදු වේ. නිර්ධන පංතිය ඒ සඳහා සුදුසු තත්වයට පැමිණේ’’. සමාජවාදය පිහිටුවීමේ හැකියාව සහ එහි අවශ්‍යතාවය ගැන, ‘‘එම පංතියට විඥානය උදා වේ’’. මේ අනුව බලන කල, සමාජවාදී විඥානය යනු, නිර්ධන පංතියේ පංති අරගලයේ අවශ්‍ය සහ සෘජු ප්‍රතිඵලයක් වන බව පෙනේ. එහෙත් මෙය සාකල්‍යයෙන් ම අසත්‍ය ය. නිර්ධන පංතියේ පංති අරගලයේ මෙන් ම, න්‍යාය ධර්මයක් වශයෙන් සමාජවාදයේ ද, මුල් විහිදී තිබෙන්නේ නූතන ආර්ථික සම්බන්ධකම් අතර වන බවත්, එමෙන් ම, නිර්ධන පංති අරගලය හා සමානව ම, සමාජවාදය ද පැන නගින්නේ, ධනේශ්වරය විසින් ජනතාව අතර උදා කරන දරිද්‍රතාවයට හා දුක්ඛිත තත්වයට විරුද්ධව කරන අරගලයෙන් වන බවත්, සැබෑ ය. එහෙත් සමාජවාදය හා පංති අරගලය මතු වන්නේ එක පෙළට මෙනි. එකකින් අනික මතු වන ආකාරයට නොවේ. එකක් පැන නගින්නේ අනිකට වෙනස් තත්වයන් යටතේ ය. නවීන සමාජවාදී විඥානය ඇති විය හැක්කේ, ගැඹුරු විද්‍යාත්මක දැනුම පදනම් කර ගෙන පමණකි. නවීන ආර්ථික විද්‍යාව ද, නවීන තාක්ෂණික ශිල්පය තරමට ම, සමාජවාදී නිෂ්පාදනය සඳහා ඇත්තෙන් ම අවශ්‍ය වන කොන්දේසියකි. නිර්ධන පංතිය කොතරම් ආශා කළත්, එයට

---

* ‘‘ඉස්ක්‍රා’’ අංක 12 හි ආර්ථිකවාදීන්ගේ ලිපිය.

* ‘‘රබෝචිය දියල’’ අංක 10.

* “Neue Zeit” 1901-1902, XX, 1 අංක 3, පිටුව 79. කෞට්ස්කි සඳහන් කරන කාරක සභා වාර්තා (පසුගිය වසර අගදී) වියානා සම්මේලනය විසින් සුළු සංශෝධන සහිතව සම්මත කරන ලදී.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඒ දෙකෙන් එකක් වත් නිර්මාණය කර ගත නොහැකි. ඒ දෙකම පැන නගින්නේ, නවීන සමාජ ක්‍රියාදමයෙනි. විද්‍යාවේ ප්‍රගමනය සිදු වන්නේ නිර්ධන පංතිය නැමති වාහනයෙන් නො වේ; ධනේශ්වර බුද්ධිමතුන් මගිනි (අවධාරණය කේ. කේ. ගේ ය). සමාජවාදයේ සමාරම්භය වූයේ, මෙම ස්ථරයේ එක්, එක් සාමාජිකයන්ගේ සිත් තුළ ය. බුද්ධි වර්ධනය ලත් නිර්ධන පංතියට ඔවුන් ඒ ගැන දැන්වූ පසු, තත්වය අනුව හා ඉඩ කඩ ඇති ලෙසට ඒ අය විසින් එය පංති අරගලය සඳහා යොදා ගන්නා ලදී. ඒ නිසා, සමාජවාදී විඥානය යනු, නිර්ධන පංති අරගලයට පිටතින් ඇතුල් කරන ලද්දක් (von außen Hineingetragenes) මිස, එය අභ්‍යන්තරයෙන් සාංසිද්ධික වශයෙන් (urwüchsig) පැන නැගුණු දෙයක් නොවේ. ඒ අනුව නිර්ධන පංතියේ තත්වය ගැන විඥානය හා එහි කර්තව්‍ය ගැන විඥානය එය තුළට කැවීම (වචනාර්ථයෙන් කියතොත් උරා ගන්නට සැලැස්වීම) සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කර්තව්‍යය වන බව, පැරණි හයින්ෆේල්ඩ් වැඩ පිළිවෙළෙහි සඳහන් කර තිබීම, ඉතාමත් නිවැරදි ය. විඥානය පංති අරගලයෙන් ස්වයං-ජාත වීනම්, මෙය අවශ්‍ය නො වේ. පැරණි වැඩ පිළිවෙළේ මෙම අදහස පිටපත් කර ගෙන, එය අළුත් කෙටුම්පතෙහි ඉහත සඳහන් අදහසට ඈඳන ලදී. එහෙත්, ඒ හේතු කොට ගෙන චින්තාවලිය සම්පූර්ණයෙන්ම බිඳී ගියේය...''

වැඩ කරන ජනතාවගේ අරගලයේ ක්‍රියාදමය අතර තුර දී, ඔවුන් විසින් ම සකස් කර ගත හැකි දෘෂ්ටියක් ගැන කීමට නො හැකි හෙයින්*, තෝරා ගැනීමට තිබෙන්නේ, එක්කෝ ධනපති දෘෂ්ටිය, නැතහොත්,

* දෘෂ්ටියක් නිර්මාණය කර ගැනීමේ දී, කම්කරුවන් විසින් ඉටු කරනු ලබන කාර්ය කොටසක් නොමැතිය යන්න, මෙයින් කිසි සේත් අදහස් නො වේ. එහෙත් ඔවුන් ඊට සහභාගී වන්නේ කම්කරුවන් වශයෙන් නොව, ප්රුදොන්ලා, වයිත්ලිංලා ලෙසට, සමාජවාදී න්‍යාය-වාදීන් වශයෙනි. වෙනත් වචන වලින් කියතොත් ස්වකීය යුගයේ දැනුම අඩු වැඩි පමණින් ලබා ගැනීමට හා එම දැනුම සංවර්ධනය කර ගැනීමට හැකි කල්හි, ඔවුහු ඊට සහභාගී වෙති. එහෙත් වැඩ කරන ජනයාව, මෙය වැඩි වැඩියෙන් කළ හැකි වනු පිණිස, පොදුවේ කම්ක-රුවන්ගේ විඥාන මට්ටම උසස් කිරීමට සෑම ප්‍රයත්නයක් ම දැරිය යුතුය. ''කම්කරුවන් සඳහා සාහිත්‍යය'' යන කෘත්‍රිම සීමාවන්ට කොටු නො වී, කම්කරුවන් වැඩි වැඩියෙන් පොදු පොත පත හැදෑරීමට යොමු කිරීමට කටයුතු යෙදීම අවශ්‍ය ය. මෙහිදී, ''කොටු නොවී'' යන්නට වඩා ''කොටු කර නො තබා'' යන්න යෙදීම වඩාත් නිවැරදි ය. බුද්ධිමතුන් සඳහා ලියන ලද සියළුම පත පොත කියවීමට කම්ක-රුවන් කැමති වන අතර, ඔවුනට පැක්ටරිවල තත්වයන් ගැන කරුණු ටිකක් කීමත්, බොහෝ කාලයක් තිස්සේ ඔවුන් දැන සිටි දෙය නැවත නැවතත් කීමත්, ප්‍රමාණවත් යයි අදහස් කරන්නේ (නරක) බුද්ධිමතුන් කීප දෙනෙක් පමණකි.

සමාජවාදී දෘෂ්ටිය යන දෙකෙන් එකක් පමණකි. මැද මාර්ගයක් නොමැත (මිනිසා ''තුන්වැනි'' දෘෂ්ටියක් නිර්මාණය කර නොමැත. ඒ පමණක් නොව, පංති ප්‍රතිවිරෝධතාවයන් ගෙන් බෙදී ගිය සමාජයක, පංතියකට නැති, නැතහොත්, පංති අභිබවා සිටින, දෘෂ්ටියක් තිබෙනු ද නො හැකි ය). එහෙයින්, කුමණ හෝ ආකාරයකින් වුවද සමාජවාදී දෘෂ්ටිය ලඝු කොට දැක්වීමත්, ලේශ මාත්‍ර වශයෙන් හෝ ඉන් ඉවතට හැරීමත්, යනුවෙන් අදහස් වන්නේ, ධනේශ්වර දෘෂ්ටිය ශක්තිමත් කිරීම ය. සාංසිද්ධිකතාවය ගැන බොහෝ සෙයින් කථා කරනු ලැබේ. ඒ නමුත්, කම්කරු ව්‍යාපාරයේ ''සාංසිද්ධික'' සංවර්ධනයෙන් එය යොමු වන්නේ එය ධනේශ්වර දෘෂ්ටියට යටත් වන තැනට ය — "Credo" වැඩ පිළිවෙළෙහි ක්‍රියාමාර්ගය අනුව සංවර්ධනය වීමට ය. එසේ වන්නේ, කම්කරු පංතියේ සාංසිද්ධික ව්‍යාපාරය යනු, වෘත්තීය සමිති-වාදය Nur-Gewerkschaftlerei වන හෙයිනි. එමෙන් ම වෘත්තීය සමිතිවාදය යනුවෙන් අදහස් වන්නේ, කම්කරුවන් ධනේශ්වර පංතියේ දෘෂ්ටියට වහල් වීමේ තත්වයට පත් වීම වන හෙයිනි. සාංසිද්ධිකතාවයට විරුද්ධව සටන් කිරීමත්, ධනේශවර පංතියේ බල පෑමට හසු වීමට කම්කරු පංති ව්‍යාපාරය දරන මෙම සාංසිද්ධික සහ වෘත්තීය සමිතිවාදී උත්සාහයෙන් එය ඉවතට යොමු කිරීමත්, එය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂාව යටතට ගෙන ඒමත්, අපගේ කර්තව්‍යය එනම්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කර්තව්‍යය වන්නේ, එහෙයිනි. එනිසා, ද්‍රව්‍යමය මූල ධර්ම සහ ද්‍රව්‍යමය වටපිටාව අතර සිදු වන්නා වූ, අන්තර් ක්‍රියාකාරිත්වයෙන් නිශ්චය කෙරෙන මාර්ගයෙන් ඉවතට කම්කරු පංතිය යොමු කිරීමට, ඉතාමත් ප්‍රබුද්ධ දෘෂ්ටිවාදීන් වුව ද සමත් නො වෙතියි යනුවෙන්, ''ඉස්ක්‍රා''[8] අංක 12 හි පළ කරන ලද] ''ආර්ථිකවාදී'' ලිපියෙහි කර්තෘවරුන් යොදා ගත් වාක්‍යය සමාජවාදය ප්‍රතික්ෂේප කිරීමක් හා සමාන වේ. ලේඛක හා මහජන කටයුතු පිළිබඳ සටන් භූමියට අවතීර්ණ වන, සෑම කෙනෙක් ම කළයුතු වන සේ, මෙම කර්තෘ වරුන් ද තමන් කියන දේ ගැන නිර්භය, ස්ථිර හා දැඩි ලෙස සලකා බැලීමට සමත් වී නම්, ඔවුන්ගේ ''හිස් ලය මත ඔවුන්ගේ වැඩකට නැති දෑත් බැඳ ගෙන සිටීමත්'' ... කම්කරු ව්‍යාපාරය'' ඉතාමත් අබාධිත ක්‍රියාමාර්ගය ඔස්සේ'', එනම්, ධනේශ්වර වෘත්තීය සමිති මාර්ගය ඔස්සේ, ඇදගෙන යන ස්ත්රුවේලාට හා ප්‍රකපෝවිච්ලාට සටන් භූමිය භාර දීම හෝ, එසේ නැතහොත්, එම ව්‍යාපාරය දේවගැති හෝ පොලිස් හේවා ''දෘෂ්ටිය'' ඔස්සේ ඇද ගෙන යන සුබාතව්ලාට භාර දීම හැර, තමන්ට කිරීමට ඉතිරි වෙනත් දෙයක් නොමැති බව ඔවුනට පෙනෙනු ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අපි ජර්මන් නිදර්ශනය ගැන සිහිපත් කරමු. ලසාල් ජර්මන් කම්කරු ව්‍යාපාරයට කළ සේවය කුමක් ද? එය නම්, (ෂුල්ත්සේ-දෙලිච් හා එවැනි අයගේ කාරුණික ආධාර ඇතිව) ක්‍රමිකවාදී වෘත්තීය සමිතිවාදය සහ සමුපකාරවාදය කරා ගමන් කරමින් තිබූ එම ව්‍යාපාරය, එම මාර්ගයෙන් ඉවතට යොමු කිරීමය. එවැනි කර්තව්‍යයක් සාර්ථක කිරීම සඳහා, කළ යුතු වූයේ, සාංසිද්ධිකතාවයේ වැදගත්කම සුළු කොට තැකීම ගැන, ක්‍රියාදමයක් වන උපක්‍රම ගැන හා මූලධර්ම සහ වටපිටාව අතර සිදු වන අන්තර් ක්‍රියාකාරිත්වය යනාදිය ගැන කථා කිරීමට වඩා හාත්පසින් ම වෙනස් දෙයකි. ඒ සඳහා, සාංසිද්ධිකතාවයට විරුද්ධව දරුණු අරගලයක් කිරීමට සිදු විය. නිදර්ශනයක් වශයෙන්, ක්‍රමිකවාදී පක්ෂයේ බල පවුරක් බවට පත් වී සිටි බර්ලින් වැඩ කරන ජනතාව, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කදිමතම බල කඳවුරක් බවට පරිවර්තනය කළ හැකි වූයේ, අවුරුදු ගණනක් තිස්සේ කළ, එවැනි අරගලයකින් පසුව පමණකි. (ප්‍රකපෝව්ච්ගෙන් ජර්මන් ව්‍යාපාරයේ ඉතිහාසයත්, ස්ත්‍රුවේගෙන් එහි දර්ශනයත් ඉගෙන ගන්නා අය, එම අරගලය අවසන් යයි සිතනු හැකි වුවද) තවමත් එම අරගලය කිසි ලෙසකින්වත් අවසන් වී නොමැත. ජර්මන් කම්කරු පංතිය, දැනුදු දෘෂ්ටිවාද කීපයක් අතර බෙදී සිටින බව කිව හැක. එක් කොටසක් කතෝලික රාජාණ්ඩුවාදී සංගම් තුළ සංවිධානය වී සිටිති. තවත් කොටසක්, ඉංග්‍රිසි වෘත්තීය සමිතිවාදයට නමස්කාර කරන ධනේශ්වරයන් විසින් ආරම්භ කරන ලද හිර්ෂ්-දුන්කෙර් සමිති[9] තුළ සංවිධානය වී සිටිති. තුන් වැනි කොටස, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංගම් තුළ සංවිධානය වී සිටිති. මෙහි අන්තිමට සඳහන් කොටස, සංඛ්‍යාවෙන් අනික් කණ්ඩායම් අභිබවන නමුත්, එය එම තත්වය දිනා ගැනීමෙහි සමත් වූයේ හා රැක ගැනීමෙහි සමත් වන්නේ අනිකුත් දෘෂ්ටිවාද සියල්ලටම විරුද්ධව ස්ථිරසාර අරගලයක් කිරීමෙන් පමණකි.

එහෙත්, සාංසිද්ධික ව්‍යාපාරය මගින්, නැතහොත්, ඉතාමත් අබාධිත ව්‍යාපාරය මගින්, ධනේශ්වර දෘෂ්ටියේ ආධිපත්‍යයට මග පෑදෙන්නේ කෙසේ ද? යනු පාඨකයා විමසනු ඇත. ධනේශ්වර දෘෂ්ටිය, සමාජවාදී දෘෂ්ටියට වඩා බොහෝ කලින් ආරම්භ වීමත්, වඩා හොඳින් සංවර්ධනය වී තිබීමත්, එය පැතිර වීම සඳහා මෙතෙකැයි කිව නො හැකි තරම් අධිකතර මාධ්‍යයන් සමූහයක් එය සතුව තිබීමත් නිසා එසේ වන්නේ ය*. කිසියම් නිශ්චිත රටක, සමාජවාදී ව්‍යාපාරය ලා බාල වූ තරමට,

---

* කම්කරු පංතිය සාංසිද්ධික වශයෙන් සමාජවාදය වෙත ඇදී යන බව නිතර කියනු ලැබේ. සමාජවාදය, අන් කිසිම න්‍යායයකට

එය, සමාජවාදී නොවන දෘෂ්ටි ශක්තිමත් වීමට දරන සියළු ප්‍රයත්නයන්ට විරුද්ධව වඩ වඩාත් බලවත් ලෙස අරගල කළ යුතු වන්නේ ය; "විඥත ස්වභාවය අභිවාදනය කිරීම" ආදිය ගැන ඝෝෂා කරන උපදේශකයන්ගෙන් ප්‍රවේසම් වන ලෙසට වඩාත් අධිෂ්ඨාන සහගත ලෙස කම්කරුවන්ට අනතුරු හඟවා තැබිය යුතුය. ව්‍යාපාරයේ ළදරු අවධියේ නො රුස්නා ගතිය ගැන, "ආර්ථිකවාදී" ලිපියේ කර්තෘ වරු, "රබෝචිය දියල" පත්‍රය හා සමඟ එක හඬින් දෝෂාරෝපනය කරති. අපි ඊට මෙසේ පිළිතුරු දෙන්නෙමු: ඔව්, අපගේ ව්‍යාපාරය ළදරු අවධියේ පවතින බව ඇත්ත ය. එය වේගයෙන් වැඩී යනු පිණිස, සාංසිද්ධිකතාවයට වහල් වීම තුළින් එහි වර්ධනයට බාධා කරනවුන් නොරිස්සීමේ ගතිය එය තුළට කාවැද්දිය යුතු ය. තමන්, අරගලයේ තීරණාත්මක අවධි සම්බන්ධයෙන් බොහෝ කලක් තිස්සේ අත් දැකීම් ලත් "පරණ අය" වෙති යි බොරුවට හැඟවීම තරම් හාස්‍ය ජනක වෙනත් දෙයක් නැත.

1901 ශරත් සෘතුව
හා 1902 පෙබරවාරි අතර
කාලයේදී ලියන ලදී.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති,
වෙළුම 6, පිටු 37-42.

1902 මාර්තු මාසයේදී
වෙනම පොතක් ලෙස
ෂ්ටුට්ගාර්ට් හිදී
මුද්‍රණය කරන ලදී.

වඩා ගැඹුරු ලෙස හා නිවැරදි ලෙස, කම්කරු පංතියේ දරිද්‍රතාවයට හේතුව හෙළිදරව් කරන අතර, එම හේතුව නිසා, එය කම්කරුවන්ට වඩාත් පහසුවෙන් වටහා ගැනීමට හැකි වීමේ අර්ථයෙන් එය, සම්පූර්ණයෙන් ම සත්‍ය වේ. එහෙත්, එය එසේ වන්නේ, එම න්‍යායය ස්වයං උවමනාවෙන් ම සාංසිද්ධිකතාවයට ඉඩ දීම නො කළහොත් හා තමන්ට සාංසිද්ධිකතාවය යටත් කර ගතහොත් පමණකි. සාමාන්‍ය වශයෙන් මෙය සිදු වෙතැයි යනු අපේක්ෂා කෙරෙන නමුත්, "රබෝචිය දියල" පත්‍රය අමතක කරන්නේ ද, විකෘති කරන්නේ ද, මෙයම ය. කම්කරු පංතිය සාංසිද්ධික වශයෙන් සමාජවාදය වෙත ඇදී යයි. එසේ වුවද, ඉතාමත් පුළුල් ලෙස පැතිරී තිබෙන (හා නිරතුරුව හා නේකාකාර ලෙස නව ජීවයක් දෙනු ලබන) ධනේශ්වර දෘෂ්ටිය ඊටත් වැඩි තරමින් එහි ආධිපත්‍යය කම්කරු පංතිය කෙරෙහි විහිදුවයි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පක්ෂ සංවිධානය සහ පක්ෂ සාහිත්‍යය

ඔක්තෝබර් විප්ලවයට ඉක්බිතිව, රුසියාවේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී වැඩ සඳහා පැන නැගී ඇති නව තත්වයන් විසින් පක්ෂ සාහිත්‍යය පිළිබඳ ප්‍රශ්නය ඉදිරියට ගෙනැවිත් ඇත. නීත්‍යානුකූල සහ නීතිවිරෝධී ජනසන් නිවේදනයේ ඇති වෙනස — රදළ, ස්වෛරීතන්ත්‍ර රුසියාවේ ඒ කනගාටුදයක උරුමය අතුරුදහන් වීමට පටන්ගෙන තිබේ. එය තවම අභාවයට පත්වී නැත, කොහෙත්ම නැත. "කම්කරු මන්ත්‍රීවරුන්ගේ සෝවියට් සභාවල ඉස්වෙස්තිය" පුවත්පත[10] "නීති විරෝධී" ලෙස මුද්‍රණය කිරීමට තරම් තත්වයක් ඇති වන පරිදි අපේ අගමැතිගේ කෛරාටික ආණ්ඩුව වියරු වැටී සිටී. එහෙත් මෙයින් ආණ්ඩුවට අපකීර්තියක් ඇති වනවා විනා, එය සඳවාරාත්මක පහරවලට ගොදුරු වනවා විනා, පාගා දැමීමට තරම් ශක්තියක් නැති ආණ්ඩුවක් විසින් ගෙනයන අමන ප්‍රයත්න වලින් කිසිදු ඵලයක් ඇති නොවේ.

නීත්‍යානුකූල සහ නීති විරෝධී ජනසන් නිවේදන අතර වෙනසක් තිබෙන තුරු, පාක්ෂික සහ අපාක්ෂික ජනසන් නිවේදන පිළිබඳ ප්‍රශ්නය ඉතා ව්‍යාජ සහ විකෘති අන්දමට විසඳන ලදී. මුළු මහත් නීති විරෝධී ජනසන් නිවේදන, සංවිධාන සහ කාණ්ඩ විසින් ප්‍රසිද්ධ කරන ලද පක්ෂයේ ජනසන් නිවේදන (පුවත්පත්) විය. මේවා එක් හෝ තවත් විදිහකින් ප්‍රායෝගික පාක්ෂිකයින්ගේ කණ්ඩායම් සමග සම්බන්ධ වී තිබිණි. දේශපාලන පක්ෂ තහනම් කර තිබුණු බැවින් මුළු මහත් නීත්‍යානුකූල ජනසන් නිවේදන අපාක්ෂික විය. එහෙත් එය එක් පක්ෂයකට හෝ තවත් පක්ෂයකට "ඇදී යන්නට විය. අස්වාභාවික සංගම්, අරුම-පුදුම සගයින් සමග එකට ලැගීම, ව්‍යාජ ආවරණ නොවැළැක්විය හැකිවිය. පක්ෂයේ අදහස් ප්‍රකාශ කිරීමට කැමති, බලය විසින් යට කරන ලද මිනිසුන්ගේ සංචිතය, එවැනි අදහස් තරම් දියුණු නොවූවන්ගේ බුද්ධිමය අපරිණතභාවය නැති නම් බුද්ධිමය නිවටත්වය සමග මිශ්‍රණය විය. මේ මිනිස්සු ඇත්ත වශයෙන්ම පක්ෂයේ මිනිසුන් නොවූහ.

ඊසොප්ගේ බස් වහරේ ශාපලත් අවධියකි, සාහිත්‍යමය පරාධීනත්වයකි, වහල් භාෂණයකි, දෘෂ්ටිමය ප්‍රවේණිදසත්වයෙකි! රුසියාවේ සෑම ජීවමය සහ ප්‍රණීත දෙයක්ම මරා දැමූ මේ නීච වටපිටාව අවසානයේදී නිර්ධන පංතිය විසින් අහෝසි කර දමන ලදී. එහෙත් මේ වනතුර රුසියාවට අර්ධ නිදහසක් පමණක් නිර්ධන පංතිය දිනා ගත්තේය.

විප්ලවය තවම සම්පූර්ණ වී නැත. විප්ලවය පරාජය කිරීමට සාර්වාදයට තව දුරටත් ශක්තියක් නැති අතර සාර්වාදය පරාජය කර දැමීමට තරම් ශක්තියක් විප්ලවයට තවම ලැබී නැත. මේ විවෘත, සෘජු, නියත සහ ස්ථිර පාක්ෂික ආස්වාදයේ සහ රහස්, සැඟවුණු "රාජ්‍යතන්ත්‍රික" සහ ප්‍රයෝගකාරී නීත්‍යානුකූලත්වයේ අස්වාභාවික සංයෝජනයක් හැමතැනකදීම සහ හැම දෙයකම ක්‍රියාවේ යෙදෙන අවධියක අපි ජීවත්වෙමු. මේ අස්වාභාවික සංයෝජනය අපේ පුවත්පත් වලින් පවා අපට දැනේ. මධ්‍යස්ථ ලිබරල් ධනපති පුවත්පත් පවා තහනම් කැරෙන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රජා පීඩනයක් ගැන ගුච්කොව් මහතා කොතෙක් තියුණු උපහාස ඇද බැවද, ඒකාධිපති පොලිස් රුසියාවේ, රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ මධ්‍යම පුවත්පත වන "ප්‍රොලිතාරි" තවම සීල් තබා, යතුරු ලා පවතින බව සත්‍යයකි.

ඒ කෙසේ වුවද, විප්ලවය අඩ වශයෙන් සාර්ථක වී තිබෙන බැවින්, අපේ සියලු දේ අළුත් ප්‍රතිපත්ති මත වහාම සංවිධානය කිරීමට අපට සිදුවී ඇත. අද සාහිත්‍යයට, "නීත්‍යානුකූල ලෙස" ප්‍රසිද්ධ කරන දේ වලට පවා දහයෙන් නව පංගුවක් පාක්ෂික සාහිත්‍යය විය හැකිය. එය පාක්ෂික සාහිත්‍යය විය යුතුය. ධනවාදී චාරිත්‍ර වන, ලාභ ඉපයීමට, ධනවාදී ජනසන් නිවේදනය වාණිජමය කිරීමට, ධනවාදී සාහිත්‍ය වෘත්තීයවාදයට සහ පෞද්ගලිකවාදයට, "කුලීන අරාජිකවාදයට" සහ ලාභ ලැබීමේ ක්‍රියාදමයට හාත්පසින්ම වෙනස් පාක්ෂික සාහිත්‍යයේ මූලධර්ම සමාජවාදී නිර්ධන පංතිය විසින් ඉදිරිපත් කළ යුතුය, මේ මූලධර්මය වර්ධනය කොට හැකිතරම් පූර්ණ ලෙසත්, පරිසමාප්ත ලෙසත් වර්ධනය කළ යුතුය.

පාක්ෂික සාහිත්‍යයේ මූලධර්ම මොනවාද? සමාජවාදී නිර්ධන පංතිය, පුද්ගලයින්ගේ හා කාණ්ඩවල පොහොසත් වීමේ මාධ්‍යයක් හැටියට සාහිත්‍ය ගිණිය යුතුවා පමණක් නොව, එය නිර්ධන පංතියේ පොදු කාර්යයෙන් ස්වාධීනවූ පෞද්ගලික කාර්යයක්ද විය නොහැකිය. අපාක්ෂික ලේඛකයින් හංගවේවා! සාහිත්‍යමය උත්තරීතර පුද්ගලයින්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හංගවේවා! සාහිත්‍යය, නිර්ධන පංතියේ පොදු කාර්යයේ කොටසක් බවට පත්විය යුතුය, මුළු මහත් කම්කරු පංතියේ දේශපාලනමය විඥත පුරෝගාමී බල ඇණිය විසින් ක්‍රියාවේ යොදවනු ලබන එකම මහා සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී යන්ත්‍රයේ ''රෝදයක් සහ ඉස්කුරුප්පු ඇණයක් විය යුතුය''. සාහිත්‍යය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ වැඩවල සංවිධානාත්මක, සැළසුම්ගත සහ අඛණ්ඩ කොටසක් විය යුතුය.

''සියලු සංසන්දනයන් නොණ්ඩි ගසති'' යි ජර්මන් ප්‍රස්තාව පිරුළකින් කියැවෙයි. සාහිත්‍යය ඉස්කුරුප්පු ඇණයකටත්, ජීවමය ව්‍යාපාරය යන්ත්‍රයකටත් මවිසින් සංසන්දනය කිරීමද එසේය. දෘෂ්ටිමය අරගලයේ නිදහස, විවේචනය කිරීමේ නිදහස, සාහිත්‍ය නිර්මාණයේ නිදහස ආදිය පහත දමන, මරා දමන 'නිලධාරීකරණයකට' හසු කරන, මායාරෝගී බුද්ධිමතුන් පවා මෙවැනි සංසන්දනයක් ගැන මහත් හඬින් වැළපෙනු ඇතැයි මම තරයේම ප්‍රකාශ කරමි. මෙවැනි වැළපීම් ඇත්ත වශයෙන්ම, ධනපති බුද්ධිමත් පෞද්ගලිකවාදය ප්‍රකාශ කිරීමක් හැර අන් කිසිවක් නොවන්නේය. බහුතරය විසින් අල්පතරය පාලනය කිරීමේදී සාහිත්‍යය විෂයයක් වශයෙන් යාන්ත්‍රික ලෙස සීරු මාරුවකට හෝ මට්ටම් කිරීමකට අන් හැමටම වඩා අඩුවෙන් භාජනය වන බවට තර්කයක් නැත. මෙම ක්ෂේත්‍රයේදී පෞද්ගලික උනන්දුවට සහ පෞද්ගලික ආනතියට, චින්තනයට සහ මනස් සෘෂ්ටියට ආකාරයට සහ හරයට නිසැක ලෙසම විශාල කොටසක් දිය යුතු බවටද තර්කයක් නැත. මේවා සියල්ල ප්‍රතික්ෂේප කළ නොහැකිය. නිර්ධන පංතික පක්ෂයක සාහිත්‍යමය අංශය යාන්ත්‍රික ලෙස අනිත් අංශය සමග හැඳින්විය නොහැකි බව, පැහැදිලි ලෙස පෙන්වා දෙයි. සාහිත්‍යය අනිවාර්ය ලෙසත්, අවශ්‍යයෙන්මත්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ වැඩවල කොටසක් විය යුතුය, එය අඛණ්ඩ ලෙස අනිකුත් දේ සමග වෙළී පවතින්නේය යන සාධ්‍යය මින් බිඳකුදු නිෂ්ප්‍රභා නොවේ. මෙය ධනපති ක්‍රමයට සහ ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධ සහ නොපුරුදු දෙයකි පුවත්පත් විවිධ සංවිධානවල නිල පුවත්පත් බවට පත්විය යුතුය. මේවාට ලිපි සපයන ලේඛකයෝ අනිවාර්යයෙන්ම මේ සංවිධාන වල සාමාජිකයින් විය යුත්තාහ. ප්‍රකාශක සහ බෙදහරින මධ්‍යස්ථාන, පොත් වෙළඳ ශාලා, කියවීම් ශාලා, පුස්තකාල සහ එවැනි සංවිධාන සියල්ල පක්ෂයේ පාලනය යටතේ තිබිය යුතුය. සංවිධානයවූ සමාජවාදී නිර්ධන පංතිය, මේ සියලු වැඩ සොයා බැලිය යුතුය, එහි සමස්තය පාලනය කළ යුතුය, මුල සිට අග දක්වා කිසිදු භේදයකින් තොරව, ජීවමාන නිර්ධන පංතික කාර්යයන්, එය තුළට කා වැද්දවිය යුතුය.

එමගින් පැරණි රුසියානු අර්ධ ඔබ්ලෝමව්[11] අර්ධ වෙළඳ ශාලා අයිතිකාර මූලධර්මය වන, ලියන්නා ලියයි, කියවන්නා කියවයි නැමැති මූලධර්මයේ පදනම් විනාශ කළ යුතුය.

ආසියාතික සාහිත්‍ය පාලක සමීක්ෂණයෙන් සහ යුරෝපීය ධනපති පංතියෙන් කෙළසනු ලැබූ සාහිත්‍ය වැඩ කටයුතුවල පරිණාමනයක් එකවර සපුරාලිය හැකි යැයි අපි නොකියමු. කිසිම විදිහක ප්‍රමිතකරණ පද්ධතියක් අපි කොහෙත්ම ඉදිරිපත් නොකරමු. ආඥාපනත් කීපයක් මගින් මෙයට පිළියමක්ද අපි ඉදිරිපත් නොකරමු. සාද පිළියෙල කරන ලද වැඩපිළිවෙළවල් මේ ක්ෂේත්‍රයේ කොහෙත්ම ක්‍රියාවට යෙදවිය නොහැකිය. අපේ මුළු පක්ෂයත්, රුසියාවේ දේශපාලන විඥත සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී නිර්ධන පංතියත් මේ නව කාර්යය ගැන හැඟීමකින් සිටිය යුතුය. එය සුපැහැදිලි ලෙස වෙන්කොට හඳුනා ගෙන, හැම තැනකදීම එය නිරාකරණය කිරීම සඳහා ඉදිරිපත් විය යුතුය. ප්‍රවේණි දස සාහිත්‍ය පාලනයෙන් මිදී පිටතට විත් සිටින අපි ධනවාදී වෙළඳ ශාලා සාහිත්‍ය සම්බන්ධකම්වල සිරකරුවන් බවට පත්වීමට අදහස් නොකරමු. අපි එලෙස සිරකරුවන් බවට පත් නොවන්නෙමු. ස්වාධීන ජනසත් නිවේදනයක් පොලිසියෙන් පමණක් නොව, ප්‍රාග්ධනයෙන්ද, වෘත්තීය වාදයෙන්ද, එපමණක් නොව, ධනවාදී අරාජික පෞද්ගලිකවාදයෙන්ද, ස්වාධීනවූ ජනසත් නිවේදනයක් ගොඩනැගීම අපට අවශ්‍ය වී ඇත, අපි එය සපුරාලන්නෙමු.

අවසාන වචන පාඨකයාට විරුද්ධාභාසයක්, නැතිනම් ප්‍රසිද්ධියේ කරන නින්දවක් හැටියට සිතෙනු ඇති. මොනවාද! යම්කිසි බුද්ධිමතෙක් නිදහස ගැන ඉමහත් උනන්දුවක් දක්වන්නෙක් කෑගසනු ඇත. මොනවා! සාහිත්‍ය කෘතීන් වැනි මටසිලුටු ප්‍රත්‍යෙක කාර්යයන්හීදී සාමූහික පාලනයක් ඇති කිරීමට ඔබ ඉදිරිපත් වන්නෙහිද! විද්‍යාව, දර්ශනය නැතිනම් සෞන්දර්යය පිළිබඳ ප්‍රශ්න වැඩකරන මිනිසුන්ගේ බහුතර චන්දයෙන් තීරණය කිරීමට ඔබ ඉදිරිපත් වන්නෙහිද! නිරපේක්ෂ වශයෙන්. පෞද්ගලික දෘෂ්ටිමය වැඩවල නිරපේක්ෂ නිදහස ඔබ ප්‍රතික්ෂේප කරන්නෙහිය.

මහත්වරුනි සන්සුන් වෙයල්ලා! ප්‍රථමයෙන්ම අප සාකච්ඡා කරන්නේ පක්ෂ සාහිත්‍යය සහ එය පක්ෂයේ පාලනයට යටත්වීම ගැනය. සීමාකිරීම් වලින් තොරව හැම කෙනෙකුටම තමන් රිසි දේ ලිවීමටත්, කීමටත් හැම කෙනෙකුටම නිදහසක් ඇත. එහෙත් පක්ෂ විරෝධී මත ප්‍රකාශ කිරීමට, පක්ෂයේ නම පාවිච්චි කරන සාමාජිකයින් අස්කර දැමීමට ස්වේච්ඡානුගත සෑම සංවිධානයකටම (පක්ෂයත් ඇතුළු) නිදහස තිබේ. කතා කිරීමේ සහ ලිවීමේ නිදහස සම්පූර්ණ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

විය යුතුය. එහෙත් ඒ අතරම සංවිධානය වීමේ නිදහසද සම්පූර්ණ විය යුතුය. කතා කිරීමේ නිදහසේ නාමයෙන්, කෑගැසීමටත්, බොරු කීමටත්, හිතේ හැටියට ලිවීමටත් ඔබට ප්‍රදනය කිරීමට මම බැඳී සිටිමි. එහෙත් සංවිධානය වීමේ නිදහසේ නාමයෙන්, එක් හෝ තවත් මතයකට පක්ෂපාත මිනිසුන්ගේ සංවිධානවලට බැඳීමට සහ ඒවායින් ඈත් වීමට ඇති අයිතිය ඔබ මට ප්‍රදනය කළ යුතුය. ස්වේච්ඡානුගත සංවිධානයක් වන පක්ෂය, පක්ෂ විරෝධී මත ප්‍රකාශ කරන මිනිසුන්ගෙන් පිරිසිදු වන්නේ නැතිනම්, ප්‍රථමයෙන්ම දෘෂ්ටිමය වශයෙන්ද ඉන් අනතුරුව කායික වශයෙන්ද නොවැළැක්විය හැකි සේ විනාස වී යනු ඇත. පක්ෂ හා පක්ෂ විරෝධී වැඩවල සීමාවන් විග්‍රහ කිරීම සඳහා පක්ෂයේ වැඩ පිළිවෙළත්, උපක්‍රම හා රීති පිළිබඳ පක්ෂයේ යෝජනාවනුත්, අවසානයේදී ජාත්‍යන්තර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ මුළු මහත් අත් දැකීමුත් ඇත්තේය. නිර්ධන පංතියේ ස්වේච්ඡානුගත ජාත්‍යන්තර සමාගමය වන ජාත්‍යන්තර සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය සිය ව්‍යාපාරය සමග සම්පූර්ණ ලෙස නොගැලපෙන, සම්පූර්ණ ලෙස මාක්ස්වාදී නොවන, එහෙම පිටින්ම නිවැරදි නොවන පුද්ගලයින් සහ ප්‍රවණතාවයන් සිය පක්ෂවලට ස්ථාවර ලෙසට ඇතුළු කැරගෙන තිබෙන අතර එවැනි සාමාජිකයින්ගෙන් පක්ෂ පිරිසිදු කිරීම සඳහා ස්ථාවර ලෙසම ''පවිත්‍ර කිරීමේ'' ව්‍යාපාරය ගෙන ගියේය. පක්ෂය තුළ ධනවාදී ''විවේචනය කිරීමේ නිදහසට'' පක්ෂපාත මහත්වරුනි, අපටද එසේ කිරීමට සිදුවනු ඇත. බලාපොරොත්තු රහිතව විවෘත සංවිධානයක් දක්වා වෙනස් වෙමින්, අපි දැන් බහුජන පක්ෂයකට එකවරම පත්වෙමින් සිටිමු. අස්ථිර බොහෝ පුද්ගලයින් (මාක්ස්වාදී දෘෂ්ටි කෝණය අනුව), අප පක්ෂයට ඇතුළුවීම නොවැළැක්විය හැකිය, සමහර විට අප පක්ෂයට ක්‍රිස්තියානි ආගමික කොටස්ද, සමහර ගුප්තවාදීන්ද ඇතුළු වීමට ඉඩ ඇත. අපි ශක්තිමත් පුද්ගලයින් වමු, ශෛලමය පර්වත වැනි නොසැලෙන මාක්ස්වාදීන් වමු.අස්ථිර පුද්ගලයින් මැඩ ජය ගැනීමට අපට ශක්තිය ඇත. පක්ෂය තුළ සිතීමේ නිදහස සහ විවේචනය කිරීමේ නිදහස නිසා ස්වේච්ඡානුගත සංවිධාන හැටියට හැඳින්වෙන පක්ෂවලට මිනිසුන් සංවිධානය කිරීමේ නිදහස අපට අමතක නොවනු ඇත.

දෙවනුව, ධනපති පෞද්ගලිකවාදී මහත්වරුනි, නිරපේක්ෂ නිදහසක් ගැන නුඹලා කරන කතා අමූලික කුහක කමකි. ධනයේ බලය මත පදනම් වුණු සමාජයක, වැඩකරන ජනතාවගේ බහුතරය දුගීභාවයේ ගිලී සිටින අතර අතළොස්සක් පමණවූ ධනපතීන් පරපෝෂිතයන් ලෙස ජීවත්වන සමාජයක යථාර්ථවාදී සහ සැබෑ නිදහසක් තිබිය

නොහැකිය. ධනවාදී ප්‍රකාශකයින් සම්බන්ධයෙන් ලේඛක මහත්මයාණෙනි, නුඹලා නිදහස්ද? රාමුවල* හා චිත්‍රවල කාමුක අසභ්‍ය දේ ඉල්ලා සිටින, ''නිර්මල'' ස්වාභාවික දර්ශනීය කලාවලට ''අතිරේකව'' දූෂණයවූ කලා ඉල්ලා සිටින ධනවාදී මිනිසුන්ගෙන් නුඹලා නිදහස්ද? මේ නිරපේක්ෂ නිදහස ධනවාදී හෙවත් අරාජිකවාදී වාක්‍ය ඛණ්ඩයකි (මන්දයත් ජගත් දර්ශනයක් ලෙස, අරාජිකවාදය, කණපිට පෙරළන ලද ධනවාදී දර්ශනයක් බැවිනි). කෙනෙකුට සමාජයේ ජීවත් වෙමින්, එම සමාජයෙන් නිදහස් වී සිටිය නොහැකිය. ධනවාදී ලේඛකයකුගේ, චිත්‍ර ශිල්පියකුගේ හෝ නිළියකගේ නිදහස, සල්ලි මල්ලට, අල්ලසට සහ කලා විෂයට යටවූ කඩතුරාවක් (නැතිනම් කුහකමය කඩතුරාවක්) පමණකි.

සමාජවාදීන් වන අප මෙම කුහකකම හෙළිදරව් කොට, ව්‍යාජ ලේබල් ඉරාදමන්නේ පංතිමය නොවන සාහිත්‍යයක් හා කලා ශිල්ප ලබා ගැනීමට නොව (මෙය කළ හැකි වන්නේ, සමාජවාදී පංති රහිත සමාජයකදීය), සැබවින්ම ධනපති පංතිය සමග සම්බන්ධ වී ඇති මේ කුහකමය නිදහස් සාහිත්‍යය, විවෘත ලෙසම නිර්ධන පංතිය සමග සම්බන්ධ වී ඇති සැබෑ නිදහස් සාහිත්‍යයක් සමග සංසන්දනය කිරීමටය.

එය නිදහස් සාහිත්‍යයක් වනු ඇත, මන්දයත් සාහිත්‍යයට නව බලවේගයන් එකතු කරන්නේ කෑදරකම හෝ වෘත්තීයවාදය හෝ නොව, සමාජවාදයේ අදහස සහ වැඩකරන ජනතාව වෙත දක්වන හිතවත්කම වන බැවිනි. එය නිදහස් සාහිත්‍යයක් වනු ඇත, මන්දයත් එය තෘප්තියට පත් යම්කිසි වීරවරියකට සේවය නොකරන බැවිනි, මේදස් පරිහානියට භාජන වී සිටින කුසීත ''දස දහසකට'' සේවය නොකරන බැවිනි; එහෙත් රටේ පුෂ්පය වන, එහි ශක්තිය හා අනාගතය වන කෝටි සංඛ්‍යාත වැඩකරන ජනතාවට සේවය කරන බැවිනි. සමාජවාදී නිර්ධන පංතියේ අත්දැකීම් සහ ජීවමාන වැඩ සමග මිනිස් සංහතියේ විප්ලවවාදී චින්තනයේ අනගිතම අළුත් අදහස් පෝෂණය කරන, අතීතයේ අත්දැකීම් (විද්‍යාත්මක සමාජවාදය, ආදිකාලීන, මනෝරාජික ක්‍රමවල සිට සමාජවාදයේ වර්ධනය සම්පූර්ණ කිරීම) සහ වර්තමානයේ අත්දැකීම් (කම්කරු සගයින්ගේ වත්මන් අරගලය) අතර ස්ථාවර අන්තර් ක්‍රියාකාරිත්වයක් නිර්මාණය කරන නිදහස් සාහිත්‍යයක් වනු ඇත.

---

* රුසියානු මුල් පිටපතේ ''ව් රාම්කාහ්'' යන වචනය සඳෙස්ය. එය හරය අනුව ''ව් රොමානාහ්'' (නවකතාවල) යනුවෙන් නිදෙස් විය යුතුය. — සංස්කාරක

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

එසේ නම් සගයිනි, වැඩට බසිමු! අළුත් සහ අමාරු කාර්යයකට අපි මූණ පා සිටිමු. එහෙත් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පංතික ව්‍යාපාරය සමග අඛණ්ඩ ලෙස වෙළී පවතින පුළුල්, බහු රූපී සහ විවිධත්වයෙන් යුත් සාහිත්‍යයක් සංවිධාන කිරීම උදරතර සහ ශ්‍රේෂ්ඨ කාර්යයකි. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සියලු සාහිත්‍යය පක්ෂයේ සාහිත්‍යය විය යුතුය. එක් හෝ තවත් ක්‍රමයකින් සෑම පුවත්පතක් මත් සඟරාවක් හා ප්‍රකාශන මන්දිරයක් ආදියත් පක්ෂ සංවිධානවලට අනුබද්ධ කිරීමේ තත්වයක් දක්වා ගෙන ඒමට ඒවායේ වැඩ වහාම සංවිධානය කළ යතුය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සාහිත්‍යයට සැබවින්ම එම නාමයට උචිත විය හැක්කේ එවිට පමණකි, ධනපති සමාජයේ රාමුව තුළ පවා සිය කාර්යයන් සපුරාලිය හැක්කේත්, ධනවාදී වහල් භාවයෙන් කැඩී වෙන්වී සැබවින්ම දියුණු සහ මුළුමනින්ම විප්ලවවාදී පංතිය සමග එකතු විය හැක්කේත් එවිට පමණකි.

"නෝවය ෂිස්න්" අංක 12,
1905 නොවැම්බර් 13 ද.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති,
වෙළුම 12, පිටු 99—105

සමාජවාදී පක්ෂය සහ
අපාක්ෂික විප්ලවවාදීත්වය

I

ජනතාවගේ අළුත්, අළුත් කොටස්වලට වේගයෙන් පැතිර යන රුසියාවේ විප්ලවවාදී ව්‍යාපාරය අපාක්ෂික සංවිධාන කීපයක්ම බිහිකළේය. එක්සත් වීමේ ආශාව පාගා දැමීම සහ එයට දඬුවම් දීම කොතරම් දුරට කරන්නේද, එතරම් දුරට එම ආශාව බලවත් ලෙස නැගී සිටී. ආකාරය අනුව බොහෝ විට ලිහිල් සහ ස්වරූපය අනුව විවිධ මූල නිර්මාණමය, නා නා සංවිධාන නිරතුරුවම පැන නගිමින් පවතී. යුරෝපයේ සංවිධාන මෙන් මෙම සංවිධාන වලට ස්ථිර සීමා නොමැත. වෘත්තීය සමිති දේශපාලන ස්වරූපයක් ගෙන ඇත. දේශපාලන අරගල ආර්ථික අරගල සමග එකට සංකලනය වෙයි, වැඩ වර්ජන මෙයට එක් නිදසුනකි. මේවා නිසා තාවකාලික හෝ අඩු වැඩි වශයෙන් ස්ථාවර, සංකලන වර්ගයක සංවිධාන ඇතිවිය.

මෙම ප්‍රපංචයේ වැදගත්කම කුමක්ද? සමාජ — ප්‍රජාතන්ත්‍රවාදීන් මෙම ප්‍රපංචය කෙරෙහි දැක්විය යුතු ආකල්පය කුමක්ද?

පක්ෂයේ ප්‍රතිපත්ති මත ස්ථිර ලෙස පිහිටා ක්‍රියා කිරීම ඵලිතයක් වන අතර එය උසස් ලෙස වර්ධනයවූ පංති සටනේ ප්‍රතිඵලයද වන්නේය. අනිත් අතට විවෘත හා පුළුල් පංති සටන්වල අවශ්‍යතාවයන් දැඩි පාක්ෂික ප්‍රතිපත්ති වර්ධනය කිරීමක් ඉල්ලා සිටී. අපාක්ෂික මත වලට විරුද්ධව නිතරම නිවැරදි ලෙස පංති විඥනයෙන් යුත් නිර්ධන පංතියත්, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයත් සටන් කර තිබෙන්නේත්, ස්ථිර ප්‍රතිපත්ති මූලක, ශක්තිමත් ලෙස වෙළුණු සමාජවාදී කම්කරු පක්ෂයක් පිහිටුවාලීම සඳහා ස්ථිර ලෙස ක්‍රියා කරන්නේත් ඒ නිසාය. ධනපති සංවර්ධනය විසින් මුළු මහත් ජනගහණයම වඩාත් පූර්ණ ලෙස පංතිවලට බෙදා වෙන් කිරීමද, මෙම පංති අතර ප්‍රතිවිරෝධීතාවයන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

උග්‍ර කිරීමද වැඩිකරන තරමට පොදු ජනතාව අතර වැඩකිරීම වඩාත් සාර්ථක වෙයි.

රුසියාවේ වත්මන් විප්ලවය විසින් මේ තරම් විශාල සංඛ්‍යාවක් අපාක්ෂික සංවිධාන බිහිකිරීමත්, ඒවා දිගටම එලෙස බිහිකිරීමත් ස්වභාවික දෙයකි. මෙය ප්‍රජාතන්ත්‍රික විප්ලවයකි, එනම් එහි සමාජමය හා ආර්ථික හරය අනුව එය ධනපති වන බැවිනි. මේ විප්ලවයේ අරමුණ ඒකාධිපති අර්ධ වැඩවසම් ක්‍රමය පෙරළා දමා ඉන් ධනපති ක්‍රමය වෙන්කර ගැනීමය, ඒ අනුව ධනවාදී සමාජයේ සියලු පංතීන්ගේ ඉල්ලීම් සපුරාලීමය, මේ අනුව එය මුළු මහත් ජනතාවගේම විප්ලවයකි. මින් සත්තකින්ම අපේ විප්ලවය පංති විප්ලවයක් නොවේයැයි අදහස් නොකෙරේ. සත්තකින්ම එසේ නොවේ. ධනපති සමාජයේ දෘෂ්ටි කෝණය අනුව, යල්පැන ගිය නැතිනම්, යල්පනිමින් පවතින්නා වූ, ධනපති සමාජයට පිටස්තර සහ එහි වර්ධනයට බාධා කරන්නා වූ පංතීන් සහ කුලවලට එම විප්ලවය එල්ල වී ඇත. අප රටේ මුළු මහත් ආර්ථික ජීවිතයේ සියලු ප්‍රධාන අංග ලක්ෂණ දැනටමත් ධනවාදී වී තිබෙන නිසාත්, දැනටමත් ජනගහණයේ අධි බහුතර සංඛ්‍යාව ධනවාදී තත්වයන් යටතේ ජීවත්වන නිසාත්, විප්ලව විරෝධී කොටස්වල සංඛ්‍යාව ස්වභාවයෙන්ම ඉතා අල්පය. ජනතාව සමග සන්සන්දනය කරන විට, විප්ලව විරෝධීන්ගේ සංඛ්‍යාව අතළොස්සකි. ඒ අනුව ධනවාදී විප්ලවයේ පංතිමය ස්වරූපය නොවැළැක් විය හැකි සේ 'පොදුජන' වන්නේය, බැලූ බැල්මට එය පංතිමය නොවන බවක් පෙන්වයි, ඒකාධිපතිත්වය හා වැඩවසම් ක්‍රමයට විරුද්ධව ධනපති සමාජයේ සියලු පංතීන්ගේ අරගලයක ස්වරූපයක් පෙන්වයි.

අනික් රටවල මෙන්ම රුසියාවේ ධනපති විප්ලවීය යුගයද, ධනපති සමාජයට ආවේණික පංති ප්‍රතිවිරෝධීතාවයන්ගේ සාපේක්ෂ නොදියුණු තත්වය නිසා කැපී පෙනෙයි. වත්මන් කාලයේ රුසියාවේ ධනපති ක්‍රමය 1848 ජර්මනියේ පැවැති ධනපති ක්‍රමයට වඩා දියුණු බව සත්‍යයකි. මෙහිදී 1789 ප්‍රංශයේ ධනපති ක්‍රමය ගැන සටහන් කිරීම අවශ්‍ය නොවේ. එහෙත් රුසියාවේ පිරිසිදු ධනපති ක්‍රමයේ ප්‍රතිවිරෝධතාවයන්, සංස්කෘතිය හා ආසියාතික ම්ලේච්ඡත්වය අතරද, යුරෝපීයවාදය සහ තතාර්වාදය අතරද, ධනවාදය සහ රදළ වැඩවසම් ක්‍රමය අතරද ඇති ප්‍රතිවිරෝධතාවයන් විසින් යටකර දමා ඇති බවට සැක නැත. වෙනත් වචන වලින් කියතොත්, අද ඉදිරිපත් කරන ඉල්ලීම් ධනපති ක්‍රමය වර්ධනය වීමට අදාළ වන ඉල්ලීම්ය. ධනපති ක්‍රමය රදළ ක්‍රමයේ බාධාවලින් ඉවත්කොට, නිර්ධන පංතියේ සහ ධනපති පංතියේ ජීවනයේ සහ අරගලයේ තත්වයන් උසස් කරන ඉල්ලීම්ය.

සත්තකින්ම අපි ඉල්ලීම්, උපදෙස් හා doléances* පිරික්සා බලමු නම්, සෑම පැක්ටරියකම, කාර්යාලයකම, බලකායකම, පොලිස් අංශයකම, මීසමකම, අධ්‍යාපන ආයතනයකම ආදී මේ අසංඛ්‍යයක් විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් අතුරෙන් අධි බහුතරය හුදු සංස්කෘතික ඉල්ලීම් යැයි අපට කිව හැකිය. මා මෙහිදී අවධාරණය කරන්නේ මේවා සුවිශේෂ පංති ඉල්ලීම් නොවන බවය, එහෙත් මූලික අයිතිවාසිකම් පිළිබඳ ඉල්ලීම්ය. මේ ඉල්ලීම් විසින් ධනපති ක්‍රමය විනාශ නොකරන, අතර, එයට විලෝම වශයෙන්, එම ඉල්ලීම් නිසා රට යුරෝපීයවාදය වෙතට ගෙනයයි, ම්ලේච්ඡත්වයෙන්, වනචාරීත්වයෙන් දූෂණයෙන් හා ''රුසියානු'' වැඩවසම් ක්‍රමයේ නටබුන් වලින් මුදලයි. හරය වශයෙන් බලන විට, නිර්ධන පංතික ඉල්ලීම් පවා සීමා සහිතය, මේ ඉල්ලීම් වලින් බොහොමයක්, ධනපති ක්‍රමයේ රාමුව තුළ පූර්ණ ලෙස සපුරාලිය හැකිය. රුසියානු නිර්ධන පංතිය දැන් සහ ක්ෂණික ලෙස ධනපති ක්‍රමය විනාශ කරන ඉල්ලීම් ඉදිරිපත් නොකරයි. ඔවුන් ඉල්ලා සිටින්නේ ධනපති ක්‍රමය පිරිසිදු කරන හා එහි සංවර්ධනය ත්වරණය කිරීමට සහ තීව්‍ර කිරීමට උපකාර වන දේවල්ය.

ධනපති සමාජය තුළ නිර්ධන පංතිය උසුලන විශෙෂ තත්වය නිසාත්, කම්කරුවන් සමාජවාදය කරා ඉදිරියට යන නිසාත්, ඔවුන් සමාජවාදී පක්ෂය සමග මිත්‍ර සන්ධානයක් ඇති කැරගෙන සිටින නිසාත්, ව්‍යාපාරයේ ඉතා මුල් අවධිවලදී ඖපලක්ෂණික ලෙස එය ඉදිරියට ගමන් කරයි. එහෙත් හුදු සමාජවාදී ඉල්ලීම් අනාගතයට අයත් දෙයකි; අදට බලපාන ක්ෂණික ඉල්ලීම් නම්, දේශපාලන ක්ෂේත්‍රයේ කම්කරුවන්ගේ ප්‍රජාතන්ත්‍රික ඉල්ලීම්ද ආර්ථික ක්ෂේත්‍රයේ ධනපති ක්‍රමයේ රාමුව තුළ ආර්ථික ඉල්ලීම්ද වන්නේය. නිර්ධන පංතිය පවා උපරිමය වැඩපිළිවෙළක් අනුව නොව, අවමය වැඩපිළිවෙළක සීමාවන් තුළ, විප්ලවය කරයි. සංඛ්‍යාව අතින් ජනගහණයේ අධිබහුතරය වන ගොවීන් ගැන කියනුම කවරේද! ගොවි විප්ලවයේ උපරිමය වැඩපිළිවෙළ, එහි අවසාන අරමුණු ධනපති ක්‍රමයේ සීමාවන් ඉක්ම නොයයි. ඉඩම් මුළු මහත් ගොවි ජනතාවට සහ පොදු ජනතාවට පවරා දීමෙන් ධනපති ක්‍රමය තවත් පුළුල් ලෙස සහ අලංකෘත ලෙස වැඩෙනු ඇත. අපේ සුළුධනවාදී සමාජවාදයේ අනුරක්ත වීරයින්ගේ, අනුරක්ත කන්වලට මෙම වදන් කෙතරම් අමිහිරි ශබ්දයක් ඇති කළද, අද ගොවි විප්ලවය වූකලී ධනපති විප්ලවයක් වන්නේය.

---

*දූක්ගැනවිලි. — සංස්කාරක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඉහත සඳහන් කළ පරිදි, දනට වැඩෙමින් පවතින විප්ලවයේ ස්වරූපය ස්වභාවයෙන්ම අපාක්ෂික සංවිධාන බිහිකරයි. ඒ නිසා මුළු මහත් ව්‍යාපාරයම මතු පිටින් පාක්ෂික නොවන සලකුනක්, අපාක්ෂික පෙනුමක් නොවැලැක් විය හැකි සේ ගත්තද, එය මතු පිටින් පමණකි. ''මානුෂික'' සභ්‍ය ජීවිතයක අවශ්‍යතාවය, මිනිසකුගේ සහ රටවැසියකුගේ අයිතිය සඳහා මිනිස් ගරුත්වය ආරක්ෂා කිරීම පිණිස සංවිධානය කිරීමේ අවශ්‍යතාවය හැම කෙනෙකුමත්, හැම දෙයක්මත් අල්ලා ගනී, සියලු පංතීන් සමගි කරයි, සියලු පාක්ෂික සීමා මැඩ නැගී සිට, පාක්ෂික ලැදිකම් දක්වීමෙන් බොහෝ ඈත සිටින කොටස් පවා ඒ සඳහා පුබුදුවාලයි. ඉතා වැදගත්, ක්ෂණික මූලික අවශ්‍ය අයිතීන්ද, ප්‍රතිසංස්කරණද, තවත් දුර ඒ ගැන සිතීම හා කල්පනා කර බැලීමද යන මේ හැම දෙයක්ම කල් දමා ඇතිවාක් මෙනි. ඇවිල පවතින අරගල වලට සිත යෙදවීම, අරගලයට මෙලෙස සිත යෙදවීම ඉතා අවශ්‍ය මෙන්ම නීත්‍යානුකූලද වන්නේය, මන්දයත් එය නැතිව අරගලයේදී ජය ලැබිය නොහැකි බැවිනි, මේ ක්ෂණික සහ මූලික පරමාදර්ශී කිරීමට මිනිසුන්ට එය හේතුවන බැවිනි, ඒවා යහපත් පැහැයෙන් පාට කිරීමට, සහ අද්භූත ඇඳුම් වලින් ඒවා සැරසවීමට අවස්ථාව ලැබෙන බැවිනි. සරළ ප්‍රජාතන්ත්‍රවාදය, සමාන්‍ය ධනපති ප්‍රජාතන්ත්‍රවාදය, සමාජවාදය ලෙස පිළිගෙන එය තහවුරු කරති. හැම දෙයක්ම ''අපාක්ෂික'' ලෙස පෙනීයයි. හැම දෙයක්ම ''විමුක්තිය'' සඳහා වූ එකම ව්‍යාපාරයකට එක්වන්නාක් මෙනි (සැබවින්ම, මුළු මහත් සමාජයම විමුක්ති කර ලන්නා වූ ව්‍යාපාරයකි). හැම දෙයක්ම සුළු, ඉතා සුළු සමාජවාදී පැහැයක් ගනී. මෙසේ වනුයේ ප්‍රජාතන්ත්‍රික අරගලයේදී සමාජවාදී නිර්ධන පංතිය අන් හැමටම වඩා මූලික ක්‍රියා කලාපයක් ඉටු කරන බැවිනි.

මෙවැනි තත්වයන් යටතේ අපාක්ෂිකත්වය පිළිබඳ අදහස තාවකාලික ජයග්‍රහණයක් ලබනු නිසැකය; අපාක්ෂිකත්වය පිළිබඳ උද්යෝග පාඨය මෝස්තර පිළිබඳ උද්යෝග පාඨයකි. සියලු මෝස්තර ජීවිතය අග වලිගයක් සේ තේරුමක් නැතිව ගැටෙයි. දේශපාලන ජීවිතයේ මතුපිට පෙනෙන ඉතා පොදු ප්‍රපංචය නම්, අපාක්ෂික සංවිධානය; අපාක්ෂික ප්‍රජාතන්ත්‍රවාදය, අපාක්ෂික වැඩවර්ජනවාදය සහ අපාක්ෂික විප්ලවවාදයයි.

දන් පැන නගින ප්‍රශ්නය මෙසේය. අපාක්ෂික සංවිධාන කෙරෙහිත්, අපාක්ෂික ලැදිකම කෙරෙහිත් විවිධ පංතිවල අනුගාමිකයින්ගේ සහ නියෝජිතයින්ගේ ආකල්පය කුමක් විය යුතුද? ''යුතුය'' යනු මෙහි උක්ත කාරක අදහසක් නොව කර්ම කාරක අදහසක් ගනී; එනම්, බැලිය යුත්තේ කිනම් ආකාරයටද යන්න නොවේ, විවිධ පංතීන්වල ඒ ඒ වුවමනා සහ දෘෂ්ටි කෝණයන්ගේ බලපෑම අනුව, අනිවාර්යයෙන්ම ඇතිවන ආකල්පය ගැනය.

II

අප විසින් දනටමත් පෙන්වා දී ඇති පරිදි, අපාක්ෂික මූලධර්මය අපේ විප්ලවයේ ධනවාදී ස්වරූපයේ ඵලයකි, නැතිනම් ප්‍රකාශනයකි. අපාක්ෂික මූලධර්ම වලට නැඹුරු නොවී නොසිටීමට ධනපති පංතියට නොහැකිය, මන්දයත් ධනපති සමාජය නිදහස් කර ගැනීම සඳහා සටන් කරන අය අතර පක්ෂ නොමැති වීම ධනපති සමාජය තුළ එයට විරුද්ධව අළුත් අරගල ඇති නොවන්නේයැයි ඉන් අදහස් කරන බැවිනි. නිදහස සඳහා ''අපාක්ෂික'' අරගලයක් ගෙනයන අය ධනපති නිදහසේ ස්වරූපය නොහඳුනති, නැතිනම් ඔවුහු ධනපති ක්‍රමය ශුද්ධවූ වස්තුවක් බවට හරවති, එසේත් නැතිනම්, ඔවුහු ග්‍රීක කලෙන්ද[12] දක්වා ධනපති ක්‍රමයට විරුද්ධව කරන සටන කල්දමති. ආනුෂංගික වශයෙන්, ධනපති ක්‍රමයට පක්ෂව විඥත ලෙස හෝ අවිඥත ලෙස නැගී සිටින අයට අපාක්ෂිකත්වය නැමැති සංකල්පය වෙත ඇදීයාම වැලැක්විය නොහැකිය.

පංතීන් වශයෙන් බෙදී සිටින සමාජයක, ප්‍රතිවිරෝධී පංති අතර අරගලය, එහි වර්ධනයේ එක්තරා අවධියකදී දේශපාලනමය අරගලයක් දක්වා වැඩේ. පංතීන්ගේ දේශපාලන අරගලයේ ඉතා ඵල හරිත, ඉතා සංයුක්ත සහ විශේෂිත ප්‍රකාශනය දේශපාලන පක්ෂවල අරගලය වන්නේය. අපාක්ෂික ප්‍රතිපත්තිය යනු පක්ෂ අරගලය කෙරෙහි උදාසීනත්වයක් දක්වීමය. එහෙත් මෙම උදාසීනත්වය මධ්‍යස්ථභාවයට හෝ වැළකී සිටීමට සමාන නොවේ. මන්දයත්, පංති සටනේදී මධ්‍යස්ථ වීමක් නැති බැවිනි. ධනපති සමාජය තුළ භාණ්ඩ හුවමාරුවෙන් හෝ කම්කරු ශ්‍රමය හුවමාරුවෙන් හෝ ''මධ්‍යස්ථ වී'' සිටීමට නොපුළුවන. මෙම හුවමාරුව නොවැළැක්විය හැකි සේ පළමුව ආර්ථික සහ ඉන් අනතුරුව දේශපාලනමය අරගලවලට මග පාදයි. ඒ අනුව භාවිතයේදී, අරගලය කෙරෙහි උදාසීන වීම යනු, අරගලයෙන් ඈත් වීමක් හෝ, ඉන් වැළකී සිටීමක් හෝ එසේත් නැතිනම් ඉන් මධ්‍යස්ථ වීමක් හෝ කොහෙත්ම අදහස් නොකරයි. උදාසීනත්වය යනු බලවතාට, පාලනය කරන්නාට නිහඬව ආධාර කිරීමකි. ඒකාධිපතිත්වය බිඳ වැටීමට පෙර ඔක්තෝබර් විප්ලව[13] සමයේදී රුසියාවේ ඒකාධිපතිත්වය කෙරෙහි උදාසීනත්වයක් දක්වූ අය එයට නිහඬව ආධාර දුන්හ. වත්මන් යුරෝපයේ ධනවාදීන්ගේ පාලනය කෙරෙහි උදාසීනත්වයක් දක්වන්නෝ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එයට නිහඬව ආධාර දෙති. දැනට ඉදිකරමින් සිටින නිදහස් රුසියාවේ නිදහස සඳහා කරන සටන ධනවාදී ස්වරූපයක් ගනිතියි යන සංකල්පය කෙරෙහි උදාසීනත්වයක් දක්වන්නෝ, මේ අරගලයේදී ධනවාදයට නිහඬව ආධාර කරති. දේශපාලන උදාසීනත්වය, දේශපාලනමය තෘප්තිය වන්නේය. බඩ පුරා ආහාර ගෙන සිටින මිනිහෙක් පාන් කැබල්ලක් කෙරෙහි නොසැලකිල්ලක් උදාසීනත්වයක් දක්වයි. එහෙත් කුසගින්නෙන් පෙළෙන්නෙක් පාන් කැබැල්ල පිළිබඳ ප්‍රශ්නය කෙරෙහි ''පක්ෂග්‍රාහිත්වයක්'' දක්වනු ඇත. පාන් කැබැල්ලක් කෙරෙහි කෙනෙකුගේ නොසැලකිලි කම හා උදාසීනත්වය, නිසා ඔහුට පාන් අවශ්‍ය නැතැයි අදහස් නොකෙරේ. එහෙත් ඔහුට නියත ලෙසම පාන් ලැබේ. ඔහුට කිසි කලෙක පාන්වල අවශ්‍යතාවයක් පැන නගින්නේ නැත. ඔහු කුස පුරා ආහාර ගන්නා පක්ෂයට සම්බන්ධ වූ කෙනෙකි. ධනපති සමාජයේ අපාක්ෂික ප්‍රතිපත්තිය, කුස පුරා අහර ගත්, පාලකයින්ගේ, සූරාකන්නන්ගේ පක්ෂයට ආවැඩීමක් නිෂ්ක්‍රීය ලෙස ප්‍රකාශ කරන කුහක, වෙස්වළාගත් ප්‍රතිපත්තියකි.

අපාක්ෂික සංකල්පය ධනවාදී සංකල්පයකි. පාක්ෂික සංකල්පය සමාජවාදී සංකල්පයකි. මෙම න්‍යායය පොදු හා සමස්තයක් වශයෙන් මුළු ධනවාදී සමාජයටම යෙදවිය හැකිය. මේ සාමාන්‍ය සත්‍යය විශේෂ ප්‍රශ්න වලට සහ විශේෂ අවස්ථා වලට යෙදවීමට කෙනෙකුට හැකියාවක් තිබිය යුතුය. මුළු මහත් ධනපති සමාජයම විප්ලවවාදී ලෙස රදළවාදයට සහ ඒකාධිපතිත්වය විරුද්ධව නැගී සිටින මෙවැනි අවස්ථාවක මේ සත්‍යය අමතක කර දැමීම, ධනවාදී සමාජයේ සමාජවාදී විවේචනය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමකි.

රුසියානු විප්ලවය තවමත් සිය මුල් අවධිවල පැවතුනද, මෙහි පෙන්වා ඇති පොදු කරුණු ස්ථිර කිරීමට දැනටමත් නොමඳ සාක්ෂි ඉදිරිපත් කර ඇත. පංති විඥත නිර්ධනීන්ගේ දේශපාලන පක්ෂය වන සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය පමණක්, පක්ෂයේ ප්‍රතිපත්ති දැඩි ලෙස පිළිපැදිය යුතුයැයි, නිතර ඉල්ලා සිටියේය, දැනුදු ඉල්ලා සිටී. ධනපතීන්ගේ අදහස් ඉදිරිපත් කරන අපේ ලිබරල්වාදයෝ සමාජවාදී පක්ෂ ප්‍රතිපත්තිය පිළිනොගන්නා අතර පංති සටන ගැන සවන් දීමට පවා කැමති නොවෙති. විදේශගත ''ඔස්වබෂ්දේනිය''[14] විසින්ද, එමෙන්ම රුසියානු ලිබරල්වාදයේ අති විශාල සංඛ්‍යාවක් ගැති පුවත්පත් විසින්ද පුන පුනා කියනු ලබන දේ සියවැනි වරටත් කී රොදිචෙව් මහතාගේ කතාව, මෙහිදී මතක් කිරීම වටී. අවසාන වශයෙන්, අතරමැද පංතියේ, සුළු ධනපති පංතියේ දෘෂ්ටිය ''නාෂෂිස්න්''[15] සඟරාවේ සහ රැඩිකල්-ඩිමොක්‍රැට්වරුන්ගේ[16] සිට සමාජවාදී-විප්ලවවාදීන්[17]

දක්වාත් වූ විවිධ පැහැයයන්ට අයත් රැඩිකල්වාදීන්ගේ අදහස් පැහැදිලි ලෙස ප්‍රකාශ කිරීමකි. පසුකී කොටස කෘෂක ප්‍රශ්නයේදී ඉතා පැහැදිලි ලෙසම සමාජවාදය සමග ප්‍රජාතන්ත්‍රවාදය පටලවා ගෙන සිටින බව, පෙන්වා දී ඇත. විශේෂයෙන්ම ''සමාජවාදීකරණය'' (ප්‍රාග්ධනය සමාජය සතු නොකර ඉඩම් පමණක් සමාජය සතු කිරීම) නැමැති ඔවුන්ගේ උද්යෝග පාඨයේදී විශේෂයෙන් පෙන්වා දී ඇත. ධනපති රැඩිකල්වාදය කෙරෙහි ඉවසිලි සහගතතාවයක් පෙන්වන ඔවුහු, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ මූලධර්ම සහ ප්‍රතිපත්ති කෙරෙහි නොඉවසිලි සහගතතාවයක් පෙන්නුම් කරති.

සියලු පැහැයයන්ට අයත් රුසියානු ලිබරල්වාදීන්ගේ සහ රැඩිකල්වාදීන්ගේ වැඩ පිළිවෙළවල් සහ උපක්‍රම වලින් විවිධ පංතීන්වල අයිතිවාසිකම් පිළිබිඹු වන්නේ කෙසේද යන්න ගැන විශ්ලේෂණයක් කිරීම අපේ විෂයයෙන් පිටස්තර දෙයකි. අපි වෙනත් කරුණු ගැන සඳහන් කරන අතර අවධාරණයෙන් තොරව මේ වැදගත් කරුණ ගැන සඳහන් කළෙමු. අපාක්ෂික සංවිධාන කෙරෙහි අපේ පක්ෂය දක්වන ආකල්පය ව්‍යවහාරික දේශපාලන නිගමනයන් කිරීමට දැන් අපි ඉදිරිපත් වමු.

සමාජවාදීන්ට අපාක්ෂික සංවිධානවල වැඩ කිරීමට අවසර තිබේද? එසේනම්, කිනම් තත්වයන් යටතේද? මෙම සංවිධානවල අනුගමනය කළ යුතු උපක්‍රම මොනවාද?

පළමුවැනි ප්‍රශ්නයට දියහැකි පිළිතුර නම් කොන්දේසි විරහිත ලෙසත්, ස්ථිර ලෙසත් අවසර ''නැත'' යනුය. කිසිම අවස්ථාවකදී හෝ කිසිම තත්වයක් යටතේදී හෝ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට අපාක්ෂික සංවිධානවල (එනම්, අඩුවැඩි වශයෙන් විඥත සහ අවිඥත ධනපති සංවිධානවල) වැඩකිරීම තහනම්යැයි වටහා ගැනීම මින් සාවද්‍ය වන්නේය. ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ අවධියකදී, අපාක්ෂික සංවිධාන තුළ වැඩකිරීමට ප්‍රතික්ෂේප කිරීම, සමහර අවස්ථාවලදී ප්‍රජාතන්ත්‍රික විප්ලවයට සහභාගි වීම ප්‍රතික්ෂේප කිරීමක් වන්නේය. එහෙත් මේ ''සමහර අවස්ථාවන්'' සමාජවාදීන් විසින් නිසැක ලෙසම පටු සීමා තුළ තබා ගත යුතුය. එවැනි සහභාගිවීම්වලට දැඩිලෙස විග්‍රහ කරන ලද, සීමාසහිත තත්වයන් යටතේ පමණක් අවසර දිය යුතුය. මන්දයත්,අප ඉහත සටහන් කළ පරිදි පංති සටනේ සාපේක්ෂ වශයෙන්, නොදියුණු තත්වයන් යටතේ අපාක්ෂික සංවිධාන පැන නගින බැවිනි. අනිත් අතින් පක්ෂ ප්‍රතිපත්ති දැඩි ලෙස පිළිපැදීම පංති සටන විඥත, පැහැදිලි, නියත සහ ප්‍රතිපත්ති මූලක කිරීමේ එක් ප්‍රධාන සාධකයක් වන්නේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිර්ධන පංතික පක්ෂයේ දෘෂ්ටිමය සහ දේශපාලන නිදහස ආරක්ෂා කිරීම, සමාජවාදීන්ගේ ස්ථාවර, නොවෙනස් සහ නිරපේක්ෂ යුතුකම වන්නේය. මෙම යුතුකම සපුරාලීමට අසමත් වන ඕනෑම කෙනෙක්, තම සමාජවාදී හැඟීම් වලට (වචනයෙන්) කෙතරම් අවංක ලෙස පක්ෂපාත වුවද, සමාජවාදියකු නොවන්නේය. අපාක්ෂික සංවිධානවලට සමාජවාදීන් සහභාගි වන්නේ විශේෂයක් හැටියට පමණකි. මෙම සහභාගි වීමේ පරමාර්ථය, ස්වභාවය, තත්වයන් ආදිය සමාජවාදී විප්ලවයක් සඳහා විඥාන නායකත්වයක් දැරීම පිණිස සමාජවාදී නිර්ධන පංතිය සංවිධාන කිරීමේ සහ පිළියෙල කිරීමේ මූලික කාර්යයන්ට සම්පූර්ණයෙන්ම යටත් කළ යුතුය.

විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රික විප්ලවීය යුගයකදීද, විශේෂයෙන්ම නිර්ධන පංතිය සම්භාවනීය ක්‍රියා කලාපයක් ඉටු කරන ප්‍රජාතන්ත්‍රික විප්ලවයකදීද අපාක්ෂික සංවිධානවලට සහභාගි වීමට තත්වය අපට බලකරනු ඇත. නිදසුනක් වශයෙන් අස්ථිර ලෙස ප්‍රජාතන්ත්‍රවාදී අදහස් දරන අයට සමාජවාදය ගැන දේශන පැවැත්වීමටත්, නැතිනම් ප්‍රතිවිප්ලවයට විරුද්ධව සමාජවාදීන්ගේ සහ විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ එක්සත් අරගලයක උවමනාවන් සඳහාත් එලෙස සහභාගි වීම අවශ්‍ය වනු ඇත. ප්‍රධාන වශයෙන් එලෙස සහභාගි වීම අපේ අදහස් පිළිගැන්වීමේ මාධ්‍යයක් වනු ඇත. දෙවැනුව, නියත විප්ලවවාදී අරමුණු සපුරාලීම සඳහා එය සටන්කාමී ගිවිසුමක් නියෝජනය කරනු ඇත. මේ අවස්ථාවන් දෙකේදීම, සහභගිවීම තාවකාලික පමණක් වනු ඇත. මේ අවස්ථා දෙකෙහිදීම සහභාගිවීමට අවසර ඇත්තේ කම්කරුවන්ගේ පක්ෂයේ ස්වාධීනත්වය සම්පූර්ණ වශයෙන් ආරක්ෂා කළහොත් පමණකි, අපාක්ෂික සංගම් සහ මණ්ඩල වලට ''වෙන් කර'' ඇති පක්ෂ සාමාජිකයින් හා කණ්ඩායම් පක්ෂය විසින් පාලනය කිරීම හා මගපෙන්වීම කළහොත් පමණකි.

අප පක්ෂයේ වැඩ කටයුතු රහස්‍ය ලෙස කරගෙන යාමේදී, මෙවැනි පාලනයක් ඇති කිරීම සහ මග පෙන්වීම ඉතා අමාරුවන අතර සමහර විට නොමැඩලිය හැකි බාධා හා අමාරුකම් ඇතිවනු ඇත. එහෙත් දැන් අපේ පක්ෂයේ වැඩ කටයුතු වඩ වඩාත් ප්‍රසිද්ධියේ කෙරෙන බැවින්, මේ පාලනය සහ මේ මග පෙන්වීම පක්ෂයේ උසස් සංවිධාන මගින් පමණක් නොව, සාමාන්‍ය සාමාජිකයින් විසින්ද අපේ පක්ෂයට අයත් සියලු සංවිධිත කම්කරුවන් විසින්ද ඉතා විශාල පරිමාණයකින් කළ යුතුය. අපාක්ෂික සංගම් හා මණ්ඩලවල සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තාද, එවැනි ක්‍රියා පිළිබඳ දේශන හා අරමුණුද, මේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සියලු වර්ගවලට අයත් පක්ෂ සංවිධානවල යෝජනාද කම්කරු පක්ෂයක අනුක්‍රමික භාවිතයක් විය යුතුය. පක්ෂය සමස්තයක් වශයෙන් එලෙස සැබවින්ම සහභාගි වීමෙන්ද, එවැනි ක්‍රියාවන් මෙහෙයැවීමට සහභාගි වීමෙන්ද පමණක් ව්‍යවහාරික ලෙස සමාජවාදී වැඩ, සාමාන්‍ය ප්‍රජාතන්ත්‍රවාදී වැඩ සමග අපට සංසන්දනය කළ හැකි වන්නේය.

අපාක්ෂික සංගම් තුළ අප විසින් අනුගමනය කළ යුතු උපක්‍රම මොනවාද? ප්‍රථමයෙන්ම, ස්වාධීන සම්බන්ධකම් ඇතිකැරැ ගැනීමට අප විසින් සෑම අවස්ථාවක්ම ප්‍රයොජනයට ගත යුතු අතර අපේ සමාජවාදී වැඩ පිළිවෙළ ප්‍රචාරය කිරීම සඳහා එය ප්‍රයෝජනයට ගත යුතුය. දෙවනුව, ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ ඉතා පූර්ණ සහ ඉතා සථිර ජයග්‍රහණයන් සඳහා අප විසින් ක්ෂණික දේශපාලන කාර්යයන් විග්‍රහ කළ යුතුය. ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ දේශපාලන උද්යෝගපාඨ අප විසින් ඉදිරිපත් කළ යුතුය. හෙට්ටු කරන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදීන් වෙනුවට, සටන්කාමී විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදීන් විසින් ක්‍රියාවට පෙරළිය යුතු ප්‍රතිසංස්කරණවල වැඩ පිළිවෙලක් ඉදිරිපත් කළ යුතුය.

මේ විදිහට වැඩ කටයුතු සකස් කළහොත් පමණක්, එක් දවසක කම්කරුවන් විසින්ද, තවත් දවසක ගොවීන් විසින්ද, ඊළඟ දවසක සෙබළුන් ආදීන් විසින්ද බිහිකරන අපාක්ෂික විප්ලවවාදී සංවිධානවලට සහභාගිවීමට පක්ෂයේ සාමාජිකයින්ට අවසර ඇතිවාක් මෙන්ම ප්‍රයෝජනද වන්නේය. ධනපති විප්ලවයකදී කම්කරු පක්ෂයක දෙයාකාර කාර්යභාරය සපුරාලීමේ තත්වයකට අප පැමිණෙන්නේ එවිට පමණකි. එනම් ප්‍රජාතන්ත්‍රික විප්ලවය සම්පූර්ණ කිරීම සහ ප්‍රාග්ධනයේ පාලනය පෙරළා දැමීමට ඉතා දැඩි අරගලයක් ගෙනයාම සඳහා ස්වාධීනත්වය අවශ්‍ය සමාජවාදී නිර්ධන පංතියේ බලමුළු පුළුල් කිරීම හා ශක්තිමත් කිරීමය.

''නෝවය ෂිස්න්'' අංක 22 සහ 27; '1905 නොවැම්බර් 26 සහ දෙසැම්බර් 2.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, වෙළුම 12, පිටු 133-141

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමාජවාදය සහ ආගම

වත්මන් සමාජය ජනගහණයේ ඉතා කුඩා අල්පතරයක් විසින්, ඉඩම් හිමියන්ගේ සහ ධනපතීන්ගේ පංතිය විසින් කම්කරු පංතියේ අධි බහුතරය සූරාකෑම මත සම්පූර්ණයෙන්ම පදනම් වී ඇත. එය වහල් සමාජයකි, මන්දයත්, මුළු මහත් ජීවිත කාලය තිස්සේම ධනපතීන් සඳහා වැඩකරන "නිදහස්" කම්කරුවන්ට ලාභය නිපදවන වහලුන්ට දිවිපෙවෙත යම්තම් රැකදීම සඳහාත්, ධනපති වහල් ක්‍රමය ආරක්ෂා කිරීම සහ සදාකාලික කිරීම සඳහාත් අවශ්‍ය මාධ්‍යයන්ට පමණක් කම්කරුවන් "හිමිකම්" කියන බැවිනි.

කම්කරුවන් ආර්ථික වශයෙන් පාගා දැමීම, දේශපාලනමය පාගා දැමීමක් සහ සමාජමය අවඥාවක්ද, බහු ජනතාවගේ අධ්‍යාත්මික සහ සදාචාර ජීවිතය රළුකිරීමක් සහ අඳුරු කිරීමක්ද අනිවාර්ය ලෙස බිහිකරන අතර එය අවිච්ඡින්නයට පත් කරවාලයි. තම ආර්ථික විමුක්තිය සඳහා සටන් කිරීමට, අඩු වශයෙන් හෝ වැඩි වශයෙන් දේශපාලන නිදහසක් කම්කරුවන් ලබා ගනු ඇත. එහෙත් කොතෙකුත් නිදහස ලැබුණත් ධනපති ක්‍රමය පෙරළා දමන තුරු පමතින දුගී දුප්පත්කම, විරැකියාව සහ පෑගීම දුරුකර ලීමට නොපුළුවන. හැමතැනම ජනතාවගේ පුළුල් කොටස් මත ඉමහත් බරක් පටවන ආගම අධ්‍යාත්මික පෑගීමේ එක් ආකාරයක් වන්නේය. මේ පුළුල් කොටස් සදහටම අනුන්ට වැඩකිරීම, අවශ්‍යතාවය සහ හුදකලාබව නිසා මහත් වූ පීඩාවකට හසුවී සිටිති. සූරාකන්නන්ට විරුද්ධව ගෙන යන අරගලයේදී ඇතිවන බෙලහීනත්වය විසින්, මරණයෙන් පසු ඇතිවන වඩාත් හොඳ ජීවිතයක් පිළිබඳ විශ්වාසයක් අනිවාර්ය ලෙස බිහිකරන්නේ, ම්ලේච්ඡයින් ස්වභාව ධර්මයට විරුද්ධව කළ සටනේදී ඇතිවූ බෙලහීනත්වය විසින් දෙවියන්, යකුන් සහ හාස්කම් ආදිය බිහිකළාක් මෙනි. මුළු

මහත් ජීවන කාලය තිස්සේම වැඩ කරමින් සහ අග හිඟ කම්වලින් මිරිකෙමින් මිහිපිට ජීවත්වන තුරු, යටත් පහත් කමින් සහ ඉවසීමෙන් දිවි ගෙවිය යුතු බවත්, ඒ වෙනුවට දෙව්ලොව ලැබෙන දිව්‍ය සම්පත් පිළිබඳ බලාපොරොත්තුවෙන් සැනසුම ලැබිය යුතු බවත් ආගම උගන්වයි. එහෙත් අනුන්ගේ ශ්‍රමය සූරාකමින් ජීවත්වන අය මිහිපිට ජීවත්වන කාලයේදී පිනට දිය යුතු බව ආගම උගන්වයි. මේ අනුව සූරාකන්නන්ගේ මුළු මහත් ජීවන පැවැත්ම සාධාරන යැයි කියන ඉතා පහත් ක්‍රමයක් පෙන්වන ආගම දිව්‍ය ලෝකයේ දිව්‍ය සම්පත් භුක්ති විඳීම සඳහා පහසු මිලකට බලපත්‍ර විකුණයි. ආගම මිනිසුන්ගේ අබින්ය. ප්‍රාග්ධනයේ වහලුන් විසින් තම මිනිස් ප්‍රතිරූපය ගිල්වා දමන, අඩු වැඩි වශයෙන් මිනිසකුට තරම් වන ජීවිතයක් සඳහා ඔවුන්ගේ ඉල්ලීම් ගිල්වා දමන ආගම වූකලී එක්තරා විදිහක අධ්‍යාත්මික මත්වීමක් වැන්න.

එහෙත් තම වහල්භාවය ගැන හඟින වහලා තම විමුක්තිය සඳහා සටන් කිරීමට නැගී සිටීම නිසාම ඔහුගේ වහල්භාවය අර්ධ වශයෙන් අහෝසි විය. මහා පරිමාණ කම්හල් කර්මාන්තය විසින් පුහුණුව ලැබූ, නාගරික අධ්‍යාපනයෙන් අධ්‍යයනය ලැබූ සමකාලීන පංති විඥුත කම්කරුවා අවඥ සහගත ලෙස ආගමික ප්‍රාග්විනිශ්චයන් බැහැර කරයි. ඔහු ආගම් පූජකයින්ට සහ ධනවාදී අවිචාර බුද්ධිමතුන්ට භාරකොට, මෙලොවදීම තමාට වඩාත් හොඳ ජීවිතයක් දිනා ගැනීමට වෑයම් කරයි. ආගම නැමැති ධූම පටලයට විරුද්ධව සටන් කිරීම සඳහා විද්‍යාව ප්‍රයෝජනයට ගන්නා සමාජවාදයේ පැත්ත නිර්ධන පංතිය ගැනීමට පටන් ගෙන ඇත. වත්මන් කාලයේදීම මිහිපිට වඩාත් හොඳ ජීවිතයක් ලබාගැනීම සඳහා නිර්ධන පංතිය සමගි කරලීමෙන්, මරණයෙන් මතු ජීවිතයක් පිළිබඳව වූ විශ්වාසයෙන් ඔවුන් මුදවාලයි.

ආගම පෞද්ගලික කටයුත්තක් ලෙස ප්‍රකාශ කළ යුතුය. මෙම වචනවලින් සමාජවාදීහු සාමාන්‍යයෙන් ආගම කෙරෙහි තමන් දක්වන ආකල්පය ප්‍රකාශ කරති. එහෙත් මෙම වචනවල තේරුම පිළිබඳ වැරදි හැඟීම් දුරුකරලීම පිණිස ඒවා නිවැරදි ලෙස විග්‍රහ කළ යුතුය. රජය අනුව පමණක් බලන විට ආගම පෞද්ගලික දෙයක් විය යුතු බව අපි ඉල්ලා සිටිමු. එහෙත් අපේ පක්ෂය අනුව බලන විට, ආගම කිසිසේත්ම පෞද්ගලික කටයුත්තක් නොවිය යුතුය. රජය ආගම කෙරෙහි කිසිදු සැලකිල්ලක් නොදක් විය යුතුය. රජයේ අධිකාරය සමග ආගමික සංගම්වලට කිසිදු සම්බන්ධකමක් තිබිය යුතු නැත. තමන් කැමති ආගමක් ඇදහීමට සෑම කෙනෙකුටම පූර්ණ නිදහස තිබිය යුතුය. නැතිනම් කිසිම ආගමක් නොඇදහීමට, එනම් රිතියක්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වශයෙන් සෑම සමාජවාදියෙකුම මෙන් අදේවවාදියකු වීමටද පූර්ණ නිදහස තිබිය යුතුය. ආගමික විශ්වාසය අනුව රට වැසියන්ට වෙනස්කම් කිරීම සම්පූර්ණයෙන් තහනම්ය. නිල ලියවිලි වල රටවැසියන්ගේ ආගම පිළිබඳ තොරතුරු සටහන් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කළ යුතුය. රාජ්‍යය දේවස්ථාන වලට නඩත්තු මුදල් දීමද, දේවස්ථාන සහ ආගමික සංගම්වලට ආධාර මුදල් දීමද නැවැත්විය යුතුය. සමාන මත දරන රටවැසියන්ගෙන් යුත්, රජයෙන් ස්වාධීන සමාගමයන් බවට මේවා පත්විය යුතුය. පල්ලිය රජයේ රදළ පැවැත්ම මත ජීවත් වූ, රුසියානු රට වැසියන් රජය පිළිගත් පල්ලියේ රදළ ආධිපත්‍යය යටතේ ජීවත් වූ, මධ්‍යකාලීන යුගයට අයත් අධර්ම මර්දනාධිකරණ නීති (අදත් මේ නීති අපේ දණ්ඩ නීති සංග්‍රහයේ සහ ව්‍යවස්ථාවලද දක්නට ඇත) සහිත ලජ්ජා සහගත සහ ශාපලත් අතීතය අකාමකා දැමිය හැක්කේ මෙම ඉල්ලීම් පූර්ණ ලෙස ඉටු කර ලීමෙනි. මෙම අධර්ම මර්දනාධිකාරී නීති අනුව මිනිසුන්ගේ විඥානය උල්ලංඝණය කරමින්, විවිධ ආගම් විශ්වාස කරන්නන්ට සහ අවිශ්වාස කරන්නන්ට දඬුවම් දී ඇත්තේය. රජය පිළිගත් ආගමික නිකාය නැමැති මත්ද්‍රව්‍ය පාවිච්චි කරමින් රජයේ උසස් තනතුරු සහ රජයේ ආදයම් බෙදා හැරීම මෙයට සම්බන්ධ කර ඇත. පල්ලිය සහ රජය, සමකාලීන රජයෙන් සහ සමකාලීන පල්ලියෙන් සම්පූර්ණයෙන්ම වෙන් කළ යුතුයයි සමාජවාදී නිර්ධන පංතිය ඉල්ලා සිටී.

දේශපාලන නිදහසේ අවශ්‍ය සංයුතියක් ලෙස මෙම ඉල්ලීම රුසියානු විප්ලවය විසින් ක්‍රියාවට යෙදවිය යුතුය. පොලිස් නිලධාරීන්ගෙන් පිරී පවතින රදළවාදී ස්වෛරී තන්ත්‍රයේ ඇති දුෂ්ට ක්‍රියා කලාපය නිසා පූජක තන්ත්‍රය තුළ පවා නොසන්සුන්තාවයක් සහ කෝපයක් හටගෙන තිබෙන බැවින්, මේ අනුව රුසියානු විප්ලවය විශේෂ වාසිදායක තත්වයක පවතී. රුසියානු ඕතොඩොක්ස් ක්‍රිස්තියානි නිකායේ පූජකවරුන් කෙතරම් දූගී වුවද, කෙතරම් මෝඩ වුවද, රුසියාවේ පැරණි මධ්‍යකාලීන ක්‍රමය බිඳ වැටීම නිසා ඇතිවූ ඉමහත් හඬ විසින් ඔවුහු පවා නැගී සිටිති. ඔවුහු පවා නිදහස ඉල්ලීමේ ව්‍යාපාරයට එකතුවෙති. නිලධාරිවාදී ක්‍රියාවලට සහ නිලවාදයට විරුද්ධවද, ''දෙවියන්වහන්සේගේ සේවකයින් මත'' පටවා ඇති පොලීසියට ඔත්තු සැපයීමේ රාජකාර්යයට විරුද්ධවද ඔවුහු නැගිට සිටිති. සමාජවාදීන් වන අපි මෙම ව්‍යාපාරයට ආධාර කළ යුතු වෙමු. පූජක තන්ත්‍රයේ ඍජු සහ අවංක සාමාජිකයින් සිය නිගමනය කරා ගෙනයමින්, නිදහස පිළිබඳ ඔවුන්ගේ වගකීම්වලට ඔවුන් ගරු කළ යුතු බව ඉල්ලා සිටිමින්, ආගම සහ පොලීසිය අතර ඇති සියලු සම්බන්ධකම් බිඳ දැමිය යුතු යැයි ඔවුන්

විසින් තීරණාත්මක ලෙස ඉල්ලා සිටිය යුතු බව ඔවුන්ට දන්වමින් අප ක්‍රියා කළ යුතුය. නුඹලා අවංක නම්, පල්ලියෙන් රජයද, පාසලින් පල්ලියද වෙන් කර ලීම සඳහාත් ආගම සම්පූර්ණයෙන්ම සහ නිරපේක්ෂ වශයෙන් පෞද්ගලික කටයුත්තක් ලෙස ප්‍රකාශ කර ලීම සඳහාත්, ක්‍රියා කළ යුත්තාහ. නැතිනම් නුඹලා නිදහස සඳහා කරන මේ ස්ථිර ඉල්ලීම් නොපිළිගනිති. එසේනම් නුඹලා අධර්ම මර්දනාධිකරණයේ සම්ප්‍රදායයන්වල සිරකරුවන් ලෙස තවමත් ජීවත් වෙති, එසේ නම් නුඹලා තවමත් සැප පහසුකම් ඇති ආණ්ඩුවේ රක්ෂාවල් බදාගෙන සිටිති, ආණ්ඩුවෙන් ලැබෙන ආදායම් භුක්ති විඳිති, එසේනම් නුඹලා, සිය අධ්‍යාත්මික අවියේ බලය ගැන විශ්වාසය නොතබා දිගින් දිගටම රජයෙන් අල්ලස් ලබා ගනිති. තත්වය මෙසේ වන්නේ නම්, මුළු මහත් රුසියාවේ පංති විඥාත කම්කරුවෝ නුඹලාට විරුද්ධව අනුකම්පා විරහිත ලෙස යුද්ධ ප්‍රකාශ කරති.

එහෙත් නිර්ධන පංතියේ සමාජවාදී පක්ෂයට නම්, ආගම පෞද්ගලික කටයුත්තක් නොවේ. අපේ පක්ෂය කම්කරු පංතියේ විමුක්තිය සඳහා සටන් කරන දියුණු සටන් කාමීන්ගේ පංති විඥාත සංවිධානයකි. එවැනි සංවිධානයක් ආගමික විශ්වාසවල හැඩයක් ගන්නා, පංති අවිඥාතභාවය, අමනකම හෝ ඥාන ශූන්‍යතාවය කෙරෙහි උදාසීනත්වයක් නොදැක්විය හැකි සහ නොදැක්විය යුතුය. අපේ පුවත්පත් මගින් හා කට වචනයෙන්, පිරිසිදු දෘෂ්ටිමය සහ හුදු දෘෂ්ටිමය අවිං මගින් ආගම නැමැති ධූම පටලයට විරුද්ධව සටන් කළ හැකිවන සේ, රජයෙන් පල්ලිය වෙන් කළ යුතු බව අපි තරයේම ඉල්ලමු. අප අපේ සංවිධානය වන රුසියානු සමාජ — ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය (රු.ස.ප්‍ර.ක.ප) බිහි කළේ ආගම මුල් කරගෙන කම්කරුවන් අඳුරෙහි තැබීමට විරුද්ධව නිශ්චිත ලෙසම සටන් කිරීම සඳහාය. අපට නම් දෘෂ්ටිමය අරගලය පෞද්ගලික කරුණක් නොවේ. එහෙත් එය මුළු මහත් පක්ෂයේම, මුළු මහත් නිර්ධන පංතියේම කාර්යයකි.

එසේ නම්, අපි අපේ වැඩ පිළිවෙල මගින් අදේවවාදීන් බව ප්‍රකාශ නොකරන්නේ මන්ද? ක්‍රිස්තු භක්තිකයින්ට සහ වෙනත් දෙවිවරුන් අදහන පුද්ගලයින්ට අප පක්ෂයට බැඳීම තහනම් නොකරන්නේ මන්ද?

මෙම ප්‍රශ්නයට සපයන පිළිතුර අනුව, ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන් සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් විසින් ආගම ඉදිරිපත් කරන ආකාරයේ ඉතා වැදගත් වෙනස තේරුම් කෙරෙයි.

අපේ වැඩ පිළිවෙල සම්පූර්ණයෙන්ම විද්‍යාත්මක අඩු වැඩි ද්‍රව්‍යවාදී ජගත් දෘෂ්ටියක් මත පදනම් වී ඇත. එබැවින් අපේ වැඩ පිළිවෙල

https://liberationbase.wordpress.com

විස්තර කිරීම ආගම නැමැති ධූමිකාවේ සැබෑ ඓතිහාසික සහ ආර්ථික පදනම් විස්තර කිරීම අවශ්‍ය ලෙසම අයත් වෙයි. අපේ ප්‍රචාරය අවශ්‍යයෙන්ම අදේවවාදී ප්‍රචාරයන්ගෙන් යුක්ත වේ. ස්වෛරී තන්ත්‍රික ආණ්ඩුව විසින් මෙතෙක් දැඩිලෙස තහනම් කර ඇති සහ දඬුවම් පමුණුවන ලද, උචිත විද්‍යාත්මක සාහිත්‍ය කෘතීන් පළකිරීම, අප පක්ෂයේ වැඩවල එක් ක්ෂේත්‍රයක් විය යුතුය. වරක් එංගල්ස් ජර්මන් සමාජවාදීන්ට දුන් උපදෙස් දැන් අප විසින් අනුගමනය කළ යුතුය. දහඅටවැනි සියවසේ ප්‍රංශ බුද්ධිමතුන්ගේ සහ අනීශ්වරවාදීන්ගේ කෘතීන් පරිවර්තනය කොට පුළුල් ලෙස බෙදා හැරිය යුතුය.[18]

එහෙත් කිසිම අවස්ථාවකදී හෝ ආගමික ප්‍රශ්නය හුදු වියුක්ත, විඥානවාදී හැඩයකට, පංති සටන්වලට සම්බන්ධ නොවූ, ‘බුද්ධිමය’ ප්‍රශ්නයක් ලෙස ඉදිරිපත් කිරීමේ වරදට අප හසු නොවිය යුතුය. ධනපතීන් අතර සිටින රැඩිකල් ප්‍රජාතන්ත්‍රවාදීහු මෙවැනි දෑ නිතර පාහේ කරති. ඉමක් නැති පෑගීම් සහ නින්ද අපහාසවලට කම්කරු පංතිය භාජනය කිරීම පදනම් වී ඇති සමාජයක ආගම පිළිබඳ අගතිගාමී හැඟීම්, හුදු ප්‍රචාරක ක්‍රමවලින් පමණක් දුරු කරලිය හැකියැයි සිතීම මෝඩ අදහසකි. මිනිස් සංහතිය මත පටවා ඇති ආගම නැමැති වියගහ සමාජය තුළ තිබෙන ආර්ථික වධ බන්දනය නැමැති විය ගහේම ප්‍රතිබිම්බයක් බව අමතක කිරීම ධනවාදී පටු බුද්ධියක් වනු ඇත. නිර්ධන පංතිය ධනවාදයේ පාපතර බලවේගයන්ට විරුද්ධව සටන් කොට, ආලෝකාවබෝධයක් ලබා ගෙන නැති නම්, කෙතෙක් පොත් පිංචවල් මුද්‍රණය කළත්, කොතෙක් දේශනයන් කළත් එයට ආලෝකාවබෝධය ලබාගත නොහැකිය. මිහිපිට පරාදීසයක් බිහිකිරීම සඳහා පෑගෙන පංතීන්ගේ මේ සැබෑ විප්ලවවාදී අරගලයේදී සමගිය ගොඩනැගීම, ස්වර්ගයේ පරාදීසයක් පිළිබඳ නිර්ධන පංතික මතයේ එක්සත්කමට වඩා අපට වැදගත් වන්නේය.

අපේ අනීශ්වරවාදය පිළිබඳව අපේ වැඩපිළිවෙලින් අප නොදක්වන සහ නොදැක්විය යුතු හේතුව මෙයයි. පැරණි අගතිගාමීත්වයේ එක් හෝ තවත් නටබුන් ආරක්ෂා කරන නිර්ධන පංතියට අපේ පක්ෂය සමග සම්බන්ධවීම තහනම් නොකරන්නේත්, නොකළ යුත්තේත් මේ හේතුව නිසාය. අපි නිතරම විද්‍යාත්මක ජගත් දෘෂ්ටිය දේශනා කරමු. කිතුනු බැතිමතුන්ගේ විවිධ කොටස්වලට අයත් අස්ථිරතාවයට විරුද්ධව සටන් කිරීමද අපට අවශ්‍ය වන්නේය. එහෙත් ආගමික ප්‍රශ්නයට මුල් තැන දිය යුතුයැයි මින් කොහෙත්ම අදහස් නොකෙරේ. ආගම පිළිබඳ ප්‍රශ්නය මුල් තැන ගෙන නැත. ඒ අතරම, ඉක්මණින්ම සියලු දේශපාලන වැදගත්කම් නැතිව යන, ආර්ථික සංවර්ධනයේ

ක්‍රියාදමය විසින් කහළ ගොඩට වීසිකර දමන, පහත් ගණයේ මතයන් සහ තේරුමක් නැති අදහස් නිසා සැබෑ විප්ලවවාදී ආර්ථික සහ දේශපාලන අරගලයේ බලවේගයන් අතර භේදයක් ඇතිවීමට අප ඉඩ දිය යුතුයැයිද මින් අදහස් නොකෙරේ.

ආගම් භේදය පැතිර වීමට ලෝකයේ හැම රටකම ප්‍රතිගාමී ධනපති පංතිය ක්‍රියා කරන අතර දැන් රුසියාවේද එය පටන් ගෙන ඇත්තේ, විප්ලවවාදී අරගලයෙන් එක්සත් වෙමින් සිටින සමස්ත රුසියානු නිර්ධන පංතිය, විසින් ව්‍යවහාරික ලෙස විසඳන්නාවූ සැබවින්ම වැදගත් සහ මූලික ආර්ථික හා දේශපාලන ප්‍රශ්නවලින් ජනතාවගේ සැලකිල්ල අන් අතකට යොමු කරවනු පිණිසය. කළු ශතකයේ ආගම් භේද ප්‍රචණ්ඩ ක්‍රියාවලින් අද ප්‍රකාශ වන නිර්ධන පංතික බලවේගයන් දෙකඩ කිරීමේ ප්‍රතිගාමී ප්‍රතිපත්තිය, හෙට වන විට වඩාත් සියුම් ආකාරයන් ගැනීමට ඉඩ ඇත. අපි සංසුන් ලෙසත්, ස්ථිර ලෙසත්, ඉවසිලි සහගත ලෙසත් නිර්ධන පංතික සහයෝගතාවය දේශනා කරමින් සහ විද්‍යාත්මක ජගත් දෘෂ්ටිය දේශනා කරමින් එයට විරුද්ධ වමු. එම දේශනා ක්‍රමය නොවැදගත් භේදයන් ඇවිලවීමට සම්පූර්ණයෙන්ම විරුද්ධය.

LIBERATIONBASE

රජය අනුව බලන විට, ආගම සැබවින්ම පෞද්ගලික දෙයක් කිරීමට විප්ලවවාදී නිර්ධන පංතිය සමත් වනු ඇත. මධ්‍යකාලීන යුගයේ පෙඳ පාසිවලින් පිරිසිදු කොට ගත් මේ දේශපාලන ක්‍රමය තුළ, මිනිස් සංහතිය ආගමික මංමුළාවකට ඇද දැමූ සැබෑ හේතුව වන ආර්ථික වහල්භාවය නැති කර ලීම සඳහා නිර්ධන පංතිය පුළුල් සහ විවෘත අරගලයක් ගෙනයනු ඇත.

‘‘නෝවය ෂිස්න්’’ අංක 28, 1905 දෙසැම්බර් 3.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, වෙළුම 12, පිටු 142-147.

https://liberationbase.wordpress.com

මාක්ස්වාදය සහ සංශෝධනවාදය

ජ්‍යාමිති ශාස්ත්‍රීය ප්‍රත්‍යක්ෂයයන් මිනිස් අවශ්‍යතාවයන් කෙරෙහි බලපාන්නේ නම් ඒවාද බිඳහෙළීමට ප්‍රයත්න දරනු ඇතැයි යන සුප්‍රසිද්ධ කියමනක් තිබේ. දේවධර්මයේ පැරණි දුර්මතයන් හා සංඝට්ටනය වන ස්වාභාවික විද්‍යාවේ න්‍යායයන් ඉතාමත් උමතු ප්‍රතිරෝධනයක් අවුස්සා ලූයේය, තවමත් අවුස්සා ලන්නේය. එනිසා, නවීන සමාජයේ දියුණු පංතිය අවබෝධයෙන් පෝෂණය කිරීමට සහ සංවිධානය කිරීමට කෙළින්ම උපකාරී වන, මෙම පංතිය හමුවේ ඇති කර්තව්‍යයන් සනිටුහන් කරන සහ වර්තමාන ක්‍රමය වෙනුවට, ආර්ථික සංවර්ධනය හේතු කොට ගෙන, — නව ක්‍රමයක් ආදේශ කිරීම නොවැළැක්විය හැකි බව පෙන්නුම් කරන මාක්ස්වාදී ධර්මයට ස්වකීය ජීවිතයේ සෑම ඉදිරි පියවරක් සඳහාම සටන් කිරීමට සිදුවී තිබීම පුදුමයක් නොවේ.

දේපළ හිමි පංතිවල නැගී එන පරම්පරාවේ ඔළු අවුල් කිරීම සහ එය අභ්‍යන්තර සහ බාහිර සතුරන්ට විරුද්ධ හුරු පුරුදු කිරීම සඳහා නිල මහාචාර්‍යවරු විසින් නිල වශයෙන් උගන්වනු ලබන ධනපති විද්‍යාවට සහ දර්ශනයට මෙය අදාළ වන බව කිව මනා නොවේ. මෙම විද්‍යාව මාක්ස්වාදයේ නම පවා ඇසීමට අකැමතිය. එය කියන්නේ මාක්ස්වාදය බිඳ හෙළා සහ සුනු විසුනු කොට දමා ඇති බවය. සමාජවාදය බිඳ හෙළීම වෘත්තියක් කොටගත් තරුණ උගතුන්ද, යල්පැනගිය "ක්‍රම" වල නෝකාකාර සම්ප්‍රදායයන් රකින්නා වූ ජරාජීර්ණ වෘද්ධයන්ද යන දෙකොටසම ඒකාකාර අභිරුචියකින් මාක්ස්ට පහර දෙති. මාක්ස්වාදයේ ප්‍රගතියත්, එහි අදහස් කම්කරු පංතිය අතර පැතිර යමින් එය තුළ තදින් මුල් බැස ගැනීමත් සැබවින්ම සිදු වන නිසා එයට විරුද්ධව ධනපති පංතිය දෙන මෙම ප්‍රහාරයන්ගේ නිරන්තරභාවය හා උත්සන්නකම අනිවාරණීය ලෙසටම වැඩි වේ. නිල විද්‍යාව

විසින් මාක්ස්වාදය "සුනු විසුනු" කරනු ලැබූ සෑම අවස්ථාවකට එය වඩාත් ශක්තිමත් වේ, වඩාත් දැඩි වේ, හා වඩාත් බලවත් වේ.

එසේ වුවද, කම්කරු පංතියේ අරගලය හා සමග සම්බන්ධ වූ හා ප්‍රධාන වශයෙන් නිර්ධන පංතිය තුළ පැතිර පැවති ධර්මයන් අතර පවා, මාක්ස්වාදය එක් වරම තහවුරු වූයේ නොවේ. මාක්ස්වාදයේ පැවැත්මේ ප්‍රථම අර්ධ ශතවර්ෂය තුළ (1840 පටන් ඉදිරියට) එය එයට සතුරු වූ න්‍යායයන්ට විරුද්ධව අරගල කිරීම සඳහා ව්‍යාවෘත විය. හතලිස් ගණන්වල ප්‍රථම වර්ෂවලදී මාක්ස් හා එංගල්ස් දර්ශනික විඥානවාදය පිළිගත් රැඩිකල්වාදී තරුණ හේගල්වාදීන් සමග අරගලය හමාර කළහ. හතලිස් ගණන් අගදී ආර්ථික ධර්මයේ ක්ෂේත්‍රයෙහි ප්‍රැදෙන්වාදයට[19] විරුද්ධව අරගලය ආරම්භ විය. කුණාටුවලින් ගහණ 1848 වර්ෂයේ විද්‍යමානවූ පක්ෂ හා ධර්ම විවේචනය කිරීම මගින් මෙම අරගලය පනස් ගණන්වලදී සම්පූර්ණ වනු දක්නා ලදී. හැට ගණන්වලදී, අරගලය පොදු න්‍යාය ක්ෂේත්‍රයෙන් ඍජු ශ්‍රමකරු ව්‍යාපාරයට වඩාත් සමීප වූ ක්ෂේත්‍රයකට යොමු විය. එය ජාත්‍යන්තරයෙන් බකූනින්වාදය[20] නෙරපීමේ අරගලය විය. හැත්තෑ ගණන්වල මුල් අවුරුදුවලදී ජර්මනිය තුළ වේදිකාව මඳ කලකට ප්‍රැදෙන්වාදී මියුල්බෙර්ගෙර් විසින්ද, හැත්තෑ ගණන්වල අවසාන අවුරුදුවලදී අනුභූතිවාදී ඩූරිං විසින්ද අල්ලා ගෙන තිබුණි. නමුත් මෙම දෙදෙනාම නිර්ධන පංතිය කෙරෙහි පෑ බලය ඉතාමත් අල්ප විය. මේ වන විටම මාක්ස්වාදය අන්‍ය දෘෂ්ටිවාද සියල්ලම පරදවා, ශ්‍රමකරු ව්‍යාපාරය තුළ නිසැක ජයග්‍රහණයක් ලබා ගනිමින් තිබුණි.

අනූ ගණන් වන විට මෙම ජයග්‍රහණය ප්‍රධාන වශයෙන් සම්පූර්ණ කර තිබුණි. ප්‍රැදෙන්වාදී සම්ප්‍රදායයන් වැඩිම කාලයක් නොනැසී පැවතුනු ලතින් රටවල පවා, කම්කරු පක්ෂ ඒවායේ වැඩ පිළිවෙළවල් සහ උපක්‍රම අර්ථයෙන් මාක්ස්වාදී වූ අඩිතාලම් මත ගොඩ නැගූහ. කලින් කලට පවත්වන ජාත්‍යන්තර සම්මේලන ස්වරූපයෙන් යළිත් පණ ගන්වන ලද ශ්‍රමකරු ව්‍යාපාරයේ ජාත්‍යන්තර සංවිධානය, සියලුම වැදගත් කරුණුවලදී, අරගලයක් නොමැතිවම පාහේ මාක්ස්වාදී ස්ථාවරය පිළිගත්තේය. නමුත්, මාක්ස්වාදයට සතුරු වූ සියලු අනුපූර්ණ ධර්මයන්ම එය විසින් පෙරළා දමනු ලැබීමෙන් පසුව එම ධර්මයන් මගින් ප්‍රකාශිත ප්‍රවනතාවයන් වෙනත් මාධ්‍යයන් සෙවීමට පටන් ගත්තේය. ඒ අනුව අරගලයේ ආකෘති සහ ඊට හේතු වෙනස් විය. නමුත් අරගලය දිගටම පැවතියේය. ඒ අනුව මාක්ස්වාදයේ පැවැත්මෙහි දෙවැනි අඩ ශත වසර (අනූගණන්වලදී) ඇරඹුනේ මාක්ස්වාදය තුළම වූ එයට සතුරු උපනතියක අරගලයද සමගය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එක් කලෙක පිළිගත් මාක්ස්වාදියෙකුව සිටි බර්න්ෂ්ටයින්, වඩාත් ආන්දෝලන සහිතව වඩාත් අධිෂ්ඨාන සහගත ලෙස මාක්ස්ගේ ධර්මයට සංශෝධන ගෙන ඒම මගින් එම උපනතියට ඔහුගේ නම දුන්නේය. එම උපනතිය නම්, මාක්ස් ධර්මය සංශෝධනය කිරීමය, සංශෝධනවාදයය. ස්වාභාවික වශයෙන්ම — රටේ ආර්ථික නොදියුණුකමත්, ප්‍රවේණිදාස ක්‍රමයේ ඇටකටුවල බරෙන් මිරිකුණු ඉතා විශාල ගොවි ජනතාවක් පැතිරී සිටීමත් නිසා — මාක්ස්වාදී නොවන සමාජවාදය ඉතාමත් වැඩි කාලයක් තිස්සේ නොනැසී පැවතුනු රුසියාවේ පවා, අපගේ ඇස් ඉදිරියේම, එය පැහැදිලිවම සංශෝධනවාදය බවට පරිවර්තනය වෙමින් තිබේ. ගොවිජන ප්‍රශ්නයේදී (සියලුම ඉඩම් නාගරික සභා සන්තක කිරීමේ වැඩ පිළිවෙළ) හා වැඩ පිළිවෙළ හා උපක්‍රම ආශ්‍රිත පොදු ප්‍රශ්නවලදී යන දෙකෙහිදීම, අපගේ සමාජ-නරෝද්නික්වරු[21], ඔවුන්නේ පැරණි ක්‍රමයේ, එනම්, ස්වභාවය අනුව අංග පූර්ණ දහමක් හා මූලික වශයෙන් මාක්ස්වාදයට සතුරු වූ එම ක්‍රමයේ මරණාසන්න හා කල් ඉක්ම වූ නෂ්ටාවශේෂයන් වෙනුවට, වැඩි වැඩියෙන් මාක්ස් ධර්මයට ''සංශෝධන'' ආදේශ කරති.

මාක්ස්-පූර්ව සමාජවාදය පරාජය කරනු ලැබ ඇත. එය දිගටම එහි අරගලය ගෙනයයි. එහෙත් දැන් එය එම අරගලය කෙරෙන්නේ එහිම භූමියෙහි නොව, සංශෝධනවාදය ලෙසට, මාක්ස්වාදයේම භූමියෙහිය. එබැවින්, සංශෝධනවාදයේ දෘෂ්ටිමය සන්ධාරය විමර්ෂණය කරමු.

දර්ශනයේ ක්ෂේත්‍රයෙහිදී, සංශෝධනවාදය ධනපති මහාචාර්ය ''විද්‍යාව'' පසු පස ගියේය. මහාචාර්යවරු ''කාන්ත් වෙත ආපසු'' ගියහ. ඒ අනුව සංශෝධනවාදය නව-කාන්ත්වාදීන්[22] පසු පස ඇදී ගියේය. පූජකවරු දහස් ගණන් වරක් නැවත නැවතත් දර්ශනවාදී ද්‍රව්‍යවාදයට විරුද්ධව කී, නිසරු වදන්ම ප්‍රතිරාවය කළ මහාචාර්යවරු අනුව යමින් සංශෝධනවාදීහුද එකඟත්වය පා සිනාසී (අලුත්ම හන්ඩ්බුක් අනුව වචනයක් වචනයක් පාසා) බොහෝ කලකට පෙරම ද්‍රව්‍යවාදය ''බිඳහෙළන'' ලදැයි යනුවෙන් කෙඳුරූහ. හේගල් ''මිය ගිය සුනඛයෙකු''[23] ලෙසට ගත් මහාචාර්යවරු, තමන්ම විඥනවාදය, එනම්, හේගල්ගේ විඥනවාදයට වඩා දහස් වරක් පහත් හා නොවැදගත් විඥනවාදයක් දේශනා කරමින්, දයලෙක්තික ක්‍රමය කෙරේ පිළිකුල හඟවමින් උරහිස් නැටවූහ.එවිට සංශෝධනවාදීහු, ඔවුන් පසු පස යමින් ''උපාය දක්ෂ'' (හා විප්ලවවාදී) දයලෙක්තිකය වෙනුවට, ''සරල'' (සහ නිශ්චල) ''පරිණාමය'' ආදේශ කරමින්, දර්ශනික ලෙස විද්‍යාව කෙළෙසීමේ මඩ ගොහොරුවෙහි පෙරළුණහ. තමන්ගේ

විඥනවාදී හා ''විවේචනාත්මක'' යන ක්‍රම දෙකම ප්‍රබල මධ්‍යකාලීන ''දර්ශනය''ට (එනම් දේවධර්මයට) ගැලපීමෙන් මහාචාර්යවරු ඔවුන්ගේ නිල චේතන උපයාගත් අතර, නවීන රාජ්‍යය සම්බන්ධයෙන් නොව, දියුණු පංතියේ පක්ෂය හා සම්බන්ධයෙන්, ආගම ''පෞද්ගලික කටයුත්තක්'' කිරීමට උත්සාහ ගැනීමෙන් සංශෝධවාදීහු ඔවුන් සමීපයට ඇදුනහ.

මාක්ස් දහමට ඉදිරිපත් කරන ''සංශෝධනයන්'' ගෙන් පංති අර්ථය අනුව අදහස් වන්නේ කුමක්ද යන්න කීම අවශ්‍ය නොවේ. එය අධ්‍යාහාරයෙන්ම පැහැදිලිය. ජාත්‍යන්තර සමාජ-විප්ලවවාදී ව්‍යාපාරයේ සිටියවුන් අතුරෙන්, සංශෝධනවාදීන්ගේ ඇදහිය නොහැකි තරම් නිසරු වූ කථා, සසංගත දයලෙක්තික ද්‍රව්‍යවාදී ස්ථාවරයකින් විවේචනය කළ එකම තැනැත්තා ප්ලෙහානව් බව පමණක් මෙහිලා සඳහන් කරමු. ප්ලෙහානව්ගේ උපක්‍රමීය අවස්ථාවාදය විවේචනය කිරීම නැමති වෙස් මුහුණ පළඳවා පැරණි හා ප්‍රතිගාමී දර්ශනික කුණු කන්දල් හොරෙන් ඉදිරියට ගෙන ඒමට, මහත් මුළාවකින් ප්‍රයත්න දරනු ලබන හෙයින් මෙකල මෙය වඩාත් අවධාරණය කරමින් විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේය*

දේශපාලන අර්ථශාස්ත්‍රය ගැන සඳහන් කරන්නේනම්, සංශෝධනවාදීන්ගේ මෙම ක්ෂේත්‍රයේ ''සංශෝධන'' බෙහෙවින් විස්තරාත්මක හා පරිවේෂණාත්මක වූ බව සඳහන් කළ යුතුය. ''ආර්ථික සංවර්ධනය පිළිබඳ නව දත්තයන්'' ඉදිරිපත් කිරීම මගින් මහජනයා කෙරෙහි බලපෑමට ප්‍රයත්න දරන ලදී. මහා පරිමාණ නිෂ්පාදනය විසින් කුඩා පරිමාණ නිෂ්පාදනය සංකේන්ද්‍රණය කිරීම හා නෙරපා දැමීම කෘෂිකර්මාන්තය තුළ සිදු වන්නේම නැති බවත්, වාණිජයෙහි හා කර්මාන්තයෙහි එය සිදුවන්නේ ඉතා සෙමින් බවත්, කියන ලදී. දැන් අර්බුද දුර්ලභ හා දුර්වල වී ඇති බවත්, කාටල සහ සංගත ව්‍යාපාර නිසා ඒවා සම්පූර්ණයෙන්ම අහෝසි කර දැමීමට ප්‍රාග්ධනයට හැකි වනු ඇතැයි යනුත් කියන ලදී. පංති විරෝධතාවයන්ගේ සැර බාල

* බග්දනව්, බසාරව් සහ අනිකුත් අයගේ ''මාක්ස්වාදයේ දර්ශනය ගැන සමීක්ෂා'' බලන්නා. එම පොත ගැන සාකච්ඡා කිරීමට මෙය තැන නොවේ. නව කාන්ත්වාදී සංශෝධනවාදීන් ගැන මා මෙම ලියවිල්ලෙහි කියා ඇති හැම දෙයක්ම, මෙම නව හියුම්වාදී සහ නව බර්ක්ලිවාදී සංශෝධනවාදීන්ට ද මූලික වශයෙන් ගැලපෙන බව නුදුරු අනාගතයේදීම ලිපි මාලාවක් හෝ කුඩා පොතක් හෝ මගින් ඔප්පු කිරීමට මා බලාපොරොත්තු වන බව පමණක් මෙහිදී සඳහන් කරන්නෙමි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වීමේ සහ තියුණු කම අඩුවීමේ ප්‍රවණතාවය නිසා, ධනපති ක්‍රමය යොමුවී ඇතැයි කියන "බිඳවැටීම පිළිබඳ න්‍යායය" දුර්වල න්‍යායයක් ලෙස හඳුන්වන ලදී. බෙම්-බාවෙර්ක්ගේ මතය අනුව වටිනා කම පිළිබඳ මාක්ස්ගේ න්‍යායය වුවද නිවරද කිරීමේ වරදක් නැතැයි අවසාන වශයෙන් කියන ලදී.

මෙම ප්‍රශ්න පදනම් කර ගෙන සංශෝධනවාදීන්ට විරුද්ධව කළ සටනේ ප්‍රතිඵලයක් වශයෙන්, විසි අවුරුද්දකට පෙර එංගල්ස් ඩූරිං සමග කළ විවාදයෙන් සිදු වූ සේම, ජාත්‍යන්තර සමාජවාදයේ න්‍යායාත්මක චින්තනයේ ඵලදයක පුණර්ජීවනයක් ඇති විය. සත්‍ය කරුණු හා සංඛ්‍යා ලේඛන පිටිවහල්කොට ගෙන සංශෝධනවාදීන්ගේ තර්ක විග්‍රහ කරන ලදී. ඔවුන් නවීන කුඩා පරිමාණ නිෂ්පාදනය ක්‍රමානුකූල ලෙස රෝසපාටින් පින්තාරු කරමින් සිටින බව ඔප්පු විය. කර්මාන්තයෙහිදී පමණක් නොව කෘෂිකර්මාන්තයෙහිදී ද කුඩා පරිමාණ නිෂ්පාදනයට වඩා මහා පරිමාණ නිෂ්පාදනයේ ඇති තාක්ෂණික හා වාණිජ උසස් බව බිඳලිය නොහැකි සත්‍ය කරුණු අනුව ඔප්පු වී ඇත. නමුත් වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනය කෘෂිකර්මාන්තය තුළ සංවර්ධනය වී තිබෙන්නේ ඉතාමත් අඩුවෙනි. කෘෂිකර්මාන්තය ක්‍රම ක්‍රමයෙන් ලෝක ආර්ථිකයේ හුවමාරු ක්‍රියාදමය තුළට ඇදී යන බව සලකුණු කරන කෘෂිකර්මාන්තයේ විශේෂ අංශ (සමහර විට ව්‍යාපාර පවා) තෝරා බේරා ගැනීමෙහිදී, නවීන සංඛ්‍යා විද්‍යාඥයෝ හා ආර්ථික විද්‍යාඥයෝ, සාමාන්‍ය වශයෙන්ම වැඩි දක්ෂ කමක් නොදක්වති. කුඩා පරිමාණ නිෂ්පාදනය නඩත්තුවන්නේ, නිරන්තරව ආහාරය බාලකිරීමෙන්ද, සැමද සාගින්නෙන්ද, වැඩ දිනය දීර්ඝ කිරීමෙන්ද, ගවයන්ගේ සගුණත්ව තත්වය හා ඔවුනට සාත්තුව දුර්වල කිරීමෙන්ද, කොටින් කියතොත්, ධනපති කර්මාන්තයට විරුද්ධව හස්ත කර්මාන්තය රැකුණු ආකාරයෙන්ම, ස්වාභාවික ආර්ථිකයේ නෂ්ටාවශේෂ පිහිට කොට ගෙන වේ. විද්‍යාවේ හා කාර්මික ශිල්පයේ සෑම දියුණුවක්ම, ධනපති සමාජයේ කුඩා පරිමාණ නිෂ්පාදනයේ අඩිතාලම් අනිවාරණීය ලෙස හා නිර්දය ලෙස දුර්වල කරයි. බොහෝ විට සංකීර්ණ සහ පැටලිලි සහිත වන මෙම ක්‍රියාදමය, එහි ආකෘති සියල්ලම අනුව විමර්ශනය කිරීමත්, ධනපති ක්‍රමය යටතේ කුඩා නිෂ්පාදකයාට ඔහුගේ තත්වය රැක ගැනීමට කිසිම ඉඩක් නොලැබෙන බවද, ධනපති ක්‍රමය යටතේ ගොවිතැන් කරන ගොවියාට සහනයක් නොදෙන අති දුෂ්කර තත්වයද, ගොවියා නිර්ධන පංතියේ ස්ථාවරය පිළිගැනීමේ අවශ්‍යතාවයද, පෙන්වා දීමත්, සමාජවාදී දේශපාලන අර්ථ ශාස්ත්‍රයට භාර කර්තව්‍යය යි. මෙම ප්‍රශ්නයේදී ඒකාර්ථයෙන් තෝරාගත් කරුණු පදනම වශයෙන්

ගනිමින් ද, සමස්තයක් වශයෙන් ධනපති ක්‍රමය ගැන ක්‍රමයක් වශයෙන් සඳහන් නොකරම ද, මතුපිටින් සාමාන්‍ය කරණයන් කිරීමෙන්, සංශෝධනවාදීහු විද්‍යාත්මක අර්ථයෙන් බරපතල වරදක් කළහ. නිර්ධන පංතියේ දෘෂ්ටිකෝණය පිළිගන්නා ලෙසට සුළු ගොවියා උනන්දු කරනවා වෙනුවට, අනපේක්ෂිතව හෝ අනපේක්ෂිතව, සුළු දේපල හිමියාගේ ආකල්පය (එනම් ධනපති ආකල්පය) පිළිගන්නා සේ, ඔහුට අනිවාරණීය ලෙස ආරාධනා කිරීමෙන් හෝ උනන්දු කිරීමෙන් සංශෝධනවාදීහු දේශපාලන දෘෂ්ටිකෝණය අනුවද බරපතල වරදක් කළහ.

අර්බුද පිළිබඳ න්‍යායයත්, බිඳ වැටීම පිළිබඳ න්‍යායයත් සම්බන්ධයෙන් සංශෝධනවාදයේ තත්වය ඊටත් වඩා නරක විය. අවුරුදු කීපයක කාර්මික උත්පාතනය සහ සමෘධිය පදනම් කරගෙන මාක්ස්ගේ න්‍යායයට අමුතු හැඩයක් දීම ගැන මිනිසුන්ට කල්පනා කළ හැක්කේ ඉතා කෙටි කාලයක් ගතවන තෙක් පමණකි. එසේ කළ හැක්කේද ඉතාමත් කෙටි දෘෂ්ටියක් ඇති අයට පමණකි. අර්බුද යනු යටගියාවට හිමි දෙයක් නොවන බව යථාර්ථය සංශෝධනවාදීන්ට කල් නොයවාම පැහැදිලි කර දුන්නේය: සමෘධිය පසු පස අර්බුද ආවේය. ඒ ඒ අර්බුදයේ ආකෘති, අනු පිළිවෙළ හා පින්තූරය වෙනස් විය. එහෙත් අර්බුද ධනපති ක්‍රමයේ අනිවාරණීය සංයුක්ත කොටසක් විය. කාටල සහ සංගත ව්‍යාපාර, නිෂ්පාදනය එක්සත් කරන අතරම, ඒ හා සමගම, කාටත් පැහැදිලි වන ආකාරයට, නිෂ්පාදනයේ අරාජිකත්වයත්, නිර්ධන පංතියේ පැවැත්මේ අවදානම් සහගත තත්වය සහ ප්‍රාග්ධනයේ පීඩනයත් උග්‍ර කිරීමෙන්, පංති සතුරුතාවයන් පෙර නොවූ විරූ මට්ටමකට නගින සේ උත්සන්න කළේය. ධනපති ක්‍රමය — තනි දේශපාලන සහ ආර්ථික අර්බුදවල ද, එමෙන්ම මුළු ධනපති ක්‍රමයම සම්පූර්ණයෙන්ම බිඳ වැටීමේද, යන දෙ අර්ථයෙන්ම — බිඳ වැටීමක් කරා ඇදෙන බව, ඉඳුරාම නව යෝධ සංගත ව්‍යාපාර විසින්ම, විශේෂයෙන්ම පැහැදිලි ලෙස හා විශේෂයෙන්ම මහා පරිමාණ වශයෙන් පෙන්නුම් කර තිබේ පෙනෙන්නට තිබෙන ලක්ෂණ ගණනාවකින් පෙරනිමිති කියන, ළඟ එන කාර්මික අර්බුදය ගැන කිසිවක් නො කීවත්, ඇමෙරිකාවේ මෑත ඇති වූ මූල්‍ය අර්බුදයෙහිත් යුරෝපය මුළුල්ලේම භයානක ලෙස විරැකියාව වැඩි වී යාමෙහිත්, ප්‍රතිඵලයක් වශයෙන්, සංශෝධනවාදීන්ට බොහෝ දෙනෙකු ඇතුළු, බොහෝ අයට, සංශෝධනවාදීන්ගේ "න්‍යායයන්" අමතක වීමට හේතු විය. නමුත් මෙම බුද්ධිමතුන්ගේ අස්ථාවරභාවය කම්කරු පංතියට උගැන්නූ පාඩම අමතක නොකළ යුතු වේ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වට්නාකම පිළිබඳ න්‍යායය සම්බන්ධයෙන් කිව යුත්තේ, බෙම්-බාවෙර්ක්ගේ අදහස් අනුව, ඉතාමත් නොපැහැදිලි ඉඟි පෑම් හා සුසුම් ලෑම් හැර සංශෝධනවාදීන් එයට අදාලව කිසිම දෙයක් ඉදිරිපත් කර නොමැති බව හා ඒ ගැන වූ විද්‍යාත්මක චින්තනයේ වර්ධනය පිළිබඳ කිසිම සටහනක් වත් ඉතිරි කර නොමැති බවයි.

දේශපාලන ක්ෂේත්‍රයෙහිදී සංශෝධනවාදීහු ඇත්ත වශයෙන්ම මාක්ස්වාදයේ අඩිතාලම, එනම්, පංති අරගලය ගැන උගැන්වීම සංශෝධනය කිරීමට ප්‍රයත්න දැරූහ. දේශපාලනමය නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය හා සර්වජන ඡන්දය යන මේවා නිසා, පංති අරගලය කිරීමේ පසු බිම නැතිව යන බව අපට කියන ලදී. වැඩ කරන මිනිසුන්ට රටක් නැත යනුවෙන් ''කොමියුනිස්ට් ප්‍රකාශනය'' කියන අදහස ඉන් බොරු වන බව කියන ලදී. ප්‍රජාතන්ත්‍රයෙහි ''වැඩි දෙනාගේ කැමැත්ත'' බල පවත්වන නිසා, රාජ්‍යය පංතියක පාලනයක් ලෙස සැලකීම හෝ ප්‍රතිගාමීන්ට විරුද්ධව ප්‍රගතිශීලී, සමාජ-ප්‍රතිසංස්කරණ ධනපතියන් සමග සන්ධානයන් ඇති කර ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ නොකළ යුතුයයි ඔවුහු කීහ.

සංශෝධනවාදීන්ගේ මෙම තර්කවලින් ඉදිරිපත් වූයේ එක්තරා දුරකට මනාව තුලනය වූ අදහස් පද්ධතියක්, එනම්, පැරණි සහ සුප්‍රසිද්ධ ලිබරල්-ධනපති අදහස් බව විවාද රහිතව පිළිගැනීමට සිදු වේ. ඡන්දය දීමේ අයිතිය හා ආණ්ඩු කිරීමට සම්බන්ධ වීමේ අයිතිය, විශේෂයක් නොමැතිව, පුරවැසියන් සෑම දෙනාටම තිබෙන නිසා, ධනපති පාර්ලිමේන්තුවාදය නිසා, පංති හා පංති භේදය නැතිව යන්නේ යයි ලිබරල්වාදීහු නිතරම කීහ. එවැනි අදහස් කොතරම් අඥනද යනු, දහ නමවැනි ශත වර්ෂයේ යුරෝපයේ මුළු ඉතිහාසයෙන්ම හා විසිවැනි ශත වර්ෂයේ මුල් අවධියේ රුසියානු විප්ලවයේ මුළු ඉතිහාසයෙන්ම පැහැදිලිව පෙනේ. ධනපති ක්‍රමයේ ''ප්‍රජාතන්ත්‍රවාදී'' තරඟය යටතේ ආර්ථික වෙනස් කම් උග්‍ර වෙනවා මිස ලිහිල් වන්නේ නැත පාර්ලිමේන්තුවාදයෙන් සිදු වන්නේ, ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී ධනපති සමූහාණ්ඩු තුළ පවා ආවේනිකව පවතින පංති පීඩනයේ අවයව ස්වභාවය නැති වී යාම නොව, එය පැහැදිලිව අනාවරණය වීමය. ඉහත දේශපාලන සිදුවීම්වලට සහභාගි වූ පොදු ජනතා කොටස්වලට වඩා අපමණ පුළුල් ජන සමූහයකට දැනුම ලබා ගැනීමට හා සංවිධානය වීමට ආධාර කිරීම නිසා පාර්ලිමේන්තුවාදයෙන් අර්බුද හා දේශපාලන විප්ලව අහෝසි වන්නේ නැත. එයින් සිදු වන්නේ, එවැනි විප්ලවවලදී සිවිල් යුද්ධය උපරිම මට්ටමින් උත්සන්න වීමය. මෙම උත්සන්න වීම කෙසේ නම් අනිවාරණීය ලෙස සිදු වන්නේද

යන්න පැරිසියේ 1871 වසන්තයේ සිද්ධිවලින් හා රුසියාවේ 1905 ශීත ඍතුවේ සිද්ධිවලින්[24] ඉතාමත් පැහැදිලි ලෙස පෙනී ගොස් තිබේ. නිර්ධන පංතිය පොඩිපට්ටම් කර දැමීම සඳහා ප්‍රංශ ධනපති පංතිය මොහොතක හෝ පැකිළීමක් නොමැතිව, මුළු ජාතියේම සතුරා සමග, එනම් රට විනාශ කළ විදේශීය හමුදාව සමග, එකඟත්වයක් ඇති කර ගත්තේය. බහු ජන හිංසනයේ තර්කය මගින් පෙරටත් වඩා තියුණු තීරණයක් ගැනීමට මඟ හෙළි කරන පාර්ලිමේන්තුවාදයට සහ ධනපති ප්‍රජාතන්ත්‍රවාදයට ආවේණික අනිවාර්ය දයලෙක්තිකය වටහා නොගන්නා කොයි කවුරු වුවත්, මෙම පාර්ලිමේන්තුවාදය පදනම් කර ගෙන, එවැනි ''තර්ක'' වලට ජයග්‍රාහී ලෙස සහභාගි වීම සඳහා කම්කරු පංති ජනතා සමූහයා ඇත්ත වශයෙන්ම සූදනම් කරන්නා වූ, ප්‍රතිපත්තියෙන් සසංගත වූ ප්‍රචාරය සහ උද්ඝෝෂණය ගෙනයාමට කිසි කලෙකත් සමත් වන්නේ නැත. බටහිර සමාජ-ප්‍රතිසංස්කරණ ලිබරල්වාදීන් සමග සහ රුසියානු විප්ලවයේ ලිබරල් ප්‍රතිසංස්කරණවාදීන් (කැඩෙට්වරු[25]) සමග ඇති කරගත් සන්ධානයන්, එකඟතාවයන් හා පෙරමුණු දුන් අත්දැකීම්වලින් මනාව ඒත්තුයන සේ පෙනී ගොස් ඇති දෙයක් නම්, සටන් කිරීමේ හැකියාව අතින් දුර්වලතම, ඉතාමත් වැනෙන සුලු සහ ද්‍රෝහී කොටස් සමග සටන් කරුවන් එකට සම්බන්ධ කිරීමෙන්, මෙම ගිවිසුම්වලින් සිදු වන්නේ, ජනතාවගේ විඥනය මොට කිරීමත් හා එයින් ඔවුන්ගේ අරගලයේ වැදගත්කම වැඩි නොකර එය අඩු කිරීමත්, පමණක් බවය. ලෝකය මුළුල්ලේම නිර්ධන පංතියට කිසි කලෙකත් අමතක නොවන පරිද්දෙන් සංශෝධනවාදී දේශපාලන උපක්‍රම පුළුල් හා සැබැවින්ම ජාතික පරිමාණයෙන් යොදා ගැනීමේ විශාලම අත්හදා බැලීම වූ, ප්‍රංශයේ මිලියරාන්වාදය[26] සංශෝධනවාදය ගැන අගය කිරීමක් සපයා තිබේ.

ඔවුන් සමාජවාදයේ පරමාර්ථ අරමුණ කෙරෙහි දැක්වූ ආකල්පය වූයේ, එම අරමුණ සංශෝධනවාදයේ ආර්ථික හා දේශපාලන ප්‍රවණතාවයන්ගේ ස්වාභාවික ඌණ පූරකයක් කොට සැලකීමය. ''සියල්ලටම වඩා ව්‍යාපාරය වැදගත්ය. පරාමාර්ථ අරමුණ වැදගත් නොවේ.'' දීර්ඝ දේශනා ගණනාවකට වඩා හොඳින් සංශෝධනවාදයේ හරය විස්තර කිරීමට බර්න්ෂ්ටයින් යොදගන්නේ එම සිත්ගන්නා පාඨය යි. අවස්ථාවෙන් අවස්ථාවට හැසිරෙන ආකාරය වෙනම තීරණය කිරීම, කාලීන සිදුවීම් අනුව සහ සාමාන්‍ය දේශපාලනයේ කැපුම්, කෙටුම් හා වෙනස්වීම් අනුව තමන් හැඩ ගැසීම, නිර්ධන පංතියේ ප්‍රධාන අවශ්‍යතාවයන් සහ මුළු ධනපති ක්‍රමයේත්, මුළු ධනපති පරිණාමයේත් මූලික අංග ලක්ෂණ අමතක කිරීම, අවස්ථාවේ සැබෑ හෝ කල්පිත වාසි තකා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මෙම මූලික අවශ්‍යතාවයන් කැප කිරීම — සංශෝධනවාදයේ ප්‍රතිපත්තිය එසේය. තවද, ඒ අනුව, මෙම ප්‍රතිපත්තියේ ස්වභාවය නිසාම එය නියමයක් නොමැති ආකෘති ගණනාවකින් ඉදිරිපත් වන බවත්, යම් දුරකට හෝ "නව" තාවයක් ඇති සෑම ප්‍රශ්නයකදීමද, යම් දුරකට හෝ බලාපොරොත්තු නොවූ හා නොසිතූ විරූ සිදුවීමක් ඇති වන, සංවර්ධනයේ මූලික ක්‍රියාමාර්ගය ඉතා සුළු වශයෙන් හා ඉතා සුළු කලකට පමණක් වෙනස් කරන සුලු එවැනි සිදුවීමක් වුවද ඇතිවන, සෑම අවස්ථාවකදීම ද, එක් හෝ තවත් ආකාරයක සංශෝධනවාදයක් උද්ගත වන බව ඉතා ප්‍රකටව පෙනෙන කරුණකි.

සංශෝධනවාදයේ නොවැලැක්විය හැකි බව නිර්ණය වන්නේ නවීන සමාජය තුළ විහිදී ඇති එහි මුල් අනුවය. සංශෝධනවාදය ජාත්‍යන්තර ප්‍රපංචයකි. ජර්මනියේ ඕතොඩොක්ස්වරු[27] සහ බර්න්ෂ්ටයින්වාදීන් අතරද, ප්‍රංශයේ ගෙද්වාදීන් සහ ජොරේස්වාදීන් (දැන්, විශේෂයෙන්ම බ්රූස්වාදීන්)[28] අතරද, එංගලන්තයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සම්මේලනය සහ ස්වාධීන කම්කරු පක්ෂය[29] අතරද, බෙල්ජියමේ බ්රූකෙර් සහ වන්දෙර්වෙල්ද් අතරද, ඉතාලියේ අංග පූර්ණවාදීන් සහ ප්‍රතිසංස්කරණවාදීන් අතරද[30], රුසියාවේ බොල්ෂෙවික්වරු හා මෙන්ෂෙවික්වරු අතරද පවතින සම්බන්ධය, එරටවල් සියල්ලෙහි වර්තමාන තත්වයට අංවේනික වන ජාතික කොන්දේසිවල සහ ඓතිහාසික සාධකයන්ගේ අතිශය විවිධත්වය එසේ තිබියදීම, සෑම තැනෙකම, එම සම්බන්ධය මූලික වශයෙන් එක සමාන වන බව ගැන, කල්පනාකාරී සහ ඉතා අඩු මට්ටමේ හෝ දැනුම ඇති සමාජවාදියෙකුට සැකයක් ඇති කර ගැනීමට ඉඩක් නැත. යථාර්ථ ලෙසට, වර්තමාන ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ "බෙදීම", දැන් ලෝකයේ සියලුම විවිධ රටවල එකම මාර්ගයක් ඔස්සේ ක්‍රියාත්මක වෙමින් පවතී. අවුරුදු තිහකට, හතළිහකට පෙර, විවිධ රටවල වූ එකම ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයේ විෂමජාතීය උපනති ඒවා අතර අරගල කරගනිමින් පැවති තත්වය සමග සසඳා බලන කල මෙය දැවැන්ත ඉදිරි ගමනක් නියෝජනය කරන්නකි. එසේම ලතින් රටවල "විප්ලවවාදී සින්ඩිකෝට්වාදය"[31] ලෙසට "වමෙන් එන සංශෝධනවාදය" ද මාක්ස්වාදය "සංශෝධනය" කරමින් එයට ගැලපෙන සේ සකස් වෙයි: වැරදි ලෙසට වටහා ගනු ලැබූ මාක්ස්ට විරුද්ධව නිවැරදි ලෙස වටහා ගනු ලැබූ මාක්ස් වෙත ඉතාලියේ ලබ්‍රියෝලාද, ප්‍රංශයේ ලගර්දෙල් ද නිතර නිතර ආයාචනා කරනු ඇසේ.

අවස්ථාවාදී සංශෝධනවාදය තරම් දුරට තවමත් කිසිසේත් සංවර්ධනය වී නොමැති, මෙම සංශෝධනවාදයේ දෘෂ්ටිමය සන්ධාරය

විග්‍රහ කිරීමට අපට මෙහිදී ප්‍රමාද විය නොහැකිය. එය තවමත් ජාත්‍යන්තර තත්වයට පැමිණ නැත; එකම රටක වත් සමාජවාදී පක්ෂයක් සමග කරන ලද එකම ලොකු ප්‍රායෝගික සටනක හෝ පරීක්ෂාවට එය තවමත් භාජනය වී නොමැත. එනිසා අපි ඉහත විස්තර කරන ලද "දකුණෙන් එන සංශෝධනවාදයට" පමණක් සීමා වන්නෙමු.

ධනපති සමාජය තුළ එය ඇතිවීම අනිවාරණීය වන්නේ කුමක් නිසාද? ජාතික විශේෂතාවයන්ටත්, ධනපති සංවර්ධනයේ මට්ටමෙහි වෙනස්කම්වලටත් වඩා එය ගැඹුරු වන්නේ මන්ද? එසේ වන්නේ, සෑම ධනපති රටකම, නිර්ධන පංතිය හා සමග එහි එක පැත්තකින් නිතරම ඉතා පුළුල් සුළු ධනපති, සුළු දේපල හිමියන් ස්ථරයක් සිටින හෙයිනි. ධනපති ක්‍රමය පැන නැගුණේ හා නිරන්තරව පැන නගින්නේ සුළු නිෂ්පාදනයෙනි. ධනපති ක්‍රමය විසින් අළුත් "මධ්‍යම ස්ථර" ඇඳුතු (පැක්ටරියට සම්බන්ධ උපාංග, ගෙදරවල වැඩ කිරීම, බයිසිකල් හා මෝටර්වාහන කර්මාන්ත ආදී විශාල කර්මාන්තවල අවශ්‍යතාවයන් සපුරාලීමට රට සෑම තැනම විසිරී ගිය කුඩා කර්මාන්ත ශාලා) නැවත නැවතත් අනිවාරණීය ලෙසම ජනිත කරනු ලැබේ. එසේම අනිවාරණීය ලෙසට, මෙම අළුත් සුළු නිෂ්පාදකයන්, නැවතත් නිර්ධන පංති සමූහයා අතරම වීසි කරනු ලැබේ. පුළුල් කම්කරු පක්ෂ තුළ, සුළු ධනේශ්වර ලෝකාවබෝධය නැවත නැවතත් පැන නැගීම ඉතාමත් ස්වාභාවිකය. එය එසේ වීම ඉතාමත් ස්වාභාවිකය; නිර්ධන පංති විප්ලවයේදී වාසනාවේ වෙනස්කම් ඇති වන තාක් දක්වාම, එය කවදත් එසේම වනු ඇත. එවැනි විප්ලවයක් ඇති කිරීම සඳහා ජනගහනයෙන් බහුතරයක් "සම්පූර්ණ" නිර්ධන පංති කරණයට භාජන කිරීම අවශ්‍යයයි කල්පනා කිරීම බරපතල වරදක් වනු ඇත. නිර්ධන පංති විප්ලවය මගින්, විවාද විෂය කරුණු සියල්ලම තියුණු කෙරෙන විටත්, පොදු ජනතා සමූහයාගේ හැසිරීම නිර්ණය කිරීමේදී ඉතාමත් හදිසි වැදගත් කමක් ඇති කරුණු සම්බන්ධයෙන් වන වෙනස් කම් සියල්ලම අවධානයේ එල්ලයට ගෙන එන විටත්, සටනේ තාපය අසූ අස්සේම සතුරන් හා මිතුරන් වෙන් කොට හඳුනා ගැනීම අවශ්‍ය කෙරෙන විටත්, සතුරාට තීරණාත්මක ප්‍රහාරයක් දීම පිණිස නරක මිතුරන් ඉවත ලීමට සිදු වන විටත්, අපට දැන් දෘෂ්ටිමය ක්ෂේත්‍රයෙහි නිතර දක්නට ලැබෙන දෙය වන මාක්ස්ගේ දහමට න්‍යායික සංශෝධන ගෙන ඒම ගැන ආරාවුල්ද, දැන් කම්කරු ව්‍යාපාරය ආශ්‍රිත තනි හා අංශ බද කරුණු සම්බන්ධයෙන් ව්‍යවහාරයේදී මතුවන උපක්‍රමීය ප්‍රශ්න ගැන පමණක් සංශෝධනවාදීන් සමග ඇති වන වෙනස්කම් හා ඉන් පැන නගින භේදභින්න වීම් ලෙසට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පැන නගින දෙයද, අසදෘශ ආකාර විශාල පරිමාණයකින් අත් දැකීමට කම්කරු පංතියට සිදුවනු ඇත.

සුළු ධනපති පංතියේ චපල කම් හා දුර්වල කම් එසේ තිබිය දීම, නිර්ධන පංතිය ස්වකීය සත් — ව්‍යාපාරයේ ජයග්‍රහණය කරා ඉදිරියට ගමන් කරන බව කියන පෙර නිමිත්තකි, විප්ලවවාදී මාක්ස්වාදය විසින් සංශෝධනවාදීන්ට විරුද්ධව දහනවවැනි ශතවර්ෂය අවසානයේදී ගෙනගිය දෘෂ්ටිමය අරගලය.

1908 මාර්තු-අප්‍රියෙල් මාසවල ලියන ලදී

''කාල් මාක්ස් (1818-1883)'' සංග්‍රහයෙහි 1906 සැප්තැම්බර්-ඔක්තෝබර් අතර කාලයේ පළ කරන ලදී

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, වෙළුම 17, පිටු 17-26

''වේඛි'' පිළිබඳව

කෙටි කාලයක් තුළදී මුද්‍රණ කීපයක්ම පළවුණු, ඉතා ප්‍රබල ව්‍යවස්ථාදායක — ප්‍රජාතන්ත්‍රවාදී ලේඛකයින්ගේ ලිපි සහිත සුප්‍රසිද්ධ ''වේඛි''[32] ලිපි සංග්‍රහය මුළු මහත් ප්‍රතිගාමී ජනසන් නිවේදන විසින් ඉමහත් උනන්දුවකින් පිළිගත් අතර එය කාලයාගේ සැබෑ ලක්ෂණයක් වේ. වේඛි ලිපි සංග්‍රහයේ ඉතා දැඩි පිළිකුල දනවන යම්කිසි කොටස් ''නිදෙස් කිරීමට'' කැඩෙට් පුවත්පත් කොතරම් ඉදිරිපත් වුණද, ව්‍යවස්ථාදායක — ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ප්‍රතිපත්තිය මත බලපෑමට තරම් කොහෙත්ම ශක්තියක් නොමැති, නැතිනම් මේ ප්‍රතිපත්තියේ සැබෑ තේරුම පිළිබඳව ජනතාව රැවටීමේ අරමුණ ඇති සමහර කැඩෙට්වරුන් මෙම ලිපි සංග්‍රහය කොතෙක් ප්‍රතික්ෂේප කළද, සමකාලීන කැඩෙට්වාදයේ නොවරදින සුලු හරය ''වේඛි'' විසින් ප්‍රකාශ කොට තිබීම විවාද රහිත සත්‍යයකි. කැඩෙට් පක්ෂය වූකලී ''වේඛි'' පක්ෂය වේ.

අන් හැම දේකටම වඩා පොදු ජනතාවගේ දේශපාලනමය සහ පංතිමය හැඟීම අගය කරන කම්කරු පංතික ප්‍රජාතන්ත්‍රවාදීහු, කැඩෙට්වරුන්ගේ දේශපාලනමය ප්‍රවණතාවයේ හරය, ඔවුන්ගේ දෘෂ්ටිමය නායකයින් විසින් වේඛි ලිපි සංග්‍රහය මගින් ඉතා අගනා ලෙස හෙළිදරවු කැරැතිබීම සාදරයෙන් පිළිගත යුත්තාහ. වේඛි ලිපි සංග්‍රහය පිළියෙල කරන ලද්දේ බෙර්ද්‍යායෙව්, බුල්ගාකව්, ගෙර්ෂෙන්සොන්, කිස්ත්‍යකොව්ස්කි, ස්ත්‍රැවේ, ෆ්‍රාන්ක් සහ ඉස්ගෝයෙව් මහත්වරුන් විසිනි. මේ සුප්‍රසිද්ධ මන්ත්‍රීවරුන්ගේ, සුප්‍රසිද්ධ ද්‍රෝහීන්ගේ, සුප්‍රසිද්ධ කැඩෙට් වරුන්ගේ නම් වුවද සෑහෙන විස්තරයක් කරයි. මුළු මහත් සමාජීය ප්‍රවණතාවයක සැබෑ දෘෂ්ටිමය නායකයින් හැටියට ''වේඛි'' හී කතෘවරු කතා කරති. දර්ශනවාදය, ආගම, දේශ-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පාලනය, දේශපාලන හා ආණ්ඩුක්‍රම පිළිබඳ සාහිත්‍යය පිළිබඳ ප්‍රශ්න ගැනද, මුළුමහත් විමුක්ති ව්‍යාපාරය පිළිබඳව අගැයීමක් සහ රුසියානු ප්‍රජාතන්ත්‍රවාදයේ මුළු මහත් ඉතිහාසය ගැනද පූර්ණ විශ්ව කෝෂමය සංක්ෂිප්ත සටහනක් ඔවුහු ඉදිරිපත් කරති. "වෙහි" වලට "රුසියානු බුද්ධිමතුන් පිළිබඳව ලිපි එකතුවක්" නැමැති නාමය ආරූඨ කරමින් කතුවරු ප්‍රකාශයට පත් කරන ලද ලිපිවල සැබෑ විෂය වස්තුව පටුකළහ. ඔවුන්ගේ මතය අනුව, මුළු මහත් රුසියානු ප්‍රජාතන්ත්‍රවාදයේ සහ මුළු මහත් රුසියානු විමුක්ති ව්‍යාපාරයේ අධ්‍යාත්මික නායකයා, ආස්වාදකයා සහ ප්‍රකාශකයා හැටියට බුද්ධිමත් පංතිය ක්‍රියා කරයි. පොදුවේ රුසියානු කැඩෙට්වාදය සහ රුසියානු ලිබරල්වාදය, රුසියානු විමුක්ති ව්‍යාපාරයෙන් සහ එහි සියලු ප්‍රධාන අරමුණුවලින් සහ මූලික සම්ප්‍රදයයන්ගෙන් සම්පූර්ණයෙන් කැඩී වෙන් වී යාමක් පෙන්වන ඉතා වැදගත් සිද්ධියකි, "වෙහි".

I

<u>ලිබරල්වාදී ද්‍රෝහිත්වයේ මේ විශ්වකෝෂය</u> ප්‍රධාන විෂයයන් තුනක් වැළඳ ගනී: 1) රුසියානු (සහ ජාත්‍යන්තර) ප්‍රජාතන්ත්‍රවාදී ජගත් දර්ශනයේ දෘෂ්ටිමය මූලධර්මයන්ට විරුද්ධව සටන් කිරීම; 2) මෑත කාලයේ විමුක්ති ව්‍යාපාරය ප්‍රතික්ෂේප කිරීම සහ එය අපකීර්තියට පත් කිරීම; 3) ඔක්තෝබර්වාදී[33] ධනපති පංතිය, පැරණි පාලනය සහ පොදුවේ මුළු මහත් රුසියාව සම්බන්ධයෙන් ස්වකීය ව්‍යාජ ප්‍රසංශාත්මක හැඟීම් විවෘත ලෙස (එයට සරිලන ව්‍යාජ ප්‍රසංශාත්මක ප්‍රතිපත්තියක් අනුව) ප්‍රකාශ කිරීම.

"වෙහි" කතුවරු "බුද්ධිවාදී" ජගත් දර්ශනයක, දර්ශනික පදනමක් අනුව පටන් ගෙන ඇත්තාහ. දර්ශනවාදීකරණයේ "ඉතා මූලික සහ ඉතා පහත් පාර භෞතිකවාදය" වන භෞතිකවාදය ආධානග්‍රාහිත්වය ලෙස හඳුන්වා දෙමින්, එයට දැඩි ලෙස විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙන සැටි එම පොත පුරාම පැහැදිලිව පෙනෙන්නට තිබේ. (4 පිටුව. — "වෙහි" ලිපි සංග්‍රහයේ පළමුවැනි මුද්‍රණය ආශ්‍රයෙනි). ඉන්ද්‍රියානුභූතවාදය හෙළා දැක තිබේ, මන්දයත් එය "අපට" (එනම් "වෙහි" විසින් විනාශ කරනු ලබන රුසියානු බුද්ධිමත් පංතියට) ද්‍රව්‍යවාදී පාර භෞතිකවාදය සමග සර්වසම වන බැවිනි, නැතිනම් එයට "සුවිශේෂයෙන්ම ද්‍රව්‍යවාදී පදනමක් අනුව අර්ථකථනයක් දී තිබෙන බැවිනි." (15 පිටුව), එහෙත් "කිසිදු ගූඪවාදියෙකුට, කිසිදු ලබ්ධිකයකට විද්‍යාත්මක ඉන්ද්‍රියානුභූතවාදය සහ විද්‍යාව ප්‍රතික්ෂේප කළ නොහැකිය" (11 පිටුව). සිනහ නොවන්න! විඥනවාදී සහ ආගමික

ගූඪවාදී ප්‍රවණතාවයන්ට සතුරු කම් දැක්වීම" (6 පිටුව) — "වෙහි" "බුද්ධිමත් පංතියට" පහර දෙමින් ඉදිරිපත් කරන චෝදනාව එසේය. "චෙර්නිෂෙව්ස්කි සමග සංසන්දනය කර බලන විට, කෙසේවුවද යුර්කේවිච් සැබෑ දර්ශනියෙකි" (4 පිටුව).

මෙම මතය දැඩිකොට ගන්නා, වෙහි ස්වභාවයෙන්ම බුද්ධිමතුන්ගේ අදේවවාදයට, අනීශ්වරවාදයට නිරන්තරයෙන්ම පහර දෙමින් ජගත් ආගමික දර්ශන යක් යළිත් ස්ථාපිත කිරීම සඳහා ඉතා ප්‍රබල ආයාසයක් දරයි. දර්ශනිකයකු ලෙස චෙර්නිෂෙව්ස්කිව විනාශ කර දමන "වෙහි" දේශපාලන ආණ්ඩුක්‍රම පිළිබඳ විශේෂඥයකු ලෙස බෙලින්ස්කිව විනාශ කර දැමීමද ස්වාභාවික දෙයකි. බිලින්ස්කි දබ්රලූබව් සහ චෙර්නිෂෙව්ස්කි "බුද්ධිමතුන්ගේ" නායකයින් වූහ (134, 56, 32, 17 සහ අනිත් පිටු). වාදයෙව්, ව්ලදිමීර් සලව්යොව්, දස්තයෙව්ස්කි කොහෙත්ම බුද්ධිමතුන් නොවූහ. "වෙහි" විසින් අවසානය දක්වා සටන් කරනු ලබන ප්‍රවණතාවයට විරුද්ධව මුලින් කී පුද්ගලයෝ නායකයින් වූහ. අද, "වෙහි" පක්ෂපාත වන දේ පසුකී පුද්ගලයින් "වෙහෙස නොබලා ස්ථිර කළද", ඔවුනට සවන් නොදී බුද්ධිමතුන් ඔවුන් පසුකර ගියහ" යි "වෙහි" සිය ප්‍රස්ථාවනාවෙන් ප්‍රකාශ කරයි.

"වෙහි" මෙලෙස පහර දෙන්නේ "බුද්ධිමතුන්ට" නොවන බව මින් දැනටමත් පාඨකයාට පෙනී යනු ඇත. මෙය ප්‍රකාශනයේ කෘතිම හා රවටන සුලු විධියකි. ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධවත්, ප්‍රජාතන්ත්‍රවාදී ජගත් දර්ශනයට විරුද්ධවත් මුල සිට අග දක්වා ප්‍රහාරය එල්ල කර ඇත. "ව්‍යවස්ථාදයක" හා "ප්‍රජාතන්ත්‍රවාදී" යැයි කියා ගන්නා පක්ෂයක දෘෂ්ටිමය නායකයින්ට නියම නමින් සමහර දේ හැඳින්වීම අපහසු නිසා ඔවුන් සිය ශබ්දමාලාව "මොස්කව්ස්කියෙ වේදමස්ති"[34] පුවත්පතින් ණයට ඉල්ලා ගෙන ඇත. ඔවුහු ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප නොකරති (කොතරම් නින්ද සහගත අපකීර්තියක්ද!) එහෙත් "බුද්ධිමත්වාදය" හෙළා දකිති.

බෙලින්ස්කි ගෝගොල්ට යැවූ ලියුම, "බුද්ධිමත් මනෝභාවයේ මලානික සහ ආවිර්ණ කල්පික ප්‍රකාශනයකි" (56 පිටුව) යි "වෙහි" ප්‍රකාශ කරයි. බිලින්ස්කිගෙන් පසු අපේ ආණ්ඩුක්‍රම සාහිත්‍යය පිළිබඳ ඉතිහාසය ජීවිතය වටහා ගැනීමේ අදහස අනුව අමුම අමු නපුරු සිහිනයකි" (82 පිටුව).

අපොයි, අපොයි. ප්‍රවේණිදස ක්‍රමයට ප්‍රවේණිදස ගොවියා සතුරුකම් දැක්වීම කැපී පෙනෙන "බුද්ධිමත්" මනෝභාවයකි. 1861 සිට 1905 දක්වා රුසියානු ජීවිත ක්‍රමයේ රදළවාදයේ නටබුන් වලට විරු-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ද්ධව සටන් කිරීමේ සහ විරුද්ත්වය ප්‍රකාශ කිරීමේ පුළුල් පොදුජන ඉතිහාසය දූන් පෙනෙන පරිදි, එකම නපුරු ''සිහිනයකි''. එසේත් නැතිනම් සමහර විට, අපේ බුද්ධිමත් සහ උගත් කතු වරයින්ගේ මතය අනුව, බිලින්ස්කි විසින් ගෝගොල්ට යවන ලද ලියුමේ අදහස් ප්‍රවේණිදස ගොවීන්ගේ හැඟීම් මත පැවතුනේ නැතිද? රදළවාදී පැගීමේ නටබුන්වලට විරුද්ධව පැනනැගුණු පොදුජන කෝපය මත අපේ ආණ්ඩු ක්‍රම පිළිබඳ සාහිත්‍යයේ ඉතිහාසය නොපැවතිණිද?

රදළවාදී ආයතන විසින් උල්ලංඝණය කරන ලද ජනතාවගේ මූලික අයිතිවාසිකම් සඳහා බහු ජනතාවගේ ඉතා පුළුල් කොටස් ගෙනගිය සටන් අරගල, යටත් පිරිසෙයින් බිලින්ස්කිගෙන් පටන් ගන්නා රුසියානු ප්‍රජාතන්ත්‍රවාදය කොහෙත්ම ප්‍රකාශ නොකළ බවත්, එනමුදු බුද්ධිමත් අදහස් පමණක් ප්‍රකාශ කළ බවත් ඔප්පු කිරීමට, ''මොස්කව්ස්කියෙ වේදමස්ති'' පුවත්පත නිතරම උත්සාහ දැරීය.

දර්ශනවාදයේදී සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කරුණු වලදී ''මොස්කව්ස්කියෙ වේදමස්ති'' පුවත්පතේ වැඩපිළිවෙළම ''වෙඛි'' වලටද තිබේ. කෙසේවුවද, දර්ශනවාදයේදී ලිබරල්වාදී ද්‍රෝහියෝ මුළු මහත් සත්‍යම හෙළි කිරීමටද, ඔවුන්ගේ මුළු වැඩපිළිවෙළ (ද්‍රව්‍යවාදයට සහ ඉන්ද්‍රියානුභූතවාදය පිළිබඳ ද්‍රව්‍යවාදී අර්ථ කථනයට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීම) හෙළි කිරීමටද තීරණය කළහ. එනමුදු ආණ්ඩුක්‍රම පිළිබඳ විෂයයන්හිදී ඔවුහු ඇත්ත සඟවති, වක්‍රව කියති, ජේසු නිකායේ පූජකයින් මෙන් හැසිරෙති. ඔවුහු ඉතා මූලික ප්‍රජාතන්ත්‍රවාදී අදහස් වලින් සහ ඉතා මූලික ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවණතාවයන්ගෙන් වෙන්වී කැඩී ගියද, තමන් වෙන්වී යන්නේ ''බුද්ධිමත්වාදයෙන්'' පමණක් බව අඟවති. ලිබරල් ධනපති පංතිය ජනතාවට විරුද්ධ ආයතන ආරක්ෂා කිරීම සඳහා පොදුජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙන් තීරණාත්මක ලෙස ඇත් විය. එහෙත් ''ප්‍රජාතන්ත්‍රවාදීන්'' යන නාමය දිගටම තබා ගැනීමට ලිබරල්වාදී දේශපාලනඥයින්ට වුවමනා වී ඇත.

බෙලින්ස්කි විසින් ගෝගොල්ට වෙත යවන ලද ලියුම සහ රුසියානු ආණ්ඩුක්‍රම සාහිත්‍යයේ ඉතිහාසය පිළිබඳව පෙන්වූ විජ්ජාව මෑත ව්‍යාපාරයේ ඉතිහාසයටද යොදවා ඇත.

II

ඇත්ත වශයෙන්ම ''වෙඛි'' ප්‍රහාරය එල්ල කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රකාශ කරන, ඒ නිසාම මෙම ව්‍යාපාරයේ සැබෑ කොටස්කරුවකු ලෙස පෙනී සිටින බුද්ධිමතුන්ට පමණකි. ''වෙඛි'' බිහිසුණු ලෙස

බුද්ධිමතුන්ට ප්‍රහාරය එල්ල කරන්නේ ''මේ කුඩා රහස් නිකාය මහ දවල් ප්‍රසිද්ධියට පත්වී, අති විශාල සංඛ්‍යාවක් අනුගාමිකයින් දිනාගෙන එක්තරා කාලයකට දෘෂ්ටිමය වශයෙන් බලපාන සහ සැබැවින්ම බලගතු ව්‍යාපාරයක් හැටියට පවා පත්වූ බැවිනි'' (176 පිටුව). ලිබරල්වාදීන්, බුද්ධිමතුන්ට හිතවත්කමක් දක්වූයේත්, සමහර විට ඔවුන්ට රහසේ ආධාර කළේත් ඔවුන් හුදු කුඩා රහස් නිකායක් ලෙස පැවතිතාක් කල් පමණකි, බුද්ධිමතුන්ට අති විශාල සංඛ්‍යාවක් ගෝලයින් ඇති වී සැබැවින්ම ඔවුන් ශක්තිමත් වන තුරු පමණකි; එහි තේරුම මෙසේය: ප්‍රජාතන්ත්‍රවාදය සැබෑ පොදු ජනතාව ක්‍රියා කරවන තුරු ලිබරල්වාදීහු එයට හිතවත්කමක් දක්වූහ. මන්දයත්, පොදු ජනතාව ඉදිරියට නොපැමිණිතාක් කල් ප්‍රජාතන්ත්‍රවාදය ලිබරල්වාදයේ ස්වාර්ථ අරමුණු වලට පමණක් සේවය කළ බැවිනි. ලිබරල් ධනපති පංතියේ ඉහළ කොටස්වලට බලය දක්වා තවත් මඳක් සමීපවීමට ප්‍රජාතන්ත්‍රවාදය උදව් කළා පමණකි. ප්‍රජාතන්ත්‍රවාදය පොදු ජනතාව තමන් වෙතට ඇදගත් විට, ස්වකීය අරමුණු මොනවාද යන්න වටහාගත්, ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ ලිබරල්වාදය ඉන් ඈත් විය. ප්‍රජාතන්ත්‍රවාදී ''බුද්ධිමතුන්ට'' විරුද්ධව කෑගැසීම ආවරණයක් කරගත් කැඩෙට් වරුන්ගේ යුද්ධය, සැබවින්ම පොදු ජනතාවගේ ප්‍රජාතන්ත්‍රික ව්‍යාපාරයට විරුද්ධව එල්ල වූවක් විය. දහඅට වැනි සිය වසර අගදී ප්‍රංශයේ පැවැති සමාජීය මහා ව්‍යාපාරය, ''සියලු අධ්‍යාත්මික ශකත්‍යාවයන් ප්‍රදර්ශනය කළ සෑහෙන තරම් දිග්ගැස්සුණු බුද්ධිමතුන්ගේ විප්ලවයකි'' (57 පිටුව) යි ''වෙඛි'' හි ප්‍රකාශය මෙම සම්බන්ධකම්වල අසංඛෙය සහ පැහැදිලි හෙළිකිරීම් වලින් එකක් විය.

යසයි, එහෙම නේද? දහ අට වැනි සිය වසර අගදී පැවති ප්‍රංශ ව්‍යාපාරය එහි ගැඹුරුතම සහ පුළුල්තම රූපය අනුව, පොදු ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ නිදසුනක් නොවූ නමුදු බුද්ධිමතුන්ගේ විප්ලවයේ නිදසුනක් විය; කරුණාකර සටහන් කර ගන්න. සජාතීය වර්ගයේ ව්‍යාපාරයකින් තොරව, ලෝකයේ කිසිම තැනෙක ප්‍රජාතන්ත්‍රවාදී අරමුණු මුදුන් පමුණුවා ගෙන නැති බැවින්, ලිබරල්වාදයේ දෘෂ්ටිමය නායකයින් ප්‍රජාතන්ත්‍රවාදයෙන් වෙන් වී යන බව සක්සුදක් සේ පැහැදිලිය.

''වෙඛි'' දෝෂාරෝපණයට භාජනය කරන රුසියානු බුද්ධිමතුන්ගේ ලක්ෂණය, ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයක අත්‍යවශ්‍ය දෙයක් හා ප්‍රකාශනයක් වන්නේය. බුද්ධිමතුන්ගේ අදහස්වල දේශපාලන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රැඩිකල්වාදයට, පොදුජන සහජ බුද්ධියේ* සමාජීය රැඩිකල්වාදය සම්මිශ්‍රණය වීම පුදුමය දනවන සුලු සීඝ්‍රතාවයකින් ඇතිවූවකි'' (141 පිටුව) — ''මෙය හුදු දේශපාලනමය වරදක් නොවීය, උපක්‍රමවල හුදු වරදක්ද නොවීය. මෙතැන වරද අධ්‍යාත්මික එකකි''. වද හිංසාවට භාජනයවූ පොදු ජනතාවක් නැති තැන ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයක් ඇති විය නොහැකිය. ප්‍රජාතන්ත්‍රික ව්‍යාපාරය හුදු ''කෝලාහලයකින්'' වෙන් වී කැපී පෙනෙන්නේ එය එක්තරා රැඩිකල්වාදී දේශපාලනමය ධජයක් යටතේ ගමන් කරන බැවිනි. ප්‍රජාතන්ත්‍රික ව්‍යාපාරය සහ ප්‍රජාතන්ත්‍රික අදහස් දේශපාලනමය වශයෙන් සාවද්‍ය පමණක් නොව, ඒවා උපක්‍රමීය වශයෙන් තැනට ඔබින්නේ නැතිවා පමණක් නොව, අධ්‍යාත්මික වශයෙන් පාපතර වන්නේය — පබෙදනොස්ට්සෙව්ගේ සැබෑ අදහස් වලින් අංශු මාත්‍රයකුදු වෙනස් නොවන ''වේඛි'' වල සබෑ අදහසේ හරය එසේය. ස්ත්‍රුවේ ඉස්ගෝයෙව්, ෆ්‍රාන්ක් සහ සමාගම කියන දේම වඩාත් අවංක ලෙසත්, ඍජු ලෙසත් පබියදනොස්ට්සෙව් ප්‍රකාශ කළා පමණකි.

වෛරයට පාත්‍රවූ ''බුද්ධිමතුන්ගේ'' අදහස්වල හරය වඩාත් පැහැදිලි ලෙස විග්‍රහ කිරීමට ''වේඛි'' ඉදිරිපත් වන විට එය ස්වභාවයෙන්ම පොදුවේ වාමාංශික අදහස් ගැනත්, විශේෂයෙන් නරෝද්නිවාදී සහ මාක්ස්වාදී අදහස් ගැනත් සඳහන් කරයි. නරෝද්නිවරුන් ගොවීන්ටද, මාක්ස්වාදීන් ''නිර්ධනීන්ටද'' ''ව්‍යාජ ලෙස ආලය කරති'' යි ''වේඛි'' චෝදනා කරයි (9 පිටුව). ජනතාව මූර්ති ''පූජනයට භාජනය'' කිරීම නිසා ඉහත සටහන් දෙවර්ගයම දරුණුතම පහරකට ලක් කොට ඇත (59, 59-60 පිටු). නින්දිත බුද්ධිමතාට ''ජනතාව දෙවියාය, එකම අරමුණ බහුතරයේ වාසනාවය'' (159 පිටුව). ''අදේවවාදී වාමාංශික කණ්ඩායමේ ප්‍රබල ව්‍යක්ත කපටිකත්වය'' (29 පිටුව), — දෙවැනි ඩූමාවේදී[35] කැඩෙට්වාදී බුල්ගාකව්ගේ මතක පටයෙහි නොමැකෙන සටහන් තැබුවේත්, එමෙන්ම ඔහුගේ දැඩි කෝපයට ලක් වූයේත් මේවාය. මෙහිදී බුල්ගාකව් කැඩෙට් පක්ෂයේ උදර චින්තනය, පොදු කැඩෙට්වාදී මානසික හැඟීම, අනිත් අයට වඩා තරමක් කැපී පෙනෙන සේ ප්‍රකාශ කළ බවට මඳකුදු සැකයක් නම් නැත්තේය.

ලිබරල්වාදියකුට නරෝද්නිවාදය සහ මාක්ස්වාදය අතර ඇති වෙනස නොපැහැදිලි ලෙස පෙනීම අහම්බෙන් සිදුවන්නක් නොව

* එම පිටුවේ පේළි දෙකකට යටින් ''විපතට භාජනයවූ පොදු ජනතාව'' ගැන කියයි.

අනිවාර්යයකි. මෙය (මෙම වෙනස ඉතා හොඳින් දන්නා) ලේඛකයාගේ විජ්ජාවක් නොව, ලිබරල්වාදී ස්වභාවයේ තර්කානුකූල ප්‍රකාශනයකි. තත් කාලයේදී රුසියාවේ ලිබරල්වාදී ධනපති පංතිය වැඩිකොටම බියවන්නේත්, ද්වේෂ කරන්නේත් රුසියාවේ කම්කරු පංතියේ සමාජවාදී ව්‍යාපාරයට නොව, කම්කරුවන් සහ ගොවීන් යන දෙකොටසගේම ප්‍රජාතන්ත්‍රික ව්‍යාපාරයටය; එනම්, නරෝනික්වාදයට සහ මාක්ස්වාදයට පොදුවේ ඇති දේට, බහු ජනතාවට ආයාචනය කිරීමෙන් ඔවුන් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට ලිබරල්වාදී ධනපති පංතිය බියවීම හා එයට ද්වේෂ කිරීමය. රුසියාවේ ලිබරල්වාදය තීරණාත්මක ලෙසම ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධ වීම, වත්මන් කාලයට ආවේණික ලක්ෂණයකි. ස්වභාවික ලෙසම, ඔවුන් ප්‍රජාතන්ත්‍රවාදය තුළ පවතින විශේෂතාවයන් ගැන හෝ ප්‍රජාතන්ත්‍රවාදය ලබාගත් විට, ඇතිවන්නාවූ තවත්දුර අරමුණු දර්ශන සහ පර්යාලෝකය ගැන හෝ කිසිදු උනන්දුවක් නොදක්වයි.

''වේඛි'' රචනය ''ජනතාව මූර්ති පූජනයට භාජනය කරති'' වැනි සිත්ගන්නා සුලු වාක්‍ය වලින් ගහනය. මෙය විමතියට කරුණක් නොවේ. මන්දයත් ජනතාව නිසා බියපත්වී සිටින ලිබරල්වාදී ධනපති පංතියට, ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ''ජනතා මූර්ති පූජනයට'' විරුද්ධව කෑගැසීම හැර අන් කිසිවක් නොමැති බැවිනි. වඩාත් හයියෙන් බෙර ගැසූ පමණින්, මෙම පසුබැසීම වසන් කළ නොහැකිය. පළමුවැනි ඩූමා සභා දෙක තුළ කම්කරු සහ ගොවි බහු ජනතාවගේ සැබෑ අයිතිවාසිකම්ද, ඉල්ලීම් හා අදහස්ද ඉදිරිපත් කළේ කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ මන්ත්‍රීවරුන් බව කොහෙත්ම අමතක නොකළ හැකිය. එහෙත් කැඩෙට්වරුන් සදහටම ප්‍රජාතන්ත්‍රවාදයෙන් පසුබසින බව හෙළිදරවු කළ නිසා, කැඩෙට්වරුන් තුළ වාමාංශිකයින්ට විරුද්ධව පතුළක් නැති ආගාධයක් වැනි ගැඹුරු වෛරයක් රෝපණය කළේ මේ ''බුද්ධිමත්'' මන්ත්‍රීවරුන්* විසිනි. ඇත්ත වශයෙන්ම, කරුණු ''හතරේ මැතිවරණ ක්‍රමයක්''[36] ඉල්ලා සිටීමේ සාධාරණත්වය එකහෙළාම ප්‍රතික්ෂේප කළ නොහැකිය. කරුණු හතරේ ක්‍රමය අනුව, සමකාලීන රුසියාවේ පවත්වන මැතිවරණ, සැබවින්ම ප්‍රජාතන්ත්‍රික මැතිව-

* බුද්ධිමත් නැමැති වචනයේ සාමාන්‍ය තේරුම ''වේඛි'' විසින් විකෘති කිරීම සැබවින්ම සිනහවට කරුණකි. ගොවීන් අතර තෘදවික් වරුන්ද, කම්කරුවන් අතර වැඩි වශයෙන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ද ධනපති බුද්ධිමතුන්ගේ විශාල කොටස කැඩෙට්වරුන් අතර සංකේන්ද්‍රණය වී සිටින සැටිද, දැකීමට පළවුවැනි ඩූමා මන්ත්‍රණ සභා දෙකේ මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය දෙස බැලීම පමණක් ප්‍රමාණවත්ය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රණ කම්කරු පක්ෂයේ මන්ත්‍රීවරුන් සමග තෘදවික්[37] මන්ත්‍රීවරුන්ට අති විශාල බහුතරයක් ලබා දෙන බවට, යම්තමින් හෝ අවංක කිසිදු දේශපාලන නායකයෙක් අංශු මාත්‍රයකින් හෝ සැක නොකරයි.

''මොස්කෝව්ස්කියෙ වේදමස්ති'' සහ ''නෝවොයෙ විරේමිය''[38] වාග්මාලාවට අයත් සිත් ගන්නා සුලු වචන පාවිච්චි කිරීම මගින්, ප්‍රජාතන්ත්‍රවාදයෙන් සිය වෙන්වීම සඟවා ගැනීමට හැර පසුබසින ලිබරල් ධනපති පංතියට කළ හැකි අන් දෙයක් නොමැත. ''වේහි'' ලිපි සංග්‍රහය මෙවැනි වචන වලින් පිරී ඇත.

''වේහි'' වූකලී ප්‍රජාතන්ත්‍රවාදය මත වත්කරන ලද ප්‍රතිගාමී මඩ ප්‍රවාහයකි. ''නෝවොයෙ විරේමිය'' ප්‍රකාශකයින් වන රොසානව්, මෙන්ෂිකොව් සහ ඒ. ස්තොලිපින් ඉදිරියට පැන''වේහි''සිප ගැනීම වටහා ගත හැකි දෙයකි. සත්තකින්ම ලිබරල්වාදයේ නායකයින්ගේ මේ ප්‍රකාශනය නිසා වොලීනාහි රාජගුරුප්‍රසාදී අන්තෝනි ප්‍රමුදිත විසිටී.

''වේහි'' මෙසේ ලියයි: බුද්ධිමතා ජනතාව ඉදිරියේ ඇති සිය යුතුකම ගැන සිතන විට, යුතුකමේ මූලධර්මයෙන් ප්‍රකාශවන පෞද්ගලික වගකීම බුද්ධිමතා වන ඔහුට පමණක් නොව, ජනතාවටද එක ලෙස බලපාන බව කිසිදිනෙක කල්පනා කර නැත'' (139 පිටුව). ජනතාවගේ නිදහස සහ අයිතිවාසිකම් විස්තීර්ණ කිරීම ගැන ප්‍රජාතන්ත්‍රවාදියා සිතන්නට වූයේ, ජනතාවට උසස් පංතීන්ගෙන් ඉටුවිය යුතු ''යුතුකම'' ගැන මෙම අදහස වචන වලින් සරසමිනි. ප්‍රතිසංස්කරණයට පෙර රටක හෝ ජූනි 3 ද[39] ''ව්‍යවස්ථාව'' ඇති රටක හෝ ආණ්ඩු කරන පංතිවලට ජනතාවගේ ''වගකීම'' පිළිබඳ ප්‍රශ්නයක් පැන නැගිය නොහැකි බව, ප්‍රජාතන්ත්‍රවාදියෙකුට සිතාගත නොහැකිය, එලෙස සිතීමට හේ අසමත්ය. මෙවැනි චින්තනයක් කරා එළඹීමට ප්‍රජාතන්ත්‍රවාදියා නැතිනම් ඊනියා ප්‍රජාතන්ත්‍රවාදියා ප්‍රතිවිප්ලවවාදී ලිබරල්වාදියකු දක්වා සම්පූර්ණයෙන් පරිවර්තනය විය යුතුය.

''ආත්මාර්ථවාදය, ආත්ම අධිරෝපණයකි'' යි ''වේහි'' ලිපිවලින් කියැවේ. ''දෙවියන් වහන්සේගේ අභිප්‍රාය පෘථිවිය මත ක්‍රියා කරවීමේදී ජර්මන් ධනපති පංතිය අවිඥනික අවියක් බවට පත්වන්නේ මේ නිසාය'' (95 පිටුව). "Enrichissez-vous! — නුඹලා පොහොසත් වෙයල්ලා!'' නැමැති භාව සත්නය මෙතැනදී රස වැඩි කොට ඉදිරිපත් කිරීමකි. නැතිනම් අපේ රුසියානු ආදර්ශ වාක්‍ය මෙසේ වනු ඇත: ''ශක්තිමත් එවුන්ට අපි ඔට්ටු අල්ලමු''.[40] නිදහස සඳහා සටන් කිරීමට මහ ජනතාවට ධනපති පංතිය ආධාර දුන් විට, මෙම ව්‍යාපාරය දේවමය කාර්යයක් ලෙස ඔවුහු ප්‍රකාශ කළහ. ඔවුන් ජනතාව නිසා බිය වී,

ජනතාවට විරුද්ධව සියලු වර්ගවලට අයත් මධ්‍යකාලීන දේ වලට ආධාර දීමට ඉදිරිපත් වූ විට, ඔවුහු ''ආත්මාර්තවාදයත්'', ස්වයං — පොහොසත්වීමත්, සීමාන්තික ජාතිවාදී විදේශීය ප්‍රතිපත්තියත් ආදිය දේවමය කාර්යයන් ලෙස ප්‍රකාශ කළහ. යුරෝපයේ හැම තැනකම මෙසේ විය. මෙය දැන් රුසියාවේ අනුකරණය කරනු ලැබේ.

''ඔක්තෝබර් 17 ද ආඥාවෙන් විප්ලවය සැබවින්ම සහ විධිමත් ලෙසත් උච්චස්ථානයට එළැඹිය යුතුව තිබිණි'' (136 පිටුව). ඔක්තෝබර්වාදයේ මූල සහ අග, එනම් ප්‍රතිවිප්ලවවාදී ධනපති පංතියේ වැඩ පිළිවෙල මෙය වන්නේය. ඔක්තෝබර්වාදීහු හැමදම මෙලෙස ප්‍රකාශ කර ඇති අතර ඒ අනුව ඔවුහු විවෘත ලෙස ක්‍රියා කළහ. කැඩෙට්වරුද මෙලෙස ඔක්තෝබර් 17 ද සිට රහසේ ක්‍රියා කළ අතර ප්‍රජාතන්ත්‍රවාදීන් මෙන් ඇඟවීමටද වුවමනාවක් දැක්වූහ. ප්‍රජාතන්ත්‍රවාදයේ කාර්යය සාර්ථක වීමට නම්, ප්‍රජාතන්ත්‍රවාදීන් සහ ද්‍රෝහීන් අතර පූර්ණ, විවෘත සහ පැහැදිලි මායිමක් ඇති කිරීම ඉතාම එලදායී සහ අවශ්‍ය කාර්යය වන්නේය. මෙම අවශ්‍ය කාරණය සඳහා ''වේහි'' උපයෝගී කර ගත යුතුය. ද්‍රෝහී ඉස්ගෝසෙව් මෙසේ ලියයි: ''කැඩෙට්වාදී සහ ඔක්තෝබර්වාදීන් දූසිම් තුන හතරක් හැරුණු විට, රාජ්‍ය ඩූමාවේ මන්ත්‍රීවරුන්ගෙන් අති බහුතරය ආණ්ඩු කිරීමට සහ රුසියාව ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය දැනීම විජෘම්භණය කර නැති බව අවසානයේදී එළිපිට ප්‍රකාශ කිරීමට අපට ධෛර්‍යයක් තිබිය යුතුය'' (208 පිටුව). ඔව්, සත්තකින්ම, ගැමියන් වන තෘදවික් මන්ත්‍රීවරුන්ට සහ යම් කිසි කම්කරුවන්ට එවැනි කාර්යයක් කළ හැකිද? ඒ සඳහා කැඩෙට් සහ ඔක්තෝබර්වාදීන්ගේ බහුතරයක් සහ තෙවැනි ඩූමාවක් අවශ්‍ය වන්නේය.

ඉදින් ඒ අනුව මහජනතාව සහ ඔවුන්ගේ ප්‍රතිමා වඳින්නෝ, තුන්වැනි ඩූමාවේ ලොක්කන් සහ තෙවැනි ඩූමා රුසියාව ඉදිරියේ ඇති සිය වගකීම වටහා ගත යුත්තාහ. ඒ සඳහා ජනතාව වොල්හීන්යාහි රාජගුරු අන්තෝනි සමග එක්වී ''පශ්චාත්තාපය'' (වේහි 26) ''යටහත් පහත්කම'' (49 පිටුව), ''බුද්ධිමතාගේ ප්‍රෞඪත්වයට විරුද්ධවීම'' (52 පිටුව), ''යටත්වීම'' (55 පිටුව), ''පැරණි මෝසස්ගේ දස පණතේ ඇති චාම් රළු ආහාර ගැනීම'' (51 පිටුව), ''රුසියාවේ යෝධමය සිරුරට ඇතුළු වී සිටින යක්ෂයාගේ සේනාවිලට'' විරුද්ධව සටන් කිරීම (68 පිටුව) කළ යුත්තාහ. ගොවියෝ තෘදවික් වරුන්ද, කම්කරුවෝ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ද තෝරා පත් කරති නම්, මෙය යක්ෂයාගේ වැඩකි, මන්දයත් බොහෝ කලකට පෙර කත්කොව් සහ පබියදනොසෙට්සෙව් සොයාගත් පරිදි, මහජනතාව සිය සැබෑ ස්වභාවය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අනුව බුද්ධිමතුන් කෙරෙහි වෛරයකින් පසුවූ බැවිනි'' (87 පිටුව, ''ප්‍රජාතන්ත්‍රවාදය සඳහා'' කියවන්න).

එබැවින් පොදු ජන කෝපයෙන් අප (බුද්ධිමතුන්), බයිනේත්තු සහ සිරගෙවල් ඇතිව ආරක්ෂා කරන ආණ්ඩුවට සෑම රුසියානු රටවැසියෙකුම ආශිර්වාද කළ යුතු යැයි වේහී අපට උගන්වයි.

මෙලෙස දීර්ඝ ලෙස බැණවැදීම් හොඳය, මන්දයත් එය අවංක බැවිනි; එය ප්‍රයෝජනවත්ය මන්දයත්, 1905-1909 කාලයේදී ව්‍යවස්ථාදයක ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ප්‍රතිපත්තියේ හරය පිළිබඳ සත්‍යය එය හෙළිකරන බැවිනි. මේ දීර්ඝ බැණ වැදීම් හොඳය, මන්දයත් සංක්ෂිප්ත ලෙසත්, විචිත්‍ර ලෙසත් ''වේහි'' හි ආස්වාදය හෙළි කරන බැවිනි. ''වේහි'' ලිපි සංග්‍රහය හොඳය, මන්දයත් රුසියානු කැඩෙට් වරුන් ඇතුළුව, රුසියානු ලිබරල්වාදීන්ගේ සැබෑ ප්‍රතිපත්තියේ මුළු මහත් ආස්වාදයම එය හෙළි කරන බැවිනි. ''වේහි'' සමග කැඩෙට්වරුන්ගේ විවාදය සහ කැඩෙට්වරුන් විසින් ''වේහි'' ප්‍රතික්ෂේප කිරීම අන් කිසිවක් නොව, කුහක කමක් වන්නේත්, නිකම් පුහු කතා වන්නේත් ඒ නිසාය. මන්දයත් යථාර්ථ ලෙස කැඩෙට්වරුන් සමූහායත්ත ලෙසත්, පක්ෂයක් ලෙසත්, සමාජමය බලවේගයක් ලෙසත්, ''වේහි'' හි ප්‍රතිපත්තිය මිස අන් කිසිදු ප්‍රතිපත්තියක් අනුගමනය නොකළ අතර දැනුදු එයම අනුගමනය කරන බැවිනි. 1905 අගෝස්තු සැප්තැම්බර් මාසවලදී බුලීගින් ඩූමාව[41] සඳහා පැවැත්වෙන මැතිවරණ වලට සහභාගි වන ලෙස ඉල්ලා සිටීමද, එම වසරේ අගදී ප්‍රජාතන්ත්‍රවාදයේ කාර්යය පාවාදීමද, මහජනතාවට සහ මහජන ව්‍යාපාරයට මුරණ්ඩු ලෙස බිය වීමද, පළමුවැනි ඩූමා සභා දෙකෙදී කම්කරු සහ ගොවි මන්ත්‍රීවරුන්ට ක්‍රමානුකූල ලෙස විරුද්ධ වීමද, අයවැය ලේඛනයට පක්ෂව චන්දය දීමද, තුන්වැනි ඩූමාවේ කරවුලව් ආගම ගැනත්, බෙරෙසොව්ස්කි කෘෂක ප්‍රශ්නය ගැනත් කතා කිරීමද, ලන්ඩන් සංචාරයද, — ''වේහි'' විසින් දෘෂ්ටිමය වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද මේවා එම ප්‍රතිපත්තියේ අසංඛෙය සිද්ධීන්වලින් ස්වල්පයක් පමණකි.

මේ ප්‍රතිපත්තියේ හරය සහ ඒවායේ පංතිමය මුල් වටහා ගන්නා තුරු රුසියානු ප්‍රජාතන්ත්‍රවාදයට එකද පියවරක්වත් ඉදිරියට තැබිය නොහැකිය.

''නෝවී ද්යෙන්'' අංක 15, 1909 දෙසැම්බර් 13 ද.

වී. අයි. ලෙනින. සම්පූර්ණ කෘති, වෙළුම 19, පිටු 167-175.

එල්. එන්. තොල්ස්තෝයි

ලෙව් තොල්ස්තෝයි අභාවප්‍රාප්ත විය. කලා ශිල්පියකු වශයෙන් ඔහුගේ විශ්වමය වැදගත්කමද චින්තකයකු සහ දේශකයකු වශයෙන් ඔහුගේ විශ්මය ප්‍රසිද්ධත්වයද යන මේ දෙකම ස්වයං ආකාරයකින් රුසියානු විප්ලවයේ විශ්වමය වැදගත්කම පිළිබිඹු කරයි.

ප්‍රවේණිදසත්වය රජ කරන කාලයේ සිට ලෙව් නිකොලායෙවිච් තොල්ස්තෝයි මහා කලා කරුවකු ලෙස ඉදිරියට ආවේය. අඩ සිය වසරකටත් වඩා වැඩි කාලයක් තිස්සේ සාහිත්‍ය කටයුතු වල නිරතවූ ඔහු මහා කෘතීන් පෙළකින්, 1861 වසරට[42] පසුව පවා, අර්ධ ප්‍රවේණිදසත්වය පැවැති රුසියාව, ඉඩම් හිමියන්ගේ සහ ගොවීන්ගේ ගම්බද රුසියාව, ප්‍රධාන වශයෙන් පැරණි ප්‍රාග් විප්ලවීය රුසියාව ඇඳ පෙන්වීය. රුසියානු ඉතිහාසයේ මේ වකවානුව සාහිත්‍යයට නැගීමේදී තොල්ස්තෝයි අති විශාල ගැටළු සංඛ්‍යාවක් ඉදිරිපත් කිරීමෙහි සමත් විය. ඔහු මෙම ගැටළු කෙතරම් උසස් සාහිත්‍යික තත්වයකට නංවාලීදයත්, ලෝක සාහිත්‍යයේ ශ්‍රෙෂ්ඨතම කෘතීන් අතර ඔහුගේ කෘතීන්ද ගැනේ. ප්‍රවේණිදස හිමියන්ගේ යකඩ සපත්තුවට පෑගී සිටි රටක විප්ලවයට සූදනම් වීමේ අවධිය තොල්ස්තෝයිගේ අති දක්ෂ දීප්තිමත් පැහැදිලි කිරීමට පින් සිදු වන්නට, මුළු මහත් මානව සංහතියේ සාහිත්‍ය කලාත්මක වර්ධනයේ ඉදිරි පියවරක් විය.

රුසියාවේ පවා ඉතා කුඩා වූ අල්පතරයක් පමණක් තොල්ස්තෝයි — කලා කරු හඳුනති. ඔහුගේ මේ ශ්‍රෙෂ්ඨ කලා කෘතීන් සැබවින්ම සියලු දෙනාගේම වස්තුව බවට පත් කිරීමට නම්, දස ලක්ෂ සංඛ්‍යාත, කෝටි සංඛ්‍යාත ජනකායයක් නූගත් බවට අන්ධකාර පීඩිත බවට, වහල් මෙහෙයට සහ දුගී බවට ඇද හෙළන සමාජ ක්‍රමයට විරුද්ධව, සමාජවාදී විප්ලවයක් ඇති කළ යුතුය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඉඩම් හිමියන්ගේ සහ ධනපතීන්ගේ කෲර පාලනය පෙරළා දමා තමන්ට මානුෂික තත්වයන් බිහිකළ ඉක්බිතිව, පොදු ජනතාව විසින් අගය කරන සහ කියවනු ලබන කලා කෘතීන් තොල්ස්තෝයි නිර්මාණය කළා පමණක් නොවේ; ඔහු පොදු මහජනතාවගේ තත්වයන් සහ ඔවුන්ගේ සාංසිද්ධික විරුද්ධතාවය සහ කෝපය ප්‍රකාශ කිරීම මගින් , වත්මන් සමාජ ක්‍රමය විසින් පාගනු ලැබ සිටින අති විශාල ජනකායයකගේ මනෝභාවය ඉතා අගනා ලෙස පෙන්වීමට සමත් විය. ප්‍රධාන වශයෙන්, ඔහු 1861 — 1904 වකවානුවට අයත් වූයේය. තොල්තෝයි කලා කරුවකු, චින්තකයකු හා දේශකයකු වශයෙන්, මුළු මහත් රුසියානු විප්ලවයේ විශේෂ ඓතිහාසික ලක්ෂණද, එහි ශක්තිය හා දුර්වලකම්ද පුදුමය එලවන සුලු දක්ෂතාවයකින් විස්තර කළේය.

අපේ විප්ලවයේ එක් ප්‍රධාන කැපී පෙනෙන ලක්ෂණයක් නම්, ලෝකය පුරා ධනවාදී දියුණු වර්ධනයක් සහ රුසියාවේ සාපේක්ෂ වශයෙන් දියුණු ධනවාදී ක්‍රමයක් ඇති යුගයක එය ගොවි ධනපති විප්ලවයක් වීමය. එය ධනපති විප්ලවයක් වූයේ, එහි ක්ෂණික අරමුණ සාර්ගේ ස්වෛරී තන්ත්‍රය, සාර්ගේ රාජාණ්ඩුව, ඉඩම් හිමිත්වය නැති කර දැමීම මිස ධනපති ආධිපතිත්වය පෙරළා දැමීම එහි අරමුණ නොවූ බැවිනි. විශේෂයෙන්ම ගොවි ජනතාව මේ විප්ලවයේ අරමුණ නොදැන සිටියහ. මේ අරමුණේ සහ අරගලයේ වඩාත් සමීප සහ වඩාත් ක්ෂණික අරමුණු අතර වෙනස ගොවි ජනතාව නොදැන සිටියහ. එය ගොවිජන ධනවාදී විප්ලවයක් වූයේ ගොවි ජීවිතයේ මූලික තත්වයන් වෙනස් කිරීමත්, ඉඩම් අයිතියේ පැරණි, මධ්‍යකාලීන ක්‍රමය කඩා බිඳ දැමීමත්, ධනපති ක්‍රමයට ''පසුබිම සකස් කර දීමත්'' යන මේ වාස්තවික තත්වයන් ඉදිරිපත් කළ බැවිනි. අඩු වැඩි වශයෙන් ස්වාධීන ඓතිහාසික ක්‍රියාකාරිත්වයක් සහිතව ගොවි ජනතාව දේශපාලන කරලියට පිවිසියේ එයට සරිලන වාස්තවික තත්වයන් පැවති බැවිනි.

තොල්ස්තෝයිගේ කෘතීන්, විශේෂයෙන්ම මෙම ගොවි බහු ජන ව්‍යාපාරයේ ශක්තිය හා දුර්වලත්වයද, බලය සහ සීමා සහිත භාවයද ප්‍රකාශ කළේය. රජයට සහ පොලිස් බලය සමග මිත්‍රව ක්‍රියා කරන පල්ලියේ නිල පූජක තන්ත්‍රයට විරුද්ධව, ඔහු උණුසුම්, තීව්‍ර හැඟීම් සහ නිතර ඉතා දැඩි කෝපය ප්‍රකාශ කළේය. ශත වර්ෂ ගණනක් තිස්සේ ප්‍රවේණිදාසත්වයටද, නිල පූජා පීඩනයටද, සොරකමටද, පල්ලියේ ජේසුයිට්වාදයටද, රැවටීම් හා කපටිකම් වලටද විරුද්ධව කන්දක් තරම් විශාල කෝපයක් හා වෛරයක් ප්‍රකාශ කළ ආදිකාලීන ගොවි බහු ජනතාවගේ භාවාත්මක හැඟීම්ද ඔහු මැනවින් ප්‍රකාශ කළේය

ඉඩම්වල පෞද්ගලික අයිතිය පිළිබඳ ඔහුගේ නොසැලෙන විරුද්ධත්වය, එම ඓතිහාසික වකවානුවේ විසූ ගොවි ජනතාවගේ මානසිකත්වය ප්‍රකාශ වේ.විශාල වතු සහ රජයට අයත් රජයේ''ඉඩම් කොටස්''[43] පිළිබඳ මධ්‍යකාලීන අයිතිය රටේ තවත් දුර වර්ධනයට ඉසිලිය නොහැකි බාධාවක් විය. මේ ඉඩම් අයිතිය අනිවාර්යයෙන්ම, ක්ෂණික ලෙසත්, අනුකම්පා විරහිත ලෙසත් විනාශ කළ යුතු තත්වයක් ඇති විය. ඉතා ගැඹුරු චිත්ත වේගයක් සහ ඉතා ප්‍රබල කෝපයකින් යුතුව ඔහු විසින් ධනවාදයට විරුද්ධව නගන ලද අනවරත චෝදනා, කොහේදෝ නගරවලින් නැතිනම් කිසියම් පිටරටකින් ඉදිරියට එන නව, අදිසි, තේරුම් ගත නොහැකි සතුරකු නිසා බියට පත් පීතෘ මූලික ගොවීන්ගේ සියලු සංත්‍රාසයන් ප්‍රකාශ කරයි. මේ සතුරා ගම්බද ජීවිතයේ සියලු ''පවුරු පදනම්'' පුපුරුවා හරිමින් මින් පෙර නොදුටු විරූ, විනාශයත්, දුගී බවත්, දුර්භික්ෂයත්, ගණිකා වෘත්තියත්, සිපිලිස් රෝගයත් — 'ආදිකාලීන සංකේන්ද්‍රණ යුගයේ' සියලු අභාග්‍යයනුත් සියක් වාරයකින් උග්‍ර කරමින් අති බලසම්පන්න කූපොන් මහතා[44] විසින් රුසියානු භූමියට ගෙනෙන ලද කොල්ලකෑමේ ඉතා නවීන ක්‍රම බද්ධ කිරීමද ඉදිරිපත් කළේය.

එහෙත් ඒ අතරම මේ දැඩි විරුද්ධත්වය ප්‍රකාශ කරන්නා, අනුරාගික චෝදකයා, මහා විවේචකයා සිය කෘතීන් මගින් රුසියාවට තර්ජනය කරන අර්බුදයට හේතූන්ද, ඉන් බේරෙන සැටිද වටහා ගැනීමට අපොහොසත් වූයේය. මෙය පීතෘමූලික බොළඳ ගොවියකුගේ ලක්ෂණයක් මිස යුරෝපීය අධ්‍යාපනයක් සහිත ලේඛකයකුගේ ලක්ෂණයක් නොවීය. රදළවාදී පොලිස් රජයට සහ රාජාණ්ඩුවට විරුද්ධව ඔහු ගෙන ගිය අරගලය ඔහු දේශපාලනය ප්‍රතික්ෂේප කිරීමක් දක්වාද, නපුරට විරුද්ධව අවිහිංසාවාදය දේශනා කිරීමක් දක්වාද, 1905-1907 වසර ඇතිවූ බහු ජන විප්ලවවාදී සටන් වලින් සම්පූර්ණයෙන්ම ඈත්වීමක් දක්වාද පැතිරිණි. නිල වරප්‍රසාද සහිත පල්ලියට විරුද්ධව ගෙන ගිය සටන, අලුත්, ශුද්ධවූ ආගමක්, එනම් පෑගී සිටින ජනතාවට, අලුත් සියුම්, පිරිසිදු වස කැවීමක් සමග සංයෝජනය කළේය. ඉඩම්වල පෞද්ගලික අයිතියට විරුද්ධවීම නිසා නියම සතුරා සහ එහි දේශපාලන බලයේ අවිය වන රාජාණ්ඩුවට විරුද්ධව සටන් අරගල දක්වා පරිවර්තනය නොකළේය. එහෙත් එය සිහින දකින, විසරණ සහ බෙලහීන විලාප ගැසීම් දක්වා ගෙන ගියේය. ඔහු ධනේශ්වර ක්‍රමය සහ එය ජනතාවට ගෙන දෙන විශාල හානි හෙළිදරවු කිරීම, ජාත්‍යන්තර සමාජවාදී නිර්ධන පංතිය විමුක්තිය සඳහා ගෙනයන ලෝක ව්‍යාප්ත

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අරගලය දෙස දක්වන පූර්ණ උදසීන ආකල්පයක් සමග සංයෝජනය කළේය.

තොල්ස්තෝයි මතයේ මේ ප්‍රතිවිරෝධතා ඔහුගේ පෞද්ගලික මතයේ ආවේණික ප්‍රතිවිරෝධතා නොවේ. පශ්චාත් ප්‍රතිසංස්කරණ එනමුදු ප්‍රාග් විප්ලවීය යුගයේ රුසියානු සමාජයේ විවිධ ජාතීන්ගේ සහ විවිධ කොටස්වල මානසිකත්වය තීරණය කරන, ඉතා සංකීර්ණ, ප්‍රතිවිරෝධ තත්ත්වයන්ගේ, සමාජයීය බලපෑම්වල සහ ඓතිහාසික සම්ප්‍රදයයන්ගේ පිළිබිඹුවකි.

විප්ලවයේදී ජනතාවගේ විමුක්තිය සඳහාත්, සූරාකෑමෙන් ජනතාව ගලවා ගැනීම සඳහාත් ගෙනයන අරගලයේ නායකයා වීමට නියම වී ඇති පංතියේ, සිය දේශපාලනමය ක්‍රියා කාරිත්වයේදී සහ අරගලයේදී මෙම ප්‍රතිවිරෝධීතාවයන් පළමුවෙනම පෙන්වා දුන් පංතියේ දෘෂ්ටි කෝණයෙන් පමණක් තොල්ස්තෝයි ගැන නිවැරදි අගැයීමක් කළ හැක්කේ එබැවිනි. මේ පංතිය ප්‍රජාතන්ත්‍රවාදයේ කාර්ය භාරයට සිය ආත්ම පරිත්‍යාගී භක්තියද, ධනපති (ගොවි ඇතුළු) ප්‍රජාතන්ත්‍රවාදයේ සීමාසහිත භාවයට සහ අස්ථිරතාවයට විරුද්ධව සටන් කිරීමෙහි සමත් සිය දක්ෂතාවයද ඔප්පු කර ඇත. තොල්ස්තෝයි ගැන එවැනි අගැයීමක් කළ හැක්කේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දෘෂ්ටි කෝණයෙන් පමණකි.

ආණ්ඩු පක්ෂයේ පුවත්පත්වල තොල්ස්තෝයි පිළිබඳව කරන අගැයීම දෙස බලන්න. එක් අතකින් මහා ලේඛකයාට ගරු කරන බව කියන අතර අනික් අතින් ''ශුද්ධවූ'' සිනොඩ් සභාව[45] ආරක්ෂා කරමින් ඔවුහු කිඹුල් කඳුළු වගුරුවති. ශුද්ධවූ පූජකවරු නම් මේ දුන් අති දුෂ්ට අපරාධයක් කළහ. මහජනතාව රවටවා තොල්ස්තෝයි ''පශ්චාත්තාප වී'' යැයි කීම සඳහා ඔවුහු පණ අදින ලේඛකයා වෙත පූජකයින් යැවූහ. ශුද්ධවූ සිනොඩ් සභාව තොල්ස්තෝයි, පල්ලියෙන් පන්නා දැමීය. එය වඩාත් හොඳය. පූජක ලෝගු හැඳගෙන සිටින නිලධාරීන්ට, ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් පෙනී සිටින නිලධාරීන්ට විරුද්ධවත්, සාර්වාදී කළු ශතක සොර මුලේ යුදෙව් විරෝදී වද දීම් සහ අනිකුත් එවැනි මිනීමරු වැඩවලට ආධාර දුන් පාපතර අධර්ම මර්දනාධිකරණ නිලධාරීන්ට විරුද්ධවත් ක්‍රියා කිරීමට කාලය එළැඹි විට, මේ ක්‍රියාව ගැනද මතක් කරනු ඇත.

ලිබරල්වාදී පුවත්පත් තොල්ස්තෝයි පිළිබඳව කරන අගැයීම දෙස බලන්න. ඔවුහු, ''සභ්‍ය මනුෂ්‍ය සංහතියේ හඬ'' ''ලෝකයේ ඒකමතික ප්‍රතිචාරය'' ''සත්‍යයේ සහ යහපත් භාවයේ චින්තනය'' ආදී පුහු, නිල ලිබරල්වාදී වෘත්තීය වාග්පාඨවලට පමණක් සීමා වෙති.

එහෙත් තොල්ස්තෝයි මේවාට දැඩි ලෙස පහර දුන්නේය, ඔහු සාධාරණ ලෙස ධනවාදී විද්‍යාවට පහර දුන්නේය. රජය, පල්ලිය, ඉඩම් පිළිබඳ පෞද්ගලික අයිතිය, ධනවාදය පිළිබඳව තොල්ස්තෝයිගේ මත ගැන සිය අදහස් සරළ ලෙසත් පැහැදිලි ලෙසත් විස්තර කිරීමට ඔවුනට නොපුළුවන. රජයේ පුවත් පාලනය මෙයට විරුද්ධ නිසා නොවේ; — එයට පටහැනිව, ලජ්ජා සහගත තත්ත්වයකින් බේරීමට පුවත් පාලනය ඔවුන්ට ආධාර කරයි — මන්දයත් තොල්ස්තෝයිගේ විවේචනයේ හැම යෝජනාවක්ම ධනපති ලිබරල්වාදයට ගසන ලද කම්මුල් පහරක් වූ බැවිනි; අද පවතින පීඩාකර ගැටළු නිර්භය ලෙසත්, අවංක ලෙසත්, අනුකම්පා විරහිත ලෙසත් තොල්ස්තෝයි ඉදිරිපත් කරන බැවින්, අපේ ලිබරල්වාදී (සහ ලිබරල් නරෝද්නිවාදි) දේශපාලන හා ආණ්ඩුක්‍රම විශේෂඥයින්ගේ විජ්ජාකාර වාග් පාඨ, පැරණි රැවටිලි, කපට ''සභ්‍ය'' බොරු වලට දෙන ලද අතුල් පහරක් වන බැවිනි. ලිබරල්වාදීහු එකා මෙන් තොල්ස්තෝයිට පක්ෂ වෙති. ඔවුහු සිනොඩ් සභාවට විරුද්ධ වෙති. එහෙත් ඒ අතරම ඔවුහු වෙඛිවාදීන්ට පක්ෂ වෙති. ඔවුන්ට වෙඛිවාදීන් සමග එකඟ නොවීමට පිළිවන, එසේ වුවද, ඔවුන් සමග එකම පක්ෂයක සමගියෙන් ජීවත් වීම ''අවශ්‍ය'' වී ඇත, ඔවුන් සමග එකට එක්වී සාහිත්‍ය හා දේශපාලන කටයුතුවල නිරතවීම අවශ්‍ය වී ඇත. එහෙත් වොලිනියාවේ රාජගුරු අන්තෝනි විසින් වෙඛිවාදීන් සිපගැනීමෙන් ආචාර කරනු ලැබේ.

ලිබරල්වාදීහු තොල්ස්තෝයි ''ශ්‍රේෂ්ඨතම හෘද සාක්ෂිය'' බව පවසති. නෝවොයේ වරෙම්යා සහ අනිකුත් එවැනි පුවත්පත් විසින් පුන පුනා කියනු ලබන මෙය පුහු වාග් පාඨයක් නොවන්නේද? මෙය තොල්ස්තෝයි විසින් ඉදිරිපත් කරන ලද ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජවාදී සංයුක්ත ප්‍රශ්න කපට ලෙස මග හැරීමක් නොවේද? තොල්ස්තෝයිගේ ප්‍රඥව නොව, ඔහුගේ ප්‍රාග් විනිශ්චය, අනාගතයට අයත් දේ නොව, ඔහුගේ අතීතයට අයත් දේ, සියලු පංති ආධිපත්‍යයට විරුද්ධව ඔහු විසින් ඉදිරිපත් කළ දැඩි විරුද්ධත්වය නොව, ඔහු විසින් දේශපාලනය ප්‍රතික්ෂේප කිරීම සහ අධ්‍යාත්මික ස්වයං පරිපූර්ණත්වය පිළිබඳ ඔහුගේ දේශනය ඉදිරියට ඇද දැමීම සඳහා කරන ප්‍රයත්නයක් නොවන්නේද?

තොල්ස්තෝයි අභාවප්‍රාප්ත විය. මේ ශ්‍රේෂ්ඨ කලා කරුවාගේ දර්ශනයෙන් සහ කෘතීන් මගින් ප්‍රාග් විප්ලවීය රුසියාවේ දුර්වලත්වය සහ බෙලහීනත්වය ප්‍රකාශ වීම යටගියාවට අයත් වූවකි. එහෙත් ඔහු අපට තබා ගිය උරුමය අතීතයට පමණක් නොව අනාගතයටද අයත් දෙයකි. රුසියානු නිර්ධන පංතිය මෙම උරුමය භාරගෙන ඒ ගැන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කටයුතු කරයි. රුසියානු නිර්ධන පංතිය රජය, පල්ලිය සහ ඉඩම් පිළිබඳ පෞද්ගලික අයිතිය ගැන තොල්ස්තෝයිගේ විවේචන වැඩකරන ජනතාවගේ පුළුල් කොටස්වලට විස්තර කරනු ඇත. එසේ කරන්නේ පොදු ජන කොටස් අධ්‍යාත්මික ස්වයං පරිපූර්ණත්වයකට සහ දේවමය ජීවිතයකට සීමා කිරීමට නොව, 1905 දී යම්තමින් හානියට පත්වුණද, විනාශකර දැමිය යුතු සාර්වාදී රාජාණ්ඩුවට සහ ඉඩම් අයිතියට නව පහරක් ගැසීම සඳහා ඔවුන් නැගිට සිටිය යුතු බැවිනි. ධනවාදය පිළිබඳ තොල්ස්තෝයිගේ විවේචනය රුසියානු නිර්ධන පංතිය පොදු ජනතාවට විස්තර කරනු ඇත. එසේ කරන්නේ පොදු ජන කොටස්, ප්‍රාග්ධනයට සහ මුදලේ පාලනයට විරුද්ධව දෙස් පැවරීමකට ඔවුන් සීමා කිරීමට නොවේ. එහෙත් ඔවුන් ධනවාදයේ තාක්ෂණික සහ සමාජයීය ජයග්‍රහණ සිය ජීවිතයේදී සහ සිය අරගලයේදී පාවිච්චි කළ යුතු බැවිනි, ධනවාදය පරාජය කර දමා දුගී බවේ දූෂ්ට ඉරණමට ජනතාව භාජනය නොවන, මිනිසකු විසින් මිනිසකු සූරාකෑමක් නැති නව සමාජයක් සඳහා සමාජවාදී සටන්කාමී භටයින්ගේ කෝටි සංඛ්‍යාත හමුදවක් වටා එක්රැස් විය යුතු බැවිනි.

''සොට්සියාල්-ඩිමොක්‍රාට්'' අංක 18, 1910 නොවැම්බර් 16 (29).

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, වෙළුම 20, පිටු 19-24.

මාක්ස්වාදයේ ඓතිහාසික සංවර්ධනයේ ඇතැම් ලක්ෂණ

තමාගේ සහ තම සුප්‍රසිද්ධ මිතුරාගේ එනම් කාල් මාක්ස්ගේ උගැන්වීම් ගැන එංගල්ස් මෙසේ පැවසීය: ''අපේ උගැන්වීම් දෘෂ්ටියක් නොවේ, එනමුදු ක්‍රියාවට මග පෙන්වන්නෙකි. මේ උත්කෘෂ්ට වාක්‍යයෙන් ඉතා දැඩි ශක්තියකින් යුතුව, පැහැදිලිවම, අවධාරණයෙන් ප්‍රකාශ වන්නේ බොහෝ විට නෙතට ලක් නොවන, මාක්ස්වාදයේ එක් ලක්ෂණයකි. මෙම ලක්ෂණය අප නොදැක සිටීමෙන්, අපි මාක්ස්වාදය ඒකාංශිකවූද, විකලාංගවූද අප්‍රාණික දෙයක් බවට පත් කරන්නෙමු, අපි එහි ජීව ශක්තිය මුලිනුපුටා දමන්නෙමු. එහි මූලික න්‍යායික පදනම – දයලෙක්තිකය එනම් හැම අංශයකටම බලපාන මුළු මහත් ප්‍රති විරෝධතාවයන්ගෙන් පූර්ණ වූ ඓතිහාසික සංවර්ධනය පිළිබඳ උගැන්වීම අපි බිඳ දමන්නෙමු. ඉතිහාසය නව මගක් ගන්නා සෑම අවස්ථාවකදීම විපරිවර්තනයකට භාජනය වන්නාවූ, අවධියට අයත්වූ නියත ව්‍යවහාරික කාර්ය භාරයන් සමග එහි ඇති සබැඳියාව කඩා බිඳ දමන්නෙමු.

තවද, සැබවින්ම රුසියාවෙහි මාක්ස්වාදයට අත්වන ඉරණම ගැන මෙකල උනන්දුවක් දක්වන අය අතර මාක්ස්වාදයේ ඉහත කී අංශය ගැන සැලකිලි නොදක්වන බොහෝ දෙනෙක් හමුවෙති. එසේ නමුදු, කාහට වුවද පැහැදිලි වන කරුණක් නම්, අමුතු වේගයකින් හා අමුතු ශක්තියකින් තත්ත්වය වෙනස් කරන, සමාජ දේශපාලන තත්ත්වයන් වෙනස් කරන ක්ෂණික පෙරළි මෑත කාලයේදී රුසියාවේ ඇති වීමය. ක්‍රියාකාරීත්වයේ තත්ත්වය ක්ෂණික හා සෘජු ආකාරයකින් වෙනස් කරන්නේත්, එම හේතුව නිසාම ක්‍රියාකාරීත්වයේ කාර්ය භාරයන් නියම කරනු ලබන්නේත් සමාජ — දේශපාලන තත්ත්වයන් විසිනි. සත්තකින්ම මා මෙහි ලා පවසන්නේ පංතීන් අතර ඇත්තාවූ මූලික සම්බන්ධකම් එලෙසින්ම පවතින තාක් කල් ඓතිහාසික විපර්-

https://liberationbase.wordpress.com

යාසයන් සමග වෙනස් නොවන්නාවූ පොදු, මූලික කාර්ය භාරයන් ගැන නොවේ රුසියානු සමාජයේ විවිධ පංතීන් අතර පවතින මූලික සම්බන්ධනයන් මෙන්ම, රුසියාවේ මේ සාමාන්‍ය ආර්ථික (ආර්ථික පමණක් ද නොවේ) පරිණාමනයේ ප්‍රවණතාවයද, ඉකුත් සය වසර තුළ වෙනස් වී නැති බව සක් සුදක් සේ පැහැදිලිය.

එහෙත් සංයුක්ත සමාජ දේශපාලන තත්ත්වය වෙනස් වී ඇති අයුරින්ම මෙම කාලය තුළදී ක්ෂණික හා රිජු ක්‍රියාකාරිත්වයේ කාර්ය භාරයන් ඉතා තියුණු ලෙස වෙනස් වී ඇත. එම හේතුව නිසාම මාක්ස්වාදය ජීවමාන න්‍යාය ධර්මයක් ලෙසත්, එහි විවිධ අංශයනුත් පෙරමුණට නිරායාසයෙන්ම ගෙන ඒමට සිදුවිය.

මෙම අදහස පැහැදිලි කරනු වස්, ඉකුත් සය වසර තුළ සංයුක්ත සමාජ-දේශපාලන තත්ත්වයෙහි ඇති වූ වෙනස්කම් දෙස අපි බලමු. මේ සය වසරක කාල පරිච්ඡේදය තෙවසර බැගින් යුත් වකවානු දෙකකට බෙදී ඇති බව අපට එකවර පෙනේ. එකක් අඩුවැඩි වශයෙන් 1907 ගිම්හානයේ අවසන් වේ, අනික 1910 ගිම්හානයෙන් සමාප්ත වේ. න්‍යායික දෘෂ්ටි කෝණයකින් බලන විට, මුල් තෙවසරෙහි ඇති විශේෂ ලක්ෂණය නම්, එම කාලයේදී රුසියාවේ රාජ්‍ය ක්‍රමයේ මූලික ලක්ෂණවල සීඝ්‍ර වෙනස් වීමක් ඇති වීමය. මේ වෙනස්වීම්වල ක්‍රියාදාමය එකිනෙකට සමාන නොවීමය. දෙපසෙහිම මේ විස්තාරයේ උච්චාවචනය ඉතා විශාලය. සමාජ ආර්ථික පදනමේ අධි ව්‍යූහයේ සිදුවූ වෙනස් වීම් කෙතරම් චමත්කාර වීදයත්, කෙතරම් බහුල වීදයත් රුසියානු සමාජයේ සෑම පංතියක්ම ඉතා විවිධ අංශයන්හි (ඩූමාව තුළත්, ඩූමාවට පරිබාහිරවත්, පුවත්පත්, සංගම් හා රැස්වීම් ආදිය මගින්ද) ක්‍රියා ශීලී වූහ. මෙය ඉතිහාසයේ විරල සිද්ධියක් විය. එහෙත් අනිත් අතට, දෙවන තෙවසරේ ලක්ෂණය මෙසේ විය: — මේ වර අපි හුදු න්‍යායාත්මක — සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් බලන බව යළිත් පවසා සිටිමු. මේ කාලයේ පරිණාමය කොතරම් සෙමින් සිදුවීදයත්, එය එකතැන පල්වීමකට බෙහෙවින් සමාන විය. රාජ්‍ය ක්‍රමයෙහි සැලකිය යුතු කිසිදු වෙනස් වීමක් සිදු නොවීය. මුල් තෙවසර තුළදී ''වේදිකා'' බහුතරයක ක්‍රියා ශීලී වූ පංතීන්ගේ විවෘතවූද, විවිධවූද ක්‍රියාකාරිත්වයක් හෝ එයට සමාන කිසිවක් නොවීය.

මේ කාල පරිච්ඡේද දෙක අතර ඇති පොදු ලක්ෂණය නම්, පළමුවැනි හා දෙවැනි කාල පරිච්ඡේදවල සිදුවූ පරිණාමය පැරණි දෙයම, එනම් ධනපති පරිණාමයක් වීමය. මෙවැනි ආර්ථික පරිණාමයේ ප්‍රතිවිරෝධතාවය වූයේ එහි ප්‍රවේණිදාස හා මධ්‍යකාලීන සංස්ථා කීපයක්ම පැවැති අතර ඒවා පෙර සේ පැවතීමය. ඇතැම් සංස්ථා විසින් අර්ධ ධනවාදී

ස්වරූපයක් ගැනීම නිසා මේ ප්‍රතිවිරෝධතාවය ලිහිල් වනවා වෙනුවට වඩාත් උග්‍ර තත්වයකට පත්විය.

ඉහත කී අසමානවූද, ක්ෂණිකවූද පෙරළිවල ප්‍රතිඵල කෙබඳුවේද යන ප්‍රශ්නය ඓතිහාසික ක්‍රියාකාරිත්වය නැමැති වේදිකාවේ පළමුවැනි වකවානුවේ තිබීම මේ කාල පරිච්ඡේද දෙක අතර තිබුණු වෙනස වන්නේය. රුසියාවේ ඇතිවූ පරිණාමය ධනවාදී පරිණාමයක් වූ බැවින් මේ වෙනස්කම් වල හරයද ධනවාදී නොවී සිටිනු නොහැකි විය. එහෙත් ධනපති පංතිය සහ ධනපති පංතිය සිටි. අඩුවැඩි වශයෙන් ඇල් මැරුණු ලිබරල්වාදයක් අනුගමනය කළ මධ්‍යම හා මහා ධනපති පංතිය, ස්වකීය පංති පදනම හේතුකොට ගෙන විශාල වෙනස්කම් වලට බිය විය. ඔවුහු කෘෂක සැකැස්මේ හා දේශපාලනයේ ''අධි ව්‍යූහයේ'' සහ පැරණි සංස්ථාවල නෂ්ඨාවශේෂයන්ගේ සෑහෙන කොටසක් ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියා කළහ. ''සිය දහේ ශ්‍රමයෙන් යැපෙන්නාවූ'' ගොවි ජනතාව සමග වෙළී ජීවත්වන ගම්බද සුළු ධනපති පංතිය, මධ්‍ය කාලීන යුගයෙන් ශේෂවූ දේවලට හැකි තරම් ඉතා අඩු ස්ථානයක් දෙන වෙනත් විදිහක ධනපති ප්‍රතිසංස්කරණ සඳහා පරිශ්‍රමයක් දැරීම නොවැළැක්විය හැකි දෙයක් විය. තමන් වටා සිදුවන දේ ගැන විඥ නක හැඟීමකින් සිටි වැටුප් ශ්‍රමික කම්කරුවෝ , මෙම ප්‍රවණතා දෙකේ සට්ඨනය කෙරෙහි එක්තරා නියමිත ආකල්පයක් දැක්වූහ. මෙම ප්‍රවණතා දෙක ධනවාදී ක්‍රමයේ රාමු තුළ වුවද, ඒවා මෙම ක්‍රමයේ සම්පූර්ණ වෙනස් වූ ස්වරූපයන්ද, එහි සංවර්ධනයේ සම්පූර්ණයෙන්ම වෙනස් වූ වේගයන්ද, එහි ප්‍රගතිගාමී ප්‍රවණතාවයන්ගේ විවිධ පුළුල් බලපෑමද නිගමනය කළේය.

මේ කරුණු අනුව, ඉකුත් තෙවසර තුළදී මාක්ස්වාදයේ ගැටළු වශයෙන් අප විසින් සිරිත් පරිදි හඳුන්වනු ලබන ගැටළු සාංසිද්ධිකව නොව, අවශ්‍යයෙන්ම පෙරමුණට පත්විය. මේ ගැටළු පිළිබඳව පැන නැගුණු මතභේද හා විවාද ''බුද්ධිමතුන්ගේ'' මතභේද හැටියටත්, ඒවා නොමේරූ නිර්ධන පංතිය කෙරෙහි බලපෑමක් ඇති කිරීමට ගත් ආයාසයක් හැටියටත් විවිධ වර්ග වලට අයත් වෛභිවාදීන් සිතන පරිදි එය නිර්ධන පංතියට ගැළපෙන පරිදි හැඩගැසීමට බුද්ධිමතුන් ඉදිරිපත් වීමක් හැටියටත්'', හුවා දැක්වීම තරම් අසත්‍ය මතයක් තවත් නොමැත. එයට හාත්පසින්ම වෙනස්ව, මෙම පංතිය මුහුකුරා වැඩී තිබෙන බැවිනි, නිර්ධන පංතියට රුසියාවේ ධනවාදී සංවර්ධනයේ ප්‍රවණතා දෙක අතර ගැටුම කෙරෙහි උදාසීනව සිටීමට නොහැකිවූ බැවිනි, තවද ඒ එකිනෙකට වෙනස්වූ ප්‍රවණතාවයන්ට (නියම ලෙස හෝ අනියම් ලෙසත්, සෘජු ලෙස හෝ වක්‍ර ලෙසත් පිළිබිඹුවන)

https://liberationbase.wordpress.com

න්‍යායික සූත්‍රයන් ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටීමට මෙම පංතියට අයත් දෘෂ්ටිවාදීන් අපොහොසත්වූ බැවිනි.

දෙවැනි තෙවසරේදී රුසියාවේ ධනවාදී සංවර්ධනයේ විවිධ ප්‍රවණතා අතර වූ ගැටුම පිළිබඳ ප්‍රශ්නයක් පැන නොනැංගේය. මන්දයත් "සූබර්"[46] විසින් එම ප්‍රශ්නය පාගා දමා, පසු බස්වා, අභ්‍යන්තරයට එළවා දමා, එක්තරා කාලයකට මර්දනය කර දමා තිබුණු බැවිනි. මධ්‍යකාලීන සූබර්වරුන් පෙරමුණ ගෙන සිටියා පමණක් නොව වෛහිවාදී හැඟීම්වලින් සහ අධෛර්යවූ අස්ථිරතාවයකින් ඔවුහු ධනපති සමාජයේ විශාල කොටසක් වෙළා දමූහ. පැරණි ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කැපවූ මාර්ග දෙකක් අතර හටගත් ගැටුමක් නොව, කිනම් ආකාරයක ප්‍රතිසංස්කරණයක් කෙරෙහි තැබූ බලාපොරොත්තු සුන්වීමක්, පසුතැවිල්ලකින් සහ බියසුලු හැඟීමකින් යුත් ගතියක්, සමාජ විරෝධී හැඟීම් කෙරෙහි දක්වූ ලොල් බවක්, ගුඪ ධර්මයන් මෝස්තරයක් ලෙස සැලකීමක් ආදිය — මතු පිටින් පෙනෙන්නට විය.

පුදුම සහගත දැඩි බවකින් හටගත් මේ පෙරළිය සාංසිද්ධියකින් හෝ 'බාහිර' බලපෑමක ප්‍රතිවිපාකයක් වශයෙන් හෝ සිදුවූවක් නොවීය. සිය වස් ගණනාවක් තිස්සේ දේශපාලන ප්‍රශ්නවලින් වෙන්වී සිටි, පිටස්තර පුද්ගලයින් සේ සිටි, පීඩිත මහජනතාව පළමු අවධිය තුළදී කොතරම් දුරට ප්‍රබෝධමත් වීදයත්, "වටිනාකම පිළිබඳව අළුත් අගැයීමක් කිරීමත්" මූලික ගැටළු අළුතින් හැදෑරීමත්, න්‍යාය හා මූලික කරුණු පිළිබඳව අළුතින් ආශාවක් දක්වීමත්, මූලික කරුණු හැදෑරීම පිළිබඳව නව ආශාවක් හට ගැනීමත් ඔවුන් තුළ ස්වභාවික ලෙසත්, අනිවාර්ය ලෙසත් ඇති විය. කෝටි සංඛ්‍යාත ජනකායක් දීර්ඝ කාලීන නින්දෙන් වහාම අවදිවූහ. තමන් ඉදිරියේ පැන නැගි වැදගත් ප්‍රශ්නවලට, හදිසියේ මුහුණ දීමට ඔවුනට සිදුවූ අතර පෙර සිටි තත්ත්වයෙහි තව දුරටත් රැඳී සිටීමටද, නැවතීමකින් තොරව දිගටම ක්‍රියා කිරීමටද, මූලික ප්‍රශ්නයන් විසඳනු පිණිස ආපසු නැවිත් නොසිටීමටද ඔවුහු අපොහොසත් වූහ. ඉමහත් වටිනාකමකින් යුත් මෑත කාලයේ පාඩම් "සමීකරණය කිරීමට,, ආධාර වන්නාවූ සහ වඩාත් දැඩි අධිෂ්ඨානකින් යුතුව, වඩාත් වැඩි සවිඥනයකින් යුතුව, වඩාත් වැඩි ආත්ම ශක්තියකින් සහ වඩාත් වැඩි හික්මීමකින් යුතුව පොදු ජනතාවගේ වඩාත් පුළුල් කොටස්වලට ඉදිරියට යාමට ඉඩකඩ සලසා දීමට අළුත් සූදනම් වීමකින් තොරව ඔවුහු අපොහොසත් වූහ.

ඓතිහාසික වර්ධනයේ දයලෙක්තික ක්‍රියා කාරිත්වය කෙසේවීදයත්, රටේ සෑම ක්ෂේත්‍රයකම ක්ෂණික ප්‍රතිසංස්කරණ සපුරාලීමේ

කාර්ය භාරය මුල් අවධියේදී ප්‍රමුඛස්ථානය දැරීය. දෙවැනි අවධියේදී අත්දැකීම් යළි සකස්කර ගැනීමටත්, එම අත්දැකීම් පොදු ජනතාවගේ පුළුල් කොටස් විසින් උකහා ගැනීමටත්, එය මෙලෙස ප්‍රකාශ කළ හැකිනම්, විවිධ පංතිවල නොදියුණු කොටස්වලට ඒවා කාවැද්දවීමටත් ක්‍රියා කිරීමය.

මෙම හේතුව නිසාම, මාක්ස්වාදය අප්‍රාණික ආධානයක් නොවන්වෙන්ය, එය අවසාන වශයෙන් සාදා පිළියෙල කරන ලද උගැන්වීමක් නොවන්නේය, එහෙත් එය ක්‍රියාවට මග පෙන්වන ජීවමාන උගැන්වීමක් වන නිසා සමාජ ජීවිතයේ සිදුවූ පුදුමාකාර ක්ෂණික තත්ත්වයන්ගේ වෙනස් වීම මාක්ස්වාදයෙන් අනිවාර්ය ලෙසම පිළිබිඹු විය. සමා ජ තත්ත්වයෙහි සිදුවූ වෙනස්කම් මාක්ස්වාදය තුළ විසිරී යාමක, භේද භින්න වීමක, විවිධ අවිනිශ්චිත භාවයක කෙටියෙන් කිය තොත් ඉතා දරුණු අභ්‍යන්තරික අර්බුදයක පිළිබිඹු වීමක් විය. මෙසේ විසිරියාම වළක්වාලීම සඳහා අධිෂ්ඨාන සහගත අරගලයක යෙදීමත්, මාක්ස්වාදයේ පදනම ආරක්ෂා කිරීම සඳහා ඉතා දැඩි අරගලයක යෙදීමත් හදිසි කාර්ය භාරයන් බවට පත්විය. තම පරමාර්ථ සූත්‍රගත කිරීමේදී මාක්ස්වාදය බැහැර කිරීමට නොහැකි වූ ඒ පංතීන්වල ඉතා පුළුල් කොටස් විසින්, මුල් අවධිය තුළදී බෙහෙවින් ඒකාංශවූද, අසම්පූර්ණවූද ආකාරයකින් මාක්ස්වාදය උකහා ගන්නා ලදී. එක් හෝ තවත් "උද්යෝග පාඨ" කීපයක් කට පාඩම් කැර ගත් ඔවුහු උපාය මාර්ග පිළිබඳ ප්‍රශ්න කීපයකටද පිළිතුරු දැන සිටියහ. එහෙත් එම පිළිතුරුවල මාක්ස්වාදී නිර්ණායකයන් (මිමි) පිළිබඳ අවබෝධයක් ඔවුනට නොතිබිණි. සමාජ ජීවිතයේ විවිධ අංශයන්හී "සියලු වටිනාකම් පිළිබඳව අධි — අගැයීමක් කිරීම" මාක්ස්වාදයේ ඉතා වියුක්ත පොදු දර්ශනික පදනම් "සංශෝධනය" කිරීමට හේතු විය. ධනපති දර්ශනවාදයේ අනේක විධ වෛඥනික පැහැයයන් විසින් කරන ලද බලපෑම මාක්ස්වාදීන් අතර පැතුරුණු මාහ්වාදයෙන්[47] හෙළිවිය. සාක්ෂාත් නොකරගත්, නොතේරෙන, කට පාඩම් කර ගත් 'උද්යෝග පාඨ' පුන පුනා උච්චාරණය කිරීම නිසා පුහු වාග්පාඨ පුළුල් ලෙස පැතිරිණි. මේ නිසා එළිපිට නැතිනම් ලජ්ජාශීලී "ඔත්සෝවිවාදය" එසේත් නැතිනම් "ඔත්සෝවිවාදය"[48] මාක්ස්වාදයේ නීත්‍යානුකූල පැහැයක් ලෙස පිළිගන්නා වූ, කොහෙත්ම මාක්ස්වාදී නොවන සුළු ධනපති පංතික ප්‍රවණතා පැතිරිණි.

අනිත් අතින් ධනපති පංතියේ ඉතා පුළුල් කොටස් වලට බලපෑ වෛහිවාදී ආස්වාදයත්, අස්ථිරභාවයේ ආස්වාදයත්, මධ්‍යස්ථ භාවය හා නිරවද්‍ය භාවයට මාක්ස්වාදයේ න්‍යායය සහ ව්‍යවහාරය පැටවීමට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වෙහෙස දරූ ප්‍රවණතාවය තුළට කාවැදිණි. ''ධූරාවලිය'' සහ ''ආධිපත්‍යය'' ආදිය ගැන ඇතිවූ ලිබරල්වාදී හරයකින් යුත් වාග්පාඨ පමණක් මෙහිදී මාක්ස්වාදී යැයි කිව හැකි දෙයක් ලෙස ශේෂවිය.

මෙම ලිපියේ පරමාර්ථය මේ තර්ක විමර්ශනය කිරීම නොවේ. මාක්ස්වාදය මුහුණ පා ඇති ගැඹුරු අර්බුදය නිදසුනක් ලෙස පෙන්වා දීමටත්, මෙලෙස අර්බුදයට හසුවී තිබෙන වකවානුවේ සමස්ත සාමාජික සහ ආර්ථික තත්ත්වය සමග එයට ඇති සම්බන්ධතාවයන් පෙන්වා දීමටත් මෙය ගෙන හැර දක්වීම ප්‍රමාණවත්ය. මෙම අර්බුදය විසින් මතුකර තිබෙන ප්‍රශ්න ඉවත දැමීම කළ නොහැකිය. පුහු වාග්පාඨ ඇද බැමෙන් මේ ප්‍රශ්න විසඳා ලීමට උත්සාහ දැරීම තරම් ප්‍රතිපත්ති විරෝධී, හානිකර දෙයක් තවත් නැත. විවිධ මාක්ස්වාදී ''ගමන් සගයින්'' අතර ධනවාදී බලපෑම පුළුල් කිරීමෙන් ප්‍රතිවිරුද්ධ ආකාරයකින් විකෘති කරන මාක්ස්වාදයේ න්‍යායික පදනම් සහ මූලික තත්ත්වයන් ආරක්ෂා කර ගැනීම සඳහා අර්බුදයේ භයානකත්වයත්, එය මගහරවාලීමේ අවශ්‍යතාවයත් සාක්ෂාත් කැරගත් සියලු මාක්ස්වාදීන් ඒකරාශි කිරීම තරම් වැදගත් කටයුත්තක් තවත් නොමැත.

මාක්ස්වාදය පළමුවැනි වරට නිසි ලෙස හැඳින ගැනීමට දැන් පටන් ගන්නාවූ පුළුල් ජන කොටස්, ඉහත කී තෙවසර තුළදී විඥානික ලෙස සමාජ කටයුතු වල ක්‍රියා කිරීමට ඉදිරිපත් වී සිටිති. මෙම කරුණ සම්බන්ධයෙන් අන් කවර කලෙකටත් වඩා සාවද්‍ය මත ධනපති පුවත්පත් විසින් පළ කරන අතර එය වඩාත් පුළුල් ලෙස පතුරුවා හරිති. මෙවැනි තත්ත්වයන් යටතේ මාක්ස්වාදීන් අතර භේදයන් ඇතිවීම විශේෂයෙන්ම භයානකය. එබැවින් වත්මන් තත්ත්වයේදී මෙලෙස භේදවීමේ අනිවාර්යතාවයට හේතු අවබෝධ කැරැ ගැනීමත්, එයට විරුද්ධව ක්‍රමානුකූලව සටන් කිරීම සඳහා ඒකරාශි වීමත්, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම, මාක්ස්වාදීන් මත පැවරී ඇති කාර්ය භාරය වන්නේය.

1910 දෙසැම්බර් 23 ද
''ස්වෙස්ද'' අංක 2.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති,
වෙළුම 20, පිටු 84-89.

ලෙව් තොල්ස්තෝයි සහ ඔහුගේ යුගය

ලෙව් තොල්ස්තෝයි අයත් යුගය සහ ඔහුගේ දීප්තිමත් සාහිත්‍ය කෘතීන් සහ ඔහුගේ උගැන්වීම් 1861 න් පසුව පටන්ගෙන 1905 දක්වා වූ වකවානුවේදී අගනා ලෙස මතුවී පෙනිණි. තොල්ස්තෝයිගේ සාහිත්‍යමය ක්‍රියාකාරිත්වය එයට පෙර පටන් ගෙන අප සටහන් කළ කාලයට පසුවත් පැවතුණු බව සත්‍යයකි. තොල්ස්තෝයි කලා කරුවකු සහ චින්තකයකු ලෙස මුහුකුරා වැඩුණේත් මෙම කාලය තුළදීය. තොල්ස්තෝයි ගේ කෘතීන්වල අංග ලක්ෂණ කැපී පෙනුණේත්, ''තොල්ස්තෝයිවාදය'' මුහු කුරා වැඩුණේත් මේ පරිණාමන කාලය තුළදීය.

මේ අඩ සිය වසර තුළදී රුසියාවේ ඇතිවූ පරිවර්තනයේ ස්වභාවය තොල්ස්තෝයි සිය කෘතිය වූ ''ආන්නා කරේනිනා'' හි චරිතයක් වන ලේවින් මගින් ඉතා විචිත්‍ර ලෙස මෙසේ සටහන් කරයි:

''... අස්වැන්න කැපීමත්, කම්කරුවන් කුලියට ගැනීමත්, ගැන කතා කිරීම පහත් සිරිතක් ලෙස ගණන් ගන්නා බව ලේවින් දනී. .. එහෙත් ලේවින්ට දැන් නම් එය ඉතා වැදගත් කරුණකි. ''මෙය සමහර විට ප්‍රවේණිදාස ක්‍රමය යටතේ සමහර විට නොවැදගත් දෙයක් වූවා විය හැකිය, නැතිනම් එය එංගලන්තයේ වැදගත් දෙයක් වූවා විය හැකියි. මේ අවස්ථා දෙකේදීම තත්ත්වයන් නියතය; එහෙත් අද හැම දෙයක්ම උඩු යටිකුරු කොට පෙරළා යළිත් හැඩයක් ගැනීමට පටන් ගෙන ඇත. මේ සියලු තත්ත්වයන් කිනම් ආකාරයක හැඩයක් ගන්නේද යන ප්‍රශ්නය ගැන'' — ලේවින් සිතත්නට විය.'' (කෘතීන් එකතුව, 10 වෙළුම. 137 පිටුව.)

''මෙහි රුසියාවේ හැමදෙයක්ම උඩු යටිකුරු කොට පෙරළා යළිත් හැඩයක් ගැනීමට පටන් ගෙන ඇත'' — 1861—1905 වකවානුව

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විස්තර කිරීම සඳහා මීට වඩා උචිත ලෙස මෙය නිරූපනය කළ නොහැකිය. උඩු යටිකුරු කොට පෙරළා ඇත්තේ මොනවාද යන්න ප්‍රසිද්ධ දෙයකි, නැතිනම්, යටත් පිරිසෙයින් සෑම රුසියානුවෙක්ම ඒ ගැන දනී. එය ප්‍රවේණිදසත්වය සහ එයට සම්බන්ධ වුණු මුළු මහත් පැරණි ක්‍රමය'' යි. ''යළිත් හැඩයක් ගැනීමට පටන් ගෙන ඇතැ'' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න කිසිවෙක් නොදනිති, ජනගහනයේ පුළුල් කොටස්වලට පිටස්තර සහ අවබෝධ කර ගත නොහැකි දෙයකි. ''දැන් යළිත් හැඩයක් ගැනීමට පටන් ගෙන ඇතැ'' යන මේ වැකියෙන් අදහස් කරන ධනපති ක්‍රමය තොල්ස්තෝයි වටහා ගත්තේ නොපැහැදිලි ලෙසය. මේ ''එංගලන්තයේ'' ඇති වූ සමාජ ක්‍රමයේ ලක්ෂණද, මේ ක්‍රමය සහ ප්‍රාග්ධනයේ ආධිපත්‍ය අතර ඇති සම්බන්ධතාවයද, මුදල් ඉටු කරන ක්‍රියා කලාපයද, විනිමයේ නැගීම සහ වර්ධනයද පිරික්සා බැලීමට කරන හැම ප්‍රයත්නයක්ම ප්‍රතිපත්ති මූලක වශයෙන් තොල්ස්තෝයි ප්‍රතික්ෂේප කරන නිසා එය පඹයකු වීම සත්‍යයකි. නරෝද්නිවාදීන් මෙන්ම ඔහුද, රුසියාවේ හැඩගැසීගෙන එන්නේ අනිකක් නොව, ධනපති ක්‍රමය බව දැකීමට ප්‍රතික්ෂේප කරයි, ඒ දෙස නොබලා දෙනෙත් වසා ගනී, එම අදහස පිළිනොගනී.

''එංගලන්තයේ'', ජර්මනියේ, ඇමෙරිකාවේ, ප්‍රංශයේ ආදී රටවල අනේක විධ හැඩයන් ගත්, මෙ ධනවාදී ක්‍රමය, රුසියාවේ 1861-1905 ඇතිවූ සමාජ හා දේශපාලන ක්‍රියාකාරිත්වයේ හදිසි කාර්ය භාරයන් අනුව, ''කිනම් හැඩයක්'' ගනීද යන්න එම වකවානුවට පමණක් නොව (අප කාලයට පවා) බලපාන ඉතාම වැදගත්, නැතිනම් ඉතා වැදගත් ප්‍රශ්න අතුරෙන් එකක් බව සැබවි. එහෙත් ප්‍රශ්නය මෙලෙස නියත, සංයුක්ත ඓතිහාසික ලෙස ඉදිරිපත් කිරීම තොල්ස්තෝයිට නම් සම්පූර්ණයෙන්ම පිටස්තර දෙයක් විය. ඔහු එය වියුක්ත ලෙස පිරික්සා බලයි. සදචාර ධර්මයේ ''සදකාලික'' ප්‍රතිපත්ති අනුව, ලබ්ධියේ ''සදකාලික'' සත්‍යයන් අනුව පමණක් ඔහු එය සාක්ෂාත් කර ගනී. මෙම දෘෂ්ටි කෝණය පැරණි (''උඩු යටිකුරු කළ'') ක්‍රමයේ, රදළ ක්‍රමයේ, නැගෙනහිර මිනිසුන්ගේ ජීවන ක්‍රමයේ දෘෂ්ටියක් බව වටහා ගැනීමට ඔහු අපොහොසත් වෙයි.

තොල්ස්තෝයිගේ කෘතියක් වන ''ලුසෙර්න්'' හි (මෙය 1857 ලියන ලදී) ''සභ්‍යත්වය වරප්‍රසාදයක් ලෙස පිළිගැනීම සිතින් මවාගත් විකල්පයකියි'' සටහන් වේ. ''මෙය මිනිස් ස්වභාවයට ආවේණික වූ යහපත් දේ කිරීමේ, නෛසර්ගික, දිව්‍යමය ආදිකාලීන අවශ්‍යතාවය විනාශ කරයි.'' ''අපට ඇත්තේ එකම, එක නොවරදින සුලු මාර්ග දේශකයෙකි'' යි තොල්ස්තෝයි පවසයි. ''එය අප තුළට කාවදින

සර්වසාධාරණ ආත්මය වන්නේය''. (කෘතීන් එකතුව, දෙවැනි වෙළුම, 125 පිටුව).

තොල්ස්තෝයිගේ කෘතියක් වන ''අප කාලයේ වහල්භාවය'' නැමැති කෘතියෙහි (මෙය 1900 ලියන ලදී) සර්වසාධාරණ — විශ්වමය අධ්‍යාත්මයට කරන මෙම ආයාචනය ඉමහත් උද්යෝගයකින් සටහන් වී ඇත. ''එය දේශපාලන ආර්ථිකය ''ව්‍යාජ විද්‍යාවක්'' ලෙස බැහැර කරයි. මන්දයත්, දේශපාලන ආර්ථිකය මුළු මහත් ඉතිහාසයේ මුළු මහත් ලෝකයේ සියලු රටවල මිනිසුන්ගේ තත්ත්වයන් ආකෘතියක් ලෙස නොගෙන ඉතා විශේෂ තත්ත්වයන් ඇති කුඩා එංගලන්තය ආකෘතියක් ලෙස ගණන් ගන්නා බැවිනි''. ''ප්‍රගතිය සහ අධ්‍යාපනයේ නිර්වචනය'' (1862) නැමැති ලිපියෙන් ඔහු මේ 'මුළු මහත්' ලෝකය කුමක්දැයි අපට හෙළි කරයි. ප්‍රගතිය මිනිස් සංහතියේ පොදු නිගමනයකි යන ඉතිහාසඥයින්ගේ මතයට ගරු කරන තොල්ස්තෝයි ''නැගෙනහිර නමින් හැඳින්වෙන සමස්තය'' උපුටා දක්වයි. (IV—162) මිනිස් ප්‍රගතියේ පොදු නියමයක් නැතැයි තොල්ස්තෝයි අපට කියයි. ''ශාන්ත නිශ්චල නැගෙනහිර ජනතාව මෙය ඔප්පු කර ඇත''.

තොල්ස්තොයිවාදය එහි ඓතිහාසික හරය අනුව, නැගෙනහිර, ආසියාතික ක්‍රමයකට අයත් දෘෂ්ටිවාදයකි. ඒ අනුව තොල්ස්තොයිවාදය තාපස, නපුරට ප්‍රතිරෝධනය නොදක්වන, සර්ව අශුභවාදයක ගැඹුරු සටහන් සහිත, හැම දෙයක්ම ශූන්‍යයකි, හැම දෙයක්ම ද්‍රව්‍යමය ශූන්‍යයකි (''ජීවිතයේ තේරුම'' 52 පිටුව), ''අධ්‍යාත්මය'' කෙරෙහි විශ්වාසය තැබීම, ''හැම දෙයකම පටන් ගැන්ම'' මිනිසා මෙම පටන් ගැන්ම සමග සමකරන විට, ''තම ආත්මය ගළවා ගැනීමේ කාර්යය පවරා ඇති ... හුදු ග්‍රාමිකයකි'' ආදිය මත ප්‍රකාශ කරන දර්ශනයකි. සිය ''ක්‍රෙට්සර් සොනාටා'' කෘතිය මගින් ඔහු මෙසේ කියන විට, ඔහු සිය දෘෂ්ටියට අවංක වේ: කාන්තාවගේ ගැළවීම ඇත්තේ විද්‍යාලවල සහ පාර්ලිමේන්තුවේ නොවේ, නිදන කාමරයේය. විශ්ව විද්‍යාල වලින් පිට වන්නේ ''ස්නායු කිපුණු, රෝගී ලිබරල්වාදීන්'' යැයි ඔහු 1862 දී ලියන ලද ලිපියක සඳහන් වේ. මොවුන් ''ජනතාවට කොහෙත්ම අවශ්‍ය නොවේ'' ''සිය පැරණි වටපිටාවෙන් ප්‍රයෝජන රහිත ලෙස වෙන් වී ඇත'', ඔවුනට ජීවිතයේ තැනක් සොයා ගැනීමට බැරිය ආදී වශයෙන් එහි සටහන් වී ඇත (IV, 136—137 පිටු).

මුළු මහත් පැරණි ක්‍රමය උඩු යටිකුරු කොට පෙරළූ විටෙක, සර්ව අශුභ වාදයත්, අවිහිංසාවාදයත්, ''අධ්‍යාත්මයට'' ආයාචනා කිරීමත් ඇති දෘෂ්ටියක් අනිවාර්ය වී ඇත. මේ ක්‍රමයේ මූලධර්ම, පරිචය, සම්ප්‍රදායයන් සහ විශ්වාසයයන් සිය මවු කිරිත් සමග උකහාගත්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මිනිසුන් මෙම පැරණි ක්‍රමය බිඳ දැමූ විටෙක කිනම් විධියේ නව ක්‍රමයක් "හැඩ ගැසෙන්නේද" යන්න දැකීමට ඔවුනට වුවමනාවක් නැත, එය දැකීමටද ඔවුන් අසමත්ය. එය කිනම් සමාජ බලවේගයන් විසින් හැඩ ගසනු ලබන්නේද, මෙම පෙරළීමේ යුගවලට ආවේණික විශේෂයෙන් තීව්‍ර සහ අසංඛෙය විපත් වලින් මුදවා සහනයක් ලබා දිය හැක්කේ කිනම් සමාජ බලවේගයන්ටද යන්න දැකීමටද වුවමනාවක් නැත, එය දැකීමෙහිද අසමත්ය.

1862—1904 වකවානුව රුසියාවේ පෙරළි ඇතිවූ වකවානුවෙකි. යළිත් නැවත නොනැගිටින සේ හැම දෙනෙකුගේම නෙත් ඉදිරියේ පැරණි ක්‍රමය බිඳ වැටිණි. මෙම වකවානුවේදී අළුත් ක්‍රමය හැඩයක් ගත්තා පමණකි, අළුත් ක්‍රමය හැඩ ගස්වන සමාජමය බලවේගයන් පළමුව පුළුල්, විස්තීරණ — ජාතික පරිණාමයකින්, 1905 දී පමණක් ඉතා විවිධ කෂේත්‍රවල ප්‍රකාශනය විය. 1905 රුසියාවේ ඇතිවූ සිද්ධීන්වලට ඉක්බිතිව, තොල්ස්තෝයි විසින් පෙන්වා දෙනු ලබන "ශාන්ත නිශ්චල" නැගෙනහිර රටවල් කීපයකද එයට ප්‍රතිසම සිද්ධීන් ඇතිවිය. 1905 දී නැගෙනහිර ශාන්ත-නිශ්චලභාවය අවසාන වීම ආරම්භ විය. මෙම හේතුව නිසාම තොල්ස්තොයිවාදයේ ඓතිහාසික අවසානය එම වසරේදී සිදුවිය. යම්කිසි පෞද්ගලික දෙයක් ලෙස නොව, හිතුවක්කාර දෙයක් හැටියට හෝ පිස්සුවක් හැටියට නොව, එක්තරා කාල සීමාවක් තුළදී කෝටි සංඛ්‍යාත ජනතාවගේ ජීවන තත්ත්වයන් පැවැති දෘෂ්ටියක් ලෙස, තෝල්ස්තෝයිගේ උගැන්වීම් පැන නැගිය හැකි, එය වැළැක්විය නොහැකි වකවානුවක් අවසන් විය.

තොල්ස්තෝයිගේ උගැන්වීම් සත්තකින්ම මනෝරාජික, වචනයේ පරිසමාප්ත හා ඉතා ගැඹුරු අර්ථයෙන් එය ප්‍රතිගාමීය. එහෙත් එම උගැන්වීම් සමාජවාදී අදහස් වලින් තොරවූ බවක් හෝ දියුණු පංතීන්ගේ ඥනාවබෝධය ඇති කිරීමෙහි සමත් වටනා ද්‍රව්‍ය සහිත විවේචක මූලධාතු එහි නොතිබිණැයි මින් කොහෙත්ම අදහස් නොකෙරේ.

විවිධ වර්ගවල සමාජවාදයන් ඇත්තේය. ධනවාදී නිෂ්පාදනය ක්‍රමය පවතින සියලු රටවල ධනපති පංතිය වෙනුවට බලය අල්ලා ගැනීමට යන පංතියේ දෘෂ්ටිය ප්‍රකාශ කරන සමාජවාදය ඇත්තේය. ධනපති පංතිය වෙනුවට බලයට පත්වීමට යන පංතීන්ගේ දෘෂ්ටිය ප්‍රකාශ කරන සමාජවාදයද ඇත්තේය. නිදසුනක් වශයෙන් පසු කී වර්ගයේ සමාජවාදයකි, රදළ සමාජවාදය. මෙම සමාජවාදයේ ස්වභාවය, මීට බොහෝ කලකට පෙර, අවුරුදු හැටකට ඉහතදී, වෙනත් වර්ග වලට අයත් සමාජවාද තක්සේරු කරන අතරම මාක්ස් විසින් තක්සේරු කැරිණි.

තවදුරටත් මනෝරාජික බොහෝ ක්‍රම වලට අවේණික වූ විවේචක මූලධාතු මෙන්ම, තොල්ස්තෝයිගේ මනෝරාජික උගැන්වීම් වලද විවේචක මූලධාතු තිබේ. මනෝරාජික සමාජවාදයේ විවේචක මූලධාතු පිළිබඳව මාක්ස්ගේ අගනා නිරීක්ෂණය අප මෙහිදී අමතක නොකළ යුතුය: එය, "ඓතිහාසික සංවර්ධනයට ප්‍රතිලෝම සම්බන්ධතාවයක් ඇත්තේය". නව රුසියාව හැඩ ගසන සමාජමය බලවේගවල ක්‍රියාකාරීත්වය වත්මන් සමාජමය විශමතාවයන්ගෙන් මුදවාලීම සංවර්ධනය වී නියත ස්වරූපයක් ගන්නේ කොතරම් දුරටද, එතරම් දුරට විවේචක මනෝරාජික සමාජවාදයේ සියලු ප්‍රායෝගික වටනාකම් සහ න්‍යායික සමර්ථනය අහෝසි වී යන්නේය.

මීට වසර විසි පහකට පෙර තොල්ස්තෝයිගේ උගැන්වීමේ විවේචක මූලධාතු ඒවායේ ප්‍රතිගාමී සහ මනෝරාජික ලක්ෂණ නොතකා, ජනගහණයේ සමහර කොටස්වලට ඒවායේ ප්‍රායෝගික වටනාකමක් තිබිණි. එහෙත් මේ තත්ත්වය පසුගිය දශකයට බල නොපෑවේය. මන්දයත්, එක්දහස් අටසිය අසූ ගණන්වල සිට පසුගිය සිය වසර අවසානය දක්වූ කාලයේදී, ඓතිහාසික සංවර්ධනය සැහෙන ප්‍රගමනයකට මුණ පෑ බැවිනි. අපේ කාලයේදී ඉහත සටහන් කළ සිද්ධීන් වැළෙන් ඉක්බිතිව, නැගෙනහිර ශාන්ත — නිශ්චලතාවය නැවතී ඇත. අපේ කාලයේදී "වේහි" හි විඥත ප්‍රතිගාමී අදහස් (පටු පංතිමය සහ ආත්මාර්තකාමී පංතිමය අදහස අනුව ප්‍රතිගාමී) ලිබරල්වාදී පංතිය තුළ පැතිරී ඇත. මාක්ස්වාදයට ඉතා කිට්ටු කොටසක් තුළට පවා මේ අදහස් බෝවී ඔවුන් අතර "ලික්විඩේටර්වාදී" ප්‍රවණතාවයක්[49] මතු වී ඇත. අපේ කාලයේදී, තොල්ස්තෝයිගේ උගැන්වීම් පරමාදර්ශී කිරීම සඳහා ප්‍රයත්න දැරීමෙන් ඉතා ඍජු සහ ඉතා ගැඹුරු හානියක් කර ඇත. ඔහුගේ "අවිහිංසාවාදයද", අධ්‍යාත්මයට ඔහු කරන ආයාචනයන්ද, "සදචාර සමය. පරිපූර්ණතාවය පිළිබඳ ඔහුගේ අනුශාසනාද, "හෘද සාක්ෂිය" සහ විශ්වමය "ආදරය" පිළිබඳ ඔහුගේ උගැන්වීම්ද, තාපසවාදය සහ ශමනවාදය[50] පිළිබඳ ඔහුගේ දේශනයන් ආදියද සාධාරණ යැයි පෙන්වීමට සහ එහි සාවද්‍යතාවය ලුහු කොට පෙන්වීමට දරන ප්‍රයත්නයද ඍජු ඉතා ගැඹුරු හානියක් කර ඇත.

"ස්වෙස්ද" අංක 6,
1911 ජනවාරි 22 ද

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති,
වෙළුම 20, පිටු 100-104.

https://liberationbase.wordpress.com

මහ රුසියානු ජාතිකාභිමානය ගැන

ජාතිකත්වය සහ පිතෘ භූමිය ගැන අද මොන තරම් කථා කරති ද! තර්ක කරති ද! ඝෝෂා කරති ද! බ්‍රිතාන්‍යයේ ලිබරල් සහ උන්නතිකාමී කැබිනට් ඇමතිවරුද, ප්‍රංශයේ ''ඉදිරිය බලන'' පුවත්පත් කලාවේදීන් (ඔවුහු ඔවුන්ගේ ප්‍රතිගාමී සගයන් සමග සම්පූර්ණ එකඟත්වයෙන් ඇතිව සිටින බව ඔප්පු කර ඇත්තාහ) සමූහයක් ද රුසියාවේ නිල, කැඩෙට්වාදී සහ ප්‍රගතිශීලී කුරුටුගාන්නන් (නරෝද්නික්වරු සහ මාක්ස්වාදීන් කීප දෙනෙක් ඇතුලත්ව) රංචුවක්ද, යන සියළු දෙනාම තම තමන්ගේ රටෙහි විමුක්තියේ සහ ස්වාධීනත්වයේ ද, ජාතික ස්වාධීනත්වය පිළිබඳ ප්‍රතිපත්තියේද, ප්‍රෞඪත්වය ගැන වර්ණනාත්මක ප්‍රශංසා කරන්නාහ. මොවුන් අතරේ සිටිනවුන් අතුරෙන් නිකොලායි රොමානව්ටත්, නීග්‍රෝවරුන් හා ඉන්දියානුවන් ම්ලේච්ඡ ලෙස පීඩාවට පත් කරන්නාටත්, කුලියට තියු ගී ගයන්නා කවරෙක්ද යන්න හා හුදෙක් අඥාන කම හා නැතහොත් කොන්ද පණ නැති නිසාම, ප්‍රවාහය සමග ගසාගෙන යන්නා කවරෙක්ද යන්න, තෝරා ගැනීම උගහට ය. මොවුන් වෙන් කොට හඳුනා ගැනීමේ විශේෂ අවශ්‍යතාවයක් ද නොමැත. අධිපති රටවල ඉඩම් හිමියන්ගේ සහ ධන හිමියන්ගේ උවමනාවන් හා සමග ආසන්න ලෙස වෙළී පැටලී තිබෙන සමාරම්භය සහිත, විශාල සහ ගැඹුරු දෘෂ්ටිමය ප්‍රවණතාවයන්, අප හමුවේ දක්නට තිබේ. එම පංතිවලට වාසි සහගත වන අදහස් පතුරුවාලීම සඳහා, අවුරුදු පතාම, කෝටි ගණන් හා දස කෝටි ගණන් මුදල් වියදම් කරනු ලැබේ. සෑම පැත්තකින්ම පළවන අදහස්, එනම්, අවබෝධයෙන් ජාතොන්මාදවාදියෙක් වූ මෙන්ෂිකොකව්ගේ පටන්, අවස්ථාවාදය, නැතහොත් කොන්ද පණ නැති කම නිසා ජාතොන්මාදවාදීන් වූ ප්ලෙහානව් සහ මාස්ලව්, රුබනොවිච් හා ස්මිර්නොව්, ක්‍රපොත්කින් හා බුර්ත්සෙව් දක්වාවූ සියළු දෙනා විසින්ම පළ කෙරෙන අදහස් උකහා ගනිමින් ගෙනයන, මෙම ව්‍යාපාරය බලවත් ප්‍රවාහයක් බඳුය.

මහ රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් වන අපිද, මෙම දෘෂ්ටිමය ප්‍රවණතාවය විෂයෙහි අප දක්වන ආකල්පය පැහැදිලි කිරීමට උත්සාහ දරමු. යුරෝපයේ, ඈත පෙරදිග සහ ආසියාවේ විශාල කොටසක් අධිපතිත්වයට පත්, විශේෂයෙන්ම, ''ජනතාවගේ හිරගෙදර'' යනුවෙන් නිවැරදි ලෙස හඳුන්වා තිබෙන රටක නියෝජිතයින් වශයෙන්, ජාතික ප්‍රශ්නයේ ඇති වැදගත්කම අමතක කිරීම අපට තරම් නොවේ. විශේෂයෙන්ම නැගෙනහිර යුරෝපයේ සහ ආසියාවේ, විශාල සහ කුඩා ''නව'' ජාතීන් ගණනාවක්ම, ධනපති ක්‍රමය විසින් ජීවන ප්‍රබෝධයටත්, ආත්ම සංවිත්තියටත් ගෙන එන අවස්ථාවක, වංශවතුන්ගේ එක්සත් මණ්ඩලයේ[51] සහ ගුච්කොව්ලා සමග ක්‍රෙස්තොව්නිකව්ලාගේ, දල්ගරුකව්ලාගේ, කුත්ලෙර්ලාගේ සහ රොදිචෙව්ලාගේ අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙසට ජාතික ප්‍රශ්න ගණනාවක්ම ''විසඳීමට'' මහ රුසියානුන් හා රුසියානු නොවන දශ ලක්ෂ ගණන් පිරිස් මෙහෙයා ඇති අවස්ථාවක, එම ප්‍රශ්නය අමතක කළ නොහැක.

පංති විඥානය ඇති, මහ රුසියානු නිර්ධන පංතිකයන් වන අපට, ජාතික අභිමානය පිළිබඳ හැඟීම අන්‍යතර දෙයක් ද? ඇත්තෙන් ම නැත! අපි, අපගේ භාෂාවට සහ රටට ආදරය ඇත්තෙමු. ඇගේ වැඩ කරන ජනතාවගේ (ඇගේ ජනගහනයෙන් දහයෙන් නව පංගුවක් ම) ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී විඥානයේ මට්ටමට උසස් කිරීමට අපි සියළු දෙයක්ම කරන්නෙමු. සාර්ගේ බුචේරුවන්, වංශවතුන් සහ ධනපතියන් අතින්, අපගේ මේ ශෝභමාන රටට විඳින්නට සිදුවී තිබෙන දුෂ්ටාපරාධ, පීඩනය සහ නින්ද අපහාස දකින්නට හා දැනගන්නට ලැබෙන විට, එය අපට මහත් වේදනා දනවයි. මෙම දුෂ්ටාපරාධයන්ට විරුද්ධව, අප අතරින්, මහ රුසියානුන් අතරින්, දක්වනු ලබන ප්‍රතිරෝධය ගැන අපි ආඩම්බර වෙමු. ඔවුන් අතරින් රදිෂෙව්, දෙසැම්බර්වාදීන්[52] සහ රාස්නොචින්ට්සි[53] ඉදිරිපත් කළ හැකිවීම ගැන අපි ආඩම්බර වෙමු. මහ රුසියානු කම්කරු පංතිය 1905 දී පොදු ජනතාවගේ මහා බලවත් විප්ලවවාදී පක්ෂයක් ඇති කිරීම සම්බන්ධයෙන් ද, මහ රුසියානු ගොවි ජනතාව ප්‍රජාතන්ත්‍රවාදය වෙතට හැරවීමේ සහ දේව ගැති බලය සහ ඉඩම් හිමියන් බලයෙන් පහ කර දැමීමේ කටයුතුවල යෙදෙන්නට පටන් ගැනීම සම්බන්ධයෙන් ද, ආඩම්බර වන්නෙමු.

ස්වකීය ජීවිතයම, විප්ලවයේ සද්ව්‍යාපාරයට කැප කළ මහ රුසියන් ප්‍රජාතන්ත්‍රවාදියා වූ චෙර්නිෂෙව්ස්කි, අර්ධ ශතවර්ෂයකට පෙර මෙසේ කී බව අපි දනිමු: ''කාලකණ්ණි ජාතියක්, වහලුන්ගේ ජාතියක්,

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ඉහළ සිට පහළට සියළු දෙනාම වහල්ලු ය''.[55] මහ රුසියානු විවෘත හා ආවෘත වහල්ලු (සාර්වාදී රාජ ආණ්ඩුව සම්බන්ධයෙන් වහල් වූ අය) මෙම වචන සිහිපත් කිරීමට අකැමති වෙති. එහෙත් මෙම වචන රටට ඇති සැබෑ ඇල්මෙන් කියන ලද බව, මහ රුසියන් ජනතාවගේ පොදු ජන කොටස් අතර විප්ලවවාදී ජීව ගුණයක් නොතිබීම ගැන ආවේගයෙන් කියන ලද බව, අපි අදහස් කරන්නෙමු. ඒ වකවානුවේදී එම ජීව ගුණය කොහෙත්ම තිබුණේ නැත. දැනට එය ඇත්තේ මඳ වශයෙනි. එහෙත් එය දැනටමත් ඇති වී පවතින්නේ ය. මහ රුසියන් ජාතියද, විප්ලවවාදී පංතියක් නිර්මාණය කර තිබෙන නිසා, නිදහස හා සමාජවාදය සඳහා වූ අරගලයේ ශ්‍රේෂ්ඨ ආදර්ශයන් මිනිස් වර්ගයා හමුවේ තැබීමට එයද සමත් වී තිබෙන නිසා, අපි අභිමානයෙන් පිරී සිටින්නෙමු. අප අභිමානවත් වන්නේ යුදෙව් සංහාර, එල්ලුම් ගස් පේළි, බිම් ගෙවල මහා සිරමැදිරි, මහා සාගත සහ පූජක වරුන්ට, සාර්ලාට, ඉඩම්හිමියන්ට සහ ධනපතියන්ට දක්වන මහා දීනකම නිසා නොවේ.

අපි ජාතික අභිමානය පිළිබඳ හැඟීමෙන් ඔද වැඩී සිටින් නෙමු. එනිසාම අපි අපේ වහල් අතීතයට (හංගේරියාවේ, පෝලන්තයේ, පර්සියාවේ සහ චීනයේ නිදහස කුරුවල් කිරීම පිණිස වංශවතුන් විසින් ගොවිජනතාව යුද්ධයට මෙහෙයවුනු අතීතයට), විශේෂයෙන්ම වෛර කරන්නෙමු. ධනපතියන්ගේ ආධාරය ලබන එම ඉඩම් හිමියන්ම විසින්, පෝලන්තයේ සහ උක්‍රේනියාවේ බෙල්ල මිරිකීම පිණිස, පර්සියාවේ සහ චීනයේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාර මර්දනය කිරීම පිණිස සහ අපේ මහ රුසියානු ගෞරවය කෙළෙසන අපහාසයක් වන රොමානව්ලා, බොබ්‍රින්ස්කිලා සහ පුරිෂ්කේවිච්ලා කල්ලිය ශක්තිමත් කිරීම පිණිස, අප යුද්ධයට මෙහෙයවනු ලබන වර්තමානයට ද, අපි එසේම වෛර කරන්නෙමු. වහලෙකුව ඉපදීම ගැන කිසිවෙකුට දෙස් කිව නොහැකිය. නමුත්, නිදහස සඳහා දරන ප්‍රයත්නයක් බැහැර කරන වහලෙක් වේනම්, එපමණක් නොව, ස්වකීය වහල් භාවය සාධාරණ බව කියන සහ වර්ණනා කරන (නිදර්ශනයක් වශයෙන් පෝලන්තයේ සහ උක්‍රේනියාවේ ආදී දේශවල බෙල්ල මිරිකීම මහ රුසියන් වරුන්ගේ ''පීතෘ භූමිය ආරක්ෂා කිරීම'' යයි සඬ නගන) වහලෙක් වේනම්, ඔහු සාධාරණ කෝපාන්විත හැඟීමකට, පිළිකුලට සහ අප්‍රිය බවට හේතුවන නිවට කෙල තොල්ලෙකි, අශික්ෂිතයෙකි.

''වෙනත් ජාතීන් පීඩාවට පත් කරන කිසිම ජාතියකට නිදහස් විය නොහැකිය'' යි[55] දහනව වැනි ශත වර්ෂයේ ස්පීරසාර ප්‍රජාතන්ත්‍ර-

වාදයේ ශ්‍රේෂ්ඨතම නියෝජිතයන් වූ මාක්ස් සහ එංගල්ස් කීහ. අපිද ජාතික අභිමානයෙන් පිරුණු හැඟීමෙන් යුතුවෙමු. එහෙයින් මොනවා සිදු වුවත්, මහා රුසියානු කම්කරුවන් වන අපට, නිදහස් සහ ස්වාධීන, ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් වන ප්‍රෞඪ මහා රුසියාවක් අවශ්‍ය බව, ප්‍රකාශ කරන්නෙමු. අපට අවශ්‍ය අසල් වැසි රටවල් සමඟ ඇති කරගන්නා සම්බන්ධකම් මහා ජාතියකට නින්දවක් වන, වරප්‍රසාදය පිළිබඳ රදළ ප්‍රතිපත්තිය මත නොව, සමානාත්මතාවය පිළිබඳ මිනිස් ප්‍රතිපත්තිය මත සකස් කර ගන්නා මහ රුසියාවක්ය. අපට එය අවශ්‍ය නිසාම, අපි මෙසේ කියන්නෙමු: විසි වැනි ශත වර්ෂයේ දී, යුරෝපය තුළ (යුරෝපයේ ඈත පෙරදිග පවා) තමන්ගේ ම පීතෘ භූමියේ, රාජ ආණ්ඩුවට, ඉඩම් හිමියන්ට සහ ධනපතියන්ට විරුද්ධව, එනම්, අප රටේ ඉතාමත් ම නරක සතුරන්ට විරුද්ධව සටන් කිරීමට, සෑම විප්ලව-වාදී මාර්ගයක් ම උපයෝගි කර නොගෙන, ''පීතෘභූමිය ආරක්ෂා කිරීම'' කළ නොහැක්කකි. ඕනෑම යුද්ධයකින් සාර්වාදය පරාජය කිරීමට කැමති වීම හැර, වෙනත් මගකින්, මහ රුසියානුන්ට ''පීතෘභූ-මිය ආරක්ෂා කිරීමට'' නොහැකි බව අපි කියන්නෙමු. මහ රුසියා වාසීන්ගෙන් දහයෙන් නව පංගුවකටම අඩු ලන්සුවේ දූර්භාග්‍යය වන්නේ එයයි. එසේ කියන්නේ, ජනතාවගේ මෙම දහයෙන් නව පංගුව ආර්ථික හා දේශපාලන වශයෙන් පීඩාවට පත් කිරීමෙන් නොනැ-තින සාර්වාදය, වෙනත් ජාතීන් පීඩාවට පත් කිරීමටත්, එයින් වන ලජ්ජාව වසා ගැනීම පිණිස ව්‍යාජ සහ අර්ධ වශයෙන් දේශප්‍රේමී සටන් පාඨ කීමටත්, එම ජනතාව පුරුදු කිරීමෙන්, ඔවුන් දූර්මුඛ කරන, නින්දවට හා දූෂණයට පත් කරන හෙයිනි.

සාර්වාදයට අමතරව, එහි අනුග්‍රහය යටතේ තවත් ඓතිහාසික බලවේගයක්, එනම් මහ රුසියානු ධනපති ක්‍රමය මතුවී තිබෙන බවත්, එය විශාල ප්‍රදේශ ආර්ථික වශයෙන් මධ්‍යගත කරමින් හා ඒකාබද්ධ කරමින් ප්‍රගතිශීලී ලෙස වැඩ කරගෙන යන බවත්, කියා අපට විරුද්ධ අදහසක් මතුකිරීමට ඉඩ තිබේ. මෙම විරෝධය පෑම නිසා, අපගේ සමාජවාදී-ජාත්‍යොන්මාද වාදීන්ට සමාව ලැබෙන්නේ නැත. ඊට ප්‍රතිකූල වශයෙන්, එනිසාම, මොවුන් තවදුරටත් ‍ෙහළා දැකීමට ලක් වේ. මාක්ස් ලසාල්වාදීන්[56] හැඳින්වීමට රාජකීය-ප්‍රැසියන් සමා-ජවාදීන් යන නම යෙදූ පරිද්දෙන් මොවුන් හැඳින්විය යුත්තේ සාර්වාදී-පුරිෂ්කෙවිච් සමාජවාදීන් යනුවෙනි. මහ රුසියන් අධිපති ජාතියේ ධනපති ක්‍රමයට පක්ෂව සහ සියයකුත් එකක් කුඩා ජාතීන්ට විරුද්ධව, ඉතිහාසය තීරණය කරනු ඇතැයි යන්න වුවද, උපකල්පනයක් වශයෙන් පිළිගනිමු. ප්‍රාග්ධනයේ මුළු ඉතිහාසයම, හිංසනයෙන්, මංකොල්ලයෙන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ලෙසින් හා දූෂණයෙන් සැදුනු එකක් වන නිසා, මෙය සිදු විය හැක්කක් නොවේ. කුඩා ජාතීන් මොන ක්‍රමයකින් හෝ තබාගත යුතුයයි අපි නොකියමු. අන් තත්වයන් එක සමාන නම්, අපි නිශ්චිත වශයෙන් ම මධ්‍යගතකරණයට පක්ෂ වෙමු; පෙඩරල් සම්බන්ධකම් පිළිබඳ සුළු ධනපති අදහසට විරුද්ධ වන්නෙමු. ප්‍රථමයෙන් ම, අපේ උපකල්පනය සැබෑ වුවත් උක්‍රේනියාව ආදී ප්‍රදේශවල බෙල්ල මිරිකීමට රොමානව්-බොබ්‍රින්ස්කි-පූරිෂ්කේවිච්ලාට උදව් දීම, අපගේ, නැතහොත් (සමාජවාදීන්ගේ තබා), ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ හෝ කාර්යයක් නොවේ. බිස්මර්ක්, ඔහුටම විශේෂ වූ ජුන්කර් ශෛලියෙන්, ප්‍රගතිශීලී ඓතිහාසික කර්තව්‍යයන් ඉටු කළේය. නමුත්, එම කරුණ හේතුවක් වශයෙන් ගනිමින්, බිස්මර්ක්ට සමාජවාදී ආධාර දීම සාධාරණ යයි කල්පනා කරන අයෙක් වී නම්, ඇත්තෙන්ම ඔහු හැබෑම ''මාක්ස්වාදියෙකි''! එපමණක් නොව, අනිකුත් ජාතීන් විසින් පීඩාවට පත් කරනු ලැබූ, අසමගිව සිටි, ජර්මන් ජාතීන් එක්සත් කිරීම මගින් බිස්මර්ක් ආර්ථික සංවර්ධනයට ද රුකුල් දුන්නේ ය. එසේ වුවද, මහ රුසියාවේ ආර්ථික සමෘධිය සහ වේගවත් සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නේ, වෙනත් ජාතීන් මහ රුසියානු පීඩනයට ලක් කරන තත්වයෙන් රට මුදා ගැනීමට ය. සැබෑ රුසියානු රුකඩ බිස්මර්ක්ලා කෙරෙහි නෙත් සිත් රඳවා සිටින අපේ අය අමතක කරන්නේ මෙම වෙනසය.

දෙවැනිව, ඉතිහාසය, මහ රුසියානු අධිපති ජාතියේ ධනපති ක්‍රමයට පක්ෂව තීරණය කරයි නම්, එයින් බැස ගත යුතු නිරායාස නිගමනය වන්නේ, ධනපති ක්‍රමයෙන් ජනිත කරන ලද, කොමියුනිස්ට් විප්ලවයේ ප්‍රධාන ගාමක බලවේගය වන මහ රුසියානු නිර්ධන පංතියේ සමාජවාදී කාර්ය කොටස තවත් විශාල වන බවයි. නිර්ධන පංති විප්ලවය සඳහා, සම්පූර්ණ ජාතික සමානාත්මතාවය සහ සහෝදරත්වය පිළිබඳ ජීවගුණයෙන්, දීර්ඝ කාලයක් තිස්සේ කම්කරුවන් ශික්ෂණය කිරීම අවශ්‍ය වන්නේය. එනිසා, මහ රුසියානු නිර්ධන පංතියේ යහපත පිණිස කළ යුතු වන්නේ, මහ රුසියානුන් විසින් පීඩනයට පත් කරනු ලබන සියළුම ජාතීන්ගේ සම්පූර්ණ සමානාත්මතාවය සහ ස්වාධිපත්‍යය පිළිබඳ අයිතියට පක්ෂව සටන් කිරීමට, පොදු ජනතාව ක්‍රමානුකූල ලෙස ශික්ෂණය කිරීමයි. මහ රුසියානු ජාතික අභිමානයේ (වහල් අර්ථයෙන් වටහා නොගත්) අවශ්‍යතාවයන් මහ රුසියානු සහ අන් සියළුම නිර්ධන පංතිකයන්ගේ සමාජවාදී අවශ්‍යතාවයන් සමග සම්පාත වන්නේ ය. කවදත්, අප ආදර්ශයට ගන්නේ, මාක්ස්ය. ඔහු දශක ගණන් බ්‍රිතාන්‍යයේ ජීවත්ව සිට අර්ධ ඉංග්‍රිසි වැසියෙකුගේ තත්වයට පත්වුවත්, බ්‍රිතාන්‍ය කම්කරුවන්ගේ සමාජවාදී ව්‍යාපාරයේ යහපත පිණිස, අයිර්ලන්තයට නිදහස සහ ජාතික ස්වාධීනත්වය දෙන ලෙස ඉල්ලීය.

අප සැලකිල්ලට ගත් දෙවැනි කල්පිතය අනුව, අපේ දේශීය සමාජවාදී-ජාතෝන්මාදවාදීන් වන, ප්ලෙහානව් යනාදීන්, ඔවුන්ගේ රටට පමණක් නොව, නිදහස් හා ප්‍රජාතන්ත්‍රවාදී මහ රුසියාවකට පමණක් නොව, රුසියාවේ සියළුම ජාතීන්ගේ නිර්ධන පංති සහෝදරත්වයට, එනම්, සමාජවාදයේ සද් ව්‍යාපාරයට ද, ද්‍රෝහී වූ බව ඔප්පු වේ.

''සොට්සියාල් ඩිමොක්‍රාට්''
අංක 35, 1914 දෙසැම්බර් 12.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති,
වෙළුම 26, පිටු 106-110.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අධිරාජ්‍යවාදය සහ සමාජවාදයේ භේද වීම

අධිරාජ්‍යවාදය සහ යුරෝපයේ කම්කරු පංතික ව්‍යාපාරය අභිබවා අවස්ථාවාදය (සමාජ — ෂෝවිනිස්ට්වාදයේ ආකාරය අනුව) ලබාගත් දූවැන්ත සහ පිළිකුල දනවන ජයග්‍රහණය අතර සම් බන්ධකමක් තිබේද?

සමකාලීන සමාජවාදයේ මූලික ප්‍රශ්නය මෙයයි. පළමුව, අප යුගයේ අධිරාජ්‍යවාදී ස්වරූපය, සහ වත්මන් අවධියද, දෙවනුව සමාජ-ෂෝවිනිස්ට්වාදය සහ අවස්ථාවාදය අතර ඇති අඛණ්ඩ ඓතිහාසික සම්බන්ධතාවයද එමෙන්ම, ඒවායේ දේශපාලන දෘෂ්ටියේ ඇති නිසග සමානත්වයද අප පක්ෂයේ සාහිත්‍ය මගින් සම්පූර්ණයෙන්ම තහවුරු කළ පසුව, මේ මූලික ප්‍රශ්නය විශ්ලේෂණය කිරීම සඳහා අපට ඉදිරියට යා හැකිය, අප ඉදිරියට යා යුතුය.

අධිරාජ්‍යවාදය පිළිබඳව හැකි තරම් නියත සහ පූර්ණ අර්ථ නිග්‍රහයක් දෙමින් අප පටන් ගත යුතුය. අධිරාජ්‍යවාදය වූකලී ධනවාදයේ විශේෂ ඓතිහාසික අවධියකි. එහි විශේෂ ස්වරූපය තෙයාකාරය; අධිරාජ්‍ය-වාදය 1) ඒකාධිකාරී ධනවාදයයි; 2) පරපෝෂිත නැතිනම් දිරාපත්වන ධනවාදයයි; 3) මියයන ධනවාදයයි. ස්වාධීන තරඟය ඒකාධිකාරය ඇතිවීම අධිරාජ්‍යවාදයේ මූලික ආර්ථික ලක්ෂණය, හරය වන්නේය. ප්‍රධාන ආකාරයන් පහක් මගින් ඒකාධිකාරය ප්‍රකාශ වෙයි: 1) කාටල, සම්මේල සහ සංගතය — ධනපතීන්ගේ මේ ඒකාධිකාරී සමාගමයන් බිහිකරන තත්ත්වයකට නිෂ්පාදනය සංකේන්ද්‍රණය කිරීම පැමිණ ඇත; 2) විශාල බැංකුවල ඒකාධිකාරී තත්ත්වය — ඇමෙරිකාවේ, ප්‍රංශයේ සහ ජර්මනියේ මුළු මහත් ආර්ථිකයම යෝධමය බැංකු තුන හතරක් හෝ පහක් විසින් ක්‍රියා කරවයි; 3) සංගත සහ මූල්‍ය කතිපයා-ධිකාරය (මූල්‍ය ප්‍රාග්ධනය යනු ඒකාධිකාරී කර්මාන්ත ප්‍රාග්ධනය බැංකු ප්‍රාග්ධනය සමග එකට එක් වීමය) අමුද්‍රව්‍ය නිපදවන උල්පත්

අල්ලා ගැනීම; 4) ජාත්‍යන්තර කාටල විසින් ලෝකය (ආර්ථික වශ-යෙන්) බෙදා ගැනීම ආරම්භ වී ඇත. මෙවැනි ජාත්‍යන්තර කාටල සියයකටත් වඩා වැඩි ගණනක් තිබේ. මේවා මුළු මහත් ලෝක වෙළඳ පොළට අණ දෙන අතර, යුද්ධයක් විසින් යළි බෙදීමක් කරන තුරු, තමන් අතර සමාදානයෙන් ඒවා බෙදාගෙන තිබේ. ඒකාධිකාරී නොවන ධනවාදය යටතේ, භාණ්ඩ අපනයනයට වඩා වෙනස්වූ, ප්‍රාග්ධන අපන-යනය උසස් විශේෂ ලක්ෂණයකි, මෙය ලෝකයේ, ආර්ථික හා භෞමික දේශපාලනමය බෙදීම සමග කිට්ටු ලෙස වෙළී පවතී; 5) ලෝකයේ (යටත් විජිතවාදී) භෞමික බෙදීම සම්පූර්ණ වී ඇත.

අධිරාජ්‍යවාදය, ධනවාදයේ ඉහළම අවධිය ඇමෙරිකාවේ සහ යුරෝපයේත්, පසුකලෙක ආසියාවේත් 1898-1914 වකවානුවේදී අවසාන හැඩය ගත්තේය. ස්පාඤ්ඤ-ඇමෙරිකන් යුද්ධය (1898), ඉංග්‍රීසි-බොයර් යුද්ධය (1899-1902), රුසියන් ජපන් යුද්ධය (1904-1905) සහ 1900 යුරෝපයේ ආර්ථික පරිහානිය ලෝක ඉතිහාසයේ නව යුගයේ ප්‍රධාන ඓතිහාසික සිද්ධීන් වන්නේය.

අධිරාජ්‍යවාදය වූකලී පරපෝෂිතවාදී නැතිනම් දිරාපත්වන ධනවාදය බව ප්‍රකාශ වන්නේ, පළමුකොටම එහි දිරාපත්වීමේ ප්‍රවණතාවය නිසාය. මෙය නිෂ්පාදන මාධ්‍යයන් පුද්ගලයන් සතු ක්‍රමයක් යටතේ පවතින සෑම ඒකාධිකාරයකටම පොදුවූ ලක්ෂණයකි. ප්‍රජාතන්ත්‍රික-සමූහාණ්ඩුවාදියා සහ ප්‍රතිගාමී-රාජාණ්ඩුවාදී අධිරාජ්‍යවාදී ධනපතියා අතර ඇති වෙනස මැකී යන්නේ, දෙදෙනම පණ පිටින් කුණු වී යන බැවිනි. (මෙය කොහෙත්ම කර්මාන්ත ක්ෂේත්‍රයේ එක්, එක් අංශවලද, එක්, එක් රටවලද, එක්, එක් අවධිවලද ධනපතිවාදයේ විශේෂ සීඝ්‍ර වර්ධනයක් අවලංගු නොකරයි). දෙවැනිව, ''කූපන් කැපීමෙන් ජීවත්-වන ධනපතීන්ගේ'', පොලී කන්නන්ගෙන් යුත් විශාල ස්ථරයක් බිහිවීම තුළින් ධනපති ක්‍රමයේ දිරාපත් වීම ප්‍රකාශ වෙයි. ප්‍රධාන අධිරා-ජ්‍යවාදී රටවල් සතර වන එංගලන්තය, ඇමෙරිකා එක්සත් ජනපදය, ප්‍රංශය සහ ජර්මනිය යන මේ රටවලින් සෑම එකකම සුරැකුම් පත් වලට අයත් ප්‍රාග්ධනය ප්‍රෑන්ක් කෝටි 10,000 සිට 15,000 බැගින් වේ. මෙයින් මේ එක් එක් රටක් අවුරුදු පතා ලබා ගන්නා ආදායම කෝටි 50 සිට කෝටි 80 කට අඩු නොවේ. තෙවනුව, ප්‍රාග්ධන අපන-යනය උච්ච අවස්ථාවකට නැංවූ පරපෝෂිතවාදය වන්නේය. සතරවැ-නිව මූල්‍ය ප්‍රාග්ධනය ආධිපත්‍යය සඳහා මිස නිදහස සඳහා ක්‍රියා නොකරයි. මුළ සිට අග දක්වා දේශපාලන ප්‍රතිගාමිත්වය අධිරාජ්‍යවා-දයට ආවේණික වූ විශේෂ ලක්ෂණයකි. මහා පරිමාණයක් මත දූෂණය හා අල්ලස් දීම සහ වංචනික කියාවන් කිරීම (නේකාකාරේ පැනමා[57]).

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පස්වෙනුව, පැගී සිටින ජාතීන් සූරා කෑම — මෙය ඇඳා ගැනීම් සමග අඛණ්ඩ ලෙස වෙළී ඇත — ''මහා'' බලවතුන් අතලොස්සක් විසින් විශේෂයෙන් යටත් විජිත සූරාකෑමද විසින් කෝටි සංඛ්‍යාත අසභ්‍ය ජාතීන්ගේ දේහය මත වසන පරපෝෂිතයකුගේ තත්වයට ''සභ්‍ය'' ලෝකය වැඩි වැඩියෙන් පරිවර්තනය කෙරේ. රෝම නිර්ධන පංතිය සමාජයේ වියදමින් ජීවත් විය. සමකාලීන සමාජය, සමකාලීන නිර්ධන පංතියේ වියදමින් ජීවත් වෙයි. සිස්මොන්ඩිගේ මේ ගැඹුරු නිරීක්ෂණය මාක්ස් විශේෂයෙන්ම අවධාරණය කළේය. අධිරාජ්‍යවාදය විසින් තත්ත්වය තරමක් වෙනස් කැරිණි. අධිරාජ්‍යවාදී රටවල වරප්‍රසාද ලැබූ නිර්ධන පංතික ඉහළ ස්තරයක් අසභ්‍ය රටවල කෝටි සංඛ්‍යාත ජනතාවගේ වියදමින් ජීවත් වේ.

අධිරාජ්‍යවාදය මියයන ධනවාදය බවත්, සමාජවාදය කරා පරිවර්තනය වන ධනවාදය බවත්, පැහැදිලිය. ධනවාදයෙන් වැඩෙන ඒකාධිකාරය දැනටමත් මියයන ධනවාදය වී ඇත. එය සමාජවාදය දක්වා පරිවර්තනය වීමේ ආරම්භය වන්නේය. අධිරාජ්‍යවාදය විසින් ශ්‍රමය ඉමහත් ලෙස සමාජකරණය කිරීම (ධනවාදී ආර්ථික විද්‍යාඥයෝ — එහි නිදහසට කරුණු කියන්නේ මෙය අන්තර් බද්ධය ලෙස හඳුන්වති) නිසා එම ප්‍රතිඵලයම ලබා දෙයි.

අධිරාජ්‍යවාදය පිළිබඳව මේ අර්ථ නිරූපණය ඉදිරියට ගෙන යන විට, කාල් කෞට්ස්කි සමග සම්පූර්ණ ප්‍රතිපක්ෂ බවකට අපි පිවිසෙන්නෙමු. අධිරාජ්‍යවාදය ධනවාදයේ අවධියක් ලෙස පිළිගැනීමට ප්‍රතික්ෂේප කරන කෞට්ස්කි, එය මූල්‍ය ප්‍රාග්ධනයේ ''වරණ'' ප්‍රතිපත්තියක් ලෙසද, කාර්මික රටවල් විසින් ''කෘෂක'' රටවල් ඇඳා ගැනීමේ ප්‍රවණතාවයක් ලෙසද විග්‍රහ කරයි*. න්‍යායික ස්ථාවරය අනුව, කෞට්ස්කිගේ අර්ථ විග්‍රහය සම්පූර්ණයෙන්ම ව්‍යාජය. අධිරාජ්‍යවාදය වෙන්කොට පෙන්වන රීතිය, කර්මාන්ත ප්‍රාග්ධනය නොව මූල්‍ය ප්‍රාග්ධනයයි, විශේෂයෙන් කෘෂක රටවල් ඇඳා ගැනීම නොව, එහෙත් සෑම රටක්ම ඇඳා ගැනීමේ අභිලාෂයයි. කෞට්ස්කි අධිරාජ්‍යවාදී දේශපාලනය අධිරාජ්‍යවාදී ආර්ථිකයෙන් වෙන් කරයි. සිය ග්‍රාම්‍ය ධනවාදී ප්‍රතිසංස්කරණවාදී ''නිරායුධකරණය'', ''අති — අධිරාජ්‍යවාදය'' සහ එවැනි

* අධිරාජ්‍යවාදය උසස් ලෙස වර්ධනය වූ කර්මාන්ත මය ධනවාදයේ නිෂ්පාදනයකි. සෑම කර්මාන්තමය ධනවාදී රටක්ම, වඩාත් විශාල කෘෂක රටවල්, ඒවායේ වාසය කරන ජාතීන් ගැන නොසලකා යටපත් කර ගැනීමේ සහ ඇඳා ගැනීමේ අභිලාෂයක්, අධිරාජ්‍යවාදය සතුය. (කෞට්ස්කි, "Die Neue Zeit" 1914 සැප්තැම්බර් 11 ද).

විකාර මතවලට ඉඩකඩ ලබාගනු වස් ඔහු දේශපාලනයේදී ඒකාධිකාරය, ආර්ථිකයේදී ඒකාධිකාරයෙන් වෙන්කර පෙන්වයි. මෙම න්‍යායික ව්‍යාජයේ මුළු අරමුණ සහ අර්ථය අධිරාජ්‍යවාදයේ ඉතා ගැඹුරු ප්‍රතිවිරෝධතාවයන් ඇඳිරි කොට, ඒ අනුව අධිරාජ්‍යවාදයට ආවඩන්නන්ගේද උග්‍ර සමාජ ෂෝවිනිස්ට්වාදීන්ගේ සහ අවස්ථාවාදීන්ගේද ''සමගිය'' පතන න්‍යායය සාධාරණ යැයි පෙන්වා දීමය.

''සොට්සියාල්-ඩිමොක්‍රාට්'' සහ ''කොමියුනිස්ට්''[58] පුවත්පත් මගින් මාක්ස්වාදයෙන් කෞට්ස්කිගේ වෙන්වීම පිළිබඳව අපි සෑහෙන දුරට විස්තර කර ඇත්තෙමු. අපේ රුසියානු කෞට්ස්කිවාදීන් වන ඇක්සල්රොඩ් සහ ස්පෙක්ටේටර්ගේද, මාර්තව්ගේද පවා, නායකත්වයෙන් යුත් සංවිධායක කමිටුවේ (සං. ක.) ආධාරකරුවෝද[59], සෑහෙන දුරකට ට්‍රොට්ස්කිද ප්‍රවණතාවයක් හැටියට කෞට්ස්කිවාදය ගැන නිහඬව සිටීමට කැමැත්තක් දක්වති. කෞට්ස්කිගේ යුද්ධ කාලීන ලියවිලිවලට පක්ෂපාත වීමට ඔවුහු කොහෙත්ම ඉදිරිපත් නොවූහ. ඔවුහු එක්කෝ කෞට්ස්කිට ප්‍රසංශා කිරීමට (ඇක්සල්රොඩ් ජර්මන් බසින් ලියන ලද පොත් පිංචෙන් මෙනි. මෙය රුසියන් බසින් පළ කිරීමට සං. ක: පොරොන්දු වී ඇත.) නැතිනම් කෞට්ස්කිගේ පෞද්ගලික ලියුම් උපුටා දැක්වීමට (ස්පෙක්ටේටර්) සීමා වෙති. මේ ලියුම් වලින් ඔහු තමා විරුද්ධ පක්ෂයට අයත් බව කියන අතර ෂෝවිනිස්ට්වාදී ප්‍රකාශනයන් ප්‍රතික්ෂේප කිරීම සඳහා ජේසුගැති පූජකයකු මෙන් වැර දරයි.

අධිරාජ්‍යවාදය පිළිබඳව කෞට්ස්කිගේ සංකල්පය, අධිරාජ්‍යවාදය අලංකාර කිරීමට ඉවහල් වන අතර එය හිල්පර්ඩින්ග්ගේ මූල්‍ය ප්‍රාග්ධනය (දැන් හිල්පර්ඩින්ග් කෙතරම් අනලස් ලෙස කෞට්ස්කි ආරක්ෂා කිරීම සහ සමාජ — ෂෝවිනිස්ට්වරුන් සමග 'සමගියක්' පැතුවද) සමග පමණක් නොව, සමාජ — ලිබරල්වාදී ජේ. ඒ. හොබ්සන් සමග සන්සන්දනය කරන විට පවා පිරිහීමක් පෙන්වයි. මාක්ස්වාදියකු හැටියට කොහෙත්ම පෙනී නොසිටින, ඉංග්‍රීසි ජාතික මේ අර්ථ විද්‍යාඥයා, 1902 දී ලියන ලද පොතක්* මගින් අධිරාජ්‍යවාදයේ ප්‍රතිවිරුද්ධතාවයන් හෙළි කොට, එය ගැඹුරු ලෙස විග්‍රහ කරයි. අධිරාජ්‍යවාදයේ ඉතා වැදගත් ප්‍රශ්නයක් වන එහි පරපෝෂිතභාවය ගැන හොබ්සන් (මේ පොතේ කෞට්ස්කිගේ ශාන්තිවාදී සහ සමාදනකාමී ග්‍රාම්‍ය අදහස් හැම දෙයක්ම දක්නට තිබේ) මෙසේ ලියයි.

හොබ්සන්ගේ මතය අනුව, පැරණි අධිරාජ්‍යවල බලය හීනවීමට

J. A. Hobson. "Imperialism",London, 1902.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

හේතුවූ අවස්ථා දෙකක් මෙසේය: 1) ''ආර්ථික පරපෝෂිතවාදය'' සහ 2) පරාධීන ජනතාවගෙන් යුත් යුද්ධ හමුදා සෑදීමය.'' ''පළමුවෙන්ම ආර්ථික පරපෝෂිතවාදය නැමැති මේ පුරුද්ද හේතු කොටැ ගෙන පාලනය සතු රජය එහි පළාත්, යටත් විජිත සහ යටත් රටවල්, ආණ්ඩු කරන පංතිය පොහොසත් කරවීම සඳහාත්, පහළ පංති නලවනු වස් ආණ්ඩු කරන පංතිය පොහොසත් කරවීම සඳහාත්, පහළ පංති නලවනු වස් ඔවුනට අල්ලස් දීම සඳහාත්'', යොදවනු ලැබේ.හොබ්සන් මෙසේ ලියයි:

''අධිරාජ්‍යවාදී අන්ධතාවයේ පුදුමාකාර එක් රෝග ලක්ෂණයක් නම්, (අධිරාජ්‍යවාදීන්ගේ අන්ධතාවය පිළිබඳ මෙම ගීතය, මාක්ස්වාදී කෞට්ස්කි ගයනවාට වඩා, සමාජ — ලිබරල්වාදී හොබ්සන්ගේ කටින් පිටවීම උචිතය) මේ විනාශකාරී පරාධීනත්වය කෙරෙහි මහා බ්‍රිතාන්‍ය ප්‍රංශය හා අනෙකුත් අධිරාජ්‍යවාදී ජාතීන් දක්වන සහාසික උදාසීනත්වයයි, මහා බ්‍රිතාන්‍ය අන්තයටම ගොස් ඇත. අපේ ඉන්දීය අධිරාජ්‍යය ගොඩ නැගීම සඳහා කළ සටන් වලින් ඉතා වැඩි කොටස අප සඳහා කරන ලද්දේ ඉන්දියානු ජාතිකයින්ම විසිනි. වඩාත් මෑතකදී ඊජිප්තුවේ තත්වයද එසේම විය. විශාල ස්ථාවර යුද්ධ හමුදා බ්‍රිතාන්‍ය සෙන්පතීන්ගේ නායකත්වය යටතේ තබා ඇත. අප්‍රිකාවේ දකුණු කොටස හැරුණු විට, අපේ අප්‍රිකානු යටත් රටවල් සඳහා කළ සියලු සටන් පැහේ කරන ලද්දේ අප්‍රිකාවේම වැසියන් විසිනි''.

චීනය බෙදා වෙන් කර ගැනීමේ අපේක්ෂාව නිසා හොබ්සන් මෙවැනි ආර්ථික නිමානයක් ඉදිරිපත් කළේය:

''දක්ෂිණ එංගලන්තයේ රිවිපේරාහිද, ඉතාලියේ හා ස්විට්සර්ලන්තයේ සංචාරකයින් හා ප්‍රාදේශීය පොහොසතුන් බහුලව පැමිණෙන ප්‍රදේශවල තිබෙන පෙනුම හා ස්වරූපය එවිට බටහිර යුරෝපයේ බහුතර කොටසට දරීමට හැකිවෙයි. එනම් වෘත්තීය ශිල්පීන්ගෙන් හා වෙළෙන්දන්ගෙන් සමන්විත තරමක කණ්ඩායමක්ද, පෞද්ගලික ප්‍රවාහණ සේවකයින්ගේ සහ අඩක් සාදා නිම කළ භාණ්ඩ සම්පූර්ණයෙන්ම සෑදීමේ නියුක්ත වූවන්ගේ වඩාත් විශාල කණ්ඩායමක්ද සහිතව, ඈත පෙරදිග රටවලින් ලාභාංශ හා විශ්‍රාම වැටුප් ලබා ගන්නා ධනවත් කුලීනයින්ගේ කුඩා කණ්ඩායම් ඇති වීමය. එවිට කර්මාන්තයේ ප්‍රධාන අංශ සියල්ලක්ම අහෝසි වී යනු ඇත. ආසියාවෙන් සහ අප්‍රිකාවෙන් කප්පම් ලෙස ආහාර ද්‍රව්‍ය විශාල වශයෙන්ද, අඩක් සාදා නිම කළ භාණ්ඩ විශාල වශයෙන්ද ගලා එනු ඇත... ''බටහිර රජයන්ගේ වඩාත් පුළුල් හවුලක්, මහා බලවතුන්ගේ යුරෝපීය සමූළුවක් ඇති වීමේ හැකියාවක් අප ඉදිරියේ මතුවේ. එය ජගත් සභ්‍යත්වය ඉදිරියට නොගෙනියනවා පමණක් නොව, බටහිර පරපෝෂිතභාවයේ යෝධමය අනතුරක් බිහි කිරීමක්ද වන්නේය.ආසියාවෙන් හා අප්‍රිකාවෙන් අති විශාල කප්පම් ලබන උසස් පංතීන්, කෘෂිකාර්මික හා නිෂ්පාදන කර්මාන්තවල යෙදෙනවා වෙනුවට, අභිනව මූල්‍ය වංශක්කාරයින්ගේ නායකත්වය යටතේ පෞද්ගලික සේවාවල සහ අප්‍රධාන කර්මාන්තමය

වැඩවල යෙදෙන යටත් කීකරු අතවැසියන්ගේ විශාල ජනකායක් නඩත්තු කරන දියුණු කර්මාන්තමය ජාතීන්ගේ කණ්ඩායමක් කැපී පෙනෙනු ඇත. එබඳු න්‍යායයක් ප්‍රතික්ෂේප කරන (එය පර්යායලෝකයක් ලෙස ඔහු විසින් නම් කළ යුතුය), එය සලකා බැලීමට තරම් නොවටිතියි කියන වුන් දැනටමත් එවැනි තත්ත්වයකට පත්ව තිබෙන, සමකාලීන දකුණු එංගලන්තයේ ඇතැම් පෙදෙස්වල පවතින ආර්ථික හා සමාජමය තත්ත්වය ගැන සලකා බැලීම වටී. යුරෝපයේදී පරිභෝජනය පිණිස ගැනීම සඳහා ලෝකයේ මෙතෙක් ඇති විශාලතම අනාගත නිධානයෙන් ලාභ සූරාගන්නා එබඳුම මූල්‍ය හිමියන් ''ප්‍රාග්ධන ආයෝජකයින්'' යන ඔවුන්ගේ දේශපාලනමය, වාණිජමය හා කාර්මික සේවකයින් කණ්ඩායම්වල ආර්ථික පාලනයට චීනය අවනත කිරීමෙන්, යටකී ක්‍රමය කෙතරම් විශාල ලෙස පුළුල් කරලිය හැකිද යන්න කල්පනා කිරීමට වටනේය. මෙම අර්ථ නිරූපණය හෝ වෙනත් කිසියම් තනි අර්ථ නිරූපණයක් ගැළපෙතියි අනුමානය කිරීමට තරම් තත්ත්වය සංකීර්ණත්වයෙන් වැඩිය. ලෝක බලවේගයන්ගේ ක්‍රියා කාරිත්වයට ගණනය කළ නොහැකි තරම්ය. අමාරුකම්ද එහෙත් බටහිර යුරෝපීය අධිරාජ්‍යවාදය මෙහෙයවනු ලබන බලපෑම්ද මේ මොහොතේදී ගමන් කරන්නේ එම දිසාවටය. ඒවාට විරුද්ධව ප්‍රතික්‍රියා නොයෙදුවහොත්, ඒවා අන් මගකට යොමු නොකළහොත්, ක්‍රියාදාමයේ එබඳු සම්පිණ්ඩනයක් කරා ඒවා ගමන් කරනු ඇත''.

මෙම ''ප්‍රතික්‍රියාව'' ඉදිරිපත් කළ හැක්කේ විප්ලවවාදී නිර්ධන පංතියට පමණක් බවත්, සමාජමය විප්ලවයේ ආකාරයකින් පමණක් බවත්, සමාජ — ලිබරල්වාදී හොබ්සන් දැකීමට අපොහොසත් වෙයි. එහෙත් ඔහු සමාජ — ලිබරල්වාදියෙකි! එසේ වුවද, 1802 දී ''යුරෝපීය එක්සත් ජනපද'' නැමැති උද්යෝග පාඨයේ තේරුම හා වැදගත්කම පිළිබඳව අනගිතම ප්‍රත්‍යක්ෂ බුද්ධියකින් හෙබියේය (මෙය කෞට්ස්කිවාදී ට්‍රොට්ස්කිගේ දැනගැනීම පිණිසය)! දැන් මේවා සියල්ල විවිධ රටවල සිටින කුහක කෞට්ස්කිවාදීන් විසින්, අමතක කර දමා ඇත! එනම්, අවස්ථාවාදීහු (සමාජ — ෂෝවිනිස්ට්වරු) ආසියාවේ සහ අප්‍රිකාවේ හිස මත අධිරාජ්‍යවාදී යුරෝපයක් ගොඩ නැගීමසඳහා නියත ලෙසම අධිරාජ්‍යවාදී ධනපති පංතිය සමග එක්වී ක්‍රියා කරති. යථාර්තය වශයෙන් අවස්ථාවාදීන් වූකලී සුළු ධනපති පංතියේ කොටසක් සහ අධිරාජ්‍යවාදීන්ගේ අධිලාභයෙන් අල්ලස් දෙනු ලබන සහ අධිරාජ්‍යවාදයේ මුර බල්ලන් හැටියට පරිවර්තනය කරන ලද හා කම්කරු පංතික ව්‍යාපාරයේ දූෂකයන්වූ කම්කරු පංතියේ එක්තරා ස්තරයකි.

අප පක්ෂයේ ලිපි හා යෝජනා මගින් අපි යළි, යළිත් මේ ඉතා ගැඹුරු සම්බන්ධකම, අධිරාජ්‍යවාදී ධනපති පංතිය සහ කම්කරු පංති ව්‍යාපාරයේ ජය ගෙන සිටින (කෙතරම් දිගු කලකටද?) අවස්ථා-

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

වාදය අතර ඇති ආර්ථික සම්බන්ධකම් පෙන්වා දී ඇත්තෙමු. මින් අනියම් වශයෙන්, සමාජ ෂෝවිනිස්ට්වරුන් අතර භේදයක් ඇති වීම නොවැළැක් විය හැකිය යන නිගමනයට අපි පැමිණියෙමු. අපේ කෞට්ස්කිවාදියෝ එම ප්‍රශ්නය මග හැරීමෙහි රිසි වෙති. මාර්තව් ඔහුගේ දේශනවලදී විතණ්ඩවාදී ලෙස කළ ප්‍රකාශනය "සංවිධායක කමිටුවේ විදේශගත ලේකම් මණ්ඩලයේ ඉස්වේස්තියා"[60] (1916 අප්‍රේල් 10 දූ අංක 4) හි මෙසේ සඳහන් වේ:

".. බුද්ධිමය වර්ධනය අතින්, "බුද්ධිමත් පංතියට" ඉතා කිට්ටුවෙන් සිටින්නාවූ සහ ඉතා උසස් ලෙස පුහුණුවක් ලැබ සිටින කම්කරුවන්ගේ කණ්ඩායම්, විප්ලවීය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයෙන් මාරක ලෙස ඈත් වී, අවස්ථාවාදය දෙසට යන්නේ නම්, විප්ලවීය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ කාර්යය සංවේගදයක, ඇත්ත වශයෙන්ම බලාපොරොත්තු රහිත තත්වයකට ඇද වැටෙනු ඇත..."

කම්කරුවන්ගේ සමහර කණ්ඩායම් දූනටමත් අවස්ථාවාදය වෙතට සහ අධිරාජ්‍යවාදී ධනපති පංතිය වෙතට පාවී යාමේ සත්‍යය "මාරක ලෙස" වැනි මුග්ධ වචනවලින් හා සමහර හස්කමය ඉන්ද්‍ර ජාලම් වලින් ඈත් කර දමා ඇත. සංවිධායක කමිටුවේ විතණ්ඩවාදීන්ට ඈත් කර දැමීමට වුවමනා වී ඇත්තේද මෙම සත්‍යමය! කෞට්ස්කි, හිල්පර්ඩින්ග් සහ තවත් බොහෝ දෙනෙකුන් අහංකාර ලෙස විදහාපාන 'නිලමය සර්ව ශුභවාදයට' ඔවුහු සීමාවෙති: වාස්තවික තත්ත්වයන් විසින් නිර්ධන පංතියේ සමගිය සහ විප්ලවවාදී ප්‍රවණතාවයේ ජයග්‍රහණය සහතික කෙරේ. නිර්ධන පංතිය සම්බන්ධයෙන් නම්, අපිදූ නිසැකවම, "සර්ව ශුභවාදීන්" වමු.

එහෙත් ඇත්ත වශයෙන්ම, අවස්ථාවාදය අනුව නම්, මේ සියලු කෞට්ස්කිවාදීහු, හිල්පර්ඩින්ග්, සංවිධායක කමිටුවේ ආධාර කරුවෝ, මාර්තව් සහ සමාගම සර්ව ශුභවාදීහූ වෙති. හරය එසේය!

නිර්ධන පංතිය ධනවාදයේත්, යුරෝපීය ධනවාදයේ පමණක් නොව, ලෝක ධනවාදයේත්, නැතිනම් අධිරාජ්‍යවාදී ධනවාදයේත් දරුවාය. ජගත් පරිමාණයක් අනුව, අවුරුදූ පණහක් කලින් හෝ අවුරුදූ පණහක් පමා වී හෝ — ජගත් පරිමාණයක් අනුව බලන විට මෙය සුළු දෙයකි — සත්තකින්ම "නිර්ධන පංතිය" එක්සත් "වනු ඇත", ඒ තුළ විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය අනිවාර්ය ලෙස ජයගනු ඇත. එහෙත් ප්‍රධාන කරුණ මෙය නොවේ; කෞට්ස්කිවාදී මහත්වරුනි! යුරෝපයේ අධිරාජ්‍යවාදී රටවල අවස්ථාවාදීන් ඉදිරියේ නුඹලා නිවටයින් සේ යටත් වීමය, ප්‍රධාන කරුණ. අවස්ථාවාදීන් පංතියක් ලෙස නිර්ධන පංතියට පිටස්තරය. අවස්ථාවාදීහු ධනපති පංතියේ මෙහෙකරුවන්,

ඒජන්තවරුන් සහ එහි බලපෑමේ වාහකයින් වෙති. කම්කරු පංතික ව්‍යාපාරයෙන් අවස්ථාවාදීන් පන්න නොදමන තුරු, එය ධනවාදී කම්කරු පංතික ව්‍යාපාරයක් ලෙස ඉතිරි වේ. අවස්ථාවාදීන් සමග, ලෙගින්ලා, දවීද්ලා, ප්ලෙහානව්ලා, චහෙන්කෙලිලා සහ පොත්රෙසොව්ලා ආදීන් සමගත් "එක්සත් කමක්" දේශනා කිරීමෙන් නුඹලා, කම්කරු පංතික ව්‍යාපාරයේ ඉතා හොඳ ඒජන්තවරුන්ගේ ආධාරය ඇතිව, අධිරාජ්‍යවාදී ධනපති පංතිය විසින් කම්කරුවන් වහල් භාවය ගැනීම වාස්තවික වශයෙන් ආරක්ෂා කරති. ජගත් පරිමාණයක් අනුව, විප්ලවීය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ ජයග්‍රහණය නිරපේක්ෂ වශයෙන්ම අනිවාර්යය. නුඹලාට විරුද්ධව එය ඉදිරියට යමින් සිටී, ඉදිරියට යනු ඇත, වර්ධනය වෙමින් සිටී, වර්ධනය වනු ඇත. එය නුඹලා අභිබවා ලබන ජයක් වන්නේය.

මුළු මහත් ලෝකයේම, 1914-1916 අවුරුදූ වලදී වත්මන් කම්කරු පංතික ව්‍යාපාරය තුළ පැන නැගුණු මෙම ප්‍රවණතා දෙක, නැතිනම් පක්ෂ දෙක, දළ වශයෙන් 1858-1892 දසකවලදී මාක්ස් හා එංගල්ස් විසින් එංගලන්තයේදී සොයා ගන්නා ලදී.

1898-1900 පසුව පැන නැගුණු ලෝක ධනපති ක්‍රමයේ අධිරාජ්‍යවාදී අවධිය දැකීමට මාක්ස් හෝ එංගල්ස් හෝ ජීවත් නොවීය. එහෙත් මෙය එංගලන්තයට විශේෂ ලක්ෂණයක් වූ අතර දහ නව වැනි සිය වසරේ මැද භාගයේදී පවා අධිරාජ්‍යවාදයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් එරටට අයත් බව හෙළි විය: 1) අති විශාල සංඛ්‍යාවක් යටත් විජිත සහ 2) ඒකාධිකාරී ලාභ (ලෝක වෙළඳ පොළේ එංගලන්තය සතු ඒකාධිකාරී තත්ත්වය නිසාය). මේ කරුණු දෙක අනුව ඒ කාලයේදී පවා ධනපති රටවල් අතර එංගලන්තය විශේෂයක් විය. එංගල්ස් සහ මාක්ස් මේ විශේෂිතය විශ්ලේෂණයට භාජනය කොට, එය ඉංග්‍රීසි කම්කරු පංතික ව්‍යාපාරයේ අවස්ථාවාදයේ (තාවකාලික) ජයග්‍රහණය සමග සම්බන්ධ බව ඉතා පැහැදිලි ලෙසත්, නියත ලෙසත් පෙන්වා දුන්හ.

1858 ඔක්තෝබර් 7 දූ එංගල්ස් විසින් මාක්ස් වෙත යවන ලද ලිපියෙක මෙසේ සටහන් වේ: "... ඉංග්‍රීසි නිර්ධන පංතිය සැබවින්ම වඩ වඩාත් ධනවාදී වෙමින් පවතී, සියලු ජාතීන් අතුරෙන් අතිශයින්ම ධනවාදී ජාතිය සිය අවසාන අරමුණ හැටියට ධනපති පංතිය ළඟින්ම ධනපති වංශක්කාර පෙළන්තියක් සහ ධනපති නිර්ධන පංතියක් තබා ගැනීමට ක්‍රියා කරන සැටියක් පෙනේ. මුළු මහත් ලෝකයම සූරාකන ජාතියකට, මෙය එක්තරා දුරකට සාධාරණ යැයි කිව හැකිය". 1872 සැප්තැම්බර් 21 දූ සොර්ගේට ලියූමක් ලියන එංගල්ස්, හේල්ස් (Hales)

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ජාත්‍යන්තරයේ පෙඩරල් මණ්ඩලයේදී මහා කාල ගෝට්ටියක් ඇති කරමින්, ''ඉංග්‍රීසි කම්කරු නායකයින් තමන්වම විකුණා දමා ඇතැ'' යි කාල් මාක්ස් කී නිසා ඔහුට විරුද්ධව දෙස් පැවරීමේ යෝජනාවක් සම්මත කරගත් බව දන්වයි. 1874 අගෝස්තු 4 ද මාක්ස් සොර්ගේට මෙසේ ලියුවේය: ''මෙහි නගරබද (එංගලන්තයේ) කම්කරුවන් ගැන කිව හැක්කේ, ඔවුන්ගේ නායකයින් රොත්ත පිටින්ම පාර්ලිමේන්තුවට තෝරා පත් නොවීම කණගාටුවට කරුණක් බවය. ඔවුන්ගෙන් මිදීමේ ඉතා ස්ථිර ක්‍රමය මෙය වන්නේය. 1881 අගෝස්තු 11 ද මාක්ස්ට ලියුමක් ලියන එංගල්ස්, ''ධනපති පංතියට තමන් විකුණා ඇති, යටත් පිරිසෙයින් ඔවුන්ගෙන් වැටුප් ලබන මිනිසුන්ගේ නායකත්වයේ යටතේ ඇති, ඒ ඉතා නරක ඉංග්‍රීසි වෘත්තීය සමිති'' ගැන පවසයි. 1882 සැප්තැම්බර් 12 ද එංගල්ස් කෞට්ස්කිට මෙසේ ලියුවේය: ''යටත් විජිත ප්‍රශ්නය ගැන ඉංග්‍රීසි කම්කරුවන් කුමක් සිතතිදැයි ඔබ මගෙන් ප්‍රශ්න කරන්නෙහිද. හොඳයි, ඔවුන් සාමාන්‍යයෙන් දේශපාලනය ගැන හිතන විදහට තමා, ඒ ගැනත් හිතන්නේ. මෙහි කම්කරුවන්ගේ පක්ෂයක් නැත. මෙහි ඇත්තේ කොන්සර්වේටිව් හා ලිබරල්-රැඩිකල් පක්ෂ දෙකක් පමණකි. ලෝක වෙළෙඳ පොළේ සහ යටත් විජිතවල එංගලන්තයේ ඒකාධිකාරිත්වයෙන් ලබන සංග්‍රහය කම්කරුවෝද ඔවුන් සමග එකතු වී භුක්ති විඳිති''.

1889 දෙසැම්බර් 7 ද එංගල්ස් සොර්ගේට මෙසේ ලියුවේය: ''මෙහි (එංගලන්තයේ) ඇති ඉතා පිළිකුල් උපදවන දෙය නම් ධනවාදී ''නම්බුකාරකමය'' (respectability)... කම්කරුවන්ගේ ඇට මිදුලුවලට පවා මෙය කා වැදී ඇත. මේ කට්ටියෙන් ඉතාම හොඳ පුද්ගලයා හැටියට මා ගණන් ගන්නා, ටොම් මෑන් පවා තමා පුරපති සාමිවරයා සමග දවල් ආහාරය ගන්නා බව නිතර මතක් කිරීමට කැමැත්තක් දක්වයි. මොවුන් ප්‍රංශ ජාතිකයින් සමග සංසන්දනය කරන විට, විප්ලවයක ඇති වැදගත්කම පෙනී යයි''. 1890 අප්‍රේල් 19 ද ලියුමකින් මෙසේ කියැවෙයි: ''ව්‍යාපාරය (එංගලන්තයේ කම්කරු පංතික ව්‍යාපාරය) ඉදිරියට යන්නේ මතු පිටට යටිනි. මෙතෙක් එක තැන පල්වුණු පහළතම (යටි ඉරිගැසීම එංගල්ස්ගේය) ස්තරයට අයත් කොටස් සහ වඩාත් පුළුල් කොටස් එය වැළඳ ගනී. මේ පොදු ජනකාය තමන් හඳුනා ගැනීමේ දිනය වැඩි ඈත නොවන්නේ, මේ යෝධමය ජංගමශීලී පොදු ජනකාය තමාම බවට, එය පැහැදිලි කර ගත් දවය'' 1891 මාර්තු 4ද ඔහු මෙසේ ලීවේය:''බිඳ වැටුනු ඩොක් කම්කරු සමිතියේ අවාසනාවද; ''පැරණි'' කොන්සර්වේටිව්වාදී වෘත්තීය සමිති පොහොසත්ය, එනිසා බියසුලු වන අතර ක්ෂේත්‍රයේ තනිවම රැඳී සිටී...'' 1891 සැප්තැ-

ම්බර් 14 ද නිව් කාස්ල් වෘත්තීය සමිති සමුළුවේදී, පැරණි යූනියන්වාදියෝ, පැය අටේ වැඩ දවසට විරුද්ධ වූවෝ පරාජය වූහ. ''ධනපති ලේබර් පක්ෂයේ පරාජය ධනපති පුවත්පත් පිළිගනිති'' (හැමතැනම යටි ඉරි ගැසීම් එංගල්ස්ගේය)...

දසක කීපයක් තිස්සේ එංගල්ස් විසින් යළි යළිත් කියන ලද මෙම අදහස්, ඔහු විසින් ප්‍රසිද්ධියේද පුවත්පත් මගින්ද ප්‍රකාශ කැරිණි. 'එංගලන්තයේ කම්කරු පංතියේ තත්වය' නැමැති පොතේ දෙවැනි මුද්‍රණයට, 1892 දී ලියූ ප්‍රස්තාවනාව මගින්ද එය ඔප්පු වෙයි. ඔහු ''කම්කරු පංතිය අතර කුලීන පෙළැන්තියක්'' ගැනද, වැඩකරණ ජනතාවගේ අති විශාල කොටසට හාත්පසින්ම වෙනස් වරප්‍රසාද ලැබූ කම්කරුවන්ගේ අල්පතරයක් ගැනද, කතා කරයි. 1848—1868 වසර වලදී එංගලන්තයේ වරප්‍රසාදී තත්ත්වයෙන්, කම්කරු පංතියේ කුඩා වරප්‍රසාද ලැබූ ආරක්ෂිත අල්පතරයක් පමණක්, ස්ථාවර වාසි ලැබූ අතර පුළුල් ජන කොටස් වැඩිම වශයෙන් තාවකාලික සහනයක් ලැබූහ...'' ''... එම (එංගලන්තයේ කර්මාන්තමය) ඒකාධිකාරයේ බිඳ වැටීමත් සමගම, ඉංග්‍රීසි කම්කරු පංතියට එම වරප්‍රසාද තත්ත්වය අහිමි වනු ඇත...'' ''අථත්'' සමිතිවල සාමාජිකයින්ට, නූපුහුණු කම්කරුවන්ගේ සමිතිවලට, ''පැරණි සමිතිවල'' සාමාජිකයින්ගේ මොලවලට බාධා කළ, දයාද වශයෙන් ලබාගත් ධනවාදී ප්‍රාග් විනිශ්චයෙන් සම්පූර්ණයෙන්ම නිදහස් වූ නැවුම් බිමක් වැනි සිතක් ඇති වීමේ අති මහත් වාසිය තිබිණි...'' තමන්ම තම කම්කරු ගුණය ලිබරල්වාදී සාගරයක ගිල්වා දැමීමට කැමති නිසා තමන් කම්කරු පංතියේ සාමාජිකයින් වීමට සමාව දෙන මිනිස්සු එංගලන්තයේ ''ඊනියා කම්කරු නියෝජිතයෝ වෙති...''

මාක්ස්ගේ හා එංගල්ස්ගේ සෘජු ප්‍රකාශනයන් දීර්ඝ ලෙස අප වුවමනාවෙන්ම උපුටා දක්වූයේ, පාඨකයාට එය සම්පූර්ණ වශයෙන් අධ්‍යයනය කළ හැකි වන පරිදිය. ඒවා අධ්‍යයනය කළ යුතුය, ඒවා ගැන සැලකිලිමත් ලෙස කල්පනා කර බැලීම වටී. මන්දයත්, අධිරාජ්‍යවාදී යුගයේ වාස්තවික තත්ත්වයන් විසින් අණ කරන කම්කරු පංතික ව්‍යාපාරයේ උපක්‍රමවල භ්‍රමණ කේන්ද්‍රය එය බැවිනි.

මෙතැනදීද, කෞට්ස්කි ප්‍රශ්නය දූම පටලයකින් වසා දැමීමට සහ මාක්ස්වාදය වෙනුවට අවස්ථාවාදීන් සමග සංවේදනීය සමාදනයකට පැමිණීමට තැත් කර ඇත. එංගලන්තයේ ඒකාධිකාරය විනාශකර දැමීමේ මාධ්‍යයක් වශයෙන් ජර්මනිය යුද්ධයට සහභාගි වීම සාධාරණ යැයි කියන (ලෙන්ච් වැනි) තිරසර සහ ළාමක සමාජ අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව තර්ක කරන කෞට්ස්කි, පැහැදිලිව පෙනෙන මෙම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ව්‍යාජය එවැනිම පැහැදිලි තවත් ව්‍යාජයකින් ''නිරවද්‍ය'' කරයි. නරුමවාදී ව්‍යාජයක් වෙනුවට, මනෝඥ ව්‍යාජයක් ඔහු ඉදිරිපත් කරයි! එංගලන්තයේ කර්මාන්තමය ඒකාධිකාරය බොහෝ කලකට පෙර බිඳ දමා, බොහෝ කලකට පෙර විනාශ කර දමා තිබෙන බැවින්, විනාශ කිරීමට දෙයක් නැතැයි ඔහු කියයි.

මේ තර්කය සාවද්‍ය වන්නේ මක්නිසාද?

මන්දයත්, පළමුවෙන්ම එය එංගලන්තයේ යටත් විජිත ඒකාධිකාරය ගැන නොසලකන බැවිනි. එහෙත්, එංගල්ස් 1882 දී එනම්, මීට වසර තිස් හතරකට පෙර මේ ගැන ඉතා පැහැදිලි ලෙස පෙන්වා දුන් බව අපි දකිමු! එංගලන්තයේ කර්මාන්ත අධිකාරය විනාශ කළද, ඇගේ යටත් විජිත අධිකාරය එලෙසම පවතින අතර එය උග්‍රවී ඇත, මන්දයත් මුළු මහත් ලෝකයම දැනටමත් බෙදා ඉවර වී ඇති බැවිනි. මෙම මනෝඥ බොරුව මගින් කෞට්ස්කි, ''සටන් කිරීමට තරම් දෙයක් නැතැ'' යි යන ධනපති-ශාන්තිවාදී සහ අවස්ථාවාදී අවරසික අදහස ඇද ගෙන යයි. විලෝම වශයෙන්, දැන් ධනපතීන්ට සටන් කිරීමට දෙයක් තිබෙනවා පමණක් නොව, ඔවුනට ධනපති ක්‍රමය ආරක්ෂා කිරීමට වුවමනා නම්, සටන් නොකර සිටීමට බැරිය, මන්දයත් බලහත්කාරයෙන් යටත් විජිත බෙදා ගන්නේ නැතිව, අළුත් අධිරාජ්‍යවාදී රටවලට පැරණි (සහ දුර්වල) අධිරාජ්‍යවාදී බලවතුන් භුක්ති විඳින වරප්‍රසාද ලබාගත නොහැකි බැවිනි.

දෙවනුව, එංගලන්තයේ අවස්ථාවාදයේ (තාවකාලික) ජයග්‍රහණය එංගලන්තයේ ඒකාධිකාරය විසින් විස්තර කරන්නේ කෙසේද? මන්දයත් ඒකාධිකාරය විසින් අධි ලාභ ලබාගන්නා බැවිනි. එනම්, මෙය මුළු මහත් ලෝකයේ සාමාන්‍ය සහ සිරිතක් බවට පත්ව් තිබෙන ධනවාදී ලාභයට වඩා අතිරික්ත ලාභයකි. මේ අධි ලාභ වලින් කොටසක් එය සුළු කොටසක් නොවේ) තමන්ගේ කම්කරුවන්ට අල්ලස් වශයෙන් දීමටද, එමගින් අනිකුත් රටවලට විරුද්ධව, එක් රටක කම්කරුවන් සහ ඔවුන්ගේ ධනපතීන් අතර මිත්‍ර සන්ධානයක් (ඉංග්‍රීසි වෘත්තීය සමිති සහ ස්වාමිවරුන් අතර ඇති, වෙබ් විසින් විස්තර කරන ලද සුප්‍රසිද්ධ මිත්‍ර සන්ධානය මතක් කරමු) ඇති කැර ගැනීමටද ධනපතීන්ට පිළිවන. දහ නව වැනි සිය වසර අග වන විට, එංගලන්තයේ කර්මාන්ත ඒකාධිකාරය විනාශ කර දමා තිබිණි. මෙය තර්ක විරහිත කරුණකි. එහෙත් මේ විනාශය ඇති වූයේ කෙසේද? මුළු මහත් ඒකාධිකාරයම අහෝසි වීද?

මෙසේ සිදුවිණි නම්, කෞට්ස්කිගේ (අවස්ථාවාදීන් සමග) සමාදන වීමේ ''න්‍යායය'' එක්තරා ප්‍රමාණයකට සාධාරණත්වයක් ලබාගනු

ඇත. එහෙත් එය එසේ නොවේ. කාරණයත් එයයි. අධිරාජ්‍යවාදය යනු ඒකාධිකාරී ධනවාදයයි. සෑම කාටලයක්ම, සංගතයක්ම සහ සම්මේලයක්ම සෑම යෝධ බැංකුවක්ම ඒකාධිකාරයකි. අධිලාභ අහෝසි වී නැත. ඒවා තවමත් පවතී. වරප්‍රසාද සහිත මූල්‍ය වශයෙන් පොහොසත් එක් රටක් විසින් අනෙකුත් සියලු රටවල් සූරාකෑම එලෙසම පවතින අතර එය තවත් තීව්‍ර වී ඇත. පොහොසත් රටවල් අතලොස්සක්, නිදහස් සැබවින්ම යෝධමය, සමකාලීන පොහොසත් ලෙස ගණිත විට එවැනි රටවල් ඇත්තේ හතරක් පමණකි: එංගලන්තය, ප්‍රංශය, ඇමෙරිකා එක්සත් ජනපදය සහ ජර්මනියය. මේ රටවල් අති විශාල පරිමාණ දක්වා ඒකාධිකාරය වර්ධනය කර ඇත. ලක්ෂ ගණනින් නැතිනම් කෝටි ගණනින් ඔවුහු අධි ලාභ ලබති. ඔවුහු වෙනත් රටවල කෝටි සංඛ්‍යාත මිනිසුන්ගේ ''පිට උඩ නැග'' යති. විශේෂයෙන්ම පොහොසත්, විශේෂයෙන් ස්ථූල සහ විශේෂයෙන්ම ලෙහෙසි ගොදුරු සඳහා ඔවුහු තමන් අතර පොර කා ගනිති.

කෞට්ස්කි විසින් හෙළි කරනවා වෙනුවට ඔහු විසින් අමතක කර දමන අධිරාජ්‍යවාදයේ ආර්ථික සහ දේශපාලන හරය, ගැඹුරු ප්‍රතිවිරුද්ධතාවයන් සැබවින්ම මේවාය.

අධිරාජ්‍යවාදී ''මහා'' බලවතකුගේ ධනපති පංතියට වසරකට ප්‍රැන්ක් දස කෝටියක් පමණ වියදම් කොට තම කම්කරු පංතියේ ඉහළ ස්තරයට ආර්ථික අල්ලසක් දිය හැකිය. මන්දයත් වසරකට ඔවුන් ලබන අධි ලාභය ප්‍රැන්ක් කෝටි සියයක් වන බැවිනි. මේ කුඩා අල්ලස කම්කරු-ඇමතිවරුන් අතරත්, ''කම්කරු නියෝජිතයින්'' අතරත් (මෙම සංකල්පය පිළිබඳ එංගල්ස්ගේ අනගිතම විශ්ලේෂණය මතක් කරන්න), යුද්ධ කර්මාන්ත කමිටුවල[61] කම්කරු සාමාජිකයින්, කම්කරු නිලධාරීන්, පටුවැඩශාලා සමිති වලට අයත් කම්කරුවන්, කාර්යාල සේවකයින් ආදීන් අතර බෙදීම ද්විතීයික ප්‍රශ්නයකි.

1848 සිට 1868 දක්වා කාලයේදීත්, ඉන් ඉක්බිතිව එක්තරා කාලයකදීත් එංගලන්තය ඒකාධිකාරයක් භුක්ති වින්දය. එරටෙහි අවස්ථාවාදයට දසක කීපයක් තිස්සේ පැවතීමට හැකි වූයේ ඒ නිසාය. අනිත් රටවල් වලට පොහොසත් යටත් විජිත හෝ කර්මාන්ත ඒකාධිකාර නොතිබිණි.

දහනව වැනි සිය වසරේ අවසාන තිස් වසර තුළදී, නව අදිරාජ්‍යවාදී යුගයක පරිවර්තනයක් ඇති විය. ඉතා අල්ප සංඛ්‍යාවක් වුවද, රටවල් කීපයක මූල්‍ය ප්‍රාග්ධනය සහිත මහ බලවත්තු ඒකාධිකාරයක් භුක්ති වින්දහ. (ජපානයේ හා රුසියාවේ මිලිටරි බලයේ ඒකාධිකාරයක්ද, භෞමික වශයෙන් ඉතා විශාල පෙදෙසක්ද සූළු ජාතීන්, චීනය ආදී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

රටවල් සොරකම් කර ගැනීමේ විශේෂ වාසි ආදියද, මූල්‍ය ප්‍රාග්ධනයේ සමකාලීන, නවීන ඒකාධිකාරය විසින් අර්ධ වශයෙන් පරිශිෂ්ට වන අතර අර්ධ වශයෙන් වෙනස් වේ). එංගලන්තය විසින් උසුලන ලද මේ ඒකාධිකාරය දසක කීපයක් තිස්සේ වෙනස් නොවූ හේතුව එම වෙනස විසින් විස්තර කෙරේ. සමකාලීන මූල්‍ය ප්‍රාග්ධනයේ ඒකාධිකාරයට උමතු ලෙස අභියෝග කර ඇත; අදිරාජ්‍යවාදී යුද්ධ ඇතිවන යුගය උදා විය. ඒ කාලයේදී එක් රටක කම්කරු පංතියට අල්ලස් දී දසක කීපයක් තිස්සේ එය දූෂණය කිරීමට පුළුවන් කමක් තිබිණි. දැන් මෙය නොනිසි දෙයකි, නොකළ හැකි දෙයකි. එහෙත් අනිත් අතට සෑම අධිරාජ්‍යඩාදී මහා බලයක්ම කම්කරු කුලීනයින්ගේ කුඩා ස්තරයකට (1848-1868 එංගලන්තයේ ස්තරයට වඩා මෙය කුඩාය) අල්ලස් දීමට සමත්ය, ඔවුහු එසේ කරති. එංගල්ස්ගේ විශිෂ්ට ගැඹුරු ප්‍රකාශය අනුව, ඉස්සර ධනවාදී කම්කරු පක්ෂයක්, පැන නැගිය හැක්කේ එක් රටක පමණකි. මන්දයත්, එම රට පමණක් ඒකාධිකාරයක් භුක්ති වින්ද බැවිනි. එහෙත් අනිත් අතින්, එයට බොහෝ කල් පැවැතිය හැකි විය. දැන් ධනවාදී කම්කරු පක්ෂයක් සියලු අධිරාජ්‍යවාදී රටවල අනිවාර්යයක් සහ නියමයක් වී ඇත. එහෙත් ඔවුන් ගොදුරු බෙදගැනීම සඳහා මාරාන්තික අරගලයක් ගෙනයන බැවින්, රටවල් කීපයක එවැනි පක්ෂයක් දීර්ඝ කාලයක් තිස්සේ පවතිතැයි සිතීම උගහටය. මන්දයත්, සංගත මූල්‍ය කතිපයාධිකාරය, මිළ ඉහළ නැගීම ආදිය නිසා ඉහළ ස්තරයේ අතළොස්සකට අල්ලස් දීම කළ හැකි වුවද, නිර්ධන පංතියේ බහු ජන කොටස් සහ අර්ධ නිර්ධන පංතිය මත පෑගීම, පොඩිකර දැමීම, විනාශ කිරීම සහ වධ දීම වැඩිකරන බැවිනි.

අනිත් අතින්, ඉතා පොහොසත් හා වරප්‍රසාද ලබන ජාතීන් අතළොස්සක් ඉතිරි මිනිස් සංහතියේ දේහය තුළට වැදී සිටින "සදකාලික" පරපෝෂිතයින්ගේ තත්ත්වයට පත් කිරීමටද, නීග්‍රෝවරුන් සහ ඉන්දියානුන් සූරාකෑමේ කීර්තිය මත උදසීනව සිටීම ආදියටද, සමකාලීන මිලිටරිවාදය විසින් සපයන ලද සමූලඝාතනය කිරීමේ ඉතා හොඳ අවිවල ආධාරයෙන් ඔවුන් පරාධීනත්වයේ තබා ගෙන සිටීමටද ප්‍රවණතාවයක් ධනපතීන් සහ අවස්ථාවාදීන තුළ දක්නට ඇත. අනිත් අතින්, පෙරට වඩා පෑගී සිටින, අධිරාජ්‍යවාදී යුද්ධවල සියලු දුක් කරදර විඳ දරාගන්නා ජනතාව තුළ මෙම වීය ගහ පෙරළා දමා ධනපති පංතිය පරාජය කර දැමීමේ ප්‍රවණතාවයක් ඇත්තේය. මේ ප්‍රවණතා දෙක අතර අරගලයේදීය, කම්කරු පංතික ව්‍යාපාරයේ ඉතිහාසය දැන් අනිවාර්ය ලෙස වර්ධනය වනුයේ. මන්දයත්, පළමුවැනි ප්‍රවණතාවය අහම්බෙන් සිදුවූ දෙයක් නොවන බැවිනි, එය ආර්ථික වශයෙන් ඔප්පු-

වන්නේය. හැම රටමක ධනපති පංතිය දැනටමත්, සමාජ — ෂෝවිනිස්ටවරුන්ගේ ධනවාදී කම්කරු පක්ෂයක්, හදා වඩා ස්ථිර කොට ඇත. නිදසුනක් වශයෙන් ස්ථිර ලෙස පිහිටුවන ලද ඉතාලියේ බිස්සොලාතිගේ සමාජ — අධිරාජ්‍යවාදී පක්ෂය සහ පොත්රෙසොව්ලාගේ, ග්වස්දියොව්ලාගේ, බුල්කින්ලාගේ, චෙහෙයිද්සෙලාගේ, ස්කෝබිලෙව්ලාගේ සහ සමාගමයේ අර්ධ වශයෙන් ගොඩ නගන ලද, පක්ෂයකට ආසන්න සංවිධානය අතර ඇති වෙනස කිසිදු වැදගත් කමක් නොදරයි. මෙහිදී වැදගත් කරුණ නම්, ආර්ථික වශයෙන් කම්කරු කුලීනත්වයේ එක් ස්තරයක් ධනපති පංතිය වෙතට ඇදීයාම මුහුකුරා වැඩී ගිය අතර එය ක්‍රියාවට යෙදුණු සත්‍යයක් බවට පත්වී තිබීමය. මෙම ආර්ථික සාධකය, පංති සම්බන්ධතාවයන්ගේ මෙම වෙනස්වීම, යම්කිසි විශේෂ "අමාරුකමක්" නැතිව එක් හෝ තවත් ආකාරයකින්, දේශපාලනමය හැඩයක් ගනු ඇත.

යට සඳහන් කරන ලද ආර්ථික පදනම් අනුව, පුවත්පත්, පාර්ලිමේන්තුව, සංගම් හා සම්මේලන ආදිය වැනි සමකාලීන ධනවාදයේ දේශපාලන ආයතනයන්, විසින් වැදගත්, යටහත්, ප්‍රතිසංස්කරණවාදී සහ දේශ ප්‍රේමී කාර්යාල සේවකයින්ට සහ කම්කරුවන්ට ආර්ථික වරප්‍රසාද සහ කුඩා අල්ලස්වලට ගැළපෙන පරිදි දේශපාලනමය වරප්‍රසාද සහ කුඩා අල්ලස් බිහිකර ඇත. ආණ්ඩුවේ නැතිනම් යුද්ධ කර්මාන්ත කමිටුවලද, පාර්ලිමේන්තුවේ සහ විවිධ කොමිසම් සභාවලද, නීත්‍යානුකූල ලෙස පළ කරනු ලබන පුවත්පත් වල කතෘ මණ්ඩලවලද නැතිනම් "ධනපති නීතිය පිළිපදින" වැදගත් කමින් කොහෙත්ම අඩු නොවන, වෘත්තීය සමිතිවල විධායක මණ්ඩලවලද වාසි සහගත සහ කරදර රහිත උසස් තනතුරු ලබාදීමය — ධනවාදී කම්කරු පක්ෂවල නියෝජිතයින්ට හා ආධාර කරුවන්ට අධිරාජ්‍යවාදී ධනපතීහු මෙවැනි ඇම දීමක් සහ තෑගි දීමක් මගින් තමන් වෙත ඇද ගනිති.

දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදයේ යන්ත්‍රණයද එලෙසම ක්‍රියා කරයි. මැතිවරණයකින් තොරව අප කාලයේදී කිසිවක් කළ නොහැකිය. පොදු ජනතාව නැතිවද කිසිවක් කළ නොහැකිය. ධනපති පංතිය පෙරළා දැමීමේ විප්ලවවාදී අරගලය කම්කරුවන් විසින් ප්‍රතික්ෂේප කරනතාක් කල්, දිගට හරහට ඔවුනට ප්‍රතිසංස්කරණ සහ ආශිර්වාද ලබා දීමට පොරොන්දුවන, ඉච්චාබස්, බොරු, වංචනික ක්‍රියා, නවීන මෝස්තරයට ගැළපෙන ජනප්‍රිය උද්යෝග පාඨ ඇද බෑමේ ප්‍රචලිත, ක්‍රමානුකූලව පාලනය කරන ලද, හොඳින් පිළියෙල කරන ලද ක්‍රමයක් නැතිව, මුද්‍රණයේ සහ පාර්ලිමේන්තුවාදයේ යුගය වන මේ කාලයේදී පොදු ජනතාවගේ ආධාරය ලබා ගැනීමට නොහැකි වන්නේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

"ධනවාදී කම්කරු පක්ෂයේ" සනාතනික රටේ, මේ ක්‍රමයේ ඉතා ප්‍රගාමී, නිපුණ නියෝජිතයකු වන ඉංග්‍රීසි ඇමතිවර ලොයිඩ් ජෝර්ජ්ගේ නම අනුව,මෙය ලොයිඩ් ජෝජ් ක්‍රමය හැටියට මම හඳුන්වමි. ප්‍රධාන පංතියේ ධනවාදී කාර්ය ශූරයෙක් වන ඔහු, කපටි නුවණැති දේශපාලනඥයෙකි, කම්කරු ප්‍රේක්ෂකයින් ඉදිරියේ අධි-විප්ලවවාදී කතා ඇතුළු ඕනෑම කතාවක් ඔහු කරනු ඇත. සමාජ ප්‍රතිසංස්කරණ (සංරක්ෂණ ආදිය) වැනි සුළු අල්ලස් යටත් පහත් හීලෑ කම්කරුවන්ට සෑහෙන තරම් ලබා දීමටද ඔහු සමත්ය. ලොයිඩ් ජෝජ් ධනපති පංතියට* අනගි ලෙස සේවය කරයි, කම්කරුවන් අතර ධනපති පංතියට ඔහු නියත ලෙසම සේවය කරයි. ධනපතීන්ගේ බලපෑම ඉතා අවශ්‍ය ස්ථානයට අධ්‍යාත්මික වශයෙන් පොදු ජනතාව ධනවාදයේ බලපෑමට යට කිරීමට, ඉතා අමාරු අවස්ථාවලදී නිර්ධනීන් අතර ධනවාදී බලපෑම පැතිරවීමට ඔහු නියත ලෙසම ක්‍රියා කරයි.

ලොයිඩ් ජෝජ් සහ ෂෙයිඩමාන්ලා, ලේගින්ලා, හෙන්ඩර්සන්ලා සහ හයින්ඩ්මන්ලා, ප්ලෙහානව්ලා, රෙනෝල්ඩ්ලා සහ සමාගමය අතරත් විශාල වෙනසක් තිබේද? පසු කී අයගෙන් සමහරෙක් මාක්ස්ගේ විප්ලවවාදී සමාජවාදය වෙත යළිත් එනු ඇතැයි කියමින් අපට විරුද්ධ වනු ඇත්තාහ. මෙසේ විය හැකිය. එහෙත් ප්‍රශ්නය දේශපාලනමය අනුව, එනම් බහුජන අංශයෙන් බලන්නේ නම්, අංශය අනුව එහි ඇති වෙනස ඉතා නොවැදගත් වනු ඇත. වත්මන් සමාජ ෂෝවිනිස්ට් නායකයින් අතරින් සමහර පුද්ගලයින් නිර්ධන පංතිය වෙත යළිත් එනු ඇත. එහෙත් සමාජ — ෂෝවිනිස්ට්වාදී (එම අර්ථයම ගෙන දෙන) නැතිනම් අවස්ථාවාදී ප්‍රවණතාවයට අතුරුදහන් වීමට හෝ යළිත් නිර්ධන පංතිය වෙත පැමිණීමට හෝ නොපිළිවන. කම්කරුවන් අතර මාක්ස්වාදය ජනප්‍රිය තැනෙක මේ දේශපාලන ප්‍රවණතාවය, මේ ධනවාදී කම්කරු පක්ෂය, මාක්ස්ගේ නාමයෙන් දිවුරනු ඇත. යම්කිසි වෙළඳ ව්‍යාපාරයකට, යම්කිසි ලේබලයක් සළකුණක් හෝ දැන්වීමක් පාවිච්චි කිරීම තහනම් කළ නොහැකිවාක් මෙන්ම, මෙයටද එය තහනම් කළ නොහැකිය. පැහෙන පංතීන් අතර ජනප්‍රිය

* ඉංග්‍රීසි සහරාවක, ලොයිඩ් ජෝජ්ගේ දේශපාලන විරුද්ධකරුවකු වන ටෝරි පාක්ෂිකයකු විසින් ලියන ලද ලිපියක් මම කියවීමි. "ලොයිඩ් ජෝජ් ටෝරියකුගේ දෘෂ්ටි කෝණයෙන්" යනු එම ලිපියේ සිරස් තලය විය. යුද්ධය විසින් මේ විරුද්ධවාදියාගේ නෙත් පැහැදූ අතර ලොයිඩ් ජෝජ් ධනපති පංතියේ කොතරම් අගනා සේවකයකුද යන්න ඔහු සාක්ෂාත් කර ගත්තේය. ටෝරිවරු ඔහු සමග සාමයකට එළඹ සිටිති!

වී සිටි, විප්ලවවාදී නායකයින්ගේ මරණින් පසු, ඔවුන්ගේ සතුරන් පැගී සිටින පංතීන් මුලා කිරීම සඳහා ඔවුන්ගේ නම් තමන් වෙතට ඇඳා ගැනීම පිළිබඳව ඉතිහාසය හැමදම පෙන්වා දෙයි.

සියලු ප්‍රගාමී ධනපති රටවල "ධනවාදී කම්කරු පක්ෂ" දේශපාලනමය ප්‍රපංචයක් ලෙස සංවිධානය කර තිබීමේ සාධකය සහ මේ සියලු පක්ෂවලට, කාණ්ඩවලට නැතිනම් ප්‍රවණතා ආදියට විරුද්ධව මුල සිට අග දක්වා අධිෂ්ඨාන සහගත සහ සමාව නොදෙන අරගලයක් ගෙනයන්නේ නැතිනම්, අධිරාජ්‍යවාදයට විරුද්ධව අරගලයක්වත්, මාක්ස්වාදය සඳහා නැතිනම් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අරගලයක්වත් පිළිබඳව ප්‍රශ්නයක් පැන නොනගිනු ඇත. රුසියාව තුළ චිහෙයිද්සේ ප්‍රැක්ෂණය[62], "නාෂෙ දියල" සහ "ගෝලස් ත්‍රුද" ද[63] විදේශගත 'සංවිධාන කමිටුවේ' ආධාරකරුවෝද මෙවැනි පක්ෂයක විවිධත්වයක් මිස අන් කිසිවක් නොවේ. සමාජ විප්ලවයට පෙර මෙම පක්ෂ අහෝසි වී යතැයි සිතීමට තුඩුදෙන කරුණු කොහෙත්ම නැත. එයට විලෝම වශයෙන්, විප්ලවය වඩ වඩාත් ළංවෙත්ම, එය බලගතු ලෙස විහිදෙයි, එහි ප්‍රගමනයේ සංක්‍රාන්තිය සහ පිමි වඩාත් හිංසාකාරී සහ ක්ෂණික වන පමණට, අවස්ථාවාදී සුළු ධනපති ප්‍රවාහණයට විරුද්ධව විප්ලවවාදී පොදු ජනතාව කම්කරු පංති ව්‍යාපාරය තුළ ගෙනයන අරගලයද වඩාත් වැඩිවනු ඇත. කෞට්ස්කිවාදය ස්වාධීන ප්‍රවනතාවයක් නොවේ. මන්දයත්, එය පොදු ජනතාව අතර හෝ ධනපති පංතිය වෙතට ගොස් සිටින වරප්‍රසාද ලැබූ ස්තරය අතර හෝ මුල් බැස නැති බැවිනි. එහෙත් කෞට්ස්කිවාදයේ අවදානම රඳා පවතින්නේ, අතීතයේ දෘෂ්ටිය ප්‍රයෝජනයට ගනිමින්, එය නිර්ධන පංතිය ධනවාදී කම්කරු පංතිය සමග සමාදන කිරීමටද, එම පංතිය සමග නිර්ධන පංතියේ සමගිය ආරක්ෂා කොටැ, එම පක්ෂයේ ජනප්‍රියතාවය වර්ධනය කිරීමටද වැයම් කරන බැවිනි. විවෘත සමාජ — ෂෝවිනිස්ට්වාදීන්ගේ නායකත්වය පිළිගැනීමට පොදු ජනතාව සූදනම් නැත. එංගලන්තයේ කම්කරු රැස්වීමකදී ලොයිඩ් ජෝජ්ට හූ කියා ඇත. හයින්ඩ්මාන් පක්ෂය අතහැර ගියේය. රෙනොදේලිලා සහ ෂෙයිඩමාන්ලා, පොත්රෙසොව් සහ ග්වස්දියොව්ලාද පොලිසියේ ආරක්ෂාව ලබති. කෞට්ස්කිවාදීන් විසින් වෙස් මුහුණු බැඳගෙන සමාජ-ෂෝවිනිස්ට්වරුන් ආරක්ෂා කිරීම වඩාත් භයානකය.

කෞට්ස්කිවාදයේ සමාන්‍ය විතණ්ඩ වලින් එකක් නම්, 'මහජනතාව' උපුටා දැක්වීමය. මහ ජනතාවගෙන් සහ මහජන සංවිධාන වලින් ඈත්වීමට අපි කැමති නොවමුයි ඔවුහු පවසති! එහෙත් එංගල්ස් මේ ප්‍රශ්නය ඉදිරිපත් කළ ආකාරය බලන්න. දහනව වැනි සිය වසරේදී,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඉංග්‍රීසි වෘත්තීය සමිතිවල පොදු ජන සංවිධාන ධනවාදී කම්කරු පංතියේ පැත්ත ගෙන තිබිණි. මෙම තත්ත්වය සමග සමථයකට පත්වීමට මාක්ස් සහ එංගල්ස් සූදනම් නොවූහ. ඔවුහු එය හෙළිදරව් කළහ. පළමුකොටම වෘත්තීය සමිති සංවිධාන සෘජු ලෙසම නිර්ධන පංතියේ අල්පතරයක් මත බල පෑ බව ඔවුහු අමතක නොකළහ. එවකට එංගලන්තයේදීද අද ජර්මනියේ මෙන් නිර්ධන පංතියෙන් පහෙන් පංගුවකට වඩා සංවිධාන කර නොතිබිණි. ධනවාදය යටතේ නිර්ධන පංතියේ බහුතරය සංවිධානය කළ හැකියි කිසිවෙක් බැරෑරුම් ලෙස නොසිතති. දෙවැනිව, ප්‍රධාන දේ සංවිධානයක ප්‍රමාණය නොවේ, එහි ප්‍රතිපත්තියේ සැබෑ වාස්තවික වැදගත් කමය — ප්‍රධාන කරුණ එයයි. එම ප්‍රතිපත්තිය පොදු ජනතාව නියෝජනය කරතිද, එය ඔවුනට සේවය කරතිද එනම් ඔවුන් ධනවාදයෙන් මුදවා ගැනීමේ වුවමනාවන් එය නියෝජනය කරතිද, එසේත් නැතිනම්, එය අල්පතරයේ වුවමනාවන්, ධනවාදය සමග අල්පතරයේ සමථයක් එය නියෝජනය කරතිද? පසු කී දෙය එංගලන්තයේ දහනව වැනි සිය වසර පිළිබඳ සත්‍යයක් විය, ජර්මනිය ආදී රටවලට දූන් එම සත්‍යය බලපායි.

එංගල්ස් පැරණි වෘත්තීය සමිතිවල ධනවාදී කම්කරු පක්ෂය — වරප්‍රසාද ලැබූ අල්පතරය — සහ පහළතම පොදු ජනතාව එනම් සැබෑ බහුතරය අතර ඇති වෙනස පෙන්වා දෙයි. ''ධනවාදී නම්බුකාරකම'' නැමැති රෝගය වැළැදී නැති පසු කීකොටසට ඔහු ආයාචනය කරයි. මෙය මාක්ස්වාදී උපායවල හරය වන්නේය!

සමාජ-ෂෝවිනිස්ටවාදීන් සහ අවස්ථාවාදීන් පසු පස යන නිර්ධනීන්ගේ ප්‍රමාණය මේ යැයි අපට හෝ වෙනත් කෙනෙකුට හෝ ස්ථිර වශයෙන් කිව නොහැකිය. අරගලය තුළින් පමණක් මෙය හෙළිවනු ඇත. මෙය ස්ථිර ලෙසම තීරණය කරන්නේ සමාජවාදී විප්ලවය විසින් පමණකි. එහෙත් අධිරාජ්‍යවාදී යුද්ධයකදී 'පීතෘ භූමිය ආරක්ෂා කරන්නන්ගේ සංඛ්‍යාව අල්පතරය බව අපි ස්ථිර ලෙසම දන්නෙමු. අප සමාජවාදීන් හැටියට ඉදිරියටත් සිටිය යුතු නම්, සැබෑ ජනතාව අතරට වඩාත් පහතට සහ වඩාත් ගැඹුරට කා වැදීම අපේ යුතුකම වන්නේය. අවස්ථාවාදයට විරුද්ධව ගෙන යන අරගලයේ මුළු මහත් තේරුම සහ අභිප්‍රාය මෙය වන්නේය. අවස්ථාවාදීන් හා සමාජ — ෂෝවිනිස්ටවරුන් ඇත්ත වශයෙන්ම, පොදු ජනතාවගේ අයිතිවාසිකම් පාවා දීම හා විකිණීම හෙළි කිරීමෙන්ද සහ ඔවුන් කම්කරුවන් අල්පතරයකගේ තාවකාලික වරප්‍රසාද ආරක්ෂා කරන බවත්, ඔවුන් ධනවාදී අදහස්වල සහ බලපෑමේ වාහකයින් බවත්, ඔවුන් සැබවින්ම ධනපති පංතියේ මිතුරන් හා ඒජන්තවරුන් බවත් හෙළිදරව් කිරීමෙන්, ඔවුන්ගේ සැබෑ දේශපාලන වුවමනාවන් අගැයීමටද, සමාජවාදය සහ විප්ලවය සඳහා මුල සිට අග දක්වා සටන් කිරීමටද, අධිරාජ්‍යවාදී යුද්ධවලට සහ යුද්ධ විරාමවල දීර්ඝ සහ වේදනාකාරී පෙරළීම්වලට විරුද්ධව සටන් කිරීමටද, අපි ජනතාවට උගන්වන්නෙමු.

ලෝක කම්කරු පංති ව්‍යාපාරයේ එකම මාක්ස්වාදී ප්‍රතිපත්තිය වන්නේ, අවස්ථාවාදයෙන් කැඩී යාමේ අනිවාර්යතාවය සහ අවශ්‍යතාවය ජනතාවට විස්තර කර දීමය, අවස්ථාවාදයට විරුද්ධව ඉතා දැඩි සටනක් අරඹමින් විප්ලවය සඳහා ජනතාවට උගැන්විය යුතුය, යුද්ධයේ අත් දැකීම් ප්‍රයෝජනයට ගෙන, ජාතික ලිබරල් කම්කරු දේශපාලනයේ නීච අධමත්වය සැඟවීමට නොව එය හෙළිදරවු කිරීමට ජනතාවට උගැන්විය යුතුය.

මෙම ප්‍රතිපත්තිය කෞට්ස්කිගේ ප්‍රතිපත්තියෙන් වෙන්කර පෙන්වන ප්‍රධාන ලක්ෂණ අපි මීළඟ ලිපිය මගින් ගොනු කර පෙන්වීමට උත්සාහ දරමු.

1916 ඔක්තෝබර් මාසයේදී ලියන ලදී.
1916 දෙසැම්බර්
'' ස්බෝර්නික් ''සොට්සියාල් ඩිමොක්‍රාට'' '' හි (අංක 2) පළ විය.

වී. අයි. ලෙනින්., සම්පූර්ණ කෘති, වෙළුම 30, පිටු 163-179.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිර්ධන පංති සංස්කෘතික-අධ්‍යාපනික සංවිධානවල සාකච්ඡාවේ සභාපති මණ්ඩලයට යැවූ ලියුම

1918 සැප්තැම්බර් 17 ද

ප්‍රිය සහෝදරවරුනි! ඔබගේ සුබ පැතීම්වලට අප බොහෝ සේ ස්තුති වන්ත වෙන අතර ඔබගේ වැඩ කටයුතු සෑම අතින්ම සාර්ථක වේවායි පතමු[64].

සමාජවාදී විප්ලවයේ එක් ප්‍රධාන කොන්දේසියක් වන්නේ, කම්කරු පංතිය තමා රට පාලනය කළ යුතුය යන්න වටහා ගැනීම සහ ධනවාදයේ සිට සමාජවාදය දක්වා පරිවර්තනය වන යුගයේදී මෙම පාලනය ගෙන යා යුතු බවත්ය. පංතීන් සම්පූර්ණයෙන්ම අහෝසි කර දැමීමට නම්, ධනපති ක්‍රමය විසින් පොඩිකර, පාගා, සහ අසමගි කොට, සිටින්නාවූ වැඩකරන සහ සූරාකනු ලැබූ ජනතාව නාගරික කම්කරුවන් වටා එකසත් කොට, ඔවුන් සමග සමීප මිත්‍ර සන්ධානයක් ඇති කොට සූරාකන්නන්ගේ ප්‍රතිරෝධනය පාගා දැමීමට නම්, මේ පරිවර්තන යුගයේදී වැඩකරන ජනතාවගේ හා සූරාකනු ලැබූ ජනතාවගේ පුරෝගාමී බල ඇණිය වන නිර්ධන පංතියේ පාලනය අවශ්‍ය වන්නේය.

අපේ සියලු ජයග්‍රහණවලට හේතු වූයේ කම්කරුවන් මෙය වටහා ගෙන සිය රජය සෝවියට් සභා මගින් ආණ්ඩු කිරීමය.

එහෙත් කම්කරුවෝ මෙය සෑහෙන තරමින් තවමත් වටහා ගෙන නැත්තාහ. රජය පාලනය කිරීමේ තත්ත්වයට කම්කරුවන් උසස් කිරීමේදී ඔවුහු තවමත් අධික බයාදු කමක් දක්වති.

සහෝදරවරුනි, මේ සඳහා සටන් කරන්න! මෙහිදී නිර්ධන පංතික සංස්කෘතික සහ අධ්‍යාපනික සංවිධානවල ආධාරය ලැබිය යුතුය. තවත් ජයග්‍රහණ සඳහා සහ සමාජවාදී විප්ලවයේ අවසාන ජයග්‍රහණය සඳහා එය සහතිකයක් වනු ඇත.

සුබපැතුම් සමග

වී. උල්‍යානව් (ලෙනින්)

"ප්‍රාව්ද" අංක 201,
1918 සැප්තැම්බර් 19 ද.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති,
වෙළුම 37, පිටුව 87.

1919 ජනවාරි 18 ද ජාත්‍යන්තරවාදී ගුරුවරුන්ගේ සමස්ත රුසියානු දෙවැනි සමුළුව අමතා කළ කතාව

(අත්පොළසන් ප්‍රීති ඝෝෂාවලට පරිවර්තනය වේ.) සහෝදරවරුනි, මහජන කොමසාරිස් මණ්ඩලයේ නාමයෙන්, ඔබේ සමුළුවට සුබපැතීමට මට අවසර දෙන්න. සහෝදරවරුනි, දැන් ගුරුවරුන් ඉදිරියේ ඉතා වැදගත් කාර්යයක් ඇත්තේය. අප මුහුණ දුන් මේ වසරට පසුව, වසරක අරගලයකින් ඉක්බිතිව, ජාත්‍යන්තර වශයෙන් සිදුවූ දේ වලට අනතුරුව, මුල සිටම සෝවියට් ආණ්ඩුවේ පැත්ත ගෙන, සමාජවාදී විප්ලවයට පක්ෂව වැඩ කිරීමට තීරණය කළ ගුරුවරුන් සහ මේ වනතුරුත් පැරණි ක්‍රමයට පක්ෂපාත වන, පැරණි ක්‍රමය මත පදනම් කැරැ ගෙන, ඉගැන්වීම් දිගටම කළ හැකිය යන අගතිගාමී මතය දරන ගුරුවරුන් අතර හටගෙන තිබෙන අරගලය අවසන් විය යුතුය, එමෙන්ම එය අවසන් වෙගන එන්නේය. කම්කරු පංතියට සහ වැඩකරන ගොවීන්ට ළංවී සිටින ගුරුවරුන්ගේ අති විශාල බහුතරය, සමාජවාදී විප්ලවය ගැඹුරු ලෙස මුල් බැස ඇති බවත්, නොවැළැක්විය හැකි සේ එය මුළු මහත් ලෝකයටම පැතිර යන බවත් ඒත්තු ගෙන සිටින බවට සැක නැත. සමාජවාදී විප්ලවය සඳහාත්, තවමත් පැරණි ධනවාදී අගතිගාමීත්වයට පක්ෂ වන්නාවූද, පැරණි ක්‍රමයට හා කෛරාටික කම් වලට පක්ෂ වන්නාවූද, පැරණි ක්‍රමයෙන් කොටසක් හෝ ආරක්ෂා කර ගත හැකියැයි සිතන්නාවූද ගුරුවරුන්ට විරුද්ධව ගෙනයන සටන සඳහාත් වැඩ කරන සහ සූරාකනු ලබන ජනතාවගේ ආණ්ඩුවේ පැත්තට ගුරුවරුන්ගේ අති බහුතර සංඛ්‍යාව අවංකවම එතියි මම සිතමි.

මේ ධනපති කෛරාටිකකම් වලින් එකක් නම්, අධ්‍යාපනය දේශපාලනයෙන් තොරව ගෙන යා හැකිය යන විශ්වාසයයි. මෙය කෙතරම් ගැඹුරු ව්‍යාජ විශ්වාසයක්ද යන්න ඔබ දනිති. මෙම මූල ධර්මය දේශනා කරන ධනපති පංතිය පවා, පාසල් අධ්‍යාපන පද්ධතියේ මුල්ගල හැටියට තමන්ගේ දේශපාලනය පදනම් කර ඇත. පාසල් අධ්‍යාපනය සහ පුහුණුව ධනපති පංතියට සුවච කීකරු කාර්යක්ෂම මෙහෙකරුවන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඇති කිරීම දක්වා පටු කිරීමට ධනපති පංතිය ක්‍රියා කළේය. විශ්ව අධ්‍යාපනය පවා පහළ සිට ඉහළ දක්වා ධනපති පංතියේ සුවච කීකරු, කාර්යක්ෂම මෙහෙකරුවන් සහ ප්‍රාග්ධනයේ වහලුන් සහ උපකරණ පුහුණු කිරීමක් දක්වා පටු කිරීමටත් ධන්වාදීහු ක්‍රියා කළහ. පාසල මිනිස් පෞරුෂත්වය වර්ධනය කිරීමේ මාධ්‍යයක් හැටියට ඔවුහු කිසි කලෙක කල්පනා නොකළහ. වැඩ කරන ජනතාව සමගත් සූරාකන ජනතාව සමගත් අඛණ්ඩ ලෙස වෙළී ඇති එමෙන්ම සම්පූර්ණයෙන්ම සෝවියට් ප්‍රතිපත්ති වලට ආධාර කරන සමාජවාදී පාසලට පමණක් මෙය කළ හැකි බව, හැම දෙනෙකුටම පැහැදිලි ලෙස දැන් පෙනී ගොස් ඇත.

සත්තකින්ම අධ්‍යාපනය යළි ගොඩ නැගීම ලෙහෙසි කාර්යයක් නොවේ. සහජයෙන්ම වැරදි කර ඇත. දනුදු වැරදි කරති. අධ්‍යාපනය හා දේශපාලනය අතර ප්‍රධාන සම්බන්ධකම් වැරදි ලෙස පෙන්වීමටද එයට රළු සහ විකෘති තේරුමක් දීමටද වැර දරති. තරුණයින්ගේ බුද්ධිය දේශපාලනය සඳහා පිළියෙල වී නැති විටදී පවා, ඔවුන් තුළට දේශපාලනය කා වැද්ද වීම සඳහා නුහුරු ප්‍රයත්න කරති. මේ මූලික ප්‍රතිපත්ති මෙතරම් රළු ලෙස ක්‍රියාවේ යෙදවීමට විරුද්ධව නිසැක ලෙසම, අපි නිතර සටන් කළ යුතු වෙමු. එහෙත් ජාත්‍යන්තරයට සහ සෝවියට් ආණ්ඩුවට පක්ෂපාත වූ උගැන්වීමේ වෘත්තියෙහි යෙදී සිටින සාමාජිකයින්ගේ ප්‍රධාන කාර්යය විය යුත්තේ සියලු දෙනම ඇතුළත් කැර ගන්නා, හැකි තරම් පුළුල්, ගුරු සංගමයක් සෑදීමය.

ඔබේ සංගමයට, ජාත්‍යන්තරවාදීන්ගේ සංගමයට තැනක් නැත, මන්දයත් පැරණි ගුරු සංගමය ධනවාදී අගතිගාමිත්වයට එල්ලී කරුණු වටහා ගැනීමට අපොහොසත් බවක් හෙළිකළ බැවිනි. මේ වරප්‍රසාද රැක ගැනීමට 1917 විප්ලවයේ මුල් කාලයේදීම, සාදන ලද උසස් සංගම්වලට වඩා දීර්ඝවූද, අතිශයින්ම දීර්ඝ අරගලයක් ගෙනයන ලද්දේ මේ සංගමය විසිනි. මෙවැනි සංගම්වලට විරුද්ධව අපි සියලු ක්ෂේත්‍රවලට සටන් කර ඇත්තෙමු.මගේ මතය හැටියට ඔබගේ ජාත්‍යන්තරවාදී සංගමය, සමස්ත රුසියානු දෙවැනි වෘත්තීය සමිතිවල දෙවැනි සමුළුව ඉතා පැහැදිලි ලෙස පෙන්වා දුන් පරිදි, සෝවියට් ආණ්ඩුවේ ප්‍රතිපත්තියට පක්ෂපාත අනිකුත් වෘත්තීය සමිති මෙන් එකම ගුරු වෘත්තීය සංගමය වනු ඇත. ගුරුවරුන් මුණ පාන කාර්යය අති මහත්ය. පසුගිය විප්ලවය විසින් තබාගිය කුසීත භාවයේ සහ අසමගියේ නටබුන් නැති කරලීම සඳහා ඔවුහු සටන් කළ යුත්තාහ.

මීළඟට අපි උද්ඝෝෂණය පිළිබඳ ප්‍රශ්නය ගෙන බලමු. ගුරුවරුන්ගේ ධනපති කොටස් විසින් ගෙනයන කඩාකප්පල්කාරී වැඩ සහ ඔවුන්ගේ අගතිගාමී අදහස් නිසා ගුරුවරුන් අතර ඇතිවී තිබෙන අවිශ්වාසය ගැන අප කල්පනා කරන විට, ප්‍රචාරයේ සහ අධ්‍යාපනයේ සියලු ක්ෂේත්‍රවල අසමගිය තවමත් පැවතීම ස්වභාවික දෙයකි. මේ ධනපති කොටස් සැබෑ අධ්‍යාපනයට සුදුස්සන් විය යුත්තේ ධනපතීන් පමණක් බවද, වැඩකරන ජනතාවගේ බහුතරය හොඳ මෙහෙකරුවන් සහ හොඳ ශිල්පීන් හැටියට පුහුණු කළ යුතු අතර ජීවිතයේ ස්වාමිවරුන් බවට පත් නොකළ යුතුයයිද සිතති. මේ නිසා ගුරුවරුන්ගෙන් කොටසක් පටු ක්ෂේත්‍රයකට ව්‍යාජ — අධ්‍යාපනික ක්ෂේත්‍රයකට ඇද දමා තිබේ. මේ හේතුව නිසා මුළු මහත් ආචාර්ය සංහතිය එකට අනුබද්ධ කරන සහ අප සමග එක්වී කටයුතු කරන සංවිධානයක් නිසි ලෙස ගොඩ නැගීමට බාධා පැන නැගී ඇත. අපට ජයලබා ගත හැකි වන්නේ පැරණි ධනවාදී අගතිගාමී, ප්‍රාග් විනිශ්චය බැහැර කිරීමට අප සමත් වුවොත් පමණකි. ගුරුවරුන්ගේ පුළුල් කොටස් ඔබ වෙත ඇද ගැනීමත්, ගුරු වෘත්තියෙහි යෙදී සිටින ඉතා නොදියුණු කොටස් වලට අධ්‍යාපනයක් ලබාදීමත්, ඔවුන් පොදු නිර්ධන පංතික ප්‍රතිපත්තිය යටතට ගෙන ඒමත් සහ ඔවුන් පොදු සංවිධානයක් තුළ සමගි කර ලීමත් ඔබේ සංගමයේ කාර්යය වන්නේ මේ නිසාය.

අද අප.රට මුණ පා ඇති වත්මන් තත්ත්වය යටතේ, වෘත්තීය සමිති සංවිධානය අනුව, ගුරුවරුන් අත ඉතා බරුරුම් කටයුත්තක් ඇත්තේ, රටවැසි යුද්ධයේ කරුණු සියල්ල ඉතා පැහැදිලි වෙමින් පවතින විට, සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන මිනිසුන්ට සිද්ධීන්ගේ තර්කානුකූල නිගමනය නිසා සෝවියට් ආණ්ඩුවේ පැත්ත ගැනීමට සිදුවී තිබෙන විටදීය. වෙනත් ඕනෑම ප්‍රතිපත්තියක් ඔවුන්ගේ කැමැත්ත හෝ අකමැත්ත හෝ නොතකා, ප්‍රතිවිප්ලවීය බලවේගයන් සහ ජාත්‍යන්තර අධිරාජ්‍යවාදය ආරක්ෂා කිරීම වෙත නැඹුරු වී ඇති බව ඔවුන්ටම පෙනී ගොස් ඇති බැවිනි. දැන් මුළු මහත් ලෝකයම එකම ප්‍රධාන කාර්යයකට මුණ පා සිටී. ප්‍රශ්නය මෙයයි: එක්කෝ අන්ත ප්‍රතිගාමිත්වය, මිලිටරි ආඥාදායකත්වය සහ වෙඩි තැබීමය; බර්ලිනයෙන් ලැබෙන පුවත් අනුව මෙවැන්නක ඉතා විචිත්‍ර චිත්‍ර අපට පෙනේ; නැතිනම් අවුරුදු හතරක යුද්ධය නිසා දඬුවම් නොවිඳ බේරීමට පුළුවනැයි සිතන මේ මලේච්ඡ ධනපතීන්ගේ දුෂ්ට ප්‍රතිගාමිත්වය, වැඩකරන ජනතාවගේ ලෙයින් පෑවී තලය නැවීම සඳහා ඕනෑම දෙයක් කිරීමට සූදනම් වී සිටින අතර ඔවුන් පරදවා සමාජවාදී විප්ලවයක් තුළින් වැඩකරන ජනතාව ලබන පූර්ණ ජයග්‍රහණයය. අද මැද

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මාවතක් නැත. එබැවින්, මුල සිටම ජාත්‍යන්තරයට පක්ෂව සිටි ගුරුවරු තමන්ට විරුද්ධ කඳවුරේ සිටින ගුරුවරුන්ට දැන් දැඩි විරෝධයක් පළ නොකළ හැකි බව හොඳින් වටහා ගන්නා බැවින්, වඩාත් පුළුල් කටයුතු සඳහා ඉදිරියට යා යුත්තාහ. ගුරුවරුන්ගේ අති විශාල සංඛ්‍යාවක් ඒකරාශී කරන පුළුල් ගුරු වෘත්තීය සංගමයක් දක්වා, ඉතා ස්ථිර ලෙස සෝවියට් ප්‍රතිපත්තිවලට පක්ෂපාත, නිර්ධන පංතික ආඥාදායකත්වයක් මගින්, සමාජවාදය සඳහා ගෙන යන අරගලයට තීරණාත්මක ලෙස පක්ෂපාත වෘත්තීය සංගමයක් දක්වා පරිවර්තනය විය යුතුය.

දැනට රුස්වී සිටින, සමස්ත රුසියානු වෘත්තීය සමිතිවල දෙවැනි සමුළුව, මෙන්න මේ විධියේ නිගමනයකට එළඹිණි. එකම වෘත්තියක යෙදී සිටින, එකම ක්‍රියාකාරී ක්ෂේත්‍රයක යෙදී සිටින සෑම කෙනෙකුම එකම වෘත්තීය සමිතියකට ඇතුළු විය යුත්තාහ. ඒ අතරම ශ්‍රමය ප්‍රාග්ධනයෙන් මුදවා ගැනීම සඳහා කරන සටනේදී වෘත්තීය සමිතිවලට ඉන් ඈත් වී සිටිය නොහැකි බවද සමුළුව ප්‍රකාශ කරයි. ඉදින්, ඒ අනුව, නිර්ධන. පංතික ආඥාදායකත්වය විසින් සමාජවාදය සඳහා ගෙනයන විප්ලවවාදී පංති සටන පිළිගන්නාවූ සමිති වලට පමණක් වෘත්තීය සමිතිවල පූර්ණ සහ සමාන අයිතිවාසිකම් ඇති සාමාජිකයින් විය හැකිය. ඔබගේ සමිතිය මෙවැනි සමිතියකි. ඔබේ සමිතිය මේ ප්‍රතිපත්තිය දිගටම ගෙනයන්නේ නම්, ගුරුවරුන්ගේ අති විශාල බහුතරය ඔබේ පැත්තට දිනාගැනීමට ඔබට හැකිවනු සහතිකය. දැනුම හා විද්‍යාව වරප්‍රසාද ලැබූ අයට පමණක් සීමාවූ දෙයක් නොව, පොහොසතුන්ගේ හා සූරාකන්නන්ගේ තත්ත්වය ආරක්ෂා කරනු පිණිස යොදන මාධ්‍යයක් නොව, වැඩකරන සහ සූරාකනු ලබන ජනතාව මුදවා ගැනීම සඳහා අවියක් බවට පත් කිරීමට ඔබ සමත් වනු ඇත. මේ පරමාර්ථය මුදුන් පමුණුවා ගැනීමෙහි ලා ඔබට සෑම අතින්ම ජය ලැබේවායි පැතීමට මට අවසර දෙන්න.

එන්. ලෙනින් (වී. උලියානොව්)
ගේ එකතු කළ කෘතීන්වල
පළමුවැනි වරට 1926 දී ප්‍රසිද්ධ
කැරිණි.
වෙළුම 20, කොටස 2.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති,
වෙළුම 37, පිටු 430-433

මහා ආරම්භයක්

පසු පස සිටින කම්කරුවන්ගේ වීරත්වය. "කොමියුනිස්ට්වාදී ශ්‍රමදානය" පිළිබඳව

රතු හමුද සෙබළුන්ගේ වීරත්වය පිළිබඳ බොහෝ නිදසුන් පුවත්පත් වල පළ විය. කොල්චාක්ට, ඩෙනිකින්ට හා ඉඩම් හිමියන්ගේ හා ධනපතීන්ගේ අනිකුත් බලවේග වලට විරුද්ධව, සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණයන් ආරක්ෂා කරමින් කම්කරුවෝ සහ ගොවියෝ නිතර පාහේ වීරත්වය සහ ඉවසීම අතින් හාස්කම් පෙන්වා ඇත්තාහ. ගෙරිල්ලා හැඟීම්, විඩාව සහ විනය නොතැකීම් ක්‍රමයෙන් මැඩ පැවැත්වේ. මෙය සෙමින් සිදුවන අමාරු ක්‍රියාදාමයකි. එසේ වුවද, එය දියුණු වෙමින් පවතී. සමාජවාදයේ ජයග්‍රහණය සඳහා වැඩකරන ජනතාවගේ වීරත්වය විසින් ස්වේච්ඡානුගත පරිත්‍යාගයන් කෙරේ. රතු හමුදාවේ සහෝදරාත්මක විනයේ පදනම මෙය වන්නේය. යුද්ධ හමුදාව පුනර්ජීවයට පත්වෙමින්, ශක්තිය ලබමින් වැඩෙමින් පවතින බවට එය පදනමකි.

පසු පස සිටින කම්කරුවන්ගේ වීරත්වයද එතරම්ම උසස් සැලකිල්ලට භාජනය විය යුතුය. මේ අනුව,කම්කරුවන් තමන්ගේම උනන්දුව ඇතිව සංවිධාන කරන ලද කොමියුනිස්ට්වාදී ශ්‍රමදාන දිනය ඇත්ත වශයෙන්ම අති විශාල වැදගත් කමක් දරයි. අපට පෙනෙන පරිදි මෙය ආරම්භයක් පමණකි. එහෙත් මෙය සුවිශේෂ ඉමහත් වැදගත් කමකින් යුත් මහා ආරම්භයකි. ධනපති පංතිය පාලන බලයෙන් නෙරපා දැමීමට වඩා අසීරු, වඩාත් ප්‍රත්‍යක්ෂ, වඩාත් රැඩිකල් සහ වඩාත් තීරණාත්මක විප්ලවයක ආරම්භයකි. මන්දයත්, එය ගතානු ගතිකත්වය, සුළු ධනපති ආත්මාර්ථවාදය, පරදවා ලබාගත් ජයක් වන බැවිනි, ශාපලත් ධනවාදය විසින් කම්කරුවන්ට හා ගොවීන්ට තබාගිය උරුමය පරදවා ලබාගත් ජයක් වන බැවිනි. මේ ජයග්‍රහණය තහවුරු කරගත් ඉක්බිතිව පමණක් අළුත් සමාජමය විනය, අළුත් සමාජවාදී විනය,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිර්මාණය වනු ඇත; එවිට ධනවාදය දක්වා ආපසු යාමක් යළි කිසිදිනෙක ඇති නොවන්නේය, එවිට කොමියුනිස්ට්වාදය සැබවින්ම අනභිභවනීය වන්නේය.

අ. ජ. නමින් මැයි 17 ද "ප්‍රාව්ද" පුවත්පතෙහි "විප්ලවවාදී ලෙස වැඩ කිරීම (කොමියුනිස්ට්වාදී ශ්‍රමදනයක්)" යන මැයෙන් ලිපියක් පළ විය. මෙම ලිපිය කෙතරම් වැදගත්ද යත් අපි එය සම්පූර්ණයෙන්ම යළි ප්‍රසිද්ධ කරමු:

විප්ලවවාදී ලෙස වැඩ කිරීම

(කොමියුනිස්ට්වාදී ශ්‍රමදනය)

විප්ලවවාදී ලෙස වැඩ කිරීම පිළිබඳව රුසියන් කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ලියුම කොමියුනිස්ට් සංවිධානවලට සහ කොමියුනිස්ට් වරුන්ට බලගතු උත්තේජනයක් විය. උද්යෝගයේ පොදු රළ වේගය විසින් දුම්රිය කම්කරුවන් පෙරමුණට ගැනිණි. එහෙත් බහුතරයට තම වගකිව යුතු වැඩ අත හැර යාමට හෝ විප්ලවවාදී ලෙස වැඩකිරීමේ ආකාරයන් සොයා ගැනීමට හෝ නොපුළුවන් විය. කැදවා පුහුණු කිරීමේ වැඩ කටයුතු ප්‍රමාදවීම සහ කාර්යාලයීය නිලධාරිවාදය පිළිබඳව වාර්තා නිසා දුම්රිය ධාවන කටයුතු ගැන සිය සැලකිල්ල යොමු කිරීමට මොස්කව් — කසාන් දුම්රිය දිස්ත්‍රික්කයට සිදුවිය. කම්කරු හිඟය නිසාත්, ශ්‍රම ඵලදව ඉතා පහත් තත්ත්වයක තිබීම නිසාත් හදිසි ඇණවුම් සහ දුම්රිය යන්ත්‍ර අළුත් වැඩියා කිරීම පමාවිය. මැයි මස 7 ද මොස්කව් — කසාන් දුම්රිය දිස්ත්‍රික්කයේ කොමියුනිස්ට්වරුන්ගේ හා හිතවතුන්ගේ රැස්වීමේදී කොල්චාක් පරදවා ජය ලබා ගැනීමේදී කටින් නොව ක්‍රියාවෙන් ආධාර දීමේ ප්‍රශ්නය මතුවිය. පහත සටහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී:

"දේශීය හා විදේශීය තත්ත්වය බරපතළ වීම නිසා, පංති සතුරා පරදවා ජය ලබා ගනු වස්, කොමියුනිස්ට්වරුන් සහ කොමියුනිස්ට් හිතවතුන් තම විවේක කාලයෙන් තව පැයක් අඩු කළ යුතුය, එනම් තම වැඩ දිනය පැයකින් වැඩි කළ යුතුය. මේ වැඩි පැය එකට එකතු කොට, ක්ෂණික ප්‍රයෝජනයට ගත හැකි සැබෑ වටිනාකම් බිහි කිරීම සඳහා සෙනසුරාදට අමතර පැය හයක් වැඩ කළ යුතුය. විප්ලවයේ ජයග්‍රහණය සඳහා කොමියුනිස්ට්වාදීන් සිය සෞඛ්‍යය සහ ජීවිතය නොතකා ක්‍රියා කළ යුතු බැවින් මේ වැඩ වැටුප් රහිතව කළ යුතුය. කොමියුනිස්ට් ශ්‍රමදන (සෙනසුරාද) දිනයන් දිස්ත්‍රික්කයේ හැමතැනම පටන් ගෙන කොල්චාක් පරදවා පූර්ණ ජය ලබාගන්නා තුරු කරගෙන යා යුතුය".

තරමක දෙගිඩියාවකින් ඉක්බිතිව, මෙම යෝජනාව ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

වැඩ කළ ස්ථානය	වැඩවල ස්වරූපය	වැඩ කළ සංඛ්‍යාව	වැඩ කළ පැය ගණන: එක් හිසකට	වැඩ කළ පැය ගණන: එකතුව	සපුරාලූ වැඩ
මොස්කව්. ප්‍රධාන දුම්රිය යන්ත්‍ර වැඩශාලා	මාර්ගවලට අවශ්‍ය ද්‍රව්‍යද, දුම්රිය යන්ත්‍ර සහ මැදිරි අළුත් වැඩියා කිරීමට මෙවලම්ද පෙරෝ	48	5	240	පූඩ් 7,500 පැටවූහ. පූඩ් 1,800 බෑහ.
	වො — මුරම් — අලතිර් සහ	21	3	63	
	සිස්රන් සඳහා පැටවීම	5	4	20	
මොස්කව්. මගීන්ගේ ඩිපෝව	දුම්රිය යන්ත්‍රවලට සංකීර්ණ — ජංගම අළුත්වැඩියා	26	5	130	දුම්රිය යන්ත්‍ර $1\frac{1}{2}$ අළුත්වැඩියා කරන ලදී.
මොස්කව්. ෂන්ටින් ඩිපෝව	දුම්රිය යන්ත්‍රවලට ජංගම අළුත් වැඩියා	24	6	144	දුම්රිය යන්ත්‍ර දෙකක් සම්පූර්ණ කරන ලදී. යන්ත්‍ර හතරක අළුත්වැඩියා කළ යුතු කොටස් ගලවා දමන ලදී.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

වැඩ කළ ස්ථානය	වැඩවල ස්වරූපය	වැඩ කළ සංඛ්‍යාව	වැඩ කළ පැය ගණන		සපුරාලූ වැඩ
			එක් හිසකට	එකතුව	
මොස්කව්. දුම්රිය මැදිරි අංශය	මගීන් ගෙනයන දුම්රිය මැදිරි-වලට අළුත්වැඩියා කිරීම	12	6	72	3 පංතියට අයත් දුම්රිය මැදිරි දෙකකි.
පෙරෝවො. ප්‍රධාන මැදිරි වැඩ පොළ	සෙනසුරාද සහ ඉරිද දවස්වලදී	46	5	230	පෙට්ටි මැදිරි දොළසක් සහ ප්ලැට් මැදිරි දෙකකි.
	මැදිරි අළුත්වැඩියා කිරීම සහ කුඩා අළුත්වැඩියා කිරීම	23	5	115	
	එකතුව	205	—	1,014	දුම්රිය යන්ත්‍ර හතරක් සහ මැදිරි දහසයක් සම්පූර්ණයෙන් අළුත්වැඩියා කරන ලදී. පටවනු ලැබූ සහ බානු ලැබූ පූඩ් ගණන 9,300 කි.

"මැයි 10 සෙනසුරාද හවස හයට කොමියුනිස්ට්වාදීහු සහ හිතවත්තු සෙබළුන් සේ විත් පෙළ ගැසුනහ. කිසිදු හිරිහැරයක් නැතිව නඩ නායයින් විසින් ඔවුන් විවිධ වැඩවලට ගෙන යනු ලැබීය.

විප්ලවවාදී ලෙස වැඩ කිරීමේ ප්‍රතිඵල ඉතා පැහැදිලිව පෙනෙන්නට තිබේ. පහත පෙනෙන සටහන සපුරාලූ වැඩ පිළිබඳ විස්තරයක් සපයයි.

සාමාන්‍ය වැටුප් ගණන අනුව කරන ලද වැඩවල සම්පූර්ණ වටිනාකම රූබල් පනස් ලක්ෂයකි. අතිකාල දීමනා අනුව මෙහි වටිනාකම තවත් සියයට පනහකින් වැඩිය.

වැගන්වලට බඩු පැටවීමේ ශ්‍රම ඵලදව නිතිපතා කම්කරුවන්ගේ ඵමත් සියයට 270 කි. අනිකුත් වැඩවල ශ්‍රම ඵලදවද මෙයට සමානය.

කම්කරු හිහය සහ දෙපාර්තමේන්තු නිලධාරිවාදය නිසා දවස් හතක සිට මාස තුනක් දක්වා වූ කාලයක් තිස්සේ පමා වෙමින් තුබූ (ක්ෂණික) වැඩ සපුරාලන ලදී.

"උපකරණවල (ලෙහෙසියෙන් අළුත් වැඩියා කළ හැකි) අයහපත් තත්ත්වය නිසා සමහර භාණ්ඩායම්වල වැඩ විනාඩි තිහේ සිට හතළිහ දක්වා පමාවූණද වැඩ සියල්ල සපුරාලන ලදී.

වැඩ භාර දෙන පරිපාලකයින්ට අළුත් වැඩ ඉල්ලා සිටින කම්කරුවන්ගේ වේගයට සමාන වීමට නොපුළුවන් විය. මේ කොමියුනිස්ට්වාදී ශ්‍රමදාන දිනයේදී කරන ලද වැඩ පංති හැඟීමක් නැති සහ කුසීත කම්කරුවන් සතියකදී කරන වැඩට සමාන යැයි එක් පැරණි නඩ නායකයෙක් (පෝමන් කෙනෙක්) ප්‍රකාශ කළ විට එය සුළු අතිශයෝක්තියක් පමණක් විය.

කොමියුනිස්ට්වාදීන් නොවන, සෝවියට් ආණ්ඩුවේ අවංක ආධාර කරුවන් බොහෝ දෙනෙක් මේ වැඩවලට සහභාගි වූ නිසාත් අනාගත ශ්‍රමදානවලට බොහෝ දෙනෙකු සහභාගි වීමට බලාපොරොත්තු වන නිසාත්, මොස්කව් — කසාන් දුම්රිය මාර්ගයේ කොමියුනිස්ට්වාදී දුම්රිය කම්කරුවන්ගේ ආදර්ශය අනිකුත් දිස්ත්‍රික්ක අනුගමනය කිරීමට කැමති නිසාත්, පළාත්වලින් ලැබී ඇති වාර්තා අනුව සංවිධානාත්මක අංශය මම සවිස්තර ලෙස විස්තර කරමි.

"මේ වැඩලට සහභාගි වූ පළාත් බද ස්ථිර සේවයේ යෙදී සිටින අයගෙන් සියයට දහයක් පමණ කොමියුනිස්ට් පාක්ෂිකයෝ වෙති. ඉතිරි අය වගකිව යුතු නිල දරන තෝරාපත් වුණු අය වෙති. මොවුනතර දුම්රිය කොමසාරිස්ගේ සිට එක් එක් ව්‍යවසායයක කොමසාරිස්වරුද, වෘත්තීය සමිතිවල නියෝජිතවරු සහ ප්‍රධාන කාර්යාලයේ සහ දුම්රිය කොමසාරිස් අංශයේ සේවකයෝද වෙති.

ශ්‍රම දානයේදී පෙන්වන ලද උනන්දුව සහ සමූහ ජීවය ඉතා විශිෂ්ට විය. කම්කරුවන්, ලිපිකරුවන් සහ ප්‍රධාන කාර්යාලයේ ලිපිකරුවන් මුවින් නොබැණ, තර්ක නොකර, පූඩ් හතළිහක් තරම් බරැති මැදිරියේ වීල් ටයරය කඩිසර කුහුඹුවන් රැළක් සේ පෙරළාගෙන ගොස් නියමිත ස්ථානයේ තැබූ විට, මෙම සමූහායන්ත ප්‍රයත්නය දකින කෙනෙකුගේ හදවත ප්‍රීතියෙන් පිනා ගියේය. කම්කරු පංතියේ ජයග්‍රහණය නොසෙල්විය හැකිය යන අධිෂ්ඨානය තවත් ශක්තිමත් විය. ජයග්‍රාහී කම්කරුවන් විනාශ කිරීමට ජාත්‍යන්තර සොරුන් අපොහොසත් වන අතර

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දේශීය කඩාකප්පල් කරුවන්ට කොල්චාක් දැකීමට කිසි දිනෙක නොහැකි වනු ඇත.

ශ්‍රමදානය අවසන් වූ විට, මෙතෙක් නොදුටු විරූ දෙයක් අපි දුටිමු. විඩාපත්වැ සිටි කොමියුනිස්ට්වාදීහු සිය දෙනෙක් දීප්තිමත් නෙත්වලින් යුතුව ඔවුන්ගේ ජයග්‍රහණයට උපහාරයක් වශයෙන් ''ජාත්‍යන්තර ගීතය'' ගායනා කළහ. ජයග්‍රාහී ගීතයේ ජයග්‍රාහී රළවේගය කම්කරු පංතික මොස්කම් නගරයේ පවුරු පිසගෙන, පොකුනකට වීසිකළ ගල් කැටයක් නිසා ඇතිවන රැළි විහිද යන්නා සේ මුළු මහත් කම්කරු පංතික රුසියාව පුරා විහිද ගොස් විඩාපත්වූන් සහ කුසීතයින් ප්‍රබෝධමත් කරනු ඇත.

ආ. ජ.

අනුගමනය කිරීමට තරම් වටනා ඉතා අගනා ආදර්ශය ගැන අගැයීමක් කළ එන්. ආර්. සහෝදරයා එම සිරස්තලය යටතේ මැයි 20 ද ''ප්‍රාව්ද'' පුවත්පතේ මෙසේ ලියුවේය:

''කොමියුනිස්ට්වාදීන් මෙලෙස වැඩ කිරීමේ සිද්ධීන් විරල දෙයක් නොවේ. එක් විදුලිය බල මධ්‍යස්ථානයක සහ දුම්රිය මාර්ග කීපයක මෙවැනි සිද්ධීන් ගැන මම දනිමි. දුම්රිය යන්ත්‍ර කරකැවීමට යොදන වලක වැටුණු දුම්රිය යන්ත්‍රයක් ගොඩ ගැනීම සඳහා නිකොලායෙව්ස්කායා දුම්රිය ස්ථානයේ කොමියුනිස්ට්වරු සේවා කාලයට අමතරව රාත්‍රී කීපයක්ම වැඩ කළහ. ශීත කාලයේදී උතුරු දුම්රිය මාර්ගයේ කොමියුනිස්ට්වරු සහ හිතවත්තු දුම්රිය මාර්ගයේ තිබූ හිම පිස දැමීම පිණිස ඉරිදා කීපයක්ම වැඩ කළෝය. කොමියුනිස්ට් පක්ෂ ශාඛාවල සාමාජිකවරු සොරකම් නැතිකිරීම සඳහා දුම්රිය ස්ථානවල මුර සේවාවේ යෙදෙති. එහෙත් මේවා ඉඳහිට සහ ක්‍රමානුකූලත්වයෙන් තොරව කෙරෙන වැඩ වූයේය. මොස්කව් — කසාන් දුම්රිය මාර්ගයේ සහෝදරවරු මෙම වැඩ ක්‍රමවත් කොට ඒවා ස්ථාවර කළහ. මෙය නව ලක්ෂණයකි. ඔවුහු සිය යෝජනාව මගින්, ''කොල්චාක් පරදවා පූර්ණ ජයග්‍රහණය ලබා ගන්නා තුරු'' යැයි පවසති. ඔවුන්ගේ වැඩවල වැදගත්කම රඳා පවත්නේ එතැනය. යුද්ධ තත්ත්වය පවතින තුරු කොමියුනිස්ට්වරු සහ හිතවත්තු සිය දෛනික සේවා කාලය පැයකින් වැඩි කළහ. එමෙන්ම ඔවුන්ගේ ශ්‍රමඵලදාවද උසස් ආදර්ශයකි.

මේ ආදර්ශය නිසා තව දුරටත් තරඟයක් ඇතිවන අතර, එවැන්නක් ඇතිවීමද නියතය. අලෙක්සාන්ද්‍රොව්ස්කයා දුම්රිය මාර්ගයේ කොමියුනිස්ට්වරුන්ගේ සහ හිතවතුන්ගේ පොදු සභා රැස්වීමේදී, මිලිටරි තත්ත්වය ගැන සාකච්ඡා කිරීමෙන් සහ මොස්කව් — කසාන් දුම්රිය මාර්ගයේ සහෝදරවරුන් සම්මත කැරගත් යෝජනාව සාකච්ඡා කිරීමෙන් ඉක්බිතිව, මෙලෙස තීරණය කළහ: 1) අලෙක්සාන්ද්‍රොව්ස්කයා දුම්රිය මාර්ගයේ කොමියුනිස්ට්වරුන් සහ හිතවතුන් සඳහා ශ්‍රමදාන සෙනසුරාදාවන් සංවිධාන කිරීම; පළමුවැනි ශ්‍රමදාන සෙනසුරාද මැයි 17 දය. 2) කොමියුනිස්ට්වාදීන් සහ හිතවතුන් සඳහා ආදර්ශ ශ්‍රම කණ්ඩායම් සංවිධානය කිරීම; වැඩකළ යුත්තේ කෙසේද යන්න

කම්කරුවන්ට පෙන්වීමත්, දැනට තිබෙන ද්‍රව්‍ය සහ උපකරණ අනුව සහ ආහාර තත්ත්වය අනුව කළ හැක්කේ මොනවාද යන්න පෙන්වීමත් මෙම ශ්‍රම කණ්ඩායම් විසින් කළ යුතුය.

තම ආදර්ශය අති විශාල හැඟීමක් ඇති කළ අතර ඊළඟ සෙනසුරාදට ශ්‍රමදානය සඳහා අපාක්ෂික අති විශාල සංඛ්‍යාවක් කම්කරුවන් ඉදිරිපත් වෙතියි මොස්කව් — කසාන් සහෝදරවරු ප්‍රකාශ කරති. මා මෙම වචන ලියනවිටදී වුව, අලෙක්සාන්ද්‍රොව්ස්කයා දුම්රිය වැඩපොළේ කොමියුනිස්ට්වාදීන් අතිකාල වැඩ තවම පටන් ගෙන නැත. එහෙත් කොමියුනිස්ට්වරුන් එලෙස වැඩ කිරීමට යතියි ආරංචිය පැතිර ගිය විගසම අපාක්ෂික කම්කරුවෝ කැළඹුනාහ: ''ඊයේ සිදුවූ දේ ගැන අප දැනගෙන සිටියේ නැහැ. නැත්නම් අපත් ඊයේ වැඩකරනවා'' යි ඔවුහු පැවසූහ. ''ලබන සෙනසුරාදට අපි නොවරදවා එමු'' යි හැම කෙනෙක්ම කියන්නට වූහ. මෙවැනි වැඩ වලින් ඇති කරන ලද හැඟීම ඉතා ශ්‍රේෂ්ඨය.

මොස්කව් — කසාන් දුම්රිය සහෝදරවරුන්ගේ ආදර්ශය පසුපස ඇති සියලු කොමියුනිස්ට් ශාඛා විසින් අනුගමනය කළ යුතුය. මොස්කව් මං සන්ධියේ ඇති කොමියුනිස්ට් ශාඛා පමණක් නොව රුසියාව පුරා පිහිටුවා ඇති සියලු පක්ෂ ශාඛා විසින් අනුගමනය කළ යුතුය. කොමියුනිස්ට් පක්ෂයේ ගම්බද ශාඛා පළමුවෙන්ම රතු හමුද සෙබළුන්ගේ ඉඩම්වල ගොවිතැන් පටන් ගෙන එමගින් ඔවුන්ගේ පවුල් වලට ආධාර කළ යුතුය.

මොස්කව් — කසාන් දුම්රිය මාර්ගයේ සහෝදරවරුන් සිය කොමියුනිස්ට්වාදී ශ්‍රමදාන සෙනසුරාදාව අවසන් කළේ ජාත්‍යන්තර ගීතය ගායනා කරමිනි. රුසියාව පුරා ඇති කොමියුනිස්ට්වාදී සංවිධාන මෙම ආදර්ශය අනුගමනය කරමින් එය ක්‍රමවත් ලෙස ක්‍රියාවේ යොදවන්නේ නම්, රුසියානු සෝවියට් ජනරජය, ඉදිරියට ඇති බරපතළ මාසවලදී, ජනරජයේ සියලු වැඩ කරන ජනතාව විසින් ගයන ජාත්‍යන්තර ගීතයේ රළ වේගයෙන් සියලු අමාරුකම් අභිභවා ජයගනු නියතය.

''කොමියුනිස්ට්වාදී සගයිනි, වැඩට බසින්න!''

1919 මැයි 23 ද ''ප්‍රාව්ද'' මෙසේ වාර්තා කළාය:

''මැයි 17 ද අලෙක්සාන්ද්‍රොව්ස්කයා දුම්රිය මාර්ගයේ පළමුවැනි කොමියුනිස්ට්වාදී ශ්‍රමදාන සෙනසුරාද දිනය පැවැත්විණි. ඔවුන්ගේ පොදු සභා රැස්වීමේදී සම්මත කරගත් යෝජනාව අනුව, කොමියුනිස්ට්වාදීහු සහ හිතවත්හු අනූ අට දෙනෙක් වැටුප් රහිතව පැය පහක අතිකාල වැඩක යෙදුණහ. ඔවුනට ලැබුණු එකම පාරිතෝෂය අමතර ආහාර වේලකි. කය වෙහෙසා වැඩ කරන කම්කරුවන් වශයෙන් ඔවුනට ආහාරය සමග පාන් රාත්තල් බාගයක් බැගින් වැඩිපුර ලැබිණි''.

වැඩ පිළියෙල කිරීම සහ සංවිධානය අයහපත් වුණද, ශ්‍රම ඵලදාව සාමාන්‍ය තත්ත්වයට වඩා දෙතුන් ගුණයකින් උසස් විය.

නිදසුන් කීපයක් මෙන්න:

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ටර්නර්වරු පස්දෙනෙක් පැය හතරක් තුළදී ස්පින්ඩ්ල් ඉදි අසූවක් සෑදූහ. මෙහි ශ්‍රම ඵලදාව සාමාන්‍ය තත්ත්වයට වඩා සියයට 213 කින් වැඩිය.

නුපුහුණු කම්කරුවෝ විසිදෙනෙක් පැය හතරක් තුළදී සුන්බුන් ද්‍රව්‍ය පූඩ් 600 ක්ද, පූඩ් $3\frac{1}{2}$ බැගින් බරැති ආස්තෘත මැදිරි දුනු හැත්තෑවක්ද එකතු කළහ. මේවායේ සම්පූර්ණ බර පූඩ් 850 කි. ශ්‍රම ඵලදාව සාමාන්‍ය තත්ත්වයට වඩා සියයට 300 කින් වැඩිය.

"සාමාන්‍ය වැඩවලදී එපාවූ ගතියක් සහ විඩාපත් ගතියක් ඇතිවන අතර ශ්‍රමදානයේදී තමන් අධිෂ්ඨානයකින් සහ උනන්දුවකින් වැඩ කළ බව මෙයට හේතු වශයෙන් සහෝදරවරු පෙන්වා දෙති. දැන්, කෙසේවුවද, කොමියුනිස්ට්වාදී ශ්‍රමදාන සෙනසුරාද පෙන්වූ ශ්‍රම ඵලදාවට වඩා අඩු ශ්‍රම ඵලදාවක් නිතිපතා වැඩ වලදී පෙන්වීමට ඔවුහු මැලි වෙති.

"දැන්, අපාක්ෂික බොහෝ කම්කරුවෝ තමන් ශ්‍රමදාන සෙනසුරාද වලට සහභාගී වීමට කැමති බව ප්‍රකාශ කරති. වැඩ ගැනීමට බැරි යැයි තීරණය කොට විසිකර දමා ඇති දුම්රිය යන්ත්‍ර යළිත් අළුත් වැඩියා කොට සේවයට යෙදීමට දුම්රිය යන්ත්‍ර සේවකයෝ සිය කැමැත්තෙන් ඉදිරිපත් වී සිටිති.

"මෙවැනිම ශ්‍රමදාන සෙනසුරාදවන් වියාස්මා දුම්රිය මාර්ගයේ කම්කරුවන්ද පැවැත්වීමට සූදානම් බව වාර්තා වී ඇත".

කොමියුනිස්ට්වාදී ශ්‍රමදාන සෙනසුරාද වලදී වැඩ කෙරෙන්නේ කෙසේද යන්න ආ. ද්‍යාවෙන්කෝ සහෝදරයා "ප්‍රාව්ද" ජූනි 7 ද පුවත්පතේ මෙලෙස විස්තර කළේය. "ශ්‍රමදාන සුබෝත්නික් කම්කරුවකුගේ සටහන්" නැමැති සිරස් තලය යටතේ එය පළවිය. අපි එහි ප්‍රධාන කොටස මේ ලිපියේ උපුටා දක්වමු:

"පක්ෂයේ දුම්රිය දිස්ත්‍රික් කමිටුවේ තීරණයක් පරිදි, සූදානම් කරන ලද සුබ්බෝත්නික් ශ්‍රමදානයට මාත් තවත් සගයකුත් ගොස් අපේ "කාර්යය" ඉටු කළේ සතුටකිනි. එක්තරා කාලයකින් පසු පැය කීපයකට මගේ හිසට විවේකයක්ද මගේ මස් පිඩු වලට ව්‍යායාමයක්ද මම ලබා දුනිමි... අපට වැඩ කිරීමට නියමිතව තිබුණේ දුම්රිය වඩුමඩුවේය. අපි එහි ගියෙමු. අප හඳුනන අය එහි කීපදෙනෙකු සිටියෙන් ඔවුන් සමග ආචාර — සමාචාර හුවමාරු කර ගතිමු. තරමක් වේලා සතුටු සාමීචියෙහි යෙදී සිට, වැඩට පැමිණ සිටින අය ගැන බලා ඔවුන් සංඛ්‍යාවෙන් තිහක් බව දැනගතිමු... අප ඉදිරිපිට "දැවැන්තමය" වාෂ්ප බොයිලේරුවකි. එහි බර පූඩ් හය, හත් සියයකට අඩු නොවේ. අපට අයත් කාර්යය වූයේ එම බොයිලේරුව "ඔසවාගෙන යාමය" එනම් වියෝර්ස්ට් තුනෙන් පංගුවක් පමණ දුර පිහිටි ගබඩාවට එය ගෙන යාමය. අපට සැක ඇති විය... කෙසේවුවද, අපි වැඩට බැස්සෙමු. සමහර සගයින් බොයිලේරුව යටට ලී කොට දමා එයට කඹ දෙකක් බැන්දහ. අපි එය ඇදගෙන යන්නට වීමු. ඉතා අකමැත්තෙන් මෙන් බොයිලේරුව සෙළවිණි. අපි සතුටු වීමු. මන්දයත්, අප සංඛ්‍යාවෙන් අඩු පිරිසක් වූ බැවිනි... සති දෙකක් තිස්සේ මේ බොයිලේරුව අපේ ප්‍රයත්නයට විරුද්ධව සිටියේය. සංඛ්‍යාවෙන් අපට වඩා තෙගුනයක් වැඩි කොමියුනිස්ට්වාදීන් නොවන කම්කරුවෝ එය ඇදගෙන යාමට උත්සාහ ගත්හ, එහෙත් අසාර්ථක විය. අපි සමත් වීමු... අපි වෙහෙස මහන්සි වී පැයක් අපේ නඩ නායකයාගේ අණ අනුව — එකයි, දෙකයි, තුනයි — වැඩ කළෙමු. බොයිලේරුව පෙරළෙන්නට විය. හිටිහැටියේම ව්‍යාකූලත්වයක් ඇති විය. අපේ සමහර සගයෝ බිම ඇද වැටුණහ. එය සිනහ උපදවන දර්ශනයක් විය. කඹය කැඩී යාම නිසා ඔවුන් බිම ඇද වැටිණි... විනාඩියක පමාවීමකි. වඩාත් ශක්තිමත් කඹයක් සොයා ගන්නා ලදී... හවස් වන්නට විය. ඇඳිර පැතිරිණි. අප කුඩා ගැටයක් වැනි උස් බිමක් හරහා බොයිලේරුව ගෙන යා යුතුය. එවිට අපේ වැඩේ නිමාවට පත් වේ. අපේ බාහුවල වේදනාවක්ද අත්ල ගිනිගත් කලෙකද මෙන් විය. අපි මුළු වැර යොදා කඹය අදින්නට වීමු. බොයිලේරුව අපි සමග ඇදෙන්නට විය. මෙතෙක් වේලා පසෙකට වී බලා සිටි "පරිපාලකයින්ට" ලජ්ජා සිතුන නිසාදෝ ඔවුහු කඹය අතින් ගෙන අප සමග එක්වී අදින්නට වූහ. "දැන් තමා උදව් කරන්නට ඕන වෙලාව!" රතු හමුදාවේ සෙබළෙක් අපේ වැඩ නිරීක්ෂණය කරන්නට විය. ඔහු අත ඇකෝඩියනයකි. ඔහු සිතුවේ මොනවා ගැනද? මේ මිනිසුන් කවුද? හැම කෙනෙකුම ගෙදර ඉන්නා විට, සෙනසුරාද ඔවුන් වැඩ කරන්නේ මන්ද? ඔහුගේ ප්‍රහේලිකාවට පිළිතුරු සපයමින් මම ඔහුට මෙසේ කියුවෙමි: "අපට ජොලි සින්දුවක් වාදනය කරන්න, සහෝදරයා! අපි නිකම් ළපටි එවුන් නොවේ. සැබෑ කොමියුනිස්ට්වාදීන්. ජේනව නේද ගිනි කසේට වැඩ කෙරෙන හැටි? අපි කම්මැලියෝ නොවේ. අප මුළු ශක්තිය යොදා වැඩ කරනවා!" පිළිතුරු වශයෙන් සෙබළා ඇකෝඩියනය බිම තබා කඹය දැතින් ගෙන අදින්නට විය.

"දුබිනුෂ්කා" නැමැති ගීතය උ. සහෝදරයා ගයන්නට වූයේ සැනෙකිනි. ඔහු මඳක් බැරැඩි හඬකින් ලස්සනට ගයන්ට වූයේය. අපි තිදෙනෙක් ඔහු අනුගමනය කරමින් ගැයීමු.

අප වැඩට පුරුදු අය නොවූයෙන්, අපේ මස් පිඩු විඩාවට පත්ව අපේ උරහිස් හා කොඳු ඇට කකියන්නට විය... එහෙත් හෙට නිවාඩු දවසකි. අපට ඕනෑ තරම් නිදාගෙන විවේක ගත හැකිය. අපේ අරමුණ ලං විය. තරමක අකමැත්තකින් පසු අපේ "දැවැන්තයා" ගබඩාව ළඟටම පෙරළෙමින් ගියේය. බොයිලේරුවට යටින් ලෑලි කීපයක් දමා එය තරමක් යටින් උස්සාලිය යුතුය. "දැන් ඉතින් බොයිලේරුව තමාගෙන් බොහෝ කලක් තිස්සේ බලාපොරොත්තුවන වැඩ ඉටු කළාවේ". පළාත්බද පක්ෂ ශාඛාවේ සමාජ ශාලාවට අපි පිරිස පිටින් ගියෙමු. කාමරය දීප්තිමත් ලෙස ආලෝක කර තිබිණි. බිත්තිවල පෝස්ටර අලවා තිබිණි. රයිපල් තුවක්කු කීපයක් පෙළට තබා ඇත. අපි ඉතා ලස්සනට "ජාත්‍යන්තර ගීතය" ගායනා කළෙමු. අනතුරුව අපට රම් සහිත තේ පැන් සංග්‍රහයක්ද, පාන්ද ලැබිණි. බොහෝ වෙහෙස

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වී වැඩ කළ ඉක්බිතිව අපට, පළාත්බද සගයින් විසින් කරන ලද මෙම සංග්‍රහය ඉතා අගනා එකක් විය. අපි අපේ සගයින්ගෙන් සහෝදරාත්මක ලෙස සමුගෙන, පෙළට සිට ගතිමු. රාත්‍රී නිහඬතාවය බිඳලමින්, නිදිබර වීදිවල අපේ විප්ලවීය ගීත රැව් දෙන්නට විය. අපේ පා නැග්ම ගීතවල රිද්මය සමග ගැළපිණි. ''සගයනි! රණ හඬ පැතිරේ!'' නැමැති ගීතය සහ ''ජාත්‍යන්තරය'' ද, කම්කරු ගීතද ගායනා කළෙමු.

''සතියක් ගෙවිණි. අපේ අත් පා වල හා කොඳු ඇට වල වේදනාව අතුරුදහන් වී ඇත. ඊළඟ සෙනසුරාදහි තවත් ශ්‍රමදානයක් සඳහා ඩිපෝව නවයක් ඇත පෙදෙසකට ගියෙමු. අපට ඇති කාර්යය දුම්රිය මැදිරි අළුත් වැඩියා කිරීමය. අප යන්නේ පෙරොවො දුම්රිය ඩිපෝවටය. ''ඇමෙරිකන්'' මැදිරියක පියස්සට නැග ගත් සගයෝ වහත් වූ උනන්දුවකින් ''ජාත්‍යන්තරය'' ගායනා කළහ. දුම්රියෙන් ගමන් කළ මගීහු විමතියෙන් එයට සමන් දුන්හ. දුම්රිය රෝද ගැටෙමින් ශබ්දයක් නගයි. පියස්සට නැග ගැනීමට අපොහොසත් වූ කීපදෙනෙක් පා පුවරුවේ එල්ලී ගෙන 'නිරහය' මගීන් මෙන් ගමන් කළහ. දුම්රිය නැවතුම් පොළක නවත්වන ලදී. අපි අපට ඕනෑ ස්ථානයට පැමිණියෙමු. අපි දිගැති වත්තක් හරහා ගමන් කළෙමු. එහිදී අප කොමිසාර් ග. සහෝදරයා විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

''වැඩ නම් මහ ගොඩකි. එහෙත් ඒවා කිරීමට ඉන්නේ ටික දෙනෙකි! අපේ පිරිස සංඛ්‍යාවෙන් තිස් දෙනෙකි. පැය හයකදී අප මැදිරි දහතුනක් අළුත් වැඩියා කිරීමට සමත් විය යුතුය. දෙබිඩි රෝද දූනටමත් සටහන් කර ඇත. මැදිරි සිස් කළ යුතුවා පමණක් නොව, සිස්ටර්නයක්ද පිරී ඇත... එහෙත් මේවා අමාරු වැඩ නොවේ. අපි මේවා සපුරාලමු, සහෝදරවරුනි!''

''වැඩ කඩිසර ලෙස කෙරෙන්නට විය. මා සහ තවත් සහෝදරවරු පස්දෙනෙක් නංවන යන්ත්‍රයේ වැඩ කරන්නට වූහ. අපේ උරහිස්වල පීඩනය සහ නංවන යන්ත්‍රයේ ආධාරයෙන්ද, නඩ නායකයාගේ අණ අනුවද පූඩ් හැටක් — හැත්තෑවක් බැගින් බරැති දෙබිඩි රෝද එක් පීලි යුගලක සිට තවත් පීලි යුගලයකට ප්‍රාණවත් ලෙස මාරු විය. එක් යුගලයක් අතුරුදහන් වන විට, ඒ වෙනුවට තවත් යුගලයක් දිස්විය. අවසානයේදී අප හැම දෙනාටම නියමිත ස්ථාන ලැබිණි. ඉක්මණින්ම පැරණි සුන්බුන් අපි ගබඩාවකට දැමීමු... එකයි, දෙකයි, තුනයි, ... නංවන යන්ත්‍රය විසින් ඒවා නිවේශයකදී පීළි වලින් වෙන් කරන ලදී. තරමක් ඈතින් අඳුර බිඳගෙන මිටි නගන ශබ්දය අපට ඇසේ. අපේ සගයෝ මී මැස්සන් මෙන් කඩිසර ලෙස දුම්රිය මැදිරි අළුත් වැඩියා කරති. සමහරු වඩුවන් මෙන් වැඩ කළහ. අන් සමහරු තීන්ත ගාන්නට වූහ. තවත් සමහරෙක් වහළවල් අළුත් වැඩියා කළහ. මෙය කොමිසාර් සහෝදරයාගේත්,' අපේත් ප්‍රීතියට හේතු විය. යකඩ වැඩ කරුවන්ගේ ආධාරය අවශ්‍ය විය. ජංගමශීලී විංකලයක රිටක් සහ කොක්කක් රත් පැහැගෙන දිලිසේ. එය පීලි පැනලාය. නොසැලකිලි ලෙස උපපථ කිරීම නිසා එය නැමී තිබිණි. මේ රිට කිණිරයක් මත තබා, යකඩ කම්කරුවාගේ පළපුරුදු මග පෙන්වීම යටතේ අපි යකඩ මිටි වලින් එය තලා නිසි පරිදි සාදා ගතිමු. තවමත් ගිනි රත් වී ඇති එම රිටින් අපි උරහිසින් ගෙන ලහි ලහියේ නියමිත ස්ථානයට ගියෙමු. අපි එම රිට කෙවෙනියට දැමීමු. මිටි පහර කිහිපයක් ගසා රිට සවි කළෙවු. අපි මැදිරියට යටින් රිංගුවෙමු. පූට්වු පද්ධතිය පෙනෙන තරම් සරළ නැත. මෙහි රිවට් සහ දුනු විශාල ගණනකි...

වැඩ ලහි ලහියේ කෙරේ. රෑ බෝ වී ගෙන එයි. ගිනි හුලු පෙරට වඩා දීප්තිමත් ලෙස ඇවිලෙන්නාක් මෙනි. ඉක්මණින්ම අපේ වැඩ නිමාවට පත්වනු ඇත.සමහර සහෝදරවරු හේත්තු වී උණු තේ බොන්නට වූහ. මැයි මාසයේ රෑය ශීතලය. අඩ සඳ දෑකැත්තක් සේ අහසේ බබලන්නට විය. මිනිස්සු සිනහ සෙමින් විහිළු කරන්නට වූහ.

ග. සහෝදරය වැඩ නවත්වමු. මැදිරි දහතුනක් අළුත් වැඩියා කළා මදිද!''

එහෙත් ග. සහෝදරයා සතුටු වී නැත.

අපි තේ බී, ජයග්‍රහණය පිළිබඳ ගී ගයමින් දෙර දක්වා ගමන් කළෙමු...''

කොමියුනිස්ට්වාදී ශ්‍රමදාන ව්‍යාපාරය මොස්කව් නගරයට පමණක් සීමා වී නැත. ජූනි 6 ද ''ප්‍රාව්ද'' හි පළවූ පුවතක් මෙසේය:

''මැයි 31 ද ත්වෙර්හි පළමුවැනි කොමියුනිස්ට්වාදී ශ්‍රමදාන සෙනසුරාදවක් පැවැත්විණි. කොමියුනිස්ට්වරු 128 දෙනෙක් දුම්රිය මාර්ගයෙහි වැඩ කළහ. පැය තුන හමාරක් ඇතුළතදී ඔවුහු දුම්රිය පෙට්ටි 14 කට බඩු පැටවූහ. දුම්රිය යන්ත්‍ර තුනක් අළුත් වැඩියා කළහ. දර සාෂෙන්* 10 ක් කැපූහ. පුහුණු කොමියුනිස්ට් කම්කරුවන්ගේ ශ්‍රම ඵලදාව දහතුන් ගුණයකින් උසස්විය''.

ජූනි 8 ද ''ප්‍රාව්ද'' පුවත්පතින් අපි මෙසේ කියැවීමු:

කොමියුනිස්ට්වාදී ශ්‍රමදානය

''සරාතව් ජූනි 5 ද මොස්කව් සගයින්ගේ ආයාචනයට පිළිතුරු වශයෙන් කොමියුනිස්ට්වාදී දුම්රිය කම්කරුවෝ පොදු රැස්වීමක් පවත්වා මෙසේ තීරණය කළහ. ජනතා ආර්ථිකයට ආධාර දීම සඳහා සෙනසුරාද දවස් වලදී වැටුප් රහිත අති කාල වැඩ කිරීම''.

* * *

කොමියුනිස්ට්වාදී ශ්‍රමදාන සෙනසුරාද දිනයන් පිළිබඳව ඉතා පූර්ණ සහ ඉතා සවිස්තර තොරතුරු මම ඉදිරිපත් කළෙමි. මන්දයත්, මෙහිදී අප කොමියුනිස්ට්වාදී ඉදිකිරීමේ එක් ඉතා වැදගත් අංශයක් නිසැක ලෙසම නිරීක්ෂණය කරන බැවිනි. මෙයට අපේ පුවත්පත්

* සාෂෙන්-මීටර 2. 134 කට සමාන දිග මනින ඒකකයක්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සැහෙන තරම් සැලකිල්ලක් නොදක්වයි. මෙය සැහෙන තරම් අගය කිරීමට අපි තවමත් අපොහොසත් වී සිටිමු.

සැබෑ ජීවිතයෙන් ලබා ගන්නාවූ සහ සැබෑ ජීවිතය විසින් පිරික්සුමට භාජනය කරන ලද කොමියුනිස්ට්වාදී ඉදි කිරීම් පිළිබඳව සරළ නමුදු ජීවමාන සත්‍ය කරුණු ගැන වඩාත් වැඩි සැළකිලි සහ දේශපාලන කලබල අඩු කිරීම — අප හැම දෙනමත් අපේ ලේඛකයනුත්, උද්ඝෝෂකයනුත්, ප්‍රචාරකයනුත්, සංවිධායකයින් ආදී පුද්ගලයනුත් වෙහෙස නොබලා පුන පුනා කිව යුත්තේ මේ උද්යෝග පාඨයය.

නිර්ධන පංතික විප්ලවයෙන් ඉක්බිතිව පළමුවැනි අවධියේදී, ධනපතීන්ගේ ප්‍රතිරෝධනය සහ සූරාකන්නන් විනාශ කර දැමීමද, ඔවුන්ගේ කුමන්ත්‍රණ (කළු ශතකයේ[65] සහ කැඩෙට් වරුන්ගේ සිට මෙන්ෂෙවිකයින්[66] සහ එස්ආර් වරුන් දක්වා සහභාගි වූ පෙත්‍රොග්‍රාඩය අල්ලා ගැනීමේ "වහල් හිමියන්ගේ කුමන්ත්‍රණය"[67] වැනි දේ) පාගා දැමීමද අපේ මූලික හා ප්‍රධාන කාර්ය භාර්ය වීම ස්වභාවික මෙන්ම නොවැළැක්විය හැකි විය. එහෙත් මෙම කාර්ය භාරය සමග එකවරම තවත් කාර්ය භාරයක් නොවැළැක්විය හැකි සේත්, කල් යත් යත්ම වඩාත් වැදගත් ලෙසත් පෙරමුණ ගනිමින් සිටී. එනම්, කොමියුනිස්ට්වාදී ඉදි කිරීම්වල වඩාත් වැදගත් කාර්යය, නව සමාජයක නව ආර්ථික සම්බන්ධකම් බිහිකිරීමය.

මවිසින් මීට පෙර කීපවතාවක්ම පෙන්වා දුන් පරිදිද, මාර්තු 12 දා පෙත්‍රොග්‍රාද් සෝවියට් සභාවේදී මගේ කතාවෙන් පෙන්වා දුන් පරිදිද, නිර්ධන පංතික ආඥාදායකත්වයක් යනු සූරාකන්නන්ට විරුද්ධව බලය පාවිච්චි කිරීම පමණක් නොවේ, ප්‍රධාන වශයෙන් බලය පාවිච්චි කිරීමද නොවේ. මේ විප්ලවවාදී බලවේගය පාවිච්චි කිරීමේ ආර්ථික පදනමද, එහි ප්‍රතිඵලදායකත්වයේ සහ සාර්ථකත්වයේ සහතිකයද රඳා පවතින්නේ ධනපති ක්‍රමය සමග සසඳා බලන විට, ශ්‍රමයේ සමාජ සංවිධානයේ උසස් වර්ගයක් නිර්ධන පංතිය නියෝජනය කරන නිසාත් සහ බිහිකරන නිසාත්ය. වැදගත් කාරණය මෙයයි. ශක්තියේ උල්පත මෙයයි. කොමියුනිස්ට්වාදයේ ජයග්‍රහණය අනිවාර්යය යන සහතිකයද මෙයයි.

ඉඩම් හිමියන් අතළොස්සක් විසින් ඉතා නූගත් සහ දුගී බවට භාජනය වී සිටි වැඩකරන ජනතාවගෙන් සොරකම් කරමින් සහ ඔවුන් පීඩනයට හසු කරමින් ගෙනගිය සමාජමය ශ්‍රමයේ රදළවාදී සංවිධානය පොල්ලේ විනය මත රැඳී පැවතිණි. සමාජමය ශ්‍රමයේ ධනවාදී සංවිධානය කුසගින්නේ විනය මත රඳා පැවතිණි. ධනවාදී සංස්කෘතියේ සහ ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදයේ සියලු ප්‍රගමනයන් නොතකා, ඉතා දියුණු,

ශිෂ්ට සම්පන්න සහ ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවල වැඩකරන ජනතාවගේ අයි බහුතරය නූගත්, දුගීබවට භාජනය වූ වැටුප් වහලුන් හෝ පෑගීමට හසු වූ ගොවීන් විය. අතළොස්සක් පමණවූ ධනපතීන් විසින් ඔවුන්ගෙන් සොරකම් කොට මොවුන් පීඩනයට භාජන කරන ලදී. සමාජමය ශ්‍රමයේ කොමියුනිස්ට්වාදී සංවිධානය — මෙහි පළමුවැනි පියවර සමාජවාදය වන්නේය — ඉඩම් හිමියන්ගේ සහ ධනපතීන්ගේ වධ බන්ධනය පෙරළා දැමූ වැඩකරන ජනතාවගේ නිදහස් සහ විඥුත විනය මත පදනම් වී ඇත. කල් යත් යත්ම සමාජමය ශ්‍රමයේ කොමියුනිස්ට්වාදී සංවිධානය එම සමාජ ක්‍රමය ගොඩනැගීම සඳහා වඩ වඩාත් පියවරයන් ගනු ඇත.

මෙම අළුත් විනය අහසින් වැටෙන්නේවත්, භක්තිමත් අභිප්‍රායයන්ගෙන්වත් බිහිවන්නේ නැත. එය මහා පරිමාණ ධනපති නිෂ්පාදනයන්ගේ ද්‍රව්‍යමය තත්ත්වයන්ගෙන්, (ඒවායින්) පමණක් බිහිවෙයි. ඒවායින් තොරව, මෙම විනය කොහෙත්ම ඇති නොවේ. මෙම ද්‍රව්‍යමය තත්ත්වයන්ගේ භාණ්ඩාගාරය නැතිනම් වාහනය, මහා පරිමාණ ධනපති ක්‍රමය විසින් බිහිකොට, සංවිධානය කොට, එක්සත් කොට, පුහුණු කොට, අධ්‍යාපනයක් ලබා දී, පන්නරය ලබා දුන්, නියත ඓතිහාසික පංතියකි. මෙම පංතිය නිර්ධන පංතියයි.

නිර්ධන පංතික ආඥාදායකත්වය නැමැති ලතින්, විද්‍යාත්මක, ඓතිහාසික-දර්ශනික පදය සරළ බසට පෙරළන්නේ නම්, එහි තේරුම මෙසේය:

ප්‍රාග්ධනයේ වධ බන්ධනයෙන් මිදීම සඳහා ගෙනයන අරගලයේදීත්, ජයග්‍රහණය පවත්වාගෙන යාමට සහ තහවුරු කිරීමට ගෙනයන අරගලයේදීත්, අභිනව, සමාජවාදී සමාජ ක්‍රමයක් ගොඩ නැගීමේ වැඩවලදී සහ පංතීන් සම්පූර්ණයෙන් අහෝසි කිරීමේ මුළු මහත් අරගලයේදීත්, වැඩ කරන ජනතාවගේ මුළු මහත් බහුතරයට සහ සූරාකනු ලැබූ ජනතාවට නායකත්වය දිය හැක්කේ එකම එක නියමිත පංතියකටය, එනම් නගරබද කම්කරුවන්ට සහ පොදුවේ කම්හල්වල වැඩකරන කර්මාන්තමය කම්කරුවන්ටය. (සමාජවාදය-සෝෂලිස්ට්වාදය සහ කොමියුනිස්ට්වාදය අතර ඇති විද්‍යාත්මක වෙනස නම්, පළමුවැනි පදය ධනවාදී සමාජයෙන් පැන නගින නව සමාජයේ පළමුවැනි අවධිය නිරූපනය කරන අතර දෙවැන්න ඊළඟ වඩාත් උසස් අවධියක් නිරූපනය කිරීමය. එය මෙම අන්තර් වාක්‍යයෙන් අපි නිරීක්ෂණය කරමු).

"බර්න්" කහ ජාත්‍යන්තරයේ[68] නායකයින් කළ වැරැද්ද නම්, පංති සටන සහ නිර්ධන පංතියේ මෙහෙයැවීමේ ක්‍රියා කලාපය වචන-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යෙන් පමණක් පිළිගෙන, එහි තර්කානුකූල නිගමනය ගැන කල්පනා කිරීමට බිය වීමය. විශේෂයෙන් ධනපති පංතිය බිය ගන්වන, සහ ධනපති පංතියට කොහෙත්ම පිළිගැනීමට නොහැකි එම නොවැළැක්විය හැකි නිගමනය පිළිගැනීමට ඔවුහු බිය වෙති. නිර්ධන පංතික ආඥාදායකත්වයද පංති සටනේ එක් අවධියක් බවත්, පංති අහෝසි නොකරන තුරු මෙය නොවැළැක්විය හැකි බවත්, ප්‍රාග්ධනය බලයෙන් පහකර දැමූ විගස ඇතිවන යුගයේදී මෙය විශේෂ බිහිසුණු බවක් සහ විශේෂ අමුතු ලක්ෂණයක් බවත්, පිළිගැනීමට කහ ජාත්‍යන්තරයේ නායකයෝ බිය වෙති. නිර්ධන පංතිය දේශපාලන බලය අල්ලා ගැනීමෙන් ඉක්බිතිව පංති සටන නවත්වන්නේ නැත. එහෙත් එය පංති අහෝසිවන තුරු — සත්තකින්ම, විවිධ තත්ත්වයන් යටතේ, විවිධ ආකාර සහ විවිධ මාධ්‍යයන් අනුව — දිගටම ගෙනයනු ඇත.

''පංති අහෝසි කිරීම'' යන්නෙහි තේරුම කුමක්ද? සමාජවාදීන් යැයි කියා ගන්නා හැම කෙනෙක්ම, මෙය සමාජවාදයේ අවසාන අරමුණ ලෙස පිළිගනිති. එහෙත් මෙහි වැදගත්කම ගැන කල්පනා කරන්නේ හැම දෙනෙකුම නොවේ. සමාජයීය නිෂ්පාදනයේ ඓතිහාසීය වශයෙන් නියමිත ක්‍රමයෙක, නිෂ්පාදන මාධ්‍යයන් මත තිබෙන තම (බොහෝ අවස්ථාවලදී නීතිය විසින් ස්ථිර කොට, සූත්‍ර ගත කළ) සබඳතාවය අනුව, ශ්‍රමයේ සමාජයීය සංවිධානයේදී තම ක්‍රියා කලාපය අනුව, සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් තමන් නතු කරගන්නාවූ සමාජමය ධනයේ කොටසේ පරිමාණය සහ එය නතු කර ගැනීමේ ආකාරය අනුව, විශාල ජන කොටස් විසින් දරන විවිධ තරාතිරම් විසින් පංති විග්‍රහ කෙරේ. සමාජ ආර්ථිකයේ නියත ක්‍රමයෙක තමන් දරන විවිධ තරාතිරම් නිසා තව කෙනෙකුගේ ශ්‍රමය අයත් කැරැ ගැනීමට හැකි ජන කොටස් පංති යනුවෙන් හැඳින්වේ.

පැහැදිලි ලෙසම, පංතීන් සම්පූර්ණයෙන්ම අහෝසි කැරැ දැමීම සඳහා සූරාකන්නන්, ඉඩම් හිමියන් සහ ධනපතීන් බලයෙන් පහකර දැමීම පමණක් මදිය. හිමිකම පිළිබඳ ඔවුන්ගේ සියලු අයිතිවාසිකම් අහෝසි කැරැ දැමීම පමණක් මදිය, නිෂ්පාදනයේ සියලු පෞද්ගලික අයිතිය අහෝසි කැරැ දැමීමද, නගරය සහ ගම අතර ඇති සියලු වෙනස්කම් නැති කැරැ දැමීමද, එමෙන්ම කය වෙහෙසා වැඩකරන්නාත් මොළය වෙහෙසා වැඩ කරන්නාත් අතර ඇති සියලු භේදයන් නැති කැරැ ලීමද අත්‍යාවශ්‍ය වන්නේය. මේ සඳහා ඉතා දීර්ඝ කාලයක් අවශ්‍ය වේ. මෙම ජයග්‍රහණය ලබාගනු වස්, නිෂ්පාදන බලවේගයන් වර්ධනය කිරීම සඳහා අති විශාල ඉදිරි පියවරක් තැබිය යුතුය. මෙය සඳහා කුඩා පරිමාණ නිෂ්පාදනයේ සංඛ්‍යාවෙන් විශාලවූ නටබුන්වල ප්‍රතිරෝධනයට විරුද්ධව (බොහෝ විට මෙම ප්‍රතිරෝධනය නිෂ්ක්‍රියය, මේ නිසා එය ඉතා දැඩි, එමෙන්ම මැඩීමට ඉතා අසීරු දෙයකි) ක්‍රියා කළ යුතුය. මෙම නටබුන් සමග සම්බන්ධවී ඇති පුරුද්දේ අති විශාල බලය සහ ගතානුගතිකත්වය පරාජය කළ යුතුය.

සියලු ''වැඩකරන'' ජනතාවන්ට සමාන ලෙස මෙම කාර්යය කළ හැකි යැයි නිගමනය කිරීම, පුහු වාග් පාඨයකි, අති පුරාණ, ප්‍රාග්මාක්ස්වාදී සමාජවාදියකුගේ මායා මතයෙකි. මන්දයත්, මෙම හැකියාව ඉබේටම සිදු නොවන බැවිනි. එහෙත් ඓතිහාසීය ලෙස වැඩෙන, මහා පරිමාණ ධනපති නිෂ්පාදනයේ ද්‍රව්‍යමය තත්ත්වයන්ගෙන් පමණක් පැන නගින්නකි. මෙම හැකියාව, ධනවාදයේ සිට සමාජවාදය දක්වා ඇති මාර්ගයේ මුල සිටම නිර්ධන පංතිය පමණක් සතුව පවතී. නිර්ධන පංතියට තමා ඉදිරියේ ඇති යෝධමය කාර්ය භාරය සපුරා ලිය හැකිය, මන්දයත් ප්‍රථමයෙන් එය සභ්‍ය සමාජවල ඉතා ශක්තිමත් සහ ඉතා දියුණු පංතිය වන බැවිනි, දෙවනුව ඉතා දියුණු රටවල නිර්ධන පංතිය ජනගහණයේ බහුතරය වන බැවිනි, තෙවනුව රුසියාව වැනි නොදියුණු ධනපති රටවල ජනගහණයේ බහුතරය අර්ධ නිර්ධනීන්ගෙන් යුත්, එනම් අවුරුද්දේ කොටසක් ක්‍රමවත් ලෙස නිර්ධන පංතික ජීවිතයක් ගත කරන, ධනපති ව්‍යවසායයන්වල වැටුප් ශ්‍රමිකයින් හැටියට සිය ජීවන මාධ්‍යයෙන් අඩක් උපයාගන්නා වූ ජනතාවක් සිටින බැවිනි.

ධනවාදයේ සිට සමාජවාදය දක්වා පරිවර්තනය වීමේදී පැන නගින ගැටළු නිදහස හා සමානත්වය පිළිබඳ පොදු කතාද, ප්‍රජාතන්ත්‍රවාදය ගැන පොදුවේද, කම්කරු ප්‍රජාතන්ත්‍රවාදයේ සමානතාවය ආදියද පදනම් කර ගනිමින් විසඳීමට (බර්න්හි කහ ජාත්‍යන්තරයේ වීරයින් වන කෞට්ස්කි සහ මාර්තව් කරන පරිදි) ප්‍රයත්න දැරීම සිය සුළු ධනපති හැඟීම්ද, අවරසික ස්වභාවයද, ධනපති පංතිය ඉතා කිට්ටුවෙන් අනුගමනය කිරීමේ දෘෂ්ටිමය වහල් භාවයද පමණක් හෙළි දරව් කරයි. මෙම ගැටළුවට නිවැරදි පිළිතුර සොයාගත හැක්කේ දේශපාලන බලය අල්ලා ගත් එනම් නිර්ධන පංතියේ නියමිත පංතිමය සම්බන්ධකම් සහ මුළුමහත් නොනිර්ධනීන්ගේ සහ වැඩකරන බහු ජනතාවගේ අර්ධ නිර්ධනීන්ගේ නියමිත පංතිමය සම්බන්ධකම් නිවැරදි ලෙස අධ්‍යයන කිරීමෙනි. මෙම සම්බන්ධකම් මනස් සෘෂ්ටිත සංගතිත ''පරමාදර්ශ'' තත්ත්වයන් තුළ ඇති නොවේ. එහෙත් එය බහු සහ විවිධ ආකාරයන්ගේ ධනපති දෘඪතර ප්‍රතිරෝධන පැන නගින වාස්තවික තත්ත්වයන් යටතේ ඇතිවේ.

රුසියාව ඇතුළු ඕනෑම ධනපති රටක ජනගහණයේ අති බහුතරය — එමෙන්ම වැඩකරන ජනතාවගේ අතිමහත් බහුතරය — ප්‍රාග්ධනයේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පැගීමත්, එහි මංකොල්ලකාරිත්වය සහ ප්‍රජා පීඩනයත් දහස් වාරයක් අත් දැක ඇත්තේය. එලෙසම තම සහෝදරාදීන් හා නෑයන් එයට භාජන වන සැටිද දැක ඇත. ලෝකය කොල්ල කෑමේදී ආධිපත්‍යය ලැබිය යුත්තේ බ්‍රිතාන්‍ය ප්‍රාග්ධනයටද නැතිනම් ජර්මන් ප්‍රාග්ධනයටද යන්න තීරණය කිරීම සඳහා කෝටියක් ජනතාව මරා දැමූ අධිරාජ්‍යවාදී යුද්ධය, මෙම දුක් කම්කටොලු විශාල වශයෙන් තීව්‍ර කර ඇත. ඒවා වැඩි කොට ගැඹුරු කොට ඇත. ඒවායේ තේරුම වටහා ගැනීමට ජනතාව පොළඹවා ඇත. ඒ නිසා නිර්ධන පංතිය කෙරෙහි ජනගහණයේ අධි බහුතරය විශේෂයෙන්ම වැඩකරන ජනතාව අනිවාර්ය ලෙස ලැදි කමක් දක්වති. මන්දයත්, නිර්ධන පංතිය සිය විරෝදර නිර්භයත්වයත්, විප්ලවීය අනුකම්පා විරහිත භාවයත් සහිතව ප්‍රාග්ධනයේ වධබන්ධනය පෙරළා දමමින්, සූරාකන්නන් බලයෙන් පන්නා දමා ඔවුන්ගේ ප්‍රතිරෝධනය මැඩ පවත්වමින්, සූරා කන්නන්ට ඉඩක් නැති අළුත් සමාජයක් බිහි කිරීම පිණිස මග හෙළි කිරීම සඳහා සිය ලේ වගුරවන බැවිනි.

නිර්ධන පංතික නොවන ජනතාවගේ සුළු ධනපති අස්ථිරතාවයද, ධනවාදී ''පියාපත්'' යටතේ ධනවාදී පාලන ''නියමයක්'' ඇති කිරීම සඳහා ආපසු ධනවාදීන් වෙත යාමට ඔවුන්ගේ ඇති ප්‍රවණතාවය විශාල සහ නොවැළැක්විය හැකි වූවද, නිර්ධන පංතික නොවන සහ අර්ධ නිර්ධන පංතික වැඩකරන පොදු ජනතාවට, නිර්ධන පංතියේ අධ්‍යාත්මික සහ දේශපාලනමය ආධිපත්‍යය නොපිළිගැනීමට නොහැකිය. නිර්ධන පංතිය සූරාකන්නන් බලයෙන් නෙරපා දමනවා සහ ඔවුන්ගේ ප්‍රතිරෝධනය පාගා දමනවා පමණක් නොව, අළුත් සහ උසස් සමාජමය සම්බන්ධතාවයක්ද, සමාජමය විනයක්ද, පංති හැඟීමකින් යුත් එක්සත් වැඩකරන ජනතාවගේ විනයක්ද ගොඩ නගමින් සිටී. ස්වකීය එක්සත්කම, තමන්ගේම වඩාත් වැඩි පංති හැඟීමක්, නිර්භය ස්ථිර විප්ලවවාදී සහ පන්නරය ලැබූ පන්නරය නැමැති අධිකාරය හැරුණු විට, වෙනත් වධබන්ධනයක් සහ අධිකාරයක් එක්සත් වැඩකරන ජනතාව නොදනිති.

ජයග්‍රහණය ලබාගැනීම සඳහාත්, සමාජවාදය තහවුරු කිරීම සඳහාත්, නිර්ධන පංතිය දෙයාකාර හෙවත් ද්වි කාර්ය භාරයන් සපුරාලිය යුතුය: ප්‍රථමයෙන්ම, නිර්ධන පංතිය, ප්‍රාග්ධනයට විරුද්ධව කරන විප්ලවවාදී අරගලයේදී සිය උත්තරීතර වීරත්වයෙන් වැඩකරන සහ සූරා කනු ලබන ජනතාව තමා වෙත දිනාගත යුතුය; ධනපති පංතිය බලයෙන් පහකර දැමීම සඳහාත්, එහි ප්‍රතිරෝධනය පාගා දැමීම සඳහාත්, නිර්ධන පංතිය, ජනතාව තම පැත්තට, දිනාගෙන, ඔවුන් සංවිධානය

කොට සටනේදී ඔවුන්ට නායකත්වයක් දිය යුතුය. දෙවනුව, නිර්ධන පංතිය මුළු මහත් වැඩකරන හා සූරාකනු ලබන ජනතාවත් සුළු ධනපති කොටසුත් නව ආර්ථික සංවර්ධන මාවත ඔස්සේ ගෙන යමින්, විද්‍යාවේ සහ ධනවාදී තාක්ෂණිකයේ නවීනතම සොයා ගැනීම් මහා පරිමාණ සමාජවාදී කර්මාන්ත බිහිකරන කම්කරුවන්ගේ පංති හැඟීම සමග එකට සංයෝජනය කරන අළුත් සමාජ සම්බන්ධතාවයක්, අළුත් කම්කරු විනයක්, අළුත් ශ්‍රම සංවිධානයක් බිහි කිරීමට ක්‍රියා කළ යුතුය.

දෙවැන්න, පළමුවැන්නට වඩා අසීරු කාර්යයකි. මන්දයත්, වෙන්වූ විරෝදර ක්‍රියාවලින් එය කළ නොහැකි බැවිනි. එය සපුරාලීම සඳහා සාමාන්‍ය, එදිනෙද වැඩවලදී, ඉතා දීර්ඝවූත්, ඉතා ස්ථිරවූත්, ඉතා අසීරුවූත් පොදු ජන වීරත්වයක් අවශ්‍ය වන්නේය. එහෙත් මෙම කාර්යය පළමුවැන්නට වඩා වැදගත්ය. මන්දයත්, අවසාන විශ්ලේෂණයේදී ධනපති පංතිය පරදවා ජයගැනීමේ ශක්තියේ ගැඹුරුතම උල්පත සහ මෙම ජයග්‍රහණයන්ගේ එකම සහතිකය, කල්පවතින ස්වරූපය සහ ස්ථාවරත්වය විය හැක්කේ සමාජමය නිෂ්පාදනයේ අළුත් හා උසස් මාධ්‍යයකි, එනම් ධනපති සහ සුළු ධනපති නිෂ්පාදනය වෙනුවට, මහා පරිමාණ සමාජවාදී නිෂ්පාදනය ඇති කිරීම පමණකි.

* * *

''කොමියුනිස්ට්වාදී ශ්‍රමදනයන්'' මෙතරම් විශාල වැදගත්කමක් දරන්නේ, ඒවා ශ්‍රම ඵලදාව වර්ධනය කිරීමේදීත් නව කම්කරු විනයක් පිළිගැනීමේදීත්, ආර්ථිකයේදී සහ ජීවිතයේදී සමාජවාදී තත්ත්වයන් බිහි කිරීමේදීත් කම්කරුවන්ගේ විඥාත සහ ස්වේච්ඡානුගත උනන්දුව ප්‍රකාශ කරන බැවිනි.

ජර්මන් ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන් අතුරෙන්, කීපදෙනෙකුගෙන් එක්කෙනෙකු වන, වඩාත් නිවැරදිව කියන්නේ නම්, ඉතා විරල කෙනෙකු වන ඉ. යාකොබි 1870-1871 පාඩම් වලින් ඉක්බිතිව කලහකාරී පටු ජාතිවාදය හෝ ජාතික ලිබරල්වාදය වැළඳ ගන්නවා වෙනුවට, සමාජවාදය වැළඳ ගත්තේය. එකම වෘත්තීය සමිතියක් සංවිධානය කිරීම සදෝවය හි සටනට[69] වඩා ඓතිහාසික වශයෙන් වැදගත් වන්නේ යැයි ඔහු වරක් පැවසීය. මෙය සත්‍යයකි. ජර්මන් ජාතික ධනපති රජයක් බිහි කිරීමේදී ආධිපත්‍යය දැරිය යුත්තේ ධනවාදී රාජාණ්ඩු වන ඔස්ත්‍රියාවද නැතිනම් ප්‍රසියාවද යන්න සැඩෝවාහි යුද්ධය තීරණය කළේය. එක වෘත්තීය සමිතියක් පිහිටුවාලීම ධනපති පංතිය පරදවා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිර්ධන ෂංතිය ජගත් ජයග්‍රහණයක් ලබා ගැනීම කරා තැබූ කුඩා පියවරකි. 1919 මැයි මස 10 ද මොස්කව්හි, මොස්කව් — කසාන් දුම්රිය මාර්ගයේ කම්කරුවන් සංවිධානය කළ පළමුවැනි කොමියුනිස්ට්වාදී ශ්‍රමදානය 1914-1918 අධිරාජ්‍යවාදී යුද්ධයේදී හින්ඩෙන්බුර්ග් නැතිනම් ෆොෂ් සහ බ්‍රිතාන්‍යයින් ලබාගත් ජයග්‍රහණ වලට වඩා වැඩි ඓතිහාසික වැදගත් කමක් දරතියි අපට එලෙසම ප්‍රකාශ කළ හැකිය. අධිරාජ්‍යවාදීන්ගේ ජයග්‍රහණය යනු ඇන්ග්ලෝ — ඇමෙරිකන් සහ ප්‍රංශ කෝටිපති ධන කුවේරයින්ගේ ලාභය තකා කෝටි සංඛ්‍යාත කම්කරුවන් මරා දැමීමය. අධික පෝෂණය නිසා ඉදිමී ඇති, පණ පිටින් කුණුවෙමින් සිටින විනාශයට නියම වූ ධනවාදයේ සාපරාධී ක්‍රියාවන්ය. ප්‍රාග්ධනයේ වධ බන්ධනයෙන් සහ යුද්ධ වලින් මිහිපිට සියලු ජනතාවන්ට විමුක්තිය ලබා දෙන සමාජවාදී සමාජයේ, එක් සෛලයකි, මොස්කව් -කසාන් දුම්රිය මාර්ගයේ කම්කරුවන් සංවිධානය කළ කොමියුනිස්ට්වාදී ශ්‍රමදානය.

මහජන මතයේ නියෝජිතයින් තමන්හයි විශ්වාස කිරීමට පුරුදුව සිටින ධනපති මහත්වරු සහ මෙන්ෂෙවික හා එස්ආර්වරු ඇතුළු ධනවාදී බැලයෝ, ස්වභාවයෙන්ම කොමියුනිස්ට්වාදීන්ගේ බලාපොරොත්තු වලට අපහාස කරති. මෙම බලාපොරොත්තු අහසේ ගොඩනැගූ මාලිගා (ඉතා කුඩා බඳුනක සිටවූ මහා යෝධ කජු ගසක්) මෙනැයි ඔවුහු කියති. සංඛ්‍යාවෙන් ඉතා වැඩි සොරකම් කිරීම්, වැඩ නොකර නිකම් ඉඳීම, පහත් ශ්‍රම ඵලදාව, අමු ද්‍රව්‍ය සහ සාද නිම කළ භාණ්ඩ විනාශ කිරීම් ආදිය සංඛ්‍යාවෙන් අල්ප ශ්‍රමදාන සමග සන්සන්දනය කිරිමින් උපහාසාත්මක ලෙස දෙඩවති. මේ මහත්වරුනට අපේ පිළිතුර නම්, රුසියානු සහ විදේශීය ධනපතීන්ගේ පාලන බලයක් පිහිටුවීම සඳහා ඔවුනට සේවය නොකර ධනපති බුද්ධිමතුන් සිය දැනීමෙන් රුසියානු කම්කරුවන්ට ආධාර කළේ නම්, විප්ලවය වඩාත් වේගවත් ලෙසත්, වඩාත් සාමකාමී ලෙසත් ඉදිරියට යනු ඇතැයි යන්නය. එහෙත් මෙය මනෝරාජිකවාදයකි. මන්දයත් ප්‍රශ්නය පංති සටන විසින් තීරණය කළ බැවිනි. බුද්ධිමතුන්ගේ බහුතරය ධනපති පංතිය වෙතට ඇදී ගියේය. නිර්ධන පංතිය ජයග්‍රහණය ලබා ගන්නේ බුද්ධිමතුන්ගේ ආධාර ඇතිව නොවේ, එහෙත් (යටත් පිරිසෙයින් අවස්ථා වැඩි ගණනකදී) ඔවුන්ගේ විරුද්ධත්වය මැඩ නැගී සිටිමිනි. මුරණ්ඩු ලෙස ධනපතීන් වූ පුද්ගලයින් ඉවත් කරමින්, අස්ථිර වැනෙන සුලු පුද්ගලයින් ප්‍රතිසංස්කරණයට, යළි අධ්‍යාපනයට සහ යටත් කර ගැනීමට භාජන කරමින්, බුද්ධිමතුන්ගේ විශාල වැඩි කොටස් තම පැත්තට දිනා ගනිමින් නිර්ධන පංතිය ක්‍රියා කරනු ඇත. විප්ලවයේ

අයිරුකම් සහ පසු බැසීම් නිසා දුෂ්ට ලෙස ප්‍රීති වීම, බිය පතුරුවා හැරීම, ආපසු යාමට දේශනා කිරීම — මේවා සියල්ල ධනවාදී බුද්ධිමතුන්ගේ පංති සටනේ අවි සහ විධි වන්නේය. මේවා නිසා තමාට රැවටීමට නිර්ධන පංතිය ඉඩ නොතබනු ඇත.

ප්‍රශ්නයේ හරය දෙස අපි එක එල්ලේම බලමු නම්, දිගින් දිගටම පසු බැසීම්, වැරදි සහ යළිත් අයහපත්වීම් ආදියෙන් තොරව අළුත් නිෂ්පාදන ක්‍රමයක් එකවරම මුල් බැසගත් සැටි ඉතිහාසයේ කවදා හෝ සිදුවී තිබේද? ප්‍රවේණිදාස ක්‍රමය අහෝසි කොට, අඩසිය වසරකට ඉක්බිතිව පවා රුසියාවේ ගම්බද පළාත්වල ප්‍රවේණිදාසත්වයේ නෂ්ටාවශේෂ සැහෙන තරම් දක්නට හැකිවිය. ඇමෙරිකාවේ වහල්භාවය අහෝසි කොට අඩ සිය වසරක් ගෙවී ගියද ඇමෙරිකාවේ නීග්‍රෝවරුන්ගේ තත්ත්වය නිතර පාහේ අර්ධ — වහල් භාවයකට සමානය. ප්‍රාග්ධනයට සේවය කිරීමේදී මෙන්ෂෙවිකයින් සහ එස්ආර්වරුන් ඇතුළු ධනවාදී බුද්ධිමත්හු අවංකභාවය පෙන්වමින් පූර්ණ ව්‍යාජ තර්ක දිගටම ඉදිරිපත් කරති. නිර්ධන පංතික විප්ලවයට පෙර අප මනෝරාජිකවාදීන්හයි ඔවුහු අපට චෝදනා කළහ. විප්ලවයෙන් පසුව අතීතයේ සියලු සේවාවන් ඉමහත් වේගයකින් අකා මකා දැමිය යුතුහයි ඔවුහු අපට කියා සිටිති!

අපි මනෝරාජිකවාදීන් නොවමු. කෙසේ වුවද අපි ධනවාදී තර්කවල සැබෑ වටිනාකම දනිමු. විප්ලවයෙන් අනතුරුව සැහෙන කලක් යනතුරු නැගී එන අළුත් ආචාර ධර්ම නැමැති අංකුර වලට වඩා පැරණි ඒවා උස්ව පවතින බවද අපි දනිමු. අළුත් දේ බිහිවන්නට පටන් ගන්නා කාලයේදී පැරණි දේ සැහෙන කලක් යනතුරු ශක්තිමත්ව පවතින බව අපි දනිමු. සොබා දහමේද සමාජමය ජීවිතයේදීද මෙය නිතර මෙලෙස සිදුවේ. නව ක්‍රමයේ ලාබාල අංකුරවල දුර්වලතාවය දෙස බලා සමච්චල් කිරීමත්, බුද්ධිමතුන්ගේ සහ ඔවුන්ට සමාන අයගේ පහත් වර්ගයේ සැකමුසු පරාජිතවාදයද (සංදේහවාදයද) යන මේවා නිර්ධන පංතියට විරුද්ධව ධනපති පංතිය ගෙනයන පංති සටනේ ආකාරයන් වන්නේය. සමාජවාදයට විරුද්ධව ධනවාදය ආරක්ෂා කිරීමක් වන්නේය. දුර්වල අළුත් අංකුරයන් අපි ඉතා සැලකිල්ලෙන් උගත යුතුය. එවා ගැන අති විශාල සැලකිලි දැක්විය යුතුය. ඒවායේ වැඩීමට හිතකර හැම දෙයකටම සහාය දී ඒවාට ''සාත්තු'' කළ යුතුය. මින් සමහරක් නොවැළැක්විය හැකි සේ අභාවයට යනු ඇත. කොමියුනිස්ට්වාදී ශ්‍රමදානය විශේෂ වැදගත් කලාපයක් ඉටුකරතියි අපට දිවුරා කිව නොහැකිය. එහෙත් ප්‍රශ්නයේ හරය එය නොවේ. වැදගත් දෙය සෑම අංකුරයකටම වෙන වෙනම සාත්තු කිරීමය; ඉතාම උචිත ඒවා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ජීවිතය විසින් තෝරා ගනු ඇත. සිපිලිස් රෝගය මිනිස් සංහතියෙන් දුරුකරලීම සඳහා බෙහෙත් වර්ග 605 පිරික්සා බැලීමට තරම් ඉවසීමක් ඇතිව සිටි ජපන් වෛද්‍ය විද්‍යාඥයෝ 606 වැනි පිරික්සා බැලීමේදී සතුටුදායක ප්‍රතිඵල ලබා ගත්හ. එසේ නම් වඩාත් අසීරු ගැටළුවක් නිරාකරණය කිරීමට කැමති අයට, එනම් ධනවාදී ක්‍රමය විනාශ කිරීමට කැමති අයට තමාට ඉතා උචිත අවි හා සටන් මාධ්‍යයන් තෝරා ගැනීම සඳහා අළුත් ක්‍රම සිය ගණනින් සහ දහස් ගණනින් පිරික්සා බැලීමට තරම් ඉවසීමක් තිබිය යුතුය.

''කොමියුනිස්ට්වාදී ශ්‍රමදානයන්'' ඉතා වැදගත් වන්නේ, හොඳ යැයි කිවහැකි තත්ත්වයන් යටතේ කොහෙත්ම ජීවත් නොවන කම්කරුවන් විසින් ඒවා පටන් ගත් බැවිනි. විවිධ වෘත්තීය නිපුණත්වයක් ලැබූ කම්කරුවන්ද, කිසිදු පුහුණුවක් නොලැ බූ සාමාන්‍ය තත්ත්වයන් යටතේ ජීවත්වන, එනම් ඉතා අමාරු තත්වයන් යටතේ ජීවත්වන නුපුහුණු කම්කරුවන්ද විසින් එවා පටන් ගත් බැවිනි. රුසියාවේ පමණක් නොව, මුළු මහත් ලෝකය පුරාම ශ්‍රම ඵලදාව පහළ බැසීමේ ප්‍රධාන හේතුව අධිරාජ්‍යවාදී යුද්ධය විසින් ඇති කරන ලද විනාශය, අන්ත දුගී භාවය, කෝපය, විඩාව සහ ලෙඩ රෝග, මන්ද පෝෂණයද බව අපි හැම දෙනෙක්ම ඉතා හොඳින් දනිමු. වැදගත්කම අනුව පසු කී දේ ප්‍රධාන ස්ථානය ගනී. දුර්භික්ෂය ප්‍රධාන කරුණ එයයි. දුර්භික්ෂය නැතිකරලීම සඳහා කෘෂිකර්මයෙහි, ප්‍රවාහනයෙහි සහ කර්මාන්තයෙහි ශ්‍රම ඵලදාව වැඩි කළ යුතුය. ඉදින් ඒ අනුව අපි එක්තරා විධියක වැරදි තර්ක චක්‍රයකට ඇද වැටෙමු. ශ්‍රම ඵලදාව වැඩි කිරීම සඳහා අප දුර්භික්ෂයෙන් බේරීගත යුතුය. දුර්භික්ෂයෙන් බේරීම සඳහා අප ශ්‍රම ඵලදාව වැඩි කළ යුතුය.

මෙවැනි ප්‍රතිවිරුද්ධතාවයන් නිරාකරණය කළ හැක්කේ මෙවැනි දුෂ්ට චක්‍රයන් බිඳ දැමීමෙනි, මිනිසුන්ගේ මනෝභාවයේ රැඩිකල්වාදී වෙනසක් ඇති කිරීමෙනි, එවැනි රැඩිකල් වෙනස්වීම්වල පසුතලයට විරුද්ධව නිතර තීරණාත්මක ක්‍රියා කලාපයක් ඉටු කරන පෞද්ගලික කණ්ඩායම්වල වීරෝදර උනන්දුව මගිනි. මොස්කව්හි නුපුහුණු කම්කරුවෝ සහ දුම්රිය කම්කරුවෝ (සත්තකින්ම, අප මෙහිදී සඳහන් කරන්නේ බහුතරය මිස අතළොස්සක් පමණවූ ලාභ ලබන්නන්, නිලධාරීන් හා අනිකුත් සුදු නිලධාරීන් නොවේ) ඉතාමත්ම අයහපත් තත්ත්වයන් යටතේ ජීවත් වෙති. ඔවුහු නිතර මන්ද පෝෂණයෙන් පෙළෙති. ආහාර තත්ත්වය පොදුවේ අයහපත් වෙමින් පවතින, අස්වැන්නට පෙර මේ අවධියේදී ඔවුහු සැබවින්ම කුසගින්නෙන් පෙළෙති. එසේ වුවද, කුසගින්නෙන් පෙළෙන කම්කරුවෝ ධනපතී-

න්ගේ, මෙන්ෂෙවිකයින්ගේ සහ එස්ආර්වරුන්ගේ ද්වේෂ සහගත ප්‍රතිවිප්ලවවාදී ප්‍රචාරය නොතකා කොමියුනිස්ට්වාදී ශ්‍රමදාන සෙනසුරාදවන් සංවිධානය කරති, වැටුප් රහිත අතිකාල වැඩ කරති, මන්ද පෝෂණය නිසා මහන්සියට පීඩාවට සහ අධික වෙහෙසට පත් වී සිටින කම්කරුවෝ ඒ සියල්ල නොතකා ශ්‍රම ඵලදාවේ අති විශාල උසස්වීමක් ලබාගනිති. මෙය උත්තරීතර වීරත්වයක් නොවන්නේද? මෙය ජගත් ඓතිහාසික වෙනස්වීමකට මුල පිරීමක් නොවන්නේද?

අවසාන විශ්ලේෂණයේදී නව සමාජක්‍රමයේ ජයග්‍රහණය සඳහා ඉතා වැදගත් දේ ශ්‍රම ඵලදාවයි. ප්‍රවේණිදසත්වය යටතේ නොදත් ශ්‍රම ඵලදාවක් ධනපති ක්‍රමය විසින් නිර්මාණය කරන ලදී. සමාජවාදය විසින් වඩාත් උසස් ශ්‍රම ඵලදාවක් ඇති කිරීමෙන් ධනපති ක්‍රමය සම්පූර්ණයෙන්ම පරාජය කිරීමට පුළුවන් වන්නේය, එමෙන්ම එලෙස පරාජය කරනු ඇත. මෙය ඉතා අමාරු දෙයක් වන අතර එය සඳහා දිගු කලක් ගතවනු ඇත. එහෙත් එය පටන් ගෙන ඇත. ප්‍රධාන කරුණ එයයි, දුර්භික්ෂයෙන් පෙළෙන මොස්කව් නගරයේදී, 1919 ගිම්හානයේදී, අවුරුදු හතරක් තිස්සේ අධිරාජ්‍යවාදී යුද්ධයට මුහුණ පෑ, ඉන් අනතුරුව තවත් අවුරුදු එක හමාරක් තිස්සේ අසීරු රටවැසි යුද්ධයට මුහුණ පෑ කම්කරුවන්ට මේ ශ්‍රේෂ්ඨ කාර්යය ආරම්භ කිරීමට පුළුවන් වී නම්, අපට රටවැසි යුද්ධයෙන් ජයගෙන සාමය දිනා ගත හැකි වූවොත් මෙය කෙසේ වර්ධනය වනු ඇතිද?

ධනපති ක්‍රමය යටතේ පවතින ශ්‍රමය සමග සන්සන්දනය කර බලන විට, කොමියුනිස්ට්වාදය යනු ස්වේච්ඡානුගත, පංති හැඟීමෙන් යුත්, සහ ඉතා දියුණු තාක්ෂණික ක්‍රම පාවිච්චි කරන එක්සත් කම්කරුවන්ගේ උසස් ශ්‍රම ඵලදාව වන්නේය. සැබවින්ම කොමියුනිස්ට්වාදය පටන් ගැනීමක් වශයෙන් කොමියුනිස්ට්වාදී ශ්‍රමදාන දිනයන් අති සුවිශේෂ වටිනා කමක් දරයි. මෙය ඉතා විරල දෙයකි, මන්දයත් ධනවාදයේ සිට කොමියුනිස්ට්වාදය කරා පරිවර්තනය වීමේ පළමුවැනි පියවරයන් පමණක් ගන්නා අවධියක අප සිටින බැවිනි (අප පක්ෂයේ වැඩ පිළිවෙල මේ ගැන ඉතා නිවැරදිව ප්‍රකාශ කරයි).

කොමියුනිස්ට් වාදය පටන් ගෙන තිබෙන්නේ, සාමාන්‍ය කම්කරුවන්, සිය අසීරු ශ්‍රමය මැඩ ශ්‍රම ඵලදාව වැඩි කිරීම සඳහාත්, ධාන්‍ය, බිම් අඟුරු සහ යකඩ සෑම පූඩ් එකක්මත් ආරක්ෂා කිරීම සඳහා ස්වයං පරිත්‍යාගයකින් සහ උනන්දුවකින් වැඩ කරන විටය. මේවා ලැබෙනුයේ තමන්ට හෝ තම දෙමාපියන්ට හා කිට්ටු උදවියට නොවේ, ඈත උදවියටය, එනම් මුළු මහත් සමාජයටමය, පළමුවෙන් එක් සමාජවාදී රජයක් තුළද, ඊළඟට සමාජවාදී ජනරජයන්ගේ සංගමයක්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තුළද එක්සත් වී සිටින දස ලක්ෂ සහ කෝටි සංඛ්‍යාත ජනතාවටය.

කාල් මාක්ස් සිය ප්‍රාග්ධනයෙන් ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ ගර්විත සහ වාගාඩම්බර නිදහසේ ප්‍රඥප්තිය සහ මිනිස් අයිතිවාසිකම්ද, අධම ඉන් වන ජාත්‍යන්තරයේ අධම නායකයින් ඇතුළු සියළු රටවල සුළු ධනවාදීන්ගේ සිත් සතන් බුදුවන පොදුවේ නිදහස, සමානත්වය, සහ සහෝදරත්වය; පිළිබඳ සියලු වාග්පාඨද උපහාසයට ලක් කරයි. මාක්ස් මේ ගර්විත ප්‍රකාශනයන්, නිර්ධන පංතිය විසින් ප්‍රශ්නය ඉදිරිපත් කරන චාම්, සරළ, ප්‍රායෝගික දේ සමග සන්සන්දනය කරයි: මේ සඳහා ඉදිරිපත් කරන අදර්ශයක් නම්, දවසකට වැඩ කරන පැය ගණන අඩුකිරීම පිළිබඳ නීති පැනවීමේ ප්‍රතිපත්තියය. නිර්ධන පංතික විප්ලවයේ හරය වඩ වඩාත් පතළවත්ම, මාක්ස්ගේ නිරීක්ෂණයේ යෝග්‍යතාවය සහ ගැඹුර අපට වඩාත් පැහැදිලි වේ. සැබෑ කොමියුනිස්ට්වාදයේ ''සූත්‍ර'' කෞට්ස්කිලාගේ මෙන්ෂෙවිකයින්ගේ සහ එස්ඒර් වරුන්ගේ ගර්විත ව්‍යාකූල සහ භක්තිමත් වාග් පාඨවලට සහ ඔවුන්ගේ ආදරණීය බර්න් ''සහෝදරත්වයේ'' හැම දෙයක්ම ශ්‍රම තත්ත්වයන් දක්වා අඩුකිරීමට වඩා වෙනස් වන්නේය. කම්කරු ප්‍රජාතන්ත්‍රවාදය ගැනත්, නිදහස, සමානත්වය සහ සහෝදරත්වය ගැනත් 'ජනතාවගේ ආණ්ඩුවක්' ආදී දේ ගැනත් වඩාත් අඩුවෙන් දෙඩවීමද කළ යුතුය. ''දිලිසෙන'' ඇඳුමින් සැරසී ඕනෑවට වඩා ''ව්‍යාජ සුහද ගති පාමින්'' හැසිරෙන මිනිසකු දකින සාමාන්‍ය ව්‍යවහාරික බුද්ධියක් හා අත්දැකීම් ඇති මිනිසා ''මූ නම් හොර තක්කඩියකු විය යුතුහ'' යි නිවැරදිව තීරණය කරන්නාක් මෙන්ම, අප කාලයේ පංති හැඟීම් ඇති කම්කරුවෝ සහ ගොවියෝ ධනපති බුද්ධිමතුන්ගේ ගර්විත වාග් පාඨවල ගැබ් වී ඇති වංචා සහ කූටෝපාය ලෙහෙසියෙන්ම බැහැර කරති.

ගර්විත වාග්මාලා අඩුවෙන්ද, වඩාත් සරළ දෛනික වැඩ වැඩියෙන්ද කළ යුතුය. ධාන්‍ය රාත්තල ගැනත්, බිම් අඟුරු රාත්තල ගැනත් වැඩි සැලකිලි දැක්විය යුතුය. මේ ධාන්‍ය රාත්තල සහ බිම් අඟුරු රාත්තල කුසගින්නේ සිටින කම්කරුවාට සහ වැරහැලි ඇඳගෙන පාවහන් රහිතව සිටින ගොවියාට සැපයීම ගැන වැඩි සැලකිලි දැක්විය යුතුය. එසේ කළ යුත්තේ හෙට්ටු කිරීම, කේවෙල් කිරීම මගින් නොවේ, ධනපති ක්‍රමයටද නොවේ. එහෙත් මොස්කව් — කසාන් දුම්රිය මාර්ගයේ නුපුහුණු කම්කරුවන් සහ දුම්රිය කම්කරුවන් වැනි සාමාන්‍ය මිනිසුන් මෙන් පංති හැඟීමෙන් යුතුව, ස්වේච්ඡානුගතව, අසීමිත වීරත්වයකින් යුතුව ශ්‍රමය වැය කිරීමෙනි.

විප්ලවය පිළිබඳ ප්‍රශ්න වලදී අපේ සගයින් අතර පවා හැම පියවරක් පාසාත්, හැම තැනකදීමත්, ධනපති බුද්ධිමත් වාග් පාඨ දෙඩවීම්වල

සේයා පවතින බව අපි හැම දෙනෙක්ම පිළිගත යුතු වෙමු. නිදසුනක් වශයෙන්, මේ දුහද හමන නටබුන් වලට විරුද්ධව, කුණු වූ ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී අතීතයට විරුද්ධව, අපේ පුවත්පත් ඉතා අල්ප ලෙස සටන් කරයි. සරළ නිහතමානී සාමන්‍ය නමුදු සැබෑ කොමියුනිස්ට්වාදයේ ජීවමාන අංකුරවලට අපේ පුවත්පත් ඉතා ස්වල්ප වශයෙන් ආධාර කරයි.

කාන්තාවන්ගේ තත්ත්වය ගෙන බලමු. මේ ක්ෂේත්‍රයේ අප බලයට විත් වසරක් තුළදී කර තිබෙන වැඩ වලින් සියයෙන් එක් කොටසක්වත් ලෝකයේ කිසිම ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් විසින් හෝ ඉතා දියුණු ධනපති සමූහාණ්ඩු විසින් හෝ කර නැත. කාන්තාව අසමාන තත්ත්වයට හෙළා දමන, දික්කසාදවීම සීමා කොටැ, එය සිත් කලකිරවන දේවලින් වට කොටැ, විවාහයෙන් ඉක්බිතිව උපන් දරුවන් පිළිගැනීම ප්‍රතික්ෂේප කොටැ, සිය පියවරුන් සෙවීම බලකිරීම ආදී අපකීර්තිමත් නීති සියල්ල සමූලඝාතනය කර දමන ලදී. ධනපති පංතියට සහ ධනවාදයට නින්ද ගෙනදෙන නීතිවල නටබුන් සියලු සභ්‍ය රටවල දක්නට ඇත්තේය. මේ ක්ෂේත්‍රයේ අප විසින් කර තිබෙන වැඩ ගැන ආඩම්බර වීමට දහස් වාරයක අයිතියක් අපට ඇත්තේය. පැරණි ධනවාදී නීති සහ නීති සංස්ථාවල පදනම් අප පිරිසිදු කරන තරමට, අප ඉදිකිරීම් සඳහා බිම පිරිසිදු කළා පමණක් මිස, තවම ඉදි කිරීමට පටන් ගෙන නැතැයි යන්න අපට වඩාත් පැහැදිලි ලෙස පෙනේ.

කාන්තාවට විමුක්තිය ලබා දෙන සියලු නීති නොතකා ඇ ගෘහමය වහලියක් ලෙස දිගටම වැඩ කරන්නීය. මන්දයත් නොවැදගත් ගෙදර වැඩ ඇය පාගා, පොඩිකොටැ, මොට්ටකොටැ, පහත ඇද හෙළන බැවිනි, ඇය කුස්සියේ වැඩට සහ ළමයින් හද ගැනීමට සීමාවන බැවිනි. ඇ සිය ශ්‍රමය, ම්ලේච්ඡ ලෙස නිෂ්පාදනයෙන් තොරවූ, නොවැදගත්, ස්නායු කිපෙන හා ගෙවී යන, මොට්ට සහ වහල් වැඩට වැය කරන්නීය. මෙම නොවැදගත් ගෘහමය වැඩ වලට විරුද්ධව (රාජ්‍ය බලය සියතට ගත් නිර්ධන පංතියේ නායකත්වය යටතේ) සම්පූර්ණ අරගලයක් පටන් ගත් විට නැතිනම් එය මහා පරිමාණ සමාජවාදී ආර්ථිකයක් ආරම්භ වීම දක්වා වූ පූර්ණ පරිණාමනයකට පත්වූ විට පමණක් කාන්තාවගේ සැබෑ විමුක්තිය, සැබෑ කොමියුනිස්වාදය පටන් ගනු ඇත.

න්‍යායික වශයෙන් හැම කොමියුනිස්ට්වාදියකුම අවිවාදයෙන් පිළිගන්නාවූ මෙම ප්‍රශ්නය ගැන අප ක්‍රියාවෙන් සැහෙන සැලකිල්ලක් දක්වන්නේද? සත්තකින්ම නැත. මෙම ක්ෂේත්‍රයේ දැනටමත් ඇති

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කොමියුනිස්ට්වාදී අංකුර ගැන අපි සෑහෙන සැලකිල්ලක් දක්වමුද? යළිත් අපේ පිළිතුර නැත යනුයි. ප්‍රසිද්ධ අවන් හල්, බාලාගාර, ළමා පාසල් — මෙවැනි අංකුර වල නිදසුන් අපට ඇත. ඇත්ත වශයෙන්ම කාන්තාවට විමුක්තිය ලබා දිය හැකි, පොදු ජන ජීවිතයේ සමාජමය නිෂ්පාදනයේ ක්‍රියා කලාපය අනුව, පුරුෂයා සමග සසඳන විට, ස්ත්‍රියට අයත් අසමානතාවය අඩු කළ හැකි, අහෝසි කළ හැකි, පම්පෝරි, ගර්විත හා උත්සවාකාරයෙන් තොරවූ සරළ එදිනෙද මාධ්‍යයන් මෙහිදී අපට ඇත්තේය. මේවා අළුත් දේ නොවේ, ඒවා (සමාජවාදයේ අන් සියලු ද්‍රව්‍යමය පූර්වාවයන් මෙන්) මහා පරිමාණ ධනවාදය විසින් බිහි කරන ලදී. එහෙත් ධනපති ක්‍රමය යටතේ ඒවා, පළමුව විරල දෙයක් හැටියටත්, දෙවනුව — මෙය වඩාත් වැදගත්ය — මේවා සම-පේක්ෂණය, අයුතු ලාභ ලැබීම, රැවටීම සහ වංචාව නැතිනම් ඉතා හොඳ කම්කරුවන් නියම ලෙස වෛර කළ සහ හෙළා දුටු ''ධනවාදී පුණ්‍ය කර්මවල හරඹ ක්‍රීඩාවක් හැටියටත් පැවතීමය.

අප රටේ මෙවැනි ව්‍යවසායයන්ගේ සංඛ්‍යාව අති විශාල ලෙස වැඩි වූ අතර ඒවායේ ස්වරූපය වෙනස් වීමට පටන් ගෙන තිබෙන බවට සැක නැත. අප දන සිටියාට වඩා කම්කරු සහ ගොවි කාන්තාවන් අතර සංවිධානාත්මක කුසලතාවයක් තිබෙන බවට සැක නැත. සැලැස්ම හා පද්ධති ආදිය පිළිබඳව කතා, බොරු දෙසාබෑම්, අඬදබර සහ පල් හැලි විශාල වශයෙන් ඇද බෑමෙන් තොරව, කම්කරුවන් අති විශාල සංඛ්‍යාවකගේ ආධාරය ඇතිව, ඊටත් වඩා විශාල සංඛ්‍යා-වක් පරිභෝජකයින්ගේ ආධාරය ඇතිව, ප්‍රායෝගික වැඩ කටයුතු සංවිධානය කළ හැකි අයගේ සංඛ්‍යාව අප දන සිටියාට වඩා ඉතා විශාල බවට සැක නැත. විශාල ඔළුගෙඩි ඇති ''බුද්ධිමත්හු'' සහ අඩක් හැඩ ගැසුණු කොමියුනිස්ට්වාදීහූ එවැනි දුර්වලකම් වලින් පෙළෙති. එහෙත් මේ අළුත් අංකුර වලට අපෙන් ලැබිය යුතු සැලකිල්ල නිසි ලෙස නොලැබේ.

ධනපති පංතිය දෙස බලන්න. ඔවුනට අවශ්‍ය දේ ගැන දන්වීම් මගින් ප්‍රචාරය කිරීමට ඔවුන් කොතරම් සමත්ද! ධනපතීන් ''ආදර්ශ'' ව්‍යවසායයන් හැටියට ගණන් ගන්නා දේ ඔවුන්ගේ පුවත්පත්වල කෝටි සංඛ්‍යාත පිටපත් වලින් මහත්සේ ප්‍රසංශාවට ලක්කරන සැටි බලන්න. ''ආදර්ශ'' ධනපති ව්‍යවසායයන් ජාතික ආඩම්බරයක් බවට පත්කර තිබෙන සැටි බලන්න! අපේ ඉතා හොඳ අවන්හල් සහ ළමා-ගාර දිනපතා ඉල්ලීම් අනුව ඉන් සමහරක් ආදර්ශ ආයතන බවට පත්ක-රවීමටත්, ඒවා ගැන විස්තර කිරීමටත් අපේ පුවත්පත් සම්පූර්ණයෙන් නැතිනම් කොහෙත්ම පාහේ සැලකිලි නොදක්වයි. අපේ පුවත්පත්

මේවා ගැන සෑහෙන ප්‍රචාරයක් නොදෙන අතර ඉන් ඇතිවන මිනිස් ශ්‍රම ඉතිරිකිරීම් ගැනත්, ඉන් පරිභෝජකයාට ඇතිවන පහසුකම් ගැනත්, නිෂ්පාදනයන්ගේ ලාභය ගැනත්,ගෙදර දොර වහල් වැඩ වලින් කාන්තාව විමුක්ති කිරීම ගැනත්, සෞඛ්‍ය තත්ත්වයන්ගේ උසස්වීම ගැනත් විස්තර නොකරයි. මේවා ආදර්ශමත් කොමියුනිස්ට්වාදී වැඩ වලින් සහ මුළු මහත් සමාජයටත්, මුළු මහත් වැඩකරන ජනතාවටත් පතළ කිරීමෙන් ලබාගත හැකි බව විස්තර නොකරයි.

ආදර්ශවත් නිෂ්පාදනය, ආදර්ශවත් කොමියුනිස්ට්වාදී ශ්‍රමදනය, සෑම ධාන්‍ය රාත්තලක්ම ලබාගැනීමේදී සහ බෙද හැරීමේදී ආදර්ශවත් සැලකිල්ල සහ හෘද සාක්ෂියට අනුව යුක්ති සහගත භාවය, ආදර්ශවත් අවන්හල්, අසවල් — අසවල් කම්කරු නිවාසවලත්, තට්ටු ගෙවල්-වලත් ආදර්ශවත් පිරිසිදු භාවය, යන මේවාට අපේ පුවත්පත් මගින් සහ සෑම කම්කරු සහ ගොවි සංවිධාන වලින්ද දනට වඩා දසවාරය-කින් වැඩි සැලකිලි ලැබිය යුතුය. මේවා සියල්ල කොමියුනිස්ට්වාදයේ අංකුරයන්ය. මේවාට සැලකිලි දක්වීම අපේ පොදු සහ මූලික කාර්ය භාරය වන්නේය. අපේ ආහාර සහ නිෂ්පාදනය තත්ත්වය අසීරු වුවද, අවුරුදු එකහමාරක බොල්ෂෙවික්වාදී පාලනයකින් පසු හැම අතින්ම වර්ධනයක් පෙනෙන්නට තිබේ. ආහාර මිලදී ගැනීම පූඩ් කෝටි 3 (1917 අගෝස්තු 1 ද සිට 1918 අගෝස්තු 1 ද දක්වා) සිට පූඩ් කෝටි 10 ක් (1918 අගෝස්තු 1 ද සිට 1919 මැයි 1 ද දක්වා) දක්වාද වැඩි වී ඇත. එළවළු වතු වගාව වැඩිවී ඇත. වගාවට යට නොවූ ඉඩම්වල ප්‍රමාණය අඩු වී ඇත. ඉන්දන පිළිබඳව අති විශාල අමාරුකම් නොතකා දුම්රිය ප්‍රවාහණය දියුණු වීමට පටන් ගෙන ඇත. මෙවැනි පොදු පසුතලයක් සහිතව සහ නිර්ධන පංතික රාජ්‍ය බලයේ ආධාරය ඇතිව කොමියුනිස්ට්වාදයේ අංකුර අතුරු දහන් නොවනු ඇත. මේවා පූර්ණ කොමියුනිස්ට්වාදය දක්වා වැඩී, දියුණු වනු ඇත.

* * *

මේ මහා ආරම්භයෙන් ඇතිවන ඉතා වැදගත් ප්‍රායෝගික පාඩම් අප සියලු දෙනා විසින් ලබාගනු පිණිස කොමියුනිස්ට්වාදී ශ්‍රමදන සෙනසුරාදවල වැදගත්කම ගැන අපි ඉතා ගැඹුරු ලෙස කල්පනා කල යුතු වෙමු.

මේ මහා ආරම්භයට සෑම ආධාරයක්ම ලබාදීම පළමුවැනි සහ ප්‍රධාන පාඩම වන්නේය. 'කොමියුන්' නැමැති වචනය අපි ඉමහත් සැහැල්ලු ලෙස පාවිච්චි කිරීමට පටන් ගෙන ඇත්තෙමු. කොමියුනිස්-

https://liberationbase.wordpress.com

ටවාදීන් විසින් ආරම්භකරන නැතිනම් ඔවුන්ගේ සහභාගිත්වය ඇතිව පටන් ගන්නා හැම ව්‍යාපාරයක්ම අපි නිතරපාහේ එකවර කොමියුන් හැටියට නම් කරමු. මෙම ඉතා ගෞරවනීය නාමය දීර්ඝ කාලීන සහ ස්ථිර පරිශ්‍රමයන් මගින්ද, සැබවින්ම කොමියුනිස්ට්වාදී වර්ධනය තුළින් ලබා ගන්නා ප්‍රායෝගික ජයග්‍රහණයන් මගින්ද දිනාගත යුතු බව නිතර පාහේ අමතක කර ඇත.

''පරිභෝජකයින්ගේ කොමියුන''[70] නැමැති යෙදුම භාවිතා කිරීමට මහජන කොමිසාර්වරුන්ගේ මණ්ඩලය කළ තීරණය අවලංගු කිරීම ගැන මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුවේ සාමාජිකයින්ගෙන් වැඩි දෙනෙකු කල්පනා කිරීම නිවැරදි බව මා සිතන්නේ එබැවිනි. එම නාමය වඩාත් සරළ වූවාවෙ. යටත් පිරිසෙයින් නව සංවිධානයේ මූලික අවධිවලදී ඇතිවන වැරදි සහ අඩුපාඩුකම් වලට ''කොමියුන් වලට'' දෙස් පැවරීම වෙනුවට නරක කොමියුනිස්ට්වාදීන්ට දෙස් පැවරුවාවේ (සාධාරණ ලෙස ඔවුන්ට දෙස් පැවරිය යුතුය). කොමියුන් නැමැති වචනය පොදු භාවිතයෙන් බැහැර කිරීම හොඳ දෙයකි. සෑම හෙංචයියකුටම එම වචනය පාවිච්චි කිරීමට ඉඩදීම තහනම් කළ යුතුය, නැතිනම් තම කටයුතු නියම කොමියුනිස්ට්වාදී ලෙස සංවිධානය කිරීමෙහි සමත් (අවට ජනගහණය විසින් ඒකමතිකව පිළිගැනීමෙන් ඔප්පු කරන ලද) ප්‍රයෝගික ලෙස එසේ පෙන්වන ලද සැබෑ කොමියුන් වලට පමණක් මෙම නාමය භාවිතා කිරීමට ඉඩ දිය යුතුය. වැටුප් රහිතව සමාජයේ යහපත තකා, මුළු මහත් වැඩකරන ජනතාවගේ යහපත තකා වැඩ කිරීමට සමත් බවද, විප්ලවවාදී ක්‍රමයකට වැඩ කිරීමට සමත් බවද, ශ්‍රම ඵලදව වැඩි කිරීමට සමත් බවද, වැඩ ඉතා ආදර්ශවත් විදිහකට සංවිධානය කිරීමට සමත් බවද පළමුවෙන්ම පෙන්විය යුතුය. ඉන් අනතුරුව පමණක් කොමියුන් නැමැති ගෞරවනීය නාමය ලබාගනු පිණිස අත දිගු කරන්න!

මේ අනුව කොමියුනිස්ට්වාදී ශ්‍රමදානය ඉතා වටිනා විශේෂතාවයකි. මොස්කව් — කසාන් දුම්රිය මාර්ගයේ නුපුහුණු කම්කරුවෝද දුම්රිය කම්කරුවෝද තමන්ට කොමියුනිස්ට්වාදීන් හැටියට වැඩ කළ හැකි බව පළමුවෙන් ක්‍රියාවෙන් පෙන්වූහ. ඉන් අනතුරුව කොමියුනිස්ට්වාදී ශ්‍රමදයකයින් නැමැති නාමය සිය ව්‍යාපාරය සඳහා තෝරාගත්හ. තම අසීරු වැඩවලින් සහ දීර්ඝ කාලීන පරිශ්‍රමය තුළින් ප්‍රයෝගික සාර්ථකත්වය ඔප්පු නොකර, ආදර්ශවත් වැඩ සහ කොමියුනිස්ට්වාදී සංවිධානයක් රහිතව, යම් කිසිවෙක් තම ව්‍යාපාරය, සංස්ථාව හෝ වැඩ කටයුතු කොමියුනයක් ලෙස පෙන්වා දීමට ඉදිරිපත් වන්නේ නම්, ඔහු ප්‍රෝඩාකාරයකු හා පුහු මිනිසකු හැටියට අනුකම්පා විරහිත

ලෙස හංවඩු ගැසීමට, අප විසින් වග බලා ගත යුතුය, එය සහතික කළ යුතුය.

මෙම මහා ආරම්භය, ''කොමියුනිස්ට්වාදී ශ්‍රමදනය'' තවත් කාර්යයක් සඳහා එනම්, පක්ෂය පිරිසිදු කිරීම සඳහා යෙදවිය යුතුය. විප්ලවයට ඉක්බිතිව මුල් වකවානුවේදී, පොදු ජනතාවගේ ''ගෞරවනීය'' සහ අවරසික හැඟීම් ඇති මිනිසුන් බියවී සිටි විටදීත්, මෙන්ෂෙවිකයන් සහ එස්ආර් වරුන් ඇතුළු ධනපති බුද්ධිමතුන්ට අයත් හැම මිනිසකුම ධනවාදයට ගැතිකම් කරමින් කඩාකප්පල්කාරී වැඩ කළ විට, වෛක්‍රමිකයින් සහ වෙනත් හානිකර පුද්ගලයින් ආණ්ඩු කරන පක්ෂය තුළට රිංගා ගැනීම නොවැළැක්විය සැකි දෙයක් විය. මෙය රහිතව විප්ලවයක් සිදුවන්නේවත්, සිදුවූයේවත් නැත. මෙහිදී වැදගත් කරුණ නම්, යහපත් සහ ශක්තිමත් පුරෝගාමී පංතිය මත පදනම් කැරුගෙන සිය සාමාජිකත්වය ශෝධනයකට භාජනය කිරීමට ආණ්ඩු කරන පක්ෂය සමත් වීමය.

අපි මෙම වැඩ බොහෝ කලකට පෙර පටන් ගතිමු. මෙය ස්ථිර ලෙසත් නොකඩවාත් කරගෙන යා යුතුය. යුද්ධය සඳහා කොමියුනිස්ට්වාදීන් සේවයට බඳවා ගැනීම මෙහිදී අපට ආධාර විය. බියගුල්ලෝ සහ තක්කඩියෝ පක්ෂය අතහැර පලා ගියහ. පලා යනවුන්ට ඉණිමං බැන්දක් මෙන් විය! මෙලෙස පක්ෂයේ සාමාජික සංඛ්‍යාව අඩුවීම පක්ෂයේ ශක්තිය හා බර විශාල වශයෙන් වැඩිවීමට හේතුවක් විය. මෙලෙස ශෝධනයට භාජනය කිරීම අප විසින් දිගටම කළ යුතුය. කොමියුනිස්ට්වාදී ශ්‍රමදනයන් නිසා ඇතිවූ මෙම මහා ආරම්භය, මේ කාර්යය සඳහා යෙදවිය යුතුය. ''විප්ලවවාදී ලෙස වැඩ කිරීමේ'' හයමසක ''පරීක්ෂණ'' කාලයකින් නැතිනම් ''අපේක්ෂක'' කාලයකින් අනතුරුව පමණක් පක්ෂයේ සාමාජිකයින් හැටියට බඳවා ගත යුතුය. 1917 ඔක්තෝබර් මස 25 දට පසුව පක්ෂයට බැඳුණු සියලු සාමාජිකයින්ගෙන් මෙවැනිම පරීක්ෂණයක් ඉල්ලා සිටිය යුතුය. කොමියුනිස්ට්වාදීන් හැටියට නිරපේක්ෂ විශ්වාසයක්, ලැදිකමක් සහ දක්ෂතාවයක් විශේෂ කාර්යයක් සහ සේවයක් මගින් ඔප්පු නොකළ හැම සාමාජිකයකුම මෙවැනි පරීක්ෂණයකට භාජනය කළ යුතුය.

සැබෑ කොමියුනිස්ට්වාදී ලෙස වැඩකිරීම ක්‍රමවත් ලෙස වැඩි කිරීමක් ඉල්ලා සිටීම මගින් පක්ෂයට සිය සාමාජිකයින් ශෝධනයට භාජනය කළ හැකිය. මේ නිසා රාජ්‍ය යන්ත්‍රයේ කාර්යක්ෂමභාවය වඩාත් උසස් වනු ඇත. ගොවීන් විප්ලවවාදී නිර්ධන පංතියේ පැත්තට අවසාන ලෙස පරිණාමනය වීම වඩාත් ඉක්මන් වීමක් මේ නිසා සිදුවනු ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ආනුෂංගික ලෙස කොමියුනිස්ට්වාදී ශ්‍රමදානයන්, නිර්ධන පංතික ආඥාදායකත්වය යටතේ රාජ්‍ය යන්ත්‍රයේ පංතිමය ස්වරූපය පිළිබඳව ප්‍රබල ආලෝකයක් විහිදුවා ඇත. ''විප්ලවවාදී ලෙස වැඩකිරීම'' නැමැති ලිපියක් මධ්‍යම කාරක සභාව විසින් කෙටුම්පත් කර ඇත. ලක්ෂයක සිට දෙලක්ෂයක් දක්වා සාමාජික සංඛ්‍යාවක් ඇති පක්ෂයක් පිළිබඳ අදහසක් මධ්‍යම කාරක සභාව විසින් ඉදිරිපත් කර ඇත (සෑහෙන ශෝධනයකට භාජනය කිරීමෙන් පසුව පක්ෂයේ සාමාජික සංඛ්‍යාව මෙතරම් වනු ඇතැයි මම අදහස් කරමි. දැනට පක්ෂයේ සාමාජික සංඛ්‍යාව වඩාත් විශාලය).

වෘත්තීය සමිතිවලට සංවිධානය වී සිටින කම්කරුවෝ මෙම අදහස පිළිගෙන ඇත්තාහ. රුසියාවේ සහ උක්රයිනයේ වෘත්තීය සමිතිවල කම්කරු සාමාජික සංඛ්‍යාව හතළිස් ලක්ෂයකි. මොවුන්ගෙන් අති විශාල බහුතරය නිර්ධන පංතිය රාජ්‍ය බලය සතු කර ගැනීමටත්, නිර්ධන පංතික ආඥාදායකත්වයටත් පක්ෂපාතය. දෙලක්ෂයක් සහ හතළිස් ලක්ෂයක්, කිසිවකු විසින් ප්‍රකාශ කළ හැකි පරිදි පන්න රෝදවල අනුපාතය එසේය. ඊළඟට ප්‍රධාන කණ්ඩායම් තුනකට බෙදී සිටින කෝටි සංඛ්‍යාත ගොවි ජනතාවය. නිර්ධන පංතියට ඉතා කිට්ටුවෙන් සිටින අර්ධ නිර්ධනීන් නැතිනම් දුප්පත් ගොවීන් සංඛ්‍යා වශයෙන් ඉතා විශාල වේ. ඊළඟට මැද ගොවීන්ය. සංඛ්‍යාව අනුව ඉතා සුළු කණ්ඩායමක් වන කුලාකයින් හෙවත් ගම්බද ධනපති පංතිය තෙවැන්නය.

ධාන්‍ය වෙළඳම් කිරීම සහ දුර්භික්ෂයෙන් ලාභ ලබා ගැනීම පවතින තාක් කල් (නිර්ධන පංතික ආඥාදායකත්වය යටතේ මෙය එක්තරා කාලයක් ගතවන තුරු නොවැළැක්විය හැකිය), ගොවියා අර්ධ කම්කරුවකු හැටියටත්, අර්ධ ලාභ ලබන්නෙකු හැටියටත් පවතිනු ඇත. ලාභ ලබන්නකු හැටියට ගොවියා අපට,නිර්ධන පංතික රජයට විරුද්ධය. ඔහු මෙන්ෂෙවික ෂර් නැතිනම් එස්ඵර් බී.වෙර්නෙන්කොව් දක්වාවූ ධනවාදීන්ගේ අවංක සේවකයින් ඇතුළු ධනපති පංතිය සමග එකහවීමට නැඹුරු වෙයි. මන්දයත් ඔවුන් නිදහස් ධාන්‍ය වෙළඳාමට පක්ෂපාත බැවිනි. එහෙත් වැඩකරන මිනිසකු හැටියට ගොවියා නිර්ධන පංතික රජයේ මිතුරෙකි. ඉඩම් හිමියාට සහ ධනපතියාට විරුද්ධව ගෙනයන අරගලයේදී කම්කරුවාගේ ඉතා විශ්වාසදායක මිතුරෙකි. වැඩ කරන මිනිසුන් හැටියට ගොවියෝ, අති බහුතර සංඛ්‍යාව නිර්ධන පංතික පුරෝගාමී බලඇණිය වන කොමියුනිස්ට්වරුන් ලක්ෂයක් හෝ දෙලක්ෂයකගේ නායකත්වයෙන් ඇති, දස ලක්ෂ සංඛ්‍යාත සංවිධිත නිර්ධනීන්ගෙන් සමන්විත රාජ්‍ය ''යන්ත්‍රයට'' ආධාර කරති.

වචනයේ පරිසමාප්ත අර්ථයෙන් වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී රජයක්, වැඩකරන සහ සූරාකනු ලැබූ ජනතාව සමග වඩාත් සමීප ලෙස සම්බන්ධ වුණු රජයක් මීට පෙර කවර කලෙකවත් නොතිබිණි.

කොමියුනිස්ට්වාදී ශ්‍රමදාන වලට යෙදූ පරිදි සුපැහැදිලි ලෙසම නිර්ධන පංතික වැඩවලට, නිර්ධනීන්ගේ රජය වෙත පූර්ණ ගරුත්වයක් සහ ආදරයක් දිනාගත හැකිය. අප නිවැරදි බවත්, කොමියුනිස්ට්වාදය නිවැරදි බවත්, ගොවියාට ඒත්තු ගැන්විය හැක්කේත්, ඒ අනුව ඔහු අපගේ විශ්වාසදායක මිතුරා බවට පත්කර ලිය හැක්කේත් එවැනි වැඩවලට පමණකි. ඒ අනුව ආහාර පිළිබඳව අප මුහුණ පා ඇති අමාරුකම් සම්පූර්ණයෙන් නැතිකර ලීමට මග පෑදෙනු ඇත. ධාන්‍ය බෙදහැරීම සහ නිෂ්පාදනය සම්බන්ධයෙන් ධනවාදය පරදවා කොමියුනිස්ට්වාදයේ පූර්ණ ජයග්‍රහණය ලබා ගැනීමටත්, කොන්දේසි විරහිතව කොමියුනිස්ට්වාදය තහවුරු කිරීමටත් මග පෑදෙන්නේ එමගින් පමණකි.

1919 ජූනි 28 ද

මොස්කව්හි, රාජ්‍ය ප්‍රකාශක මන්දිරය මගින් 1919 ජූලි මාසයේදී වෙනම පොත් පිංචක් ලෙස ප්‍රසිද්ධ කරන ලදී.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, වෙළුම 39, පිටු 1-29.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

තරුණ සමිතිවල කාර්ය භාරයන්

(1920 ඔක්තෝබර් 2 ද රුසියන් තරුණ කොමියුනිස්ට් සංගමයේ තෙවැනි සමස්ත රුසියානු සමුළුව අමතා කළ කතාව)

(අත්පොළසන් සහ ප්‍රීති ඝෝෂා මධ්‍යයේ සමුළුව ලෙනින් සාදරයෙන් පිළිගත්තාය.) සහෝදරවරුනි, අද, තරුණ කොමියුනිස්ට් සංගම්වල මූලික කාර්ය භාරයන් ගැනද, මේ සම්බන්ධයෙන් සමාජවාදී ජනරජයක තරුණ සංවිධාන පොදුවේ කෙසේ විය යුතුද යන්න ගැනද කතා කිරීමට මම අදහස් කරමි.

LIBERATIONBASE

මෙම ප්‍රශ්නය ගැන පැහැදිලි කිරීම වඩාත් අවශ්‍යය, මන්දයත් කොමියුනිස්ට්වාදී සමාජයක් බිහිකිරීමේ සැබෑ කාර්ය භාරයට තරුණයින්ට මුහුණ දීමට සිදුවන බව එක් අතකින් කිව හැකි බැවිනි. මන්දයත්, සූරාකෑම මත ගොඩනගා ඇති පැරණි ධනපති ජීවන ක්‍රමයේ පදනම් විනාශ කර දැමීමේ කාර්ය භාරය සපුරාලීමට ධනපති සමාජය තුළ හැදී වැඩුණු වැඩකරන ජනතාවට වැඩිම වුනොත්, කළ හැකි බව පැහැදිලි බැවිනි. නිර්ධන පංතියට සහ වැඩකරන පංති වලට රාජ්‍ය පාලනය දිගටම තම අත තබා ගැනීමට හැකිවන සමාජ ක්‍රමයක් බිහිකිරීමට සහ අළුත් තත්ත්වයන් යටතේ වැඩ කිරීමට පටන් ගන්නා වූ පරපුරකට ගොඩනැගිය හැකි සමාජ ක්‍රමයකට පදනම් දැමීමට වැඩිම වුනොත් ඔවුන්ට පුළුවන්වනු ඇත. මෙවැනි තත්ත්වයක් යටතේ මිනිසකු විසින් මිනිසකු සූරාකෑම තව දුරටත් නොපවතින්නේය.

ඉතින්, මේ අනුව තරුණයින් මූණ පාන කාර්යයන් ගැන විමර්ශනය කරන විට, පොදුවේ තරුණයින්ගේ කාර්ය භාරයත්, විශේෂයෙන් තරුණ කොමියුනිස්ට් සංගමය සහ අනිකුත් සංවිධානවල කාර්යයනුත් පිළිබඳව එකම වචනයකින් සම්පිණ්ඩනය කළ හැකිය: එනම් ඉගෙන ගන්න යනුයි.

සත්තකින්ම මෙය ''එක් වචනයක්'' පමණකි. එය මූලධර්මයට සහ ඉතා හදිසි ප්‍රශ්නවලට පිළිතුරු සපයන්නේ නැත: ඉගෙන ගන්නේ මොනවාද, ඉගෙන ගන්නේ කෙසේද? මෙහිදී ප්‍රධාන කරුණ නම්, පැරණි ධනපති සමාජය පරිවර්තනය කිරීමත් සමගම කොමියුනිස්ට්-

වාදී සමාජය ගොඩනගන පරපුරේ ශික්ෂණය, පුහුණුව සහ අධ්‍යාපනය පැරණි ක්‍රම අනුව ගෙනයාමට නොහැකි වීමය. තරුණයින්ට උගැන්වීම, පුහුණු කිරීම, සහ අධ්‍යාපනය දීම පටන් ගත යුත්තේ පැරණි සමාජය විසින් අපට දී තිබෙන දේ වලිනි. අපට කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩ නැගිය හැක්කේ, පැරණි සමාජය විසින් අපට ඉතිරි කරන ලද දැනීමේ සමස්තයද, සංවිධාන සහ ආයතනයන්ද පදනම් කර ගනිමිනි, මිනිස් බලය සහ මාධ්‍යයන්ද ප්‍රයෝජනයට ගනිමින් පමණකි. පැරණි සමාජයට වඩා වෙනස් සමාජයක් නිර්මාණය කිරීම, එනම් කොමියුනිස්ට්වාදී සමාජයක් නිර්මාණය කිරීමේ තරුණ පරපුරේ වැයම අපට සාර්ථක කළ හැක්කේ තරුණයින්ට උගැන්වීම්, ඔවුන් සංවිධානය කිරීම සහ පුහුණු කිරීම රැඩිකල්වාදී ලෙස ප්‍රතිනිර්මාණය කිරීමෙනි. අප තරුණයින්ට ඉගැන්විය යුත්තේ මොනවාද, කොමියුනිස්ට්වාදීන් යන නමට, නියම සුදුස්සන් වීමට කැමති නම්, ඔවුන් ඉගෙන ගත යුත්තේ මොනවාද, අප පටන් ගත් දේ සම්පූර්ණ කිරීමට සහ පරිසමාප්තියට පත් කිරීමට ඔවුනට හැකි වන සේ ඔවුන් පුහුණු කළ යුත්තේ කෙසේද යන ප්‍රශ්නය ගැන අප සවිස්තර ලෙස පැහැදිලි කරගත යුත්තේ එබැවිනි.

පළමුවෙන්ම දිය හැකි ස්වාභාවික පිළිතුර නම්, කොමියුනිස්ට්වාදය දක්වා ඉදිරියට ගමන් කිරීමට කැමති තරුණ සංගමය සහ පොදුවේ තරුණයින්, කොමියුනිස්ට්වාදය ඉගෙන ගත යුතුය යනුයි.

එහෙත් මෙම පිළිතුර, එනම් 'කොමියුනිස්ට්වාදය ඉගෙන ගැනීම' ඉතා පොදුය. කොමියුනිස්ට්වාදය ඉගෙනගැනීම සඳහා අප විසින් කළ යුත්තේ කුමක්ද? කොමියුනිස්ට්වාදය ගැන දැනීමක් ලබා ගැනීම සඳහා සාමාන්‍ය දැනීමේ සමස්තයෙන් අප විසින් වෙන් කර ගත යුත්තේ මොනවාද? කොමියුනිස්ට්වාදය ඉගෙන ගැනීමේ පරමාර්ථ වැරදි විධියට ඉදිරිපත් කරන විටත්, නැතිනම් ඕනෑවට වඩා එක් පැත්තකට බරවූ විධියකට එය ගැන අර්ථ කථනයක් ඉදිරිපත් කරන විටත්, අවදානම් කීපයක් මතු වේ.

ස්වාභාවික ලෙසම, කොමියුනිස්ට්වාදය ගැන ඉගෙනගැනීම ගැන කියන විට, කොමියුනිස්ට්වාදී අභ්‍යාස පොත්වලත්, පොත් පිංචවල සහ කුඩා පොත්වලත් ඇත්තාවූ උගැන්වීම්වල සමස්තය උකහා ගැනීම පිළිබඳ අදහස කෙනෙකුට පහළ වෙයි. එහෙත් කොමියුනිස්ට්-වාදය ඉගෙනගැනීම පිළිබඳ එවැනි නිර්වචනයක් ඉතා ගොරහැඩි මෙන්ම අසම්පූර්ණද වන්නේය. කොමියුනිස්ට් කෘතීන්වලත්, පොත්-වලත්, කුඩා පොත්වලත් ඇති දේ නිකම්ම නිකම් කට පාඩම් කිරීම පමණක් නම්, අපට පොතේ ගුරාලා නැතිනම් පුරසාරම් දෙඩවන්නන්

https://liberationbase.wordpress.com

ලෙහෙසියෙන් ලබාගත හැකි වන්නේය. මෙය අපට බොහෝ විට, අලාභ හානි කරනු ඇත. මන්දයත්, කොමියුනිස්ට්වාදී පොත්වල සහ පොත් පිංචවල ඇති දේ කට පාඩම් කිරීමෙන් අනතුරුව, මේ සියලු දැනීම ඔවුනට නිසිලෙස සම්බන්ධ කිරීමට නොහැකිවන බැවිනි, කොමියුනිස්ට්වාදය සැබවින්ම ඉල්ලා සිටින පරිදි ක්‍රියා කිරීමට ඔවුනට නොහැකි වන බැවිනි.

පැරණි ධනවාදී සමාජය විසින් අපට දයාද කොට ඇති ඉතා විශාල හානියක් සහ අවාසනාවක් නම්, පොත් සහ ප්‍රායෝගික ජීවිතය අතර ඇති පූර්ණ භේදයය. හැම දෙයක්ම හැකි තරම් ඉතා හොඳ පිළිවෙලට විස්තර කරන පොත් අපට තිබුණද, බොහෝ පොත්වල ධනවාදී සමාජය ගැන විනාශකාරී සහ කෛරාටික බොරුද ව්‍යාජ විස්තරයක්ද තිබේ.

කොමියුනිස්ට්වාදය ගැන පොතින් පමණක් දැනගැනීම අති විශාල වරදක් වන්නේ එබැවිනි. කොමියුනිස්ට්වාදය ගැන ඉස්සර කී දේ, යළිත් එපරිද්දෙන්ම අනුකරණය කිරීමක් දැන් අපේ කතාවල සහ ලිපිවල නැත. මන්දයත්, අපේ කතා සහ ලිපි සියලු ක්ෂේත්‍රවල අපේ වැඩ සමග සම්බන්ධ වී ඇති බැවිනි. වැඩවලින් තොරව සහ අරගලවලින් තොරව, කොමියුනිස්ට්වාදය පිළිබඳව කෘතීන්වලින් සහ පොත්වලින් ලබන දැනුම කිසිදු වටනාකමක් නැත. මන්දයත්, එය න්‍යායය සහ ව්‍යවහාරය අතර ඇති පැරණි භේදයද, පැරණි ධනවාදී සමාජයේ ඉතා විනාශකාරී ලක්ෂණය වන පැරණි විභේදනයද දිගින් දිගටම පවත්වාගෙන යන බැවිනි.

කොමියුනිස්ට්වාදී උද්යෝග පාඨ පමණක් ජීර්ණ කර ගැනීම ඊටත් වඩා භයානකය. මෙම අවදානම අපි කල් වේලා ඇතිව අවබෝධ නොකර ගන්නෙමු නම්, මෙම අවදානම මග හරවා ගැනීම සඳහා අපේ සියලු ප්‍රයත්නයන් අපි නොයොදවමු නම්, මේ විධියට කොමියුනිස්ට්වාදය ඉගෙන ගෙන තමන් කොමියුනිස්ට්වාදීන් යැයි කියා ගන්නා පන්ලක්ෂයක් හෝ දසලක්ෂයක් හෝ තරුණ තරුණියෝ කොමියුනිස්ට්වාදයේ අරමුණට අති විශාල හානියක් ගෙන දෙනු ඇත්තාහ.

දැන් අප ඉදිරියේ පැන නගින ප්‍රශ්නය මෙසේය: කොමියුනිස්ට්වාදය හැදෑරීම සඳහා මේ සියල්ල අප මුසු කරන්නේ කෙසේද? පැරණි පාසල් වලින්ද, පැරණි වර්ගවලට අයත් විද්‍යාවන්ගෙන් අප ගත යුත්තේ මොනවාද? පොදුවේ විද්‍යා විෂයයන් උගැන්වීම සඳහා අංග සම්පූර්ණ අධ්‍යාපනයක් ලැබූ පුද්ගලයින් බිහිකිරීම පැරණි වර්ගයේ පාසල්වල ප්‍රකාශිත අරමුණ විය. මුළු මහත් සමාජය පංතිවලටත්, සූරාකන්නන් සහ සූරාකනු ලබන්නන් වශයෙනුත් බෙදීම පදනම් කර ගැනීම සහ

එම බෙදීම දිගටම පවත්වා ගැනීමත් නිසා මෙය සම්පූර්ණ ව්‍යාජයක් බව අපි දනිමු. පැරණි නිකායයන් සම්පූර්ණයෙන්ම පංතිමය හැඟීම්වලින් පිරී ඉතිරී තිබුණු බැවින්, ස්වභාවයෙන්ම දැනීම ලබා දුන්නේ ධනපති පංතියේ ළමයිනට පමණකි. ධනපති පංතියේ වුවමනාවන් සඳහා හැම වචනයක්ම බොරු කර ඇත. මෙම පාසල්වල කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ තරුණ පරපුරට අධ්‍යාපනයක් ලබා දෙනවාට වඩා ධනපති පංතියේ වුවමනාවන්ට සරිලන සේ ඔවුන් පුහුණු කර ඇත. ධනපති පංතියේ සාමයට සහ කුසීත විවේකයට බාධා නොකර එයට ලාභ ලබා දිය හැකි, ධනපති පංතියට ප්‍රයෝජනවත් මෙහෙකරුවන් හැටියට ඔවුන් පුහුණු කරන ලදී. පැරණි වර්ගයේ පාසල් ප්‍රතික්ෂේප කරන අතරම, සැබෑ කොමියුනිස්ට්වාදී අධ්‍යාපනයක් සඳහා අපට අවශ්‍ය දේ ඒවායින් ලබා ගැනීම අප අපේ අරමුණ ලෙස ඉදිරිපත් කර ඇත්තේ එබැවිනි.

පැරණි පාසල්වලට විරුද්ධව අප විසින් නිතර ඉදිරිපත් කළ සහ නිතරපාහේ සම්පූර්ණ වැරදි නිගමනවලට එළඹුණු දෝෂාරෝපණ සහ චෝදනා මෙහිදී මම සැලකිල්ලට ගනිමි. පැරණි පාසල හුදු පොත්වලින් පමණක් දැනීම ලබන, ඉමක් නැති සරඹ ව්‍යායාම් සහ කට පාඩම් කරන පාසලක් බව කියති. එය සත්‍යයකි, එහෙත් පැරණි පාසල්වල අයහපත් දේ මොනවාද, අපට ප්‍රයෝජනවත් දේ මොනවාද යන්න අප තීරණය කළ යුතුය. කොමියුනිස්ට්වාදයට අවශ්‍ය දේ තෝරා ගැනීමට අප සමත් විය යුතුය.

පැරණි පාසල් අභ්‍යාස පොත්වලින් පමණක් දැනීම ලබා දුන්නේය. අප්‍රයෝජනවත්, මතුපිට පාවෙන සහ පුහු දැනීමක් ජීර්ණ කර ගැනීමට පැරණි පාසල් තම සිසුනට බල කළෝය. මේවායින් තරුණ පරපුරේ මොළය පිරුණු අතර ඔවුන් එකම රටාවක් අනුව පෙළ ගැසුණු නිලධාරීන් බවට පත් විය. එහෙත් මිනිස් සංහතිය විසින් මෙතෙක් එකතු කර ගන්නා ලද දැනීම් සම්භාරය ස්වීකරණයට භාජනය නොකර කෙනෙකුට කොමියුනිස්ට්වාදියකු විය හැකිය යන නිගමනයට එළැඹීම සාවද්‍ය වන්නේය. කොමියුනිස්ට්වාදය ප්‍රතිඵලයක් බවට පත්කළ දැනීම් සමස්තය නතු කර නොගෙන කොමියුනිස්ට්වාදී සටන් පාඨ සහ කොමියුනිස්ට් විද්‍යාවේ නිගමන පමණක් ඉගෙන ගැනීම සෑහේයැයි සිතීම වරදකි. මාක්ස්වාදය මිනිස් දැනීමේ සමස්තය තුළින් කොමියුනිස්ට්වාදය පැන නැගුනේ කෙසේද යන්න පෙන්වන නිදසුනකි.

කොමියුනිස්ට්වාදී න්‍යායය — කොමියුනිස්ට්වාදී විද්‍යාව ප්‍රධාන වශයෙන් මාක්ස් විසින් නිර්මාණය කළ බව ඔබ කියවා ඇත, අසා ඇත. මෙම මාක්ස්වාදී ධර්මය බිහිකළේ මහා ප්‍රඥාවන්තයකු විසින්

https://liberationbase.wordpress.com

වුවද, එය දහ නව වැනි සියවසේ තනි සමාජවාදියකුගේ කෘතියක් ලෙස තව දුරටත් නොපවතී. ධනපති ක්‍රමය විරුද්ධව තමන් ගෙන යන සටන්. අරගලවලදී මාක්ස්වාදයට ක්‍රියාවට යොදන ලෝකයේ සෑම තැනම සිටින කෝටි සංඛ්‍යාත නිර්ධනීන්ගේ ධර්මය බවට එය පත්වී තිබේ. අතිශයින්ම විප්ලවවාදී පංතියේ ලක්ෂ සංඛ්‍යාත සහ කෝටි සංඛ්‍යාත ජනතාවකගේ හදවත් හා බුද්ධිය දිනාගැනීමට මාක්ස්වාදය සමත්වූයේ මන්දැයි ඔබ ප්‍රශ්න කළොත් ඔබට ලැබෙන පිළිතුර මෙසේය: එයට හේතුව මාක්ස් ධනපති ක්‍රමය යටතේ ලබාගත් මිනිස් දැනුම නැමැති ස්ථිර අත්තිවාරම මත සිය කෘතීන් ගොඩ නැගූ බැවිනි. මිනිස් සමාජයේ වර්ධනයේ පාලන නියමයන් අධ්‍යයනය කළ මාක්ස් ධනවාදය නොවැළැක්විය හැකිසේ, කොමියුනිස්ට්වාදය කරා වර්ධනය වන බව වටහා ගත්තේය. මෙය ඉතා වැදගත් වන්නේ, මීට ඉහත සියලු විද්‍යා විසින් නිර්මාණය කරන ලද දේ පූර්ණ ස්වීකරණයට භාජනය කළ, ඔහු විසින් ධනපති ක්‍රමය ඉතා නිවැරදි, සවිස්තර සහ ගැඹුරු අධ්‍යයනයකට භාජනය කිරීමේ පදනම අනුව පමණක් මෙය ඔප්පු කළ බැවිනි. එකද කරුණක්වත් අමතක නොකර, මානව සමාජය විසින් බිහිකරන ලද සියලු දේ ඔහු විවේචනාත්මක ලෙස යළි හැඩ ගැසුවේය. මිනිස් චින්තන ශක්තිය විසින් බිහිකරන ලද සියලු දේ ඔහු යළි සැලකිල්ලටත්, විවේචනයටත් භාජන කොට, කම්කරු පංති ව්‍යාපාරයෙන් සත්‍යෝක්ෂණයට හසු කළේය. ඉන් ඉක්බිතිව ඔහු ධනවාදී සීමා තුළ හිරවී සිටි මිනිසුන්ට හෝ ධනවාදී ප්‍රාග් විනිශ්චයට බැඳී සිටි මිනිසුන්ට හෝ කළ නොහැකි නිගමන ඉදිරිපත් කළේය.

නිදසුනක් වශයෙන්, අප නිර්ධන පංතික සංස්කෘතිය ගැන කතා කරන විට, මෙය සිහියේ තබා ගත යුතුය. මිනිස් සංහතියේ මුළු මහත් වර්ධනය විසින් බිහිකරන ලද සංස්කෘතිය පිළිබඳව නිවැරදි දැනීමකින් සහ පරිණාමනයකින් පමණක් නිර්ධන පංතික සංස්කෘතියක් නිර්මාණය කළ හැකිය, නැතිනම් අපට මෙම ගැටළුව විසඳා ලිය නොහැකිය යන්න ගැන අප පැහැදිලි ලෙසම දැනගෙන සිටිය යුතුය. නිර්ධන පංතික සංස්කෘතිය අදිසි තත්ත්වයකින් බිහිවූවක් නොවේ, එය නිර්ධන පංතික සංස්කෘතිය පිළිබඳව විශේෂඥයින් යැයි කියා ගන්නා මිනිසුන් විසින් නිපදවන ලද දෙයක්ද නොවේ. මේවා සියල්ල විකාර කතාය. නිර්ධන පංතික සංස්කෘතිය ධනවාදී ඉඩම් හිමි සහ නිලධාරිවාදී සමාජයේ වියගහට යටවී සිටි මිනිස් සංහතිය ඒකරාශි කරගත් දැනීම් සම්භාරයේ තාර්කිය වර්ධනය විය යුතුය. මාක්ස් විසින් යළි හැඩ ගස්වන ලද දේශපාලන ආර්ථිකය මිනිස් සමාජය පැමිණිය යුත්තේ කොතැනටදැයි පෙන්වූ පරිදි, පංති සටන් වලටද, නිර්ධන පංතික විප්ලවයේ

ආරම්භයටද මග පෙන්වූ පරිදි, මේ සියලු මාර්ග ඉදිරියට යමින්, නිර්ධන පංතික සංස්කෘතියට මග හෙළි කරනු ඇත.

තරුණයින්ගේ නියෝජිතවරුන් සහ නව අධ්‍යාපන ක්‍රමයක සමහර නියෝජිතවරුන් පැරණි පාසල්වලට පහර දෙමින්, එය වනපොත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කළැයි කියන විට, පැරණි පාසල්වල යහපත් දේ අප උකහාගත යුතු බව අපි කියා සිටිමු. දහයෙන් කොටස් නවයක් ප්‍රයෝජන රහිත වූද ඉතිරි දහයෙන් කොටස විකෘති වූද දැනීම් විශාල සම්භාරයකින් තරුණ ජනතාවගේ හිස පුරවාලන අධ්‍යාපන ක්‍රමයක් අපි නොගත යුතු වෙමු. ඒ කෙසේ වුවද, කොමියුනිස්ට්වාදී නිගමනවලට සහ කොමියුනිස්ට්වාදී සටන් පාඨවලට පමණක් අප සීමා විය යුතු යැයි මින් කොහෙත්ම අදහස් නොකරමු. මේ විධියට කොමියුනිස්ට්වාදය ගොඩනැගීමට නොපුළුවන. මිනිස් සංහතිය විසින් නිර්මාණය කරන ලද සියලු වස්තූන්ගෙන් ඔබගේ දැනීම පොහොසත් කරගත් විට පමණක් ඔබට කොමියුනිස්ට්වාදියකු විය හැකිය.

වනපොත් කිරීමට අපට අවශ්‍යතාවයක් නැත. එහෙත් මූලික සත්‍ය කරුණු පිළිබඳ දැනීමෙන්, අපේ මොළය වර්ධනය කිරීම සහ සම්පූර්ණ කිරීම අප විසින් කළ යුතුය. ඔබ විසින් ලබා ගන්නා ලද දැනීම, මනස විසින් උකහා ගන්නේ නැති නම්, එවිට කොමියුනිස්ට්වාදය පුහු වචනයක් බවටද එය නිකම් නාම පුවරුවක් බවටද පත්වනු ඇත. කොමියුනිස්ට්වාදියා හුදු පුරසාරම් දෙඩවන්නකු බවට පත්වනු ඇත. මෙම දැනීම නිකම් සමාග්‍රහණය කර ගැනීම නොව, ඔබේ මනස නුවමනා දේවලින් පුරවා නොගනු පිණිස විවේචනාත්මකව එය සමාග්‍රහණය කර ගත යුතුය. අද හොඳ අධ්‍යාපනයක් ලත් කෙනෙකුට අනිවාර්යයෙන්ම අවශ්‍ය සත්‍ය කරුණුවලින් ඔබේ දැනීම පොහොසත් කර ගත යුතුය. ඉතා බැරෑරුම් ලෙස හා අමාරු ලෙස වැඩ නොකර, සත්‍ය කරුණු විවේචනාත්මක ලෙස පරීක්ෂා නොකර, තමා දැනගත් කපා පිළියෙල කරන ලද නිගමනයන් නිසා තමාගේ කොමියුනිස්ට්වාදය ගැන කිසියම් කොමියුනිස්ට්වාදියකු පුරසාරම් දෙඩවීමට ඉදිරිපත් වන්නේ නම්, සත්තකින්ම ඔහු නින්දිත කොමියුනිස්ට්වාදියකු වනු ඇත. මෙවැනි අවිචක්ෂණයක් තීරණාත්මක ලෙසම විනාශකාරී වනු ඇත. මගේ දැනීම අල්පයැයි මා සිතන්නේ නම්, මම තව දුරටත් ඉගෙන ගැනීමට පෙළඹෙමි. තමා කොමියුනිස්ට්වාදියකු නිසා කිසිවක් නිසි ලෙස දැනගැනීම අවශ්‍ය නැතැයි කිසිවෙක් කියති නම්, ඔහු කිසි කලෙක කොමියුනිස්ට්වාදියකුට කොහෙත්ම සමාන නොවනු ඇත.

පැරණි අධ්‍යාපන ක්‍රමය ධනපතීන්ට අවශ්‍ය මෙහෙකරුවන් පුහුණු කළේය. පැරණි අධ්‍යාපන ක්‍රමය ධනපතීන් සතුටු වන දේ ලියන,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කියන මිනිසුන් බවට උගතුන් පත් කළේය. එබැවින් එම අධ්‍යාපනය නැති කර දැමිය යුතු වෙමු. එය අප විසින් අස් කර දැමිය යුතු නිසාත්, එය විනාශ කළ යුතු නිසාත්, මිනිස් සංහතිය විසින් ඒකරාශී කරන ලද, මිනිසාට අවශ්‍ය සියලු දේ ඉන් නොගත යුතු යැයි එයින් අදහස් කෙරෙන්නේද? ධනපති ක්‍රමයට අවශ්‍ය වූයේ මොනවාද, කොමියුනිස්ට් ක්‍රමයට අවශ්‍ය වන්නේ මොනවාද යන්න අප විසින් තෝරා වෙන් නොකර ගත යුතු බව ඉන් අදහස් කෙරේද?

බහුතරයේ අභිප්‍රායයට විරුද්ධව, ධනපති සමාජය විසින් ක්‍රියාවට යොදවන ලද පැරණි දර දඬු ක්‍රමය වෙනස් කොට, මේ අරගලය සඳහා තම බලවේග එක්සත් කිරීමටත්, සංවිධානය කිරීමටත් දක්ෂතාවය සහ සූදනමක් ඇත්තාවූත්, පැරණි සමාජය කෙරෙහි වෛරයක් ඇත්තාවූත් කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ පංති හැඟීමෙන් යුත් විනයට එය භාර කරමු. මෙම අරගලය සඳහා කෝටි සංඛ්‍යාත ජනතාවගේ අධිෂ්ඨානය ඒකරාශී නොකරන්නේ නම්, අති විශාල රටක විසිර සිටින ජනතාව එක්සත් නොකරන්නේ නම්, පරාජය නොවැළැක් විය හැකි වන්නේය. මෙම සහයෝගතාවය නැතිව, කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ පංති හැඟීමකින් යුත් විනයකින් තොරව, අපේ කාර්යය බලාපොරොත්තු රහිත වනු ඇත. මෙය රහිතව, මුළු මහත් ලෝකයේ ධනපතීන් සහ ඉඩම් හිමියන් පරාජය කිරීමට අපට නොපුළුවන. පදනම මත අළුත් කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩ නැගීම කෙසේවතුදු, පදනම පවා තහවුරු කැරැ ගැනීමට අපට නොහැකි වනු ඇත. ඒ ආකාරයෙන්ම, පැරණි අධ්‍යාපන ක්‍රමය හෙළා දකින අතර, පැරණි අධ්‍යාපන ක්‍රමය කෙරෙහි අති සාධාරණ, අවශ්‍ය වෛරයක් හඟින අතර, පැරණි උගැන්වීම් ක්‍රමය, වනපොත් කිරීම සහ සරඹ ව්‍යායාම් වෙනුවට, මිනිස් දැනීමේ සමස්තයක් ලබා ගැනීමේ හැකියාව ඇති කළ යුතුය. කොමියුනිස්ට්වාදය කට පාඩම් කිරීමෙන් ලබාගත හැකි දෙයක් නොවන පරිදි, එහෙත් ඒ වෙනුවට එය ඔබේ විචක්ෂණ චින්තනයට හසුවන පරිදි, සමකාලීන අධ්‍යපනික දෘෂ්ටි කෝණය අනුව, අනිවාර්ය වශයෙන් ඇතිවන නිගමනයක් වන පරිදි එම දැනීම ලබා ගත යුතුය.

කොමියුනිස්ට්වාදය ඉගෙන ගනු නැමැති අරමුණ ගැන අප කතා කරන විට, ප්‍රධාන කාර්යයන් ඉදිරිපත් කළ යුත්තේ ඒ ආකාරයටය.

ඔබට මේ ගැන පැහැදිලි කිරීම සහ ඔබ ඉගෙනගත යුත්තේ කෙසේද යන ප්‍රශ්නය වෙත සමීප විය යුත්තේ කෙසේද යන්න පෙන්වා දීම සඳහා මම ව්‍යවහාරික නිදසුනක් ඉදිරි පත් කරමි. අපේ ජනරජය ආරක්ෂා කිරීමේ මිලිටරි ගැටළු වලට අනතුරුව අප ඉදිරියේ ආර්ථික කාර්යයන් මතුවී ඇත. අප දන්නා පරිදි කර්මාන්තය හා කෘෂිකර්මය

පුනරුත්ථාපනය නොකරන්නේ නම්, අපට කොමියුනිස්ට්වාදී සමාජය ගොඩනැගිය නොහැකි බව අපි දනිමු. එයද පැරණි විධියට නොවේ. විද්‍යාවේ අළුත්ම ක්‍රම අනුගමනය කරමින්, නවීන පදනමක් මත යළි ඉදිකළ යුතුය. මෙම පදනම විය යුත්තේ විදුලිය බලයයි. මුළු මහත් රටම විද්‍යුතන කිරීමෙන් ඉක්බිතිව, කර්මාන්තයේ සහ කෘෂිකර්මාන්තයේ සියලු අංශ විද්‍යුතන කිරීමෙන් ඉක්බිතිව, මෙම අරමුණ සපුරා ලූ ඉක්බිතිව, පැරණි පරපුරට ගොඩනැගිය නොහැකි කොමියුනිස්ට් සමාජය ඔබට ගොඩනැගීමට හැකිවනු ඇත. මුළු මහත් රටම ආර්ථික වශයෙන් පුනරුත්ථාපනය කිරීමත්, සමකාලීන විද්‍යාව සහ තාක්ෂණිකය මත, විදුලිය බලය මත පදනම් වුණු නවීනතම තාක්ෂණිකය අනුව, කෘෂිකර්මය හා කර්මාන්තය ගොඩ නැගීමත් ඔබ හැමදෙන ඉදිරියේ ඇති කාර්ය භාරය වන්නේය. විද්‍යුතන කිරීම නූගත් මිනිසුන්ට කළ නොහැකි දෙයක් බවත්, මූලික අධ්‍යාපනය මෙයට ප්‍රමාණවත් නොවන බවත් ඔබට වැටහෙනු ඇත. විදුලි බලය යනු කුමක්ද යන්න අවබෝධ කැරැ ගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. විදුලි බලය තාක්ෂණික වශයෙන් කර්මාන්තයට සහ කෘෂිකර්මයට යොදවන්නේ කෙසේද, එය කර්මාන්තයේ හා කෘෂිකර්මයේ එක් එක් ශාඛාවලට යොදවන්නේ කෙසේද දැනගැනීම අවශ්‍ය වී ඇත. මෙය හැම කෙනෙකුම පෞද්ගලිකව උගත යුතුය. වැඩ කරන ජනතාවගේ වැඩී එන පරපුරට එය උගැන්විය යුතුය. පංති හැඟීමකින් යුත් හැම කොමියුනිස්ට්වාදියකුගේත්, කොමියුනිස්ට් තරුණ සංගමයට බැඳීම නිසා කොමියුනිස්ට්වාදය ගොඩ නැගීම සඳහා පක්ෂයට ආධාර කිරීමටද, කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩ නැගීම සඳහා මුළු මහත් තරුණ පරපුරට ආධාර දීමට දිවුරා පොරොන්දු වී සිටින සෑම තරුණයකුගේමත් යුතුකම වන්නේය. නවීන අධ්‍යාපනය නැමැති පදනම යටතේ පමණක් ඔහුට මෙය ලබා ගත හැකි බව ඔහු වටහා ගත යුතුය. ඔහු මෙම අධ්‍යාපනය නොලබන්නේනම්, කොමියුනිස්ට්වාදය චේතනාවක් හැටියට පමණක් ශේෂවනු ඇත.

ධනපති පංතිය බලයෙන් පහ කර දැමීම වැඩිහිටි පරපුරේ කාර්යය විය. එද තිබුණු ප්‍රධාන කාර්යය වූයේ ධනපති පංතිය විවේචනය කිරීමත්, බහුජනතාවගේ වෛරයට ධනපති පංතිය පත්කැරැ ලීමත්, පොදු ජන බලවේග අතර පංති හැඟීම සහ එක්සත් වීමේ හැකියාව තහවුරු කර ලීමත්ය. නව පරපුර ඉදිරියේ වඩාත් සංකීර්ණ කාර්ය භාරයක් ඇත්තේය. කම්කරුවන්ගේ හා ගොවීන්ගේ රජයට විරුද්ධව ධනපතීන්ගේ පෙළඹවීම යටතේ ඇතිවන ආක්‍රමණයකින් රජය ආරක්ෂා කිරීම සඳහා බලවේගයන් ඒකරාශි කිරීම පමණක් ඔබේ යුතුකම නොව-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

න්නේය. සත්තකින්ම ඔබ එසේ කළ යුතුය; මෙය ඔබ පැහැදිලි ලෙසම සාක්ෂාත් කරගත් දෙයකි. සෑම කොමියුනිස්ට්වාදියකුම මෙය සුපැහැදිලි ලෙස දකී. කෙසේවුවද, මෙය ප්‍රමාණවත් නොවේ. කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩ නැගීමට ඔබට සිදුවී ඇත. මේ වැඩවලින් අඩක් සපුරා ඇතැයි කිව හැකිය. පැරණි සමාජ ක්‍රමය, එයට සරිලන පරිදි, විනාශ කරන ලදී. එම ක්‍රමයට සරිලන සේ එය නටබුන් ගොඩක් බවට පත් කර ඇත. භූමිය (පසුතලය) පිරිසිදු කර තිබේ. තරුණ කොමියුනිස්ට්වරු මෙම භූමිය මත කොමියුනිස්වාදී සමාජයක් ගොඩ නැගිය යුත්තාහ. ඔබ ඉදිරියේ ඇති කාර්ය භාරය ඉදිකිරීමය, ඔබට මෙය කළ හැක්කේ සමකාලීන සියලු දැනීම් ස්වීකරණයට භාජනය කිරීමෙනි. කපා පිළයෙල කරන ලද සහ කට පාඩම් කරගත් සූත්‍ර වලින්ද, උපදෙස්, වට්ටෝරු, පිළියම්, සටහන් ආදියෙන්ද කොමියුනිස්ට්වාදය මුදුගෙන ඔබේ තාක්ෂණික වැඩවලට එක්සත්කමක් ලබාදෙන ජීවමාන යථාර්ථයක් බවට එය පරිණාමනය කිරීමෙන් පමණක්, ඔබේ ව්‍යවහාරික වැඩවලදී කොමියුනිස්ට්වාදයෙන් ඔබ මග පෙන්වීම ලබා ගන්නේ නම් පමණක් ඔබ මෙම කාර්යය සපුරාලීමට සමත් වන්නෙහිය.

මුළු මහත් තරුණ පරපුරට අධ්‍යාපනය ලබාදීමේදීත්, පුහුණු කිරීමේදී සහ උනන්දුව ඇතිකිරීමේදීත් ඔබ අනුගමනය කළ යුතු කාර්යය මෙය වන්නේය. කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩ නගන කෝටි සංඛ්‍යාත ඉදිකරන්නන් අතර ඔබ පෙරමුණ ගත යුතුය. මෙම ඉදි කරන්නන් අතර සෑම තරුණයෙක් සහ තරුණියක් වැඩ කළ යුත්තාහ. කොමියුනිස්ට්වාදය ගොඩනැගීමේ කාර්යයට කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ බහුතර කොටස් ඇද ගන්නේ නැතිව ඔබට කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩ නැගිය නොහැකි වන්නේය.

අප විසින් කොමියුනිස්ට්වාදය උගැන්විය යුත්තේ කෙසේද, අපේ විධිවල විශේෂ ලක්ෂණ විය යුත්තේ මොනවාද යන ප්‍රශ්නයට පිළිතුර සැපයීයට මෙහිදී අපට සිදුවේ.

මෙහිදී මම ප්‍රථම කොටම කොමියුනිස්ට්වාදී ආචාර ධර්ම පිළිබඳ ප්‍රශ්නය ගැන කතා කරමි.

කොමියුනිස්ට්වාදියකු වීම සඳහා ඔබ පුහුණු විය යුතුය.

ඉගෙන ගනිමින්, සංවිධානය වෙමින්, එක්සත් වෙමින් සහ සටන් කරමින් සිය ප්‍රයෝගික කාර්යයන් සංවිධානය කිරීම තරුණ සමිතියේ කාර්ය භාංය වන්නේය. තරුණ සමිති සාමාජිකයින් මෙලෙස ස්වයං පුහුණුවකුත්, නායකයින්වීමට සුදුසු පුද්ගලයනුත් පුහුණු කළ යුතුය. තරුණ සමිතිය කොමියුනිස්ට්වාදීන් පුහුණු කළ යුතුය. තත්කාලීන තරුණයින් පුහුණු කිරීමේත්, ඔවුනට අධ්‍යාපනය ලබාදීමේත්, උගැන්-

වීමේත් අරමුණ විය යුත්තේ, ඔවුන්ගේ සිත් තුළට කොමියුනිස්ට්වාදී ආචාර ධර්ම කාවැද්ද වීමය.

එහෙත් කොමියුනිස්ට්වාදී ආචාර ධර්මයක් තිබේද? කොමියුනිස්ට්වාදී සදචාරයක් තිබේද? සත්තකින්ම ඒවා තිබේ. අපට අපේම ආචාර ධර්ම නැතැයි සමහරු නිතර කියති. කොමියුනිස්ට්වාදීන් සියලු සදචාර ගුණධර්මයන් ප්‍රතික්ෂේප කරතියි බොහෝ විට, ධනපතියෝ චෝදනා කරති. මෙය ප්‍රශ්නය ව්‍යාකූල කිරීමේද කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ ඇස්වලට වැලි ගැසීමේද විධියකි.

ආචාර ධර්ම සහ සදචාරය අප ප්‍රතික්ෂේප කරන්නේ කිනම් අදහසක් අනුවද?

දෙවියන් වහසේගේ පනත් මත පදනම් කරමින් ධනපතීන් දේශනා කරන ආචාර ධර්ම අපි ප්‍රතික්ෂේප කරමු. මෙතැනදී අපි දෙවියන් විශ්වාස නොකරමුයි එළිපිටම ප්‍රකාශ කරමු. පූජකයනුත්, ඉඩම් හිමියන් සහ ධනපතීනුත් දෙවියන්ගේ නාමයෙන් පෙනී සිට, එමගින් සූරාකෑමේ අයිතිවාසිකම් තවදුරටත් තහවුරු කැර ගන්නා බව අපි දනුමු. සදචාර පණත් මත සහ දෙවියන්ගේ පනත් මත, ආචාර ධර්ම පදනම් කරනවා වෙනුවට, නිතර පාහේ දෙවියන්ගේ පනත් වලට සමාන වන විඥානවාදී හෝ අර්ධ විඥානවාදී වාග් පාය මත ඔවුහු ඒවා පදනම් කර ගනිති.

බහිර් මානුෂික සහ බහිර් පංති සංකල්පයන් මත පදනම් වුණු සදචාරය අපි ප්‍රතික්ෂේප කරමු. මෙය ධනපතීන්ගේ සහ ඉඩම් හිමියන්ගේ අයිතිය සහ වුවමනාවන් සඳහා කම්කරුවන් සහ ගොවීන් රැවටීමක්, මුළාකිරීමක්, හා ඔවුන් අඳුන කිරීමක් හැටියට අපි පෙන්වා දෙමු.

අපේ සදචාරය සම්පූර්ණයෙන්ම නිර්ධන පංතියේ අරගලය සඳහා යට කොට ඇති බව අපි පවසා සිටිමු. නිර්ධනීන්ගේ පංති සටනේ වුවමනාවන්ගෙන් අපේ සදචාරය වැඩී ඇත්තේය.

ඉඩම් හිමියන් සහ ධනපතීන් විසින් සියලු කම්කරුවන් හා ගොවීන් පාගා දැමීම මත පැරණි සමාජය පදනම් විය. මේවා සියල්ල විනාශ කිරීමටත්, ඔවුන් පන්නා දැමීමටත් අපට සිදුවිය. එහෙත් මෙය සපුරාලීම සඳහා අපට සමගිය ගොඩ නැගීමට සිදු විය. මෙවැන්නක් මැවීමට දෙවියන් වහන්සේට නොපුළුවන.

මේ සමගිය ගොඩනැගිය හැක්කේ කම්හල්වලටත්, සිය දීර්ඝ කාලීන නින්දෙන් පිබිදුනු සහ පුහුණුව ලැබූ නිර්ධන පංතියටත් පමණකි. එම පංතිය හැඩගැසුණු ඉක්බිතිව පමණක්, ලෝකයේ ඉතා දුර්වල රටක් විසින් දැනට අප ලබා සිටින ජයග්‍රහණය ලබා ගෙන ඇත. මෙම රට මුළු මහත් ලෝකයේ ධනපති ප්‍රහාරය දැනට වසර තුනක් තිස්සේ පළවා හරිමින් සිටී. මුළු මහත් ලෝකය පුරා නිර්ධන පංතික

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විප්ලවය වර්ධනය වන සැටි අපට පෙනේ. අසමගි වුණු සහ විසිර ගිය ගොවි ජනතාව ඇදී එන ශක්තිමත් බලවේගයක් නිර්මාණය කළ හැක්කේ නිර්ධන පංතියට පමණක් බව අත්දැකීම්වල පදනම් අනුව අපට කිව හැකිය. මෙම බලවේගය සූරාකන්නන්ගේ සියලු ප්‍රහාරයනට මූණ දී නැගී සිටී. වැඩ කරන ජනතාව සමගි කිරීමටත්, ඔවුන්ගේ කොටස් ඒකරාශී කොට, අවසානය දක්වා ආරක්ෂා කිරීමටත්, අවසානය දක්වා තහවුරු වීමට සහ අවසානය දක්වා කොමියුනිස්ට් සමාජයක් ගොඩ නැගීමටත් සහාය විය හැක්කේ මේ පංතියට පමණකි.

මිනිස් සමාජයට පරිභාහිරව සදචාරයක් නැතැයි අප කියන්නේ ඒ නිසාය; එය වංචාවකි. අපට නම්, සදචාරය නිර්ධනීන්ගේ පංති සටන්වල වුවමනාවන්ට යටවී ඇත.

මෙම පංති සටනේ සංයුක්ත කොටස් මොනවාද? සාර්ව නෙරපා දැමීම, ධනපතීන්ව නෙරපා දැමීම සහ ධනපති පංතිය අහෝසි කර දැමීම මෙහි සංයුක්ත කොටස් වන්නේය.

පොදුවේ පංති යනු කවරේද? සමාජයේ එක් කොටසකට අයත් ශ්‍රමය තවත් කොටසකට අයත් කැරැ ගැනීමට අවසර දෙන්නේ පංතීන් විසිනි. සමාජයේ එක් කොටසක් සමාජයේ ඉඩම් සියල්ල අයත් කැරැ ගන්නේ නම්, එවිට ඉඩම් හිමි පංතියක් සහ ගොවි පංතියක් ඇතිවේ. සමාජයේ එක් කොටසකට කම්හල් ව්‍යාපාර කොටස් සහ ප්‍රාග්ධනය අයත් නම්, සමාජයේ තවත් කොටසක් මේ කම්හල්වල වැඩ කරන්නේ නම්, එවිට ධනපති පංතියක් සහ නිර්ධන පංතියක් ඇතිවේ.

සාර් රජු පන්නා දැමීම අමාරු කාරියක් නොවීය, ඒ සඳහා ගතවූයේ දවස් කීපයක් පමණකි. ඉඩම් හිමියන් පන්නා දැමීම එතරම් අමාරු කාරියක් නොවීය, එය මාස කීපයකින් ඉටු කරන ලදී. ධනපතීන් පන්නා දැමීමද ඉතා අමාරු කාරියක් නොවීය; එහෙත් පංති අහෝසි කර දැමීම අසමසම ලෙස වඩාත් අසීරුය. කම්කරුවන් සහ ගොවීන් වශයෙන් ප්‍රභේදනයක් අප අතර තවමත් පවතී. කුඹුරක් ගොවිතැන් කරන ගොවියා සිය අතිරික්ත ධාන්‍ය එනම් ඔහුට සහ ඔහුගේ ගව මහීසාදීන්ට අනවශ්‍ය ධාන්‍ය අයත් කැරැ ගන්නේ නම්, ඒ අතර අනිත් මිනිසුන්ට ආහාර නැතිනම්, එවිට ගොවියා සූරා කන්නෙකු බවට පත්වේ. ඔහු තමාට අතිරික්ත ධාන්‍ය තබාගන්නා තරමට ඔහුගේ ලාභය තරවන සැටි ඔහුට පෙනේ. ඉතිරි මිනිසුන් බඩ ගින්නේ සිටියාවේ: "ඔවුන්ගේ බඩගිනි වැඩිවන තරමට ධාන්‍ය වැඩි මිලකට විකිණීමට මට පුළුවන." හැම දෙනෙක්ම එකම සැලැස්මක් අනුව පොදුවේ ඉඩම්වල, පොදුවේ කම්හල්වල පොදු ක්‍රමයක් අනුව වැඩ කළ යුතුය. මෙවැනි තත්ත්වයක් ඇති කිරීම ලෙහෙසිද? සාර් රජුවත්, ඉඩම් හිමියන් සහ ධනපතීනුත් පන්නා දැමීම තරම් මේ කාර්යය ලෙහෙසි නැත. නිර්ධන පංතිය ගොවීන්ගෙන් කොටසකට යළි අධ්‍යාපනය ලබා දීම අවශ්‍ය වන්නේය. පොහොසත් සහ පොදු ජනතාවගේ දුප්පත් කමෙන් ලාභ ලබා ගන්නා ගොවීන්ගේ ප්‍රතිරෝධනය බිඳ හෙළීම සඳහා වැඩකරන ගොවීන් නිර්ධන පංතිය තම පැත්තට දිනා ගත යුතුය. සාර් රජු නෙරපා, ඉඩම් හිමියන් සහ ගොවීන් පන්නා දැමූ පසුව වුවද නිර්ධන පංතික අරගලයේ කාර්ය භාරයන් තවම අවසන් වී නැති බව එහි තේරුම වන්නේය. මේ කාර්යය සපුරාලීම සඳහා අප විසින් නිර්ධන පංතික ආඥාදායකත්වය නමින් හඳුන්වන ලබන ක්‍රමය අවශ්‍ය වන්නේය.

පංති සටන දිගටම කෙරීගෙන යයි. එය සිය ආකාරයක් වෙනස් කර ඇත. පැරණි සූරාකන්නන් යළිත් පැමිණීම වළක්වාලීමත්, රටපුරා විසිරී සිටින ගොවීන් එකම සංගමයක් තුළ සමගි කිරීමත් නිර්ධනීන්ගේ පංති අරගලය වන්නේය. පංති සටන දිගටම කෙරීගෙන යයි. අපේ කාර්යය සියලු වුවමනාවන් මෙම අරගලයට යට කිරීමය. අපේ සදචාරයද මෙම අරමුණට යටවී ඇත. අපි මෙසේ පවසමු: අපේ සදචාරය වූකලී සූරාකන පැරණි සමාජය විනාශ කිරීමට සේවය කරන සහ අළුත් කොමියුනිස්ට්වාදී සමාජයක් ඉදිකරන නිර්ධන පංතිය වටා වැඩ කරන සියලු ජන කොටස් සමගි කිරීම වන්නේය.

කොමියුනිස්ට්වාදී සදචාරය වූකලී මෙම අරගලයට සේවය කරන සහ සියලු අන්දමේ සූරාකෑම්වලට විරුද්ධවත්, සියලු අන්දමේ කුඩා දේපල අයිතියට විරුද්ධවත්, වැඩකරන ජනතාව ඒකරාශී කිරීමය. මන්දයත්, මුළු මහත් සමාජයේ ශ්‍රමය විසින් නිර්මාණය කරන ලද දේ, කුඩා දේපල අයිතිය මගින් එක් පුද්ගලයෙකුට අයත් වන බැවිනි. අප රටේ සියලු ඉඩම් පොදු උරුමයට අයත් වේ.

මා මේ පොදු ඉඩම්වලින් කැබැල්ලක් ගෙන මට අවශ්‍ය ධාන්‍ය ප්‍රමාණයට වඩා දෙගුණයක් වැඩියෙන් එහි වගා කොට අතිරික්තයෙන් ලාභ ලබා ගතහොත් කුමක් සිදුවේද? බඩගින්නේ පෙළෙන්නන් වැඩි වන තරමට ඔවුන් වැඩි මිලක් ගෙවතියි මා තර්ක කළොත්? එවිට මා කොමියුනිස්ට්වාදියකු හැටියට හැසිරෙන්නේද? නැත. එවිට මා සූරාකන්නකු ලෙස හැසිරෙනු ඇත. ස්වාමියකු ලෙස හැසිරෙනු ඇත. මෙයට විරුද්ධව සටන් කළ යුතුය. මෙවැනි දේ සිදුවීමට ඉඩ හැරියොත්, මීට පෙර සිදුවූ විප්ලවවලදී මෙන්ම, යළිත් වරක් ධනපතීන්ගේ සහ ධනවාදීන්ගේ පාලනයක් ඇතිවනු ඇත. ධනපතීන්ගේ සහ ධනවාදීන්ගේ පාලනයක් යළිත් ඇතිවීම වළක්වාලීම සඳහා ලාබ ලැබීමට ඉඩ නොතැබිය යුතුය. පොදු ජනතාව පාගා පුද්ගලයින්ට පොහොසත් වීමට ඉඩ නොතැබිය යුතුය. වැඩ කරන ජනතාව නිර්ධන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පංතිය සමග එක්සත් වී කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩ නැගිය යුතුය. ලීගයේ ප්‍රධාන කාර්යය සහ කොමියුනිස්ට් තරුණයින්ගේ සංවිධානයේ ප්‍රධාණ ලක්ෂණය මෙය විය යුතුය.

පැරණි සමාජය පදනම් වූ මූලධර්මය මෙසේ විය: සොරකම් කරනු නැතිනම් සොරකම් කරනු ලැබීමට භාජන වනු; එක්කෝ වැඩ කරනු නැතිනම් තම ප්‍රයෝජනය සඳහා අනුන් ලවා වැඩ ගනු; එක්කෝ වහල් හිමියකු වනු නැතිනම් වහලෙකු වනු. නුඹ එක්කෝ වහල් හිමියෙකි, නැතිනම් වහලෙකි, නැතිනම් කුඩා ව්‍යාපාර හිමියෙකි, පහත් සේවකයෙකි, කුඩා නිලධාරියෙකි, නැතිනම් බුද්ධිමතෙකි වශයෙන් තමාට පමණක් සීමා වූ සහ අනිත් මිනිසුන් ගැන කොහෙත්ම නොසළකන මානසිකත්වය, පුරුද්ද, සංකල්පයන් එම සමාජයට ආවේණික වන අතර එවැනි සමාජයක වැඩුණු මිනිස්සු, මවු කිරිත් සමග මෙය ජීර්ණ කර ගනිති.

මා මේ ඉඩම් කැබැල්ලේ වගා කරන්නේ නම්, අනිත් අය ගැන මා කොහෙත්ම නොසළකන්නේ නම්, අනිත් පුද්ගලයින් කුසගින්නේ පෙළෙති නම්, මගේ ධාන්‍ය වලට වඩාත් වැඩි මිලක් මට ලැබෙනු ඇත. මා දෙස්තරකු ඉන්ජිනේරුවකු, ගුරුවරයකු හෝ ලිපිකරුවකු හැටියට වැඩ කරති නම්, අනිත් අයවලුන් මා කොහෙත්ම නොසලකනු ඇත. බලයේ සිටින ධනපතීන්ට ගැතිකම් කරමින් සමහර විට මගේ රැකියාව තහවුරු කැරගෙන ජීවිතය සරු කැරගෙන ධනපතියකු වීමට පවා මට ඉඩ ලැබෙනු ඇත. කොමියුනිස්ට්වාදියකුට මෙවැනි හැඟීම් සහ චින්තනයක් ඇති කර ගත නොහැක. ස්වකීය පරිශ්‍රමයෙන් තමන් ආරක්ෂා වී නව සමාජයක් ඉදිකිරීමට තමන්ට පුළුවන් බව ඔප්පු කිරීම අළුත් සහ කොමියුනිස්ට්වාදී අධ්‍යාපනයක මූලාරම්භය වන්නේය. සූරාකන්නන්ට විරුද්ධව ගෙන ගිය අරගලයේදී ලැබූ අධ්‍යාපනයකි. නිර්ධනීන් සමග එකතු වී ආත්මාර්ථකාමීන්ට සහ කුඩා ව්‍යාපාර හිමියන්ටත් විරුද්ධවද, 'මම මගේ ලාභය සොයා ගන්නවා මිස අනිත් එවුන් ගැන නොතකමි' යි යන මානසිකත්වය සහ පුරුද්දට විරුද්ධවත් ලැබූ අධ්‍යාපනයකි.

තරුණයින් සහ නැගී එන පරපුර කොමියුනිස්ට්වාදය ඉගෙන ගත යුත්තේ කෙසේද නැමැති ප්‍රශ්නයට පිළිතුර එසේය.

තරුණ පරපුරට කොමියුනිස්ට්වාදය ඉගෙන ගත හැක්කේ තම අධ්‍යයනයත්, පුහුණු වීමත්, අධ්‍යාපනයත්, පැරණි සමාජයේ සූරාකන්නන්ට විරුද්ධව නිර්ධන පංතිය සහ වැඩකරන ජනතාව ගෙනයන අවිච්ඡින්න අරගලය සමග එකතු කර ලීමෙනි. සමහරුන් අපට සදාචාරය ගැන කියන විට, අපි මෙසේ පවසමු: කොමියුනිස්ට්වාදියකුට

සදාචාරය රඳා පවතින්නේ මෙම එක්සත් විනය සහ සූරාකන්නන්ට විරුද්ධව ගෙන යන විඥත අරගලය තුළය. අපි සදාකාලික සදාචාරයක් ගැන විශ්වාස නොකරමු: සදාචාරය ගැන ගොතන ලද සියලු සූරංගනා කතාවල ව්‍යාජ භාවය අපි හෙළිදරවු කරමු. මිනිස් සමාජයට උසස් තත්වයකට පැමිණීම සඳහාත් ශ්‍රමය සූරාකෑමෙන් මුදවා ගැනීම සඳහාත් සදාචාරය සේවය කරයි.

මෙය ලබා ගැනීම සඳහා ධනපති පංතියට විරුද්ධව මාරාන්තික සහ විනය ගරුක අරගලයක් මධ්‍යයේ දේශපාලන පරිණතභාවය ලැබූ තරුණ ජනතාවගේ පරපුරක් අපට අවශ්‍ය වන්නේය. මෙම අරගලයේදී මෙම පරපුර සැබෑ කොමියුනිස්ට්වාදීන් පුහුණු කරයි. සිය අධ්‍යයනයේදීත්, අධ්‍යාපනයේදීත් සහ පුහුණු වීමේදීත් සෑම පියවරක්ම මෙම අරගලයට යට කළ යුතුය, එය සමග සම්බන්ධ කළ යුතුය. සිත් ගන්නා සුලු කතා සහ සදාචාර රීතීන් පිළිබඳ වට්ටෝරු ඉදිරිපත් කිරීම, කොමියුනිස්ට්වාදීන්ට උගැන්වීමේදී බැහැර කළ යුතුය. අධ්‍යාපනයට මේවා අඩංගු නැත. තමන්ගේ මවුවරුන් සහ පියවරුන් ඉඩම් හිමියන්ගේ හා ධනපතීන්ගේ වියගහට යටවී ජීවත් වූ සැටි මිනිසුන් දුටු විට, සූරාකන්නන්ට විරුද්ධව අරගලය පටන් ගත් අය දුක් පීඩනය අත්දැකීමෙන් ලබාගෙන ඇති විට, සටන් කොට ලබාගත් දේ ආරක්ෂා කිරීම සඳහා කර ඇති ආත්ම පරිත්‍යාගයන් දුටු විට, ඉඩම් හිමියන් සහ ධනපතීන් කොතරම් භයානක සතුරන්දැයි දැක ඇති විට — මෙම තත්ත්වයන් කොමියුනිස්ට්වාදීන් වීමට ඔවුනට උගන්වා ඇත. කොමියුනිස්ට්වාදය ස්ථිර කිරීම සහ සම්පූර්ණ කිරීම සඳහා ගෙනයන අරගලය මත කොමියුනිස්ට්වාදී සදාචාරය පදනම් වී ඇත්තේය. කොමියුනිස්ට්වාදී පුහුණුවේ, අධ්‍යාපනයේ සහ උගැන්වීමේ පදනමද එයම වන්නේය. කොමියුනිස්ට්වාදය ඉගෙනගත යුත්තේ කෙසේද යන ප්‍රශ්නයට පිළිතුර එයය.

උගැන්වීම් පුහුණු කිරීම සහ අධ්‍යාපනය පාසල් කාමර වලට පමණක් සීමා කොට, ඒවා සැබෑ ක්‍රියාකාරී ජීවිතයෙන් වෙන් කොට තිබේ නම් අපට ඒවා ගැන විශ්වාස කළ නොහැකිය. ඉඩම් හිමියන් සහ ධනපතීන් කම්කරුවන් සහ ගොවීන් පාගා සිටින තුරු, ඉඩම් හිමියන් හා ධනපතීන් විසින් පාසල් පාලනය කරන තුරු, තරුණ පරපුර අන්ධයින් සහ නූගතුන් හැටියට සිටිනු ඇත. අපේ පාසල් තරුණයින්ට දැනීමේ මූලධර්මයන්ද, කොමියුනිස්ට්වාදී නිගමනවලට නිදහස් ලෙස පැමිණීමට හැකියාවක්ද සැපයිය යුතුය. පාසල් තරුණ ජනතාවට අධ්‍යාපනය ලබා දිය යුතුය. ඔවුන් පාසල්වල ඉගෙන ගන්නා අතර සූරාකෑමෙන් නිදහස්වීමේ අරගලයේ කොටස් කරුවන් වීමට ඉගෙන ගත යුතුය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තරුණ කොමියුනිස්ට් සංගමය, තරුණ කොමියුනිස්ට් පරපුරේ සංගමය යන නාමයට සැහෙන්නේ සිය උගැන්වීමේ, පුහුණු කිරීමේ සහ අධ්‍යාපනය දීමේ සෑම පියවරක්ම සූරාකන්නන්ට විරුද්ධව වැඩකරන ජනතාව ගෙනයන පොදු අරගලයට සහභාගිවීමත් සමග එක් කරවීමෙනි. රුසියාව එකම කම්කරු ජනරජය හැටියට පවතින තාක් කල්, ලෝකයේ සෙසු රටවල පැරණි ධනපති ක්‍රමය පවතින තාක් කල්, අප ඔවුනට වඩා දුර්වල වන බවත්, අළුත් ප්‍රහාරයන්ගේ තර්ජනය නිතර අප වෙත එල්ල වී ඇති බවත්, ඔබ හැම දෙන ඉතා හොඳින් දනිති. ඉතා ස්ථිර ලෙස එක්සත් වීමට අපි ඉගෙන ගනිමු නම්, තවදුරටත් අරගලවලදී අපට ජය ලබා ගත හැකිවේ. තව දුරටත් ශක්තිය ලබා ගනිමින් අපි අනභිභවනීය වන්නෙමු. ඒ අනුව කොමියුනිස්ට්වාදියකු වීමට නම් ඔබ මුළු මහත් තරුණ පරපුර සංවිධානය කොට මෙම අරගලයේදී පුහුණු වීමේදී සහ විනය ගරුක වීමේදී ආදර්ශයක් විය යුත්තෙහිය. අන්න එවිට පමණක් ඔබට කොමියුනිස්ට්වාදී සමාජය නැමැති මන්දිරයේ ආකෘතිය ඉදිකිරීම ආරම්භ කිරීමට සහ එය සම්පූර්ණ කිරීමට හැකි වනු ඇත.

මෙය වඩාත් පැහැදිලි කරදීම සඳහා මම ඔබට නිදසුනක් ගෙන හැර දක්වමි. අපි, අප කොමියුනිස්ට්වාදීන් හැටියට හඳුන්වමු. කොමියුනිස්ට් යනු කුමක්ද? කොමියුනිස්ට් යනු ලතින් වචනයකි. ලතින් බසින් කොමියුනිස් යනු "පොදු" නැමැති තේරුම දෙන වචනයකි. කොමියුනිස්ට්වාදී සමාජයක හැම දෙයක්ම, ඉඩම්, කම්හල් පොදු අයිතියට යට කොට තිබෙන අතර මිනිස්සු ඒවායේ පොදුවේ වැඩ කරති. මෙය කොමියුනිස්ට්වාදය වන්නේය.

හැම කෙනෙකුම තමන්ගේ කුඩා ඉඩම් කැබලිවල වැඩ කරති නම්, පොදුවේ වැඩ කළ හැකිද? පොදුවේ එක්වී සාමූහිකව වැඩ කිරීම එකවර ලබා ගත හැකි දෙයක් නොවේ. එකවර මෙය ලබා ගත නොහැකිය. එය අහසින් වැටෙන දෙයක් නොවේ. එය වැඩ කිරීම, පීඩා විඳීම සහ නිර්මාණය තුළින් ලබාගත යුත්තකි. අරගලයන් තුළින් එය නිර්මාණය කළ යුතුය. මෙහිදී පැරණි පොත්වලින් වැඩක් නැත. කිසිවෙක් ඒවා විශ්වාස නොකරති. කෙනෙකු සිය ජීවිතයේදී ලබන අත්දැකීම මෙහිදී ප්‍රයෝජනවත් වේ. කොල්චාක් සහ දෙනිකින් සයිබීරියාව සහ දකුණු දෙසින් ඉදිරියට ගමන් කරන විට ගොවියෝ ඔවුනට පක්ෂවූහ. ඔවුහු බොල්ෂේවිකයිනට අකමැති වූහ. මන්දයත්, බොල්ෂේවිකයින් ඔවුන්ගේ ධාන්‍ය නියමිත මිලකට ගත් බැවිනි. එහෙත් සයිබීරියාවේ සහ උක්රයිනයේ ගොවියෝ කොල්චාක්ගේ සහ දෙනිකින්ගේ පාලනයේ රස වින්දනය කළ පසු තමන් ඉදිරියේ ඇත්තේ එක්

වෛකල්පිකයක් බව අවබෝධ කැරගත්හ. එක්කෝ ධනපතීන් වෙතට නැවත යාමය. එවිට ඔවුහු ගොවීන් ඉඩම් හිමියන්ට වහලුන් ලෙස වහාම භාර දෙනු ඇත්තාහ. නැතිනම්, කිරෙන් හා පැණියෙන් උතුරන දේශයක් පොරොන්දු නොවන, ඉතා අසීරු අරගලයකදී අයෝමය විනයකුත්, දැඩි බවකුත් ඉල්ලා සිටින, එනමුදු ඉඩම් හිමියන්ගේ සහ ධනපතීන්ගේ වහල් භාවයෙන් ගොවීන් මුදවාලන කම්කරුවන් වෙත යාමය. සිය අත් දැකීම අනුව ඉතා මෝඩ ගොවියා පවා මෙය වටහා ගත් විට, ඉතා අසීරු-අමාරු පාඩමක් ඉගෙනගත් ගොවීහු හැඟීමකින් යුතුව කොමියුනිස්ට්වාදය වෙතට පක්ෂ වීමට පටන් ගත්හ. තරුණ කොමියුනිස්ට් සංගමයේ සියලු ක්‍රියාකාරිත්වයන්ට පදනම විය යුත්තේ මෙවැනි අත්දැකීම්ය.

අප විසින් ඉගෙන ගත යුත්තේ මොනවාද පැරණි පාසලින් සහ පැරණි විද්‍යාවෙන් අප ගත යුතු පාඩම් මොනවාද යන ප්‍රශ්නවලට මම පිළිතුරු සැපයීමි. මෙය ඉගෙන ගත යුත්තේ කෙසේද යන ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට දැන් මම උත්සාහ ගනිමි. මගේ පිළිතුර මෙසේය: පාසල්වල සියලු ක්‍රියාකාරිත්වයේ සෑම පියවරක්මද, පුහුණු වීමේ, අධ්‍යාපනයේ සහ උගැන්වීමේ සෑම පියවරක්මද, වැඩකරන ජනතාවගේ සියලු කොටස් විසින් සූරාකන්නන්ට විරුද්ධව ගෙනයන අරගලය සමග අඛණ්ඩ ලෙස වෙළිමෙන් පමණකි.

කොමියුනිස්ට්වාදය පිළිබඳව මෙම පුහුණු වීම කෙසේ කළ යුතුද යන්න විස්තර කිරීම සඳහා සමහර තරුණ සංවිධාන වැඩවලදී ලබාගත් අත්දැකීම් ආදර්ශයන් කීපයක් ලෙස මම ඉදිරිපත් කරමි. නූගත්කම නැති කිරීම ගැන හැම දෙනෙක්ම කතා කරති. නූගත් රටක කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩ නැගිය නොහැකි බව ඔබ දන්නෙහිය. මේ සඳහා සෝවියට් ආණ්ඩුව විසින් පනත් සම්මත කිරීමද, නැතිනම් පක්ෂය විසින් යම් කිසි නියමිත උද්යෝග පාඨයක් ඉදිරිපත් කිරීමද, එසේත් නැතිනම් මෙම කාර්යය සඳහා ඉතා හොඳ වැඩකරුවන් කීප දෙනෙකු වෙන් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. තරුණ පරපුර මෙම කාර්යය භාර ගත යුතුය. කොමියුනිස්ට්වාදය යනු තරුණ ජනතාව, තරුණ සංගමයට අයත් තරුණයින් සහ තරුණියන් මෙලෙස ප්‍රකාශ කිරීමය: මෙය අපේ කාර්යයයි, අපේ තරුණ ජනතාව අතර එකද නූගතකුවත් ඉතිරි නොකිරීම සඳහා, නූගත්කම නැතිකර දමනු පිණිස අපි එක්සත් වී ගම්බද පෙදෙස්වලට යන්නෙමු. නැගී එන පරපුර මෙම කාර්යය සඳහා ඇප-කැප විය යුතු බව වටහා දීමට අපි උත්සාහ දරමු. මෝඩ සහ නූගත් රුසියාවක් එකවර උගත් රටක් බවට පරිවර්තනය නොකළ හැකි බව ඔබ දන්නෙහිය. එහෙත් තරුණ සංගමය මේ කාර්යය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සඳහා ඉදිරිපත් වන්නේ නම්, සියලු තරුණයන් සියලු දෙනාගේ යහපත සඳහා වැඩ කරන්නේ නම්, තරුණ තරුණියන් 400,000 සාමාජිකත්වයක් ඇති තරුණ සංගමය තරුණ කොමියුනිස්ට් සංගමය හැටියට පෙනී සිටීමට සුදුසු වන්නේය. තරුණ සංගමයේ කාර්යය වන්නේ තම සාමාජිකයින්ට අධ්‍යාපනයක් ලබා දීම පමණක් නොවේ; නූගත්කමේ පීඩනයෙන් ස්ව උත්සාහයෙන් මිදීමට නොහැකි තරුණයින්ට ආධාර දීමද එහි කාර්යය වන්නේය. තරුණ සංගමයක සාමාජිකයකු වීම යනු ඔහුගේ ශ්‍රමය පොදු කාර්යය සඳහා යෙදවීමය. කොමියුනිස්ට් අධ්‍යාපනයක තේරුම එයයි. මෙවැනි වැඩවල යෙදීමේදී පමණක් තරුණයින්ට සහ තරුණියන්ට කොමියුනිස්ට්වාදීන් විය හැකිය. මෙම වැඩවලදී ඔවුන් ප්‍රායෝගික ප්‍රතිඵල ලබා ගැනීමට සමත් වෙති නම් පමණක් ඔවුනට කොමියුනිස්ට්වාදීන් විය හැකිය.

නගරාසන්න එළවලු වතුවල වැඩකිරීම නිදසුනක් වශයෙන් ගෙන බලමු. මෙය සැබෑ වැඩක් නොවන්නේද? මෙය තරුණ කොමියුනිස්ට් සංගමයේ එක් කාර්යයකි. ජනතාව කුස ගින්නෙන් පෙළෙති. කම්හල්වල දුර්භික්ෂය පවතී. දුර්භික්ෂයෙන් අප බේරා ගැනීම සඳහා අපි එළවලු වගාව දියුණු කළ යුතු වෙමු. එහෙත් වගාව පරණ විධියටම කර ගෙන යති. එබැවින් වඩාත් වැඩි පංති හැඟීමකින් යුත් කොටස් මේ වැඩවල යෙදිය යුතුය. එවිට එළවලු වතුවල සංඛ්‍යාව වැඩි වනු ඇත. එළවලු වගාවට යටකරන අක්කර ප්‍රමාණය වැඩි වනු ඇත. ප්‍රතිඵල යහපත් වනු ඇත. තරුණ කොමියුනිස්ට් සංගමය මේ වැඩවල ක්‍රියාශීලී ලෙස යෙදිය යුතුය. හැම සංගමයක්මත්, සංගම් ශාඛාවක්මත් මෙය සිය කාර්යය ලෙස සැලකිය යුතුය.

හැම වැඩකදීම අධාර කරමින්, උනන්දුව සහ කාර්යක්ෂම භාවය ප්‍රදර්ශනය කරමින් තරුණ කොමියුනිස්ට් සංගමය ශ්‍රමකාමී බලවේගයක් ලෙස ක්‍රියාකළ යුතුය. යම් කිසි කම්කරුවකුට අවබෝධ කරගත නොහැකි උගැන්වීම්ද, සමහර විට ඔහු වහාම විශ්වාස නොකරන උගැන්වීම්ද විශ්වාස කරන මිනිසුන්ගෙන්ද යුත් සංවිධානයක් හැටියට තරුණ සංගමය පෙන්වා දීමට, එය සමත් විය යුතුය. එසේ වුවද ව්‍යවහාරික වැඩවලදී සහ ක්‍රියාවලදී එම මිනිසුන් තමාට නියම මග පෙන්වන බව ඔහුට සාක්ෂාත් කර ගැනීමටද ඉඩකඩ ලබා දිය යුතුය.

මේ විධියට සියලු ක්ෂේත්‍රවල වැඩ සංවිධානය කිරීමට තරුණ කොමියුනිස්ට් සංගමය අසමත් වන්නේ නම්, මෙහි තේරුම යළිත් පරණ ධනපති මාර්ගයට වැටීම වනු ඇත. වැඩ කරන ජනතාවට කොමියුනිස්ට්වාදී උගැන්වීම් ක්‍රියාවට යෙදවීමට ආධාර දෙනු පිණිස සූරාකන්නන්ට විරුද්ධව වැඩකරන ජනතාව ගෙනයන අරගලය සමග අපි අපේ අධ්‍යාපනය සම්බන්ධ කළ යුතුය.

තරුණ සමිතියේ සාමාජිකයෝ සිය විවේක කාලවලදී එළවලු වගා කිරීමටත්, කිසියම් කම්හලක තරුණයින්ට උගැන්වීමටත් ආදී වශයෙන් ක්‍රියා කළ යුත්තාහ. දුගී දුප්පත් අසරණ රටක් වන රුසියාව පොහොසත් රටක් බවට පරිවර්තනය කිරීම අපේ අරමුණය. තරුණ කොමියුනිස්ට් සංගමය සිය අධ්‍යාපනය, ඉගෙනීම සහ පුහුණුවීම පාසලට සහ කොමියුනිස්ට්වාදී පොත් පත් කියවීමට පමණක් සීමා නොකිරීම පිණිස කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ශ්‍රමය සමග එකට සංයෝජනය කළ යුතුය. කෙනෙකුට සැබෑ කොමියුනිස්ට් වාදියකු විය හැක්කේ කම්කරුවන් සහ ගොවීන් සමග උරෙනුර ගැටී වැඩ කළහොත් පමණකි. තරුණ සංගමයේ සියලු සාමාජිකවරුන් උගත් අය බවත්, ඒ අතරම ඔවුන් තමන්ගේ වැඩ කටයුතු ගැන විශාල උනන්දුවක් දක්වන බවත් හැම කෙනෙකුටම පැහැදිලි ලෙස පෙනෙන සේ ක්‍රියා කළ යුතුය. පැරණි පාසල්වල තිබුණු පැරණි අභ්‍යාස-ව්‍යායාම් ක්‍රමය ඉවත ලා ඒ වෙනුවට විඥූත, විනය ගරුක භාවය යෙදූ බව සියලු දෙනාම දකින විටත්, සියලු තරුණයින් කොමියුනිස්ට්වාදී ශ්‍රමදානවලට සහභාගි වීම සහ නගරාසන්න හැම ගොවිපලක්ම ජනතාවට උදවු කිරීම සඳහා යෙදීම දකින විටත්, ජනතාව ශ්‍රමය කෙරෙහි දක්වන පැරණි ආකල්පය නවත්වනු ඇත.

නිදසුනක් වශයෙන් ගතහොත්, පොදු ජන සෞඛ්‍යය හෝ ආහාර බෙදා හැරීම වැනි වැඩවලට ආධාර දීමට සෑම ගමකත්, නගරවල සෑම තට්ටු නිවාස පේළියකමත් සංවිධාන ඇති කිරීම තරුණ කොමියුනිස්ට් සංගමයේ කාර්යය වන්නේය. පැරණි ධනවාදී සමාජය මෙය කළේ කොහොමද? හැම කෙනෙක්ම තම තමන්ගේ වැඩ කර ගත්තා මිස, මහල්ලන් හා රෝගීන් ගැන කොහෙත්ම සොයා නොබැලූහ. ගෙදර වැඩ කාන්තාවට පමණක් අයිති දෙයක් සහ මේ හේතුව නිසා කාන්තාව පෑගීමට හා දසභාවයට වැටී සිටින සැටිත් සොයා නොබැලූහ. මේවාට විරුද්ධව සටන් කළ යුත්තෝ කවරහුද? එය තරුණ සංගමයේ කාර්යයයි. එම සංගමය මෙසේ ප්‍රකාශ කළ යුතුය: අපි මේවා සියල්ලම වෙනස් කරමු. පොදුජන සෞඛ්‍ය සේවා ආරක්ෂාව සඳහාත් නැතිනම් ආහාර බෙදා හැරීම සඳහාත් අපි තරුණ කණ්ඩායම් සංවිධාන කරමු. මේ කණ්ඩායම් ගෙයක් පාසා ගොස් ක්‍රමානුකූල පරික්ෂා කරනු ඇත. මුළු මහත් සමාජයටම යහපතක් සැලසෙන පරිදි, සිය බලවේග නිසිලෙස බෙදා හරිමින්, ශ්‍රමය සංවිධානය කළ යුතු බව පෙන්වා දෙමින්, සංවිධානාත්මක ලෙස වැඩ කරන්නෙමු.

දැනට පනස් වියෙහි පසුවන මිනිස් පරපුරට කොමියුනිස්ට්වාදී සමාජයක් දැකිය නොහැක. එම සමාජය ඉදිකිරීමට පෙර ඔවුහු මිය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යනු ඇත්තැහ. එහෙත් දනට පසළොස් වියෙහි පසුවන පරපුරට කොමියුනිස්ට්වාදී සමාජයක් දකීමට හැකිවනු ඇත. එම සමාජය එම පරපුර විසින් ඉදි කරනු ඇත. මෙම පරපුරෙහි එකම අරමුණ විය යුත්තේ කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩනැගීම බව ඔවුහු දන ගත යුත්තාහ. පැරණි සමාජයේ සෑම පවුලක්ම වෙන් වෙන්ව වැඩ කළ අතර, පොදු ජනතාව පාගා දමූ ඉඩම් හිමියන් හා ධනපතීන් හැරුණු විට, අන් කිසිවෙක් ශ්‍රමය සංවිධානය නොකළහ. අප විසින් සියලු ශ්‍රමය — එය කොතරම් අමාරු වුණද, අසීරු වුණද — සංවිධානය කළ යුත්තේ සෑම කම්කරුවකුට සහ ගොවියකුටම මෙසේ කිවහැකි වන පරිද්දෙනි: මම නිදහස් ශ්‍රම මහා හමුදාවේ කොටස් කරුවෙක්මි, ඉඩම් හිමියන් සහ ධනපතීන් රහිතව මගේ ජීවිතය ගොඩනැගීමට මම සමත් වෙමි, කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩ නැගීමට මම සමත් වෙමි. බාල වයසේ සිටම විඥත සහ විනය ගරුක ශ්‍රමයක යෙදීමට සියලු තරුණ ජනතාවන්ට තරුණ කොමියුනිස්ට් සංගමය විසින් උගැන්විය යුතුය. අප ඉදිරියේ ඇති ගැටළුව මේ ලෙස විසඳිය හැකි බව අපට විශ්වාසය. රට විද්‍යුතන කිරීම සඳහා වසර දහයකට නොඅඩු කාලයක් ගතවන බව අප නිගමනය කළ යුතුය. එවිට අපේ දුප්පත් රටට තාක්ෂණිකයේ ඉතා නවීන ජයග්‍රහණවල ඵල නෙලා ගන්නට හැකිවනු ඇත. තව වසර දහයකින් හෝ විස්සකින් හෝ ඉක්බිතිව, කොමියුනිස්ට්වාදී සමාජයක ජීවත් වන, දනට වසර පහළොවක් වයසැති පරපුර ස්වකීය අධ්‍යාපනික කාර්යයන් විසඳාලිය යුත්තේ, ඉතා කුඩා හෝ ඉතා සරළ වුවද පොදු ශ්‍රමයේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය හැමදමත්, හැම ගමකමත්, හැම නගරයකමත් විසඳාලීම සඳහා තරුණ ජනතාව සහභාගී වන ආකාරයෙනි. මෙය සෑම ගමකම සපුරා ලූ විට, කොමියුනිස්ට්වාදී ශ්‍රම තරහය දියුණු වූ විට, ශ්‍රමය එක්සත් කිරීමට තරුණයින්ට පුළුවන් බව ඔප්පු කළ විට, කොමියුනිස්ට්වාදී ඉදිකිරීම්වල ජයග්‍රහණය සාර්ථක වනු ඇත. මෙය ඉදි කිරීමේ සාර්ථකත්වයේ දෘෂ්ටි කෝණයෙන් බලමින්, දේශපාලනමය වශයෙන් පංති හැඟීමකින් යුත් වැඩකරන ජනතාව, එක්සත් කිරීම සඳහා කළ හැකි සෑම දෙයක්ම කළේද යන ප්‍රශ්නය ඉදිරිපත් කරමින් පමණක්, තරුණ කොමියුනිස්ට් සංගමයට සිය පන්ලක්ෂයේ සාමාජික සංඛ්‍යාව එකම ශ්‍රම හමුදාවකට සංවිධානය කොට විශ්වමය ගෞරවය දිනාගත හැකි වන්නේය. (අත් පොළසන්.)

''ප්‍රාව්ද'' කලාප 221, 222 සහ 223;
1920 ඔක්තෝබර් 5, 6 සහ 7.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, වෙළුම 41, පිටු 298-318.

නිර්ධන පංතික සංස්කෘතිය ගැන

8/X දතම දරන ''ඉස්වෙස්තියා'' පුවත්පත අනුව, ප්‍රොලෙත්කුල්ත් සමුළුවේදී[71] ලුනචාර්ස්කි සහෝදරයා කර ඇති කතාව, ඊයේ අපත් සමග ඔහු එළඹි එකඟත්වයට වඩා හාත්පසින්ම වෙනස් වූවකි.

(ප්‍රොලෙත්කුල්ත් සමුළුවට) කෙටුම්පත් යෝජනාවක් ඉතා ඉක්මණින් පිළියෙල කිරීමත්, එය මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කොට සම්මත කරවාගෙන ප්‍රොලෙත්කුල්ත් සංවිධානයේ එම සැසි වාරයට ඉදිරිපත් කිරීමත් අප විසින් කළ යුතුය. එම කෙටුම්පත් යෝජනාව මධ්‍යම කාරක සභාවේ සහ නර්කොම්ප්‍රොස් (අධ්‍යාපන අමාත්‍යාංශය) මණ්ඩලයේ නාමයෙන් ප්‍රොලෙත්කුල්ත් සමුළුවට අදම ඉදිරිපත් කළ යුතුය. මන්දයත් එම සමුළුව අද නිමාවට පත් වන බැවිනි.

කෙටුම්පත් යෝජනාව:

1. කම්කරුවන්ගේ හා ගොවීන්ගේ සෝවියට් ජනරජයේ සියලු අධ්‍යාපනික කටයුතු, අධ්‍යාපනික ක්ෂේත්‍රයේ පොදුවෙන්ද, කලාශිල්ප ක්ෂේත්‍රයේ විශේෂයෙන්ද, මිනිසකු විසින් මිනිසකු සූරාකෑම සහ පංතීන් අහෝසි කැර දැමීම සඳහාත්, ධනපති පංතිය පාලනයෙන් පහකර දමා නිර්ධන පංතික ආඥාදායකත්වයේ අරමුණු සාර්ථක කර ගනු සඳහාත් නිර්ධන පංතිය ගෙනයන පංති සටනේ ජීවයෙන් පිරී තිබිය යුතුය.

2. එබැවින් නිර්ධන පංතිය — සිය පුරෝගාමී බලඇණිය වන කොමියුනිස්ට් පක්ෂය තුළින් සහ පොදුවේ නිර්ධන පංතික සංවිධාන තුළින් මහජන අධ්‍යාපනය පිළිබඳ සියලු වැඩවලදී අතිශයින්ම ක්‍රියාශීලී සහ මූලික ක්‍රියා කලාපයක් ඉටු කළ යුතුය.

3. සමකාලීන ඉතිහාසයේ සියලු අත්දැකීම් සහ විශේෂයෙන්ම, කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය නිකුත් කිරීමෙන් ඉක්බිතිව, සියලු රටවල නිර්ධන පංතියේ අඩ සිය වසරකටත් වඩා වැඩි අරගලද විසින්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විප්ලවවාදී නිර්ධන පංතියේ සැබෑ වුවමනාවන්, දෘෂ්ටි කෝණය සහ සංස්කෘතිය අවිවාදාත්මක ලෙස ප්‍රකාශ කර තිබේ.

4. ධනවාදී යුගයේ ඉතා වටනා ජයග්‍රහණයන් කොහෙත්ම ප්‍රතික්ෂේප නොකර, එයට හාත්පසින්ම වෙනස්ව, මිනිස් චින්තනයේ සහ සංස්කෘතියේ අවුරුදු දෙදහස් පන්සියයකටත් වඩා වැඩි කාලයක් තිස්සේ ලබා ඇති සෑම දෙයක්ම ස්වීකරණයට සහ යළි හැඩ ගැසීමකට භාජනය කළ නිසා මාක්ස්වාදය විප්ලවවාදී නිර්ධන පංතියේ දෘෂ්ටිය ලෙස ජගත් ඓතිහාසික වැදගත් කමක් දිනා ගත්තේය. සෑම අකාරයකම සූරාකෑමට විරුද්ධව ගෙනයන අරගලයේ අවසාන අවධිය ලෙස නිර්ධන පංතික ආඥාදායකත්වයේ ආශ්වාදයක් ලබාගනිමින් මෙම පදනම සහ මෙම දිශානතිය යටතේ වැඩ කරමින් පමණක්, සැබෑ නිර්ධන පංතික සංස්කෘතියේ වර්ධනය පිළිගත හැකිවේ.

5. මෙම ප්‍රතිපත්ති මූලක දෘෂ්ටි කෝණය දැඩි ලෙස පිළිගන්නාවූ සමස්ත රුසියානු ප්‍රොලෙත්කුල්ත් සමුළුව, තමන්ටම විශේෂවූ සංස්කෘතික වර්ග සොයා ගැනීමට දරන ප්‍රයත්නයද, ස්වයං හැඟීම් සහිත සංවිධාන තුළට වී කොන්වීමද, අධ්‍යපනය පිළිබඳ මහජන කොමසාරිස් මණ්ඩලය සහ ප්‍රොලෙත්කුල්ත් සංවිධානය අතර සීමාවන් බෙදවෙන් කිරීමද, එසේත් නැතිනම්, අධ්‍යාපනය පිළිබඳ මහජන කොමිසාර් මණ්ඩලය යටතේ පවතින සංවිධාන තුළ ප්‍රොලෙත්කුල්ත් ''ස්වෛරිත්වයත්'' ඇති කිරීම සහ අනෙකුත් මෙවැනි දේද න්‍යායික වශයෙන් සාවද්‍ය, ව්‍යවහාරික වශයෙන් හානිකර දේවල් ලෙස ඉතා දැඩි ලෙසම හෙළා දකින්නීය. අධ්‍යාපනය පිළිබඳ මහජන කොමසාරිස් මණ්ඩලයේ සංස්ථාවල සහායක සංවිධාන ලෙස කටයුතු කිරීම ගැන ප්‍රොලෙත්කුල්ත් සංවිධාන හොඳහැටි කල්පනා කළ යුතු බවටත්, තම කාර්යයන් සෝවියට් අධිකාරීන්ගේ (විශේෂයෙන්ම අධ්‍යාපනය පිළිබඳ මහජන කොමසාරිස් මණ්ඩලයේ) සහ නිර්ධන පංතික ආඥාදායකත්වයේ කාර්යයන්ගේ කොටසක් ලෙස රුසියානු කොමියුනිස්ට් පක්ෂයේද පොදු මග පෙන්වීම යටතේ ඉටුකළ යුතු බවටද සමුළුව සියලු ප්‍රොලෙත්කුල්ත් සංවිධානවලට නියම කරයි.

* * *

තම ප්‍රකාශනය විකෘති කළ බව ලූනාචාර්ස්කි සහෝදරයා අපට කියයි. එනිසාම යෝජනාව අධි අවශ්‍යතාවයක් දනවයි.

1920 ඔක්තෝබර් මාසයේදී ලියන ලදී.
''ක්‍රාස්නය නෝව්'' අංක 3 1926 දී ප්‍රථම වරට පළවිය.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, වෙළුම 41, පිටු 336-337.

ගුබේර්නියා සහ උයෙස්ද් මහජන අධ්‍යාපන අංශවල දේශපාලන අධ්‍යාපනික සේවකයින්ගේ සමස්ත රුසියානු සාකච්ඡාව අමතා 1920 නොවැම්බර් 3 ද කළ කතාව

සහෝදරවරුනි, දේශපාලන අධ්‍යපනය සඳහා ප්‍රධාන මණ්ඩලයක් තෝරා පත් කිරීම නිමිත්තෙන් කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාව සහ මහජන කොමසාරිස් මණ්ඩලය විසින් විග්‍රහ කරන ලද සමහර කරුණු ගැනද, මහජන කොමසාරිස් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද කෙටුම්පත් යෝජනාව සම්බන්ධයෙන් මසිත තුළ පැන නැගි කරුණු ගැනද අදහස් ස්වල්පයක් ඉදිරිපත් කිරීමට මට අවසර දෙන්න; මෙම කෙටුම්පත් යෝජනාව ඊයේ පදනමක් ලෙස පිළිගත්තද එය විස්තර සහිතව සාකච්ඡාවට භාජන කළ යුතුය.

මා වෙනුවෙන් වචනයක් කීමට මට අවසර දෙන්න. ඔබගේ ආයතනයේ නම වෙනස් කිරීම පිළිබඳව මුලදී මම දැඩි විරුද්ධත්වයක් දැක්වීමි. මගේ මතය අනුව, අධ්‍යාපනය පිළිබඳ මහජන කොමසාරිස් මණ්ඩලයේ යුතුකම ජනතාවට ඉගෙන ගැනීමට සහ උගැන්වීමට ආධාර කිරීමය. පටබැඳි නම් ළාමක විහිලුවක් සේ සැළකීමට මට මගේ සෝවියට් අත්දැකීම් උගන්වා ඇත. පටබැඳි හැම නමක්ම එක්තරා විධියක විහිළුවකි. තවත් නමක් දැන් පටබැඳ ඇත, එය නම්, දේශපාලන අධ්‍යාපනය සඳහා ප්‍රධාන මණ්ඩලයය.

මෙම කරුණ ගැන දැනට තීරණයක් ගෙන තිබෙන බැවින්, මෙය පෞද්ගලික ප්‍රකාශයක් හැටියට මිස වෙනත් ආකාරයකින් නොසළකන්න. මෙම කරුණ ලේබලය මාරු කිරීමකට පමණක් සීමා කර නැතිනම්, එය අපේ සතුටට හේතු වනු ඇත.

සංස්කෘතික හා අධ්‍යාපනික වැඩවලට අළුත් ජන කොටස් ඇද ගැනීමට අප සමත් වෙති නම්, එය නිකම් ලේබලයක් මාරු කිරීමක් නොවන්නේය. අළුත් හැම ව්‍යාපාරයකටත්, හැම ව්‍යවසායයකටත් ලේබල් ඇලවීමේ ''සෝවියට්'' දූර්වලතාවය සමග අපට සමාග්‍රියකට එළඹිය හැකිය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අපේ සංස්කෘතික හා අධ්‍යාපනික වැඩවලට ජනතාව බඳවා ගැනීමේදී ප්‍රධාන පෙළඹවීම විය යුත්තේ අධ්‍යාපනය සහ අපේ ප්‍රතිපත්තිය අතර ඇති සම්බන්ධකමය. අවශ්‍යතාවයක් ඇති නම් පද්ධතියකින් කිසිවක් ප්‍රකාශ වෙයි. අපේ අධ්‍යපනික වැඩවලදී මුල සිට අග දක්වා අපට අධ්‍යාපනික වැඩ දේශපාලනමය නොවිය යුතුය යන පැරණි ප්‍රතිපත්තිය ඉවත ලෑමට සිදුවිය. දේශපාලනයෙන් කොන් වී හුදකලාව අපට අධ්‍යාපනික කටයුතු ගෙනයාමට නොපුළුවන.

ධනපති සමාජයේදී මෙම අදහස නිතර බලපෑවේය. ''අදේශපාලන'' නැතිනම් ''දේශපාලනමය නොවන'' වැනි වාග් පාඨ අධ්‍යාපනය පිළිබඳව ධනපති පංතියේ කුහකත්වය විදහා පෙන්වයි. එය අන් කිසිවක් නොව ජනතාව රැවටීමකි. මෙම ජනතාවගෙන් සියයට 99 ක් පල්ලියේ සහ පෞද්ගලික දේපලවල පාලනය විසින් අවඥාවට සහ පහත් කොට සලකනු ලැබේ. තවමත් සියලු ධනපති රටවල් පාලනය කරන ධනපති පංතිය, පොදු ජනතාව රවටා ලන්නේ ඒ විධියටය.

එවැනි රටවල දේශපාලන යන්ත්‍රයේ වැදගත්කම වැඩිවන තරමට, ප්‍රාග්ධනයෙන් හා එහි ප්‍රතිපත්ති වලින් අධ්‍යාපනයට ඇති නිදහස අඩුවන්නේය.

ධනපති සමාජයට අවංක ලෙසම පිළිගැනීමට නොහැකි වුවද, සියලු ධනවාදී රටවල දේශපාලන යන්ත්‍රය සහ අධ්‍යාපනය අතර ඇති සම්බන්ධතාවය අති විශාලය. එසේ වුවද, ධනවාදී සමාජය පල්ලිය සහ පෞද්ගලික දේපලෙහි ආයතන මගින් පොදු ජනතාව අධිශීක්ෂණයට භාජනය කරති.

ධනවාදී සත්‍යය වෙනුවට අපේ සත්‍යය ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන්, එයට පිළිගැනීමක් දිනා දීම අපේ මූලික කාර්යයන්ගෙන් එකකි.

ධනපති සමාජයේ සිට නිර්ධන පංතික ප්‍රතිපත්තියක් දක්වා පරිවර්තනයවීම ඉතා අසීරු වන්නේ, ධනපති පංතිය සිය ප්‍රචාරයේ සහ උද්ඝෝෂණයේ මුළු මහත් යන්ත්‍රය යොදා නොර නෝන්චියක් නැතිව අපට විරුද්ධව ද්වේෂ සහගත ප්‍රචාරයන් කරන බැවිනි. ජනගහණයෙන් අල්පතරයක් වූ නිර්ධන පංතියක් සිටින රුසියාව වැනි රටකට ඉතා වැදගත් වන, නිර්ධන පංතික ආඥාදායකත්වය වැනි ඉතා උතුම් කාර්ය භාරයක් සහ එහි අධ්‍යාපනික කාර්ය භාරය නොවැදගත් දෙයක් ලෙස හුවා දැක්වීමට එය සෑම ප්‍රයත්නයක්ම දරයි. එහෙත් රුසියාවේ මෙම කාර්ය භාරයට ප්‍රධාන තැනක් දිය යුතුය, මන්දයත්, සමාජවාදය ගොඩනැගීම සඳහා අප විසින් පොදු ජනතාව පිළියෙල කළ යුතු බැවිනි. ධනපති පංතියට විරුද්ධව ගෙනයන සටන්වලදී, වෙනත් වචනවලින් කියතොත්, පැරණි සතුරා පරදවා නිර්ධන පංතියට පූර්ණ ජය ලබාගත

හැකි සියලු ගුණයන් සහතික කරන ඉතා උසස් පංති හැඟීමකින් යුත් දැඩි විනයක් හා ගැඹුරු ලැදිකමක් වර්ධනය නොකරන්නේ නම්, නිර්ධන පංතික ආඥාදායකත්වය පිළිබඳ ප්‍රශ්නය පවා පැන නොනගිනු ඇත.

වැඩ කරන ජනතාව සමාජවාදී සමාජයකට සූදානම් යැයි කියන මනෝරාජිකවාදී මතය අපි නොදරමු. සමාජවාදී කම්කරු පංතික ඉතිහාසය විසින් ස්ථිර කරුණු අනුව මෙය එසේ නොවන බව අපි ස්ථිර ලෙසම දනිමු. සමාජවාදයට පිළියෙල වීම, මහා පරිමාණ කර්මාන්තය විසින්ද, ස්ට්‍රයික් අරගල සහ දේශපාලන සංවිධාන විසින්ද පමණක් සපයන බව අපි දනිමු. ජයග්‍රහණය ලබා ගැනීමට සහ සමාජවාදී විප්ලවය සම්පූර්ණ කිරීම පිණිස, සූරාකන්නන් පන්නා දැමීම සඳහා, සම්මත කැරැ ගත් ක්‍රියාවන් යෙදවිය යුතුය. නිර්ධන පංතිය තමාට අවශ්‍ය දක්ෂතාවයන් ලබාගත් බවත්, බලය අල්ලා ගැනීමෙන් ඉක්බිතිව එය ක්‍රියාවට යෙදවූ බවත් දූන් අප දකිමු.

අධ්‍යාපන කම්කරුවෝ සහ අරගලයේදී මග පෙන්වන්නා වන කොමියුනිස්ට් පක්ෂයත්, පැරණි ක්‍රමයෙන් අපට උරුමය වශයෙන් ලැබුණු, පැරණි විධි සහ පරිචිත චර්යා ක්‍රමික වැඩද, ජනතාව ඇලී — ගැලී සිටින පෞද්ගලික දේපලට සම්බන්ධ පරිචිතයන්ද ඉවතලෑම පිණිස වැඩ කරන ජනතාවට දැනුම ලබාදීම සහ උපදෙස් ලබාදීම සිය මූලික කාර්ය භාරය ලෙස සැලකිය යුත්තාහ. පක්ෂයේ මධ්‍යම කාරක සභාවෙන් සහ මහජන කොමසාරිස් මණ්ඩලයෙන්, විශේෂ ප්‍රශ්න ගැන සැලකිල්ල යොමු කරන ලෙස ඉල්ලා සිටින විටදී, මුළු මහත් සමාජවාදී විප්ලවයේ මේ මූලික කාර්ය භාරය අමතක නොකළ යුතුය. දේශපාලන අධ්‍යාපනයේ ප්‍රධාන මණ්ඩලයට තිබිය යුත්තේ කිනම් වර්ගයක ව්‍යුහයක්ද? මෙය වෙනත් ආයතනයන් සමග සම්බන්ධ කරන්නේ කෙසේද? මෙය මධ්‍යස්ථානය සමග පමණක් නොව, පළාත්බද සංවිධාන සමග සම්බන්ධ කරන්නේ කෙසේද? මෙම ප්‍රශ්නය ගැන වඩාත් හොඳින් දන්නා ඒ ගැන සෑහෙන අත්දැකීමක් ලබා ඇති, එම ප්‍රශ්නය ගැන විශේෂ අධ්‍යයනයක් කළ සහෝදරවරු එම ප්‍රශ්නවලට පිළිතුරු සපයනු ඇත්තාහ. මෙයට සම්බන්ධ ප්‍රධාන මූලධර්ම ගැන අවධානය කිරීමට පමණක් මම කැමැත්තෙමි. දේශපාලනය සමග අධ්‍යාපනය සම්බන්ධ නොකළැකිය යන පැරණි බොරුව නොතකා අප විසින් ප්‍රශ්නය විවෘත ලෙස ඉදිරිපත් කොට, විවෘත ලෙස පිළිගත යුතුය.

අපට වඩා බොහෝ සෙයින් ශක්තිමත් ලෝක ධනපති පංතියට විරුද්ධව, අරගලයක් ගෙන යන ඓතිහාසික වකවානුවක අපි ජීවත් වමු. අරගලයේ මෙම අවධියේදී විප්ලවයේ වර්ධනය අප විසින් ආරක්ෂා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කළ යුතුය, මිලිටරි ක්‍රම අනුව ධනපති පංතියට පහර දිය යුතුය, අධ්‍යාපනය මගින් දෘෂ්ටිමය මාධ්‍යයෙන් වඩාත් වැඩියෙන් පහර දිය යුතුය. දේශපාලන නිදහස සඳහා වසර දසක කීපයක් තිස්සේ කම්කරු පංතිය ගෙන ගිය අරගලයේදී, ලබාගත් පරිචිතයන්, භාවිතයන් සහ වැටහීම්,— මෙම පරිචිතයන්, භාවිතයන් සහ වැටහීම්වල සමස්තය සහ චින්තනයන් — සියලු වැඩකරන ජනතාවට අධ්‍යාපනය ලබාදීමේදී අවියක් ලෙස සේවය කළ යුතුය. වැඩකරන ජනතාවට අධ්‍යාපනය ලබාදිය යුත්තේ කෙසේද යන්න තීරණය කිරීම, නිර්ධන පංතියට අයත් කාර්යයකි. ලෝකයේ වඩ වඩාත් ධනපති රටවලට දැන් පැතිර යමින් තිබෙන්නා වූ නිර්ධන පංතික අරගලයෙන් ඈත්වී සිටීමට නොහැකි බවත්, එය සමාව නොදිය හැකි කරුණක් බවත්, ජාත්‍යන්තර දේශපාලනයෙන් ඈත් වී නොසිටිය හැකි බවත්, වැඩකරන ජනතාවට සාක්ෂාත් කර ගැනීමට හැකි වන සේ, පුහුණුවක් ලබා දීම අවශ්‍ය වේ. සෝවියට් රුසියාවට විරුද්ධව ලෝකයේ අති බලසම්පන්න ධනපති රටවල් හවුලකට එක් වී සිටිති. අද ජාත්‍යන්තර දේශපාලන තත්ත්වයේ සැබෑ පදනම එයයි. ධනපති රටවල කෝටි සංඛ්‍යාත වැඩ කරන ජනතාවගේ ඉරණම මෙය මත රඳා පවතින බව අප විසින් පිළිගත යුතුය. වත්මන් අවධියේදී පෘථිවියේ අස්සක් මුල්ලක් නැර ධනපති රටවල් විසින් පාලනය කෙරෙන බව අපි දනිමු. ඒ අනුව අද මෙවැනි තත්ත්වයක් පැන නැගී තිබේ: විප්ලවයේදී හා යුද්ධයේදී අයිනකට වී බලා සිටි, අප්‍රබුද්ධ මිනිසුන් මෙන්, ධනපතීන් විසින් සම්පූර්ණ ලෙස ජනතාව රැවටීම නොදකිමින්ද, ධනපති පංතිය සිතා මතා එම ජනතාව අඳුරේ තැබූ සැටි නොදකිමින්ද, වත්මන් අරගලයේදී අයිනකට වී බලා සිටීමෙන් සිය දේශපාලන අවිඥත භාවය පූර්ණ ලෙස ඔප්පු කිරීම හෝ නිර්ධන පංතික ආඥදායකත්වය සඳහා ගෙනයන අරගලයේදී එයට පක්ෂව සහභාගි වීමෙන් හෝ ක්‍රියා කිරීම යන මේ දෙකින් එකක් තෝරා ගැනීමට සිදුවී තිබේ.

මෙම නිර්ධන පංතික අරගලය ගැන අප කතා කරන්නේ පූර්ණ විවෘත භාවයකිනි. හැම මිනිසකුම අපේ පැත්ත හෝ අපට විරුද්ධ පැත්ත හෝ තෝරා ගත යුතුය. මෙම අරගලයේදී එක් හෝ තවත් පැත්තක් නොගෙන සිටීමට වෑර දැරීම විනාශයෙන් අවසන් වනු ඇත.

කෙරෙන්ස්කිවාදී[72] පල්හොරුන්ගේ ඉමක් නැති නටබුන්ද, යුදෙනිච්ලා, කොල්චාක්ලා, පෙත්ල්යූරාලා මග්නෝලා සහ එවැනි අය විසින් නියෝජනය කරනු ලබන එස්ආර් සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ද නිරීක්ෂණය කිරීමේදී රුසියාවේ විවිධ පෙදෙස්වල පැන නැගී තිබෙන ප්‍රතිවිප්ලවවාදයේ විවිධ ආකාර අපට පෙන්වා දී ඇත. අන් සියලු

මිනිසුන්ට වඩා සටනේදී දඬුවම් පන්නරයක් ලැබීමට අපට හැම හේතුවක්ම ඇති බව කිව යුතුය. බටහිර යුරෝපය දෙස බලන විට, අප රටේ සිදුවූ දේ ඒ රටවල සිදුවේ. මෙය ඉතිහාසයේ පුනරුක්තියකි. හැම තැනම කෙරෙන්ස්කි පල් හොරුන් රැළට සමාන එවුන් ධනපතීන් සමග එක්වී කටයුතු කරන සැටි පෙනේ. ප්‍රධාන වශයෙන් ජර්මනිය ඇතුළු රටවල් කීපයකම ඔවුහු ප්‍රමුඛස්ථානය ගෙන සිටිති. හැම තැනම එකම දෙයක් අපි දකිමු. අතර මැද තත්ත්වයක් නොගැනීමට බැරි බව සහ එක්කෝ ප්‍රතිවිප්ලවීය සුදු හමුදාවල ආඥාදායකත්වයක් (මන්දයත්, බටහිර යුරෝපයේ සියලු රටවල ධනපති පංතිය අපට විරුද්ධව අවි ගනිමින් එයට සූදානම් වන බැවිනි.) නැතිනම්, නිර්ධන පංතික ආඥාදායකත්වයක් සඳහා පක්ෂපාත විය යුතු බව පැහැදිලි ලෙස වටහා ගත යුතුය. මෙය අප ඉතා තීව්‍ර ලෙසත් ගැඹුරු ලෙසත් අත්දැක තිබෙන බැවින්, රුසියන් කොමියුනිස්ට්වාදීන් ගැන දීර්ඝ ලෙස කතා කිරීමට අවශ්‍යතාවයක් නැති බව විශ්වාස කරමි. ඒ අනුව ඇත්තේ එකම නිගමනයක් පමණකි, දේශපාලන අධ්‍යාපනය සඳහා ප්‍රධාන මණ්ඩලයක් පිළිබඳ සියලු තර්ක සහ න්‍යාය පදනම් කැරගත් එකම නිගමනයක් පමණකි. එම සංවිධානයේ වැඩවලදී කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රතිපත්තිවල ප්‍රධානත්වය එළිපිටම පිළිගැනීමය. මග පෙන්වීමේ වෙනත් ක්‍රමයක් අපි නොදනිමු. වෙනත් කිසිම රටක වෙනත් ක්‍රමයක් සොයාගෙන නැත. දේශපාලන පක්ෂ තම පංතියේ අයිතිවාසිකම් එක් හෝ තවත් තත්ත්වයකට ඉදිරිපත් කරනු ඇත. මේ පක්ෂ වෙනස්වීම්වලට සහ විකරණවලට භාජනය වනු ඇත. එහෙත් මෙයට වඩා හොඳ ක්‍රමයක් අපි නොදනිමු. අවුරුදු තුනක් තිස්සේ ලෝක අධිරාජ්‍යවාදයේ ප්‍රහාරයට මුහුණ දී නැගී සිටින සෝවියට් රුසියාව විසින් ගෙනයන මුළු මහත් අරගලය නිර්ධන පංතිය ගුරුවරයා, සංවිධායකයා සහ නායකයා වශයෙන් සිය කාර්යයන් ඉටුකිරීමේදී එයට විඥත ලෙස ආධාර දීමට පක්ෂය ඉදිරිපත් වීමේ සත්‍යය සමග වෙළී පවතී. මෙය රහිතව ධනපති ක්‍රමයේ බිඳවැටීම නොකළහැ කි දෙයකි. වැඩකරන බහු ජනතාව, ගොවීන්ගේ සහ කම්කරුවන්ගේ බහු ජනතාව පැරණි බුද්ධිමත් පුරුද්ද පන්නා දැමීම සහ කොමියුනිස්ට්වාදය ගොඩනැගීමේ කාර්යය සඳහා තමන් යළිත් ඉගෙන ගත යුත්තාහ. එසේ නැතිව ඉදිකිරීමේ කාර්යයන් සපුරාලිය නොහැකිය. මෙය ඉතා බැරෑරුම් දෙයක් බව අපට අපේ අත්දැකීම් පෙන්වා දී ඇත. එබැවින් අපි පක්ෂයේ ප්‍රධාන ක්‍රියාකලාපය පිළිගත යුතුවෙමු. අපේ ක්‍රියාකාරිත්වය සහ අපේ සංවිධානාත්මක වර්ධනය ගැන සාකච්ඡා කිරීමේදී අප එය නැති නොකර ගත යුතුය. මෙය කළ යුත්තේ කෙසේද යන්න ගැන දීර්ඝ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ලෙස සාකච්ඡා කළ යුතුය. මෙය පක්ෂයේ මධ්‍යම කාරක සභාවේත්, මහජන කොමසාරිස් මණ්ඩලයේත් සාකච්ඡා කළ යුතුය. ඊයේ සම්මත කැරගත් පනත අනුව, දේශපාලන අධ්‍යාපනයේ ප්‍රධාන මණ්ඩලය මූලික කරුණු ඉදිරිපත් කර ඇත. එහෙත් එය මහජන කොමසාරිස් මණ්ඩලයේ සියලු අවධි පසු කර නැත. ඉදිරි දවස් කීපය තුළදී පනත ප්‍රසිද්ධ කරනු ඇත. එහි අවසාන ආකාරය පක්ෂය සමග ඇති සෘජු සම්බන්ධකම් සටහන් නොකරන බව ඔබට එවිට පෙනී යනු ඇත.

එකම මූලධර්මයක් අනුව, කොමියුනිස්ට්වාදීන්ට නිර්ධන පංතිය සමග වෙළීමට හැකිවන සේ, නිර්ධන පංතියට සිය ආස්වාදය කාවැද්ද වීමට හැකි වන සේ, කොමියුනිස්ට්වාදීන්ට නිර්ධන පංතියේ විශ්වාසය දිනාගත හැකි වන සේ, අප මෙතෙක් අකාමකා දැමීමට වැර දරන ධනවාදී රැවටිලි පිළිබඳව නිර්ධනීන්ගේ නෙත් විවෘත කරවිය හැකි වන සේ පක්ෂය විසින් ශුද්ධ පවිත්‍ර කිරීම, නියම කිරීම හා ඉදි කිරීම මත පදනම් වූ නීතිගත සහ ව්‍යවහාරික ව්‍යවස්ථාවක් සෝවියට් ජනරජයේ තිබෙන බව, අප විසින් කෙසේවුවද දැන ගත යුතුය, මතක තබා ගත යුතුය. අධ්‍යාපනය පිළිබඳ මහජන කොමසාරිස් මණ්ඩලය දීර්ඝ කාලීන අරගලයක් ඔස්සේ ගමන් කර ඇත. දීර්ඝ කාලයක් තිස්සේ ගුරුවරුන්ගේ සංවිධානය සමාජවාදී විප්ලවයට විරුද්ධ විය. ගුරුවරුන් අතර ධනවාදී අගතිගාමී මත (ප්‍රාග් විනිශ්චයන්) ගැඹුරු ලෙස මුල් බැස තිබිණි. සෘජු කඩාකප්පල් කිරීම් සහ මුරණ්ඩු ධනවාදී අගතිගාමී මත සහිත දීර්ඝ කාලීන අරගලයක් තිබිණි. කොමියුනිස්ට්වාදී ප්‍රතිපත්ති සඳහා සෙමින්, පියවරෙන් පියවර සටන් කිරීමටත් ගුරුවරුන් අප වෙතට දිනා ගැනීමටත් අපට සිදුවී තිබේ. දේශපාලන අධ්‍යාපනික කටයුතු පිළිබඳ ප්‍රධාන මණ්ඩලය, පොදු ජනතාවට අධ්‍යාපනයක් දීමේ සහ ඔවුනට බුද්ධිය ලබා දීමේ බාහිර පාඨශාලීය අධ්‍යපනය ගැන සැලකිලි දක්වයි. පන්ලක්ෂයක හමුදුවක් වන ගුරුවරුන්ගේ විශ්වාසය දිනාගැනීම සඳහාත්, ඔවුන්ට ආස්වාදයක් ලබා දී, ඔවුන් උනන්දු කරවීම සඳහාත් ගෙනයන ව්‍යාපාරය සමග පක්ෂයේ නායකත්වය සංයෝජන කරලීමේ කාර්යයට දේශපාලන අධ්‍යාපනික කටයුතු පිළිබඳ ප්‍රධාන මණ්ඩලය මුණ පා සිටී. මේ ගුරු හමුදුව දුන් කම්කරුවන්ට සේවය කරන විශාල ව්‍යවසායයකි. අධ්‍යාපනික ශිල්පීන් — ගුරුවරුන් පුහුණු කර තිබෙන්නේ ධනපති අගතිගාමිත්වය සහ පරිචිතය අනුවය, මෙය නිර්ධන පංතිය සමග කිසිදු සම්බන්ධ කමක් නැති නිර්ධන පංතියට සතුරු වූ ආකල්පයකි. පක්ෂය හා එහි අදහස් සමග කිට්ටු සම්බන්ධකම් ඇති, එහි ආස්වාදයෙන් වෙළී සිටින ගුරුවරුන්ගේ සහ උපදේශකයින්ගෙන් යුත් හමුදුවක් අපි පුහුණු කළ යුතු වෙමු. කොමියුනිස්ට්වාදී

ආශ්වාදය පොදු ජනතාව තුළට කාවද්දවා, කොමියුනිස්ට්වාදීන් කරන වැඩ ගැන ඔවුන් තුළ හැඟීමක් ඇති කොට, පොදු ජනතාව අප වෙතට දිනා ගැනීම පිණිස අප ක්‍රියා කළ යුතුය.

පැරණි සිරිත්, පරිචිතයන් හා මත අතහැර දැමිය යුතු නිසා දේශපාලන අධ්‍යාපනික මණ්ඩලය සහ එහි සේවක පිරිස ඉදිරියේ ඉතා වැදගත් කාර්ය භාරයක් ඇත්තේය. මෙය ඔවුන් දැඩි අවධානයකින් සිත්හි තබා ගත යුතුය. මෙහිදී අපි සැබවින්ම සංකීර්ණ ගැටළුවකට මුණ පා සිටිමු. පැරණි තාලේ අධ්‍යාපනයක් ලැබ, පැරණි මතවල එල්බ ගෙන සිටින්නන් වැඩි දෙනෙකු සිටින ගුරුවරුන් සහ පක්ෂ සාමාජිකයින් අතරත්, කොමියුනිස්ට්වාදීන් අතරත් අප සම්බන්ධකම් ඇති කරන්නේ කෙසේද? මෙය අතිශයින්ම අසීරු ප්‍රශ්නයකි. මෙය නිරාකරණය කිරීම පිණිස විශාල චින්තන ශක්තියක් යෙදවිය යුතුය.

මේ තරම් එකිනෙකාට වෙනස් මිනිසුන් අතර සංවිධානාත්මක සම්බන්ධකම් ස්ථාපිත කිරීමේ මාධ්‍යයන් ගැන අපි සළකා බලමු. කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ක්‍රියා කලාපය මූලධර්මයක් ලෙස මොහොතකටවත් අප විසින් අමතක නොකළ යුතුය. ඒ අනුව දේශපාලන සංස්කෘතියේත්, දේශපාලන අධ්‍යාපනයේත් අරමුණ විය යුත්තේ, ව්‍යාජ මත සහ අගතිගාමීත්වය නැතිකර දමා, පැරණි ක්‍රමය විනාශ කිරීමට සහ ධනපතීන්, සූරාකන්නන් හා ඉඩම් හිමියන් නැති රජයක් ගොඩ නැගීමට වැඩකරන ජනතාවට ආධාර කිරීමෙහි සමත් සබෑ කොමියුනිස්ට්වාදීන් පුහුණු කරවීමය. මෙය කළ හැක්කේ කෙසේද? ගුරුවරුන් ධනපති ක්‍රමයෙන් උරුම කොට ගත් දැනීම් සම්භාරය ප්‍රයෝජනයට ගනිමිනි. මෙය ඉටු නොකර කොමියුනිස්ට්වාදයේ තාක්ෂණික ජයග්‍රහණයන් ලබා ගත නොහැක. එසේ නැතිනම් ජයග්‍රහණ සඳහා අප තබන බලාපොරොත්තු සියල්ල පුහු සිහින වනු ඇත. එවිට අප ඉදිරියේ මතුවන ප්‍රශ්නය මෙසේය: තම වැඩවලට දේශපාලනය. විශේෂයෙන්ම අපට වාසි වන දේශපාලනය, එනම් කොමියුනිස්ට්වාදයට අවශ්‍ය දේශපාලනය ඇදාගැනීමට අකැමති මේ මිනිසුන් අප සංවිධානය කරන්නේ කෙසේද? මා මුලදී සටහන් කළ පරිදි මෙය ඉතා අමාරු ප්‍රශ්නයකි. මේ ප්‍රශ්නය ගැන අප මධ්‍යම කාරක සභාවේදී සාකච්ඡා කළෙමු. මෙය සාකච්ඡා කිරීමේදී අත්දැකීම් වලදී ලබා ගත් පාඩම් ගැන සැලකිලි දක්වීමට වැයම් කළෙමු. අද මා කතා කරන මේ සමුළුව ඔබගේ මේ සාකච්ඡා සභාව ඒ අනුව ඉතා වටනා මෙහෙයක් කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි. නියමිත කවයකට සහ නියමිත සංවිධානයකට අයත් පුද්ගලයකු හැටියට පමණක් මෙතෙක් ගණන් ගත්, සෑම ප්‍රචාරකයකු දෙසම දුන් සෑම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පක්ෂ කමිටුවක්ම වෙනත් ආකාරයකින් බැලිය යුතුය. මුළු මහත් රජය මෙහෙයවන ආණ්ඩු පක්ෂයට ධනපති ක්‍රමයට විරුද්ධව ජගත් අරගලයක් ගෙනයන සෝවියට් රුසියාවට ඒ හැම කෙනෙකුම අයත්ය. අති විශාල රාජ්‍ය යන්ත්‍රයක් ක්‍රියා කරවන, ක්‍රියා කරවිය යුතු සටන්කාමී පංතියක හා පක්ෂයක නියෝජිතයෙකි, ඔහු. නීති විරෝධී රහස් දේශපාලන කටයුතුවල යෙදීමේ අනගිතම පාසලින් අභාෂය ලැබ සටන් තුළින් පරීක්ෂණයට මූණ පා පන්නරය ලැබූ බොහෝ කොමියුනිස්ට්වාදීහු මේ විපරිණාමණයේ පූර්ණ වැදගත්කම වටහා ගැනීමට අපොහොසත් වෙති, නැතිනම් අකමැති වෙති. මෙම විපරිණාමනය විසින් උද්ඝෝෂකයා සහ ප්‍රචාරකයා, උද්ඝෝෂකයින්ගේ නායකයා හැටියටත්, අති විශාල දේශපාලන සංවිධානයක නායකයකු හැටියටත් පත් කරයි. ඔහුට පිරිනමන, සාමාන්‍ය පාසල්වල ප්‍රධාන පාලකයා නැමැති එම නිලය නිසා ඔහු ව්‍යාකූලත්වයට පත් වුණද, එය එතරම් කරුණක් නොවේ. එහෙත් ඉතා වැදගත් කරුණ නම්, ගුරු සංහතිය මෙහෙයැවීමේ දක්ෂතාවය ඔහුට තිබිය යුතු වීමය.

ලක්ෂ ගණනකින් යුත් ගුරුවරුන්ගේ සංස්ථාවකි, මෙය ක්‍රියාකාරී විය යුතුය, අදහස්වලට උත්තේජනයක් දිය යුතුය, අද වුවද මහජනතාව මත බලපාන අගතිගාමී, ප්‍රාග් විනිශ්චයන්ට විරුද්ධව සටන් කළ යුතුය. ධනවාදී සංස්කෘතියේ උරුමය, එහි අහිතකර ගුණයන් ගුරුවරුන්ගේ අති විශාල සංඛ්‍යාවකට කාවැදී තිබීමත්, කොමියුනිස්ට්වාදීන් වීමට එය ඔවුනට බාධා කිරීමත්, ඔවුන් දේශපාලන අධ්‍යාපනික සේවකයින් හැටියට ඇතුළු කර ගැනීමට අපට බාධා නොවිය යුතුය. මන්දයත්, මේ ගුරුවරුන්ට අයත් දැනුම අප ප්‍රයෝජනයට නොගන්නේ නම්, අපට අපේ අරමුණු මුදුන් පමුණුවා ගත නොහැකි බැවිනි.

කොමියුනිස්ට් අධ්‍යාපනය සඳහා අප විසින් ප්‍රයෝජනවත් මිනිසුන් ලක්ෂ ගණනක් සේවාවෙහි යෙදවිය යුතුය. යුද පෙරමුනේදී මේ කාර්යය අප විසින් සපුරාලමින් අපේ රතු හමුදවට පැරණි යුද්ධ හමුදවේ නියෝජිතයින් දහස් ගණනක් බඳවා ගත් පරිදි, මේ කාර්යය ඉටු කළ යුතුය. යළි ඉගෙන ගැනීමේ දීර්ඝ ක්‍රියාදාමය තුළින්, අවසානයේදී ඔවුන් සිය ජයග්‍රහණයන් මගින් ඔප්පු කළ පරිදි, රතු හමුදව සමග ඔවහු වෙළුණහ. අපේ සංස්කෘතික සහ අධ්‍යාපනික වැඩවලදීද අපි මේ ආදර්ශය අනුගමනය කළ යුතුය. මෙය පියවි ඇසට පෙනෙන විශිෂ්ඨ ජය ලබා නොදුන්නද, වඩාත් වැදගත් වන්නේය. අපට සෑම උද්ඝෝෂකයකු සහ ප්‍රචාරකයකු අවශ්‍ය වී ඇත. දැඩි පාක්ෂික ආස්වාදයක් අනුව ඔහු වැඩ කරන්නේ නම්, ඒ අතරම ඔහු සිය වැඩ පක්ෂයට පමණක් සීමා නොකර, ලක්ෂ සංඛ්‍යාත ගුරුවරුන්ගේ වුවමනාවන් අනුව ඔවුන් මෙහෙයවමින්,

ඔවුන්ගේ පැරණි ධනවාදී ප්‍රාග් විනිශ්චය වලින් මිදීමට ඔවුනට ආධාර දෙමින්, අප කරන වැඩවලට ඔවුන් බඳවා ගනිමින්, අපේ වැඩවලට ඉමහත් පරිමාණය සාක්ෂාත් කැර ගැනීමට ඔවුන් පොළඹවන්නේ නම්, සත්තකින්ම සැබෑ කාර්යයක් සපුරාලයි. ධනවාදය විසින් පාගා දමා අපෙන් ඈත් කළ මේ මිනිසුන් අප වෙත දිනාගෙන ඔවුන්ට නායකත්වයක් දිය හැක්කේත්, නිසි මග ඔස්සේ ඔවුන් ගෙන යා හැක්කේත් මෙම කාර්යය ඉටුකිරීමට ඉදිරිපත් වීමෙන් පමණකි.

බාහිර පාඨශාලීය අධ්‍යාපනික ක්ෂේත්‍රයේ වැඩ කරන සෑම උද්ඝෝෂකයකු හා ප්‍රචාරකයකු සපුරාලිය යුතු අරමුණු එසේය. ඔවුහු මේවා නිතරම සිත්හි තබාගත යුත්තාහ. මෙම ක්‍රියා දාමයේදී ප්‍රයෝගික අමාරුකම් සැහෙන සංඛ්‍යාවක් මතුවනු ඇත. පක්ෂ කවයන්වල පමණක් නොව, දැන් කම්කරු පංතිය අත ඇති, මුළු මහත් රාජ්‍ය පරිපාලන යන්ත්‍රයේ නියෝජිතයින් හා නායකයන් වෙමින් කොමියුනිස්ට්වාදය ගොඩනැගීමට ඔබ හැම දෙන ආධාර දිය යුත්තාහ.

යුද්ධමය සහ දේශපාලනමය ක්ෂේත්‍රවල පමණක් නොව, ධනපතීන් තුළ ඉතා ගැඹුරු ලෙසත්, ශක්තිමත් ලෙසත් මුල් බැසගත් දෘෂ්ටියේ සියලු ප්‍රතිරෝධනයන් අප විසින් අකාමකා දැමීම අපේ කාර්ය භාර්ය වන්නේය. පොදු ජනතාවට යළි අධ්‍යාපනයක් ලබාදීම සම්පූර්ණ කර ලීම අපේ අධ්‍යාපනික සේවකයන්ගේ යුතුකම වන්නේය. පොදු ජනතාව අතර කොමියුනිස්ට්වාදය ගැන ඉගෙනගැනීමට ඇති පිපාසය හා ආශාව මේ ක්ෂේත්‍රයේ අපේ ජයග්‍රහණයේ සහතිකය වන්නේය. සමහර විට යුද පෙරමුණේදී අප ලැබූ ජයග්‍රහණය තරම් ක්ෂණික නොවනු ඇත. ඉතා විශාල අමාරුකම් වලට සහ පසු බැසීම් වලට අනතුරුව විය හැකිය. කෙසේ වුවද, අවසානයේදී අපි ජය ගනිමු.

අවසානයේදී තවත් එක් කරුණක් ගැන කීමට මම කැමෙත්තෙමි. සමහර විට දේශපාලන අධ්‍යාපනය පිළිබඳ ප්‍රධාන මණ්ඩලය නැමැති නාමය නිසි ලෙස තේරුම් නොගන්නවා විය හැකිය. මෙහි දේශපාලන සංකල්ප ගැන සටහන් කරන නිසා මෙහි ප්‍රධාන දෙය දේශපාලනයයි.

එහෙත් දේශපාලනය අවබෝධ කැර ගන්නේ කෙසේද? පැරණි අරුත් අනුව දේශපාලනය අවබෝධ කර ගන්නේ නම්, කෙනෙකු බරපතළ සහ ගැඹුරු වරදකට හසු වනු ඇත. දේශපාලනය යනු පංතීන් අතර අරගලයකි, ලෝක ධනපති පංතියට විරුද්ධව නිර්ධන පංතිය සිය විමුක්තිය සඳහා ගෙනයන අරගලයේදී ඇතිවන සම්බන්ධකම්ය. කෙසේ වුවද, අපේ මේ අරගලයේ පැති දෙකක් කැපී පෙනෙයි. එක් අතකින්, ධනපති ක්‍රමයේ උරුමය විනාශ කර දැමීමත්, සෝවියට් රජය විනාශ කර දැමීම පිණිස මුළු මහත් ධනපති පංතියේ ප්‍රයත්න

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අහෝසි කර ලීමත්ය. මේ කාර්යය සාර්ථක කරනු වස් අපේ අවධානය යොමු වී ඇති අතර ඉදිකිරීමේ කාර්යය සඳහා ඉදිරිපත් වීම එය විසින් වළකා ඇත. ධනවාදී ජගත් දර්ශනය අනුව, දේශපාලන ආර්ථිකය තුළින් සොයාගත් බවකි. ධනපති පංතිය මෙසේ ප්‍රකාශ කළේය: ගොවියනි, නුඹලා ජීවිකාව සඳහා වැඩකළ යුත්තාහ; කම්කරුවනි, වෙළඳ පොළෙන් නුඹලා සිය ජීවිකාව සොයා ගත යුත්තාහ. ආර්ථික ප්‍රතිපත්තිය ස්වාමිවරුන්ගේ කාර්යයකි. මෙය කෙසේ වුවද සත්‍යය නොවේ. දේශපාලනය ජනතාවගේ කාර්යය විය යුතුය, නිර්ධන පංතියේ කාර්යය විය යුතුය. අපේ කාලයෙන් සහ වැඩවලින් සියයට අනූවක්, ධනපති පංතියට විරුද්ධ අරගල සඳහා යොදවා ඇති බව අවධාරණය කළ යුතුය. විරාන්ගෙල්ට විරුද්ධව කරන සටන්වලදී ලැබූ ජය ගැන අපි ඊයේ කියැවීමු. මේ ගැන ඔබ අද හෝ සමහර විට හෙට හෝ කියවනු ඇත. එම ජයග්‍රහණය එක් අරගලයක් අවසන් වූ බව පෙන්වයි. එමෙන්ම බටහිර රටවල් කීපයක් සමග අපි සාමය ඇති කැරගෙන සිටින්නෙමු. යුද පෙරමුණේ අප ලබන සෑම ජයග්‍රහණයක්ම අභ්‍යන්තර අරගලයට සහ රාජ්‍ය සංවිධානයේ දේශපාලනයට අත තැබීමට අපට නිදහස ලබා දෙයි. ප්‍රතිවිප්ලවවාදී සුදු හමුද පරාජය කර ලබන ජයග්‍රහණයට අප ළංකරන සෑම පියවරක්ම අරගලයේ කේන්ද්‍රය ආර්ථික ප්‍රතිපත්තිය වෙතට ගෙන යයි. පැරණි තාලයේ ප්‍රචාරය කොමියුනිස්ට්වාදය කුමක්ද යනු විස්තර කොට පැහැදිලි කරයි. දැන් මෙවැනි ප්‍රචාරයකින් වැඩක් නැත, මන්දයත් සමාජවාදය ගොඩ නගන්නේ කෙසේදැයි ප්‍රායෝගික ලෙස අප විසින් පෙන්වා දිය යුතු බැවිනි. ආර්ථික සංවර්ධනයේ දේශපාලනමය අත්දැකීම් මත අපේ සියලු ප්‍රචාරය පදනම් කළ යුතුය. අපේ ප්‍රධාන කාර්යය එයය. පැරණි අදහස් අනුව අර්ථ කථනයක් දීමට ඉදිරිපත් වන අයකු පරාවර්ති ලෙසත්, ගොවීන්ගේ සහ කම්කරුවන්ගේ පොදු ජනතාව අතර ප්‍රචාරක කටයුතු ගෙනයාම අසමත් අයකු ලෙසත් පෙනීයනු ඇත. ආහාර වැඩියෙන් නිෂ්පාදනය කිරීමටත්, බිම් අඟුරු වැඩියෙන් නිෂ්පාදනය කිරීමටත් මේ ආහාර සහ බිම් අඟුරු යොදවා දුර්භික්ෂය වළක්වා ලන්නේ කෙසේදැයි තීරණය කිරීමටත්, හැකිවන සේ රජය ආර්ථික වශයෙන් වර්ධනය කිරීම අපේ ප්‍රධාන ප්‍රතිපත්තිය විය යුතුය. අපේ ප්‍රතිපත්තිය එයයි. මෙම අරමුණ සඳහා අපේ උද්ඝෝෂණය යන ප්‍රචාරය කේන්ද්‍ර ගත කළ යුතුය. වැඩ කරන ජනතාවට ලස්සන වචන කියා සැනසිය නොහැකි බැවින් අලංකාර වචන ඇද බැම අඩුවෙන් කළ යුතුය. යුද්ධය ධනපතීන්ට විරුද්ධව ගෙනයන අරගලයෙන් සහ විරාන්ගල්ට හා ප්‍රතිවිප්ලවීය සුදු හමුදවලට විරුද්ධව ගෙන යන අරගලයෙන් ඈත් කිරීමට ඉඩ දුන් විගස

අපි ආර්ථික දෙශපාලනය වෙත හැරෙන්නෙමු. එවිට උද්ඝොෂණය සහ ප්‍රචාරය අති විශාල හා වඩාත් වැඩියෙන් වැදගත්කමක් දරනු අත.

හැම උද්ඝෝෂකයකුම රාජ්‍ය නායකයකු විය යුතුය, ආර්ථික සංවර්ධන වැඩවල ගොවීන් හා කම්කරුවන් සියලු දෙනාගේම නායකයකු විය යුතුය. කොමියුනිස්ට්වාදියකු වීම පිණිස කෙනෙකු දැනගත යුත්තේ මොනවාද, කියවිය යුතු කුඩා පොත් හා පොත් මොනවාද යන්න ඔහු පෙන්වා දිය යුතුය. අපේ ආර්ථික ජීවිතය දියුණු කර ලීමේත්, වඩාත් සුරක්ෂිත කිරීමේත්, වඩාත් සමාජයීය කිරීමේත් ක්‍රමය එය වන්නේය. නිෂ්පාදනය වැඩිකිරීමේත්, ආහාර තත්ත්වය දියුණු කිරීමේ සහ නිෂ්පාදනය කළ භාණ්ඩ බෙදා හැරීමේත්, බිම් අඟුරු නිෂ්පාදනය වැඩි කිරීමේ සහ ධනපති ක්‍රමය නැතිව, ධනපති ආශ්වාදය රහිතව, කර්මාන්තය යළි නගා සිටුවීමේත් මාර්ගය එය වන්නේය.

කොමියුනිස්ට්වාදයේ සංයුක්ත ලක්ෂණ මොනවාද? රජයේ සංවර්ධනය සඳහා ප්‍රායෝගික මග පෙන්වීමක් ඇති කරන ආකාරයට කොමියුනිස්ට්වාදය පිළිබඳව සියලු කටයුතු කළ යුතුය. පොදු ජනතාව කොමියුනිස්ට්වාදය තමන්ගේම කාර්යය ලෙස සැළකීමට තරම් ඔවුනට අවබෝධ වන විධියට එය ප්‍රචාරය කළ යුතුය. මෙම කාර්යය දුර්වල ලෙස අපි ඉටුකර ඇත්තෙමු. මෙහිදී අපි වැරදි දහස් ගණනින් කර ඇත්තෙමු. අපි මෙම කරුණ නොසඟවන්නෙමු. කෙසේ වුවද, දැනට දුර්වල සහ නොසෑහෙන තත්වයක පවතින අපේ යන්ත්‍රය අපේ ආධාර ඇතිව කම්කරුවන් සහ ගොවීන් විසින් ඉදි කළ යුතුය. මෙය අපට වැඩ පිළිවෙලක් හෝ න්‍යායයක් හෝ සපුරාලිය යුතු කාර්යයක් හෝ නොවේ. අපට මෙය ඉදිකිරීමේ සැබෑ සහ ප්‍රායෝගික කාර්යයක් බවට පත් වී ඇත. යුද්ධයේදී අපි බිහිසුණු පරාජයන් කීපයකට මුණ පැවද, යටත් පිරිසෙයින් මේ පරාජය වලින් පාඩම් ඉගෙන ගෙන පූර්ණ ජය ලබා ගත්තෙමු. දැනුදු පරාජය වලින් පාඩම් ඉගෙන ගැනීමට අපි ඉදිරිපත් විය යුතු වෙමු. දැනට කර තිබෙන වැඩ ආදර්ශයක් ලෙස ගෙන කම්කරුවන්ට හා ගොවීන්ට උපදෙස් දීමට මතක තබා ගත යුතුය. අයහපත් දේ මොනවාදැයි අප විසින් පෙන්වා දිය යුත්තේ අනාගතයේදී ඒවායින් වැළකීම පිණිසය.

නිර්මාණාත්මක වැඩ නිදසුනක් ලෙස ඒවා පෙන්වීමෙන් සහ ඉඳ හිට ඒවා අනුකරණය කරමින්, දක්ෂ කොමියුනිස්ට්වාදී කළමණාකරුවන් සැබෑ ඉදිකරන්නන් හැටියට පරිවර්තනය කිරීමට, ප්‍රධාන වශයෙන්ම අපේ ආර්ථික ජීවිතය ගොඩනගන්නන් හැටියට පරිවර්තනය කිරීමටද අපි සමත් වන්නෙමු. පැරණි ක්‍රමයෙන් අපට ලැබුණු සහ එක පහරින් විනාශ කළ නොහැකි සියලු බාධක මැඩ අපේ අරමුණු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අපි සපුරා ලන්නෙමු.අපි පොදු ජනතාවට යළි-අධ්‍යාපනයක් ලබා දිය යුතු වෙමු. ඔවුනට යළි-අධ්‍යාපනයක් ලබා දිය හැක්කේ උද්ඝෝෂණයෙන් හා ප්‍රචාරයෙන් පමණකි. ප්‍රථම කොටම, පොදු ජනතාව, මුළු මහත් ආර්ථික ජීවිතය ඉදි කිරීම සඳහා ඇද ගත යුතුය. හැම උද්ඝෝෂකයකුගේ සහ ප්‍රචාරකයකුගේ වැඩවල මූලික පරමාර්ථය සහ අරමුණ විය යුත්තේ එයයි. ඔහු මෙය වටහා ගත් විට, ඔහුගේ වැඩවල ජයග්‍රහණය සහතික වේ. (අත් පොළසන්, ප්‍රීති ඝෝෂා.)

''දේශපාලන අධ්‍යාපනික සේවකයින්ගේ සමස්ත රුසියානු සාකච්ඡාවේ බුලටිනය (1920 නොවැම්බර් 1—8 ද)'', මොස්කව්.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, වෙළුම 41, පිටු 398-408.

සටන්කාමී ද්‍රව්‍යවාදයේ අර්ථාන්විතය ගැන

ට්‍රොට්ස්කි සහෝදරයා ''පොද් ස්නාමෙනෙම් මාක්සිස්මා'' සඟරාවේ[73] අංක 1—2 කලාප මගින් අවශ්‍ය දේ කියා ඇති අතර එය ඉතා අනර්ග ලෙස කියා ඇත. මෙම සඟරාවේ සංඥපන ප්‍රකාශනයෙන් එම කතුවරුන් ප්‍රකාශ කරන හරය සහ වැඩ පිළිවෙල විග්‍රහ කෙරෙන සමහර ප්‍රශ්න ගැන වඩාත් කිට්ටුවෙන් පිරික්සා බැලීමට මා කැමතිය.

''පොද් ස්නාමෙනෙම් මාක්සිස්මා'' සඟරාව වටා එකතු වී සිටින අය සියලු දෙනම කොමියුනිස්ට්වාදීන් නොවූවද, ඔවුන් සියලු දෙනම ස්ථිර ද්‍රව්‍යවාදීන් බව එම ප්‍රකාශනයෙන් කියැවෙයි. කොමියුනිස්ට්වාදීන්ගේ සහ කොමියුනිස්ට්වාදීන් නොවන්නන් අතර මෙම මිත්‍රත්වය සම්පූර්ණයෙන්ම අවශ්‍ය වන අතර සඟරාවේ අරමුණ ගැන එය නිවැරදි ලෙස විග්‍රහ කර ඇත. කොමියුනිස්ට්වාදීන් විසින් කරන ලද ඉතා විශාල සහ ඉතා භයානක එක් වරදක් (මහා විප්ලවයක ආරම්භය ජයග්‍රාහී ලෙස සාර්ථක කැරැ ගත්, පොදුවේ විප්ලවවාදී මෙන්ම) නම් විප්ලවයක් කළ හැක්කේ විප්ලවවාදීන් විසින් පමණකියි යනු සිතීමය. එහෙත් එයට පටහැනිව, ඇත්ත වශයෙන්ම ජීවමාන සහ දියුණු පංතියේ පුරෝගාමී බලඇණිය හැටියට පමණක් විප්ලවවාදීන්ට ක්‍රියාකළ හැකිය යන අදහස, සියලු බැරෑරුම් විප්ලවවාදී වැඩවල ජයග්‍රහණය සඳහා අවශ්‍ය වන්නේය. මෙය අවබෝධ කැරැ ගැනීම හා ක්‍රියාවට යෙදවීම අවශ්‍ය වන්නේය. පුරෝගාමී බල ඇණියකට, පුරෝගාමී බල ඇණියක් ලෙස ක්‍රියා කළ හැකි වන්නේ එය නායකත්වය දෙන ජනතාවගෙන් කොන්වීම වලක්වා ලූ විටදී සහ මුළු මහත් පොදු ජනතාවටම නායකත්වය දී ඔවුන් ඉදිරියට ගෙනයාමට හැකි වූ විටදීය. ක්‍රියා කාරිත්වයේ විවිධ ක්ෂේත්‍රවල කොමියුනිස්ට්වාදීන් නොවන අප සමග මිත්‍ර සන්ධානයකින් තොරව, කොමියුනිස්ට්වාදී ඉදිකිරීම් සාර්ථක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ලෙස කර ගෙන යාම පිළිබඳව ප්‍රශ්නය සළකා බැලීමට පවා නොහැකිය.

'පොද් ස්නාමෙනෙම් මාක්සිස්මා' සඟරාව භාරගෙන තිබෙන ද්‍රව්‍යවාදය සහ මාක්ස්වාදය ආරක්ෂා කිරීමටද මෙය බලපායි. වාසනාවකට මෙන් රුසියාවේ දියුණු සමාජයීය චින්තනයේ ප්‍රධාන ප්‍රවණතාවයන්වලට ස්ථිර ද්‍රව්‍යවාදී සම්ප්‍රදායයක් ඇත්තේය. ගි. ව. ප්ලෙහානව් හැරුණු විට, සමකාලීන නරෝද්නිවරුන් (ජනතා සමාජවාදීන්, එස්-එර්වරුන් ආදී) යුරෝපීය විද්‍යාවේ ඊනියා නවීන පන්නය නැමැති සරුව පිත්තල බොරු අහංකාරයේ සිරකරුවන් බවට පත්වී ප්‍රතිගාමී දර්ශනික දෘෂ්ටීන් සෙවීම පිණිස නිතර පාහේ අතහැර දමාගිය චෙර්නිෂෙව්ස්කි මතක් කිරීම වටී. මේ බොරු අහංකාරයට යටින් ධනපති පංතියට, ධනවාදී ප්‍රාග් විනිශ්චයට සහ ධනේශ්වර ප්‍රතිගාමිත්වයට දසකම් කිරීමේ යම්කිසි විවිධත්වයක් තෝරා බේරා ගැනීමට ඔවුහු අපොහොසත් වී ඇත්තාහ.

කෙසේ වුවද, රුසියාවේ තවත් සෑහෙන කලක් යනතුරු කොමියුනිස්ට් නොවන කඳවුරේ ද්‍රව්‍යවාදීන් අපට තවමත් සිටී, නිසැක ලෙසම ඉදිරියටද එලෙසම සිටිනු ඇත. දර්ශනික ප්‍රතිගාමිත්වයට විරුද්ධවම සහ ඊනියා උගත් සමාජයේ දර්ශනික ප්‍රාග් විනිශ්චයන්ට විරුද්ධව සටන් කිරීම පිණිස එක්සත් වැඩවලදී ස්ථිර හා සටන්කාමී ද්‍රව්‍යවාදයේ සියලු අනුගාමිකයින්ගේ ආධාරය ලබා ගැනීම අපේ නිරපේක්ෂ කාර්යය වන්නේය. සමකාලීන සමාජයේ දර්ශනය පිළිබඳ මහාචාර්යවරුන්ගේ බහුතරය ඇත්ත වශයෙන්ම, පූජක තන්ත්‍රයට බැල මෙහෙවර කරන්නන් මිස වෙනත් අයවලුන් නොවෙතියි ඩිට්ස්ගෙන්, (ජෝෂප්) කී විට ඔහු ධනපති රටවලට බලපාන දර්ශනික ප්‍රවණතාවයන් ගැන මූලික මාක්ස්වාදී මතය උචිත ලෙසත්, පැහැදිලි ලෙසත් ප්‍රකාශ කළේය. (ඔහු, ව්‍යාජ උසස්කම් දක්වන, එමෙන්ම ව්‍යාජ සාර්ථකත්වයක් දක්වන ඔහුගේ ලේඛක පුත්‍රයා සමග පටලවා නොගත යුතුය).

අපේ රුසියානු බුද්ධිමත් පංතියද, අනිකුත් සියලු රටවල සිය සෝවුරන් මෙන්ම, තමන් දියුණු යැයි සිතීමට කැමතිය. ඩිට්ස්ගෙන්ගේ වචන වලින් ප්‍රකාශවන මතයේ තත්ත්වයට ප්‍රශ්නය ඇද දැමීමට කොහෙත්ම කැමති නැත. ඔවුහු සත්‍යයට මුහුණ දීමට අකමැති නිසා එලෙස විරුද්ධ වෙති. ඩිට්ස්ගෙන්ගේ පරුෂ විස්තරය සම්පූර්ණයෙන්ම නිවැරදි බව තේරුම් ගැනීමට නම්, සමකාලීන උගත් මිනිසුන් ධනපතීන්ගේ පාලනයට රාජ්‍යමය, පොදු ආර්ථික සමාජමය හා අනික් හැම අතින්ම පරාධීන බව යම්තමින් හෝ කල්පනා කළ යුතුය. ධනපති පංතියේ පංතිමය වුවමනාවන් සහ පංතිමය තත්ත්වය අතර ඇති සම්බන්ධකම්

ගැන අදහසක් දැන ගැනීමටත්, එක් අතකින් එය සියලු ආගම් වලට ආධාර කිරීම සහ අනිත් අතින් එහි විලාසිතා දෘෂ්ටිමය හරයන්ට ආධාර කිරීම ගැන දැන ගැනීමටත්, නිදසුනක් වශයෙන් රේඩියම් සොයා ගැනීමට සම්බන්ධ දර්ශනයන්ගෙන් පටන් ගෙන, දැන් අයින්ස්ටයින්ගේ කලිසම ඇල්ලීම දක්වා වූ සියලු දර්ශනයන් සහිත යුරෝපීය රටවල බොහෝ විට පැන නගින හැඩකාර දර්ශනික ප්‍රවණතා ගැන මතක් කිරීම වටනේය.

සටන්කාමී ද්‍රව්‍යවාදී සඟරාවක් හැටියට ප්‍රකාශ කරන සඟරාවක්, ප්‍රථම කොටම සටන්කාමී විය යුතුය. පූජක තන්ත්‍රයට බැල මෙහෙවර කරන සියලු සමකාලීන උපාධිධරයන්, ඔවුන් නිල විද්‍යාවේ නියෝජිතයින් හැටියට පෙනී සිටියා හෝ ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශිකයින් නැතිනම්, දෘෂ්ටිමය සමාජවාදී ප්‍රකාශකයින් ලෙස ස්වාධීනව පෙනී සිටියා හෝ, ඔවුන් සියල්ල ස්ථිර ලෙසම හෙළිදරව් කළ යුතුය, චෝදනා එල්ල කළ යුතුය.

දෙවනුව, එවැනි සඟරාවක් සටන්කාමී ලෙස අනීශ්වරවාදී විය යුතුය. මේ කටයුතු භාරව වැඩ කරන දෙපාර්තමේන්තු නැතිනම්, යටත් පිරිසෙයින් සංස්ථා අපට ඇත්තේය. එහෙත් මේ වැඩ ඉතා අලස ලෙසත්, අතිශයින්ම අසතුටුදායක ලෙසත් කරනු ලැබේ. පැහැදිලිව පෙනෙන හැටියට අපේ සැබෑ රුසියානු (සෝවියට් වුණද) නිලධාරිවාදයේ පොදු තත්ත්වයන්ගෙන් එය පෙළෙයි. ඒ නිසා, මේ රාජ්‍ය සංස්ථාවල වැඩවලට අමතරව, එම වැඩ උසස් කිරීම සහ ඒවාට ජීවය ලබාදීම සඳහා, සටන්කාමී ද්‍රව්‍යවාදය ප්‍රචාරය කිරීම සිය අරමුණ කර ගෙන සිටින සඟරාවක්, අප්‍රතිහත ධෛර්යයකින් යුතුව, අනිශ්වර ප්‍රචාරයක් ගෙන යා යුතුය, අප්‍රතිහත ධෛර්යයකින් යුතුව අනීශ්වර සටනක් කළ යුතුය. මේ විෂය ගැන සියලු භාෂාවලින් පළවන සාහිත්‍යය කෙරෙහි සැලකිලි දැක්විය යුතුය. මේ ක්ෂේත්‍රයේ වැදගත් හැම දෙයක්ම, පරිවර්තනය කළ යුතුය, නැතිනම් යටත් පිරිසෙයින් විමර්ශනයට භාජනය කළ යුතුය.

එංගල්ස් බොහෝ කලකට පෙර, දහඅටවැනි සියවසරේ සටන්කාමී අනීශ්වර සාහිත්‍ය පරිවර්තනය කොට විශාල වශයෙන් ජනතාව අතර බෙදහරින ලෙස සමකාලීන නිර්ධන පංතික නායකයින්ට උපදෙස් දුන්නේය.[74] අද වන තුරුත් අප මෙය කර නැත, එය අපේ ලජ්ජාවට හේතුවිය යුත්තකි (විප්ලවවාදී යුගයකදී බලය අල්ලා ගැනීම, මෙම බලය නිසිලෙස පාවිච්චි කිරීම දැනගන්නවාට වඩා වැඩියෙන් ලෙහෙසි බව ඔප්පු කරන එක් සාක්ෂියකි මේ). සමහර විට අපේ කුසීත බව, අක්‍රියාකාරිත්වය, අකාර්යක්ෂමතාවය, නිදසුනක් වශයෙන් දහඅට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වැනි සිය වසරේ පැරණි අනීශ්වර සාහිත්‍යය යල්පැන ගොස් ඇතැයිද, අවිද්‍යාත්මක සහ බොළඳ යැයිද ආදී වශයෙන් කියමින් "උදුර" හේතූන් පෙන්වා ඇඟ බේරා ගැනීමට ඉදිරි පත් වෙයි. මෙවැනි ව්‍යාජ-විද්‍යාත්මක විතණ්ඩවාදය තරම් නරක දෙයක් තවත් නැත. මෙය පණ්ඩිතමානී භාවයට නැතිනම්, මාක්ස්වාදය සම්පූර්ණයෙන්ම වටහා නොගැනීමට මෙය කඩතුරාවක් සේ සේවය කරයි. දහ අටවැනි සිය වසේ විප්ලවවාදීන්ගේ අනීශ්වරවාදී කෘතිවල බොහෝ අවිද්‍යාත්මක සහ බොළඳ දේ තිබෙන බව සත්‍යයකි. එහෙත් මෙම කෘති ප්‍රසිද්ධ කරන්නන්ට ඒවා සංක්ෂිප්ත කිරීමටද, දහ අටවැනි සිය වසරට ඉක්බිතිව මිනිස් සංහතිය ආගම් විද්‍යාත්මක ලෙස විවේචනය කිරීමේදී ලබා ගත් ජයග්‍රහණයන් ගැනද, මේ විෂය ගැන පළවී ඇති අළුත් සාහිත්‍ය ආදිය ගැනද සටහන් සහිත අනුලේඛ පළකිරීමට බාධාවක් නැත. මුළු මහත් සමකාලීන සමාජය විසින් අන්ධකාරයට, මුග්ධත්වයට සහ අවිචාර ලබ්ධියට භාජන කොට ඇති, කෝටි සංඛ්‍යාත ජනතාව (විශේෂයෙන්ම ගොවීන් සහ ශිල්පීන්) පරිශුද්ධ මාක්ස්වාදී අධ්‍යාපනයක් මගින් ඍජු ලෙසම මෙම අන්ධකාරයෙන් විමුක්තිය ලබතියි යම්කිසි මාක්ස්වාදියකු සිතන්නේ නම්, එය අති විශාල හා බරපතල වරදක් වන්නේය. මේ පොදු ජනතාවට අතිශයින්ම විවිධ අනීශ්වර ප්‍රචාරක සාහිත්‍ය සැපයිය යුතුය. ජීවිතයේ අතිශයින්ම විවිධ ක්ෂේත්‍රවල සත්‍ය කරුණු ඔවුනට සපයා දිය යුතුය. ඔවුන් සිය ආගමික නිද්‍රාවෙන් අවදි කරවනු සඳහාත්, අතිශයින්ම විවිධ කෝණයන් සහ අතිශයින්ම විවිධ ක්‍රම ආදිය මගින් ඔවුන් තුළ උනන්දුවක් ඇති කරවීම සඳහාත් ඔවුනට ළඟා විය යුතුය.

පැරණි දහ අටවැනි සිය වසරේ අනීශ්වරවාදීන්ගේ දක්ෂ, ජීවමාන කුසලතාවයෙන් හෙබි ලියවිලි උපහාසාත්මක ලෙසත්, විවෘත ලෙසත් බලයේ සිටින පූජක පංතියට පහර දෙනු ඇත. මිනිසුන් ගිලී සිටින ආගමික නිද්‍රාවෙන් ඔවුන් අවදි කරවනු වස්, ඉතා හොඳින් තෝරගත් කරුණු විදහා පෙන්වීමක් කිසිසේත්ම නොකරන මාක්ස්වාදයේ නීරස හා වියලි වාක්‍ය ඛණ්ඩ වලට වඩා මෙම අනීශ්වර සාහිත්‍යය දහස් වාරයක් වැඩියෙන් සේවය කරනු ඇත. අපේ සාහිත්‍යයේ මෙවැනි විදහා පෙන්වීම් (මෙම සත්‍යය සැඟවීමෙන් ඵලක් නැත) ඇතද, ඒවා නිතර පාහේ මාක්ස්වාදය විකෘති කරයි. මාක්ස් හා එංගල්ස්ගේ සියලු ප්‍රධාන කෘතීන්වල පරිවර්තන අපට ඇත්තේය. පැරණි අනීශ්වරවාදයට සහ පැරණි ද්‍රව්‍යවාදයට මාක්ස් හා එංගල්ස් විසින් සපයන ලද නිවැරදි කිරීම් ඒවාට අතිරේක ලෙස එකතු නොකරනු ඇතැයි බියවීමට හේතුවක් කොහෙත්ම නැත. ඉතාමත්ම වැදගත් දෙය (මාක්ස්වාදීන් යැයි කියාගන්නා, එහෙත් ඇත්ත වශයෙන්ම මාක්ස්වාදය විකෘති කරන අපේ කොමියුනිස්ට්වාදීන් විසින් නිතර නොසලකා හරිනු ලබන, දෙයක්වන) ආගම කෙරෙහි බුද්ධිමය ආකල්පයක් දක්වීම සහ ආගම බුද්ධිමත් ලෙස විවේචනය කිරීම සඳහා මෙතෙක් නොදියුණු බහු ජනතාව අවදි කරන්නේ කෙසේද යන්න දැනගැනීමය.

අනිත් අතින්, සමකාලීන විද්‍යාත්මක ආගම් විවේචකයින් දෙස බලන්න. මේ උගත් ධනපති ලේඛකයෝ ආගමික අවිචාර හැඟීම් ගැන ස්වයං නිෂ්ප්‍රභ කිරීම් එකතු කරති. එහෙත් එහිදී ඔවුහු ඉදිරිපත් කරන තර්ක අනුව ඔවුන් ධනවාදයේ දෘෂ්ටිමය වහලුන් හැටියටත්, "පූජක තන්ත්‍රයට බැල මෙහෙවරකම් කරන උපාධිධාරීන්" හැටියටත් වහාම හෙළිදරවු වෙති.

නිදසුන් දෙකක් ඉදිරිපත් කරමු. 1918 දී මහාචාර්ය ආර්. යූ. විප්පර් "ක්‍රිස්තියානි ධර්මයේ සම්භවය" ("පාරොස්" ප්‍රකාශක මන්දිරය, මොස්කව්) නමින් පොතක් පළ කළේය. සමකාලීන විද්‍යාවේ ප්‍රධාන ප්‍රතිඵල ගැන විස්තරයක් ඉදිරිපත් කරන මෙම පොතේ කතුවරයා පල්ලිය දේශපාලන සංවිධානයක් හැටියට පාවිච්චි කරන අවි වන, අවිචාර ලබ්ධියට හා රැවටීමට විරුද්ධව සටන් නොකර නිකම් ඉන්නවා පමණක් නොව, මෙම ප්‍රශ්න මග හරිනවා පමණක් නොව, තමා විඥානවාදයේ සහ ද්‍රව්‍යවාදයේ "අන්ත" දෙකටම විරුද්ධය යන සැබැවින්ම අමන සහ ඉතා ප්‍රතිගාමී අයිතියක් ඉදිරිපත් කරයි. ලෝකයේ හැමතැනම වැඩ කරන ජනතාව තලා පෙලා ධනපතීන් ලබාගන්නා රූබල් කෝටි සංඛ්‍යාවෙන් ආගම් වලට ආධාර කරන ධනපති පංතියේ පාලනයට මෙය නීච ලෙස සේවය කරයි.

සුප්‍රසිද්ධ ජර්මන් විද්‍යාඥ අර්තූර් ඩ්‍රෙව්ස් "ක්‍රිස්තු මිථ්‍යාව" නැමැති පොතින් ආගමික අවිචාරක හැඟීම් ප්‍රතික්ෂේප කරන අතර, ක්‍රිස්තුස්වහන් සේ කිසිකලෙක ජීවත් නොවූ බව පෙන්වන අතර, තම පොතේ අගට ආගමට පක්ෂව ලියුවේය. "දිනපතා වැඩෙමින් පවතින ප්‍රකෘතිවාදී ප්‍රවාහයට විරුද්ධව නැගී සිටීමෙහි සමත්", ප්‍රකෘතිමත් කරන ලද, පිරිසිදු කරන ලද, වඩාත් සියුම් ආගමකට ඔහු පක්ෂපාත වේ (හතරවැනි ජර්මන් මුද්‍රණය, 1910, 238 පිටුව). පැරණි දිරාපත් වුණු, ආගමික අවිචාර ලබ්ධිය වෙනුවට අළුත් වඩාත් නින්දිත සහ අපකීර්තිමත් අවිචාර ලබ්ධියක් ඉදිරිපත් කිරීමට සූරාකන්නන්ට විවෘත ලෙසම ආධාර කරන එළිපිටම කතා කරන විඥත ප්‍රතිගාමියෙකු අප ඉදිරිපිට සිටී.

ඩ්‍රෙව්ස්ගේ පොත් පරිවර්තනය නොකළ යුතුයැයි මින් අදහස් නොකෙරේ. ඉන් තේරුම් යන්නේ, ධනපති පංති ප්‍රගතිශීලී කොටස්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමග එක්තරා දුරකට මිත්‍ර ගිවිසුමක් ඇති කැර ගන්නා අතර ඔවුන් ප්‍රතිගාමී වැරදි කරන විට, කොමියුනිස්ට්වාදීන් සහ සියලු ස්ථිර ද්‍රව්‍යවාදීන් විසින් ඔවුන් සම්පූර්ණයෙන්ම හෙළිදරව් කළ යුතුය, යන්නය. දහ අට වැනි සිය වසරේ පැවති ධනපති පංතිය සමග (— එවකට එම පංතිය විප්ලවවාදී විය —) මිත්‍ර ගිවිසුමක් ඇති කැර ගැනීමට අකැමැති වීම මාක්ස්වාදය සහ ද්‍රව්‍යවාදය පාවාදීමකට සමාන වන්නේය. මන්ද-යත්, ඩිරෙව්ස්ලා සමග එක් හෝ තවත් ආකාරයකින් සහ එක් හෝ තවත් අංශයකින් 'මිත්‍ර ගිවිසුමක්' ඇති කැර ගැනීම දූනට බලපාන ආගමික අන්ධකාරයට විරුද්ධව ගෙන යන අරගලයට අවශ්‍ය වන බැවිනි.

සටන්කාමී ද්‍රව්‍යවාදයේ සහරාවක් වන ''පොද් ස්නාමෙනෙම් මාක්සිස්මා'' සිය පිටුවලින් සෑහෙන කොටසක් අනීශ්වර ප්‍රචාරය සඳහාත්, මේ විෂය ගැන සාහිත්‍ය විවේචනය සඳහාත්, මේ ක්ෂේත්‍රයේ ආණ්ඩුවේ වැඩවල ඇති අති විශාල අඩුපාඩුකම් නිවැරදි කරවීම සඳහාත් යෙදවිය යුතුය. සමකාලීන ධනපති පංතියේ පංති වුවමනාවන් සහ පංති සංවිධාන ආගමික සංස්ථා සහ ආගමික ප්‍රචාරය සමග සම්බන්ධ වී ඇති සැටි පෙන්වන ස්ථිරසාර සාධක සහ සන්සන්ධනයන් අඩංගු පොත් සහ කුඩා පොත් පාවිච්චි කිරීම විශේෂ වැදගත් කමක් දරයි.

ඇමෙරිකා එක්සත් ජනපදයේ නිල හා රාජ්‍යමය වශයෙන් ආගම හා ප්‍රාග්ධනය අතර ඇති සම්බන්ධකම් අඩුවෙන් පෙන්වන සියලු සංඛ්‍යා සහ වාර්තාදිය ඉතා අගනේය. එහෙත් ඒ අතරම, ඊනියා සමකාලීන ප්‍රජාතන්ත්‍රවාදය (ඉතා අහේතුක ලෙස මෙන්ෂෙවිකයින්, එස්ආර්වරුන් සහ අඩ වශයෙන් අරාජිකවාදීන් විසින් වඳිනු ලබන) අන් කිසිවක් නොව ධනවාදයට වාසි සහගත හැම දෙයක්ම ප්‍රචාරය කිරීමේත්, එනම්, අන්ත ප්‍රතිගාමී අදහස්, ආගම, ඥාන ශූන්‍යවාදය, සූරාකන්නන් ආරක්ෂා කිරීම ආදිය දේශනා කිරීමේත් නිදහස වන්නේය.

සටන්කාමී ද්‍රව්‍යවාදී සහරාවක් ලෙස ක්‍රියාකිරීමට බලාපොරොත්තු වන මෙම සහරාව, කිසියම් පාඨක කවයකට යෝග්‍ය සාහිත්‍ය මොන-වාද, කිනම් අංශයෙන් එය සුදුසු වන්නේද යන්න සටහන් කිරීම සහ අප රටේ පළකර තිබෙන සාහිත්‍ය මොනවාද (හොඳ පරිවර්තන ගැන පමණක් දූන්විය යුතුය. ඒවා එතරම් විශාල සංඛ්‍යාවක් නොමැත) පළකිරීමට බලාපොරොත්තු වන සාහිත්‍ය මොනවාද යන්න ගැන පාඨකයින්ට දන්වනු ඇතැයි අපි බලාපොරොත්තු වමු.

කොමියුනිස්ට් පක්ෂයට අයත් නොවන ස්ථිර ද්‍රව්‍යවාදීන් සමග ඇති මිත්‍රත්වයට අමතරව සටන්කාමී ද්‍රව්‍යවාදය, ද්‍රව්‍යවාදය දෙසට

නැඹුරු වී ඇති, ඊනියා උගත් සමාජයේ විඥානවාදයට සහ අඥෙයවා-දයට අයත් දර්ශනික මංමුළාවීම්වලට විරුද්ධව, ද්‍රව්‍යවාදයට පක්ෂ සහ එය දේශනා කරන සමකාලීන ප්‍රකෘති විද්‍යාඥයින් සමග මිත්‍රත්-වයක් ඇතිකැර ගැනීම ද්‍රව්‍යවාදය විසින් කළ යුතු වැඩ සඳහා නොඅඩු නැතිනම් වඩාත් වැඩි වැදගත්කමක් ඇත්තකි.

''පොද් ස්නාමෙනෙම් මාක්සිස්මා'' අංක 1—2 සහරාවල පළවුණු, අයින්ස්ටයින්ගේ සාපේක්ෂතා න්‍යායය පිළිබඳ ඒ තිමිරියාසෙව්ගේ ලිපිය මේ දෙවැනි මිත්‍රත්වය ඇති කැර ගැනීමට සහරාව සමත් වෙතියි යන විශ්වාසයක් අප තුළ ඇති කරවයි. මේ සඳහා වැඩි සැලකිල්ලක් දූක්විය යුතුය. සමකාලීන ප්‍රකෘති විද්‍යාව මුහුණ පාන තියුණු ඉමහත් කම්පාවන් විසින් ප්‍රතිගාමී දර්ශනික නිකාය වලටද, සුළු නිකාය වලටද, ප්‍රවණතාවලට සහ සුළු ප්‍රවණතාවලටද ඉඩ කඩ ලබා දෙන බව මතක තබා ගත යුතුය. එනිසා ප්‍රකෘති විද්‍යාවේ මෑත විප්ලවය විසින් ඉදිරිපත් කරන ලද ගැටළු ගැන විමසිල්ලෙන් නොසිටින්නේ නම්, දර්ශනික ප්‍රශ්න හදාරන සහරාවක වැඩවලට ප්‍රකෘති විද්‍යාව ඇද ගන්නේ නැති-නම්, සටන්කාමී ද්‍රව්‍යවාදයට සටන්කාමී වීමටත්, ද්‍රව්‍යවාදී වීමටත් නොහැකි වනු ඇත. තිමිරියාසෙව් කියන පරිදි අයින්ස්ටයින්ගේ න්‍යායය ද්‍රව්‍යවාදයේ මූලික පදනම් වලට ක්‍රියාකාරී ලෙස පහර නොදෙතියි ඔහු එම සහරාවට ලියූ ලිපිය මගින් නිරීක්ෂණය කරයි. මේ න්‍යායය ලෝකයේ බොහෝ රටවල විශාල සංඛ්‍යාවක් ධනවාදී බුද්ධිමත්හු දූඩි කොට ගෙන සිටිති. මෙය බලපාන්නේ අයින්ස්ටයින්ට පමණක් නොවේ, දහ නව වැනි සිය වසරේ අගභාගයේ සිට ප්‍රකෘති විද්‍යාවේ මහා සංසෝධකයින්ගෙන් එක් සංඛ්‍යාවකට නැතිනම්, බහුතරයට මෙය බලපා යි.

මෙම ප්‍රපංචය කෙරෙහි අප දක්වන ආකල්පය දේශපාලනමය විඥාන-කයක් නිසා, කිසිදු ප්‍රකෘති විද්‍යාවක් හෝ කිසිදු ද්‍රව්‍යවාදයක් හෝ ස්ථිර දර්ශනික පදනමක් මත නොපිහිටන්නේ නම්, ඒවාට ධනවාදී මතවල ප්‍රහාරයට සහ ධනවාදී ජගත් දෘෂ්ටියේ ප්‍රකෘතිමත් කිරීමකට විරුද්ධව ආරක්ෂා විය නොහැකිය. මේ අරගලයේදී තම තත්ත්වය ආරක්ෂා කර ගෙන, එය ජයග්‍රාහී අවසානය දක්වා ගෙනයාමට නම්, ප්‍රකෘති විද්‍යාඥයා සමකාලීන ද්‍රව්‍යවාදියකු විය යුතුය, මාක්ස් විසින් නියෝජනය කරන ද්‍රව්‍යවාදයේ විඥානක පාක්ෂිකයකු එනම්, දයලෙ-ක්තික භෞතිකවාදියකු විය යුතුය. මෙම අරමුණ සපුරා ලීම සඳහා, මාක්ස් විසින් ව්‍යවහාරික ලෙස ප්‍රාග්ධනයේ සහ ඔහුගේ ඓතිහාසික හා දේශපාලනමය කෘතීන්වලට යෙදවූ දයලෙක්තිකය, ද්‍රව්‍යවාදී මතයෙහි පිහිටාලූ හෙගේලියානු දයලෙක්තිකය, ක්‍රමානුකූලව අධ්‍යයන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කිරීම පිණිස ''පොද් මාක්සිස්මා සඟරාවට'' ලිපි සපයන්නෝ කටයුතු කළ යුත්තාහ. ඔහු මේ දයලෙක්තිකය කෙතරම් සාර්ථක ලෙස ක්‍රියාවට යෙදවීදයත්, අද දිනපතාම පාහේ නැගෙනහිර (ජපානය, ඉන්දියාව සහ චීනය) අළුත් පංති, එනම් කෝටි සංඛ්‍යාත ජනකායක් ජීවිතය සහ සටන් සඳහා නැගිට සිටිති. මේ ජනතාව ලෝක ජනගහණයේ අති විශාල සංඛ්‍යාව නියෝජනය කරන අතර මොවුන්ගේ ඓතිහාසික නිෂ්ක්‍රීයත්වය සහ ඓතිහාසික නිද්‍රාව විසින් මෙතෙක් කල් යුරෝපයේ දියුණු රටවල පල්වීමක් හා දිරාපත්වීමක් ඇති කැරිණි. හැමදම නව ජනතාවන්ගේ සහ නව පංතීන්ගේ අවධිවීම මාක්ස්වාදය වැඩි වැඩියෙන් සනාථ කරයි.

සත්තකින්ම හෙගේලියානු දයලෙක්තිකය අධ්‍යයනය කිරීම, එයට අර්ථ නිරූපනයක් දීම, එය ප්‍රචාරය කිරීම ඉතා අමාරුය. මේ අංශයේ කරන මූලික පර්යේෂණ වලදී නිසැක ලෙසම අත් වැරදි සිදුවනු ඇත. එහෙත් කිසිවක් නොකරන එකකු පමණක් වැරදි නොකරයි. හෙගේලියානු දයලෙක්තිකය ද්‍රව්‍යවාදී ලෙස අවබෝධ කැරගෙන මාක්ස් විසින් යොදන ලද ව්‍යවහාරික ක්‍රමය අපේ පදනම හැටියට ගෙන, අප විසින් සියලු අංශයන්හී මේ දයලෙක්තිකය විස්තාරණය කළ යුතුය, හෙගෙල්ගේ ප්‍රධාන කෘතීන් වලින් කොටස් සඟරාවේ මුද්‍රණය කළ යුතුය, ඒවාට ද්‍රව්‍යවාදී අර්ථ කථනයක් සැපයිය යුතුය, මාක්ස් දයලෙක්තිකය භාවිතා කළ ආකාරය පෙන්වන නිදසුන්ද, මෑත ඉතිහාසය විශේෂයෙන්ම සමකාලීන අධිරාජ්‍යවාදී යුද්ධය සහ විප්ලවය විසින් අසමාන්‍ය බහුලත්වයකින් සපයන ආර්ථික සහ දේශපාලනත්වය සම්බන්ධකම්වල ක්ෂේත්‍රයන්හී දයලෙක්තික නිදසුන්ද ආධාර කොට ගෙනැ ඒවා විමර්ශනය කළ යුතුය. මගේ අදහස අනුව, 'පොද් ස්නාමෙනෙම් මාක්සිස්මා සඟරාවේ' කතුවරුන් සහ ලිපි සපයන්නන් ගෙහේලියානු දයලෙක්තිකයේ ද්‍රව්‍යවාදී මිත්‍රයින්ගේ සංගමයක් වැනි සංවිධානයක් විය යුතුය. ප්‍රකෘති විද්‍යාවේ විප්ලවය විසින් ඉදිරිපත් කැරැ ඇති සහ ධනපති විලාසිතාවලට ගරුකරන බුද්ධිමතුන් ප්‍රතිගාමීත්වය වෙතට ''ඇදගන්නාවූ'', දර්ශනික ගැටළු වලට පිළිතුරු මාලාවක්ම ද්‍රව්‍යවාදී ලෙස අර්ථ නිරූපණය කළ, හෙගේලියානු දයලෙක්තිකයෙන් සමකාලීන ප්‍රකෘති විද්‍යාඥයින්ට (ඔවුන් එය සොයා ගන්නා සැටි දනිති නම්, ඔවුනට අධාර කරන සැටි අපි ඉගෙන ගනිමු නම්), සොයාගත හැකි වන්නේය.

මේ සඟරාව මෙවැනි අරමුණක් තමා ඉදිරියෙහි තබාගෙන එය සපුරාලනු වස් ක්‍රමවත් ලෙස ක්‍රියා නොකරන්නේ නම්, ද්‍රව්‍යවාදයට සටන්කාමී ද්‍රව්‍යවාදය විය නොහැකිය. එසේ ෂෙද්රින්ගේ ප්‍රකාශනය මෙන්, සටන්කාමියා නොව සටන් කරන ලද්දක් වීමට ඉඩ ඇත. මෙය රහිතව, සුප්‍රසිද්ධ ප්‍රකෘති විද්‍යාඥයින් මෙතෙක් කල් සිදුවූ පරිදි, සිය දර්ශනික නිගමනයන් සහ සාමාන්‍යකරණයන් වලදී අසරණයින් වනු ඇත. මන්දයත්, ප්‍රකෘති විද්‍යාව ඉතා ඉක්මණින් දියුණුවන බැවින් සහ සියලු ක්ෂේත්‍රවල එය ගැඹුරු විප්ලවයකට ගොදුරු වන බැවිනි, එයට කොහෙත්ම දර්ශනික නිගමන වලින් ඈත් විය නොහැකි බැවිනි.

අවසාන වශයෙන්, දර්ශන විද්‍යාවට කොහෙත්ම සම්බන්ධ කමක් නැති එක් නිදසුනක් ඉදිරිපත් කරමි. එහෙත් කෙසේ හෝ එය ''පොද් ස්නාමෙනෙම් මාක්සිස්මා'' සඟරාවේ අවධානය යොමු විය යුතු සමාජමය ප්‍රශ්නයකි.

එය සමකාලීන ව්‍යාජ විද්‍යාව ඉතා නීච සහ අපකීර්තිමත් ප්‍රතිගාමී මතවලට වාහකයෙකු හැටියට සේවය කරන සැටි පෙන්වන නිදසුනකි.

රුසියානු තාක්ෂණික සංගමයේ XI වැනි දෙපාර්තමෙන්තුව විසින් පළ කරන ලද ''එකොනොමිස්ට්'' අංක 1 (1922) සඟරාව[75] මෑතකදී මවෙත එවා තිබිණි. මෙම සඟරාව මවෙත එවූ තරුණ කොමියුනිස්ට්වාදියා (ඔහුට එය කියවීමට වේලාවක් නොතිබුනා විය හැකිය) අප්‍රවේසම්කාරී ලෙස සෑහෙන තරමින් එය සමග එකඟත්වයක් පළකළේය. එහෙත් ඇත්ත වශයෙන්ම මෙම සඟරාව, සත්තකින්ම විද්‍යාවේ සහ ප්‍රජාතන්ත්‍රවාදය ආදියේ සළුවකින් වෙස් මාරු කරගත් සමකාලීන රදළයින්ගේ (කොතරම් දුරට වුවමනාවකින් එසේ කරතිදැයි මට කිව නොහැකිය) හොරණෑවකි.

පී. ඒ. සරෝකින් නැමැති මහත්මයෙක් යුද්ධයේ බලපෑම මත විස්තීර්ණ ''සමාජ විද්‍යාත්මක'' විමසුමක් මෙම සඟරාව මගින් කරයි. මෙම විද්‍යාත්මක ලිපිය කතුවරයාගේ සහ ඔහුගේ අනල්ප සගයින්ගේ සමාජ විද්‍යාත්මක කෘතීන් පිළිබඳව, විද්‍යාත්මක ආශ්‍රෙයක් කරයි. ඔහුගේ විද්‍යා නිපුණත්වය පෙන්වන නිදසුනක් මෙන්න:

83 පිටුවෙන් මෙසේ කියැවෙයි:

''පෙත්රොග්‍රාඩ් නගරයේ සෑම විවාහයන් 10,000 කටම දූන් දික්කයාද 92.2 කි. මහ විනාශකාරී සංඛ්‍යාවකි. කවුගා දමන ලද සෑම විවාහ 100 කින් 51.1 වසරකට වඩා අඩු කාලයක් පැවති ඒවාය. සියයට 11 ක් මසකටත් වඩා අඩු කලක් පැවති විවාහයන්ය. සියයකට 22 ක් දෙමසකටත් වඩා අඩු කාලයක්ද, සියයට 41 මාස තුනක සිට මාස හයක් දක්වා කාලයක්ද, දක්වා පැවැති අතර මාස හයකට වඩා පැවති විවාහවල සංඛ්‍යාව සියයට 26 ක් පමණකි.සමකාලීන නීත්‍යානුකූල විවාහය යල්ලාලයින්ගේ කාමාශාවන් ''නීත්‍යනුකූල ලෙස'' සංසිඳුවා ගැනීමේ බාහිර-විවාහ ලිංගික සේවනයෙහි යෙදීමක් සඟවන ක්‍රමයක් බව මේ සංඛ්‍යා පෙන්වා දෙයි.'' (''එකොනොමිස්ට්'' අංක 1, 83 පිටුව).

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මේ සහරාව පළකරන සහ මෙවැනි කතාවලට ඉඩකඩ සපයන මේ මහත්වරුන් සහ රුසියානු තාක්ෂණික සංග මය තමන් ප්‍රජාතන්ත්‍රවාදයට පක්ෂපාත බව කියනවාට සැක නැත. එහෙත් ඔවුන් ඇත්ත වශයෙන්ම, එනම් රදළයින්, ප්‍රතිගාමීන් "පූජකතන්ත්‍රයට බැල මෙහෙවරකම් කරන උපාධිධාරීන්" යැයි කීවොත් ඔවුහූ එය ඔවුනට කරන ලද මහා නින්දවක් ලෙස සලකනු ඇත්තාහ.

විවාහය, දික්කසාදය, අවජාතක දරුවන් පිළිබඳව ධනපති රටවල නීති පද්ධති ගැන යම්තමින් හෝ හැදින ගැනීමක් සහ මෙම ක්ෂේත්‍රයේ සැබෑ තත්ත්වය ගැන දන්නා ඕනෑම කෙනෙකුට, සහ මෙම විෂය ගැන සැලකිල්ලක් දක්වන ඕනෑම කෙනෙකුට පෙනී යන කරුණක් නම්, සමකාලීන ධනපති ප්‍රජාතන්ත්‍රවාදය සහ අතිශයින්ම ධනපති ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩු පවා මෙම ප්‍රශ්නයේදී කාන්තාවන් වෙතද, විවාහයෙන් පරිබාහිරව උපදින ළමයින් වෙතද සැබවින් රදළවාදී ආකල්පයක් ප්‍රකාශ කරන බවය.

ප්‍රජාතන්ත්‍රවාදය ගැන සහ බොල්ෂෙවිකයින් ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කරන්නේ කෙසේද යන්න ගැන කෑගැසීමට මෙය, මෙන්ෂෙවිකයින්ටද, එස්ආර්වරුන්ටද, අරාජිකවාදීන්ගෙන් කොටසකටද, බටහිර එයට අනුරූපී පක්ෂවලටද බාධාවක් නොවේ. එහෙත් සැබවින්ම, විවාහය, දික්කසාදය සහ විවාහයට පිටින් උපදින ළමයින් පිළිබඳ ප්‍රශ්න අනුව,. ඉතා ස්ථිර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය, බොල්ෂෙවික් විප්ලවයයි. මේ ප්‍රශ්නය රටේ ජනගහණයෙන් හරි අඩකට වඩා වැඩි ජනකායකට ඉතා සෘජු ලෙසම බලපායි. මීට පෙර ධනපති විප්ලව කීපයක්ම ඇතිවුණද ඒවා ප්‍රජාතන්ත්‍ර වේශයෙන් පෙනී සිටියද, මේ ප්‍රශ්නයේදී ප්‍රතිගාමීත්වයට හා රදළවාදයට විරුද්ධවත්, පාලනය කරන සහ දේපල හිමි පංතිවල සාමාන්‍ය කපටි කෛරාටික කම්වලට විරුද්ධවත් තීරණාත්මක අරගලයක් ගෙන ගිය පළමු වැනි විප්ලවය බොල්ෂෙවික් විප්ලවයයි.

සෑම විවාහ 10,000 කින් 92 දික්කසාද වීම විනාශකාරී සංඛ්‍යාවක් ලෙස සරෝකින් මහතාට පෙනෙන්නේ නම්, කතුවරයා ජීවිතය ප්‍රකාරවලින් වට කරන ලද පූජකාරාමයක ඉපදී හැදී වැඩුණු බව කෙනෙකුට නිගමනය කළ හැකි වෙයි. එහෙත් එවැනි පූජකාරාමයක් කවරදක හෝ තිබුණු බව කිසිවකු විශ්වාස නොකරනු ඇත. එසේ නැතිනම් කතුවරයා ප්‍රතිගාමීත්වයේ සහ ධනපතීන්ගේ වුවමනාවන් සඳහා සත්‍යය විකෘති කරයි. ධනපති රටවල සමාජ තත්ත්වයන් ගැන යම්තමින් හෝ දන්නා හැම කෙනෙක්ම ඒ රටවල සැබෑ දික්කසාද වීම්වල සත්‍යමය සංඛ්‍යාව (සත්තකින්ම පල්ලිය හා නීතිය මගින් ස්ථිර නොකරන ලද) හැමතැනම ඉතා විශාල බව දනිති. මෙම ප්‍රශ්නයේදී රුසියාව හා අනිත් රටවල් අතර ඇති එකම වෙනස නම්, අපේ නීති ධනපති කුහකත්වය සහ කාන්තාව හා ළමයින් නින්දවට පත් කිරීම ශුද්ධවූ කාර්යයක් ලෙස ප්‍රකාශ නොකිරීමය. එහෙත් විවෘත ලෙස සහ ආණ්ඩුවේ නාමයෙන්, කුහකත්වයට සහ නින්දවට පත් කිරීමේ සියලු විධිවලට විරුද්ධව ක්‍රමානුකූල ලෙස යුද්ධ ප්‍රකාශ කර ඇත්තෙමු.

මාක්ස්වාදී සහරාව, උගත් සියලු රදළයින්ට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කළ යුතුය. ඔවුන්ගෙන් සෑහෙන සංඛ්‍යවකට, බොහෝ විට ආණ්ඩුවෙන් මුදල් ලැබෙනවා විය යුතුය, තරුණයින්ට අධ්‍යාපනයක් ලබා දීම සඳහා මොවුනට අපේ රජය රැකියා දී ඇත. බාලයන් සඳහාවූ අධ්‍යාපනික ආයතනවල විධායක ධූරයන් සඳහා කුප්‍රසිද්ධ අවවර්තිකයින් සුදුසු නොවන්නාසේම, මොවුන්ද මෙවැනි තනතුරු වලට කොහෙත්ම සුදුසු නොවේ.

රුසියාවේ කම්කරු පංතිය පාලන බලය දිනාගැනීමට සමත් වී ඇත; එහෙත් එය උපයෝගී කිරීමට එය තවමත් ඉගෙනගන නැත. නැතිනම් මීට බොහෝ කලකට පෙර මෙවැනි ගුරුවරුන් සහ උගත් සමාජවල සාමාජිකයින් ඉතා විනීත ලෙස ධනවාදී "ප්‍රජාතන්ත්‍රවාදී" රටවලට පිටත් කර හරිනු ඇත. එවැනි රදළයින්ට උචිත ස්ථාන විය යුත්තේ ඒ රටවල්ය.

ඉගෙන ගැනීමට අධිෂ්ඨානය තිබේ නම්, කම්කරු පංතිය ඉගෙන ගනු ඇත.

1922 මාර්තු 12 ද.

"පොද් ස්නාමෙනෙම් මාක්සිස්මා" අංක 3, 1922 මාර්තු.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, වෙළුම 45, පිටු 23-33.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දින පොතකින් පිටු

රුසියාවේ උගත්කම පිළිබඳ 1920 ජනගහණය පදනම් කැරගෙන පළ කරන ලද වාර්තාව (රුසියාවේ අකුරු උගත් අයගේ සංඛ්‍යාව 1922 මොස්කව්හි මහජන අධ්‍යාපන අංශයේ ප්‍රධාන සංඛ්‍යාත මණ්ඩලයේ වාර්තාව) ඉතා වැදගත් සිද්ධියකි.

1897 සහ 1920 වසර වලදී ජනගහණයේ උගත්කම පිළිබඳ තත්ත්වය පෙන්වා දෙන සටහනක් එම වාර්තාවෙන් මම පහත උපුටා දක්වමි:

LIBERATIONBASE

	පුරුෂයින්ගේ උගත් සංඛ්‍යාව දහසකට		ස්ත්‍රීන්ගේ උගත් සංඛ්‍යාව දහසකට		පොදු ජනගහණයේ උගත් සංඛ්‍යාව දහසකට	
	1897	1920	1897	1920	1897	1920
1. යුරෝපීය රුසියාව . .	326	422	136	255	229	330
2. උතුරු කොකේසියාව .	241	357	56	215	150	281
3. සයිබීරියාව (බටහිර) .	170	307	46	134	108	218
එකතුව	318	409	131	244	223	319

අප නිර්ධන පංතික සංස්කෘතිය ගැන දෙඩවමින් සහ එය ධනපති සංස්කෘතිය කෙරෙහි දක්වන ආකල්පය ගැන කතා කරමින් සිටි අතර, ධනපති සංස්කෘතිය අතින් බැලුවද අපේ තත්ත්වය ඉතා අයහපත් බව,

පෙන්වන සත්‍ය කරුණු හා දත්තයන් හෙළි වී ඇත. සර්වජන උගත්කමක් ඇති කිරීම අතින් අප තවමත් ඉතා පහත් තත්ත්වයක සිටීම සහ සාර්ගේ කාලය (1897) සමග එය සංසන්දනය කර බැලුවද අප ලබා ඇති දියුණුව ඉතා සෙමින් සිදුවී තිබීම මින් පෙනේ. නිර්ධන පංතික සංස්කෘතියේ ඉතා උසස් ස්වර්ගයක් ගැන කෑගසන අයට මෙය ඉතා දැඩි අනතුරු ඇඟවීමක් සහ දෙස් පැවරීමක් විය යුතුය. සාමාන්‍ය බටහිර යුරෝපීය සභ්‍ය රටක් ලබා ඇති තත්ත්වයක් දක්වා දියුණු වීමට වුවද, අප විසින් කළ යුතු මූලික වැඩ කටයුතු මොනවාද යන්න එය පෙන්වා දෙයි. සැබෑ සංස්කෘතික මට්ටමක් වැනි යමක් ඇති කැර ගැනීම පිණිස, අපේ නිර්ධන පංතික ජයග්‍රහණයන් පදනම් කැරගෙන අප විසින් කළ යුතු ඉතා විශාල වැඩ කටයුතු එය පෙන්වා දෙයි. එහෙත් මේ තර්කවිරහිත නමුදු අධි න්‍යායික ප්‍රස්තුතයට අප සීමා නොවිය යුතුය. අපේ ත්‍රෛමාසික අය වැය ලේඛනය ගැන මීළඟ වාරයේදී අප සාකච්ඡා කරන විට, මේ ප්‍රශ්නය ගන සලකා බලා ඊට සුදුසු ප්‍රායෝගික පියවරයන්ද ගත යුතුය. පළමුකොටම අධ්‍යාපන මහජන කොමසාරිස් අංශය හැරුණු විට අනිකුත් සියලු ආණ්ඩුවේ අමාත්‍යාංශවල වියදම් අඩු කළ යුතුය. මෙසේ ඉතිරි කැර ගන්නා මුදල් අධ්‍යාපන අංශයේ අවශ්‍යතාවයන් සඳහා යෙදවිය යුතුය. ආහාර සැපයීම අතින් සාපේක්ෂ වශයෙන් සතුටුදයක මෙම වසරේදී, ගුරුවරුන්ගේ ආහාර සලාකය වැඩිකිරීමේදී අපි අකමැත්තක් නොදක්විය යුතු වෙමු.

පොදුවේ කතා කරන විට, දැනට මහජන අධ්‍යාපන ක්ෂේත්‍රයේ අප කරන වැඩ ඉතා පටුයැයි කිව නොහැකිය. පැරණි ගුරුවරුන් ඔවුන්ගේ පැරණි ලෝකයෙන් එළියට ඇද දැමීම පිණිසත්, අළුත ප්‍රශ්න වලට ඔවුන්ගේ සිත් යොමු කරවනු පිණිසත්, අළුත් අධ්‍යාපන විධි ගැන සහ ආගම වැනි ප්‍රශ්න කෙරෙහි ඔවුන්ගේ සිත් ඇද ගැනීම පිණිසත් වැඩ බොහොමයක් කර ඇත.

එහෙත් අපි ප්‍රධාන දෙය කර නැත්තෙමු. නිර්ධන පංතික හෝ ඒවා යටත් පිරිසෙයින් ධනවාදී හෝ වේවා සංස්කෘතියක් අපට අවශ්‍ය නම්, එයට නිරපේක්ෂ වශයෙන් අවශ්‍ය මට්ටමට පාසල් ගුරුවරයා නංවා සිටුවීමෙහිලා අප කිසිවක් කර නැත, නැතිනම් කොහෙත්ම ප්‍රමාණවත් නොවන වැඩ කොටසක් කර ඇත. අප තවමත් අර්ධ — ආසියාතික අඥාන බවෙන් මිදී නැති බව මතක තබා ගත යුතුය. ඉමහත් පරිශ්‍රමයන්ගෙන් තොරව අපට මින් මිදීමට නොපුළුවන. එහෙත් ඉන් මිදීමට සෑම අවස්ථාවක්ම අපට ඇත. මන්දයත් අප රටේ තරම් අන් කිසිම රටක බහුජනතාව සැබෑ සංස්කෘතිය කෙරෙහි ඉමහත් ආශාවක් නොදක්වන බැවිනි. සංස්කෘතික ප්‍රශ්න අප රටේ තරම් ස්ථිර ලෙසත්,

https://liberationbase.wordpress.com

ක්‍රමාණුකූල ලෙසත්, අන් කිසිදු රටක විසඳා නැති බැවිනි. වෙනත් කිසිම රටක රාජ්‍ය බලය කම්කරු පංතිය සතු වී නැත. මේ කම්කරු බහු ජනතාව සිය අඩු පාඩුකම් ගැන ඉතා හොඳින් දනිති. සංස්කෘතිය ගැන නොව මෙහිදී උගත්කම ගැන මතක් කළ යුතුය. අප රටේ තරම් වෙනත් කිසිම රටක කම්කරු පංතියක් තම තත්තවය මේ ක්ෂේත්‍රයේ දියුණු කැර ගැනීම සඳහා පරිත්‍යාග කිරීමට සූදනම් නැත. ඔවුහු එලෙසම පරිත්‍යාග කරති.

මහජන අධ්‍යාපනයේ මූලික අවශ්‍යතාවයන්ට සරිලන සේ, මුල් පියවරක් වශයෙන් අපේ අය වැය ලේඛනය සකස් කිරීමට අද වන තුරු වුවද කර ඇත්තේ ඉතා ස්වල්පයකි. අධ්‍යාපනය පිළිබඳ අපේ මහජන කොමසාරිස් මණ්ඩලයේ පවා රාජ්‍ය ප්‍රකාශන සංස්ථාවල නින්ද සහගත ලෙස නුවමනා සේවකයින්ගෙන් කාර්ය මණ්ඩල පිම්බී පිරී පවතී. මෙය රජයේ සංකල්පයට සම්පූර්ණයෙන්ම පටහැනි වූවකි. අපේ ප්‍රධාන කාර්යය විය යුත්තේ ප්‍රකාශන මන්දිර නොව, ඒවායින් නිකුත් කරන පොත් කියවීමට මිනිසුන් ඇති කර ලීමය. කියවීමට දත් අයගේ සංඛ්‍යාව වැඩි කළ යුතුය. එවිට අනාගත රුසියාවේ පොත් ප්‍රකාශනය සඳහා පුළුල් දේශපාලන ක්ෂේත්‍රයක් ඇති වන්නේය. අපේ පැරණි හා (නරක) පුරුද්ද නිසා කාර්මික ප්‍රශ්න ගැන අපි තවමත්, වැඩි කාලයක් සහ වැඩි පරිශ්‍රමයක් යොදවමු. ජනතාව අතර උගත්කම වැනි සාමාන්‍ය දේශපාලන ප්‍රශ්නයකට, පොත් ප්‍රකාශ කිරීම වැනි ප්‍රශ්න ගැන, එලෙස සැලකීම එක් නිදසුනකි.

ග්ලාව්ප්‍රොපොබ්ර්[76] (මධ්‍යම වෘත්තීය-අධ්‍යාපනික මණ්ඩලය) ගෙන බැලුවහොත්, එහිද වුවමනාවට වඩා වැඩි පිම්බීමක් තිබෙන අංශ දැකීමටද, මහජන අධ්‍යාපන මණ්ඩලයේ වුවමනාවන්ට කිසිසේත්ම නොගැලපෙන අවශ්‍යතාවයන් දැකීමටද අපට පිළිවන. ග්ලාප්‍රොපොබ්ර්හි තියෙන හැම දෙයක්ම කම්හල්වල වැඩ කරන තරුණ කම්කරුවන්ගේ අධ්‍යපනයේදී ප්‍රායෝගික නැඹුරුවක් ඇති කිරීම සහ පළමු කොටම උසස් කිරීම සඳහා නීති සහගත අභිප්‍රයයක් සාධාරණ යැයි පෙන්වා දෙන දේ නොවන බව අපට පෙනේ. ග්ලාව්ප්‍රොපොබ්ර් සේවක මණ්ඩලය අපි ප්‍රවේසම් සහිතව පරීක්ෂණයට භාජනය කරමු නම්, මෙය නුවමනා සේවකයින්ගෙන් පිම්බී තිබෙන බවත්, මෙහි තිබෙන සියලු ව්‍යාජ දේ නැති කර දැමිය යුතු බවත් අපට පෙනේ. ජනතාව අතර උගත්කම පැතිරවීම සඳහා නිර්ධනීන්ගේ සහ ගොවීන්ගේ රජයේ අරපරිස්සමක් ඇති කිරීමට කළ යුතු දෑ බොහෝය; අර්ධ කුලීන වර්ගයට අයත් ආයතනද, සංඛ්‍යා ලේඛන වලින් හෙළි කළ පරිදි, මිනිසුන් අතර පවතින උගත්කමේ මට්ටම කල්පනාවට ගෙන,

අපට තවම අවශ්‍ය නැති, ඉදිරියටත් එසේම අවශ්‍ය නොවන, දීර්ඝ කාලයකට අවශ්‍ය නොවන දේ ලෙස බැහැර කළ යුතු, ආයතන වසා දැමිය යුතුය.

ධනපති සමාජය තුළ කිසි කළෙක නැගිය නොහැකි, එලෙසම නැගීමට බැරි, උසස් තත්ත්වයත් දක්වා අපේ මහජන ගුරුවරයාව උසස් කළ යුතුය. යථාර්ථයක් වන මෙය ඔප්පු කිරීම අවශ්‍ය නැත. ගුරුවරයා උසස් සංස්කෘතික මට්ටමක් දක්වා නංවා ලීමටත්, ඔහු දරන උසස් පදවියට සරිලන සේ ඔහු පුහුණු කිරීමටත්, ප්‍රධාන, ප්‍රධාන හා ප්‍රධාන වශයෙන් ඔහුගේ තත්ත්වය ද්‍රව්‍යමය වශයෙන් යහපත් කැර ලීමටත් ස්ථිර ලෙසත් ක්‍රමානුකූල ලෙසත් එමෙන්ම නොකඩවාත් අපි ක්‍රියා කළ යුතු වෙමු.

ගුරුවරයා ධනපති ක්‍රමයේ පවුරෙන් මෑත් කොට සෝවියට් ක්‍රමයේ ආරක්ෂක පවුර හැටියට පත් කරලීම සඳහාත්, ඔවුන්ගේ මාර්ගයෙන් ගොවීන් ධනපතීන් සමග සම්බන්ධකම් ඇති වීමෙන් වලක්වාලීම සඳහාත්, ගොවීන් ගුරුවරුන්ගේ මාර්ගයෙන් නිර්ධන පංතියේ මිතුරන් බවට පත් කරලීම සඳහාත්, ගුරුවරුන් සංවිධානය කිරීමට අප දරන ප්‍රයත්නය ක්‍රමානුකූල ලෙස වැඩි කළ යුතුය. එකක් නැර සියලු ධනපති රටවල ගුරුවරු තවමත් ධනපති ක්‍රමයේ පවුරු බවට පත් වී සිටිත්.

නිතිපතාම ගම්වලට යාමේ විශේෂ වැදගත්කම ගැන කෙටියෙන් අවධාරණය කිරීමට මා කැමතිය. මෙවැනි ගමන් දැනටමත් කෙරෙන බව සත්‍යයකි. එහෙත් මෙවැනි ගමන් නිතිපතාම වැඩි කළ යුතුය. අප මෙහිදී මුදල් වියදම් කිරීමට මැලි නොවිය යුතුය. ගෙවී ගිය ඓතිහාසික යුගයේ නිෂ්පාදනයක් වන රාජ්‍ය යන්ත්‍රය සඳහා අපි නිතර තේරුම් රහිතව මුදල් වියදම් කරමු.

1922 දෙසැම්බර් මාසයේදී පැවැත්වීමට නියමිත සෝවියට් සභාවල සමුළුව ඉදිරියේ මගේ කතාව සඳහා නාගරික කම්කරුවන් ගම්බද මිනිසුන් මත දරන අනුශාසනය ගැන විස්තර දත්තයන් මම එකතු කළෙමි. මේ ගැන සමහර දත්තයන් මට ඡහදරොව්ස්කි සහෝදරයා සපයා දුන්නේය. සෝවියට් සභාවල සමුළුවේදී මට ඒ ගැන විස්තර වාර්තා ඉදිරිපත් කළ නොහැකි වූ බැවින්, එය සාකච්ඡා කිරීම සඳහා මම එය සහෝදරවරුන්ට ඉදිරිපත් කරමි.

මෙතැන අප ඉදිරියේ ප්‍රධාන දේශපාලන ප්‍රශ්නයක් ඇත. අපේ මුළු මහත් විප්ලවයටම තීරණාත්මක වැදගත්කමක් ඇති නගරය සහ ගම අතර ඇති සබඳතාවය එම ප්‍රශ්නයයි. රජයේ වියදමෙන් පළ කරන ලද සහ ධනපති සහ සාර්වාදී පක්ෂ විසින් පළ කරන ලද සියලු සාහි-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ත්‍යයන් යොදවමින් ධනපති රජය නාගරික කම්කරුවන් මොට්ටයින් කිරීමට වැඩ කරන අතර නාගරික කම්කරුවා ගම්බද නිර්ධන පංතිය අතරට කොමියුනිස්ට්වාදී අදහස් ගෙනයන ක්‍රියාකාරී වාහකයක් වශයෙන් යෙදවීමට අප සතු සියලු දේශපාලන බලය පාවිච්චි කළ හැකිය, එසේ කළ යුතුය.

මා 'කොමියුනිස්ට්' නැමැති වචනය පාවිච්චි කළද, ඒ ගැන වැරදි හැඟීමක් ඇති වීමට ඉඩක් තිබෙන නිසාත්, නැතිනම් එම වචනය එහි පරිසමාප්ත අර්ථයෙන්ම වටහා ගැනීමට ඉඩක් ඇති නිසාත්, මම එය අස්කර ගනිමි. පිරිසිදු හා කොමියුනිස්ට්වාදී අදහස් වහාම ගම්බද ප්‍රචාරය කළ යුතු යැයි මින් කොහෙත්ම වටහා ගත යුතු නැත. අපේ ගම්වල කොමියුනිස්ට්වාදය සඳහා ද්‍රව්‍යමය පදනමක් නැති තාක් කල්, එවැන්නක් කිරීම කොමියුනිස්ට්වාදයට හානිදයකය, ඇත්ත වශයෙන්ම විනාශකාරී වන්නේ යැයි කිව යුතුය.

මෙය සත්‍යයකි. ගම්වල කොමියුනිස්ට්වාදය රෝපණය කිරීමේ කලින් සිතාගත් අරමුණක් රහිතව අප විසින් නගරය සහ ගම අතර සම්බන්ධකම් ඇති කිරීමේ කටයුතු ආරම්භ කළ යුතුය. මේ අරමුණ වත්මන් වකවානුවේදී සපුරාලිය නොහැකිය. මෙවැනි අරමුණක් කාලෝචිත නොවේ. මෙවැනි අරමුණක් නිසා හානියක් මිස ප්‍රයෝජනයක් ඇති නොවේ.

නාගරික කම්කරුවන් සහ ගම්බද වැඩකරන ජනතාව අතර සම්බන්ධකම් ඇති කර ලීමද, ඔවුන් අතර ලෙහෙසියෙන් ඇති කර ලිය හැකි සහෝදරාත්මක සම්බන්ධතාවයක් ස්ථිර කරලීමද, අපේ යුතු කම වන්නේය. රාජ්‍ය පාලන බලය සියතට ගෙන සිටින කම්කරු පංතියේ එක් මූලික කාර්යයකි, මෙය. මෙවැන්නක් සාර්ථක කිරීම පිණිස අප විසින් කම්හල්වල වැඩකරන කම්කරුවන්ගේ විවිධ (පක්ෂයේ, වෘත්තීය සමිතිවල සහ පෞද්ගලික) සමාගමයන් ඇති කළ යුතුය. ගම්වල සංස්කෘතික දියුණුව සඳහා ගම්මුන්ට නිති පතා ආධාර කිරීමට මේ සමාගමයන් වලට පුළුවන් වනු ඇත. සෑම කම්කරු කණ්ඩායමකටම, තමන් සම්බන්ධ වී සිටින ගම්බද කණ්ඩයමේ සංස්කෘතික අවශ්‍යතාවයන්ට සේවය කිරීම සඳහා සෑම අවස්ථාවක්මත් සෑම ඉඩ ප්‍රස්ථාවක්මත් නිතිපතා ප්‍රයෝජනයට ගන්නා නාගරික කණ්ඩායම් ගම්බද කණ්ඩායම්වලට "අනුබද්ධ" කිරීම කළ හැකිද? නැතිනම් සම්බන්ධකම් ඇති කර ලීමේ වෙනත් ආකාරයන් සොයා ගත හැකිද? සහෝදරවරුන්ගේ අවධානය යොමුකරවීම සඳහාත්, බටහිර සයිබීරියාවෙන් ලබාගත් අත්දැකීම් පෙන්වාදීම සඳහාත් (මේ ගැන හදරොවිස්කි සහෝදරයා මගේ අවධානය යොමු කළේය) මේ යෝධමය ඓතිහාසික සංස්කෘතික කාර්යයේ මුළු මහත් විශාලත්වය පෙන්වා දීම සඳහාත් මෙම ප්‍රශ්නය සූත්‍රගත කිරීමට පමණක්, මම සීමා වෙමි.

අපේ නිල අය වැය ලේඛනයෙන් සහ අපේ නිල සම්බන්ධකම් වලට පරිබාහිරව ගම්බද පළාත් සඳහා අප කිසිවක් නොකරන තරම්ය. අපේ ගම්වල, නගර හා ගම් අතර සංස්කෘතික සම්බන්ධතාවය ස්වයංක්‍රීය ලෙසත්, නොවැළැක්විය හැකි ලෙසත්, වෙනස් වන බව සත්‍යයකි. ධනපති ක්‍රමය යටතේ නගරය ගමට දේශපාලන, ආර්ථික, අධ්‍යාත්මික සහ කායික ආදී දූෂණයන් ගෙනාවේය. එහෙත් දැන් ස්වයංක්‍රීය ලෙස මීට හාත්පසින්ම වෙනස් සත්ගුණයන් නගරය විසින් ගමට යැවේ. මේවා සියල්ල ස්වයංක්‍රීය ලෙසත්, සාංසිද්ධික ලෙසත් සිදුවන බව මම යළිත් අවධාරණය කරමි. මෙය විඥත ලෙසත්, ක්‍රමානුකූල ලෙසත්, විධිමත් ලෙසත්, කිරීමෙන් උසස් (සියක් වාරයකින්) කළ හැකිය.

ප්‍රශ්නය අධ්‍යයනය කළ ඉක්බිත්ව, මෙම කරුණ ඉදිරිපත් කර ගෙන එය සාකච්ඡා කොට, වැඩ කිරීම — නිලධාරිවාදී වීම සඳහා හැම දෙයක්ම කරමින් — සඳහා සියලු විධිවලට අයත් කම්කරු සංවිධාන ඇති කිරීමෙන් ඉක්බිතිව, පමණක් අපි ඉදිරියට (ඇත්ත වශයෙන්ම සිය වාරයක අධික වේගයකින්) ගමන් කරන්නෙමු.

1923 ජනවාරි 2 ද

"ප්‍රාව්ද" අංක 2, 1923 ජනවාරි 4.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, වෙළුම 45, පිටු 363-368.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

අපේ විප්ලවය

(එන්. සුහානොව්ගේ සටහන් සම්බන්ධයෙනි)

I

විප්ලවය පිළිබඳව සුහානොව්ගේ සටහන් මම මෑතදී කියවන්නට වීමි. දෙවැනි ජාත්‍යන්තරයට අයත් අපේ සියලු සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ පණ්ඩිතමානීත්වය මින් යසට කැපී පෙනෙයි. ජර්මන් ආදර්ශයෙන් ඉතා සුළු වශයෙන් හෝ ඈත් වන විට, ඔවුන්ගේ ඉතාම හොඳ අය පවා බියගුලු නිවටයින් බවට පත්වීම හැරුණු විට, මුළු මහත් විප්ලවය සිදුවූ කාලයේදී සියලු සුළු ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදීන්ට පොදු ආවේණික ලක්ෂණයක් වීම හැරුණු විට, අතීතය පිළිබඳව ඔවුන් කරන වහල් අනුකරණය ඉතා හොඳින් කැපී පෙනෙයි.

ඔවුහු තමන් මාක්ස්වාදීන් යැයි කියා ගනිති. එහෙත් මාක්ස්වාදය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය පණ්ඩිතමානීත්වයෙන් පිරී ඉතිරී තිබේ. මාක්ස්වාදයේ තීරණාත්මක දෙය, එනම් එහි විප්ලවවාදී දයලෙක්තිකය අවබෝධ කැරැ ගැනීමට ඔවුහු සම්පූර්ණයෙන්ම අපොහොසත් වී සිටිති. විප්ලවීය කාලවලදී උපරිමය නම්‍යතාවයක් තිබිය යුතුය යන මාක්ස්ගේ සරළ ප්‍රකාශණ වටහා ගැනීමට සම්පූර්ණයෙන්ම ඔවුහු අපොහොසත් වූහ. විප්ලවවාදී තත්ත්වයක් ඇති කරවීම සඳහා ජර්මනියේ ගොවි යුද්ධය, කම්කරු පංති ව්‍යාපාරය සමග සංයෝජනය කරලීමේ බලාපොරොත්තුවක් මාක්ස් තම ලියුම් මගින් — මා හිතන හැටියට 1856 දී — සඳහන් කළා විය යුතුය. මොවුහු මාක්ස්ගේ මේ සරළ ප්‍රකාශනය පවා ඉවතලමින්, උණු කැඳ බඳුනක් වටා යන බළලකු සේ, එය වටා ගමන් කරති.

ධනපතීන්ගෙන් සම්පූර්ණයෙන්ම වෙන් වී කැඩීයාම පසෙක තබා, ධනපතීන්ගෙන් අපගමනයක් ඇතිවීම ගැන පවා බියවන මොවුන්ගේ හැසිරීම නිසා මොවුහු බියසුලු ප්‍රතිසංස්කරණවාදීන් ලෙස පෙනී සිටිති. එහෙත් ඒ අතරම ඔවුහු තම බියසුලු ගතිය අලංකාර නමුදු නිස්සාර වාග් පාය දෙඩවමින් වසාලීමට තැත් කරති. පහත සටහන්

මාක්ස්වාදී ප්‍රස්තුතයන් වටහා ගැනීමට ඔවුන්ගේ ඇති අපොහොසත්කම හුදු න්‍යායික දෘෂ්ටි කෝණය අනුව වුවද, කෙනෙකුට ඉතා යසට කැපී පෙනෙයි. බටහිර යුරෝපයේ ධනවාදය සහ ධනපති ප්‍රජාතන්ත්‍රවාදය මෙතෙක් නියත සංවර්ධන මාර්ගයක් ගෙන තිබෙන බව ඔවුන් දකින අතර මෙම මාර්ගය ආදර්ශයක් ලෙස ගත හැක්කේ mutatis mutandis* වශයෙන් පමණක් බව වටහා ගැනීමට ඔවුන් අපොහොසත් වී ඇත. එය වෙනස් කළ හැක්කේ සමහර සංශෝධන (ලෝක ඉතිහාසයේ පොදු වර්ධනය අනුව බලන විට, ඉතා නොවැදගත් සංශෝධන) මගින් පමණකි.

<u>ප්‍රථමයෙන්ම</u> — විප්ලවය අධිරාජ්‍යවාදී පළමුවැනි ලෝක යුද්ධය සමග සම්බන්ධ වී තිබීම. එවැනි විප්ලව, යුද්ධයේම ප්‍රතිඵල වශයෙන් අළුත් ලක්ෂණ සහ විචලතාවයන් හෙළි කරනු නියතය. මන්දයත් මෙවැනි තත්වයක් යටතේ මෙවැනි යුද්ධයක් මීට පෙර ලෝකය නුදුටු බැවිනි. යුද්ධයෙන් අනතුරුව අද වන තුරු ඉතා පොහොසත් රටවල ධනපති පංතියට පවා ධනපති සම්බන්ධකම් සාමාන්‍ය තත්ත්ව යට ගෙන ඒමට නොහැකි වී තිබෙන සැටි අපි දකිමු. එහෙත් අපේ ප්‍රතිසංස්කරණවාදීහු — විප්ලවවාදීන් ලෙස තමන් ප්‍රදර්ශනය කරන සුළු ධනපතීහු — සාමාන්‍ය ධනපති සම්බන්ධකම් සීමාව ලෙස (එතෙක් දක්වා යාම සහ එතැනින් එහාට නොයාම) විශ්වාස කළහ, දැනුදු එසේ විශ්වාස කරති. "සාමාන්‍ය" නැමැති ඔවුන්ගේ සංකල්පය පවා උපරිමය ලෙස ආකෘතිය, පටුය.

<u>දෙවනුව</u> — ලෝක ඉතිහාසයේ වර්ධනය සමස්තයක් වශයෙන් පොදු නියමයන් අනුගමනය කරන අතර, වර්ධනයේ සමහර කාල පරිච්ඡේදවලදී එක්කෝ ආකාරය අනුව නැතිනම් අනුපිළිවෙල අනුව විශේෂතාවයන් පෙන්වීම, කොහෙත්ම නිවාරණයක් නොවන නමුදු, විලෝම වශයෙන් පූර්ව නිගමනයක්ය යන සංකල්පය මේ අයට සම්පූර්ණයෙන්ම පිටස්තර දෙයකි. නිදසුනක් වශයෙන්, රුසියාව ශිෂ්ටාචාර රටවල් සහ මෙම යුද්ධය විසින් පළමුවැනි වරට නියත ලෙසම ශිෂ්ඨත්වයේ කක්ෂයට ගෙනෙන ලද, නැතිනම් අන් සියලු තත්ත්වයන් අනුව, නැගෙනහිරට අයත් යුරෝපීය නොවන රටවල් අතර පැවති බව ඔවුනට සිහියට නගා ගැනීමට පවා බැරිය. සමහර විශිෂ්ඨ ලක්ෂණ හෙළි කිරීමට රුසියාවට හැකියාවක් තිබුණු අතර එරට ඒවා එසේම හෙළි කළේය. මේවා ලෝක සංවර්ධනයේ පොදු ප්‍රතිපත්තියට ගැළපෙන නමුදු බටහිර යුරෝපීය රටවල සිදුවූ විප්ලව-

---

* — අවශ්‍ය වෙනස් කිරීම් සහිතව. — <u>සංස්කාරක</u>

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වලට වඩා මෙම විප්ලවය වෙන් කොට පෙන්වයි. එමෙන්ම විප්ලවය නැගෙනහිර රටවලට ගමන් කරත්ම එක්තරා අර්ධ නව ලක්ෂණයන් එකතු කරයි.

නිදසුනක් වශයෙන්, බටහිර යුරෝපීය සමාජ-ප්‍රජාතන්ත්‍රිකය වර්ධනය වන කාලවලදී, ඔවුන් කට පාඩමින් ඉදිරිපත් කළ තර්කය එනම්, අප තවමත් සමාජවාදය සඳහා මුහුකුරා නැතැයි යන්න අනන්ත අප්‍රමාණ ලෙස ආකෘතික වූවකි. සමහර ''උගත්'' මහත්වරු කියන පරිදි සමාජවාදී ආර්ථික පූර්වාවයන් අප රටේ නැත. එහෙත් ඔවුනට මෙවැනි ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට තරම් බුද්ධියක් නැතිවා සේය: පළමුවැනි අධිරාජ්‍යවාදී යුද්ධය විසින් බිහිකරන ලද විප්ලවවාදී තත්ත්වයකට පිවිසුනු ජනතාවක් ගැන කෙසේද? තත්ත්වයේ බලාපොරොත්තු විරහිත බලපෑම නිසා එක්තරා විදිහකට අසමාන තත්ත්වයක් යටතේ තව දුරටත් සභ්‍යත්වය වර්ධනය කර ගැනීම සඳහා සමහර අවස්ථාවන් පමණක් හෝ ඉදිරිපත් කරන අරගලයකට එය ඉදිරිපත් නොවන්නේද?

''රුසියාවේ නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනය සමාජවාදය ගොඩනැගීමේ හැකියාව ඇති කරන තත්ත්වයට පැමිණ නැත.'' සත්තකින්ම සුභානොවි ඇතුළු දෙවැනි ජාත්‍යන්තරයේ වීරයෝ ගිරවුන් සේ මේ සූත්‍ර පාඨය පුන පුනා කියති. විවාද රහිත මෙම ප්‍රස්තුතය ඔවුන් නොයෙක් කාලවලට ගයන්නේ එය අපේ විප්ලවයේ තීරණාත්මක අගැයීම හැටියට සිතාගෙනය.

අඩුවැඩි වශයෙන් බටහිර යුරෝපයේ සෑම බලගතු රටක්ම පාහේ ඇඳුණු යුද්ධයට රුසියාව පැටළිනි. එවකට නැගෙනහිර අර්ධ වශයෙන් පටන් ගත් නැතිනම් මුහුකුරා වැඩෙමින් තිබුණු විප්ලව රුසියාව දුටු අතර ප්‍රසියාවට පා තැබිය හැකි අනාගතයක් ලෙස අන් කිසිවකු නොව, කාල් මාක්ස් වැනි ශ්‍රෙෂ්ඨ මාක්ස්වාදියකු විසින් 1856 දී යෝජනා කළ ''ගොවි යුද්ධය'' කම්කරු පංති ව්‍යාපාරය සමග සංයෝජනය කිරීම, වැනි දෙයක් ස්ථිර ලෙසම ලබා ගැනීමේ තත්ත්වයකට රුසියාව සහ එහි සංවර්ධනය පා තැබුවේ නම්, තත්ත්වය කුමක් විය යුතුද?

තත්ත්වයේ පූර්ණ බලාපොත්තු රහිත භාවය විසින් කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ පරිශ්‍රමය දසගුණයකින් උත්තේජනය කරමින්, බටහිර යුරෝපීය රටවලට වඩා වෙනස් විධියකට සභ්‍යත්වයේ මූලික අවශ්‍යතාවයන් බිහි කිරීමට අපට අවස්ථාව ලැබිණි නම්, කුමක් වන්නෙද? මෙය ලෝක ඉතිහාසයේ වර්ධනයේ පොදු ප්‍රතිපත්තිය වෙනස් කළේද? ලෝක ඉතිහාසයේ පොදු ගමනට ඇදී ඉදිරියට ගමන් කරන නැතිනම් ගමන් කළ සියලු රටවල මූලික පංති අතර ඇති මූලික සබඳතාවයන් මේ නිසා වෙනස් වීද?

සමාජවාදය ගොඩනැගීම සඳහා සංස්කෘතියේ නියමිත මට්ටමක් අවශ්‍ය නම් (නියත සංස්කෘතික මට්ටමක් ගැන ස්ථිර නිගමනයක් කිරීමට කිසිවකුට බැරිය, මන්දයත් සෑම බටහිර යරෝපීය රටකම එය එකිනෙකට වෙනස් බැවිනි), සංස්කෘතියේ එම නියත මට්ටමට අවශ්‍ය පූර්ව කොන්දේසි අපට විප්ලවවාදී විදිහකට ලබා ගැනීමට බැරි මන්ද? ඉන් අනතුරුව කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ ආණ්ඩුවේ සහ සෝවියට් ක්‍රමයේ ආධාරය ඇතිව අනිකුත් ජාතීන් අභිබවා ඉදිරියට යාමට නොහැකි මන්ද?

1923 ජනවාරි 16 ද.

II

සමාජවාදය ගොඩනැගීම සඳහා සංස්කෘතිය අවශ්‍ය බව ඔබ කියති. බොහොම හොඳයි. ඉඩම් හිමියන් හා රුසියානු ධනපතීන් පන්නා දමමින් සංස්කෘතියට අවශ්‍ය පූර්වාවයන් අප පළමුවෙන් බිහි කොට, ඉන් අනතුරුව සමාජවාදය කරා යාමට පටන් නොගන්නේ මන්ද? සාමාන්‍ය ඓතිහාසික සිද්ධීන්වල අනුපිළිවෙලේ එවැනි වෙනස්වීම්වලට අවසර නැතැයි හෝ එලෙස විය නොහැකි යැයි හෝ ඔබ කියැවූයේ කිනම් පොත් වලද?

නැපෝලියන් මෙලෙස ලියූ බවක් මම සිතමි: “On s’engage et puis... on voit”. මෙය නිදහස් පරිවර්තනය කරන විට තේරුම මෙසේය: ''පළමුව බරපතල සටනකට සහභාගිවන්න, අනතුරුව මොනවා වෙතිදැයි බලන්න''. එසේය, අපි පළමුව 1917 ඔක්තෝබර් මාසයේදී බරපතල සටනක යෙදුනෙමු. ඉන් අනතුරුව බ්‍රෙස්ට් සාමය[77], නව ආර්ථික ප්‍රතිපත්තිය[78] ආදී සංවර්ධනයේ එවැනි සවිස්තරයන් (ලෝක ඉතිහාසයේ දෘෂ්ටි කෝණයෙන් බලන විට, ඒවා සත්තකින්ම සවිස්තරයන්ය) අපි දුටිමු. ප්‍රධාන වශයෙන් අප ජයග්‍රහණය ලබා තිබෙන බවට දූන් නම් කිසිදු සැකයක් නැත්තේය.

වඩාත් දක්ෂිණාංශික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් ගැන කෙසේවතුදු අපේ සුභානොව්ලා වෙනත් විදියකට විප්ලව කළ හැකි බව හීනෙන් පවා නොසිතූහ. වඩාත් විශාල ජනගහණයක් සහ වඩාත් විවිධ සමාජ තත්ත්වයන් සහිත නැගෙනහිර රටවල මීළඟට ඇතිවන විප්ලව මගින්, රුසියන් විප්ලවයට වඩා විශාල වෙනස්කම් නිසැකයෙන්ම ඇති කරන බව අපේ යුරෝපීය අවරසිකයෝ සිහිනෙන් පවා දැකීමට අපොහොසත් වෙති.

ස්වකීය කාලයේදී කෞට්සකිගේ ප්‍රතිපත්ති අනුව ලියන ලද

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අභ්‍යාස පොත් ඉතා ප්‍රයෝජනවත් වූ බවට සැක නැත. ලෝක ඉතිහාසයේ වර්ධනයේ ඊළඟට ඇතිවන සියලු ආකාරයන් එම අභ්‍යාස පොත් කල් ඇතිව දිටීය යන අදහස අප විසින් බැහැර කළ යුතු කාලය එළඹ ඇත්තේය. එලෙස කල්පනා කරන්නන් නිකම් පුහු මෝඩයින් බව, ප්‍රකාශ කිරීම කාලෝචිතය.

1923 ජනවාරි 17 ද.

1923 මැයි 30 ''ප්‍රාව්ද'' හි (අංක 117) පළ විය.

වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘති, වෙළුම 45, පිටු 378-382.

සංස්කාරකගේ සටහන්

1 ප්‍රෙඩ්රික් එංගල්ස් විසින් ලියන ලද ''ඩූරිං විරෝධය. යුජින් ඩූරිං මහතා විසින් කරන ලද විද්‍යාවේ පෙරළිය'' නැමැති පොත ගැනය.

2 1899 ඔක්තෝබර් මාසයේදී හැනෝවර් හි පැවැත්වුණු ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සමුළුව ගැනය. එම සමුළුව බර්න්ෂ්ටයින්ගේ සංශෝධනවාදී අදහස්වලට විරුද්ධත්වය ප්‍රකාශ කළ ද, බර්න්ෂ්ටයින්-වාදය පිළිබඳව පූර්ණ විවේචනයක් ඉදිරිපත් නොකළාය.

3 ''රබෝචය මීස්ල්''— 19 වැනි සියවසරේ අග භාගයේදී සහ 20 වැනි සිය වසරේ මුල් භාගයේදී රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ අවස්ථාවාදී ප්‍රවණතාවය ඉදිරිපත් කළ ආර්ථික වාදීන්ගේ පුවත්පතකි. 1897 සිට 1902 දක්වා මෙම පුවත්පත පළවිය.

4 1895 සහ විශේෂයෙන් 1896 වසරවලදී පිටර්බුර්ගයේ කම්කරුවන්ගේ වැඩ වර්ජනය ගැන ලෙනින් සඳහන් කරයි. වැඩ දිනය පැය $10^1/_2$ දක්වා අඩු කිරීමද, වැඩ නිමාන කිරීමේදී වැටුප් උසස් කිරීමද, නිසි කලට වැටුප් ගෙවීමද මේ වර්ජනවලදී ඉදිරිපත් කළ ඉල්ලීම් විය.

පිටර්බුර්ගයේ වැඩ වර්ජන නිසා අනිකුත් නගරවල කම්කරු පංතික ව්‍යාපාරය ශක්තිමත් විය. කම්හල් හා පැක්ටරිවල වැඩ දිනය පැය $11^1/_2$ දක්වා අඩුකරමින්, 1897 ජූනි 2(14) නීතියක් පැනවීමට සාර් රජයට සිදුවිය.

5 ආර්ථිකවාදය — 19 වැනි සියවසර අග සහ විසිවැනි සියවසර මුල් භාගයේදී රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ පැන නැඟුණු අවස්ථාවාදී ප්‍රවණතාවයකි. මෙය ජාත්‍යන්තර අවස්ථාවාදයේ එක්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විවිධත්වයකි.ආර්ථිකවාදීහු කම්කරු පංතියේ කාර්‍යභාරයන් වැටුප් වැඩි කිරීම ශ්‍රම තත්ත්වය උසස් කිරීම ආදියට සීමා කළහ.දේශපාලන සටන ලිබරල්වාදී ධනපතීන්ගේ කාර්‍ය භාරයක් ලෙස පෙන්වා දුන් මොවුහු පක්ෂයේ කම්කරු පංතියේ නායක ක්‍රියා කලාපය පිළිනොගත්හ. ඉබේ හට ගන්නාවූ කම්කරු පංතික ව්‍යාපාරය ඉදිරියෙහි හිස නැමූ ආර්ථිකවාදියෝ විප්ලවවාදී න්‍යායයේ අගය පහත් කළහ. කම්කරු පංති ව්‍යාපාරය තුළට මාක්ස්වාදී පක්ෂයක සමාජවාදී විඥනයක අවශ්‍යතාවය පිළිනොගත්හ. ඒ අනුව ඔවුහු ධනපති දෘෂ්ටිවාදයට මග පෑදූහ. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය තුළ විසිර යාම හා කාණ්ඩවාදය ආරක්ෂා කළ ආර්ථිකවාදීහු කම්කරු පංතියේ මධ්‍යගත පක්ෂයක් ගොඩනැගීමේ අවශ්‍යතාවයට විරුද්ධ වූහ.

6 ''රබෝචිය දියල'' — ''විදේශගත රුසියන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සංගමයේ'' සඟරාවය. 1899—1902 වසරවලදී ජිනීවා නුවර මෙම සඟරාව පළ කැරිණි. මෙම සඟරාව මාක්ස්වාදය ''ස්වාධීන ලෙස විවේචනය කිරීමේ'' බර්න්ෂ්ටයින්වාදී උද්යෝග පාඨයට පක්ෂ විය. රුසියන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ උපක්‍රාමික හා සංවිධානාත්මක කාර්ය භාරයන් පිළිබඳ ප්‍රශ්නවලදී අවස්ථාවාදී ප්‍රතිපත්ති අනුගමන කළේය. නිර්ධන පංතියේ දේශපාලනමය අරගලය ආර්ථික අරගලයට යටකළ යුතු යැයි අවස්ථාවාදීහු ප්‍රකාශ කළහ. පක්ෂයේ නායක ක්‍රියාකලාපය නොපිළිගත් ඔවුහු, ඉබේ සටගන්නා කම්කරු පංතික ව්‍යාපාරය ඉදිරියේ හිස නැමීය.

7 "Credo" (''ක්‍රීඩො'') — විශ්වාසයේ සංකේතය, වැඩ පිළිවෙළ, විශ්වාසය ප්‍රකාශ කිරීම ය. ඊ. ඩි. කුස්කෝවා විසින් ලියන ලද ආර්ථිකවාදී කණ්ඩායමේ ප්‍රකාශනය එනමින් ප්‍රසිද්ධ විය.

8 ''ඉස්ක්‍රා'' — පළමුවැනි සමස්ත රුසියානු නීතිවිරෝධි මාක්ස්වාදී පුවත්පතය. 1900 දී විදේශගතව සිටි. වි. අයි. ලෙනින් විසින් මෙය ආරම්භ කැරිණි. පිටරට සිට රහසේ රුසියාවට ගෙනෙන ලදී. දෘෂ්ටිමය වශයෙන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් ඒකරාශී කිරීම සඳහාත්, තැනින් තැන විසිර තුබුණු ප්‍රදේශීය සංවිධාන විප්ලවවාදී මාක්ස්වාදී පක්ෂයකට එක්සත් කිරීම පිළියෙළ කිරීම සඳහාත් ''ඉස්ක්‍රා'' ඉතා විශාල සේවයක් කළේය.

9 හිර්ෂ්-දුන්කෙර් වෘත්තීය සමිති — ප්‍රතිසංස්කරණවාදී වෘත්තීය සමිති සංවිධානයක් වන මෙය ජර්මන් ධනපති ප්‍රගතිශීලි පක්ෂයේ නායකයින් වන එම්. හිර්ෂ් සහ එජ්. දුන්කෙර් විසින් සංවිධානය කැරිණි. මේ වෘත්තීය සමිති අන්‍යොන්‍යාධාර අරමුදල් සහ සංස්කෘතික අධ්‍යාපනික සංවිධාන ඇතිකිරීමට පමණක් ප්‍රධාන වශයෙන් සීමා විය. 1933 මැයි මාසය වන තෙක් මෙම සමිති ව්‍යාපාරය ජර්මනියේ පැවතිණි. එහෙත් එය ජර්මන් කම්කරු පංතික ව්‍යාපාරය තුළ සැහෙන බලවේගයක් නොවීය. ධනපති පංතිය සහ ආණ්ඩුවේ ආයතන මේ සමිතිවලට නන් අයුරින් ආධාර කළද ඉන් එලත් නොවීය.

10 ''කම්කරු මන්ත්‍රීවරුන්ගේ සෝවියට් සභාවල ඉස්වෙස්තිය'' — 1905 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා පළවූ පිටර්බුර්ගයේ කම්කරු මන්ත්‍රීවරුන්ගේ සෝවියට් සභාවේ නිල පුවත්පතය. සෝවියට් සභාවේ ක්‍රියා කලාපය ගැන පුවත් හෙළි කළ බුලටිනයක ස්වරූපයක් දැරීය.

11 ඔබ්ලෝමව් — රුසියානු ලේඛක ඊ. ආ. ගොන්චරෝව්ගේ ''ඔබ්ලෝමව්'' නව කතාවේ වීරයෙකි. ගතානුගතිකත්වය, එකතැන පල්වීම, සහ නිෂ්ක්‍රියත්වය ඔබ්ලෝමව්ගේ නාමය සමග සර්වසම විය.

12 කලෙන්ද — පුරාණ රෝමවරු මාසයේ පළමුවැනි දවස මෙනමින් හැඳින් වූහ. ග්‍රීකයිනට මෙවැන්නත් නොතිබිණි. ග්‍රීකයින්ගේ කලෙන්ද දක්වා කල් තැබීම යනු කිසි කලෙක ඉටුනොවන, අසාර්ථක වුණු යමක් ගැන හැඳින් වීමකි.

13 සාර්ගේ ඒකාධිපති පාලනය පෙරළා දැමීමේ උද්යෝග පාඨය යටතේ 1905 ඇතිවූ සමස්ත රුසියානු ඔක්තෝබර් දේශපාලන මහා වැඩ වර්ජනය ගැනය.

14 ''ඔස්වබෂ්දේනිය'' — 1902-1905 වසරවලදී විදේශයන්හි මුද්‍රණය කළ අර්ධ මාසිකයක්වූ මෙය රුසියානු ලිබරල් ධනපති පංතියේ නිල සඟරාව විය.

15 ''නාෂ ෂිස්න්'' — 1904-1906 කාලවලදී පිටර්බුර්ගයේ පළකරන ලද ලිබරල් ප්‍රවණතාවයකින් හෙබි දිනපතා පුවත්පතකි.

16 රැඩිකල්-ඩිමොක්‍රැට්වරු — සුළු ධනපති සංවිධානයකි. 1905 නොවැම්බර් සිට 1906 මුල දක්වා ක්‍රියාකාරී විය. රැඩිකල්-ඩිමොක්‍රැට්වරු ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවක් ඉල්ලා සිටියද, පාර්ලිමේන්තුවක් හා කැබිනට් ඇමති මණ්ඩලයක් ඉදිරියේ වග කියන ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුවකට වුවද එකඟ වූහ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

17 සමාජවාදී-විප්ලවවාදීහු (එස්ආර්වරු) — නරෝද්නික්වාදී කණ්ඩායම් හා කවයන්ගෙන් 1901 අගදී සහ 1902 මුලදී රුසියාවේ සංවිධානය කරන ලද සුළු ධනපති දේශපාලන පක්ෂයකි. එස්ආර්වරුන් තමන් සමාජවාදීන් වශයෙන් හඳුන්වා ගත්තද විද්‍යාත්මක සමාජවාදය හෙවත් මාක්ස්වාදය සමග කිසිවක් ඔවුනට පොදුවේ නොතිබිණි. වැඩ කරන ගොවීන්ට සමාන අයිතියක් මත ඉඩම් බෙදා දිය යුතු යැයි එස්ආර්වරු ඉල්ලා සිටියහ. ඒ අනුව කෘෂක "සමාජවාදයක්" ගොඩ නැගිය හැකි බව ඔවුහු සිතුවෝය. එහෙත් ඇත්ත වශයෙන්ම ධනවාදී නිෂ්පාදන සම්බන්ධකම් ආරක්ෂා කිරීම යටතේ සමාන ලෙස ඉඩම් බෙදා දීමෙන් සමාජවාදය කරා පරිවර්තනය විය නොහැකිය. එයින් ඇති වන්නේ ගම්බද අර්ධ රදළවාදී සම්බන්ධකම් අහෝසි වී යාම සහ ධනපති ක්‍රමයේ සීඝ්‍ර වර්ධනයක් ඇති වීමය.

නිර්ධනීන් සහ ගොවීන් අතර ඇති පංතිමය වෙනස්කම් එස්ආර්වරු නොදුටහ. වැඩ කරන ගොවීන් හා කුලාකයින් අතර ඇති පංති ප්‍රතිවිරෝධිතා සහ ගොවීන් අතර පංතිමය වෙනස්කම් අඩු කොට තැකුහ. විප්ලවයේදී නිර්ධන පංතියේ නායකත්වය ප්‍රතික්ෂේප කළහ. සාර්වාදයට විරුද්ධව ඔවුන් ගෙනගිය සටන්වල ප්‍රධාන විධිය වූයේ පෞද්ගලික ත්‍රස්තවාදයය.

1905-1907 විප්ලවයේ පරාජයෙන් අනතුරුව එස්ආර්වරුන්ගෙන් සැහෙන සංඛ්‍යාවක් ධනපති ලිබරල්වාදය වැළඳ ගත්හ. 1917 පෙබ්‍රවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් අනතුරුව මෙන්ෂෙවිකයින් සමග එක් වී ප්‍රතිවිප්ලවවාදී තාවකාලික ආණ්ඩුවේ ප්‍රධාන බලවේගය බවට පත්විය. එම පක්ෂයේ නායකයෝ ආණ්ඩුවට ඇතුළු වූහ. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් ඉක්බිතිව, එස්ආර්වරු ක්‍රියාශීලි ලෙස සෝවියට් පාලනයට විරුද්ධව සටන් කළහ.

18 ප්‍රෙඩරික් එංගල්ස් විසින් ලියන ලද "විගමන සාහිත්‍යය" බලන්න.

19 ප්රුදෙන්වාදය — මාක්ස්වාදයට සතුරු සුළු ධනවාදී සමාජවාදී ප්‍රවණතාවයකි. එම දෘෂ්ටියේ න්‍යායාචාර්ය ප්‍රංශ අරාජිකවාදී ප්රුදෙන්ගේ නමින් එම වාදය හඳුන්වනු ලැබේ.

මහා පරිමාණ ධනවාදී දේපළ අයිතිය විවේචනය කළ ප්රුදෙන් පෞද්ගලික අයිතිය සදාකාලික කිරීමේ සිහිනය දිටීය. "මහජන" සහ "හුවමාරු" බැංකු සංවිධානය කිරීමට යෝජනා කළේය. මේ බැංකුවල මාර්ගයෙන් නිෂ්පාදන මාධ්‍යයන් තමන් සතු කර ගන්නා කම්කරුවන්ට ශිල්පීන් වීමට හැකි වනු ඇත. එමෙන්ම සිය නිෂ්පාදන "සාධාරණ" මිලකට විකුණා ගැනීමට ඔවුන් සමත් වනු ඇත.

නිර්ධන පංතියේ ඓතිහාසික ක්‍රියා කලාපය සාක්ෂාත් කර ගැනීමට ප්රුදෙන් අසමත් විය. පංති සටන, නිර්ධන පංතික විප්ලවය සහ නිර්ධන පංතික ආඥාදායකත්වය කෙරෙහි සතුරු ආකල්පයක් දැක්වීය. අරාජිකවාදී ස්ථාවරයක් මත පිහිටා ඔහු රජයක අවශ්‍යතාවය බැහැර කළේය. ප්රුදෙන්වාදයට විරුද්ධව මාක්ස් සහ එංගල්ස් ස්ථිර සටනක් ගෙන ගියහ.

20 බකුනින්වරු — අරාජිකවාදයේ න්‍යායාචාර්ය වරයකු වන මිහයිල් බකුනින්ට පක්ෂපාත වූවෝ එනමින් හඳුන්වනු ලබති. කම්කරු පංතික ව්‍යාපාරය තුළ මාක්ස්වාදී න්‍යායයට හා උපක්‍රමවල විරුද්ධව බකුනින්වරු දැඩි සටනක් ගෙන ගියහ. ඔවුන්ගේ මූලික න්‍යායය වූයේ, නිර්ධන පංතික ප්‍රජාතන්ත්‍රවාදය ඇතුළුව සියලු අන්දමේ රජය ක්‍රමවලට අරාජිකවාදී ලෙස විරුද්ධ වීමය. නිර්ධන පංතියේ ජගත් ඓතිහාසික ක්‍රියා කලාපය අවබෝධ කැරැ ගැනීමට ඔවුහු අසමත් වූහ. "සම්භාවනීය" පුද්ගලයින්ගෙන් සැදුම්ලත්, රහස් විප්ලවීය සංගම් බකුනින්වරුන්ගේ මතය අනුව පොදුජන කැරළි මෙහෙයැවිය යුතු විය. ඔවුන්ගේ කුමන්ත්‍රණ සහ ත්‍රස්තවාදී ක්‍රියා නැගිටීම පිළිබඳ මාක්ස්වාදී උගැන්වීම්වලට සතුරු විය.

පළමුවැනි ජාත්‍යන්තරයට කා වැදුණු බකුනින් එහි මධ්‍යම මණ්ඩලය අල්ලා ගැනීමේ අරමුණ ඇතිව මාක්ස්ට විරුද්ධව සටන් කළේය. 1872 හේග් සමුළුවේදී බකුනින් භේදකාරී වැඩ හෙළා දුටු අතර ඔහු ජාත්‍යන්තරයෙන් නෙරපා දමන ලදී.

21 මෙය සමාජවාදී-විප්ලවවාදීන් ගැන සඳහන් කිරීමකි.

22 නව-කාන්ත්වාදියෝ — ජර්මනියේ 19 වැනි සියවසරේ මැද භාගයේදී ධනේශ්වර දර්ශනවාදයේ ප්‍රතිගාමී ප්‍රවණතාවයකි. කාන්ත් දර්ශනවාදයේ අන්ත ප්‍රතිගාමී විඥානවාදී අදහස්වලින් වැඩිහරියත් පිළිගත් මොවුහු එහි තුබූ ද්‍රව්‍යවාදී කොටස් බැහැර කළහ. "කාන්ත් වෙත ආපසු යාම" යන උද්යෝග පාඨය යටතේ කාන්ත්වාදී විඥනවාදයේ පුණර්ජීවනයක් දේශනා කළ නව-කාන්ත්වාදියෝ දයලෙක්තික හා ඓතිහාසීය ද්‍රව්‍යවාදයට විරුද්ධව සටන් කළහ.

23 කාල් මාක්ස්ගේ "ප්‍රාග්ධනය", 1 වෙළුම බලන්න.

24 1871 පැරිස් කොමියුනය ගැන සහ 1905-1907 රුසියාවේ විප්ලවයේදී මොස්කව් හා අනිකුත් නගරවල ඇතිවූ දෙසැම්බර්හි අවිගත් නැගිටීම ගැනය. මෙම නැගිටීම එම විප්ලවයේ උච්ච අවධිය විය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

25 කැඩෙට්වරු — 1905 ඔක්තෝබර් මාසයේදී පිහිටුවන ලද රුසියානු ලිබරල්-රාජාණ්ඩුවාදී ධනපති පක්ෂය වන ව්‍යවස්ථානුකූල ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකයෝය.

26 මිලියරාන්වාදය — ප්‍රංශ සමාජවාදී-ප්‍රතිසංස්කරණවාදියකු වන අ. එ. මිලියරාන්ගේ නමින් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ ප්‍රසිද්ධියට පත් අවස්ථාවාදී ප්‍රවණතාවයකි. මිලියරාන් 1899 දී ප්‍රතිගාමී ධනපති ආණ්ඩුවට ඇතුළු වී එහි ජනතා විරෝධී ප්‍රතිපත්තියට ආධාර දුන්නේය.

27 ඕතොඩොක්ස්වරු — මාක්ස්වාදය සංශෝධනය කිරීමට විරුද්ධවූ ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීහුය.

28 ගෙද්වාදියෝ — ජූල් ගෙද් සහ පෝල් ලාපාග්ගේ නායකත්වයෙන් ප්‍රංශයේ 19 වැනි සියවසර අගදී සහ 20 වැනි සියවසර මුලදී පැන නැගුණු විප්ලවීය මාක්ස්වාදී ප්‍රවණතාවයකි. ප්‍රංශයේ කම්කරු පක්ෂය (1882) භේදවීමෙන් අනතුරුව පැරණි නම සහිතව ඔවුහු වෙනත් පක්ෂයක් සෑදූහ.

1901 ජූල් ගෙද්ගේ නායකත්වයෙන් යුත් විප්ලවීය පංති සටනට පක්ෂපාත වූවෝ ප්‍රංශ සමාජවාදී පක්ෂයට එකතු වූහ. (මෙම සමාජිකයෝ සිය නායකයා වන ගෙද්ගේ නම අනුව ගෙද්වාදීන් ලෙස හඳුන්වනු ලැබූහ.)

ජොරේස්වාදියෝ — ජාන් ජොරේස්ගේ අනුගාමිකයෝ මෙනමින් හැඳින් වූහ. ජොරේස්, මිලියරාන් සමග 1890 ගණන්වලදී "නිදහස් සමාජවාදී" කණ්ඩායම සෑදුවේය. ප්‍රංශයේ සමාජවාදී ව්‍යාපාරයේ දක්ෂිණාංශික, ප්‍රතිසංස්කරණවාදී අංශය මෙහෙයැවීය. 1902 දී ප්‍රතිසංස්කරණවාදී ප්‍රතිපත්ති මත පිහිටි ප්‍රංශ සමාජවාදී පක්ෂය ඔවුහු ගොඩ නැඟූහ.

බ්රූස්වාදියෝ (සම්භාවිතවාදියෝ) — ප්‍රංශයේ සුළු ධනවාදී, ප්‍රතිසංස්කරණවාදී මෙම ප්‍රවණතාවය බ්රූස් සහ මැලොන් ආදීන් විසින් මෙහෙයැවිණි. මේ කණ්ඩායම අනිකුත් ප්‍රතිසංස්කරණවාදී කණ්ඩායම් සමග එකතුවී ප්‍රංශ සමාජවාදී පක්ෂය ගොඩ නැඟූහ.

1905 දී ප්‍රංශයේ සමාජවාදී පක්ෂය සහ ප්‍රංශ සමාජවාදී පක්ෂය එක්වී එක්සත් ප්‍රංශ සමාජවාදී පක්ෂයත් පිහිටුවා ගත්හ.

29 එංගලන්තයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සම්මේලනය 1844 දී පිහිටුවන ලදී. ප්‍රතිසංස්කරණවාදීන් සහ අරාජිකවාදීන් හැරුණු විට බ්‍රිතාන්‍ය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සම්මේලනයට (SDF) විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කණ්ඩායමක්ද (හැරී ක්වෙල්ච්, ටෝමස් මැන් සහ

අනිත් අය) එයට ඇතුළු විය. ඔවුහු බ්‍රිතාන්‍ය සමාජවාදී ව්‍යාපාරයේ වාමාංශය නියෝජනය කළෝය.

1907 SDF, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය හැටියට නම් කැරිණි. 1911 දී එම පක්ෂය ස්වාධීන කම්කරු පක්ෂයේ වාමාංශික කොටස් සමග එක් වී බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂය පිහිටුවා ගත්හ. 1920 දී මෙම පක්ෂය සහ "කොමියුනිස්ට් එක්සත් කණ්ඩායම" එකතු වී බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂය ගොඩනැඟීම සඳහා ප්‍රධාන ක්‍රියා කලාපයක් ඉටු කළේය.

ඒංගලන්තයේ ස්වාධීන කම්කරු පක්ෂය — 1893 දී පිහිටුවන ලද ප්‍රතිසංස්කරණවාදී සංවිධානයකි. මෙම පක්ෂයට අළුත් වෘත්තීය සමිතිද, පැරණි වෘත්තිය සමිති කීපයක්ද, බුද්ධිමත්තුද, සුළු ධනපති පංතියේ නියෝජිතවරුද ඇතුළු වූහ. පසුකී කොටස් ජේබියන්වාදයේ බලපෑමට හසුවී සිටියහ. කියර් හාඩි සහ රැම්සේ මැක්ඩොනල්ඩ් මෙම පක්ෂයේ නායකයෝ වූහ.

මෙම පක්ෂය ධනපති ප්‍රතිසංස්කරණවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. මෙම පක්ෂය ප්‍රධාන තැන පාර්ලිමේන්තු අරගලවලට සහ ලිබරල් පක්ෂය සමග පාර්ලිමේන්තු සම්මුති ඇති කර ගැනීමට දුන්නේය.

30 අංග පූර්ණවාදියෝ — සුළු ධනපති සමාජවාදයේ එක් විවිධත්වයක් වන "අනුකලන" සමාජවාදයේ අනුගාමිකයෝය. අංග පූර්ණවාදියෝ ඉතාලි සමාජවාදී පක්ෂය තුළ මධ්‍යස්ථ ස්ථාවරයක් දැරූහ. 1900 මුල් සමයේදී, ප්‍රතිගාමී ධනපති පංතිය සමග එකතු වී අන්ත අවස්ථාවාදී මත දරූ ප්‍රතිසංස්කරණවාදීන්ට විරුද්ධව අංග පූර්ණවාදියෝ ප්‍රශ්න කීපයකදී සටන් කළහ.

31 "විප්ලවවාදී සින්ඩිකේට්වාදය" — 19 වැනි සියවසර අවසානයේදී බටහිර යුරෝපයේ රටවල් කීපයකට කම්කරු පංතික ව්‍යාපාරයේ ඇති වූ සුළු ධනපතිවාදී අර්ධ-අරාජිකවාදී ප්‍රවණතාවයකි.

කම්කරු පංතියේ දේශපාලන අරගල සහ පක්ෂයේ නායක ක්‍රියා කලාපයක අවශ්‍යතාවය සින්ඩිකේට්වාදියෝ නොපිළිගත්හ. වෘත්තිය සමිතිවල (සින්ඩිකේට්) සමන්ත මහා වැඩ නැවැත්වීමත් මගින් විප්ලවයකින් තොරව ධනපති ක්‍රමය පෙරළා දමා නිෂ්පාදනයේ කළමණා කරණය සියාතට ගත හැකි යැයි සින්ඩිකේට්වාදියෝ සිතූහ.

32 "වෙහි" ප්‍රතිවිප්ලවවාදී ලිබරල් ධනපති නියෝජිතයින් විසින් 1909

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මොස්කව්හිදී පළකරන ලද සම්භාවනීය කැඩෙට් දේශපාලන සාහිත්‍ය ධරයන්ගේ ලිපි එකතුවකි.

33 ලෙනින් සඳහන් කරන්නේ ඔක්ත්‍යාබ්‍රිස්ට්වරු — "ඔක්තෝබර් 17 ද සංගමය" නැමැති දේශපාලන පක්ෂයේ සාමාජිකයින් ගැනය. 1905 ඔක්තෝබර් 17 ද සාර්ගේ ප්‍රකාශනයට අනතුරුව රුසියාවේ මේ දේශපාලන පක්ෂය සාදන ලදී. ප්‍රතිවිප්ලවවාදී මේ පක්ෂය විශාල ධනපතීන්ගේ සහ ඉඩම් හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කළාය. ඔක්ත්‍යාබ්‍රිස්ත්වරු සාර් ආණ්ඩුවේ දේශපාලන ප්‍රතිපත්තියට සම්පූර්ණයෙන්ම පක්ෂපාත වූහ.

34 "මොස්කව්ස්කියෙ වේදමස්ති" — රාජාණ්ඩු ජාතිවාදී පුවත්පතකි. ඉඩම් හිමියන්ගේ හා පූජකයින්ගේ අන්ත ප්‍රතිගාමී කොටස්වල මත ප්‍රචාරය කළේය. 1756 සිට 1917 දක්වා පළ විය.

35 රාජ්‍ය ධූමා සභාව — 1905 විප්ලවවාදී සිද්ධීන්වල ප්‍රතිඵලයක් වශයෙන් සාර් ආණ්ඩුවට කැඳවීමට සිදුවූ නියෝජිත සංස්ථාවකි. නාම මාත්‍රික වශයෙන් රාජ්‍ය ධූමාව ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවක් වුවද, ක්‍රියාවෙන් එය සතු පාලනයක් නොවීය. ධූමා සභාවට නියෝජිතයින් තෝරාපත් කිරීම ඍජු නොවීය, සමාන නොවීය, සර්වජන නොවීය. වැඩකරන ජනතා පංතිවල සහ රුසියානු නොවන ජාතීන්ගේ අයිතිය අති විශාල වශයෙන් සීමා කර තිබිණි. කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ සැහෙන කොටසකට ඡන්ද බලය කොහෙත්ම නොතිබිණි. පළමුවැනි රාජ්‍ය ධූමාවද (1906 අප්‍රේල්-ජූලි), දෙවැනි රාජ්‍ය ධූමාවද (1907 පෙබ්‍රවාරි-ජූනි) සාර් ආණ්ඩුව විසින් විසුරුවා හරින ලදී. 1907 ජූනි 3 ද ඇතිවූ රාජ්‍ය විපර්යාසයෙන් අනතුරුව ආණ්ඩුව නව මැතිවරණ නීති පැනවීය. ඒ අනුව කම්කරුවන්ගේ, ගොවීන්ගේ සහ නගරබද සුළු ධනපති පංතියේ අයිතිවාසිකම් තවත් අඩු විය. මේ නිසා තෙවැනි (1907-1912) සහ හතරවැනි (1912-1917) ධූමා සභාවල ඉඩම් හිමියන්ගේ හා විශාල ධනපතීන්ගේ ප්‍රතිගාමී හවුලේ පූර්ණ ආධිපත්‍යයක් සහතික විය.

36 "චාතුර්ථික මැතිවරණ ක්‍රමය" — පහත සටහන් ඉල්ලීම් හතර සහිත ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ ක්‍රමයක් ඉන් අදහස් කැරිණි. එනම් සර්වජන, සමාන, ඍජු සහ රහස් මැතිවරණයක්.

37 තෘදවික්වරු (ශ්‍රම කණ්ඩායම) — රාජ්‍ය ධූමා සභාවල සුළු ධනපති ප්‍රජාතන්ත්‍රවාදී කණ්ඩායමකි.1906 අප්‍රේල් මාසයේදී I ධූමා සභාවේ ගොවි නියෝජිතයින්ගෙන් මෙම කණ්ඩායම සැදිණි.

ධූමා සභාව තුළ තෘදවික්වරු කැඩෙට්වරුන් සහ විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අතර වැනෙන්නට වූහ.

38 "නෝවොයෙ වර්මය" — ප්‍රතිගාමී කුලීනයින්ගේ සහ නිලධාරිවාදී නිලධාරීන්ගේ දිනපතා පුවත්පතය. 1868 සිට 1917 දක්වා පිටර්බුර්ග්හි ප්‍රසිද්ධ කරන ලදී.

39 ජූනි 3 ද රාජ්‍ය පෙරළිය ගැනය.

1907 ජූනි 3 (16) ද II ධූමා සභාව විසුරුවා හැරීම සහ මැතිවරණ නීති වෙනස් කිරීම පිළිබඳව සාර් ප්‍රකාශනයක් නිකුත් කළේය. අළුත් මැතිවරණ නීති අනුව ඉඩම් හිමියන්ගේ සහ වෙළඳ-කර්මාන්ත ධනපති පංතියේ නියෝජිත සංඛ්‍යාව තවත් වැඩි කොට, ගොවීන්ගේ සහ කම්කරුවන්ගේ අල්ප නියෝජිත සංඛ්‍යාව තවත් අඩු කළේය. මෙය 1905 ඔක්තෝබර් 17 ද ප්‍රකාශනය සහ රාජ්‍ය ධූමාවේ අනුමැතිය නැතිව සාර් ආණ්ඩුවට නීති පැනවිය නොහැකිය යන 1906 මූලික නීති පනතද ඉතා රළු ලෙස උල්ලංඝනය කිරීමක් විය.

LIBERATIONBASE

40 "මහත්වරුනි, නුඹලා පොහොසත් වෙයල්ලා, එවිට නුඹලා තෝරාපත්කරගන්නෝ වන්නහුය" — ඡන්ද බලය ලැබීමට සුදුසුකම් වූ දේපළ වත්කම් පහත හෙළන ලෙස ඉල්ලා සිටි විට ගීසෝ එසේ පැවසීය. 1840-1848 අවුරුදුවලදී ප්‍රංශ ආණ්ඩුවේ සැබෑ නායකයා වූයේ ගීසෝය. 1847 දී ඔහු ඇමති මණ්ඩලයේ සභාපතිවරයා ලෙස නිල වශයෙන් පත් කරගනු ලැබීය.

1908 දෙසැම්බර් 5(18) ද III ධූමා සභාව අමතා කතා කළ ඇමති මණ්ඩලයේ සභාපතිවර පී. එ. ස්තොලිපින්, ආණ්ඩුව "ඔට්ටු අල්ලා ඇත්තේ දුප්පතුන්ට හා බේබද්දන්ට නොව, බලවත් හා ශක්තිමත් අයට යැයි" පැවසීය. 1906 නොවැම්බර් 9(22) ද නිකුත් කරන ලද පනතේ ප්‍රධාන අදහස ඔහු එමගින් ප්‍රකාශ කළේය.

41 බුලිගින් ධූමාව — උපදේශක නියෝජිත සංස්ථාවක් වූ මෙය 1905 දී කැඳවීමට සාර් ආණ්ඩුව පොරොන්දු විය. මෙම සංස්ථාවේ කෙටුම්පත් යෝජනාව ස්වදේශභාර ඇමතිවර බුලිගින්ගේ සභාපතිත්වයෙන් යුත් කමිසුමක් විසින් කෙටුම්පත් කොට, 1905 අගෝස්තු 6(19) ද සාර්ගේ ප්‍රකාශනය සමග ප්‍රසිද්ධ කරන ලදී. ආණ්ඩුවට මෙම ධූමාව කැඳවීමට නොහැකි වූ අතර බොල්ෂෙවික්වරු එය වර්ජනය කළ යුතු බව කියා සිටියහ. 1905 විප්ලවය විසින් එය අතුගා දමන ලදී.

https://liberationbase.wordpress.com

42 රුසියාවේ ප්‍රවේණිදාස ක්‍රමය 1861 අහෝසි කරන ලදී.

43 වෙන්කළ ඉඩම් — ප්‍රවේණිදාස ක්‍රමය අහෝසි කිරීමෙන් පසුව ගොවීන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන්කළ ඉඩම්ය. මෙම ඉඩම් ගම්බද සමූහයට අයත් වූ අතර වරින් වර ඒවා ගොවීන් අතර නැවත බෙදා දෙන ලදී.

44 ''කූපොන් මහතා'' — ප්‍රාග්ධනය සහ ධනපතීන් හැඳින්වීම සඳහා 1880 ගණන්වලදී සහ 1890 ගණන්වලදී පොදු එකඟත්වය අනුව යොදන ලද පර්යාය පදයකි.

45 සිනොඩ් සභාව — රුසියාවේ සාධර්මික (ඕතොඩොක්ස්) ක්‍රිස්තියානි පල්ලියේ උත්තරීතර පාලක මණ්ඩලයයි.

46 ''සූබර්'' — ඉඩම් හිමි ප්‍රතිගාමීත්වයේ අන්ත දක්ෂිණාංශයේ නියෝජිතයින් හැඳින්වීමට රුසියානු සාහිත්‍ය විසින් යොදන ලද පදයකි.

47 මාහ්වාදය — 19 සියවස අගදී සහ 20 වැනි සියවස මුලදී, බටහිර යුරෝපයේ පුළුල් ලෙස පැතිර ගිය ප්‍රතිගාමී මනෝමූල විඥානවාදී දර්ශනික ප්‍රවණතාවයකි. මේ දර්ශනයේ කර්තෘවරුන් වූයේ ඕස්ත්‍රියානු භෞතික විද්‍යාඥ සහ දර්ශනවාදී අර්නස්ට් මාහ් සහ ජර්මන් දර්ශනවාදී රිචඩ් අවෙනාරියුස්.

48 ඔත්සොව්වාදය — 1905-1907 විප්ලවය පරාජය වීමෙන් අනතුරුව බොල්ෂෙවික් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ඉතා කුඩා කණ්ඩායමක් අතර පැතුරුණු අවස්ථාවාදී ප්‍රවණතාවයකි. තෙවැනි රාජ්‍ය ඩූමා සභාවෙන් නියෝජිතවරුන් ආපසු කැඳවන ලෙසත්, නීත්‍යානුකූල බහුජන සංවිධානවල වැඩකිරීම ප්‍රතික්ෂේප කරන ලෙසත් ඔව්හු ඉල්ලා සිටියහ.

49 1905-1907 විප්ලවයේ පරාජයෙන් අනතුරුව ලික්විඩේටර් ප්‍රවණතාවය මෙන්ෂෙවික් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන් අතර දක්නට තිබිණි.

කම්කරු පංතියේ නීත්‍යානුකූල නොවන විප්ලවවාදී පක්ෂයේ (දියකර හැරිය) අහෝසි කළ යුතු යැයි ලික්විඩේටර්වාදීහු කියා සිටියහ.

සාර්වාදයට විරුද්ධව විප්ලවීය සටන් කිරීම අතහැර දමන ලෙස ඉල්ලා සිටි ලික්විඩේටර්වරු ''අපාක්ෂික කම්කරු සමුළුවක්'' කැඳවීමටත්, එමගින් අවස්ථාවාදී පුළුල් කම්කරු පක්ෂයක් ගොඩනැඟීමටත් බලාපොරොත්තු වූහ. එවැනි පක්ෂයක් විප්ලවවාදී උද්යෝග

පාය ඉවත දමන අතර සාර් ආණ්ඩුවේ අවසරය පරිදි නීත්‍යානුකූල කටයුතුවල පමණක් යෙදෙනු ඇත. කම්කරු පොදු ජනතාව අතර ලික්විඩේටර්වාදය සාර්ථක නොවීය. රු. ස. ප්‍ර. ක. පක්ෂය 1912 ජනවාරි මස ප්‍රාග්හිදී පවත්වන ලද සමුළුවේදී ලික්විඩේටර්වරුන් පක්ෂයෙන් නෙරපා දමන ලදී.

50 ශමනවාදය (ක්වියෙටිස්ම්) — නිෂ්ක්‍රීය උපනිද්ධ්‍යානයක් උගන්වන ආගමික සහ ආචාර ධර්මික දර්ශනයකි. ලෞකික කටයුතුවලට සහභාගි නොවීම, ''දෙවියන්ගේ කැමැත්තට'' සම්පූර්ණ ලෙස යටත්වීම මින් උගැන්වේ.

51 වංශවතුන්ගේ එක්සත් මණ්ඩලය — 1906 මැයි මස සිට 1917 ඔක්තෝබර් මස දක්වා පැවැති ප්‍රවේණිදාසයන් සතු ඉඩම් හිමියන්ගේ ප්‍රතිවිප්ලවවාදී සංවිධානයකි.

52 දෙසැම්බරවාදියෝ — 1825 දෙසැම්බර් 14 ද කැරැල්ලක් ඇතිකළ ප්‍රවේණිදාසරදළ විරෝධී, සර්වබලධාරීත්වය විරෝධී, රුසියානු විප්ලවවාදී කුලීනයෝය.

53 රාස්නොචින්ට්සි (සාමාන්‍යයෝ) — කුලීනයින්ට අයත් නොවන, නගරබද පහත් පංතිවලටත්, පූජකයින්ටත්, වෙළෙඳුන්ටත්, ගොවීන්ටත් අයත් උගත් ජන කොටස් මෙනමින් හැඳින්විණි.

54 ''ප්‍රලෝග්'' (ප්‍රස්ථාවනා) නැමැති නවකතාවෙන් කොටසක් ලෙනින් උපුටා දක්වයි. එහි කතුවරයා නි. ග. චෙර්නිෂෙව්ස්කිය.

55 කාල් මාක්ස්ගේ ''රහස්‍ය පණිවුඩය'' සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස්ගේ ''සංක්‍රමණ සාහිත්‍යය. I. පෝලන්ත ප්‍රකාශනය'' කියවන්න.

56 ලසාල්වාදියෝ — 1863 සමස්ත ජර්මන් කම්කරු සංගමය පිහිටවූ සුළු ධනපති සමාජවාදියකු වූ ෆර්ඩිනාන්ඩ් ලසාල්ගේ අනුගාමිකයෝය. සර්වජන ඡන්දය දිනාගැනීම සිය දේශපාලන පරමාර්ථය ලෙස මෙම සංගමය විසින් ප්‍රකාශ කැරිණි. ආණ්ඩුවේ පිහිටාධාරය ඇතිව නිෂ්පාදක කම්කරු සංගම් බිහිකිරීම එහි ආර්ථික වැඩ පිළිවෙළ විය. සිය ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයේදී ලසාල් සහ ඔහුගේ අනුගාමිකයෝ ප්‍රුසියානු ආධිපත්‍යයට හැඩ ගැසුණු අතර බිස්මාක් ආණ්ඩුවේ මහා ජාතිවාදයට ආධාර දුන්හ. කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස් ලසාල්වාදය ජර්මන් කම්කරු පංතික ව්‍යාපාරයේ අවස්ථාවාදී ප්‍රවණතාවයක් ලෙස පෙන්වා දෙමින් එහි න්‍යායය, උපක්‍රම සහ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සංවිධානාත්මක මූලධර්ම කීප වරක්ම තියුණු ලෙස විවේචනය කළහ.

57 පැනමා — විකිණීමේ හා මිලදී ගැනීමේ පර්යාස වචනයකි. ප්‍රංශ සමාගමත් විසින් පැනමා ඇල ඉදිකිරීමේදී දේශපාලන හා රාජ්‍ය නායකයින්ද, නිලධාරීන් පුවත්පත්ද මිලදී ගැනීම හෙළිදරවු කිරීම හා සමග 1892-1893 දී සම්බන්ධ වූ සිද්ධීන් ගැනය.

58 ''සොට්සියාල්-ඩිමොක්‍රාට්'' — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ (රු. ස. ප්‍ර. ක. ප.) නීතිවිරෝධී මධ්‍යම පුවත්පතය. 1908-1917 අවුරුදුවලදී පළ විය.

''කොමියුනිස්ට්'' — වී. අයි. ලෙනින් විසින් සංවිධානය කරන-ලද සහරාවකි. 1915 දී ''සොට්සියාල් ඩිමොක්‍රාට්'' කර්තෘ මණ්ඩලය විසින් මෙය ප්‍රසිද්ධ කරන ලදී.

59 ''සං. ක. වරු'' — සංවිධායක කමිටුවේ අනුගාමිකයෝ — 1912 දී ලික්විඩේටර් වරුන්ගේ අගෝස්තු සමුළුව විසින් පත්කරන ලද සංවිධාන කමිටුව (සං. ක.) වටා රැස්වූ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී මෙන්-ෂෙවිකයෝය.

60 ''රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ සංවිධායක කමිටුවේ විදේශගත ලේකම් මණ්ඩලයේ ඉස්වේස්තියා'' — මෙන්-ෂෙවික් පුවත්පතකි. 1915-1917 ජිනීවා හි පළ කරන ලද්දකි.

61 යුද්ධ කර්මාන්ත කමිටු සාර්වාදයට යුද්ධ කිරීමට ආධාර දෙනු පිණිස මහා පරිමාණ කර්මාන්ත ධනපති පංතිය විසින් 1915 දී රුසියාවේ සාදන ලදී. කම්කරුවන් තම බලපෑමට යටකැර ගැනීමට වෑයම් කළ ධනපතිහු මේ කමිටුවලට අනුබද්ධ කම්කරු කණ්ඩායම් සංවිධා-නය කරමින් ඔවුන් තුළ රට රැකීමේ මනෝභාවයක් රෝපණය කිරීමට උත්සාහ ගත්හ. රුසියාවේ ධනපති පංතිය සහ නිර්ධන පංතිය අතර ''පංතිමය සාමයක්'' උදා වී ඇති බව පෙන්වීමට තැත් කළහ. මේ කමිටු වර්ජනය කළ යුතු යැයි බොල්ෂෙවික්වරුන් කියා සිටි අතර කම්කරු බහුතරයේ ආධාරය ඇතිව එම වර්ජනය සාර්ථක විය.

62 චෙහෙයිඩ්සෙ ප්‍රැක්ෂනය — හතරවැනි රාජ්‍ය දූමාව තුළ එන්. එස්. චෙහෙයිඩ්සෙගේ නායකත්වයෙන් යුත් මෙන්ෂෙවික් ප්‍රැක්ෂනයය.

63 ''නාෂෙ දියල'' — මෙන්ෂෙවිකයින්ගේ මාසික සහරාවය. ලික්විඩේටර් වරුන්ගේ ප්‍රධාන සහරාව විය. 1915 සිට පිටර්බුර්ගයේ පළ විය.

''ගෝලස් ත්රුද'' — 1916 සමාරාහි ප්‍රසිද්ධ කළ නීත්‍යානුකූල මෙන්ෂෙවික්වාදී සහරාවකි.

64 සංස්කෘතික-අධ්‍යාපනික සංවිධානය (හෙවත් ප්‍රොලෙත්කුල්ත්) 1917 සැප්තැම්බර් මාසයේදී ස්වාධීන ස්වෛරී කම්කරු සංවිධානයක් ලෙස බිහි විය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් අනතුරුව ප්‍රොලෙත්කුල්ත් සංවිධානය සිය ස්වාධීනත්වය ආරක්ෂා කරමින්, සිය සංවිධානය නිර්ධන පංතික රජයට විරුද්ධව ඉදිරිපත් කළේය. අතීතයෙන් ලැබුණු සංස්කෘතික දයාදය සම්පූර්ණයෙන්ම පාහේ ප්‍රතික්ෂේප කළ ප්‍රොලෙත්කුල්ත්වරු පොදුජන සංස්කෘතික සහ අධ්‍යාපනික වැඩවලින් ඈත්වී කොන්වීමට උත්සාහ ගත්හ. සැබෑ ජීවිතයෙන් කොන්වූ විශේෂ ''නිර්ධන පංතික සංස්කෘතියක්'' ''පර්යේෂණාගාර මාර්ග'' අනුව නිර්මාණය කිරීමට උත්සාහ ගත්හ.

ප්‍රොලෙත්කුල්ත් සජාතීය සංවිධානයක් නොවීය. ප්‍රොලෙත්කුල්ත් සංවිධානවල උසස් නායකත්වයට පත්වුණු බුද්ධිමතුන් හැරුණු විට, එයට බොහෝ කම්කරු තරුණයෝදි අයත් වූහ. සෝවියට් රජයට සංස්කෘතික ඉදිකිරීම්වලදී අවංක ලෙසම ආධාර කිරීමට මේ තරුණයෝ ඉදිරිපත් වූහ. ප්‍රොලෙත්කුල්ත් සංවිධාන 1932 දක්වා ක්‍රියා-කාරී විය.

නිර්ධන පංතික සංස්කෘතික අධ්‍යාපනික සංවිධානවල පළමුවැනි සමස්ත රුසියානු සාකච්ඡාව 1918 සැප්තැම්බර් 15-20 මොස්කව්හි පැවැත්විණි. එම සාකච්ඡාව ලෙනින්ට එවූ ශුභ පැතුම් වලට පිළිතුරු වශයෙන් ලෙනින් මෙහි සටහන් ලිපිය යැවීය.

65 කළු ශතක — විප්ලවවාදී ව්‍යාපාරයට විරුද්ධව සටන් කිරීම සඳහා සාර් පොලිසිය විසින් සාදන ලද රාජාණ්ඩුවාදී මැරවර කණ්ඩායම්ය. කළු ශතකයට අයත් වූවෝ විප්ලවවාදීන් මරා දැමූහ. ප්‍රගතිශීලී බුද්ධිමතුන්ට පහර දුන්හ, යුදෙව් සංහාර ඇති කළහ.

66 මෙන්ෂෙවිකයෝ — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සුළු ධනපති, අවස්ථාවාදී ප්‍රවණතාවයක නියෝජිතයෝය. ඔවුහු කම්කරු පංතිය තුළ ධනවාදී බලපෑම පැතිර වූහ. 1903 අගෝස්තු මාසයේදී පවත්-වන ලද රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ (රු. ස. ප්‍ර. ක. ප.) දෙවැනි සමුළුවේදී ඔවුනට මෙන්ෂෙවික් (අල්පතරය) යන නම ලැබුණේ, සමුළුව අවසානයේදී මධ්‍යම ආයතනවලට නියෝජිතයින් තෝරාපත් කැර ගැනීමේදී පදවිවලින් අල්පතර සංඛ්‍යාවත් ලැබුණු නිසාය. ලෙනින්ගේ නායකත්වයෙන් යුත් විප්ල-

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට බහුතරයක් ලැබුණු නිසා ඔවුන් බොල්ෂෙවික් වරුන් හැටියට හැඳින් විණි. මේ අනුව බොල්ෂෙවික්, මෙන්ෂෙවික් නමින් ප්‍රවණතා දෙකක් ඇති විය.

ධනපති පංතිය සමග නිර්ධන පංතියේ එකඟතාවයක් ඇති කිරීමට මෙන්ෂෙවිකයෝ උත්සාහ ගත්හ. කම්කරු පංති ව්‍යාපාරය තුළ අවස්ථාවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළහ. 1917 පෙබ්‍රවාරි මාසයේදී ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් අනතුරුව, එස්එර් වරුන් සමග එක්වී තාවකාලික ආණ්ඩුවට රිංගා ගත්හ. අධිරාජ්‍යවාදී දේශපාලන ප්‍රතිපත්තියට ආධාර කළ මෙන්ෂෙවිකයෝ නැගී එන නිර්ධන පංතික විප්ලවයට විරුද්ධව කටයුතු කළහ.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් අනතුරුව මෙන්ෂෙවිකයෝ විවෘත ප්‍රතිවිප්ලවවාදී පක්ෂයක් ලෙස පෙනී සිටියහ. සෝවියට් ආණ්ඩුව පෙරළා දැමීම සඳහා කැරළි හා කුමන්ත්‍රණ සංවිධාන කරමින් ඒවාට සහභාගි වූහ.

67 මෙහිදී ලෙනින් සඳහන් කරන්නේ පෙත්රොග්‍රාදය පාවාදීම ගැනය. එය මෙහෙයවන ලද්දේ සෝවියට් විරෝධී කණ්ඩායම් සහ රහස්‍ය වරපුරුෂ සංවිධානවල ක්‍රියාකාරිත්වය එක්සත් කළ ''ජාතික මධ්‍යස්ථානය'' නැමැති ප්‍රතිවිප්ලවවාදී සංවිධානය විසිනි. 1919 ජූනි 14 ද පෙත්‍රොග්‍රාද් අසල ක්‍රාස්නය ගෝර්ක බලකොටුවේදී කැරැල්ලක් ඇති කළහ. ප්‍රතිවිප්ලවවාදීන්ගේ බලාපොරොත්තුව වූයේ ක්‍රොන්ෂ්ටාඩ් බලපවුරු දුර්වල කොට, යුද පෙරමුණේ ප්‍රතිප්‍රහාරය ගැළපෙන සේ තම කැරැල්ල ඇතිකර එමගින් පෙත්‍රොග්‍රාඩය අල්ලා ගැනීමය. කුමන්ත්‍රණය හෙළිකරන ලදී. කුමන්ත්‍රණයේ නායකත්වය දැරූ ප්‍රතිවිප්ලවවාදී සංවිධානය විනාශ කර දමන ලදී.

68 ලෙනින් අදහස් කරන්නේ දෙවැනි (බර්න්) ජාත්‍යන්තරයයි. 1919 පෙබ්‍රවාරි මාසයේදී බර්න් නගරයේ හමුවූ බටහිර යූරෝපීය රටවල සමාජවාදී පක්ෂවල නායකයෝ මෙම ජාත්‍යන්තරය පිහිටුවා ගත්හ. පළමුවැනි ලෝක මහා යුද්ධය පටන් ගනිත්ම, අභාවයට ගිය දෙවැනි ජාත්‍යන්තරය වෙනුවට ය, මෙය පිහිටුවා ගත්තේ.

69 සදෝවය හි සටන 1866 ජූලි 3 ද සිදුවිය . එම සංග්‍රාමයේදී ඕස්ත්‍රියානු හමුද පරදවා ප්‍රැසියානු සමුද ජය ලැබීය. ඉන් ඕස්ට්‍රො-ප්‍රැසියානු යුද්ධය සමාප්තියට පත්විය.

70 මහජන කොමසාරිස් මණ්ඩලය 1919 මාර්තු 16 ද පැනවූ ආඥවක් අනුව, පාරිභෝගික සමූපකාර සියල්ල එක්සත් කොට, ''පරිභෝජකයින්ගේ කොමියුන'' නමින් බෙද හැරීමේ එකම මධ්‍යස්ථානයක් ප්‍රතිසංවිධාන කළේය. සමහර ප්‍රදේශවල ගොවීන් අතර මෙම නම නිසා එක්තරා වැරදි මතයක් ඇතිවිය. සමස්ත රුසියානු මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුව, එම ආඥව සම්මත කරමින් 1919 ජූනි 30 ද ''පරිභෝජකයින්ගේ කොමියුනය'' නැමැති නාමය ජනතාවට හුරු පුරුදු නමක් වන ''පරිභෝජකයින්ගේ සංගමය'' ලෙස ප්‍රති සංවිධානය කළේය.

71 1920 ඔක්තෝබර් 5 ද සිට 12 ද දක්වා මොස්කව්හි පවත්වන ලද සමස්ත රුසියානු ප්‍රොලෙත්කුල්ත් පළමුවැනි සමුළුව ගැනය.

72 කෙරෙන්ස්කිවාදය — එස්එර්වාදියකු වන කෙරෙන්ස්කි නමින් ඇති වූවකි. 1917 පෙබ්‍රවාරි මාසයේ ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් අනතුරුව ධනපති තාවකාලික ආණ්ඩුවේ නායකයා වූයේ කෙරෙන්ස්කිය.

73 ''පොද් ස්නාමෙනෙම් මාක්සිස්මා'' (මාක්ස්වාදයේ ධජය යටතේ) — සටන්කාමී ද්‍රව්‍යවාදය සහ අනීශ්වරවාදය ප්‍රචාරය කරන දර්ශනික හා සමාජ ආර්ථික සඟරාවකි. 1922-1944 වසරවලදී මොස්කව්හි ප්‍රසිද්ධ කරන ලදී.

74 ප්‍රෙඩරික් එංගල්ස් ''සංක්‍රමණ සාහිත්‍යය''.

75 ''එකොනොමිස්ට්'' — රුසියානු තාක්ෂණික සංගමයේ කර්මාන්ත-ආර්ථික අංශයේ සංගරාවය. මෙම සංවිධානයට සෝවියට් ආණ්ඩුව කෙරෙහි සතුරුකම් දක්වා බුද්ධිමතුන්ද කර්මාන්ත ආයතන ආදියේ පැරණි අයිති කරුවෝද ඇතුළු වූහ. 1921-1922 වසරවලදී පිටර්බුර්ගයේ පළ කරන ලදී.

76 ග්ලාව්ප්‍රොපොබ්ර් — වෘත්තීය අධ්‍යාපනයේ ප්‍රධාන කළමණා කරණය.

77 බ්‍රෙස්ට් සාම ගිවිසුම — සෝවියට් රුසියාව සහ සිවු හවුල (ජර්මනිය, ඔස්ට්‍රො-හන්ගේරියාව, බල්ගේරියාව සහ තුර්කිය) අතර 1918 මාර්තු 3 ද බ්‍රෙස්ට්-ලිතොව්ස්ක්හි අත්සන් තැබූ සාම ගිවිසුමය. සෝවියට් රුසියාවට එම සාම කොන්දේසි ඉතා අහිතකර විය. රාජාණ්ඩුව පෙරළා දැමූ 1918 ජර්මනියේ නොවැම්බර් විප්ලවයට අනතුරුව, සමස්ත රුසියානු මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුව නොවැම්බර් 13 ද කොල්ලකාරී බ්‍රෙස්ට් සාම ගිවිසුම අහෝසි කළේය.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

78 නව ආර්ථික ප්‍රතිපත්තිය — ධනවාදයේ සිට සමාජවාදය කරා පරිවර්තන අවධියේදී නිර්ධන පංතික රජයේ ආර්ථික ප්‍රතිපත්තිය මෙනමින් හැඳින් විණි. මෙය නව ප්‍රතිපත්තිය ලෙස හැඳින් වූයේ විදේශීය යුද්ධ හමුදවල ආක්‍රමණය සමයේදී සහ පූරවැසි යුද්ධ සමයේදී සෝවියට් ආණ්ඩුව ක්‍රියාවට යෙදවූ "යුද්ධ කොමියුනිස්ට්-වාදයට" වඩා වෙනස් බැවිනි (මෙය එනමින් ඉතිහාස ගතවී ඇත).

මූලික ආර්ථික තත්ත්වය නිර්ධන පංතික රජය සතුව පවතිද්දී, නව ආර්ථික ප්‍රතිපත්තිය යටතේ සීමාසහිත පරිමාදණයක් තුළ එක්තරා කාලයකට ධනපති කොටස්වල පැවැත්මට ඉඩ හරින ලදී. මින් අදහස් කළේ නිෂ්පාදන බලවේගයන් වර්ධනය කිරීමත්, කෘෂිකර්මය නගා සිටුවාලීමත්, සමාජවාදී කර්මාන්තය ඉදිකිරීම සඳහා අවශ්‍ය අරමුදල් සංකේන්ද්‍රණය කිරීමත්ය.

නාමාවලිය

අන්තෝනි වොලින්ස්කි (1863-1936) — රුසියානු (ඕතොඩොක්ස්) සාධර්මික ක්‍රිස්තියානි පල්ලියේ උග්‍ර දක්ෂිණාංශයේ නායකයාය. සාර්වාදී ප්‍රතිගාමී දේශපාලන ප්‍රතිපත්ති ක්‍රියාවට යෙදවූ එක් ප්‍රමුඛ නායකයෙකි. — පිටු 64, 65, 71.

අයින්ස්ටයින් (Einstein), ඇල්බට් (1879-1955) — ශ්‍රේෂ්ඨතම භෞතික විද්‍යාඥයෙකි. සාපේක්ෂතා න්‍යායය බිහිකිරීමද, ප්‍රකාශ විද්‍යා ක්ෂේත්‍රයේ ක්වාන්ට් න්‍යායික සොයාගැනීම්ද සඳහා ඔහු සිය ජීවිත කාලය යෙදවීය. — පිටු 177, 181

ඇක්සල්රොඩ්, පාවෙල් බරිසවිච් (1850-1928) — මෙන්ෂෙවික්වාදයේ එක් නායකයෙකි. පළමුවැනි ලෝක මහා යුද්ධ කාලයේදී මධ්‍යමවාදී වාග් පාඨවලට සැඟවී, සමාජ-ජාත්‍යෝන්මාදවාදී ප්‍රතිපත්තියක් මුළුමනින්ම වාගේ අනුගමනය කළේය. 1917 පෙබරවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් ඉක්බිතිව පෙත්‍රොග්‍රාද් සෝවියට් සභාවේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයකු බවට පත්විය. ධනපති තාවකාලික ආණ්ඩුවට ආධාර කළේය. — පිටුව 93.

එංගල්ස් (Engels), ෆ්‍රෙඩ්රික් (1820-1895) — විද්‍යාත්මක කොමියුනිස්ට්වාදයේ මූලාරම්භකයෙකි. ජාත්‍යන්තර නිර්ධන පංතියේ නායකයෙකි. ගුරුවරයෙකි. කාල් මාක්ස්ගේ මිතුරා සහ සගයාය. — පිටු 6, 12, 13, 44, 47, 50, 73, 86, 97, 98, 99, 100, 101, 105, 106, 177, 178.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කෞට්ස්කි (Kautsky), කාල් (කා. කෞ.) (1854-1938) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සහ දෙවැනි ජාත්‍යන්තරයේ නායකයෙකි. මුලදී මාක්ස්වාදියකු විය. 1914 සිට මාක්ස්වාදය පාවා දුන්නේය. අවස්ථාවාදයේ ඉතාම භයානක සහ හානිදායක ආකාරය වන මධ්‍යවාදයේ න්‍යායාචාර්ය වරයාය. — පිටු 19—20, 92—94, 98, 99, 100, 127, 134, 195

කිස්ත්‍යකොව්ස්කි, බග්දන් අලෙක්සාන්ද්‍රවිච් (1868-1920) — කැඩෙට්වාදියෙකි. දේශපාලන සාහිත්‍ය ප්‍රචාරකයෙකි. — පිටුව 57.

කා. කෞ — කෞට්ස්කි සටහන බලන්න.

කාන්ත් (Kant), ඉම්මනුයිල් (1724-1804) — ජර්මන් දර්ශනවාදියෙකි; ජර්මන් ආචීර්ණකල්පික විඥානවාදයේ මූලාරම්භකයෙකි. — පිටුව 48.

කරවූලව් වි. ඒ. (1854-1910) — කැඩෙට්වාදියෙකි. සාර්ගේ තෙවැනි රාජ්‍ය දූමා සභාවේ මන්ත්‍රීවරයෙකි. — පිටුව 66.

කත්කොව්, මිහයිල් නිකිපරවිච් (1818-1887) — රුසියානු ප්‍රතිගාමී දේශපාලන සාහිත්‍ය ප්‍රචාරකයෙකි. — පිටුව 65.

කොල්චාක්, අලෙක්සාන්දර් වසිලෙවිච් (1873-1920) — සාර්ගේ නෞකා හමුදුවේ අද්මිරාල් කෙනෙකි. රාජාණ්ඩුවාදියෙකි. 1918-1919 රුසියානු ප්‍රතිවිප්ලවවාදයේ එක් ප්‍රධාන නායකයෙකි. — පිටු 156, 166.

ක්‍රෙස්තොව්නිකව්, ග්‍රිගොරි අලෙක්සාන්ද්‍රවිච් (උපත 1885) — ඔක්ත්‍යාබර්වාදියෙකි. විශාල කර්මාන්ත හිමියෙකි. ව්‍යාපාර පොළේ කොටස් කරුවෙකි. — පිටුව 85.

ක්‍රොපොත්කින්, පියොතර් අලෙක්සේයවිච් (1842-1921) — රුසියානු විප්ලවවාදියෙකි. භූගෝල ශාස්ත්‍රඥයෙකි. සංචාරකයෙකි. අරාජිකවාදයේ නායකයෙකි, න්‍යායාචාර්යවරයෙකි. මාක්ස්වාදයට විරුද්ධ වූවෙකි. — පිටුව 84.

කුත්ලෙර්, නිකොලායි නිකොලායෙවිච් (1859-1924) — කැඩෙට් පක්ෂයේ නායකයෙකි.සාර්ගේ දූමා II සහ III මන්ත්‍රණසභාවල සාමාජිකයකු විය. — පිටුව 85.

ගුච්කොව්, අලෙක්සාන්දර් ඉවානවිච් (1862-1936) — විශාල ධනපතියෙකි. ඔක්ත්‍යා ස්ට් පක්ෂයේ සංවිධායකයා සහ නායකයාය. පළමුවැනි ලෝක මහා යුද්ධ සමයේදී, මධ්‍යම යුද්ධ-කර්මාන්ත කමිටුවේ සභාපති ධුරය දැරීය. 1917 පෙබ්‍රවාරි ධනපති-ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් පසු ආණ්ඩු පක්ෂයට ඇතුළු විය. — පිටු 25, 85.

ගෙර්ෂෙන්සොන්, මිහයිල් ඕසිපොවිච් (1869-1925) — රුසියානු සාහිත්‍ය විචාරකයෙකි, පුරෝගාමී රුසියානු බුද්ධිමතුන්ගේ ප්‍රජාතන්ත්‍රික සම්ප්‍රදයයන්ට විරුද්ධව ක්‍රියා කළේය. — පිටුව 57.

ගෝගොල්, නිකොලායි වසිලෙවිච් (1809-1852) රුසියානු ගත්කරුවෙකි. රුසියානු සාහිත්‍යයේ විවේචනාත්මක යථාර්ථවාදයට මුල පිරුවන්ගෙන් කෙනෙකි. ඔහු සිය කෘතීන් මගින් ප්‍රවේණිදාස රුසියාවේ ඉඩම් හිමියන්ගේ සහ නිලධාරීන්ගේ ජීවිතය හෙළිදරවු කළේය. සාර් රජුගේ ප්‍රජා පීඩක ස්වෛරී තන්ත්‍රයේ දිරාපත් වූ ස්වභාවය හෙළි කරමින් ඔහු ජනතා අයිතිය සඳහා සටන් කෙළේය. සිය කෘතීන් මගින් උපහාසාත්මක ලෙස අධමත්වය, ප්‍රචණ්ඩකාරීත්වය සහ රැවටීම හෙළා දුටුයේය. එසේ වුවද ගෝගොල් ප්‍රජාතන්ත්‍රවාදයට ස්ථිර ලෙස පක්ෂපාත නොවීය. ඔහුගේ ජීවිතයේ අවසාන භාගයේදී ඔහුගේ දෘෂ්ටිය වඩාත් ප්‍රතිගාමී විය. 1847 ඔහු විසින් ලියන ලද ''මිතුරන්ට ලියූ ලිපිවලින් තොරාගත් කොටස්'' වලින් එම ප්‍රතිගාමී අදහස් කැපී පෙනිණි. බෙලින්ස්කි ගෝගොල්ට ලිපියක් ලියමින් එම මත දැඩි විවේචනයට හසු කළේය. — පිටු 59, 60.

ග්වස්දියොව්, කුස්මා අන්තෝනවිච් (උපත 1883) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. මෙන්ෂෙවික-ලික්විඩේටර්වාදියෙකි. පළමුවැනි ලෝක මහා යුද්ධ කාලයේදී සමාජ-ජාතොන්මාදවාදියෙකි. මධ්‍යම යුද්ධ-කර්මාන්ත කමිටුවේ කම්කරු කණ්ඩායමේ සභාපති ධුරය ඉසිලීය. — පිටු 103, 105.

චාදයෙව්, පියෝතර් යාකව්ලෙවිච් (1794-1856) — රුසියානු විඥානවාදී දර්ශනිකයෙකි. සාර්ගේ ස්වෛරී තාන්ත්‍රික ප්‍රවේණිදාස ක්‍රමය ඉතා දැඩි ලෙස විවේචනයට හසු කළ නිසා උම්මත්තකයකු ලෙස ප්‍රකාශ කරන ලදී. — පිටුව 59.

චෙර්නෙන්කොව්, බී. එන්. (උපත 1883) — 1903 සිට එස්ආර් පාක්ෂිකයකු විය. 1919 දී සෝවියට් පාලනයට විරුද්ධව අවිගත් සටන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කිරීම ප්‍රතික්ෂේප කළ ''නරෝද්'' කණ්ඩායමට අයත් විය. — පිටුව 140.

චෙර්නිෂෙව්ස්කි, නිකොලායි ගව්රීලවිච් (1828-1889) — රුසියානු විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදියෙකි, විද්‍යාඥයෙකි, ලේඛකයෙකි, සාහිත්‍ය විවේචකයෙකි. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සම්භාවනීය පුරෝගාමියෙකි. — පිටු 59, 85, 176.

චඛෙන්කෙලි, අකාකි ඉවානවිච් (1874-1959) — සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, මෙන්ෂෙවිකයෙකි. පළමුවැනි ලෝක මහා යුද්ධ සමයේදී සමාජ-ජාත්‍යෝන්මාදවාදියෙකි. — පිටුව 97.

චඛෙයිද්සෙ, නිකොලායි සෙමියෝනවිච් (1864-1926) — මෙන්ෂෙවික්වාදයේ නායකයෙකි. පළමුවැනි ලෝක මහා යුද්ධ කාලයේදී මධ්‍යස්ථ වාදියෙකි. IV දූමා සභාවේ මෙන්ෂෙවික් කණ්ඩායමේ නායකයා විය. — පිටු 103, 105.

ට්‍රොට්ස්කි (බ්‍රොන්ෂ්ටෙයින්), ලෙව් දවිදවිච් (1879-1940) — සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, මෙන්ෂෙවිකයෙකි. 1905-1907 රුසියන් විප්ලවයෙන් අනතුරුව ලික්විඩේටර්වාදයට නැඹුරු විය. යුද්ධය, සාමය හා විප්ලවය පිළිබඳ ප්‍රශ්නවලදී ලෙනින්ට සහ බොල්ෂෙවික්වරුන්ට විරුද්ධව සටන් කළේය. පළමුවැනි ලෝක මහා යුද්ධ කාලයේදී මධ්‍යස්ථ ස්ථාවරයක් දැරිය. 1917 දී බොල්ෂෙවික් පක්ෂයට බැඳුනේය. එසේ වුවද ට්‍රොට්ස්කි බොල්ෂෙවිකයකු නොවිය. ලෙනින්ට හා බොල්ෂෙවික් පක්ෂයේ ප්‍රතිපත්තිවලට විරුද්ධව රහස්‍ය ලෙසත් විවෘත ලෙසත් සටන් කළේය.

ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට ඉක්බිතිව උසස් නිල කීපයක්ම දැරිය. පක්ෂයේ පොදු ප්‍රතිපත්තියට සහ සෝවියට් සංගමය තුළ සමාජවාදය ගොඩ නගනවාට විරුද්ධව ක්‍රියා කළේය. 1927 දී ට්‍රොට්ස්කි බොල්ෂෙවික් පක්ෂයෙන් නෙරපාන ලදී.1929 රටින් පිටුවහල් කරන ලදී. 1932 දී ට්‍රොට්ස්කිගේ සෝවියට් රටවැසිභාවය අවලංගු කරන ලදී. — පිටු 93,-95, 175.

ඩීට්ස්ගෙන් (Dietzgen), ජොසප් (1828-1888) — ජර්මන් කම්කරුවෙකි, සම්භාවනීය සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, දර්ශනවාදියෙකි. ස්වාධීනව දයලෙක්තික භෞතිකවාදය සාක්ෂාත් කර ගත්තේය. — පිටුව 176.

ඩීට්ස්ගෙන් (Dietzgen), යෙව්ගේනි (1862(1930) — ජර්මන් දර්ශනවාදියෙකි. ජොසප් ඩීට්ස්ගෙන්ගේ පුත්‍රයාය. සිය පියාගේ දර්ශනය නිරපේක්ෂ ලෙස සැලකූ ඔහු එයින් මාක්ස්වාදයේ අඩුතැන් පිරවිය යුතු බව සිතීය. ද්‍රව්‍යවාදය මෙන්ම දයලෙක්තිකයද නොපිළිගත්තේය. — පිටුව 176.

ඩූරිං (Dühring), යුජින් (1833-1921) — ජර්මන් දර්ශනවාදියෙකි, අර්ථ ශාස්ත්‍රඥයෙකි. සුළු ධනපති දෘෂ්ටිවාදියෙකි. පාරභෞතික ද්‍රව්‍යවාදී සහ විඥානවාදී ඉන්ද්‍රියානුභූතවාදයේ, සාරසංග්‍රහවාදී මිශ්‍රණයක් ඔහුගේ දර්ශනික පදනම විය. — පිටු 47, 50.

ඩ්‍රෙව්ස් (Drews), ආතර් (1865-1935) — කිතුනු සමයේ මුල්කාලය හැදෑරූ ප්‍රතිගාමී ඉතිහාසඥයෙකි. — පිටු 179, 180,

තිමිරියාසෙව්, අර්කාදි ක්ලිමෙන්තියෙවිච් (1880-1955) — රුසියානු භෞතික විද්‍යාඥයෙකි. මොස්කව් විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙකි. — පිටුව 181.

තොල්ස්තෝයි, ලෙව් නිකොලායෙවිච් (1828-1910) — ශ්‍රේෂ්ඨ රුසියානු ගත්කරුවෙකි. — පිටු 67—72, 79—83.

දබ්රලියූබව්, නිකොලායි අලෙක්සාන්ද්‍රවිච් (1836-1861) — රුසියානු විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදියෙකි. සම්භාවනීය සාහිත්‍ය විවේචකයෙකි. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ පුරෝගාමියෙකි. — පිටුව 59.

දල්ගරුකව්, පාවෙල් ද්මීත්‍රියෙවිච් (1866-1930) — සිටු කුමාරයෙකි. විශාල ඉඩම් හිමියෙකි. කැඩෙට් පක්ෂයේ මූලාරම්භකයෙක් සහ නායකයෙකි. — පිටුව 85.

දවීද් (David), එදුආර්ද් (1863-1930) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ දක්ෂිණාංශයේ නායකයෙකි, සංශෝධනවාදියෙකි. පළමුවැනි ලෝක මහා යුද්ධ කාලයේදී සමාජ-ජාත්‍යෝන්මාදවාදියෙකි. — පිටුව 97.

දෙනීකින්, අන්තොන් ඉවානවිච් (1872-1947) — සාර් හමුදාවේ ජනරාල් කෙනෙකි. 1918-1921 වසරවලදී පැවැති රටවැසි (සිවිල්) යුද්ධ සමයේදී ප්‍රතිවිප්ලවවාදී සුදු හමුදාවල නායකයකු විය. දකුණු රුසියාවේ සෝවියට් විරෝධී යුද්ධ හමුදාවල ප්‍රධාන අණදෙන නිලධාරි

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ධුරය දැරිය. සෝවියට් රතු හමුද විසින් ඔහුගේ හමුද පරාජය කර දැමූ පසු ඔහු විදේශ ගතවිය. — පිටු 156, 157.

දස්තයෙව්ස්කි, ෆියෝදර් මිහයිලවිච් (1821-1881) — සම්භාවනීය රුසියානු ගත්කරුවෙකි. — පිටුව 59.

නැපෝලියන් පළමුවැනි (බොනපාට්) (1769-1821) — 1804-1814 සහ 1815 දී ප්‍රංශයේ අධිරාජයා විය. — පිටුව 195.

නිකොලායි දෙවැනි (රොමානව්) (1868-1918) — 1894-1917 රුසියානු අධිරාජයා විය. — පිටු 84, 88.

පබෙදනොස්ට්සෙව්, කොන්ස්තන්තින් පිත්රෝවිච් (1827-1907) — සාර් රුසියාවේ ප්‍රතිගාමී රාජ්‍ය පාලකයෙකි. ආණ්ඩුවේ සැබෑ නායකයා විය. අලෙක්සාන්දර් III සාර්ගේ පාලන සමයේදී ප්‍රචණ්ඩ-දස ප්‍රතිගාමීත්වයේ ප්‍රධාන ආශ්වාදකයා විය. නිකොලායි II සාර්ගේ පාලන කාලයේදීත් උසස් ක්‍රියා කලාපයක් ඉටු කළේය. — පිටුව 62.

පෙත්ලියුරා, සිමොන් වසිලියෙවිච් (1877-1926) — උක්රයිනයේ ධනපති ජාතිවාදීන්ගේ නායකයෙකි. විදේශීය අධිරාජ්‍යවාදී ආක්‍රමණයේදී රටවැසි (සිවිල්) යුද්ධ කාලයේදී උක්රයින ප්‍රතිවිප්ලවවාදයේ එක් නායකයෙකි. — පිටුව 166.

පොත්රෙසොව්, අලෙක්සාන්දර් නිකොලායෙවිච් (1869-1934) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. මෙන්ෂෙවික්වාදයේ නායකයෙකි. ලික්විඩේටර්වාදයේ න්‍යායාචාර්ය වරයා ය. පළමුවැනි ලෝක මහා යුද්ධ සමයේදී සමාජ-ජාත්‍යෝන්මාදවාදියකු බවට පත් විය. — පිටු 97, 103, 105.

ෆොයර්බාහ් (Feuerbach), ලුද්විග් අන්ද්‍රෙයස් (1804-1872) — සම්භාවනීය ජර්මන් ද්‍රව්‍යවාදී දර්ශනාචාර්ය වරයෙකි, අනීශ්වරවාදියෙකි. — පිටුව 6.

ෆොෂ් (Foch), ෆර්දිනාන්ද් (1851-1929) — ප්‍රංශ යුද්ධ සෙන්පතියෙකි. පළමුවැනි ලෝක මහා යුද්ධ සමයේදී යුද්ධ හමුද කීපයක්ම මෙහෙයැවීය. අනතුරුව සෙනවි මණ්ඩලයේ ප්‍රධානියා හැටියටද, ඇන්ටැන්ට හමුදවල ප්‍රධාන අණදෙන සෙන්පතියා ලෙසද පත් විය. — පිටුව 130.

පුරිෂ්කේවිච්, ව්ලදීමිර් මිත්‍රපානවිච් (1870-1920) — විශාල ඉඩම් හිමියෙකි, ප්‍රතිගාමී කළු ශතකයෙකි. රාජාණ්ඩුවාදියෙකි. ඩූමාවේදී යුදෙව් විරෝධී සංහාරය ගැන කතා කිරීම නිසා ප්‍රසිද්ධියක් ලැබීය. — පිටු 86, 88.

ෆ්‍රාන්ක්, එස්. එල්. (1877-1950) — රුසියානු විඥනවාදී දර්ශනිකයෙකි. අර්ථ ශාස්ත්‍රඥයෙකි. කාල් මාක්ස්ගේ අතිරික්ත වටිනාකම පිළිබඳ න්‍යායය විවේචනය කළේය. ප්‍රතිවිප්ලවවාදී ''වෙඛි'' ලිපි මාලාවට හවුල් විය. — පිටු 57, 62.

ප්රුදොන් (Proudhon), පියෙර් ජොසෙප් (1809-1865) — ප්‍රංශ දේශපාලන සාහිත්‍යධරයෙකි. ආර්ථික විද්‍යාව සහ සමාජ විද්‍යාව හැදෑරිය. සුළු ධනපති පංතියේ න්‍යායාචාර්ය වරයෙකි. අරාජිකවාදයේ මූලාරම්භකයෙකි. — පිටුව 20.

ප්‍රකපෝවිච්, සෙර්ගේයි නිකොලායෙවිච් (1871-1955) — රුසියානු ආර්ථික විද්‍යාඥයෙකි, දේශපාලන සාහිත්‍ය ප්‍රචාරකයෙකි. රුසියාවේ බර්න්ෂ්ටයින්වාදය ප්‍රචාරය කළේය. කැඩෙට් පක්ෂයේ සාමාජිකයකු විය. — පිටු 21, 22.

ප්ලෙහානව්, ගියෝර්ගි වලෙන්තිනවිච් (1856-1918) — රුසියානු සහ ජාත්‍යන්තර කම්කරු පංතික ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. ප්‍රචාරයේ පුරෝගාමියා ය.

රු. ස. ප්‍ර. ක. පක්ෂයේ දෙවැනි සමුළුවෙන් (1903) ඉක්බිතිව සමදනවාදී හා අවස්ථාවාදී ස්ථාවරයක් දැරිය. අනතුරුව මෙන්ෂෙවිකයිනට එකතු විය. පළමුවැනි ලෝක මහා යුද්ධ සමයේදී සමාජ-ජාත්‍යෝන්මාදවාදී මත දැරිය.

1917 පෙබ්‍රවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් අනතුරුව ''සමගිය'' නැමැති අන්ත දක්ෂිණාංශික කණ්ඩායමේ නායකයා විය. බොල්ෂෙවික්වාදයට හා සමාජවාදයට විරුද්ධ වූ ඔහු රුසියාව සමාජවාදී විප්ලවයක් සඳහා මුහුකුරා නැතැයි සිතීය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පක්ෂනොවූවද සෝවියට් පාලන බලයට විරුද්ධව සටන් නොකළේය. — පිටු 13, 49, 84, 89, 97, 104, 176.

බග්දනව්, අ. (මලිනොව්ස්කි, අලෙක්සාන්දර් අලෙක්සාන්ද්‍රවිච්) (1873-1928) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, දර්ශනවාදියෙකි, සමාජ විද්‍යාඥයෙකි, අර්ථශාස්ත්‍රඥයෙකි. 1905-1907 විප්ලවයේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පරාජයෙන් ඉක්බිතිව, ඔත්සොවිස්ට් ව්‍යාපාරයේ එක් නායකයකු බවට පත් විය. පක්ෂ විරෝධී ''වපිරියොද්'' කණ්ඩායමේ නායකයා ය. දර්ශනික ප්‍රශ්නවලදී ස්වකීය ක්‍රමයක් වන ''එම්පිරියෝ-මොනිස්ම්'' (මාහ්වාදී දර්ශනයේ මනෝමූලවිඥානික විවිධත්වයකි). ඔහුගේ මෙම ක්‍රමය ලෙනින් සිය ''ද්‍රව්‍යවාදය සහ අනුභූතිවාදී විවේචනය'' මගින් විවේචනයට හසු කළේය. — පිටුව 49.

බර්ක්ලි (Berkeley), ජෝජ් (1685-1753) — ඉංග්‍රීසි ජාතික ප්‍රතිගාමී දර්ශනවාදියෙකි, මනෝමූල විඥනවාදියෙකි. එංගලන්ත සභාවේ රාජගුරුප්‍රසාදී වරයෙකි. — පිටුව 49.

බර්න්ෂ්ටයින් (Bernstein), එදුආර්ද් (1850-1932) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ සහ දෙවැනි ජාත්‍යන්තරයේ උග්‍ර අවස්ථාවාදී අංශයේ නායකයාය. සංශෝධනවාදයේ සහ ප්‍රතිසංස්කරණවාදයේ න්‍යායාචාර්ය වරයා ය. 1896-1898 වසරවලදී "Die Neue Zeit" සඟරාවේ ''සමාජවාදයේ ගැටළු'' නැමැති සිරස් තලය යටතේ ලිපි පෙලක්ම පළ කරමින් විප්ලවවාදී මාක්ස්වාදයේ දර්ශනික, ආර්ථික හා දේශපාලනමය පදනම් සංශෝධනය කිරීමට විවෘත ලෙසම ඉදිරිපත් විය. ධනවාදය යටතේ කම්කරුවන්ගේ ආර්ථික තත්ත්වය යහපත් කිරීම සඳහා ප්‍රතිසංස්කරණ කටයුතුවල යෙදීම කම්කරු පංතික ව්‍යාපාරයේ කාර්ය විය යුතු බව කියා සිටි බර්න්ෂ්ටයින් අවස්ථාවාදී සූත්‍රයක් ඉදිරිපත් කළේය: ''ව්‍යාපාරය හැම දෙයක්ම නියෝජනය කරයි, අවසාන අරමුණු කිසිවක් නියෝජනය නොකරයි.'' — පිටු 13, 48, 53.

බසාරව්, ව්ලදීමිර් අලෙක්සාන්ද්‍රවිච් (1874-1939) — රුසියානු දර්ශනවාදියෙකි, ආර්ථික විද්‍යාඥයෙකි, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයෙකි. 1905-1907 විප්ලව සමයේදී බොල්ෂෙවික්වාදී පුවත්පත් සමග සහයෝගීව කටයුතු කළේය. විප්ලවයේ පරාජයෙන් අනතුරුව බොල්ෂෙවික්වාදයෙන් ඈත් විය. අ. අ. බග්දනව් සමග එකතුව මාහ්වාදී පදනම් අනුව මාක්ස්වාදී දර්ශනය සංශෝධනය කළේය. — පිටුව 49.

බිස්මාක් (Bismarck), ඔත්තො එදුආර්ද් ලියොපොල්ද් (1815-1898) — ප්‍රුසියාවේ සහ ජර්මනියේ රාජ්‍ය නායකයෙකි, රාජ්‍යතන්ත්‍රිකයෙකි. ජර්මන් අධිරාජ්‍යයේ රයික් චාන්ස්ලර් ය. බිස්මාක්ගේ ප්‍රධාන පරමාර්ථය වූයේ කුඩා, විසිර ගිය ජර්මන් රජයන් එක්සත් කොට,

යුන්කර් ප්‍රුසියාවේ අධිපත්‍යය යටතේ එක්සත් ජර්මන් අධිරාජ්‍යයක් බිහි කිරීමය. — පිටුව 88.

බිස්සොලාති (Bissolati), ලෙයොනීද (1857-1920) — ඉතාලි සමාජවාදී පක්ෂයේ එක් ආරම්භකයෙකි. එහි අන්ත දක්ෂිණාංශික ප්‍රතිසංස්කරණවාදී අංශයේ නායකයාය. 1912 දී ඔහු ඉතාලි සමාජවාදී පක්ෂයෙන් නෙරපා දමන ලදී. අනතුරුව ඔහු සමාජ-ප්‍රතිසංස්කරනවාදී පක්ෂයක් ගොඩ නැගීය. පළමුවැනි ලෝක මහා යුද්ධ කාලයේදී සමාජ-ජාත්‍යොන්මාදවාදියකු විය. — පිටුව 103.

බුල්ගාකව්, සෙර්ගේයි නිකොලායෙවිච් (1871-1944) — රුසියානු අර්ථශාස්ත්‍රඥයෙකි, දර්ශනික විඥනවාදියෙකි. කෘෂක ප්‍රශ්නයේදී මාක්ස්ගේ උගැන්වීම් සංශෝධනය කිරීමට ඉදිරිපත් විය. 1905-1907 විප්ලවයෙන් අනතුරුව කැඩෙට්වරුන්ට එකතු විය. දර්ශනික ගුය්වාදයක් දේශනා කළේය. ''වේහි'' නැමැති ප්‍රතිවිප්ලවවාදී ලිපි එකතුවට ලිපි සැපයීය. — පිටු 57, 62.

බූර්සෙව්, ව්ලදීමිර් ල්වෝවිච් (1862-1936) — 1880 ගණන්වල විප්ලවවාදී ව්‍යාපාරයෙහි ක්‍රියාශීලී විය. සාර් පොලිසිය විසින් සිරභාරයට ගත් පසු ඉන් පැන ගොස් විදේශගත විය. එස්එර්වරුන්ට සමීප විය. 1905-1907 විප්ලවයේ පරාජයෙන් ඉක්බිතිව කැඩෙට්වරුන්ට ආධාර කළේය. 1911(1914 කාලවලදී ලිබරල් ධනවාදී ''බුදුෂ්ෂෙයෙ'' (අනාගතය) පුවත්පතේ කර්තෘ ධුරය දැරීය. — පිටු 85

බුල්කින්, පියෝදර් අපනාසියෙවිච් (උපත 1888) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, මෙන්ෂෙවිකයෙකි. පළමුවැනි ලෝක මහා යුද්ධ සමයේදී යුද්ධ-කර්මාන්ත කමිටුවල සේවය කළේය. පසු කලෙක මෙන්ෂෙවික්වාදයෙන් ඈත් විය. රුසියානු කොමියුනිස්ට් පක්ෂයට (බොල්ෂෙවික්) බැඳුණේය. — පිටුව 103.

බෙම්-බාවෙර්ක් (Böhm-Bawerk), යෙව්ගේනි (1851-1914) — අර්ථවිද්‍යාඥයෙකි. දේශපාලන අර්ථ ශාස්ත්‍රයේ ඔස්ත්‍රියානු නිකායේ නියෝජිතවරයෙකි. මෙම නිකායේ නියෝජිතවරු ආර්ථික නියමයන් මනෝමූල සහ විඥනවාදී ලෙස ඉදිරිපත් කරමින් මාක්ස්වාදය පැතිරීමට විරුද්ධව ක්‍රියා කළහ. — පිටු 50, 52.

බෙර්දියායෙව්, නිකොලායි අලෙක්සාන්ද්‍රවිච් (1874-1948) — රුසියානු ප්‍රතිගාමී දර්ශනිකයෙකි, විඥනවාදියෙකි, ගුය්වාදියෙකි, කැඩෙට් පාක්ෂකයෙකි. — පිටුව 57

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

බෙරෙසෝව්ස්කි, ඒ. ඊ. (දූපත 1868) — ඉඩම් හිමියෙකි, කැඩෙට් පාක්ෂකයෙකි. III රාජ්‍ය ඩූමා සභාවේ මන්ත්‍රිවරයෙකි. — පිටු 66

බෙලින්ස්කි, විස්සරියෝන් ග්‍රිගෝරියෙවිච් (1811-1848) — රුසියානු විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදියෙකි. සාහිත්‍ය විචේචකයෙකි, සාහිත්‍ය ප්‍රචාරකයෙකි. ද්‍රව්‍යවාදී දර්ශනවාදියෙකි. රුසියාවේ විප්ලවවාදී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ එක් පුරෝගාමියෙකි. — පිටු 59, 60

බොබ්රින්ස්කි, ව්ලදීමීර් අලෙක්සේයෙවිච් (උපත 1868) — රුසියානු ප්‍රතිගාමී දේශපාලනඥයෙකි. විශාල ඉඩම් හිමියකු සහ සීනි කම්හල් කරුවකු විය. සාර් ආණ්ඩුවේ II, III සහ IV ඩූමා සභාවල නියෝජිතයකු මෙන් පත් විය. — පිටු 86, 88

බ්රුකෙර් (Brouckère), ලුයී දෙ (1870-1951) — බෙල්ජියම් කම්කර පක්ෂයේ නායකයකු සහ න්‍යායාචාර්ය වරයකු විය. පළමුවැනි ලෝක මහා යුද්ධයට පෙර පක්ෂයේ වාමාංශයේ නායකත්වය ඉසිලීය. පළමුවැනි ලෝක මහා යුද්ධ කාලයේදී සමාජ-ජාතෙයාන්මාදවාදියකු බවට පත් විය. — පිටුව 54

මහ්නෝ, නේස්තර් ඉවානොවිච් (1884-1934) — 1918-1921 කාලවලදී සෝවියට් ක්‍රමයට විරුද්ධව උක්රයිනයේ අරාජික-කුලාක් සේනාංක මෙහෙයැවූ ප්‍රතිවිප්ලවවාදී නායකයෙකි. — පිටුව 166

මාක්ස් (Marx), කාල් (1818-1883) — විද්‍යාත්මක කොමියුනිස්ට්වාදයේ මූලාරම්භකයාය. ප්‍රඥාන්විත චින්තකයෙකි. ජාත්‍යන්තර නිර්ධන පංතික ව්‍යාපාරයේ නායකයාය, ගුරුවරයාය. — පිටු 5, 6, 7, 8, 9, 12, 13, 14, 19, 46, 47, 48, 49, 50, 54, 83, 86, 87, 92, 97, 89, 100, 104, 105, 106, 134, 145, 146, 178, 179, 194

මාර්තොව්, එල්. (ට්සෙදෙර්බාඋම්, යූලි ඕසිපවිච්) (1873-1923) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. මෙන්ෂෙවික්වාදයේ නායකයෙකි. 1905-1907 විප්ලවයෙන් ඉක්බිතිව ලික්විඩේටර්වාදය දේශනා කළේය. 1917 පෙබ්‍රවාරි ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයෙන් අනතුරුව ජාත්‍යන්තරවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් අනතුරුව සෝවියට් බලයට විරුද්ධව ක්‍රියා කළේය. — පිටු 93, 96, 127

මාස්ලොව්, පියෝතර් පාව්ලොවිච් (1867-1946) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, මෙන්ෂෙවිකයෙකි. කෘෂක ප්‍රශ්නය පිළිබඳ කෘතීන් කීපයක්ම කළ මොහු මාක්ස්වාදය සංශෝධනය කිරීමට වැයම් කළේය. පළමුවැනි ලෝක මහා යුද්ධ කාලයේදී සමාජ-ජාතෙයාන්මාදවාදියකු විය. — පිටුව 84

මැන් (Mann), ටොම් (1856-1941) — බ්‍රිතාන්‍ය කම්කරු පංතික ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. එංගලන්තයේ ස්වාධීන කම්කරු පක්ෂයේ (1893) නායකයෙකි, මූලාරම්භකයෙකි. එම පක්ෂයේ වාමාංශයේ ක්‍රියාකාරී විය. — පිටුව 98

මෙන්ෂිකොව්, මිහයිල් ඕසිපොවිච් (1859-1919) — රුසියානු ප්‍රතිගාමී දේශපාලන සාහිත්‍ය ප්‍රචාරකයෙකි. — පිටු 64, 84

මියුල්බෙර්ගෙර් (Mülberger), අර්තූර් (1847-1907) — සුළු ධනවාදී මත දරන දේශපාලන සාහිත්‍ය ප්‍රචාරකයෙකි. ප්රුදෝන්ගේ අනුගාමිකයෙකි. ප්‍රංශයේ හා ජර්මනියේ සමාජ චින්තනයේ ඉතිහාසය ගැන කෘතීන් කීපයක්ම කළේය. මාක්ස්වාදය විවේචනය කළේය. — පිටුව 47

යාකොබි (Jacoby), යෝහාන් (1805-1877) — ජර්මන් දේශපාලන සාහිත්‍යධරයෙකි, දේශපාලනඥයෙකි. ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදියෙකි. 1872 ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට බැඳුණේය. එම පක්ෂයෙන් රයික්ස්ටාග් මන්ත්‍රණ සභාවට තෝරා පත් විය. — පිටුව 129

යුදේනිච්, නිකොලායි නිකොලායෙවිච් (1862-1933) — සාර් යුද්ධ හමුදවේ ජනරාල් වරයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් අනතුරුව වයඹදිග ප්‍රතිවිප්ලවවාදී යුද්ධ හමුදවල ප්‍රධාන අණදෙන නිලධාරියා විය. 1919 පෙත්රොග්‍රාඩය අල්ලා ගැනීමට දෙවරක්ම වැයම් කළද අසාර්ථක විය. 1919 දී ඔහු අන්ත පරාජයට පත් විය. — පිටුව 166

යුර්කේවිච්, ලෙව් (1885-1918) — උක්රයින ධනපති ජාතිවාදී අවස්ථාවාදියෙකි. උක්රයින සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකි. — පිටුව 59

රදීෂෙව්, අලෙක්සාන්දර් නිකොලායෙවිච් (1749-1802) — රුසියානු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගත්කරුවෙකි. විප්ලවවාදී ප්‍රචාරකයෙකි. ප්‍රවේණිදාස ක්‍රමයට සහ සාර්ගේ ස්වෛරී තන්ත්‍රයට විරුද්ධව සටන් කළේය. සාර් රාජාණ්ඩුව ඔහු සිරභාරයට ගෙන මරණ දණ්ඩනය නියම කළද, පසුව දස වසරකට සයිබීරියාවට පිටුවහල් කළේය. — පිටුව 85

රිකාඩෝ (Ricardo), ඩේවිඩ් (1772-1823) — ඉංග්‍රීසි ජාතික සම්භාවනීය ආර්ථික විද්‍යාඥයෙකි. ආචීර්ණ කල්පික ධනවාදී දේශපාලන අර්ථශාස්ත්‍රයේ නියෝජිතයෙකි. — පිටුව 8

රෙනොදේල් (Renaudel), පියෙර් (1871-1935) — ප්‍රංශ සමාජවාදී පක්ෂයේ එක් ප්‍රතිසංස්කරණවාදී නායකයෙකි. පළමුවැනි ලෝක මහා යුද්ධ කාලයේදී සමාජ-ජාත්‍යොන්මාදවාදියකු විය. — පිටුව 104

රොදිචෙව්, පියෝදර් ඉස්මයිලොවිච් (1856-1933) — කැඩෙට් පක්ෂයේ නායකයෙකි. I, II, III සහ IV රාජ්‍ය දූමා සභාවල නියෝජිතයකු විය. — පිටු 36, 85

රොමානොව්ලා — 1613 සිට 1917 දක්වා රජ කළ රුසියානු සාර් හා අධිරාජයන්ගේ පෙළපතකි. — පිටුව 86

රොසනොව්, වසිලි වසිලියෙවිච් (1856-1919) — ප්‍රතිගාමී දර්ශනවාදියෙකි, විචාරකයෙකි. විඥානවාදය සහ ගුඨවාදය දේශනා කළේය. — පිටුව 64

රුබනෝවිච්, ඉල්‍යා අදෝල්ෆවිච් (1860-1920) — එස්එර් පක්ෂයේ නායකයෙකි. — පිටුව 84

ලගර්දේල් (Lagardelle), යුබෙර් (1874-1958) — ප්‍රංශ සුළු ධනපති දේශපාලනඥයෙකි. අරාජික-සින්ඩිකේට්වාදියෙකි. — පිටුව 54

ලබ්‍රියෝලා (Labriola) අර්තුරෝ (1873-1959) — ඉතාලි ජාතික දේශපාලනඥයෙකි. ඉතාලි සින්ඩිකේට්වාදී ව්‍යාපාරයේ නායකයෙකි. — පිටුව 54

ලසාල් (Lassalle), ෆර්දිනාන්ද් (1825-1864) — ජර්මන් සුළු ධනපති සමාජවාදියෙකි. ලසාල්වාදය නමින් ප්‍රසිද්ධ වූ ජර්මන් කම්කරු පංතික ව්‍යාපාරයේ අවස්ථාවාදී විවිධත්වයේ මූලාරම්භකයාය. සමස්තජර්මන් වෘත්තීය සමිති සංගමයත් ගොඩ නැගීම ඔහුගේ සේවයක් වුවද, ඔහු එය අවස්ථාවාදී මග ඔස්සේ ගෙන ගියේය. — පිටුව 22

ලෙගීන් (Legien), කාල් (1861-1920) — ජර්මන් ජාතික දක්ෂිණාංශික සමාජවාදියෙකි. වෘත්තීය සමිති ව්‍යාපාරයේ නායකයෙකි. සංශෝධනවාදියෙකි. පළමුවැනි ලෝක මහා යුද්ධ කාලයේදී සමාජ-ජාත්‍යොන්මාදවාදියෙකි. — පිටු 97, 104

ලුනචාර්ස්කි, අනතෝලි වසීලෙවිච් (1875-1933) — සම්භාවනීය සෝවියට් රාජ්‍ය නායකයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයෙන් අනතුරුව සෝවියට් ආණ්ඩුවේ අධ්‍යාපන ඇමති ධුරයට පත් විය. — පිටු 161, 162

ලෙන්ච් (Lensch), පාවුල් (1873-1926) — ජර්මන් ජාතික සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. සමාජ-ජාත්‍යොන්මාදවාදියෙකි. — පිටුව 99

ලොයිඩ් ජෝර්ජ් (Lloyd George), ඩේවිඩ් (1863-1945) — බ්‍රිතාන්‍යයේ රාජ්‍ය නායකයෙකි, රාජ්‍ය තන්ත්‍රිකයෙකි. බ්‍රිතාන්‍ය ලිබරල් පක්ෂයේ නායකයා විය. 1916-1922 බ්‍රිතාන්‍ය අගමැති ධුරය ඉසිලීය. — පිටු 104, 105

වන්දෙර්වෙල්දේ (Vandervelde), එමිල් (1886-1938) — බෙල්ජියම් කම්කරු පක්ෂයේ නායකයාය. ජාත්‍යන්තර සමාජවාදී සංගමයේ දෙවැනි අන්තර්ජාතිකයේ සභාපතිවරයාය. අන්ත අවස්ථාවාදී ස්ථාවරයක් දැරීය. — පිටු 54

වෙබ් (Webb), සිඩ්නි (1859-1947) සහ බියත්‍රිස් (1858-1943) — සුප්‍රසිද්ධ ඉංග්‍රීසි සමාජ සේවකයෝය. ෆේබියන් සමාජයේ මූලාරම්භකයෝය. එංගලන්තයේ කම්කරු පංතික ව්‍යාපාරයේ ඉතිහාසය සහ න්‍යායය පිළිබඳ කෘතීන් කීපයක්ම කළෝය. පළමුවැනි ලෝක මහා යුද්ධ සමයේදී සමාජ-ජාත්‍යොන්මාදවාදීන් වූහ. — පිටුව 100

වයිත්ලිං (Weitling), විල්හෙල්ම් (1808-1871) — ජර්මනියේ කම්කරු පංතික ව්‍යාපාරයේ මුල් කාලයේදී එහි සම්භාවනීය නායකයකු විය. මනෝරාජික සමානාත්ම කොමියුනිස්ට්වාදයේ න්‍යායාචාර්යවරයෙකි. — පිටුව 20

විප්පර්, රොබට් යූර්යේවිච් (1859-1854) — සම්භාවනීය ඉතිහාසඥයෙකි. මොස්කව් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය වරයෙකි. — පිටුව 179

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

වීරාන්ගෙල්, පියොතර් නිකොලායෙවිච් (1878-1928) — සාර් යුද්ධ හමුදාවේ ජනරාල් වරයෙකි. රුසියාවට විරුද්ධව ගෙන ගිය විදේශීය ආක්‍රමණයේදී සහ සිවිල් (රටවැසි) යුද්ධ සමයේදී, දකුණුදිග රුසියාවේ ප්‍රතිවිප්ලවයේ නායකයකු විය. — පිටුව 172

ෂයිඩෙමාන් (Scheidemann), පිලිප් (1865-1939) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදයේ අන්ත දක්ෂිණාංශික අවස්ථාවාදී අංශයේ නායකයෙකි. — පිටු 104 105

ෂෙර්, වී. වී. (1884-1940) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, මෙන්ෂෙවික්-ලික්විඩේටර් වාදියෙකි. — පිටුව 140

ශෙද්‍රින් (සල්තිකෝව්ශෙද්‍රින්), මිහයිල් යෙව්ග්‍රාපවිච් (1826-1889)— රුසියානු උපහාස ගත්කරුවෙකි. විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදියෙකි.— පිටුව 182

සිස්මොන්ඩි (Sismondi), ජාන් ෂාල් ලියෝනාර් සිමොන් දෙ (1773-1842) — ස්විට්සර්ලන්ත ජාතික ආර්ථික විද්‍යාඥයෙකි, ඉතිහාසඥයෙකි. — පිටුව 92

ස්කොබෙලෙව්, මත්වෙයි ඉවානොවිච් (1885-1939) රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, මෙන්ෂෙවිකයෙකි. පළමුවැනි ලෝක මහා යුද්ධ සමයේදී මධ්‍යස්ථවාදියකු විය. — පිටුව 103

ස්මිර්නොව්, එ. (ගුරේවිච්, එම්මනුයිල් ල්වොවිච්) (උපත 1865) රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, මෙන්ෂෙවික්-ලික්විඩේටර් වාදියෙකි. — පිටු 84

සෝර්ගෙ (Sorge), ෆ්‍රෙඩ්රික් අඩොල්ෆ් (1828-1906) — ජර්මන් සමාජවාදියෙකි, ජාත්‍යන්තර කම්කරු සහ සමාජවාදී ව්‍යාපාරයේ සම්භාවනීය නායකයෙකි. මාක්ස්ගේ හා එංගල්ස්ගේ මිතුරෙකි. — පිටු 97, 98

සුබාතව්, සෙර්ගේයි වසීලෙවිච් (1864-1917) — සාර් පොලිසියේ උසස් නිලධාරියෙකි. පොලිස් සමාජවාදයේ සංවිධායකයාය. 1901-1903 වසරවලදී පොලිස් කම්කරු සමගි සංගම් මොස්කව්, පීටර්බුර්ග් සහ අනිකුත් නගරවල සංවිධානය කළේය. මෙහි අරමුණ වූයේ කම්කරුවන් විප්ලවවාදී සටන්වලින් ඈත් කරවීමය. — පිටුව 21

සොලොවියොව්, ව්ලදිමීර් සෙර්ගේයෙවිච් (1853-1900)—රුසියානු දර්ශනවාදියෙකි. විඥානවාදියකු වූ මොහු මාක්ස්වාදය කෙරෙහි සතුරු ආකල්පයක් දැක්විය. — පිටුව 59

සොරෝකින්, පිතිරිම් අලෙක්සාන්ද්‍රවිච් (1889-1968) — එස්ආර්වාදියෙකි. 1919-1922 වසරවලදී පෙත්‍රොග්‍රාඩයේ උසස් විදුහල්වල සමාජ විද්‍යාව උගැන්විය. ප්‍රතිවිප්ලවවාදී කටයුතු නිසා විදේශගත කරන ලදී. — පිටු 183, 184

ස්ත්‍රුවේ, පියොතර් බෙර්න්ගාර්දවිච් (1870-1944) — රුසියානු ධනවාදී ආර්ථික විද්‍යාඥයෙකි. දේශපාලන සාහිත්‍ය ධරයෙකි. කැඩෙට් පක්ෂයේ න්‍යායාචාර්ය වරයෙකි. 1890 ගණන්වලදි බර්න්ෂ්ටයින්වාදයේ එක් විවිධත්වයක් වන නීත්‍යානුකූල මාක්ස්වාදයේ ප්‍රධාන නියෝජිතයා විය. රුසියානු අධිරාජ්‍යවාදයේ එක් න්‍යායාචාර්ය වරයෙකි. — 21, 22, 57, 62

සුඛානොව්, එන්. (ගිම්මෙර්, නිකලායි නිකලායෙවිච්) (උපත 1882) — රුසියානු ආර්ථික විද්‍යාඥයෙකි. ජාත්‍යන්තර දේශපාලන සාහිත්‍යධරයෙකි,මෙන්ෂෙවිකයෙකි.නරෝද්නික්වාදය සහ මාක්ස්වාදය සංකලනය කිරීමට උත්සාහ ගත්තේය. — පිටු 192

ස්මිත් (Smith) ඇඩම් (1723-1790) — ඉංග්‍රීසි ජාතික ආර්ථික විද්‍යාඥයෙකි. ධනපති ආචීර්ණ කල්පික දේශපාලන අර්ථශාස්ත්‍රයේ ප්‍රධානතම නියෝජිතයාය. — පිටුව 8

ස්පෙක්ටාටර් (නකිම්සොන්, මිරෝන් ඉසාකවිච්) (උපත 1880) — රුසියානු ආර්ථික විද්‍යාඥයෙකි. දේශපාලන සාහිත්‍යධරයෙකි. පළමුවැනි ලෝක මහා යුද්ධ කාලයේදී මධ්‍යස්ථවාදියෙකි. — පිටුව 93

ස්තලීපින්, ඒ. ඒ. (උපත 1863) — කළු ශතකයේ දේශපාලන මත ධාරියෙකි, සාහිත්‍යධරයෙකි. ප්‍රතිගාමී ''නෝවොයෙ වරේම්ය'' සඟරාවට ලිපි සැපයීය. ඔක්ත්‍යා ස්ට් පක්ෂයේ සාමාජිකයෙකි. — පිටුව 64

හයින්ඩ්මන් (Hyndman), හෙන්රි මයර්ස් (1842-1921) — ඉංග්‍රීසි සමාජවාදී ප්‍රතිසංස්කරණවාදියෙකි. 1900-1910 වසරවලදී ජාත්‍යන්තර සමාජවාදී බියුරෝවේ සාමාජිකයකු වූයේය. බ්‍රිතාන්‍ය සමාජවාදී පක්ෂයේ නායකයකු වූ මොහු 1916 ඉන් පිටවිය. මෙයට හේතු

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වූයේ 1916 සොල්පර්ඩ්හිදී පවත්වන ලද එම පක්ෂයේ සාකච්ඡාව විසින් අධිරාජ්‍යවාදී යුද්ධය කෙරෙහි හයින්ඩ්මාන් දක්වා ඇති සමාජ-ජාතෝන්මාදවාදී ස්ථාවරය හෙළා දැකීමය. — පිටුව 104

හිල්පර්ඩිං (Hilferding), රුඩොල්ෆ් (1877-1941) — ජර්මන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සහ දෙවැනි ජාත්‍යන්තරයේ නායකයෙකි. ඔහු විසින් 1910 දී ලියන ලද ‘‘මූල්‍ය ප්‍රාග්ධනය’’ නැමැති කෘතිය, ඒකාධිකාරී ධනවාදය ගැන පරීක්ෂා කිරීමට සැහෙන දුරකට හේතු විය. එසේවුවද, එම කෘතියේ න්‍යායික සාවද්‍යතාවයන් සහ අවස්ථාවාදී ස්ථාවරයන් දක්නට ඇත. පළමුවැනි ලෝක මහා යුද්ධ කාලයේදී මධ්‍යස්ථවාදියකු වූ අතර සමාජ-අධිරාජ්‍යවාදීන් සමග සමගිය ආරක්ෂා කළේය. — පිටු 93, 96

හියුම් (Hume), ඩේවිඩ් (1711-1776) — ඉංග්‍රීසි ජාතික දර්ශනවාදියෙකි. මූල විඥානවාදී අඥෙයවාදියෙකි. දර්ශනවාදය තවදුරටත් වර්ධනය කිරීමෙහි ලා විශාල බලපෑමක් ඇති කළේය. — පිටු 49

හින්දෙන්බුර්ග් (Hindenburg), පවුල් (1847-1934) — ජර්මන් යුද්ධ සෙනවියෙකි, රාජ්‍ය නායකයෙකි. පීල්ඩ්මාෂල් (මහ සෙනවි) ධුරයට පත්වූවෙකි. ජර්මන් අධිරාජ්‍යවාදයේ ප්‍රතිගාමී සහ ජාතෝන්මාදවාදී කොටස්වල නියෝජිතයෙකි. — පිටුව 130

හොබ්සන් (Hobson), ජෝන් අට්කින්සන් (1854-1940) — ඉංග්‍රීසි ජාතික අර්ථශාස්ත්‍රඥයෙකි. ප්‍රතිසංස්කරණවාදියෙකි, ශාන්තිවාදියෙකි. — පිටු 93, 95

හෙගල් (Hegel), ගියොර්ග් විල්හෙල්ම් ප්‍රිඩ්රිහ් (1770-1831) — ඉතා උසස් ජර්මන් දර්ශනිකයෙකි. විෂයමූල විඥානවාදියෙකි. විඥානවාදී දයලෙක්තිකය ගැඹුරු ලෙසත්, අංග සම්පූර්ණ ලෙසත් පිළියෙළ කිරීම හෙගල්ගේ ඓතිහාසික සේවයකි. දයලෙක්තික භෞතිකවාදයේ එක් මූලාශ්‍රයක් වූයේ හෙගල්ගේ මේ දයලෙක්තික දර්ශනයය. — පිටු 6, 47, 81, 182

හෙන්ඩර්සන් (Henderson), ආතර් (1863-1935) — ඉංග්‍රීසි ජාතික දේශපාලනඥයෙකි. බ්‍රිතාන්‍ය ලේබර් පක්ෂයේ සහ ට්‍රේඩ් යූනියන් (වෘත්තීය සමිති) මණ්ඩලයේ නායකයෙකි. සමාජ-ජාතෝන්මාදවාදියෙකි. 1915-1931 දක්වා කාලය තුළදී බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ උසස් තනතුරු දැරීය. — පිටුව 104

හේල්ස් (Hales), ජෝන් (උපත 1839) — බ්‍රිතාන්‍ය වෘත්තීය සමිති ව්‍යාපාරයේ නායකයෙකි. 1866-1872 වසරවලදී පළමුවැනි ජාත්‍යන්තරයේ සාමාජිකයකු විය. 1871-1872 එහි ප්‍රධාන මණ්ඩලයේ ...ම ධුරයට පත් විය. මාක්ස්ට හා එංගල්ස්ට විරුද්ධව සටන් කළේය. — පිටුව 97

හදරෝව්ස්කි, ඉ. ඉ. (1885-1940) — රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි, බොල්ෂෙවිකයෙකි. ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට අනතුරුව පක්ෂයේත්, යුද්ධ හා සෝවියට් පාලන ක්ෂේත්‍රවලත් සේවය කළේය. — පිටු 89, 90

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස)‍: 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

කෘතිය: සමාජවාදී දෘෂ්ටිය සහ සංස්කෘතිය
කතෘ/පරිවර්තක: වී. අයි. ලෙනින්/දැදිගම. වී. රුද්‍රිගු
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2012-03-23
ඩිජිටල් සංස්කරණයන්: V1:2012-03-23, V2:2019-05-29
පිටු ගණන: 232
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com